2024 මැයි 10

NAOSL

වාර්තාවේ අංකය : එස්පිආර්/2024/03
அறிக்கை இல. : எஸ்பீஆர்/2024/03
Report No : SPR/2024/03

2022 හා 2023 වර්ෂවල ඖෂධ අවශ්‍යතාවය, ප්‍රසම්පාදනය, සැපයුම, බෙදාහැරීම හා නියාමනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



පටුන

අනු අංකය	විස්තරය	පිටුව
	විධායක සාරාංශය	
1.	වාර්තාව නිකුත් කිරීමේ පසුබිම සහ ස්වභාවය	4
2.	වාර්තාව සකස් කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදයන්	5 - 6
3.	විගණන විෂය පථය	6
4.	විෂය පථය සීමා කිරීම්	7 - 8
5.	නියැදි පදනම තීරණය කිරීම	8
6.	**ක්‍රියාවලිය**	
6.1	2022 වර්ෂය තුළ හිඟව පැවති ඖෂධ පිළිබඳ තොරතුරු හා විදේශ විනිමය හිඟකම පිළිබඳ තොරතුරු	9
6.2	2022 වර්ෂයේ හඳුනාගෙන තිබුණු හිඟ ඖෂධ සපයා ගැනීම සඳහා ගෙන තිබුණු ක්‍රියාමාර්ග	9 - 13
6.3	ශ්‍රී ලංකාව තුළ ඖෂධ නියාමනය සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ කාර්යභාරය	14 - 15
6.4	ඖෂධ නියාමන කාර්යයන් හා සම්බන්ධිත අධිකාරියේ ප්‍රධාන අංශ, කමිටු සහ ඒවායේ ප්‍රධාන කාර්යයන්	15 - 16
6.5	කොවිඩ් වසංගතය හා විනිමය අර්බුදය පවතින කාලය තුළ හදිසි මිල දී ගැනීම් ක්‍රියාවලිය සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතීන්	16 - 21
6.6	හදිසි මිල දී ගැනීම් ක්‍රියාවලිය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ මැදිහත්වීම	21 - 28
6.7	හදිසි මිල දී ගැනීම් ක්‍රියාවලිය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මැදිහත්වීම	29 - 30
7.	**නිරීක්ෂණ**	
7.1	ඉන්දියානු ණය යෝජනා ක්‍රමය භාවිතය	30
7.2	ඖෂධ වෙනුවෙන් සිදුකළ යුතු ගෙවීම්	31 - 32
7.3	2022 හා 2023 වර්ෂ තුළ සිදුකළ හදිසි මිලදී ගැනීම් ක්‍රියාවලිය	32 - 39
7.4	අනායාචිත යෝජනා හරහා සෞඛ්‍ය අමාත්‍යවරයාට ලැබී තිබුණු ඉල්ලීම් සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ මැදිහත්වීම හා අදාළ අභ්‍යන්තර ක්‍රියාවලිය	39 - 43

7.5	හදිසි මිලදී ගැනීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මැදිහත්වීම	44 - 46
7.6	ඖෂධ ලියාපදිංචියේ දී රජයේ ඖෂධ අවශ්‍යතාවයන් සැලකිල්ලට නොගැනීම	46 - 47
7.7	ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් සිදුකරන ඖෂධ ලියාපදිංචි කිරීම් ක්‍රියාවලිය	48 - 57
7.8	ඖෂධවල මිල නියාමන ක්‍රියාවලිය	57 - 61
7.9	ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය	61 - 69
7.10	ඖෂධ ගබඩා සහ ඖෂධ ප්‍රවාහනය නියාමනය	69 - 70
7.11	ජාතික ඖෂධ නියාමන අධිකාරිය ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම	70 - 82
7.12	2022 හා 2023 වර්ෂ වෙනුවෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ඉදිරිපත් කළ ප්‍රධාන ඇණවුම් සම්බන්ධ නිරීක්ෂණ	82 - 86
7.13	2022 හා 2023 වර්ෂයන්හිදී මිලදී ගන්නා ලද ඖෂධවල තත්ත්වය	86 - 89
7.14	Bupivacaine ඖෂධය තත්ත්වයෙන් අසමත් වීම	89 - 90
7.15	Prednisolone Acetate Eye Drop ඖෂධය තත්ත්වයෙන් අසමත් වීම	90 - 91
7.16	Human Immunoglobulin හා Rituximab යන ව්‍යාජ ඖෂධ මිල දී ගැනීම	91 - 104
7.17	Trastuzumab 440mg ඇතුළු ඖෂධ වංචනික ආකාරයට වෛද්‍ය සැපයීම් අංශයට සැපයීම	104 - 113
7.18	Ceftriaxone ඖෂධය පිළිබඳ පරීක්ෂාව	114
8.	**නිර්දේශ**	114 - 118
	වෙළුම I	119 - 232
	ඇමුණුම්	233 - 861

2022 හා 2023 වර්ෂවල ඖෂධ අවශ්‍යතාවය, ප්‍රසම්පාදනය, සැපයුම, බෙදාහැරීම හා නියාමනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

විධායක සාරාංශය

2020 – 2021 කාලපරිච්ඡේදය තුළ ඇති වූ කොවිඩ් වසංගතය හා ඒ සමගම 2022 -2023 කාලපරිච්ඡේදය තුළ ඇති වූ ආර්ථික අර්බුදය ශ්‍රී ලංකාවේ විවිධ අංශ කෙරෙහි අහිතකර ලෙස බලපෑම් ඇති කර තිබුණි. ඒ අනුව මෙම ගැටළුකාරී තත්ත්වය සෞඛ්‍ය ක්ෂේත්‍රය කෙරෙහි ද සැලකිය යුතු ප්‍රමාණයකින් බලපෑම් ඇති කර තිබුණු බව විගණනයේ දී මෙන්ම රට තුළ පැවති සමාජ කථිකාවන් තුළින් ද හඳුනා ගැනීමට හැකි විය. ඖෂධ හිඟයක් රට තුළ පැවති බව වරින් වර සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ මඟින් හෙළිදරව් කර තිබුණු අතර ප්‍රමිතියෙන් තොර ඖෂධ රෝගීන්ට ලබා දීමෙන් ඇති වූ අහිතකර ප්‍රතිවිපාකයන් පිළිබඳව වරින්වර මාධ්‍ය මඟින් හා වෙනත් සමාජ කථිකාවන් මඟින් සාකච්ඡාවට බඳුන් විය. ඒ අනුව මෙම තත්ත්වය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂා කර මෙවැනි තත්ත්වයක් තුළ 2018 අංක 19 දරන විගණන පනතෙහි 13 වන වගන්තියෙන් මා හට ලැබී ඇති බලතල මත මෙම කරුණු සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් පරීක්ෂා කිරීම සිදු කර මෙම වාර්තාව නිකුත් කරන ලදී.

පවත්නා ඖෂධ තොගය ප්‍රමාණවත් නොවන බව සඳහන් කරමින් ඖෂධ හදිසි මිලදී ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යවරයා 2022 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසයන්හි දී ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද අනුමැතිය මත අභිලාෂ කැඳවීමේ ක්‍රමවේදය (Expression Of Interest - EOI) යටතේ සහ ආනායාචිත යෝජනා (Unsolicited Proposal) යටතේ සැපයුම්කරුවන් තෝරා ගෙන තිබුණි. මෙම අවස්ථාව වන විට ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ එ.ජ.ඩො. මිලියන 200 ක ප්‍රතිපාදන සෞඛ්‍ය අංශයට ලැබී තිබුණු අතර මුදල් අමාත්‍යාංශය විසින් මෙම හදිසි මිලදී ගැනීම් සඳහා අනුගමනය කිරීමට ලිහිල් කොන්දේසි සහිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ද හඳුන්වාදීමට කටයුතු කර තිබුණි.

ඉහත සඳහන් කුමන හෝ ක්‍රමවේදයක් යටතේ සැපයුම්කරුවන් තෝරා ගත්තද ඖෂධ සැපයුම්කරුවන් ඇගයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීමකින් තොරව ඇගයීම් කමිටුවක් පමණක් පත්කිරීම හේතුවෙන් ඉහළ තාක්ෂණික කරුණු මත පදනම්ව මිලදී ගැනීම අවශ්‍ය වන ඖෂධවල ප්‍රමිතිය පිළිබඳව ඇගයීමකින් තොරව මිලදී ගැනීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත ප්‍රකාරව සියළු ඖෂධ ලියාපදිංචි කර තිබිය යුතු අතර ඉතාමත් වැදගත් නිශ්චිත අවස්ථාවන් කිහිපයක දී පමණක් ලියාපදිංචියෙන් නිදහස් වීමේ සහතික (Waiver Of Registration - WOR) අධිකාරියට නිකුත් කළ හැකි වේ. තවද එම සහතික සඳහා අංක 2052/33 දරන 2018 ජනවාරි 05 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් දක්වා ඇති නියෝග ප්‍රකාරව අධිකාරිය මෙම සහතික සඳහා ගාස්තුවක් අයකරනු ලබන අතර එලෙස ගාස්තුවක් අයකරමින් නිකුත් කරනු ලබන එම සහතික පිළිගත් ක්‍රමවේදයෙන් බැහැරව වේගවත් යාන්ත්‍රණයක් යටතේ සිදුකර එතෙක් තාක්ෂණික කමිටුවක් හරහා සිදු කළ ඇගයීම තාක්ෂණික කමිටුව මගහැර ප්‍රධාන විධායක නිලධාරියා විසින්ම අනුමැතිය ලබා

දීමේ ක්‍රමවේදයක් අනුගමනය කර අධිකාරියේ මූලික අරමුණුවලින් බැහැර වී තිබුණි. එසේම ඖෂධවල ගුණාත්මකභාවය පිළිබඳ අධිකාරියෙහි වගකීම ද වෙනත් පාර්ශවයකට පැවරීමට ද කටයුතු කර තිබුණි.

මෙලෙස හදිසි මිලදී ගැනීම් සිදුකිරීමේ දී අභිලාෂ කැඳවීම් යටතේ ඖෂධ අයිතම 285 ක් හා අනායාචිත යෝජනා යටතේ ඖෂධ අයිතම 38 ක්ද මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ ද එම ප්‍රමාණයන් තීරණය කිරීමේ දී එම තීරණය කරන ලද අවස්ථාව වන විට සාමාන්‍ය ක්‍රමවේදය යටතේ ඇණවුම් කර ලැබීමට නියමිතව තිබුණු ඖෂධ තොග සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබීම හේතුවෙන් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳව සලකා බලමින් ප්‍රශස්ථ තීරණ ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව ඇතැම් ඖෂධ එම කාලපරිච්ඡේදය තුළ දී අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි වශයෙන් ලැබී තිබුණු අතර ඇතැම් ඖෂධ හදිසි මිලදී ගැනීම් ලෙස සලකා සාමාන්‍ය ක්‍රමවේදයෙන් ගත් මිලට වඩා කැපී පෙනෙන ඉහළ මුදලක් වැයකරමින් මිලදී ගැනීමට කටයුතු කළ ද සාමාන්‍ය ක්‍රමවේදය යටතේ ඇණවුම් කළ තොග ලැබෙන තෙක් ද එම හදිසි ඇණවුම් ලැබී නොතිබුණි.

තවද, මෙලෙස හදිසි මිලදී ගැනීම් යටතේ මිලදී ගත් ඇතැම් ඖෂධ සම්බන්ධයෙන් මතභේදාත්මක තත්තවයන් කිහිපයක් ඇති වී තිබුණු අතර ඒ අතරින් ***Human Immunoglobulin IV 5-6g*** ඖෂධය ව්‍යාජ ඖෂධයක් බවට ඖෂධ නියාමන අධිකාරියේ ලේඛන අනුව නිරීක්ෂණය විය. තවද නිශ්චිත ප්‍රමිතියෙන් තොර මෙම ඖෂධය ඉන්දියාවෙන් ආනයනය කර සපයන බව ඖෂධයේ සැපයුම්කරු වූ *Isolez Biotech Pharma AG Ltd* සමාගම දන්වා තිබුණ ද එම සමාගම විසින් එය ආනයනය කර නොමැති බව ආනයන හා අපනයන පාලකගේ සහ ශ්‍රී ලංකා රේගුවෙන් ලද තොරතුරු අනුව නිරීක්ෂණය විය. සැපයුම්කාර සමාගම විසින් සඳහන් කරනු ලැබූ ඉන්දියානු නිෂ්පාදන සමාගම ද මෙම ඖෂධය තම නිෂ්පාදන සමාගම විසින් නොසැපයූ බව තහවුරු කර ඇති අතර සියළු කරුණු සැලකීමේ දී මෙම ඖෂධය **(ඖෂධය ලෙස සපයා ඇති නිෂ්පාදනය)** මෙම සමාගම ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි විධිවිධාන උල්ලංඝණය කර නීතිවිරෝධී ලෙස ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය නොකළේයැයි විගණනයට තහවුරු නොවීය.

ඖෂධ වැනි මිනිස් ජීවිත හා බැඳුනු සංවේදී අයිතමයන් මිලදී ගැනීමට කටයුතු කිරීමේ දී / සැපයීම් කිරීමේ දී මෙන්ම රෝගීන්ට බෙදාහැරීමට පෙර අදාළ පාර්ශවයන් එම ඖෂධවල ගුණත්වය පරීක්ෂා කිරීම පිළිබඳව සිය වගකීම නිසි පරිදි ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය. තවද ඖෂධ සැපයුම්කරුවන් විසින් ලියාපදිංචිය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද ඖෂධ ලිපිගොනු, නියෝග මඟින් නියම කර ඇති කාලපරිච්ඡේදය වන දින 300 ඇතුළත නිසි පරිදි ඇගයීම් කර අවසන් නොකර සැලකිය යුතු ප්‍රමාණයක් අත රඳවා ගෙන තිබීම හේතුවෙන් ඖෂධ සැපයීමට විධිමත් සැපයුම්කරුවන් හිඟවී තිබුණු අතර ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ට ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි මත අදාළ ඇණවුම් ලබා දීමත් සිදු කර තිබුණි. තවද ඇතැම් ඖෂධ ඇගයීමේ කාලය අසාමාන්‍ය ලෙස අඩුකරමින් ඉතා කඩිනමින් එනම් දින දෙකකට අඩු කාලපරිච්ඡේදයක දී ඇගයීම සිදු කර තිබීම හේතුවෙන් එම ඇගයීම් නිසි පරිදි සහ අපක්ෂපාතීව සිදු වූ බව විගණනයට තහවුරු නොවීය.

ආර්ථිකය තුළ අර්බුදකාරී තත්ත්වයක් පවතින අවස්ථාවක දී සහනදායී කොන්දේසි යටතේ ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ ලද ප්‍රතිපාදන ප්‍රශස්ථ ලෙස උපයෝජනය කිරීමකින් තොරව ආනයනික භාණ්ඩ වෙනුවෙන් පවත්නා සීමිත දේශීය මුදල් භාවිතා කිරීම හේතුවෙන් රට තුළ ඇති විය හැකි කාරක ප්‍රාග්ධන ගැටලු හා විදේශ විනිමය ගැටලු පිළිබඳව අවධානය යොමු කිරීමට කටයුතු කර නොමැති බව විගණනයට නිරීක්ෂණය විය.

ඒ අනුව සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ මනා කළමණාකාරිත්වයක් නොතිබීම, එකිනෙක සම්බන්ධිත කාර්යයන් සිදුකරනු ලබන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නොමැතිවීම, නිවැරදි හා තාර්කික තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සපයා ඇතිබව තහවුරු නොවීම, නිවැරදි තොග පාලන පද්ධතියක් හඳුන්වා දී නොතිබීම වැනි හේතූන් මත 2022 -2023 වර්ෂයන් තුළදී සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ අර්බුධකාරී තත්ත්වයක් උද්ගත වී තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.

කෙසේ වුවද මෙම තත්ත්වයන් මඟ හැරීමට/ ඉදිරියේ දී ඇති වීම වළක්වා ගැනීමේ අරමුණින් පහත සඳහන් නිර්දේශයන් ඇතුළුව නිර්දේශ කිහිපයක් ලබා දෙනු ලබන අතර විස්තරාත්මක තොරතුරු හා ලිඛිත තහවුරු කිරීම් සඳහා වෙළුම I ට සහ ඇමුණුම්වලට යොමු විය යුතුය.

(i) ගුණත්වයෙන් තොර ඖෂධ ගෙන්වා රෝගී ජනතාව අවධානමට ලක් කළ තැනැත්තන් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

(ii) ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික නිකුත් කිරීම හැකිතාක් අවම කිරීම.

(iii) ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය ජාත්‍යන්තර ප්‍රමිතිකරණ මට්ටමේ පර්යේෂණාගාරයක් බවට පත් කිරීම.

(iv) තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයුම් සිදු කළ සමාගම් / ආයතන අසාධු ලේඛනගත කිරීම සඳහා කඩිනම් පියවර ගැනීම.

(v) ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ඖෂධ සඳහා ලියාපදිංචි කිරීම් කටයුතු කඩිනම් කිරීම සහ පසුවිපරම් කිරීම සඳහා වූ ක්‍රමවේදයක් සකස් කිරීම.

(vi) ඖෂධ සැපයුම් ජාලයට සම්බන්ධවන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම.

01. වාර්තාව නිකුත් කිරීමේ පසුබිම සහ ස්වභාවය

2020 වර්ෂයේ දී ඇති වූ කොවිඩ් වසංගතය හා 2021 අවසාන කාර්තුවත් සමඟ ඇතිවූ ආර්ථික අර්බුදයෙන් ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රයන්ට අහිතකර අයුරින් බලපෑම් ඇති වී තිබුණි. විදේශ සංචිත ප්‍රමාණය සීඝ්‍රයෙන් ක්ෂය වීමත් සමඟම රට තුළ ඇතිවූ විදේශ විනිමය ඌනතාවයත් ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය සීඝ්‍රයෙන් අවප්‍රමාණය වීමත් හේතුවෙන් සෞඛ්‍ය අංශයටද එහි බලපෑම ඇති වූ බවට කරුණු හෙළිදරව් විය. තවද එම තත්ත්වය තුළ රට තුළ ඖෂධ හිඟයක් ඇති වූ බවට හා රෝගීන් සඳහා නිකුත් කරන ලද ඖෂධ නියමිත ප්‍රමිතියෙන් තොර වීමත් ඖෂධ මිල සීඝ්‍රයෙන් ඉහළ යාමත් ආදී කරුණු සම්බන්ධයෙන් සමාජය තුළ සැලකිය යුතු පරිදි සාකච්ඡාවට බඳුන් වී තිබුණි.

මෙවැනි තත්ත්වයක් තුළ 2018 අංක 19 දරන විගණන පනතෙහි 13 වන වගන්තියෙන් මා හට ලැබී ඇති බලතල මත මෙම කරුණු සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් පරීක්ෂා කිරීම සිදු කර මෙම වාර්තාව නිකුත් කරන ලදී.

මෙම වාර්තාව සමඟ ඉදිරිපත් කරන වෙළුම I හි කෙටුම්පතට හා සැපයුම්කරුවන් දෙදෙනෙකු විසින් වංචනික ලෙස තත්ත්වයෙන් අසමත් ඖෂධ සැපයීමට අදාළ කෙටුම්පත් විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් මෙම වාර්තවේ දින වන විටද පිළිතුරු ලබා දීමට කටයුතු කර නොමැති බැවින් එම නිරීක්ෂණයන් පිළිගෙන ඇති බව සලකා මෙම වාර්තාවට ඇතුළත් කරන ලදී.

මෙම වාර්තාව පරිශීලනයේදී ඖෂධ ප්‍රසම්පාදනය, හදිසි මිලදී ගැනීම් ක්‍රියාවලිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතීන් හා ඖෂධ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට කර තිබුණු සංශෝධන, හදිසි මිලදී ගැනීම් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මැදිහත්වීම හා ඖෂධ නියාමනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා 6 ඡේදයට සහ 7.5 සිට 7.11 දක්වා යොමු විය යුතුය. 7 ඡේදය මඟින් මෙම වාර්තාවට අදාළ සියළුම නිරීක්ෂණ දැක්වෙන අතර ඖෂධ 05 කට අදාළ නිරීක්ෂණ පමණක් 7.14 සිට 7.18 දක්වා අන්තර්ගත කර ඇත. අනෙකුත් ඖෂධ 73 ට අදාළ නිරීක්ෂණ සඳහා වෙළුම 1ට යොමුවිය යුතුය. එසේම විස්තරාත්මක තොරතුරු හා ලිඛිත තහවුරු කිරීම් සඳහා ඇමුණුම්වලට යොමු විය යුතුය. ඡේද අංක 08 මඟින් මෙම වාර්තාවේ නිර්දේශයන් දක්වා ඇත.

02. වාර්තාව සකස් කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදයන්

2.1 ලේඛන, පොත්පත් හා වාර්තා පරීක්ෂා කිරීම

(i) 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත

(ii) 2018 අංක 19 දරන ජාතික විගණන පනත

(iii) 2020 සිට 2023 වර්ෂය දක්වා අර්බුදකාරී කාලය තුළ අඛණ්ඩ වෛද්‍ය සැපයීම් සේවාවක් පවත්වාගෙන යාමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ, තීරණ හා මුදල් අමාත්‍යාංශ නිරීක්ෂණ

(iv) මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ හා හදිසි ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්

(v) වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ විසින් 2021, 2022 හා 2023 වර්ෂවල නිකුත් කරන ලද තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයීම් පිළිබඳ චක්‍රලේඛ

(vi) 2007 ඖෂධ හා වෛද්‍ය උපකරණ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(vii) 2022 ඖෂධ හා වෛද්‍ය උපකරණ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය (මෙම මාර්ගෝපදේශ සංග්‍රහය 2007 ඖෂධ හා වෛද්‍ය උපකරණ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය වෙනුවට 2023 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය.)

(viii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(ix) 2008 වර්ෂයේදී සංශෝධනයට ලක් වූ 1987 වර්ෂයේදී නිකුත්කර තිබුණු ඖෂධ කළමනාකරණය පිළිබඳ මහපෙන්වීම් සහිත ඖෂධ කළමනාකරණ අත්පොත (Manual on Management of Drugs)

(x) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා, ඖෂධ ඇගයීම් කමිටු වාර්තා, ලියාපදිංචිය නිදහස් කිරීමේ අනුකමිටු වාර්තා, ආරක්ෂාව හා අවදානම් පිළිබඳ කමිටු වාර්තා, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මිල කමිටු වාර්තා, ඖෂධ ඩොසියර් ලිපිගොනු, ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික (WOR), ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ ලිපිගොනු

(xi) ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේ ලිපිගොනු, ඉන්දියානු ණය යෝජනා ඖෂධ අනුකමිටු රැස්වීම් වාර්තා, හදිසි මිලදී ගැනීම්වලට අදාළ ලිපිගොනු, හදිසි මිලදී ගැනීම් මිල කමිටු වාර්තා, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රසම්පාදන ලිපිගොනු, අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා, වාප්පු අංශයේ (Wharf Division) නිෂ්කාශන ලිපිගොනු

(xii) අභිලාෂ කැඳවීමේ ක්‍රියාවලිය යටතේ සිදුකළ ප්‍රසම්පාදනයන්ට අදාළ ලිපිගොනු

(xiii) රේගු දෙපාර්තමේන්තුව, ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව මඟින් රේගු නිෂ්කාශනයට අදාළ තොරතුරු හා සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පරිගණක පද්ධතිය මඟින් සමාගම් සංස්ථාපනයට අදාළව ලබාගත් තොරතුරු සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් ලබාගත් තොරතුරු

(xiv) ඖෂධ ඇණවුම්වලට අදාළ වෛද්‍ය සැපයීම් අංශයේ ලිපිගොනු හා ගෙවීම් වවුචර්

(xv) වෛද්‍ය සැපයීම් පිළිබඳ ක්‍රියාවලිය පරිපාලනය සඳහා යොදා ගෙන තිබුණු PRONTO හා ස්වස්ථ පරිගණක පද්ධතිය මඟින් ලබා ගත් තොරතුරු

2.2 අනෙකුත් ක්‍රමවේදයන්

(i) යථෝක්ත ක්‍රියාවලියට අදාළව රජයේ රෝහල් මඟින් විවිධාකාරයෙන් ලබාගන්නා තොරතුරු විශ්ලේෂණයට ලක් කිරීම.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය, ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන ඒකකය, වෛද්‍ය සැපයීම් අංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ආදී ආයතනවල ඉහළ කළමනාකරණය සමඟ සාකච්ඡා කිරීම, ඉන්දියානු ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන භාණ්ඩාගාර නිලධාරීන් සහ ආසියානු සංවර්ධන බැංකු මූල්‍ය සහාය ක්‍රියාත්මක කරන සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (Health Sector Enhancement Project - HSEP) නිලධාරීන් මඟින් තොරතුරු ලබා ගැනීම.

(iii) ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාර පරිශ්‍රය භෞතිකව පරීක්ෂා කිරීම.

03. විෂය පථය

රජයේ රෝහල්වල වෛද්‍ය සැපයීම් අවශ්‍යතා සම්පාදනය කිරීම සඳහා ඉන්දියානු ණය යෝජනා පහසුකම ඇතුළුව ලංකාවට ලද ණය ආධාරවල ප්‍රගතිය හා ඒ හරහා සම්මත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සිදුකර තිබුණු ඖෂධ හදිසි මිලදී ගැනීම්වල ඵලදායීතාව පිළිබඳවත්, එලෙස සැපයූ ඖෂධවල ගුණත්වය නියාමනය කිරීමේ ක්‍රමවේදය පිළිබඳවත් නියැදි විගණන පරීක්ෂාවක් සිදු කරන ලදී.

විගණනයේ අරමුණ

විනිමය හිඟය හා වෙනත් කරුණු හේතුවෙන් 2022 වර්ෂයේ පැන නැගුණු අර්බුදකාරී කාලය තුළ ඖෂධ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලීමත්, එහිදී

සිදුකරන ලද හදිසි මිලදී ගැනීම් ඵලදායීද යන්නත්, ගුණත්වයෙන් යුතු ඖෂධ රෝගීන්ට ලබාදීමේ ක්‍රියාවලියේ නියාමනය පරීක්ෂා කිරීම මෙම විශේෂ විගණනයේ අරමුණ විය.

04. විෂය පථය සීමාකිරීම්

මෙම වාර්තාවෙන් ඉස්මතු කර ඇති නිරීක්ෂණයන් මඟින් නිර්දේශවලට එළඹීමේදී මාගේ විෂය පථය පහතින් දැක්වෙන සීමා කිරීම්වලට යටත්ව තිබුණු බව අවධාරණය කරනු ලැබේ.

(i) මෙම විගණනය සිදු කරමින් පවතින අතරතුර හදිසි මිලදී ගැනීම් ප්‍රසම්පාදනයට අදාළ මුල් ලිපිගොනු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ භාරයට ගැනීම.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී**,** ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම්වරයා, වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ, වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ, වෛද්‍ය සැපයීම් සහකාර අධ්‍යක්ෂ (ඖෂධ), වෛද්‍ය සැපයීම් ගණකාධිකාරී (සැපයුම්) යන නිලධාරීන් අධිකරණ ක්‍රියාවලියක් හේතුවෙන් රක්ෂිත බන්ධනාගාර ගතවීම සහ ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ ප්‍රසම්පාදන අංශ ප්‍රධාන වෛද්‍ය නිලධාරීවරයා විදේශගතවී නැවත නොපැමිණීමත් හේතුවෙන් ප්‍රසම්පාදනයන්ට අදාළ ඇතැම් පැහැදිලි කිරීම් ලබා ගැනීමට නොහැකි වීම.

(iii) ඖෂධවල ගුණාත්මක බව තහවුරු කර ගැනීම සඳහා අදාළ බලධාරීන් විසින් ලබාගෙන තිබුණු තත්ත්ව සහතික වලට වැඩිමනත්ව ස්වාධීන තත්ත්ව පරීක්ෂාවන් සිදු නොකිරීම/ සිදු කරවා නොගැනීම

(iv) ඖෂධවල තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් ද අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුවල තීරණ / නිර්දේශ වලට වැඩිමනත්ව ස්වාධීන තහවරු තහවුරු කිරීම් ලබා නොගැනීම.

(v) නව ස්වස්ථ පරිගණක පද්ධතිය මඟින් ලබාගන්නා දත්තවල විශ්වාශනීයත්වය/ නිවැරදිතාවය පිළිබඳ තහවුරු නොවීම

(vi) මෙම වාර්ථාවේ කෙටුම්පතට පිළිතුරු ලබා දීමේ දී අමාත්‍යාංශ ලේකම්වරයා කටයුතු කර තිබුණු පහත දැක්වෙන ආකාරයන් හේතුවෙන් කෙටුම්පත් විගණන නිරීක්ෂණයන් පිළිබඳව නිශ්චිත තහවුරුවන් ලැබී නොමැති අවස්ථා ද පවතින අතර එලෙස කටයුතු කිරීම යම් අවාසිසහගත තත්ත්වයකින් මහහැරීම සඳහා චේතාන්විතව කටයුතු කිරීමක්ද යන්නද ඉදිරියෙන් තවදුරටත් අවධානය යොමුකළ යුතු කරුණක් සේ නිරීක්ෂණය කෙරේ.

(vii) 2023 දෙසැම්බර් 29 දින නිකුත් කරන ලද මෙම වාර්තාවේ කෙටුම්පත් වාර්තාව සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් ලිඛිත ප්‍රතිචාර දැක්වීමේ දී ''ලබාගත හැකි තොරතුරු අනුව හැකි පමණ සම්පූර්ණ ලෙස පිලිතුරු සැපයීමට කටයුතු කර ඇතත් එම වාර්තාවේ කරුණුවලට අදාළ මූලික නිලධාරීන් කිහිප දෙනෙකු රිමාන්ඩ් භාරයේ පසුවීම හා සමහර ලිඛිත තොරතුරු නොමැතිවීම නිසා සපයනු ලබන පිලිතුරු අසම්පූර්ණව පැවතිය හැකි බව" ට විගණනයට දන්වා තිබීම.

(viii) ඉහත ඡේදයේ සඳහන් කෙටුම්පත් වාර්තාවේ ඖෂධ 75 ක නියැදියක් පරීක්ෂා කිරීම මඟින් ලබාගත් නිරීක්ෂණයන් සඳහා පොදු සංක්ෂිප්ත පිළිතුරක් ලබා දෙමින්, අදාළ විගණන විමසුම්වලට ලබාදෙන පිළිතුරු මඟින් සම්පූර්ණ පිළිතුරක් ලබා දීමට අපේක්ෂා කරන බවත් සෞඛ්‍ය ලේකම් විසින් දක්වා ඇතත් විගණන විමසුම් බොහොමයක් නිකුත් කර මාස 02 කට වැඩි කාලයක් ගතවී තිබුණද පිළිතුරු ලබාදී නොතිබුණි.

(ix) සැපයුම්කරුවකු විසින් වංචනික ලෙස තත්ත්වයෙන් අසමත් ඖෂධ සැපයීමට අදාළ කෙටුම්පත් විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන්, අධිකරණ ක්‍රියාවලියක් සිදුවන බැවින් හා කිහිප දෙනෙකු අධිකරණ භාරයේ පසුවන බැවින් එම කටයුතු අවසන් වීමෙන් පසුව පූර්ණ පිළිතුරක් ලබාදීමට කටයුතු කරන බවට දැනුම් දීමත්, තවත් සමාගමක් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් සිදුකර වාර්තා කරන බවට දැනුම් දීම.

05. නියැදි පදනම තීරණය කිරීම

ඖෂධ ඇස්තමේන්තු සකස් කිරීමේ සිට ඖෂධ ඇණවුම් කර වෛද්‍ය සැපයීම් අංශය වෙත ලබාදීමත්, එම ඖෂධ බෙදාහැරීමත් සම්බන්ධයෙන් වූ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සඳහා ඖෂධ වර්ග 78 කින් යුත් නියැදියක් තෝරාගන්නා ලද අතර 2022 සහ 2023 වර්ෂ තුළ ඖෂධ හිඟ වීම්, ඖෂධ හදිසි මිල දී ගැනීම්, ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි මත ඖෂධ ආනයනය කිරීම්, ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ඖෂධ ආනයනය කිරීම්, ඖෂධ තත්ත්වයෙන් අසමත් වීම් හා රෝගීන්හට බරපතල අහිතකර ප්‍රතික්‍රියා ඇති වීම් යන හඳුනාගත් හඳුනාගත් අවධානම් ක්ෂේත්‍ර 06 ක් අතුරින් එකක් හෝ කිහිපයක් ආවරණය වන අයුරින් එම නියදිය තෝරාගෙන ඒ අනුව 2022 සහ 2023 කාලපරිච්ඡේදය තුළ විදුයුත් සහ මුද්‍රිත මාධ්‍ය මඟින් නිරන්තර සාකච්ඡාවට ලක් වූ ඖෂධ අයිතමද මෙම නියැදියට ඇතුළත්ව ඇත.

06. ක්‍රියාවලිය

6.1 2022 වර්ෂය තුළ හිඟව පැවති ඖෂධ පිළිබඳ තොරතුරු හා විදේශ විනිමය හිඟකම පිළිබඳ තොරතුරු

සමාලෝචිත කාලය තුළ පැවති ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් ඖෂධ සැපයුමෙහි එවකට තත්ත්වය පිළිබඳව විගණනයට ඉදිරිපත් කරන ලද ලේඛනය අනුව 2022 මැයි 13 දිනට ඖෂධ අයිතම 311 ක **(ඇමුණුම 01)** තොග ශූන්‍ය බව (out of stock) හඳුනාගෙන තිබුණු අතර විනිමය හිඟය හේතුවෙන් බැංකු තුළ පොරොත්තු මට්ටමේ පවතින විදේශ ණයවර ලිපි සඳහාත්, බැංකුවට ඉදිරිපත් කිරීමට ඇති විදේශ ණයවර ලිපි සඳහාත් එ.ජ.ඩො.මිලියන 13.2 ක මූල්‍ය අවශ්‍යතාවයක් පවතින බවට ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් භාණ්ඩාගාර ලේකම් වෙත 2022 අප්‍රේල් 22 දින දන්වා තිබුණි **(ඇමුණුම 02)**. එසේම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විගණනයට ලබා දුන් තොරතුරු අනුව 2022 අප්‍රේල් 20 දිනට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් දේශීය වෙළඳපලින් ඇණවුම් කර තිබුණු වෛද්‍ය සැපයීම් සඳහාත්, දේශීය සැපයුම්කරුවන් සඳහා මහජන බැංකුව හා ලංකා බැංකුව තුළ පොරොත්තු මට්ටමේ පවතින ණයවර ලිපි සඳහාත් එදිනට ගෙවීමට තිබුණු මුළු මුදල රු.මිලියන 4,278.82 ක් **(ඇමුණුම 03)** විය. තවද 2022 මැයි 25 දින වන විට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් වෛද්‍ය සැපයීම් අංශයේ ඇණවුම් වෙනුවෙන් ණයවර ලිපි නිකුත් කිරීමට, සැපයුම්කරුවන්ට ගෙවීමට හා ආනයන හා නිෂ්කාශන කටයුතු සඳහා රු.මිලියන 7,135 ක් ද, වෛද්‍ය සැපයීම් වෙනුවෙන් ලබා ගත් බැංකු අයිරා පහසුකම් පියවීම සඳහා රු.මිලියන 15,988 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 23,123 ක **(ඇමුණුම 04)** මූල්‍ය අවශ්‍යතාවයක් පවතින බවට එම සංස්ථාව විසින් විගණනයට තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

6.2 2022 වර්ෂයේ හඳුනාගෙන තිබුණු හිඟ ඖෂධ සපයා ගැනීම සඳහා එවකට පැවති ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ගෙන තිබුණු ක්‍රියාමාර්ග

6.2.1 සෞඛ්‍ය අමාත්‍යාංශය, ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය, වෛද්‍ය සැපයීම් අංශය, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් ඖෂධ සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමටත්, 2022 වර්ෂයේ පළමු කාර්තුව තුළ විනිමය හිඟය හේතුවෙන් සපයාගත නොහැකි වූ වෛද්‍ය සැපයීම් අයිතම ප්‍රමුඛතාවය මත මිලදී ගැනීම සඳහාත්, පහතින් විස්තර සඳහන් ආධාර ක්‍රම උපයෝගී කර ගැනීමට කටයුතු කරමින් පැවතුණි. භාණ්ඩාගාර තොරතුරු අනුව රට තුළ වෛද්‍ය සැපයීම්වල හදිසි පහසුකම් සැලසීමට

පහත පරිදි විදේශ ණය ආධාර යෝජනා ක්‍රම මඟින් වෛද්‍ය සැපයීම් මිලදී ගැනීමට පහසුකම් සලසා තිබුණි.

වගුව අංක - 01 : විදේශ ණය ආධාර යෝජනා ක්‍රම

දායකත්වය ලබාදෙන නියෝජිත ආයතනය /රට	**ප්‍රතිපාදනය (එ.ජ.ඩො. මිලියන)**
ඉන්දියානු ණය යෝජනා ක්‍රමය (ICL)	360.0*
ආසියානු සංවර්ධන බැංකු ආධාර (ADB- HSEP/ AIIB)	166.0
ලෝක බැංකු ණය ආධාර (WB)	48.0
චීන පරිත්‍යාග	22-25
වෙනත් නියෝජිත ආයතන (WHO, UNFPA)	2.0

* ඉහත ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ අවස්ථා දෙකක දී පිළිවෙලින් එ.ජ.ඩො. මිලියන 200 ක් හා එ.ජ.ඩො. මිලියන 35 ක් බැගින් ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඉතිරි ප්‍රතිපාදන පසුව වෙන්කර තිබුණි.

6.2.2 ඉන්දියානු ණය යෝජනා ක්‍රමය හරහා මුල් අවස්ථාවේ දී ලබාදෙන ලද එ.ජ.ඩොලර් මිලියන 200 ක ණය ආධාර මුදල ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශය යටතේ පිහිටුවා තිබුණු ඉන්දියානු ණය යෝජනා ඖෂධ අනුකමිටුව විසින් වෛද්‍ය සැපයීම් අංශය හරහා රජයේ රෝහල් වෙත ලබාදෙන වෛද්‍ය සැපයීම් මිලදී ගැනීමටත්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) හරහා ක්‍රියාත්මක වන ඔසුසැල්වල ඖෂධ සුලබ කිරීමේ අරමුණින් මිලදී ගැනීම් සිදුකිරීමටත්, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ (SPMC) ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීමටත්, වෙළඳපල තුළ ඖෂධ සුලබ කිරීමේ අරමුණින් දේශීය නිෂ්පාදකයන්ට හා පෞද්ගලික අංශය වෙනුවෙන් ඖෂධ ආනයනය කිරීමටත් 2022 අප්‍රේල් 06 දින වන විට පහත වගුව 02 හි දැක්වෙන ආකාරයට අනුමත කර තිබුණි. එහිදී ඉන්දියානු ණය යෝජනා ඖෂධ අනුකමිටුවක් පිහිටුවා එමඟින් තෝරා ගන්නා ලද ඉන්වොයිස්පත් මුදල් අමාත්‍යාංශය යටතේ පිහිටුවා තිබුණු ඉන්දියානු ණය යෝජනා සම්බන්ධීකරණ අංශය හරහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට යැවෙන අතර අදාළ අනුමැතීන් ලද පසු ආනයනකරුවන් විසින් ණයවර ලිපි විවෘත කිරීමට අවශ්‍ය මුදල ශ්‍රී ලංකා රුපියල් වලින් භාණ්ඩාගාර ගිණුමක තැන්පත් කළ යුතු වේ.

වගුව අංක - 02 : 2022 අප්‍රේල් 06 දිනට ණය ආධාර වෙන්කළ අංශ හා උපරිම ණය සීමා

ණය ආධාර වෙන්කළ අංශය	**ණය ලබාදීමේ උපරිම සීමාව**
	(එ.ජ.ඩො.මිලියන)
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සඳහා ඔසුසැල් සඳහා	126
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සඳහා	04
දේශීය නිෂ්පාදකයන් සඳහා	25
පෞද්ගලික අංශයේ සැපයුම්කරුවන් සඳහා	45
එකතුව	**200**

6.2.3 2022 අගෝස්තු 29 දිනැති ඉන්දියානු ණය යොජනා අනුකමිටු රැස්වීම් වාර්තාව අනුව එදිනට මෙම ඉන්දියානු ණය යෝජනා ක්‍රමය භාවිතා කරමින් ඉන්දියානු ණය යෝජනා අනු කමිටුව විසින් ඉහත පරිදි ණය ආධාර භාවිතා කරමින් එ.ජ.ඩො.මිලියන 109 ක් වටිනා අයිතම 1,372 ක් සඳහා ඉන්වොයිස්පත් අනුමත කර ඉදිරිපත් කර තිබුණු බව දක්වා තිබුණි. ඉන් එ.ජ.ඩො.මිලියන 68 ක් **වටිනා** ඉන්වොයිසිපත් 584 ක් සඳහා මුදල් අමාත්‍යාංශයේ ඉන්දියානු ණය යෝජනා ක්‍රමය සම්බන්ධීකරණ අංශයේ (Indian Credit Line Facility Cordination Unit - ICFCU) සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ අනුමැතිය හිමිව තිබුණු බවද දක්වා තිබුණි. ඒ අනුව එම වටිනාකම මුල් අවස්ථාවේ දී ඖෂධ සඳහා වෙන්කළ **එ.ජ.ඩො.මිලියන** 200 **ක** ණය මුදලෙන් සියයට 34 ක ප්‍රමාණයක් විය. විස්තර පහත දැක්වේ.

වගුව අංක - 03 : 2022 අගෝස්තු 29 දිනට ඉන්දියානු ණය යෝජනා අනුකමිටුව අනුමත කළ ණය ආධාර

ණය ආධාර වෙන්කළ අංශය	**ණය ලබා දීමේ උපරිම සීමාව**	**අනුමත කළ ණය ආධාර ප්‍රමාණය**
	(එ.ජ.ඩො.)	**(එ.ජ.ඩො.)**
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව		24,044,243
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා ආනයනය කර සැපයීමට	114,990,000	242,288
ඔසුසැල් සඳහා		13,028,077
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට	4,000,000	3,765,680
දේශීය නිෂ්පාදකයන් සඳහා	25,000,000	13,244,885
පෞද්ගලික අංශයේ සැපයුම්කරුවන් සඳහා	55,010,000	55,005,841
රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාව සඳහා	1,000,000	-
	200,000,000	109,331,014

වගුව අංක - **04 : 2022.10.21** දිනට ඉන්දියානු ණය ආධාර උපයෝජනයේ ප්‍රගතිය

	2022.08.29 දිනට ඉන්දියානු ණය යෝජනා ඖෂධ අනුකමිටුව විසින් අනුමත කරන ලද මුදල --- (එ.ජ.ඩො.)	2022.08.29 දිනට ඖෂධ අනුකමිටුව අනුමත කරන ලද ඉන්වොයිස් ප්‍රමාණය ---		2022.08.26 දිනට ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් අනුමත කරන ලද ඉන්වොයිස්වල වටිනාකම --- (එ.ජ.ඩො.)	2022.08.26 දිනට ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් අනුමත කරන ලද ඉන්වොයිස් ප්‍රමාණය ---		2022.08.26 දිනට ආනයනක රුවන් විසින් භාණ්ඩාගාරයේ ගිණුම වෙත තැන්පත් කරන ලද මුදල --- (එ.ජ.ඩො.)	2022.08.26 දිනට ආනයනක රුවන් විසින් භාණ්ඩාගාර ගිණුම වෙත මුදල් තැන්පත් කළ ඉන්වොයිස් ප්‍රමාණය ---		2022.10.21 දිනට ලද තොගවල වටිනාකම --- (එ.ජ.ඩො.)	2022.10.21 දිනට තොග ලද ඉන්වොයිස් ගණන ---
SPC (DHS)	24,044,243	398		9,899,985	113		53,244	04		4,654,693	50
Import & supply (SPC)	242,288	08		171,438	06		0	0			
Osusala	13,028,077	322		3,344,524	109		108,087	07		870,144	47
SPMC	3,765,680	22		1,555,120	08		373,500	01		1,781,780	05
Local Manufactures	13,244,885	236		5,644,303	92		608,631	12		-	-
Private sector suppliers	55,005,841	386		47,595,611	256		15,843,765	77		-	-
	--- 109,331,014 =========	--- 1,372 ====		--- 68,210,981 =========	--- 584 ====		--- 16,987,227 =========	--- 101 ====		--- 7,306,617 =========	--- 102 ====

6.2.4 2023 මැයි 19 දිනැති ඉන්දියානු ණය ආධාර අනුකමිටු රැස්වීම් වාර්තාව අනුව ඉහත 2022 අගෝස්තු 29 දිනෙන් මාස නවයකට පසු එනම් 2023 මැයි 19 දිනට ඉන්දියානු ණය ආධාර අනුකමිටුව අනුමත කරන ලද වටිනාකම් පහත වගුවෙහි දැක්වේ.

වගුව අංක - 05 : 2023 මැයි 19 දිනට අනුමත කළ ණය ආධාර

ණය ආධාර වෙන්කළ අංශය	**ණය ලබාදීමේ උපරිම සීමාව**	**අනුමත කළ ණය ආධාර ප්‍රමාණය**
		(එ.ජ.ඩො.)
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා වෛද්‍ය සැපයීම් අංශයට ඖෂධ මිලදී ගැනීමට (SPC -DHS)		72,346,466
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා ආනයනය කර සැපයීමට	116,954,957	280,038
වෛද්‍ය සැපයීම් අංශය හරහා ආනයනය කර සැපයීමට		2,105,155
වෛද්‍ය සැපයීම් අංශයට		4,490,377
ඔසුසැල් සඳහා		37,802,989
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීමට	3,908,580	3,908,580
දේශීය නිෂ්පාදකයන් සඳහා	12,773,403	12,773,403
පෞද්ගලික අංශයේ සැපයුම්කරුවන් සඳහා	73,817,032	69,878,047
2022.11.29 දින අතිරේක ප්‍රතිපාදන ලෙස එ.ජ.ඩො.මි. 35 ක් ලැබීම්	27,546,028	-
	235,000,000	203,585,055

6.2.5 කෙසේ වුවද 2022 වර්ෂයේ අවසන් කාර්තුවේ සිට 2023 වර්ෂයේ තුන්වන කාර්තුව දක්වා හදිසි මිලදී ගැනීම් යටතේ අභිලාෂ කැඳවීම් (EOI) හා අනායාචිත යෝජනා (Unsolicited Proposal) ඇතුළුව අනෙකුත් ක්‍රමවේදයන් යටතේ රු.මිලියන 29,575 ක් වටිනා වෛද්‍ය සැපයීම් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

6.3 ශ්‍රී ලංකාව තුළ ඖෂධ නියාමනය සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ කාර්යභාරය

ජාතික ඖෂධ ප්‍රතිපත්තියට අනුකූල වන ආකාරයට ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම, නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම ඇතුළු අදාළ වෙනත් සියලු කරුණු සහ සායනික පරීක්ෂණ පවත්වන ආකාරය නියාමනය කිරීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු රාජ්‍ය ආයතනය වශයෙන් 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතෙහි 1 වගන්තිය අනුව **(ඇමුණුම 05)** 2015 ජුනි 25 දිනැති අංක 1920/28 දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය **(ඇමුණුම 06)** මඟින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පනත එදින සිට බලාත්මක කර ඇත. ගුණාත්මක බව සහතික කළ ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂණ නිෂ්පාදන සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම අධිකාරියේ දැක්ම වූ අතර ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂණ නිෂ්පාදනවල ගුණාත්මකභාවය, ආරක්ෂාව හා ප්‍රත්‍යක්ෂභාවය සහතික කිරීම සඳහා නියාමන අධීක්ෂණ සහ සාධක පදනම් තීරණ රෝගීන්ගේ යහපත සඳහා ලබා දීම අධිකාරියේ මෙහෙවර විය. අධිකාරිය පිහිටුවීමේ අරමුණු අතුරින් ශ්‍රී ලංකාව තුළ ඖෂධ නියාමනයට අදාළව සෘජුව ම සම්බන්ධිත අරමුණු හා ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ **(ඇමුණුම 07).**

(i) ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්ත්වයෙන් යුතු ඖෂධ සාධාරණ මිලකට මහජනතාවට ලබා දෙන බවට තහවුරු කිරීම.

(ii) ඖෂධ ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම, ලියාපදිංචිය හෝ බලපත්‍ර අවලංගු කිරීම, නිෂ්පාදනය කිරීම, මිල නියම කිරීම, ආනයනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, බෙදා හැරීම, විකිණීම, ප්‍රචාරණය කිරීම සහ බැහැර කිරීම හා සම්බන්ධ සියලු කාරණා සඳහා මධ්‍යම නියාමක ලෙස කටයුතු කිරීම.

(iii) ඖෂධ ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම සහ ආනයනය කිරීමට අදාළ සියලු කටයුතු විනිවිදභාවයකින් යුතුව, තිරසාර ලෙස සහ සාධාරණ ආකාරයට සිදුකරන බවට තහවුරු කිරීම.

(iv) අත්‍යවශ්‍ය ඖෂධ සාධාරණ මිලකට පැවතීම සහතික කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ නිවැරදි තත්වයෙන් යුතු ඖෂධ නිෂ්පාදනය දිරිමත් කිරීම.

(v) සෞඛ්‍ය සත්කාර වෘත්තිකයන් හා පාරිභෝගිකයන් විසින් ඖෂධ ආරක්ෂාකාරී ලෙස සහ විචාරශීලී ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීම.

(vi) ඖෂධ සම්බන්ධයෙන් අදාළ නීති සඳහා උචිත සංශෝධන නිර්දේශ කිරීම.

(vii) ඖෂධ පිළිබඳ මහජනතාව, සෞඛ්‍ය සත්කාර වෘත්තිකයන් සහ ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන සියලු දෙනා දැනුවත් කිරීම.

(viii) ඖෂධ ප්‍රවර්ධනය හා අලෙවිකරණය නියාමනය කිරීම.

(ix) රට තුළ ඖෂධ පැවතීම නියාමනය කිරීම.

(x) ඖෂධවල තත්ත්වය, ආරක්ෂාකාරී බව සහ අහිතකර ප්‍රතික්‍රියාවන් පිළිබඳව පශ්චාත් අලෙවිකරණ සමීක්ෂණ පැවැත්වීම.

(xi) ශ්‍රී ලංකාවේ සායනික පරීක්ෂණ පැවැත්වීමට අදාළ සියලු කටයුතු නියාමනය කිරීම.

6.4 ඖෂධ නියාමන කාර්යයන් හා සම්බන්ධිත අධිකාරියේ ප්‍රධාන අංශ, කමිටු සහ ඒවායේ ප්‍රධාන කාර්යයන්

(i) ඖෂධ නියාමන අංශය (Medicines Regulatory Division - MRD)

ඖෂධවලට අදාළ සියලු කරුණු නියාමනය කිරීම සහ පාලනය කිරීම සඳහා අධිකාරිය හා සම්බන්ධීකරණ කටයුතු කිරීම සහ අධිකාරියට සහය වීම.

(ii) ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (National Medicines Quality Assurance Laboratory – NMQAL)

ලියාපදිංචිය සඳහා වූ ඉල්ලීම් සමඟ ඉදිරිපත් කරන ලද ඖෂධ, රටට ගෙන ඒමේ දී එකතුකරන ලද ඖෂධ, භාවිතා කරන්නන් විසින් පැමිණිල්ලක් වශයෙන් ඉදිරිපත් කරන ලද ඖෂධ, අධිකාරිය විසින් පශ්චාත් අලෙවි සමීක්ෂණයේ දී එකතු කරන ලද ඖෂධ සහ වෙනත් යම් හේතුවක් මත අධිකාරිය විසින් ඉදිරිපත් කරනු ලබන ඖෂධවල තත්ත්වය පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම.

(iii) ඖෂධ ඇගයීම් කමිටුව (Medicines Evaluation Committee – MEC)

ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන ඖෂධවලට අදාළ ප්‍රතිලාභ, අවදානම්, එම ඖෂධවල තත්ත්වය, ප්‍රත්‍යක්ෂභාවය, ආරක්ෂාකාරී බව, අවශ්‍යතාවය, මිල සහ ආර්ථික විශ්ලේෂණ පිළිබඳව නිශ්චිතව දක්වමින් තාක්ෂණික ඇගයීම සිදු කිරීම සහ ඒ පිළිබඳ වාර්තාවක් අධිකාරිය වෙත ඉදිරිපත් කිරීම.

(iv) ඖෂධ ඇගයීම් අනුකමිටුව (Medicines Evaluation Subcommittee – MESC)

ගුණාත්මක භාවය, ආරක්ෂාකාරී බව, ක්‍රියාකාරී බව සහ මිල සැලකිල්ලට ගනිමින් ඖෂධ නියාමන අංශය මඟින් සැකසූ වාර්තාව අනුමත කිරීම හෝ අවශ්‍ය අවස්ථාවල වෙනස් කිරීම මඟින් නිර්දේශ ඉදිරිපත් කිරීම සහ එම නිර්දේශ ඖෂධ ඇගයීම් කමිටුව වෙත වාර්තා කිරීම.

(v) ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුකමිටුව (Waiver of Registration Subcommittee –WORSC)

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 109 වන වගන්තිය ප්‍රකාරව **(ඇමුණුම 08)** අධිකාරිය වෙත ලැබී ඇති බලතල මත ලැබෙන ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අයදුම්පත්, හදිසි අවස්ථා සහ වෙනත් විශේෂ අවස්ථානුගත කරුණු සලකා බලා අවශ්‍ය පරිදි නිර්දේශ කිරීම, අනුමත කිරීම හා අවසර ලබා දීම සහ ඒ පිළිබඳව ඖෂධ ඇගයීම් කමිටුව වෙත වාර්තා කිරීම.

(vi) මිල නියම කිරීමේ කමිටුව (Pricing Committee – PC)

යම් ඖෂධයක මිල තීරණය කිරීමේ දී බලපාන්නා වූ අදාළ තොරතුරු සහ දත්ත ලබා ගැනීම සඳහා අධිකාරිය වෙත සහාය ලබා දීම, ඖෂධයක හදුන්වාදීමේ මිල, උපරිම සිල්ලර මිල සහ මිල ප්‍රතිශෝධනයන් පිළිබඳ ක්‍රම අධිකාරිය වෙත නිර්දේශ කිරීම, යම් ඖෂධයක මිල අඩු කිරීමක් හෝ වැඩි කිරීමකට හෝ පවතින මිල පවත්වා ගෙන යාමට අධිකාරිය වෙත නිර්දේශ කිරීම සහ යම් ඖෂධ නිෂ්පාදනයක මිල උච්චාවචනය වීම අධික්ෂණය කිරීම.

(vii) ආරක්ෂාව හා අවධානම් ඇගයීමේ අනුකමිටුව (Safety and Risk Evaluation Subcommittee –SAFRESC)

ඖෂධ සුරක්ෂිතතාව පිළිබඳ අධික්ෂණ කටයුතු කාර්යක්ෂම කර ගැනීම සඳහා හේතුඵල ඇගයීම, අවධානම් ඇගයීම, අවධානම් කළමනාකරණය, සිද්ධි විමර්ශනය, අවශ්‍ය අවස්ථාවලදී අර්බුදකාරී තත්ත්වයන් සන්නිවේදනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා තාක්ෂණික සහය සැලසීම.

(viii) ඖෂධ නැවත කැඳවීම් කළමනාකරණ කමිටුව (Recall Management Committee)

ඖෂධ සම්බන්ධයෙන් ගැටලු ඇතිවන අවස්ථාවල දී එම ඖෂධ නැවත කැඳවීම පිළිබඳ අධිකාරියට නිර්දේශ ලබා දීම.

6.5 කොවිඩ් වසංගතය හා විනිමය අර්බුදය පවතින කාලය තුළ හදිසි මිල දී ගැනීම් ක්‍රියාවලිය සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතීන් හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට සිදු කරන ලද සංශෝධන

6.5.1 කොවිඩ් වසංගත කාලයේ දී අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සම්පාදනයට අදාළව එවකට ජනාධිපතිතුමන් විසින් 2020 අප්‍රේල් 01 දිනැතිව ඉදිරිපත් කරන ලද අංක 20/0694/201/016 දරන අමාත්‍ය මණ්ඩල සටහනෙහි 16(i) **(ඇමුණුම 09)** අනුව එදිනම පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී, කොරෝනා වසංගතයට අදාළ හදිසි ප්‍රසම්පාදනයන් පහසුවෙන් සිදුකිරීමට ජාතික ප්‍රසම්පාදන

කොමිෂන් සභාව විමසමින් ප්‍රසම්පාදන අත්පොතට අදාළ පරිපූරක 35හි විධිවිධාන තවදුරටත් ලිහිල් කොට, ඉතාමත් සරල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිකුත් කරන ලෙසට 2020 අප්‍රේල් 09 දින නියම කර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල් වෙත නියම කර තිබුණි **(ඇමුණුම 10).** එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව භාණ්ඩාගාර ලේකම් විසින් 2020 අප්‍රේල් 09 දිනැති අංක PFD/PMD/149/000/2020-02 දරන ලිපිය **(ඇමුණුම 11)** මඟින් කොවිඩ් සම්බන්ධ හදිසි ප්‍රසම්පාදනයන් සිදුකිරීමේ දී 2006 ප්‍රසම්පාදන අත්පොතෙහි 35 වන අතිරේකයෙහි ප්‍රතිපාදන තවදුරටත් ලිහිල් කිරීමට කටයුතු කර තිබුණි. නමුත් භාණ්ඩාගාර ලේකම්ගේ 2020 අප්‍රේල් 09 දිනැති ලිපිය වෙනුවට නැවතත් 2020 ඔක්තෝබර් 12 දිනැතිව නිකුත් කරන ලද අංක PFD/PMD/149/000/2020-02 දරන ලිපිය **(ඇමුණුම 12)** මඟින් කොවිඩ් 19 හා සම්බන්ධ හදිසි මිලදී ගැනීම් සඳහා 2006 ප්‍රසම්පාදන අත්පොතේ 35 වන අතිරේකය යටතේ තවදුරටත් සහන ලබාදීමේ ප්‍රතිපාදනයන් ලබා දී තිබුණි. මේ යටතේ සංශෝධනය කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ තාවකාලික කාලසීමාවකට අදාළ වන බවටත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට ලබා දී ඇති සහනයන් මඟින් විනිවිදභාවයෙන් හා වගකීම් සහගතව ප්‍රසම්පාදන අස්ථිත්වයේ මුදලට උපරිම වටිනාකමක් ලබා දෙන බවට අදාළ ප්‍රසම්පාදන කමිටුව හා ප්‍රසම්පාදන අස්ථිත්වය සහතික විය යුතු බවටත්, පවත්නා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට ලබා දී ඇති සහනයන් කොවිඩ් 19 හදිසි තත්ත්වයට සෘජුවම අදාළ හදිසි මිලදී ගැනීම් සඳහා පමණක් සලකා බැලීමටත් තවදුරටත් එම ලිපියෙන් උපදෙස් ලබා දී තිබුණි.

6.5.2 එමෙන්ම කොවිඩ් 19 හදිසි තත්ත්වය සඳහා සෘජුවම සම්බන්ධ, සංශෝධනය කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මඟින් ප්‍රසම්පාදන කමිටුවල අධිකාරී සීමාවන් ඉහළ නැංවීම, ලංසු කැඳවීම්, නැවත ඇණවුම් කිරීම්, ලංසු ආරක්ෂණය සියයට 0 දක්වා අඩු කිරීම, හදිසි මිලදී ගැනීම් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන අභියාචනා ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවීම ආදී සහනයන් සලසා තිබුණු නමුත් එහිදී ප්‍රසම්පාදන කමිටුව හා ප්‍රසම්පාදන අස්ථිත්වය ඇගයීම් ක්‍රියාවලියේ දී උපරිම අවධානයෙන් ක්‍රියාකළ යුතු බවටත් දන්වා තිබුණි.

6.5.3 කොවිඩ් 19 වසංගතයේ තෙවන රැල්ල සමය තුළ PCR ධාරිතාව වැඩි කිරීම මැයෙන් නැවතත් එවකට සිටි සෞඛ්‍ය අමාත්‍යවරිය විසින් 2021 මැයි 01 දින ඉදිරිපත් කරන ලද අංක 21/0791/309/040 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට **(ඇමුණුම 13)** 2021 මැයි 03 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී **(ඇමුණුම 14)** අනුමැතිය ලබාදී තිබුණි. ඒ අතර 2020 අප්‍රේල් 01 දිනැති හා 2021 මැයි 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පදනම් කරගනිමින් භාණ්ඩාගාර ලේකම්ගේ අංක PFD/PMD/COVID19/Guide/21 හා 2021 මැයි 13 දිනැති ලිපිය **(ඇමුණුම 15)** මඟින් "කොවිඩ් 19 හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය " (COVID 19 Emergency Procument Process - CEPP) යනුවෙන් නව මාර්ගෝපදේශයක් නිකුත් කර තිබුණි.

6.5.4 ඉහත 6.5.3 හි ඡේදයෙහි සඳහන් මාර්ගෝපදේශයට ආවරණ අනුමැතිය ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යවරයා විසින් 21/0883/304/076 අංක දරන කෝවිඩ් 19 හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය හඳුන්වා දීම මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2021 මැයි 17 දින මාර්ගෝපදේශය ඇමුණුම 01 ලෙස ද දක්වමින් **(ඇමුණුම 16)** ඉදිරිපත් කර තිබුණි. තවද එම සංදේශය මඟින් රටෙහි පවතින හදිසි තත්ත්වය සැලකිල්ලට ගෙන සංදේශයේ ඇමුණුම 01 හි සඳහන් කර ඇති පරිදි කෝවිඩ් 19 හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් ගනු ලබන තීරණ අදාළ බලධාරීන් විසින් සෑම මසකම අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු බවත් , ප්‍රසම්පාදන අස්ථිත්වයේ අභ්‍යන්තර විගණනය විසින් මෙම ක්‍රියාවලියේ ඵලදායීත්වය සාධාරණ බව සනාථ කළ යුතු බවත් දක්වමින් අදාළ මාර්ගෝපදේශය අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කර තිබුණි. එදින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී මෙම මාර්ගෝපදේශ නිකුත් කිරීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබාදීමට තීරණය කර තිබුණි **(ඇමුණුම 17).**

6.5.5 එම මාර්ගෝපදේශ මඟින් කොවිඩ් වසංගතය හමුවේ පවත්නා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු සඳහා ආමන්ත්‍රණය කිරීමටත්, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සම්මත තරඟකාරී ලංසු ක්‍රියාවලියට අනුගත නොවී කටයුතු කිරීමටත්, කෝවිඩ් 19 හදිසි ප්‍රසම්පාදන කමිටුව (COVID 19 Emergency Procument Committee - **CEPC**) පිහිටුවන බවටත්, එම කමිටුව අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු (SCAPC, CAPC, CANPC) වෙනුවට ක්‍රියාකරන බවටත්, ඊට සම්බන්ධිත හදිසි මිලදී ගැනීම් ප්‍රසම්පාදනයන්හිදී, තාක්ෂණික ඇගයීම් කමිටු පත් නොකෙරෙන බැවින් තාක්ෂණික විශේෂඥයින්ගේ උපදෙස් ලබාගත හැකි බවටත් දක්වා තිබුණි.

6.5.6 එසේම මෙම කමිටුව මඟින් පවරන ප්‍රසම්පාදනයන් පිළිබඳව අදාළ අමාත්‍ය/ රාජ්‍ය අමාත්‍යවරයා දැනුවත් කළ යුතු අතර, අදාළ අමාත්‍යවරයා විසින් එම ප්‍රසම්පාදනයන්හි මිලදී ගත් අයිතමයන් පිළිබඳ මිලදී ගැනීමේ අවශ්‍යතාවය සාධාරණීකරණය කරමින් මිලදී ගත් අයිතම, සැපයුම්කරු සහ වටිනාකම ඇතුළත්වන පරිදි මාසික වාර්තාවක් අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතියට ඉදිරිපත් කළ යුතු විය. තවද ප්‍රසම්පාදන අස්ථිත්වයේ අභ්‍යන්තර විගණක විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිරීක්ෂණය කළ යුතු අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසානයේ දී සාධාරණ හා ඵලදායී ක්‍රියාවලියක් සහතික කිරීමට වාර්තා කළ යුතු බවද එම මාර්ගෝපදේශයේ දක්වා තිබුණි.

6.5.7 **මේ අතර අර්බුදකාරී තත්ත්වය තුළ හදිසි අත්‍යවශ්‍ය ඖෂධ, වෛද්‍ය උපකරණ සහ උපාංග මිලදී ගැනීම මැයෙන්** සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් 2022 මැයි 30 දින ඉදිරිපත් කරන ලද අංක දරන 22/0734/540/001 අමාත්‍ය මණ්ඩල සංදේශය (ඇමුණුම 18) මඟින් අර්බුදකාරී තත්ත්වය තුළ ඖෂධ, වෛද්‍ය උපකරණ හදිසි මිලදී ගැනීමේ ක්‍රියාවලිය මෙහෙයවීම, බලගැන්වීම සඳහා 2021 මැයි 13 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ ස්ථාපිත කෙරුණු කොවිඩ් 19 හදිසි

ප්‍රසම්පාදන කමිටුව තවදුරටත් පවත්වා ගනිමින් එහි විෂය පථය පුළුල් කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාවරයා විසින් 2022 ජුනි 01 දින ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ මඟින් සංදේශයේ යෝජනාව සඳහා එකඟත්වය පළකළ අතර කොවිඩ් සම්බන්ධ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මාර්ගෝපදේශයන්ට සමාන ප්‍රතිපාදනයන් ඇතුළත් කරමින්, 2022 ජුනි සිට 2022 දෙසැම්බර් දක්වා කාලය සඳහා සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සඳහා නව මාර්ගෝපදේශයක් ඉදිරිපත් කර තිබුණි **(ඇමුණුම 19)**. 2022 ජුනි මස 06 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණයන්ට ඇමුණුම A ලෙස යා කොට තිබුණු සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වන මාර්ගෝපදේශ කඩිනමින් නිකුත් කිරීමට භාණ්ඩාගාරයේ ලේකම්ට බලය පැවරීමටත්, එකී මාර්ගෝපදේශ අනුගමනය කරමින් ඉදිරියේ දී හදිසි අත්‍යවශ්‍ය ඖෂධ, වෛද්‍ය උපකරණ සහ උපාංග මිලදී ගැනීමටත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ට නියම කර තිබුණි. **(ඇමුණුම 20)**

6.5.8 ආර්ථික අර්බුදකාරී තත්ත්වය තුළ පවත්නා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී පැන නගින ගැටලු හේතුවෙන් හදිසියේ අවශ්‍යවන්නා වූ අත්‍යවශ්‍ය ඖෂධ හා වෛද්‍ය උපකරණවල පැවති හිඟතාවයට ආමන්ත්‍රණය කිරීමට මුදල් අමාත්‍යාංශ ලේකම් 2022 ජුනි 16 දිනැතිව නිකුත් කරන ලද අංක PFD/PMD/Health/HSEPP/01/2022 දරන ලිපිය **(ඇමුණුම 21)** අනුව සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් (Health Sector Emergency Procument Process- **HSEPP**) සඳහා මාර්ගෝපදේශ සකස් කර ඉදිරිපත් කර තිබුණු අතර, එමඟින් රජයේ සෞඛ්‍ය අංශයේ ප්‍රසම්පාදන අස්පීත්වයන් සඳහා 2022 ජුනි මස සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ රජයේ මාර්ගෝපදේශ අනුව සම්මත තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලියට අනුගත නොවී ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අධිකාරී බලය ලබා දී තිබුණි.

6.5.9 එහිදී අත්‍යවශ්‍ය ඖෂධ හා වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට ‘‘සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුවක්’’ (Health Sector Emergency Procument Committee - HSEPC) පත්කර තිබුණු අතර එය 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය හා සම්බන්ධිත අත්පොත් හා චක්‍රලේඛනයන්හි සඳහන් අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු (SCAPC/ CAPC/ CANPC) වෙනුවට ක්‍රියාත්මක කිරීමටත්, ඊට සම්බන්ධිත හදිසි මිලදී ගැනීම් ප්‍රසම්පාදනයන්හිදී, තාක්ෂණික ඇගයීම් කමිටු පත් නොකෙරෙන බැවින් තාක්ෂණික විශේෂඥයින්ගේ උපදෙස් ලබාගත හැකි බවටත් දක්වා තිබුණි. මෙම කමිටුව මඟින් ද පවරන ප්‍රසම්පාදනයන් පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යවරයා දැනුවත් කළ යුතු අතර, සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් එම ප්‍රසම්පාදනයන්හි මිලදී ගත් අයිතමයන් පිළිබඳ මිලදී ගැනීමේ අවශ්‍යතාවය සාධාරණීකරණය කරමින් මිලදී ගත් අයිතම, සැපයුම්කරු සහ වටිනාකම ඇතුළත්වන පරිදි මාසික වාර්තාවක් අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතියට ඉදිරිපත් කළ යුතු විය. එසේම පෙර සඳහන් කොවිඩ් හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී මෙන්ම

ප්‍රසම්පාදන අස්ථිත්වයේ අභ්‍යන්තර විගණක විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිරීක්ෂණය කළ යුතු අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසානයේ දී සාධාරණ හා ඵලදායී ක්‍රියාවලියක් සහතික කිරීමට වාර්තා කළ යුතු විය.

6.5.10 ඒ අනුව එම නව මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.2 ඡේදය අනුව සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය	සභාපති
අධ්‍යක්ෂ ජනරාල් හෝ සමාන තනතුරක, මුදල් අමාත්‍යාංශය	සාමාජික
ප්‍රසම්පාදන අස්ථිත්වයේ ප්‍රධානියා හෝ ඔහුගේ නාමිකයා	සාමාජික

6.5.11 තවද නව මාර්ගෝපදේශයෙහි 2.3 ඡේදය අනුව හදිසි තත්ත්වය මත පදනම්ව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය, තනි මූලාශ්‍ර (single source selection) හෝ වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යන ප්‍රසම්පාදන ක්‍රමයන්ගෙන් එකක් අනුගමනය කළ හැකිව තිබුණු අතර, සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් අවශ්‍ය ප්‍රමිතිය හා ගුණාත්මකභාවය පිළිබඳව සෑහීමකට පත්වන්නේ නම් දේශීය නිෂ්පාදකයන්ගෙන් මිලදී ගැනීම ප්‍රවර්ධනය කර තිබුණි.

6.5.12 එසේම ආර්ථික අර්බුදකාරී තත්ත්වය තුළ හදිසි අත්‍යවශ්‍ය ඖෂධ, වෛද්‍ය උපකරණ සහ උපාංග මිලදී ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් 2023 ජනවාරි 31 දින ඉදිරිපත් කරන ලද අංක 23/0302/640/005 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය **(ඇමුණුම 22)** මඟින් හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2023 ජුනි 30 දක්වා නැවතත් දීර්ඝ කරන ලෙස ඉල්ලා තිබුණි. මේ සම්බන්ධයෙන් 2023 පෙබරවාරි 06 දින මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණවලට අනුව මිල විචලනයන් හා අනායාචිත යෝජනා (Unsolicited Proposal) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මුදල් අමාත්‍යාංශය වෙත කරන ලද බොහොමයක් ඉල්ලීම් සලකා බැලීමේ දී ආයතන අතර පවතින දුර්වල සම්බන්ධීකරණය හා දුර්වල ප්‍රසම්පාදන සැලසුම් හේතුවෙන් ප්‍රසම්පාදන සැලැසුම් හා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් ඇති බව මුදල් අමාත්‍යවරයා නිරීක්ෂණය කරන බව දක්වා තිබුණි. තව දුරටත් අමාත්‍ය මණ්ඩලය විසින් 2011 ජනවාරි 12 දින ලබා දුන් අනුමැතියට අනුව ඖෂධ සඳහා ප්‍රසම්පාදන සැලසුම් කමිටුව වහාම ක්‍රියාත්මක වන පරිදි පත්කිරීමට ද යෝජනා කර තිබුණි. එසේ වුවද ඖෂධ සම්බන්ධව අඛණ්ඩ සැපයීම සලකා බලා ඉහත සංදේශයෙහි සඳහන් යෝජනාව සම්බන්ධයෙන් විරෝධතාවයක් නොමැති බව ද මුදල් අමාත්‍යවරයා දක්වා තිබුණු අතර **(ඇමුණුම 23)** 2023 පෙබරවාරි 13 දින රැස්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී මුදල් අමාත්‍යවරයා ගේ නිරීක්ෂණවලට සැලකිල්ලක් දක්වමින් කටයුතු කරන ලෙස අවධාරණය කරමින් ඒ සඳහා අනුමැතිය ලැබී තිබුණි **(ඇමුණුම 24)**.

6.5.13 සුපුරුදු ප්‍රසම්පාදන ක්‍රියාවලිය එහි උපරිම මට්ටමින් ස්ථාපිත වනතුරු අර්බුදකාරී තත්ත්වය තුළ භාණ්ඩ හිඟය මහහරවා ගැනීම උදෙසා සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වන මාර්ගෝපදේශ බලපැවැත්වෙන කාලසීමාව 2023 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කිරීමට අනුමැතිය ඉල්ලමින් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් නැවතත් 2023 ජුනි 19 දින අංක 23/1223/640/022 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය **(ඇමුණුම 25)** ඉදිරිපත් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් 2023 ජුනි 28 දින මුදල් අමාත්‍යවරයා විසින් ඖෂධ හා වෙනත් වෛද්‍ය සැපයීම් මිලදී ගැනීමට හදිසි ප්‍රසම්පාදන ප්‍රතිපාදනයන් භාවිතා කිරීමෙන් ප්‍රසම්පාදන පිරිවැය ඉහළ යාම පමණක් නොව පිළිගත් ප්‍රසම්පාදන හොඳම භාවිතයන්ගෙන් අපගමනය වීමට තුඩු දෙනු ඇති බවත්, හදිසි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලංගු කාලය දීර්ඝ කිරීමේ දී අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ප්‍රසම්පාදන කාල රාමුව, ලංසු සුරක්ෂණය, කාර්යසාධන ඇපකර ආදී ප්‍රසම්පාදන කොන්දේසි සුදුසු පරිදි වෙනස් කිරීම් කරන ලෙසද නිරීක්ෂණය කර තිබුණි **(ඇමුණුම 26).**

6.5.14 ඒ සම්බන්ධයෙන් 2023 ජූලි 04 දින රැස්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගේ නිරීක්ෂණ සහ සංදේශයේ සඳහන් යෝජනාව පිළිබඳව එම රැස්වීමේ දී සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සිදුකරන ලද වැඩිදුර කරුණු පැහැදිලි කිරීම් සමඟ සලකා බලා සංදේශයේ සඳහන් යෝජනාව සඳහා අනුමැතිය ලබා දී තිබුණි **(ඇමුණුම 27).** එහිදී අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් කරුණු 05 ක් පිළිබඳව අධ්‍යයනය කර නිර්දේශ සහිත වාර්තාවක්, අමාත්‍ය මණ්ඩලය වෙත මාසයක කාලසීමාවක් තුළ ඉදිරිපත් කිරීමට ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීමට ද ජනාධිපති ලේකම් වෙත බලය පවරා තිබුණි.

6.6 හදිසි මිල දී ගැනීම් ක්‍රියාවලිය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ මැදිහත්වීම

6.6.1 ඉන්දියානු ණය යෝජනා අනුකමිටුවේ සභාපති විසින් 2022 සැප්තැම්බර් 01 දින ඉන්දියානු ණය යෝජනා යටතේ ආනයනය කිරීමට බලාපොරොත්තු වන සියළුම අයිතම ලබා ගැනීමේ දිනයන් සංශෝධනය කරගැනීමට 2023 ජනවාරි 31 ට පෙර ක්‍රියාකළ යුතු වීමත්, ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගැනීමට හැකි නව ඇණවුම් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ඉදිරිපත් කරන ලෙසත් වෛද්‍ය සැපයීම් අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා තිබුණි **(ඇමුණුම 28).**

6.6.2 2022 සැප්තැම්බර් 22 දින ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම් විසින් වෛද්‍ය සැපයීම් අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත එවන ලද ලිපිය මඟින් **(ඇමුණුම 29)** ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ පුද්ගලික සැපයුම්කරුවන්ගෙන්

මාසයකට අඩු තොග මට්ටම් ඇති ඖෂධ ප්‍රසම්පාදනයන් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාවරයා සමඟ පැවති රැස්වීමක දී තීරණය කර තිබුණු බව දන්වා තිබුණි. ඒ අනුව මාස තුනකට ප්‍රමාණවත් තොග හදිසි මිලදී ගැනීම් ලෙස ලබා ගැනීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ඇණවුම් ඉදිරිපත් කිරීමටත්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මාස දෙකක් දක්වා ප්‍රමාද වන බැවින් එම අවස්ථා වන විට ලැබීමට නියමිත ඇණවුම් පිළිබඳ නොසලකා ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීමටත් දන්වා තිබුණි.

6.6.3 ඉහත 6.6.2 ඡේදයෙහි සඳහන් ලිපියෙහිම 2022 සැප්තැම්බර් 23 දින වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් සටහනක් යොදමින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ඇණවුම් ඉදිරිපත් කිරීමට දැනුම් දී තිබුණි. ඉහත ඡේදයෙහි සඳහන් අතිරේක ලේකම්ගේ උපදෙස් පරිදි ඊට දින 03කට පසුව එනම් 2022 සැප්තැම්බර් 26 දින අංක 2022/SPC/V/P/09/2022 දරන ලිපිය වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මාසයකට වඩා අඩු තොග මට්ටම් පවතින ඖෂධ අයිතම සඳහා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ මාස 03 ක කාලයක් සඳහා, ලැබිය යුතු තොග පිළිබඳ නොසලකා (pending order) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත රු.මිලියන 4,150.11 ක් වටිනා ඖෂධ අයිතම 182 ක් සඳහා ඇණවුම් ඉදිරිපත් කර තිබුණි **(ඇමුණුම 30).**

6.6.4 ශ්‍රී ලංකාව තුළ අඛණ්ඩ වෛද්‍ය සැපයීම් සේවාවක් පවත්වාගෙන යාමේ අරමුණින් එවකට සිටි සෞඛ්‍ය අමාත්‍යාවරයා විසින් 2022 සැප්තැම්බර් 26 දින ඉදිරිපත් කළ අංක 22/1523/610/018 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය **(ඇමුණුම 31)** මඟින් රජයේ සෞඛ්‍ය ආයතනවල පවත්නා උග්‍ර වෛද්‍ය සැපයීම් හිඟය මඟහරවා ගනිමින් අඛණ්ඩ වෛද්‍ය සැපයීම් සේවාවක් පවත්වා ගැනීමටත්, ඉන්දියානු ණය යෝජනා ක්‍රමය වසර අවසානයේ අවලංගු වන බවටත්, ඊට පෙර එය උපයෝජනය කළ යුතු බවටත්, එහි ඉතිරි අරමුදල් භාවිතා කරමින් හදිසි ප්‍රසම්පාදන ලෙස ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය යටතේ වෛද්‍ය සැපයුම් ආනයනය කිරීමට පුද්ගලික අංශයේ ආනයනික නියෝජිතයන්ට අවසරය ලබාදීමටත්, ඔවුන්ගෙන් මාස 03කට ප්‍රමාණවත් වෛද්‍ය සැපයුම් තොග මිලදී ගැනීමටත්, ඒ සඳහා අමාත්‍යාංශයේ මිල කමිටුව භාවිතා කරනු ලබන මිල තීරණය කිරීමේ පවතින ක්‍රමවේදයම භාවිතා කිරීම සඳහා විසඳුම් යෝජනා කර තිබුණි. ඊට අමතරව සෞඛ්‍ය අමාත්‍යාවරයා විසින් සංදේශයේ 3.3 යටතේ ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි නොමැති අයිතම අර්බුදකාරී තත්ත්වය හමුවේ ආනයනය කිරීම ප්‍රමාදවීම අවම කිරීම සඳහා ආනයනය කිරීමට පෙර නිසි ලෙස ලියාපදිංචිය නිදහස් කිරීමේ ක්‍රියාවලියකට යටත් විය යුතු බවද යෝජිත විසඳුමක් ලෙස අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණි. එම සංදේශයෙන් පහත සඳහන් කරුණු සඳහා අනුමැතිය ඉල්ලා තිබුණි.

(i) වෛද්‍ය සැපයීම් අංශයේ හදිසි අවශ්‍යතාවය මත පදනම්ව ඉන්දියානු ණය යෝජනා ක්‍රමය (Indian Credit Line - ICL) යටතේ ඉතිරි අරමුදල් භාවිතා කරමින් හදිසි

ප්‍රසම්පාදන ලෙස ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය යටතේ වෛද්‍ය සැපයුම් ආනයනය කිරීමට පුද්ගලික අංශයේ ආනයනික නියෝජිතයන්ට අවසර ලබාදීමත්,

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශයේ මිල කමිටුව විසින් තීරණය කර ඇති පවත්නා මිලදී ගැනීමේ යාන්ත්‍රණයට යටත්ව ඉන්දියානු ණය යෝජනා ක්‍රමය භාවිතා කරමින් වෛද්‍ය සැපයීම් ආනයනය කරනු ලබන පෞද්ගලික ආනයන නියෝජිතයන්ගෙන් මාස 03 කට ප්‍රමාණවත් වෛද්‍ය සැපයීම් තොග මිලදී ගැනීමට වෛද්‍ය සැපයීම් අංශයට අනුමැතිය ලබාදීමත් විය.

මේ පිළිබඳව සලකා බැලූ අමාත්‍ය මණ්ඩලය එම යෝජනා 02 සඳහා 2022 ඔක්තෝබර් 03 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි **(ඇමුණුම 32).**

6.6.5 ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ මාස 03 ක් සඳහා වැදගත් හා අත්‍යවශ්‍ය ඖෂධ ආනයනය කර සැපයීම පිළිබඳව 2022 සැප්තැම්බර් 22 දින සෞඛ්‍ය අමාත්‍යවරයා හා ඖෂධ සැපයුම්කරුවන් අතර පැවති රැස්වීම් තීරණයකට අනුව ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම් හා වෛද්‍ය නිලධාරී (ප්‍රසම්පාදන) විසින් ඒකාබද්ධව 2022 සැප්තැම්බර් 27 දින ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර සටහනක් මඟින් වැදගත් හා අත්‍යවශ්‍ය ඖෂධ ආනයනය හා සැපයීමට සැපයීම්කරුවන්ට ආරාධනා කිරීම සඳහා සකස් කළ අභිලාෂ කැඳවීමේ ලේඛන සඳහා අනුමැතිය සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගෙන් ඉල්ලා තිබුණි. තවද මෙම අභිලාෂ කැඳවීමේ ලේඛන අදාළ වෙබ්අඩවිවල පළකිරීම සඳහාත් අනුමැතිය ඉල්ලා තිබුණි. තවද ප්‍රමුඛතා ලේඛන 04 ක් යටතේ ඖෂධ අයිතම 285 ක් මිලදී ගැනීම සඳහා අභිලාෂ කැඳවීමේ ලේඛන ද සකස් කර අනුමැතිය සඳහා සෞඛ්‍ය ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණි **(ඇමුණුම 33).** ඒ අනුව සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතිය මත එම ලේඛන එදිනම රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන වෙබ් අඩවියේ (PROMISE.lk) පළකර තිබුණි. මෙදිනම අභිලාෂ කැඳවීම් විවෘත කිරීමේ කමිටු 06 ක් හා අතිරේක කමිටු 02 ක් පත්කිරීමට ද සෞඛ්‍ය ලේකම් විසින් ඉහත ඇමුණුම 33 හි දැක්වෙන පරිදි අනුමත කර තිබුණු අතර 2022 සැප්තැම්බර් 28 දිනැතිව අදාළ පත්වීම් ලිපි නිකුත් කර තිබුණි. 2022 සැප්තැම්බර් 30 දින සෞඛ්‍ය ලේකම් විසින් අභිලාෂ කැඳවීමට අදාළව අතිරේක ලේකම්වරියකගේ සභාපතිත්වයෙන් පහත පරිදි පස් දෙනෙකුගෙන් සමන්විත ඇගයීම් කමිටුවක් පත්කර තිබුණි **(ඇමුණුම 34).**

වගුව අංක - 06 : ඇගයීම් කමිටු සාමාජිකයින්

	නම	තනතුර
1.	යූ.එස්.කේ දෙනාවත්ත මිය	අතිරේක ලේකම්, (පාලන), සෞඛ්‍ය අමාත්‍යාංශය
2.	වෛද්‍ය ඒ.ටී. සුදර්ෂණ මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ, වෛද්‍ය සැපයීම් අංශය
3.	වෛද්‍ය ජයනාත් බුත්පිටිය මයා	වෛද්‍ය නිලධාරී, (ප්‍රසම්පාදන), සෞඛ්‍ය අමාත්‍යාංශය
4.	ඩී.එච්.ආර්.එන් පේමතුංග මිය	අභ්‍යන්තර විගණක, සෞඛ්‍ය අමාත්‍යාංශය **
5.	පී.ඩී.සොලමන් මිය	සහකාර අධ්‍යක්ෂ (ඖෂධ), වෛද්‍ය සැපයීම් අංශය

** මෙම කමිටුවට පත්කරන විට පේමතුංග මිය සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක නොවේ.

6.6.6 මෙම අභිලාෂ කැඳවීම් ක්‍රියාවලියේ ව්‍යාපෘති කළමනාකරු ලෙස සෞඛ්‍ය ලේකම්වරයා නම්කර තිබුණු අතර දෙවැනි සම්බන්ධීකරණ නිලධාරියා ලෙස අභිලාෂ කැඳවීම සඳහා සම්බන්ධ වූ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශ අතිරේක ලේකම්වරයා ඉහත ඇමුණුම 33 හි පරිදි නම්කර තිබුණි. මෙම අභිලාෂ කැඳවීම 2022 ඔක්තෝබර් 03 පෙ.ව.11.00 ට අවසන් වන බවත්, කෙටි ලැයිස්තුගත කිරීම (Intended completion date of short listing process) දින 02 ක් තුළ සිදුකරන බවත්, ඇගයීම් කටයුතු 2022 ඔක්තෝබර් 07 දින නිම කරන බවටත් (Intended completion date of evaluation of invitee's responses) අභිලාෂ කැඳවීමේ ලේඛනයේ දක්වා තිබුණි. එසේම අභිලාෂ කැඳවීමේ ලේඛනයේ අනුගම්‍ය අවශ්‍යතා යටතේ (Mandatory Requirement) ශ්‍රී ලංකාවට ඖෂධ ආනායනය කිරීම සඳහා සැපයුම්කරුට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් තිබිය යුතු අතර මිල සාධකය සලකා අධිකාරියේ ලියාපදිංචිය නොමැති අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුවන්ට ලියාපදිංචිය නිදහස් කිරීමට තෝරා ගැනීමට හැකි බවත්, එවැනි ලංසුකරුවන් සඳහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික (WOR) නිකුත් කිරීම සලකා බැලිය හැකි බවත් දක්වා තිබුණි.

6.6.7 අධිකාරියේ ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ට අභිලාෂ කැඳවීමේ ලේඛන (Expression of Interest - EOI) සමඟ ලියාපදිංචිය නිදහස් කිරීමට පහත සඳහන් ලිපිලේඛන අවශ්‍ය බවද දක්වා තිබුණි.

i. අයදුම්කරුගේ ඉල්ලීම් ලිපිය
ii. සම්පූර්ණ කරන ලද WOR අයදුම්පත්‍රය
iii. අදාළ නිෂ්පාදනයෙහි විශ්ලේෂණ සහතිකය (COA)
iv. ඖෂධ නිෂ්පාදන සහතිකය (COPP)
v. වෙළඳ ඉන්වොයිසිය ඇතුළු ලේඛන

6.6.8 මේ අතර ඉන්දියාවේ The Savorite pharmaceuticals (pvt) Ltd නමැති පුද්ගලික සමාගමක් විසින් සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත 2022 ඔක්තෝබර් 21 දිනත් **(ඇමුණුම 35),** වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත 2022 ඔක්තෝබර් 28 දිනත් **(ඇමුණුම 36)** අත්‍යවශ්‍ය ඖෂධ සැපයීමට අදාළව ලිපි යොමුකර තිබුණු අතර, එමඟින් අදාළ සමාගම සතුව පවතින ඖෂධ අයිතම 38 ක අතිරික්ත තොග සම්පාදනය කිරීමට යෝජනා කර තිබුණි.

6.6.9 මේ සම්බන්ධයෙන් එවකට සිටි සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් 2022 ඔක්තෝබර් 25 දින නැවතත් 22/1523/610/024 අංක දරන අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරමින් **(ඇමුණුම 37),** රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් වෛද්‍ය සැපයීම් ආනයනය සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගතවන බවටත්, වෛද්‍ය සැපයීම් අංශය තුළ දැනට පවතින තොග, අවදානම් මට්ටමක පවතින බවටත්, ඖෂධ 151 ක තොග ශූන්‍ය මට්ටමක පවතින බවටත්, ඉදිරි සති 03ක කාලසීමාව තුළ ශල්‍යාගාරවල ක්‍රියාකාරිත්වය මුළුමනින්ම අක්‍රීය කරනු ඇතැයි අපේක්ෂා කරන බවටත්, ඉන්දියානු ණය යෝජනා ක්‍රමය සහ අනෙකුත් අරමුදල් ක්‍රම භාවිතා කර දින 45ක් ඇතුළත ශ්‍රී ලංකාව වෙත මාස 03ක කාලයක් සඳහා ප්‍රමාණවත් වෛද්‍ය සැපයීම් තොග ලබා දීම සඳහා ඉන්දියාවේ ගුජරාත් හී The Savorite pharmaceuticals (pvt) Ltd ආයතනය එකඟතාවය පළ කර ඇති බවටත් දක්වා තිබුණි. එම සංදේශයෙන් පහත කරුණු සඳහා අනුමැතිය ඉල්ලා තිබුණි.

(i) වෛද්‍ය සැපයීම් අංශයේ හදිසි තත්ත්වය හා අවශ්‍යතාවය මත පදනම්ව, ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේ ඉතිරිව පවතින අරමුදල් සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් ඇතුළු වෙනත් අරමුදල් ක්‍රම භාවිතා කරමින් මාස 03 ක කාලයක් සඳහා ප්‍රමාණවත්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අනුමත වෛද්‍ය සැපයුම් ආනයනය කිරීම සඳහා The Savorite Pharmaceuticals (pvt) Ltd හා වෙනත් තෝරාගත් සැපයුම්කරුවන් වෙත අවසර ලබා දීමටත්,

(ii) ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේ සහ වෙනත් අරමුදල් ක්‍රම භාවිතා කරමින්, එකඟවනු ලබන ගෙවීම් සැලැස්මකට අනුව ගෙවීම් සිදුකිරීම සඳහා The Savorite Pharmaceuticals ආයතනය සහ වෙනත් තෝරාගත් සැපයුම්කරුවන් සමඟ ගිවිසුමක් අත්සන් තැබීමටත්,

6.6.10 ඒ අනුව එදිනම පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී සංදේශයේ සඳහන් මෙම යෝජනා සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදීමටත්, මේ පිළිබඳ අවසන් තීරණයකට එළඹීමට මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ රාජ්‍ය වියදම් කළමනාකරණ පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට ඉදිරිපත් කරන ලෙසත් දැනුම් දී තිබුණි **(ඇමුණුම 38).** මේ අතර වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් 2022 නොවැම්බර් 01

දිනැති ලිපියක් මඟින් අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ලද බවටත්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට "V" කේතය යටතේ ඉදිරිපත් කළ ඇණවුම් වෛද්‍ය සැපයීම් අංශයේ දේශීය ඇණවුම් යටතේ "V" කේතය මඟින් ඉදිරිපත් කිරීමටත් වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ හා සියළුම සහකාර අධ්‍යක්ෂවරුන්ට දැනුම් දී තිබුණි **(ඇමුණුම 39)**.

6.6.11 ඒ අනුව 2022 ඔක්තෝබර් 25 දිනැති එම අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2022 නොවැම්බර් 02 දින මුදල් අමාත්‍යවරයා විසින් පහත නිරීක්ෂණවලට යටත්ව අදාළ යෝජනා සඳහා විරුද්ධත්වයක් නොමැති බව දන්වා තිබුණි **(ඇමුණුම 40).**

(i) යෝජිත සැපයුම්කරු අනායාචිත පදනම (Unsolicited) යටතේ තෝරාගෙන ඇති බැවින් වෛද්‍ය සැපයීම්වල මිල හා ගුණත්වය පිළිබඳව සමාලෝචනය කිරීමට හා වෙළඳපළ මිල, සත්‍ය හා සාධාරණ මිල හා ඖෂධයේ ගුණත්වය පිළිබඳව එකඟතාවයට පැමිණීමට අමාත්‍ය මණ්ඩල එකඟතා කමිටුවට (Cabinet Appointed Negotiation committee – CANC) හෝ සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව (Health Sector Emergency Procument Committee - HSEPC) මඟින් සිදු කිරීමටත්,

(ii) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙනුවෙන් ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ පෞද්ගලික අංශයේ ඖෂධ සැපයුම්කරුවන් විසින් ඖෂධ ආනයනය කරන ක්‍රියාපිළිවෙල සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් යෝජිත සැපයුම්කරු වෙනුවෙන්ද අනුගමනය කළ යුතු බවටත්,

(iii) සෞඛ්‍ය අමාත්‍යාංශය හා යෝජිත සැපයුම්කරු ඖෂධවල මිල හා ගුණත්වය පිළිබඳව ආනයනයට පෙර ගිවිසුමකට එළඹිය යුතු බවටත්,

(iv) ඉන්දියානු ණය යෝජනා ක්‍රමය හරහා අනායාචිත පදනම (Unsolicited) යටතේ වෙනත් පෞද්ගලික සැපයුම්කරුවකු ඖෂධ සැපයීමට ඉදිරිපත් වන්නේ නම්, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉහත කරුණු 03 අනුගමනය කළ යුතු අතර, ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ නොවන වෙනත් අරමුදල් උපයෝජනයකට යන්නේ නම් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු බවටත්,

(v) ප්‍රසම්පාදන ක්‍රියාවලියට ගතවන පොරොත්තු කාලය (Lead time) අඩුකර ගැනීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් යාන්ත්‍රණයක් සංවර්ධනය කළ යුතු බවටත්,

(vi) ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අනවශ්‍ය ප්‍රමාදයන් අවම කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ආයතන අතර නිසි අධීක්ෂණයක් හා සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් සංවර්ධනය කළ යුතු බවටත්,

(vii) ඉදිරියේ දී වෛද්‍ය සැපයීම් හිඟතාවය වළක්වා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පොරොත්තු කාලය සහ ආරක්ෂිත තොග පවත්වා ගනිමින් අදාළ ප්‍රසම්පාදන සැලසුම් ක්‍රියාවලිය අනුගමනය කළ යුතු බවටත් නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණි.

6.6.12 රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව රැස්ව නිර්දේශ ඉදිරිපත් කර තිබුණු අතර මේ පිළිබඳව 2022 නොවැම්බර් 14 දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය විසින් මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණවලට අනුව කටයුතු කිරීමට යටත්ව අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජනා සඳහා අනුමැතිය ලබා දී තිබුණි. **(ඇමුණුම 41)**

6.6.13 ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය 2020 වර්ෂයේ පිහිටු වීමට පෙර වෛද්‍ය සැපයීම් ප්‍රසම්පාදන කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය මඟින් සිදු කරන ලද අතර අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසු අදාළ ප්‍රසම්පාදන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් සිදු කර තිබුණි. නමුත් 2022 අප්‍රේල් 28 දින ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි කිරීමෙන් පසුව, ඉහත පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ අතිරේක ලේකම්වරයකු යටතේ ප්‍රසම්පාදන අංශයක් පැවතිය දී ලිඛිත පැවරීමකින් තොරව 2022 නොවැම්බර් 19 දින දක්වා මාස 6 ½ ක කාලය තුළ දී තවත් අතිරේක ලේකම්වරයකු යටතේ ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයක් ස්ථාපිත කර වෛද්‍ය සැපයීම් සම්බන්ධ ප්‍රසම්පාදනයන් ඒ හරහා සිදු කිරීමට හිටපු සෞඛ්‍ය ලේකම් විසින් ඉඩකඩ සලසා දී තිබුණි. ඉන් අනතුරුව සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුවලට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය එම අංශය මඟින් සිදුකිරීමට සෞඛ්‍ය ලේකම් විසින් 2022 නොවැම්බර් 20 දිනැති ලිපියක් **(ඇමුණුම 42)** මඟින් ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම්ට බලය පවරා තිබුණි. අතිරේක ලේකම් විසින් 2022 නොවැම්බර් 21 දින ඔහු යටතේ සිටින වෛද්‍ය නිලධාරීවරයකු එම ප්‍රසම්පාදන අංශයේ ප්‍රධානියා ලෙස පත්කර සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් සකස් කිරීම හා අනෙකුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කටයුතු සම්බන්ධීකරණ කටයුතු පවරා **(ඇමුණුම 43)** තිබුණි . නමුත් මතභේදයට තුඩුදුන් වෛද්‍ය සැපයීම් හදිසි මිලදී ගැනීම් බොහෝ ප්‍රමාණයක් එම අංශය මඟින් සිදුකර තිබුණු අතර බලය පැවරීමට පෙර සිටම අතිරේක ලේකම් විසින් ඉහත පරිදි අනායාචිත යෝජනා (Unsolicited proposal) හරහා මිලදී ගැනීම් සිදු කිරීමටත්, අභිලාෂ කැඳවීම (Expression of Interest - EOI) මඟින් හදිසි මිලදී ගැනීම් සිදු කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කර තිබුණි.

6.6.14 වෛද්‍ය සැපයීම් අංශය විසින් මිලදී ගෙන රජයේ රෝහල් වෙත බෙදාහරින වෛද්‍ය සැපයීම්වලට අදාළ ප්‍රසම්පාදනයන්හි ප්‍රසම්පාදන නියෝජිත ලෙස කටයුතු කරන රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය හරහා අදාළ අමාත්‍යාංශ මට්ටමේ ප්‍රසම්පාදනයන් සිදුකළද, මතභේදයට තුඩු දුන් බොහෝ හදිසි මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයන්, අනායාචිත ක්‍රමවේදය (Unsolicited) හා අභිලාෂ කැඳවීමේ ක්‍රමවේදය (EOI) අනුගමනය කරමින් ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශය හරහා ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි.

6.6.15 2022 දෙසැම්බර් 01 දින සෞඛ්‍ය ලේකම්, අතිරේක ලේකම් හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ පැවති රැස්වීමක දී සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ලබාදුන් උපදෙස් අනුව ඉන්දියාවේ Kausikh Therapeutics (P) Ltd නමැති සමාගම විසින් ඉදිරිපත් කරන ලද ඖෂධ අයිතම 28 කට අදාළව අනුමැතීන් ලබාගැනීමට කටයුතු කිරීමට උපදෙස් දෙමින් වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් දින රහිතව සටහනක් යොදා තිබුණි **(ඇමුණුම 44).** අදාළ සමාගම විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත 2022 නොවැම්බර් 30 දිනැතිව ඖෂධ අයිතම 28කට අදාළව මිල කියුමක් / ඉන්වොයිස්පතක් ඉදිරිපත් කර තිබුණි **(ඇමුණුම 45).**

6.6.16 ශ්‍රී ලංකාව තුළ අඛණ්ඩ වෛද්‍ය සැපයීම් සේවාවක් පවත්වා ගෙන යාම මැයෙන් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් 2022 දෙසැම්බර් 05 දින නැවතත් අමාත්‍ය මණ්ඩලයට 22/1993/610/024-1 දරන අමාත්‍ය මණ්ඩල සටහනක් ඉදිරිපත් කර තිබුණු අතර **(ඇමුණුම 46)** එමඟින් රජයේ සෞඛ්‍ය ආයතනවල උග්‍ර වෛද්‍ය සැපයීම් හිඟයන් ඇතිවීම වළක්වා ගැනීම සඳහා වෛද්‍ය සැපයීම් අංශයේ හදිසි තත්ත්වය හා අවශ්‍යතාවය මත පදනම්ව, ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේ ඉතිරිව පවතින අරමුදල් සහ වෙනත් අරමුදල් ක්‍රම භාවිතා කර මාස 03ක කාලයක් සඳහා ප්‍රමාණවත්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අනුමත වෛද්‍ය සැපයීම් තොග ආනයනය කිරීම සඳහා Kausikh Therapeutics (P) Ltd සමාගමට අවසර ලබා දීමට අනුමැතිය ඉල්ලා තිබුණි. තවද ඉන්දියානු ණය යෝජනා ක්‍රමයට සහ වෙනත් අරමුදල් ක්‍රම භාවිතා කරමින් එකඟවනු ලබන ගෙවීම් සැලැස්මකට අනුව ගෙවීම් සිදුකිරීම සඳහා මෙන්ම, ගුණාත්මක බව සහ මිල පිළිබඳව ආයතනය සමඟ ගිවිසුම්ගත වීමටත් එමඟින් අනුමැතිය ඉල්ලා තිබුණි. එදිනම රැස්වූ අමාත්‍ය මණ්ඩලය විසින් 2022 ඔක්තෝබර් 25 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව මුදල් අමාත්‍යවරයා විසින් 2022 නොවැම්බර් 02 දිනැතිව ඉදිරිපත් කරන ලද නිරීක්ෂණයන්ට අනුගතව කටයුතු කිරීමට යටත්ව මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. **(ඇමුණුම 47)**

6.7 හදිසි මිල දී ගැනීම් ක්‍රියාවලිය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මැදිහත්වීම

හදිසි මිල දී ගැනීම් ක්‍රියාවලිය සඳහා පහසුකම් සලසමින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම් සම්බන්ධයෙන් ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පහත පරිදි වේ.

වගුව අංක - 07 : ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම් සම්බන්ධයෙන් ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා දිනය	අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ අංකය	අධ්‍යක්ෂ මණ්ඩල තීරණ
2022 සැප්තැම්බර් 16 - ICL/ ADB/ WB/ AIIB ණය යෝජනා ක්‍රම යටතේ ඖෂධ ප්‍රසම්පාදනය කිරීම සඳහා විශේෂ වේගවත් යාන්ත්‍රණයක් අනුමත කිරීම.	84.5.2 **(ඇමුණුම 48)**	මෙම යෝජනා ක්‍රම යටතේ ආනයනය කරන ලද තත්ත්වයෙන් අසමත් ඖෂධ සම්බන්ධයෙන් නියාමන අධිකාරිය විසින් වගකීම භාර නොගැනීම සහ භාර ගන්නා සහ පරිත්‍යාග කරන ආයතන විසින් එම වගකීම දැරීම.
2022 ඔක්තෝබර් 21	84.5.2 **(ඇමුණුම 49)**	මෙම යෝජනා ක්‍රම යටතේ ආනයනය කරන ලද තත්ත්වයෙන් අසමත් ඖෂධ සම්බන්ධයෙන් නියාමන අධිකාරිය විසින් වගකීම භාර නොගැනීම සහ භාර ගන්නා සහ පරිත්‍යාග කරන ආයතන විසින් එම වගකීම දැරීම.
2022 නොවැම්බර් 18	84.5.2 **(ඇමුණුම 50)**	මෙම යෝජනා ක්‍රම යටතේ ආනයනය කරන ලද තත්ත්වයෙන් අසමත් ඖෂධ සම්බන්ධයෙන් නියාමන අධිකාරිය විසින් වගකීම භාර නොගැනීම සහ භාර ගන්නා සහ පරිත්‍යාග කරන ආයතන විසින් එම වගකීම දැරීම. JICA සහ ලේකම් විසින් අනුමත

		කරන ලද වෙනත් ඕනෑම ආයතනයක්.
2022 දෙසැම්බර් 29	87.4.9 **(ඇමුණුම 51)**	නිෂ්පාදනයේ ආරක්ෂාව, ප්‍රත්‍යක්ෂභාවය සහ ගුණාත්මකභාවය පිළිබඳ වගකීම NMRA විසින් භාර නොගැනීම.
2022 දෙසැම්බර් 29	87.5.1 **(ඇමුණුම 52)**	නිෂ්පාදනයේ ආරක්ෂාව, ප්‍රත්‍යක්ෂභාවය සහ ගුණාත්මකභාවය පිළිබඳ වගකීම NMRA විසින් භාර නොගැනීම.

7. නිරීක්ෂණ

7.1 ඉන්දියානු ණය යෝජනා ක්‍රමය භාවිතය

7.1.1 ඉහත 6.2.3 හා 6.2.4 ඡේදයන්හි පිළිවෙලින් 2022 අගෝස්තු 29 සහ 2023 මැයි 19 දිනයන්ට ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ලද ප්‍රතිපාදනය උපයෝජනය කිරීමේ ප්‍රගතිය දක්වා ඇති අතර 2023 සැප්තැම්බර් වන විට ඉහත වගුව 01 හි දැක්වෙන ඖෂධ වෙනුවෙන් ලද එ.ජ.ඩො මිලියන 360 න් එ.ජ.ඩො.මිලියන 160 ක් භාණ්ඩාගාරයට ආපසු හරවා යැවීමට කටයුතු කර තිබුණි. තවද ඉන්දියානු ණය යෝජනා අනුකමිටු රැස්වීම් වාර්තා අනුව 2024 ජනවාරි 29 දින වන විට එ.ජ.ඩො.මිලියන 197 ක් වටිනා ඉන්වොයිසිපත් 2,565 ක් සඳහා ඉන්දියානු ණය යෝජනා අනුකමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. ඉන් එ.ජ.ඩො.මිලියන 130 ක් වටිනා ඉන්වොයිසිපත් 1,816 කට එනම් අනුකමිටුව අනුමත වටිනාකමෙන් සියයට 66 ක ට පමණක් අදාළව ආනයනකරුවන් විසින් භාණ්ඩාගාර ගිණුමෙහි රුපියල් වටිනාකමින් මුදල් තැන්පත් කර තිබුණි. තවද එම වටිනාකම ඖෂධ සඳහා අනුමත වූ ඉහත වගුව අංක 01 හි දැක්වෙන එ.ජ.ඩො මිලියන 360 ක වටිනාකමෙන් සියයට 36 ක් පමණක් වී තිබුණි. එසේ තිබියදීත් දේශීය අරමුදල් ද භාවිතා කරමින් හදිසි මිලදී ගැනීම් සිදු කිරීමට කටයුතු කර ඇති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

7.1.2 සෞඛ්‍ය ලේකම් විසින් 2024 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කළ මෙම වාර්තාවේ කෙටුම්පත් වාර්තාවට ඉදිරිපත් කළ පිළිතුරු අනුව මෙහිදී ආනයනකරුවන් විසින් මහා භාණ්ඩාගාරයේ ඉන්දියානු ණය යෝජනා ක්‍රමය සම්බන්ධීකරණ ඒකකය වෙත අදාළ ලිපි ගොනු භාර දීමේ දී සිදු විය හැකි ප්‍රමාදයන්, අදාළ ඉන්දියානු නිෂ්පාදන සමාගම අදාළ ලේඛන ආනයනකරුවා වෙත එවීමේ දී සිදු විය හැකි ප්‍රමාදයන්, ඇතැම් අවස්ථාවල දී ඉන්දියානු මහ

කොමසාරිස් කාර්යාලය විසින් අදාළ ඉන්වොයිසි සඳහා අනුමැතිය ලබා දීමට ඉතා දීර්ඝ කාලයක් ගත කිරීම, ආනයනකරුවන් විසින් ණයවර ලිපි විවෘත කිරීමේ දී සිදු වන ප්‍රමාදයන් සහ ඇතැම් නිෂ්පාදකයන් ණයවර ලිපි ලැබෙන තෙක් නිෂ්පාදන කටයුතු ආරම්භ නොකිරීම වැනි හේතු මත අදාළ ණය අරමුදල් සඵලදායී ලෙස උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණු බව දන්වා තිබුණි.

7.2 ඖෂධ වෙනුවෙන් සිදුකළ යුතු ගෙවීම්

7.2.1 වෛද්‍ය සැපයීම් අංශය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2023 දෙසැම්බර් 31 දින වන විට වෛද්‍ය සැපයීම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ඇතුළු වෙනත් සැපයුම්කරුවන්ට වෛද්‍ය සැපයීම් සැපයීම වෙනුවෙන් රු.මිලියන 79,652.98 ක් ගෙවිය යුතුව පැවති අතර ඉන් රු.මිලියන 54,364.84 ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවටද, රු.මිලියන 13,543.31 ක් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙනුවෙන්ද විය. නමුත් එම සංස්ථා දෙකෙහි 2023 මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම පිළිවෙලින් රු.මිලියන 38,853.76 ක් හා රු.මිලියන 2,368.68 ක් වූයෙන් ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් රු.මිලියන 26,685.72 ක වෙනසක් නිරීක්ෂණය විය.

7.2.2 වෛද්‍ය සැපයීම්වලට අදාළව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් වෛද්‍ය සැපයීම් අංශය වෙත එවනු ලබන හර නිවේදන පත්‍ර නිරවුල් කිරීම ඖෂධ කළමනාකරණය සඳහා ස්ථාපිත කර ඇති ස්වස්ථ පරිගණක පද්ධතිය මඟින් සිදුකළ යුතු වුවද, එම පරිගණක පද්ධතිය ක්‍රියාත්මක වීමේ ගැටළු හේතුවෙන් 2023 අගෝස්තු සිට නොවැම්බර් දක්වා කාලය තුළ ලැබී තිබුණු රු.මිලියන 20,202.74 ක් වූ හර නිවේදන පත්‍රවල ගෙවීම් කටයුතු 2023 නොවැම්බර් 29 දින වන විටත් ඇණහිට තිබුණි. ඊට අමතරව වෛද්‍ය සැපයීම් මිලදී ගැනීමට අදාළව 2023 අගෝස්තු සිට නොවැම්බර් දක්වා කාලය තුළ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සහ දේශීය සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු පිළිවෙලින් රු.මිලියන 5,678.91 ක් හා රු.මිලියන 2,297.39 කට අදාළ වවුචර්පත් සකස් කිරීමේ දී ස්වස්ථ පරිගණක පද්ධතිය තුළ වටිනාකම් නිවැරදි නොවීම, ප්‍රමාද ගාස්තු සටහන් නොවීම, ආදායකයාගේ නම සඳහන් නොවීම යනාදී අඩුපාඩු හේතුවෙන් එම ගෙවීම් ද විගණිත දිනය වූ 2023 නොවැම්බර් 29 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

7.2.3 2023 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් වෛද්‍ය සැපයීම් අංශයේ ඇණවුම් වෙනුවෙන් ණයවර ලිපි නිකුත් කිරීම සඳහා රු.මිලියන 606.09 ක්ද, සැපයුම්කරුවන්ට ගෙවීම් (ගෙවිය යුතු බැංකු බිල්පත්) සඳහා රු.මිලියන 14,120 ක්ද වෛද්‍ය සැපයීම් වෙනුවෙන් ලබා ගත් බැංකු අයිරා පහසුකම් පියවීම සඳහා රු.මිලියන 18,616.64 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 33,342.78 ක මූල්‍ය අවශ්‍යතාවයක් පැවතුණි. එය 2023 දෙසැම්බර් 31 දින සිට මාස

19 කට පෙර එනම් 2022 මැයි 25 දිනට පැවති වටිනාකම වූ රු.මිලියන 23,123 ට වඩා රු.මිලියන 10,220 ක වැඩිවීමකි.

7.2.4 2023 දෙසැම්බර් 31 දිනට 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය සඳහා වූ කාල සීමාව තුළදී විවෘත කරන ලද නැව් ඇපකර 11 කට අදාළව රු.මිලියන 145ක් ලංකා බැංකුව විසින් ලබා දී ඇති ණයවර ලිපි සීමාවෙන් භාවිතා කර තිබුණි. විගණිත දිනය වූ 2024 පෙබරවාරි 22 දින වන විට ද, උක්ත නැව් ඇපකර නිදහස් කර ගැනීමට නොහැකි වීම තුළ මෙම වටිනාකමින් ණයවර ලිපි විවෘත කර ගැනීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට නොහැකිව පැවතුණි.

7.3 2022 හා 2023 වර්ෂ තුළ සිදුකළ හදිසි මිලදී ගැනීම් ක්‍රියාවලිය

ශ්‍රී ලංකාව තුළ අඛණ්ඩ වෛද්‍ය සැපයීම් සේවාවක් පවත්වා ගෙන යාමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ මැදිහත්වීම, මුදල් අමාත්‍යාංශයේ මැදිහත්වීම හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මැදිහත්වීම පිළිබඳව නිරීක්ෂණය කරන ලදුව එහිදී සෞඛ්‍ය අමාත්‍යාංශය, ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශය, වෛද්‍ය සැපයීම් අංශය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හා ජාතික ඖෂධ නියාමන අධිකාරිය කටයුතු කළ ආකාරයත්, එහිදී හදිසි මිල දී ගැනීම් සිදුකළ ආකාරය පිළිබඳවත්, සම්මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ බැහැර කිරීම හේතුවෙන් අභ්‍යන්තර පාලන ක්‍රමවේද උල්ලංඝනය වීම්, අමාත්‍ය මණ්ඩල තීරණ අභිබවා කටයුතු කිරීම් හා දුර්වල අභ්‍යන්තර පාලන ක්‍රමවේද තුළ වංචාවන් සිදුකිරීමට පරිසරය සැකසීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දක්වා ඇත.

7.3.1 ඉහත 6.5.8 ඡේදයෙහි දැක්වෙන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2022 ජුනි 16 දිනැතිව නිකුත් කරන ලද අංක PFD/PMD/Health/HSEPP/01/2022 දරන ලිපියට අනුව සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ සිදුකළ ප්‍රසම්පාදනයන්හි මිලදී ගත් අයිතමයන් පිළිබඳ මිලදී ගැනීමේ අවශ්‍යතාවය සාධාරණීකරණය කරමින් මාසික වාර්තාවක් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතියට ඉදිරිපත් කළ යුතු බව දැක්වේ. නමුත් 2022 ජුනි මස සිට 2023 නොවැම්බර් මස දක්වා සිදු කරන ලද රු.මිලියන 21,999 ක් වටිනා සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදනයන් 663 කට අදාළ සහ එ.ජ.ඩො. මිලියන 20 ක් වටිනා ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් එලෙස මාසිකව ගතයුතු අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතීන් 2024 මාර්තු 31 දිනවන විටත් ලබා ගෙන නොතිබුණි.

7.3.2 ප්‍රසම්පාදන අස්ථිත්වයේ අභ්‍යන්තර විගණක විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා ක්‍රියාත්මක වූ හදිසි ප්‍රසම්පාදනයන් නිරීක්ෂණය කිරීමට සහභාගී වී තිබුණද, ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශය මඟින් සිදුකළ අනෙකුත් හදිසි ප්‍රසම්පාදනයන් නිරීක්ෂණය කළ බවට විගණනයේදී තහවුරු නොවීය. එසේම නිරීක්ෂක ලෙස සහභාගී වූ ප්‍රසම්පාදනයන්හි

ඵලදායී ක්‍රියාවලියක් සිදුකළ බව තහවුරු කර ගැනීමට කිසිදු ලේඛනයක් අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කර නොතිබුණු අතර ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසානයේ සාධාරණ හා ඵලදායී ක්‍රියාවලියක් සහතික කර නොතිබුණි. එසේ වුවද **ලබා දෙන ලද දුරකථන ඇමතුම් අනුව ප්‍රසම්පාදන කමිටුවලට සහභාගි වූ බවත්, ප්‍රසම්පාදන කමිටුවේ නිරීක්ෂක ලෙස සහභාගි විය යුතු බවටත්, එසේ සහභාගි වීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දිය යුතු බවට ලිඛිතව දැනුම්දීමක් සිදුනොකළ බවත්, එවැනි වාර්තාවක් ලබා දිය යුතු බවට දැනුවත් වී නොසිටි බැවිනුත් නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක් ලබා නොදුන් බවත් දක්වමින්** 2024 අප්‍රේල් 01 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් විගණනයට ලිඛිතව ප්‍රකාශ කර තිබුණි.

7.3.3 ඉහත ඡේද අංක 6.6.2 ඡේදයෙහි දැක්වෙන පරිදි 2022 සැප්තැම්බර් 22 දින ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම් විසින් එවන ලද ලිපිය අනුව ඡේද අංක 6.6.3 හි දැක්වෙන පරිදි වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් කාර්ය මණ්ඩලය වෙත සටහනක් යොදමින් 2022 සැප්තැම්බර් 23 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ඇණවුම් ඉදිරිපත් කිරීමට දැනුම් දී තිබුණු බවත්, ඊට දින 03කට පසුව එනම් 2022 සැප්තැම්බර් 26 දින වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත රු.මිලියන 4,150.11 ක් වටිනා ඖෂධ අයිතම 182 ක් සඳහා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ මාස 03 ක කාලයක් සඳහා ඇණවුම් ඉදිරිපත් කර තිබුණු බවත් නිරීක්ෂණය විය. ඒ අනුව ඉහත අංක 6.6.4 අනුව මේ සම්බන්ධව ඉදිරිපත් කළ අමතය මණ්ඩල සංදේශයට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමට දින 07කට පෙර හදිසි ප්‍රසම්පාදනය සඳහා ඇණවුම් ඉදිරිපත් කර තිබුණු බව නිරීක්ෂණය විය. එහිදී ලැබිය යුතු තොග (pending orders) පිළිබඳව නොසලකා ඇණවුම් ප්‍රමාණය දැනුම් දීමට තීරණය කිරීමෙන් ආසන්න දිනයන්හිදී තොග ලැබීමෙන් හා වැඩි මිලට හදිසි මිලදී ගැනීම් සිදු කිරීමෙන් රජයට වන පාඩුව සම්බන්ධයෙන් වන අවධානම පිළිබඳව නොසලකා ඇති බවද නිරීක්ෂණය විය.

7.3.4 ඖෂධ අයිතම 182 ක් සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත රු.මිලියන 4,150.11 ක් වටිනා ඇණවුම් ඉදිරිපත් කර සහ ඉහත අංක 6.6.4 හි සඳහන් අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර දිනකට පසු එනම් 2022 සැප්තැම්බර් 27 දින ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම් විසින් සෞඛ්‍ය ලේකම්ට ඉදිරිපත් කළ 6.6.5 ඡේදයෙහි දැක්වෙන අභ්‍යන්තර සටහනක් මඟින් "2022 සැප්තැම්බර් 22 දින ඉන්දියානු ණය යෝජනා භාවිතයෙන් මාස 03 ක් සඳහා වැදගත් හා අත්‍යවශ්‍ය ඖෂධ ආනයනය කර සැපයීමට අදාළව සෞඛ්‍ය අමාත්‍යවරයා හා ඖෂධ සැපයුම්කරුවන් අතර පැවති රැස්වීමේ තීරණයකට අනුව" යැයි සඳහන් කරමින් 2022 ඔක්තෝබර් 03 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමට දින 06 කට පෙර ඉන්දියානු ණය යෝජනා ක්‍රමය හරහා වැදගත් හා අත්‍යවශ්‍ය ඖෂධ ආනයනය කර

සැපයීමට අදාළව ඖෂධ අයිතම 285 ක් මිලදී ගැනීමට සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතියෙන් අභිලාෂ කැඳවීමේ ලේඛන සකස්කර ඉදිරිපත් කර තිබුණු බව නිරීක්ෂණය විය. එලෙස අභිලාෂ කැඳවූ අයිතම තුළ Everolimus, Gentamicin Sulphate inj., Cefuroxime inj. යනාදි අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුවේ ඇතුළත් නොවන ඖෂධ අයිතමද ඇතුළත් කර තිබුණි.

7.3.5 තවද එදිනම එම අභිලාෂ කැඳවීම වෙබ් අඩවිවල පළ කර තිබුණු බවත්, අතිරේක ලේකම් විසින් ලංසු විවෘත කිරීමේ කමිටුත්, සෞඛ්‍ය ලේකම් විසින් ඇගයීම් කමිටු පත්කිරීමත් ඉහත 6.6.4 ඡේදයෙහි දැක්වෙන 2022 ඔක්තෝබර් 03 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමට පෙර සිදු කර තිබුණි. එමෙන්ම මෙම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද දිනයේදීම ලංසු විවෘත කිරීමට කටයුතු කළද එම අමාත්‍ය මණ්ඩල තීරණය පිළිබඳව 2022 ඔක්තෝබර් 05 දින සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කර තිබුණි. එසේම මෙම ඡේදයෙහි ඉහතින් සෞඛ්‍ය අමාත්‍යවරයා හා ඖෂධ සැපයුම්කරුවන් අතර රැස්වීමක් පැවති බව සඳහන් වුවද එලෙස රැස්වීමක් පැවැත්වීම පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

7.3.6 ඉහත 6.6.5 ඡේදයෙහි දැක්වෙන ඖෂධ අයිතම 285 හි අභිලාෂ කැඳවීම ඇගයීම සඳහා සෞඛ්‍ය ලේකම් විසින් පස් දෙනෙකුගෙන් සමන්විත ඇගයීම් කමිටුවක් පත්කර තිබුණු අතර ප්‍රසම්පාදන අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කළ වෛද්‍යවරයා ද එම ඇගයීම් කමිටු සාමාජිකයකු ලෙස පත් කර තිබුණු බවත්, ඇතැම් පිළිකා සඳහා වන විශේෂිත ඖෂධ ඇගයීම් සඳහා තාක්ෂණික දැනුමැති කිසිදු විශේෂඥ වෛද්‍යවරයකු හෝ ඒ සම්බන්ධ තාක්ෂණික දැනුමැති ප්‍රවීණයකු පත්කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය. හදිසි මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති පරිදි තාක්ෂණික ඇගයීම් කමිටු පත් නොකළද හදිසි මිලදී ගැනීම් කමිටුව විසින් තාක්ෂණික විශේෂඥයන්ගේ උපදෙස් ලබාගැනීමට කටයුතු කළ යුතු වුව ද, එපරිදි කටයුතු කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

7.3.7 2022 ඔක්තෝබර් 06, 07, 10, 11,12 හා 13 යන දිනයන්හි දී රැස්වුණු මෙම EOI ඇගයීම් කමිටුව විසින් අදාළ ඇගයීම් සිදු කිරීමේ දී ඖෂධයේ මිල හා තොග ලබාදීමේ කාලසටහන් පිළිබඳව සලකා බලා තිබුණ ද ඖෂධවල ගුණාත්වය පිළිබඳව සලකා බලා නොමැති බවත් 2023 නොවැම්බර් 13 දිනැති ඇගයීම් කමිටු සාමාජිකගේ ප්‍රකාශය අනුව නිරීක්ෂණය විය. තවද අභිලාෂ කැඳවීමේ දී ඉදිරිපත් කළයුතු ලේඛනවල පැවති අඩුපාඩු හේතුවෙන් ඇගයීම් කිරීම කළ නොහැකි බව ඖෂධ නිෂ්පාදන සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම් වෙත දැනුම් දුන් අතර එහිදී ඖෂධ ආනයන කාල සටහන (Deliivery Shedule) සහ තාත්ත්වික අවම මිල අනුව සුදුසු අභිලාෂකරුවන් කඩිනමින් තෝරා දෙන ලෙසට අදාළ අතිරේක ලේකම්වරයා දැනුම් දුන් බවට 2024 මැයි 02 දින EOI ඇගයීම් කමිටුවේ සභාපති විගණනයට දන්වා තිබුණි. ඒ අනුව අභිලාෂ කැඳවීමේ දී ඇගයීම් නිර්ණායකවල සඳහන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය නොමැති සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන නොමැතිවීම

සම්බන්ධයෙන් ප්‍රසම්පාදනයේ ප්‍රධාන අපගමනයන් (major deviation) පිළිබඳව කමිටුව සැලකිලිමත් වී නොතිබුණි. ඒ අනුව ඇගයීම් කමිටුව විසින් ස්වාධීනව තම ඇගයීම් ක්‍රියාවලිය සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. එසේම ඉහත 6.6.7 ඡේදයෙහි පරිදි අභිලාෂ කැඳවීමේ දී ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය හා ව්‍යාපාර ලියාපදිංචියත්, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය නොමැති සැපයුම්කරුවන් විසින් ඊට අදාළ අයදුම්පත්‍රය ඇතුළු ලේඛන 08 ක් ඉදිරිපත් කිරීම කළයුතුව තිබුණ ද අභිලාෂ කැඳවීම් විවෘත කිරීම් කමිටුව විසින් ද ඒ පිළිබඳව පරීක්ෂා කර බලා නොතිබුණි.

7.3.8 පහත ඡේද 7.7 හි දැක්වෙන පරිදි ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ පැවති පසුබෑම සහ අධිකාරිය විසින් ඖෂධ ලියාපදිංචියේ දී රජයේ ඖෂධ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු නොකිරීම ඇතුළු කරුණු හේතුවෙන් රටේ ඖෂධ සැපයුම් අවශ්‍යතාවයට සරිලන පරිදි ඖෂධ සඳහා ප්‍රමාණවත් වලංගු ලියාපදිංචි සැපයුම්කරුවන් නොවීය. අභිලාෂ කැඳවීම් ක්‍රමයේ දී ලියාපදිංචියෙන් නිදහස් කිරීම් යටතේ ප්‍රසම්පාදනයන් සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව සලසා දී තිබීම සහ ලියාපදිංචියෙන් නිදහස් කිරීම් යටතේ ප්‍රසම්පාදනයන් සඳහා ඉදිරිපත් වීම අවම වන පරිද්දෙන් උචිත සීමාකාරී කොන්දේසි ලංසු ලේඛනවලට ඇතුළත් කර නොතිබීම නිසා බොහොමයක් සැපයුම්කරුවන් වලංගු ලියාපදිංචි සහතිකයක් නොමැතිව ලංසු ඉදිරිපත් කර තිබුණි. මෙලෙස කොන්දේසි ලිහිල් කිරීම හරහා ගුණාත්වයෙන් යුතු ඖෂධ සැපයෙන බවට තහවුරු කෙරෙන ක්‍රමවේදයෙන් බැහැර වී තිබුණි.

7.3.9 2007 ඖෂධ හා වෛද්‍ය උපකරණ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.1 අනුව ඖෂධ ප්‍රසම්පාදනයේ දී ගුණාත්මක ඖෂධයක් ද යන්න සහතික කෙරෙන ලියාපදිංචි සහතිකයේ අනිවාර්ය අවශ්‍යතාවය නොසලකා හැරීමත්, තාක්ෂණික ඇගයීම් කමිටු පත් නොකිරීමත් ඒ වෙනුවට ඇගයීම් කමිටුවක් පත් කිරීමත්, තාක්ෂණික ප්‍රවීණයන්ගේ උපදෙස් ලබා නොගැනීමත්, පත්කළ ඇගයීම් කමිටු විසින් ඖෂධවල ගුණාත්වයට අදාළ ලේඛන පරීක්ෂා නොකිරීමත් යන කරුණු හේතුවෙන් මිලදී ගන්නා ඖෂධවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

7.3.10 හදිසි මිලදී ගැනීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මැදිහත්වීම යටතේ මෙම වාර්තාවේ ඉහත අංක 6.7 හා පහත නිරීක්ෂණ අංක 7.5 සහ 7.11.7 යටතේ නිරීක්ෂණය වූ කරුණු අනුව ඖෂධ අධිකාරිය විසින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික නිකුත් කිරීමේ පිළිගත් පැවති ක්‍රමවේදයෙන් බැහැරව කටයුතු කර එම සහතිකය නිකුත් කිරීමට කටයුතු කිරීම හේතුවෙන් හා අධිකාරිය ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික නිකුත් කළ ද, එම ඖෂධවල ගුණාත්වය, ආරක්ෂාව හා ප්‍රත්‍යක්ෂභාවය පිළිබඳ වගකීමෙන් බැහැර වීමත්, ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 3(අ) උපවගන්තියේ දැක්වෙන අරමුණින් බැහැරව ඖෂධවල ගුණාත්වය, ආරක්ෂාව හා ප්‍රත්‍යක්ෂභාවය පිළිබඳ වගකීම වෙනත් පාර්ශව වෙත

පැවරීමත් **(ඇමුණුම 53)** , එම වගකීම පවරන ලද පාර්ශවයන් ඒ සම්බන්ධ වගකීම ප්‍රතික්ෂේප කිරීමත් **(ඇමුණුම 54)** හේතුවෙන් උසස් ප්‍රමිතියෙන් යුතු ඖෂධ රෝගීන්ට ලබා දීමේ මූලික අරමුණ ඉටු නොවන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

7.3.11 ඒ අනුව විනිවිදභාවයෙන් හා වගකීම් සහගතව ප්‍රසම්පාදන අස්ථිත්වයේ මුදලට උපරිම වටිනාකමක් ලබා දෙන බවට අදාළ ප්‍රසම්පාදන කමිටුව හා ප්‍රසම්පාදන අස්ථිත්වය සහතික වූ බවටත්, ප්‍රසම්පාදන කමිටුව හා ප්‍රසම්පාදන අස්ථිත්වය ඇගයීම් ක්‍රියාවලියේ දී ප්‍රමාණවත් අවධානයෙන් ක්‍රියාකළ බවටත් විගණනයේදී තහවුරු නොවීය.

7.3.12 එසේම EOI ඇගයීම් කමිටුව විසින් ඖෂධ අධිකාරියේ ලියාපදිංචිය නොමැති සියළු ප්‍රතිචාරාත්මක සැපයුම්කරුවන් WOR සහතිකය ලබා ගැනීමත් සමඟ ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණු බවත් (Recommended to award with WOR), **(ඇමුණුම 55)** අදාළ ඇගයීම් වාර්තා නිරීක්ෂණය කරමින් 2022 ඔක්තෝබර් 13 හා 18 යන දිනයන්හී දී රැස්ව තිබුණු සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් එ.ජ.ඩොලර් මිලියන 19.8 ක් වටිනා ඖෂධ අයිතම 170 ක් සඳහා සාරානුකූල ප්‍රතිචාරාත්මක ලංසුකරුවන්ට ප්‍රදානය කිරීමටත් තීරණය කර තිබුණි. එලෙස කමිටුව විසින් ප්‍රතිචාරාත්මක ලංසුකරු ලෙස තෝරා ගනිමින් මෙම ලංසු ප්‍රදානය කළ ද, ප්‍රසම්පාදන කමිටුව ද ඖෂධවල ගුණත්වය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

7.3.13 භාණ්ඩාගාර නියෝජිතයකුද සාමාජිකත්වය දරන ඉහත 6.5.10 ඡේදයෙහි දැක්වෙන මෙම සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව මඟින් 2022 ඔක්තෝබර් 13 හා 18 යන දිනයන්හි රැස්ව මෙම ඖෂධ අයිතම **ඉන්දියානු ණය යෝජනා ක්‍රමය හෝ සෘජු මිලදී ගැනීම් යටතේ** මිලදී ගැනීමටත් තීරණය කර තිබුණි **(ඇමුණුම 56).** ඒ අනුව ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේ ඉතිරි අරමුදල් භාවිතා කරමින් හදිසි ප්‍රසම්පාදන ලෙස වෛද්‍ය සැපයුම් ආනයනය කිරීමට පුද්ගලික අංශයේ ආනයනික නියෝජිතයන්ට අවසර ලබා දෙමින් 2022 ඔක්තෝබර් 03 දිනැතිව ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය අභිබවා යමින් සෞඛ්‍ය අංශ හදිසි මිලදී ගැනීමේ කමිටුව ක්‍රියාකර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දින වන විට අභිලාෂ කැඳවීමේ ක්‍රමවේදය යටතේ මිලදී ගත් ඖෂධ සඳහා ඉන්දියානු ණය ආධාර ක්‍රමවේදයෙන් බැහැරව යමින් දේශීය අරමුදල් මඟින් රු.මිලියන 2,909.45 ක් ගෙවා ඇති අතර රු.මිලියන 1,267.60 ක් ගෙවීමට ඇති බව නිරීක්ෂණය විය.

7.3.14 ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ අභිලාෂ කැඳවීමේ ක්‍රමවේදය හරහා ක්‍රියාත්මක කර තිබුණු ප්‍රසම්පාදනය සඳහා ඉන්දීය නිෂ්පාදකයින් තෝරාගෙන තිබුණු අතර සෞඛ්‍ය ලේකම් විසින් මෙම ඇණවුම් ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ පමණක් ක්‍රියාත්මක කළ යුතු බවට දන්වමින් **(ඇමුණුම 57)** සැපයුම්කරුවන් 21 දෙනෙකුට 2022 ඔක්තෝබර් 20 දින සිට

ඇණවුම් ප්‍රදානය කර තිබුණි. නමුත් මීට අදාළ ගැණුම් ඇණවුම් පහත කොන්දේසි යටතේ ක්‍රියාත්මක කළ යුතු බවට සෞඛ්‍ය ලේකම් විසින් වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් අමතමින් ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ ලිපිගොනු අංක PSRP/08/EOI/General/2022 මඟින් 2022 ඔක්තෝබර් 28 දිනැති ලිපියක් **(ඇමුණුම 58)** හරහා උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව,

- ඉන්දියානු ණය යෝජනා ක්‍රමය හෝ දෙපාර්ශවයටම පහසු වෙනත් ඕනෑම ක්‍රමවේදයක් මඟින් එක් එක් අයිතම මිලදී ගැනීමටත්
- කිසියම් සැපයුම්කරුවකු ලියාපදිංචි සහතික ඉදිරිපත් නොකළේ නම් අදාළ වගකීම පිළිබඳ පැහැදිලි සීමාවන් ඇතුළත් කිරීමටත්,
- කාර්යසාධන ඇපකර, ප්‍රමාදවීම් සඳහා දඩ මුදල් නිදහස් කිරීම් පිළිබඳ අදාළ කොන්දේසි ඇතුළත් කිරීමටත්
- සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමේදී දින 45 ක් ඇතුළත සැපයුම්කරුවන්ට ගෙවීම් සිදුකළ යුතු බවටත්
- ගෙවීම් සිදුකිරීමේදී අමාත්‍යාංශය පාර්ශවයෙන් සිදුවන ප්‍රමාදයන් වෙනුවෙන් මාසිකව සියයට 03 බැගින් මාසික ගාස්තුවක් සැපයුම්කරුවන්ට ගෙවීමට අමාත්‍යාංශය ක්‍රියා කළ යුතු බවටත් එහිදී වැඩිදුරටත් දක්වා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශය යටතේම ඉන්දියානු ණය ආධාර අනුකමිටුව පිහිටුවා තිබුණු නමුත්, ඉහතින් සඳහන් කරන ලද ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ පමණක් ක්‍රියාත්මක කළ යුතුවන එ.ජ.ඩො මිලියන 19.1 ක ඇණවුම් 158 ක් ඉන්දියානු ණය ආධාර අනුකමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කිරීමට එම අංශය යටතේම පැවති ප්‍රසම්පාදන ඒකකය විසින් කටයුතු කර නොතිබුණු බැවින් ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ මෙම ඇණවුම් ක්‍රියාත්මක කරවීම මගහැරවීමට ඉඩසැලසීමක් ලෙස නිරීක්ෂණය විය.

(ii) මෙම ප්‍රසම්පාදනයන් ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේ ඉතිරි අරමුදල් පමණක් භාවිතා කරමින් සිදු කිරීමට ලංසු කැඳවා තිබුණද එම කොන්දේසියට පටහැනිව ලේකම්වරයා විසින් ඉන්දියානු ණය යෝජනා ක්‍රමය හෝ දෙපාර්ශවයටම පහසු වෙනත් ඕනෑම ක්‍රමවේදයක් මඟින් මිලදී ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි.

(iii) ඒ තුළින් ඉන්දියානු සැපයුම්කරුවන් තෝරාගෙන දේශීය අරමුදල් මඟින් ගෙවීම් සිදුකිරීමටත්, ඉන්දියානු නොවන සැපයුම්කරුවන්ට/නිෂ්පාදකයින්ට මෙම ප්‍රසම්පාදනය සඳහා සාධාරණ ලෙස ඉදිරිපත් වීමේ ඉඩකඩ සීමාකර තිබීමත්, එමඟින් වැඩි මිලට ඖෂධ මිලදී ගැනීමටත්, වෙනත් ගුණාත්මක ඖෂධ තරඟකාරී මිලකට ලබා ගැනීමට පැවති අවස්ථාවන් අහිමි කිරීමටත් කටයුතු කර තිබුණි.

(iv) ගෙවීම් සිදුකිරීමේදී සිදුවන ප්‍රමාදයන් වෙනුවෙන් මාසිකව සියයට 03 බැගින් ගාස්තුවක් සැපයුම්කරුවන්ට ගෙවීමට වැනි කොන්දේසි ඇතුළත් කිරීම හරහා පැවති ආර්ථික අර්බුදය හමුවේ රජයට පාඩු සිදුවන ආකාරයට කටයුතු කිරීමට සෞඛ්‍ය ලේකම් තීරණ ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(v) EOI යටතේ ගැණුම් ඇණවුම් නිකුත් කිරීමේදී එවකට අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා පත්කළ වෛද්‍ය සැපයීම් අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් විධිමත් පත්කිරීමකින් තොරව වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂක ලෙස නිල මුද්‍රාව යොදා තිබුණු බවද නිරීක්ෂණය විය.

7.3.15 2022 ඔක්තෝබර් 25 දින ඉදිරිපත් කර තිබුණු ඉහත 6.6.9 ඡේදයෙහි සඳහන් ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේ ඉතිරිව පවතින අරමුදල් සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් ඇතුළු වෙනත් අරමුදල් ක්‍රම භාවිතා කරමින් වෛද්‍ය සැපයුම් ආනයනය කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුමැතිය ලැබීමට පෙර ඇමරිකානු ඩොලර් මඟින් මෙම ගැණුම් ඇණවුම් නිකුත් කිරීමටත්, ඉන්දියානු ණය යෝජනා හෝ වෙනත් මූලාශ්‍ර මඟින් ගෙවීම් කිරීමටත්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රතිපාදන වෛද්‍ය සැපයීම් අංශයට මාරු කිරීමට යටත්ව ගැණුම් ඇණවුම් නිකුත් කිරීමටත්, මිලදී ගැනීමේ ගිවිසුම් හා කාර්යසාධන ඇපකර ලබා ගැනීමකින් තොරව ගැණුම් ඇණවුම් නිකුත් කිරීමට වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හා ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම් විසින් 2022 නොවැම්බර් 02 දින නිර්දේශ කර තිබුණු අතර, සෞඛ්‍ය ලේකම් විසින් එදිනම අනුමත කර තිබුණි **(ඇමුණුම 59)**

7.3.16 මේ අතර විගණනයට ලද තොරතුරු අනුව 2022 ජූලි - 2023 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ දී සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා රු.මිලියන 12,200 ක් වටිනා ඖෂධ අයිතම 280 ක් සඳහා හදිසි මිලදී ගැනීම් කිරීමට කටයුතු සිදුකර තිබුණි. එම සියළුම ඇණවුම් ද ඉහත 7.3.14 ඡේදයෙහි සඳහන් සමාගම් 21 න් සමාගම් 18 ක් වෙත ප්‍රදානය කර තිබුණි. එම ඇණවුම් 280 න් 103 ක් සඳහාම ලියාපදිංචිය නිදහස් කිරීම (WOR) යටතේ ප්‍රසම්පාදන ප්‍රදානය කර තිබුණි.

7.3.17 ඉහත අංක 6.6.8, 6.6.9 හා 6.6.10 අනුව 2022 ඔක්තෝබර් 25 දිනැතිව ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණයට 2022 නොවැම්බර් 02 දිනැතිව මුදල් අමාත්‍යවරයා විසින් ලබා දුන් නිරීක්ෂණවලට යටත්ව අදාළ මිලදී ගැනීම් සිදු කිරීමට 2022 නොවැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අනුව ICL නොවන වෙනත් අරමුදල් උපයෝජනයකට යන්නේ නම් අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සෞඛ්‍ය අමාත්‍යාංශය අනුගමනය කළ යුතු බවට දක්වා ඇතත් අභිලාෂ කැඳවීමේ ක්‍රමවේදයක් එමඟින් අනුමත කර නොතිබුණි.

7.3.18 හදිසි මිලදී ගැණුම් ඇණවුම් යටතේ ලබාදුන් ඇණවුම් 158 න් මුළුමනින්ම තොග නොසැපයූ ඖෂධ අයිතම 140 කට අදාළ ඇණවුම් හා කොටසක් නොසැපයූ අයිතම ඇණවුම් 12 ක් වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂකගේ අංක DDG/MSD/EM.PU/Gen/2022 හා 2023 නොවැම්බර් 06 දිනැති ලිපිය මඟින් අවලංගු කර තිබුණු බවත් නිරීක්ෂණය විය **(ඇමුණුම 60).** ඒ අනුව ඉතා හදිසි මිලදී ගැණුම් ලෙස සඳහන් කරමින් හදිසි ප්‍රසම්පාදන මාර්ගෝපදේශය බලපැවැත්වෙන කාලය අවස්ථා කිහිපයක දී දීර්ඝ කර ගනිමින්ද, ඖෂධ සම්බන්ධ ලියාපදිංචිය නොමැති සමාගම් වෙත ඉහත 7.3.14 හි සඳහන් ලිහිල් කිරීම් ද ලබා දීමට උත්සාහ කරමින් මෙම ක්‍රියාවලිය සිදු කළ ද අවසානයේ එලෙස ඇණවුම් 140ක් අවලංගු කර දැමීම තුළින් සිදු කරන ලද සමස්ථ ක්‍රියාවලියම ඵලදායී නොවූ බව විගණනයට නිරීක්ෂණය විය.

7.4 අනායාචිත යෝජනා (Unsolicited Proposals) හරහා සෞඛ්‍ය අමාත්‍යවරයාට ලැබී තිබුණු ඉල්ලීම් සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ මැදිහත්වීම හා අදාළ අභ්‍යන්තර ක්‍රියාවලිය

7.4.1 2022 ඔක්තෝබර් 17 දින එවකට සිටි සෞඛ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමකදී ලබාදුන් උපදෙස් අනුව යැයි සඳහන් කරමින් ඉහත 6.6.8 ඡේදයෙහි සඳහන් ඉන්දියානු සමාගම විසින් ඉදිරිපත් කරන ලද ඖෂධ අයිතම ලැයිස්තුවක් සම්බන්ධයෙන් සකස් කරන ලද සංදේශයක් වෛද්‍ය සැපයීම් වැඩබලන අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් 2022 ඔක්තෝබර් 19 දින සෞඛ්‍ය ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණි **(ඇමුණුම 61).** අනායාචිත යෝජනා ප්‍රසම්පාදන ක්‍රමවේදය (Unsolicited Procument Procedure) යටතේ එය ක්‍රියාත්මක කිරීමට ඔක්තෝබර් 20 දින සෞඛ්‍ය ලේකම් විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී තිබුණි **(ඇමුණුම 62).** එසේම එදිනම මෙම සමාගම හා සෞඛ්‍ය අමාත්‍යවරයා අතර රැස්වීමක් පැවති බවත්, සමාගම සතුව අතිරික්ත තොග පවතින බවටත්, ඖෂධ අයිතම 38 ක් දින 45 ත් දින 65 ත් අතර කාලයකදී ලබාදිය හැකි බවටත් ඉහත 6.6.8 ඡේදයෙහි දැක්වෙන පරිදි සමාගම විසින් සෞඛ්‍ය අමාත්‍යවරයාට 2022 ඔක්තෝබර් 21 දිනැති ලිපියක් මඟින් දන්වා තිබුණි **.** ඒ අනුව අදාළ සමාගමේ ලිඛිත දැනුම් දීමට දින 04 කට පෙරම සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් අදාළ ඇණවුම් ලබාදීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව නිරීක්ෂණය විය.

7.4.2 2022 ඔක්තෝබර් 21 දින සමාගම විසින් සෞඛ්‍ය අමාත්‍යවරයාට ලිපිය යොමුකර දින 04 කට පසු ඉහත අංක 6.6.7 හා 6.6.8 ඡේදයෙහි දැක්වෙන පරිදි සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් 2022 ඔක්තෝබර් 25 දිනැති අමාත්‍ය **මණ්ඩල සංදේශය මඟින්, වෛද්‍ය සැපයීම් අංශය තුළ දැනට පවතින තොග අවදානම් මට්ටමක පවතින බවටත්, ඖෂධ 151 ක තොග ශූන්‍ය මට්ටමක පවතින බවටත්, ඉදිරි සති 03ක කාලසීමාව තුළ ශල්‍යාගාරවල ක්‍රියාකාරීත්වය මුළුමනින්ම අක්‍රීය කරනු ඇති බවටත් දක්වමින්, ඉන්දියානු ණය යෝජනා ක්‍රමය සහ අනෙකුත් අරමුදල් ක්‍රම භාවිතා කර දින 45ක් ඇතුළත ශ්‍රී ලංකාව වෙත මාස 03ක කාලයක් සඳහා** ප්‍රමාණවත් වෛද්‍ය සැපයීම් තොග ලබා දීම සඳහා ඉන්දියාවේ ගුජරාත් හී The Savorite pharmaceuticals (pvt) Ltd ආයතනය එකඟතාවය පළ කර ඇති බවටත්, ඒ සඳහා අවසර ලබා දෙන ලෙසත් අමාත්‍ය මණ්ඩලයෙන් ඉල්ලීමක් සිදුකර තිබුණි. එම අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි ඇමුණුම 1 මඟින් මාස 03 ට අඩු තොග මට්ටම් පවතින ඖෂධ ලැයිස්තු 02 ක් (වැදගත් හා අත්‍යවශ්‍ය) එනම් ඖෂධ 325 ක ලැයිස්තු ඉදිරිපත් කර තිබුණු අතර එම ලැයිස්තු MSMIS පද්ධතිය මඟින් 2022 ඔක්තෝබර් 24 දිනට ලබා ගන්නා ලද තොරතුරු මත පදනම්ව සකස් කර තිබුණි. නමුත් මෙම ඖෂධ ලැයිස්තුවේ තොග මට්ටම තීරණය කිරීමේදී එදිනට ලැබිය යුතු තොග (pending orders) පිළිබඳව අවධානය යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

7.4.3 මෙම සංදේශය පිළිබඳව සලකා බලමින් එම යෝජනා සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබාදීමටත්, අවසන් තීරණයකට එළඹීමට එම යෝජනා සඳහා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සලකා බැලීමටත්, 2022 ඔක්තෝබර් 26 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. 2022 නොවැම්බර් 02 දිනැති මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අනුව අමාත්‍ය මණ්ඩලය පත්කළ සාකච්ඡා කමිටුවක් (Cabinet Appointed Negotiate Committee - CANC) හෝ සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුවක් මඟින් (Health Sector Emergency Procument Committee) මිල හා ගුණත්වය පිළිබඳ සමාලෝචනය කර එකඟතාවයකට පැමිණීමටත්, ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සිදුකරන ක්‍රමවේදය අනුගමනය කිරීමටත්, නිර්දේශ කර තිබුණු අතර ඉහත නිරීක්ෂණවලට යටත්ව අදාළ සමාගමින් ඖෂධ ආනයනය කිරීමට 2022 නොවැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි .

7.4.4 අනායාචිත යෝජනාව ඉදිරිපත් වී දින 10ක් ඇතුළත එනම් 2022 ඔක්තෝබර් 31 දින වන විට සෞඛ්‍ය ලේකම් විසින් මෙම සමාගම වෙත ඖෂධ 38 කට අදාළව එ.ජ.ඩො. මිලියන 4.49 ක් වටිනා ඇණවුම් ප්‍රදානය කිරීමේ ලිපියක් නිකුත් කර තිබුණි **(ඇමුණුම 63)**. සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනීමට පෙර සෞඛ්‍ය ලේකම් විසින් මෙම සමාගමට අදාළ ලිපිය යවා තිබුණු බවත්, ඊට පසුදින එනම් නොවැම්බර් 01 දින සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව රැස්වී ඉන්දියානු ණය යෝජනා හෝ සෘජු මිලදී ගැනීම් යටතේ මෙම මිලදී ගැනීම් සිදු

කිරීමටත් අනුමැතිය ලබා දී තිබුණු බවත් නිරීක්ෂණය විය. 2022 නොවැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලැබීමට දින 09 කට පෙර එනම් 2022 නොවැම්බර් 05 දින වන විට එ.ජ.ඩො.මිලියන 4.49 ක් වටිනා (ආසන්න වශයෙන් රු.බිලියන 1.7) ගැණුම් ඇණවුම් (Purchase Order) 38 ක් අදාළ සමාගමට නිකුත් කර තිබුණු බවද සමාගම විසින් එදිනම එම ගැණුම් ඇණවුම් භාරගෙන තිබුණු බවද විගණනයේදී නිරීක්ෂණය විය.

වගුව අංක - 08 : අනායාචිත ක්‍රමවේදය සිදු කළ කාලරාමුව

	ගනු ලැබූ ක්‍රියාමාර්ගය	**කාල රාමුව**
1	The Savorite pharmaceuticals (pvt) Ltd සමාගම විසින් ඉදිරිපත් කරන ලද ඖෂධ අයිතම ලැයිස්තුවක් සම්බන්ධයෙන් සංදේශයක් සකස් කරන ලෙස එවකට සිටි සෞඛ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමක දී උපදෙස් ලබා දීම.	2022.10.17
2	වෛද්‍ය සැපයීම් වැඩබලන අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් යථෝක්ත සංදේශය සෞඛ්‍ය ලේකම් වෙත ඉදිරිපත් කිරීම.	2022.10.19
3	නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කර තිබුණු සංදේශය අනායාචිත යෝජනා ප්‍රසම්පාදන ක්‍රමවේදය මඟින් ක්‍රියාත්මක කිරීමට සෞඛ්‍ය ලේකම් විසින් දැනුම් දීම.	2022.10.20
4	ඖෂධ අයිතම 38 ක් දින 45 - 65 ත් අතර කාලයකදී ලබා දිය හැකි බවට Savorite සමාගම විසින් සෞඛ්‍ය අමාත්‍යවරයාට ලිපියක් මඟින් දැනුම් දීම	2022.10.21
5	අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීම	.2022.1025
6	පළමු අමාත්‍ය මණ්ඩල තීරණය (ප්‍රතිපත්තිමය අනුමැතිය)	2022.10.26
7	ලේකම් විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව MSD වෙත දැන්වීම	2020.10.28
8	සෞඛ්‍ය ලේකම් විසින් Savorite සමාගම වෙත ඖෂධ 38 කට අදාළව ඇමරිකානු ඩොලර් 4,490,377.5 ක් වටිනා ඇණවුම් ප්‍රදානය කිරීමේ ලිපියක් නිකුත් කිරීම.	2022.10.31
9	සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව රැස්වීම	2022.11.01
10	සැපයුම්කරුට ගැණුම් ඇණවුම් 38 ක් නිකුත් කිරීම	2022.11.05
11	අමාත්‍ය මණ්ඩල අවසන් තීරණය ලබාදීම	2022.11.14

7.4.5 ඉහත අනායාචිත යෝජනාව මඟින් ඉදිරිපත් කර තිබුණු ඖෂධ මිල ගණන් 6.6.11 (i) හා (iii) හි දැක්වෙන මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ පරිදි අදාළ මිල කමිටුව විසින් පෙර SPC මිල ගණන් හා විනිමය අනුපාත වෙනස්කම් ගලපා විශ්ලේෂණය කර ඇති බව හෝ ඖෂධවල ගුණත්වය සම්බන්ධයෙන් අදාළ රසායනාගාර වාර්තා පරිශීලනය කර ඇති බව විගණනයේ දී තහවුරු නොවීය.

7.4.6 2018 ජනවාරි 05 දිනැති අංක 2052/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ගාස්තු නියෝගය ප්‍රකාරව ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ගාස්තු අය කරනු ලබයි. ඉහත කී සමාගම විසින් අනායාචිත යෝජනාව මඟින් ඉදිරිපත් කරන ලද කිසිදු ඖෂධයක් සඳහා ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය ලබා නොතිබුණු අතර මෙම සමාගමට විශේෂිත වන පරිදි මුදල් අයකිරීමකින් තොරව WOR සහතික ලබාදීමට ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම්වරයා විසින් 2022 දෙසැම්බර් 08 දින පැවති රැස්වීමක දී කරුණු දක්වා තිබුණු අතර සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් මෙම අවස්ථාවට පමණක් එලෙස සිදු කරන ලෙසටත්, එය සාමාන්‍ය භාවිතයක් කර නොගැනීමටත් දැනුම් දී තිබුණි. ඒ අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් විශේෂ ක්‍රමවේදය (special pathway) යටතේ ඖෂධයේ ගුණත්වය පිළිබඳව ඇගයීමකින් තොරව WOR සහතික 38 ක් ලබා දී තිබුණු බවත් නිරීක්ෂණය විය.

7.4.7 වෛද්‍ය සැපයීම්වල දැනට පවතින තොග අවදානම් මට්ටමක පවතින බවත්, ඉදිරි සති 03 ක කාලසීමාව තුළ රටේ උග්‍ර වෛද්‍ය සැපයුම් හිඟයක් නිර්මාණය වීමේ දැඩි අවධානමක් පවතින බවත්, ඉදිරි සති 03 ක කාලසීමාව තුළ ශල්‍යාගාරවල ක්‍රියාකාරීත්වය මුළුමනින්ම අක්‍රීය කරනු ඇතැයිද අපේක්ෂා කරන බව දක්වමින් රජයේ සෞඛ්‍ය ආයතනවල උග්‍ර වෛද්‍ය සැපයීම් හිඟය වළක්වා ගැනීම සඳහා වෛද්‍ය සැපයුම් අංශයේ හදිසි තත්ත්වය මත Savorite සමාගමෙන් ඖෂධ ආනයනය කරන බවට 2022 ඔක්තෝබර් 25 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් අමාත්‍ය මණ්ඩලයට කරුණු දක්වා ඇතත්, මෙම සමාගමට ඇණවුම් ඉදිරිපත් කළ ඖෂධ 38 න් ඖෂධ අයිතම 10 ක්ම වෛද්‍ය සැපයීම් අංශයේ Pronto පද්ධතිය අනුව අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුවට ඇතුළත් නොවන කාණ්ඩයේ ඖෂධ වන අතර ඒ සඳහා වැයකිරීමට අපේක්ෂිත මුදල ආසන්න වශයෙන් රු.මිලියන 280 ක් බවද නිරීක්ෂණය විය.

7.4.8 එවැනි අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුවට ඇතුළත් නොවන ඖෂධ වැඩි මිලට ගුණත්වය පරීක්ෂා කිරීමකින් තොරව හදිසි මිල දී ගැනීම් යටතේ එකම සමාගමකින් මිල දී ගැනීම අත්‍යවශ්‍යද යන්න විගණනයේ දී ගැටළු සහගත වූ අතර ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන ඒකකයේ අතිරේක ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2022 දෙසැම්බර් 08 දින පැවති ඖෂධ කළමනාකරණ රැස්වීමේ දී මෙම සමාගමට ලබා දී ඇති ඇණවුම් සියල්ල තවත් මාස 03 ක් සඳහා සියයට 100

කින් ඉහළ නංවා ඇණවුම් ඉදිරිපත් කිරීමට තීරණය කර ඉන් අයිතම 33ක් සඳහා ඇණවුම් නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය.

7.4.9 ඉහත අංක 6.6.11 හා 6.6.15 අනුව Savorite සමාගමට අමතරව ඉන්දියාවේ Kausikh Therapeutics (P) Ltd නමැති සමාගමක් විසින්ද එ.ජ.ඩො.537,955.12 ක් වටිනා ඖෂධ අයිතම 28 ක් සම්බන්ධයෙන් අනායාචිත යෝජනාවක් (Unsolicited Proposal) සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර තිබුණු බවත්, ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ ලිපිගොනුවක් හරහා සෞඛ්‍ය ලේකම් විසින් අදාළ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ඇමතූ 2022 දෙසැම්බර් 20 දිනැති ලිපියක් **(ඇමුණුම 64)** මඟින් සමාගම විසින් ඉදිරිපත් කළ යෝජනාවේ සඳහන් අයිතම 13 ක් ආනයනය කිරීමට අනුමත කරන බවත්, සම්මත මිලට වඩා ඉහළ මිලක් ඇති අයිතම 15 ක මිල පිළිබඳ එකඟතාවයකට පැමිණීමටත් දැනුම් දී තිබුණි. **(ඇමුණුම 65)**. එසේම ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේ ඉතිරි අරමුදල් මෙම අවශ්‍යතාවයට උපයෝගී කර ගැනීමටද දැනුම් දී තිබුණි. නමුත් ඒ වන විටත් 2022 නොවැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ඇගයීම් කමිටු හෝ මිල කමිටු පත් කර නොතිබුණු අතර ඊට දින 14 කට පසු එනම් 2023 ජනවාරි 03 දින ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම් විසින් මෙම අනායාචිත යෝජනාව ඇගයීමට පස් දෙනෙකුගෙන් සමන්විත මිල කමිටුවක් පත්කිරීමට ඉල්ලමින් සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ඉදිරිපත් කර තිබුණි.

7.4.10 2022 දෙසැම්බර් 19 දින ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති ඖෂධ කළමනාකරණ රැස්වීමේ දී මෙම සමාගමේ අයිතම 28 ට මාස 06 ක් සඳහා තොග ලබා දීමට තීරණය කර තිබුණු අතර සෞඛ්‍ය අමාත්‍යවරයා හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරීවරයා 2022 දෙසැම්බර් 21 ත් 24 ත් අතර කාලයේදී ඉන්දියාවේ මෙම සමාගම නිරීක්ෂණය සඳහාද සහභාගී වී තිබුණි. නමුත් මෙම සැපයුම්කරු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් මීට පෙර අසාධු ලේඛනගත කරන ලද සමාගමක් බවට කරුණු හෙළිවීමෙන් පසු මෙම අයිතම මිල දී ගැනීම සම්බන්ධ ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි.

7.4.11 ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ඇගයීම් සිදු නොකර ඖෂධවල තත්ත්වය, ආරක්ෂාව හා ප්‍රත්‍යක්ෂභාවය සම්බන්ධයෙන් වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ වෙත වගකීම පවරා තිබුණු ඉහත සඳහන් අනායාචිත යෝජනාව හරහා ඇණවුම් ලබාදුන් ඖෂධ අයිතම 38 කට අදාළව සිවිල් සංවිධානයක් හා සිවිල් සංවිධාන ක්‍රියාකාරිකයකු විසින් ඉදිරිපත් කරන ලද මූලික අයිතිවාසිකම් නඩු අංක SC/FR/65/2023 හා SC/FR/82/2023 හේතුවෙන් ඖෂධ ගෙන්වීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අත්හිටුවා තිබුණි.

7.5 හදිසි මිලදී ගැනීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මැදිහත්වීම

7.5.1 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 58, 82 හා 101 වගන්ති මඟින් **(ඇමුණුම 66)** සියළුම ඖෂධ ආනයනය, නිෂ්පාදනය, විකිණීම හා බෙදාහැරීමේදී ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය ලබා ගැනීම අනිවාර්ය වන අතර, ඖෂධවල ගුණත්වය, ආරක්ෂාව හා ප්‍රත්‍යක්ෂභාවය පිළිබඳ ඖෂධ අධිකාරිය වගකිව යුතු විය. නමුත් ඒ පිළිබඳව නොසලකා අධිකාරියේ ලියාපදිංචිය නොමැති අයිතම ලියාපදිංචිය නිදහස් කිරීමේ ක්‍රියාවලියකට යටත් වීමටද අමාත්‍ය මණ්ඩලය වෙත යෝජනා කර ඇති බව නිරීක්ෂණය විය. එසේම ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 109 වන වගන්තියෙන් බැහැරව වෙනත් කරුණු සඳහා ලියාපදිංචිය නිදහස් කිරීමේ ක්‍රියාවලිය භාවිතා කිරීමෙන් ඇති වන ගැටලු පිළිබඳව වර්ෂ ගණනාවක සිට විගණනය විසින් නිරීක්ෂණ ඉදිරිපත් කළද, ඒ පිළිබඳව අවධානය යොමු කර නොමැති බවද නිරීක්ෂණය විය.

7.5.2 එසේම මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම් විසින් 2023 ජනවාරි 13 දින රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 1/2023 මඟින් නිකුත් කරන ලද නව ඖෂධ හා වෛද්‍ය උපකරණ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 3.6 යටතේත්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2023 වර්ෂයේ ලංසු ලියවිලිවල පොදු කොන්දේසි යටතේත්, මතභේදයට තුඩු දුන් අභිලාෂ කැඳවීමේදී අනුගම්‍ය අවශ්‍යතා යටතේත් ඖෂධ ලියාපදිංචිය නොමැති සැපයුම්කරුවන්ට ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතිකය ලබාගෙන ඖෂධ සැපයීමට අවස්ථාව විවර කරමින් අදාළ කොන්දේසි ලිහිල් කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

7.5.3 ඉහත 6.6.4 ඡේදයෙහි දැක්වෙන පරිදි සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් 2022 සැප්තැම්බර් 26 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමේදී ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය නොමැති අයිතම ආනයනය කිරීම ප්‍රමාදවීම අවම කිරීමට, ආනයනයට පෙර නිසි ලෙස ලියාපදිංචිය නිදහස් කිරීමේ ක්‍රියාවලියකට යටත් විය යුතු බවට යෝජනා කර තිබුණද, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතික (WOR) විධිමත් කමිටු අනුමැතියකට යටත්ව නිකුත් කිරීමේ ක්‍රමවේදයෙන් බැහැරව වේගවත් යාන්ත්‍රණයක් (Fast Track) ඔස්සේ විශේෂ ක්‍රමවේදයකට (Special Pathway) යැයි සඳහන් කරමින් අදාළ කමිටුවට ඉදිරිපත් කිරීමකින් තොරව WOR සහතික නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය.

7.5.4 පහත නිරීක්ෂණ අංක 7.11.7 හි සඳහන් පරිදි ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් 2022 සැප්තැම්බර් 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව අනුකමිටු අනුමැතිය සඳහා යොමු කිරීමෙන් තොරව Special Pathway ක්‍රමය වශයෙන් හඳුන්වනු ලබන වේගවත් යාන්ත්‍රණයක් හරහා ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතිය මත

ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. එහිදී ලියාපදිංචියෙන් නිදහස් කිරීම් සඳහා අනුමැතිය ප්‍රදානය කිරීමේ දී අනුකමිටුව විසින් සලකා බලනු ලබන මිල සාධාරණත්වය, ඖෂධය පිළිබඳව අදාළ විද්‍යාලයේ මතය, ඖෂධයේ අත්‍යාවශ්‍යතාවය, දැනට පවතින ඒ හා සමාන ලියාපදිංචි ඖෂධ සංඛ්‍යාව, ඖෂධයේ ලියාපදිංචි තත්ත්වය, සැපයුම්කරුගේ සහ නිෂ්පාදකගේ ලියාපදිංචි තත්ත්වය, ගුණත්වය පිළිබඳව පෙර ගැටළු පැවතීම (තත්ත්වයෙන් අසමත් වීම්) වැනි සාධක පිළිබඳව අවධානය යොමු කිරීමෙන් තොරව සහ ඖෂධවල ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය තහවුරු කරන ලේඛන ඇගයීමෙන් තොරව ගැණුම් ඇණවුම, ඉන්ඩෙන්ටුව සහ වෙළඳ ඉන්වොයිසිය වැනි ඇණවුම තහවුරු කරන ලේඛන පමණක් පරීක්ෂා කර අදාළ අනුමැතිය පිරිනමා තිබුණි. මේ ආකාරයටම 2018 මාර්තු 14 දින මා විසින් නිකුත් කරන ලද වෛද්‍ය සැපයීම් ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණනයේදී ද අධිකාරිය විසින් හා අධිකාරිය පිහිටුවීමට පෙර සිටම සිදුකරන ලද විරෝධතා නොදැක්වීමේ ලිපි (No Objection Letter - NOL) නිකුත් කිරීමේ ක්‍රමවේදය ස්වාධීන අපක්ෂපාතී කමිටුවක් හරහා සිදුකළ යුතු බවට ලබාදුන් නිර්දේශය නොසලකා ඇති බවද නිරීක්ෂණය විය.

7.5.5 ඉහත සඳහන් පරිදි ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුකමිටුව අභිබවා ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතිය මත ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට කටයුතු කිරීම පිළිබඳව පහත අංක 7.11.7 හි නිරීක්ෂණයෙහි දැක්වේ.

7.5.6 එසේම ඉහත අංක 6.6.4 අනුව නිසි ලෙස ලියාපදිංචිය නිදහස් කිරීමේ ක්‍රියාවලියකට යටත් විය යුතු බවට අමාත්‍ය මණ්ඩලයට යෝජනා කළද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි ඉන්දියානු ණය යෝජනා ක්‍රමය, ලෝක බැංකු, ආසියනු සංවර්ධන බැංකු, ආසියානු යටිතල පහසුකම්, JICA ආදි විවිධ යෝජනා හරහා ආනයනය කරන තත්ත්වයෙන් අසමත් ඖෂධ සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියට වගකීමක් නොමැති බවත්, නිෂ්පාදනයේ ආරක්ෂාව, ප්‍රත්‍යක්ෂභාවය හා ගුණත්වය පිළිබඳව වගකීම ගත නොහැකි බවටත් දැනුම් දී, 2015 අංක 05 දරණ පනතේ 3 (අ) වගන්තිය අනුව ඖෂධවල ගුණත්වය සම්බන්ධයෙන් අධිකාරිය තම වගකීමෙන් බැහැර වී තිබුණි.

7.5.7 2022 දෙසැම්බර් මාසයේදී ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් අනායාචිත යෝජනා හරහා ඉදිරිපත් වූ ඖෂධ අයිතම 38 ක් ආනයනය කිරීම සඳහා Savorite සමාගමක් වෙත ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතික (WOR) 38 ක් නිකුත් කර තිබුණු නමුත්, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් අදාළ ඖෂධ ඇගයීම් සිදුකර නොමැති බවත්, ඒ හේතුවෙන් අදාළ ඖෂධවල ගුණත්වය, ආරක්ෂාකාරී බව හා ප්‍රත්‍යක්ෂ බව (quality, safety, efficacy) පිළිබඳ අධිකාරිය වග නොකියන බවටත්, වගකීම වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ විසින් භාරගත යුතු බවටත් කොන්දේසි ඉදිරිපත් කරමින් එහි වගකීම අධිකාරිය විසින් අත්හැර තිබුණි. එහෙත් වෛද්‍ය

සැපයීම් අංශයේ අධ්‍යක්ෂ විසින් ‘‘අදාළ ඖෂධවල ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය සම්බන්ධ නීති රාමුව ජාතික ඖෂධ නියාමන අධිකාරියට අදාළ වන බැවින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම පිළිබඳ සම්පූර්ණ වගකීම අධිකාරිය සතු වන බවත්, ඒ පිළිබඳ වගකීම තමාට දැරීමට නොහැකි බවත්, එම කොන්දේසි අධිකාරිය විසින් තම එකඟතාවයෙන් තොරව ඇතුළත් කර ඇති බවටත්,’’ විගණනයට අදහස් දක්වන ලදි.

7.5.8 පහත නිරීක්ෂණ අංක 7.11.6.4 හි සඳහන් පරිදි 2022 වර්ෂයේ සිට සිදුකරන ලද හදිසි මිලදී ගැනීම් හා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ සිදුකළ මිලදී ගැනීම්වලට අදාළව අධිකාරිය විසින් ආනයන හා අපනයන පාලක ජනරාල් වෙත ඉදිරිපත් කරනු ලබන ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයේ වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂකගේ පිටපත වෛද්‍ය සැපයීම් අංශයට විධිමත් පරිදි එවා නොතිබුණි. අදාළ පිටපත් විධිමත් පරිදි වෛද්‍ය සැපයීම් අංශයට ලැබී තිබුනේ නම් එම සහතික සත්‍ය ඒවා ද යන්න තොග පාලන නිලධාරීන්ට තහවුරු කර ගත හැකිව තිබුණු බවද, වර්තමානයේ බරපතල ගැටළු පැන නැඟනු Human Immunoglobulin හා Rituximab වැනි ව්‍යාජ ඖෂධ සැපයීමේ වංචාවන් අවම කර ගැනීමට අභ්‍යන්තර පාලනය සමත් වනු ඇති බවද නිරීක්ෂණය විය. මෙම ප්‍රශ්නගත සිදුවීමෙන් අනතුරුව 2023 ඔක්තෝබර් 16 දින ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 105 ක වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂකගේ පිටපත ඖෂධ නියාමන අධිකාරිය විසින් වෛද්‍ය සැපයීම් අංශයට එවා තිබුණි. නමුත් විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 31 දින දක්වාම ඖෂධ අධිකාරිය විසින් නිකුත් කර තිබුණු අනෙක් WOR සහතිකවලට අදාළ පිටපත වෛද්‍ය සැපයීම් අංශය වෙත එවා නොතිබුණු බවද, ඒ හේතුවෙන් වංචා සිදු කිරීමට ඇති ඉඩකඩ තවදුරටත් විවරව පවතින බවද වැඩි දුරටත් නිරීක්ෂණය විය.

7.6 ඖෂධ ලියාපදිංචියේ දී රජයේ ඖෂධ අවශ්‍යතාවයන් සැලකිල්ලට නොගැනීම

7.6.1 2007 ඖෂධ හා වෛද්‍ය උපකරණ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.1 අනුව **(ඇමුණුම 67)** රජයේ රෝහල් සඳහා ඖෂධ ප්‍රසම්පාදනය කිරීමේ දී ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ලියාපදිංචිය ලබා තිබීම ප්‍රධාන නිර්ණායකයක් ලෙස සලකනු ලබන අතර අතර එක් ඖෂධ වර්ගීය නාමයක් (Generic Name) යටතේ ඖෂධ කිහිපයක් ලියාපදිංචි වී තිබීම මඟින් තරඟකාරී ලංසු ක්‍රමය හරහා යෝග්‍යතම ඖෂධය සාධාරණ මිලකට සපයා ගැනීමේ අවස්ථාව ප්‍රසම්පාදන අස්ථිත්වයන් වෙත සැලසෙයි. තවද අවසන් වරට 2020-2021 වර්ෂ තුළ පවත්වන ලද ඖෂධ වට්ටෝරු සමාලෝචන කමිටුව විසින් රජයේ රෝහල් තුළ භාවිතා කළ යුතු ඖෂධ 1,743 ක ලැයිස්තුවක් හඳුනාගෙන තිබුණු අතර **(ඇමුණුම 68)** ඉන් ලියාපදිංචියේ දී ප්‍රමුඛත්වය ලබා දිය යුතු ඖෂධ 36 ක්, ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව වැඩි කළ යුතු ඖෂධ 58 ක්, දුර්ලභ රෝගාබාධ සඳහා වන ඖෂධ කාණ්ඩය (Orphan Category) යටතේ

ලියාපදිංචි කළ යුතු ඖෂධ 64 ක් සහ ලියාපදිංචිය සඳහා ඇතුළත් කළ යුතු නව ඖෂධ 154 ක් වශයෙන් ඖෂධ 312 ක ලැයිස්තුවක් වෛද්‍ය සැපයීම් අංශය විසින් 2022 නොවැම්බර් 24 දින අංක MSD/QA-02/FRC/NMRA-01 දරන ලිපිය මඟින් ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි වෙත දැනුම් දී තිබුණි **(ඇමුණුම 69).**

7.6.2 එසේම වෛද්‍ය සැපයීම් සඳහා වන පිරිවැය අවම කිරීමේ අරමුණින් රෝහල් සඳහා මිලදී ගෙන භාවිතා කළ යුතුවන ඖෂධ 850 ක ප්‍රමුඛතා ලැයිස්තුවක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2023 අප්‍රේල් 04 දින නිකුත් කරන ලද අංක 01-14/2023 දරන චක්‍රලේඛය මඟින් ප්‍රකාශයට පත් කර තිබුණි **(ඇමුණුම 70)**. එම ප්‍රමුඛතා ලැයිස්තුවෙන් ඖෂධ 33ක් ද ඇතුළත් වන පරිදි දුර්ලභ රෝගාබාධ සඳහා වන ඖෂධ 96 ක් සහ මෙතෙක් ලියාපදිංචිය නොමැති ඖෂධ 135 ක සංශෝධිත ලැයිස්තුවක් ලියාපදිංචි ප්‍රමුඛත්වය උදෙසා වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ 2023 අප්‍රේල් 11 දින අධිකාරිය වෙත අවස්ථා දෙකක දී අංක MSD/FR/QA/SEO/2023-01 හා 02 දරන ලිපි මඟින් ඉදිරිපත් කර තිබුණි **(ඇමුණුම 71)**. නමුත් ඖෂධ නියාමන අධිකාරිය විසින් ඉහත කරුණු පිළිබඳ අවධානය යොමුකර නොතිබුණු අතර 2020 ඔක්තෝබර් 14 දින අධිකාරියේ නිල වෙබ් අඩවියෙහි පළ කරනු ලද ඖෂධ 95 ක ලියාපදිංචි ප්‍රමුඛතා ලැයිස්තුව රජයේ ඖෂධ අවශ්‍යතාවය පිළිබඳව කාලීනව සමාලෝචනය කරමින් යාවත්කාලීන නොකිරීම නිසා ඉහත ඖෂධ ලියාපදිංචිය ධෛර්යමත් කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි **(ඇමුණුම 72).**

7.6.3 රජයේ රෝහල් සඳහා අත්‍යාවශ්‍ය ඖෂධ සඳහා ලියාපදිංචිය නොමැති වීම හෝ ලියාපදිංචිය අවම වීම තුළින්, වට්ටෝරු සමාලෝචන කමිටුව විසින් තීරණය කරන ලද ඇතැම් ඖෂධ සෞඛ්‍ය පද්ධතිය තුළට ඇතුළත් කිරීමට නොහැකි වන අතර එම ඖෂධ ප්‍රසම්පාදනය කර ගැනීමේ දී විවිධ ගැටළු ඇති වන බව ඉහත 7.6.2 ඡේදයෙහි දැක්වෙන 2023 අප්‍රේල් 11 දිනැති ලිපිය මඟින් වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ විසින් දක්වා තිබුණි . ලියාපදිංචිය නොමැති බැවින් ඖෂධයේ ගුණත්වය, ප්‍රත්‍යක්ෂභාවය සහ ආරක්ෂාව පිළිබඳ තහවුරුවක් නොමැති වීම සහ අඛණ්ඩව සම්පාදනය කර ගැනීමට නොහැකි වීම වැනි සැපයුම්දාමයට අදාළ ගැටලු ඇති වන අතර මෙවැනි හේතූන් මත රෝගීන් හට මෙම ඖෂධ බාහිරින් මිලදී ගැනීමට සිදුනොවේයැයි හා ඒකාධිකාරී වෙළඳපොළවල් නිර්මාණය නොවේයැයි විගණනයට තහවුරු වීමක් නොමැති අතර නිදහස් සෞඛ්‍යයෙහි අපේක්ෂිත ප්‍රතිලාභ මහජනතාවට ලැබීම සම්බන්ධයෙන් විගණනයට නිශ්චිත තහවුරු වීමක්ද නොතිබුණි. ඒ අනුව අධිකාරිය රජයේ ඖෂධ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කර එම ඖෂධවල ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩපිළිවෙළක් අධිකාරි සකස් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

7.7 ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් සිදුකරන ඖෂධ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය

7.7.1 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 58(1) උපවගන්තිය ප්‍රකාරව **(ඇමුණුම 73)** කිසිදු තැනැත්තෙකු විසින් යම් ඖෂධයක් අධිකාරියේ ලියාපදිංචි නොකර සහ අධිකාරියෙන් බලපත්‍රයක් ලබා නොගෙන නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම නොකළ යුතු අතර පනතේ 64 වන වගන්තිය ප්‍රකාරව **(ඇමුණුම 74)** බලපත්‍ර අලුත් කිරීම සිදු කළ යුතුය. ඒ අනුව ඖෂධ ලියාපදිංචිය සහ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා අධිකාරිය වෙත ඖෂධ ලිපිගොනු **(Dossier)** සැලකිය යුතු ප්‍රමාණයක් වාර්ෂිකව ඉදිරිපත් වේ. 2019 ඔක්තෝබර් 14 දිනැති අංක 2145/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල වූ ඖෂධ ලියාපදිංචි කිරීමේ සහ බලපත්‍ර ලබා දීමේ නියෝගයෙහි XXIII වන උපලේඛනය මඟින් ප්‍රකාශිත යහපත් නියාමන පරිචයන් ප්‍රකාරව ලියාපදිංචි ඩොසියරයක් ඇගයීමේ සැකසුම් කාල සීමාව වැඩ කරන දින 300 ක් ලෙස **(ඇමුණුම 75)** නිර්ණය කර තිබුණි. ඖෂධයේ ඩොසියර ගොනුව ඇගයීම් මෙන්ම ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙතින් ඖෂධයේ තත්ත්වය පරීක්ෂා කරවා ගැනීම සඳහා මෙම සැකසුම් කාල සීමාව ලබා දී තිබුණි.

7.7.2 එසේ වුවද අධිකාරිය විසින් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වන සියලුම ඖෂධවල තත්ත්වය පර්යේෂණාගාරය තුළ පරීක්ෂා කිරීම සිදු නොකරන අතර ලේඛන පරීක්ෂා කිරීම මඟින් පමණක් ඖෂධයේ ඇගයීම සිදු කරනු ලබයි. එසේ වුවද අධිකාරියේ ඖෂධ ලියාපදිංචි ක්‍රියාවලිය සහ ලියාපදිංචිය අලුත් කිරීමේ ක්‍රියාවලිය පසුබෑමට (Backlog) ලක්ව තිබුණු අතර 2023 ජූනි 30 දින වන විට අධිකාරිය සතුව 2022 සහ 2023 වර්ෂ තුළ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වූ නව ඖෂධ ගොනු 1,169 ක් සහ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉදිරිපත් වූ ඖෂධ ගොනු 396 ක් වශයෙන් පොරොත්තු ගොනු (Pending Dossiers) 1,565 ක් පැවතුණු බව පහත වගුව අංක 09හි දැක්වේ **(ඇමුණුම 76).**

වගුව අංක - 09 : 2023 ජූනි 30 දිනට පොරොත්තු ගොනු (2022- 2023 ට අදාළ)

	2022	2023.06.30 දක්වා	එකතුව
ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වූ	693	476	1,169
ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉදිරිපත් වූ	189	207	396
			1,565

7.7.3 තවද, ඉහත 7.7.1 ඡේදයෙහි සඳහන් කරන ලද ඖෂධ ලියාපදිංචි කිරීමේ සහ බලපත්‍ර ලබා දීමේ නියෝගයෙහි සඳහන් ඉලක්කගත කාලය තුළ ලියාපදිංචිය ප්‍රදානය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් 2023 ජූනි 30 දිනට 2018 - 2021 කාලපරිච්ඡේදය තුළ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වූ ඖෂධ ගොනු 98 ක් සහ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉදිරිපත් වූ ඖෂධ ගොනු 219 ක්

වශයෙන් ගොනු 317 ක ලියාපදිංචි කටයුතු අවසන් නොකර වසර 1 ½ වැඩි කාලයක් මුළුල්ලේ අධිකාරිය සතුව පැවතුණු බව විගණනයට තහවුරු විය.

වගුව අංක - 10 : 2023 ජූනි 30 දිනට පොරොත්තු ගොනු (2018- 2021 ට අදාළ)

වර්ෂය	ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වූ	ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉදිරිපත් වූ	එකතුව
2018	11	14	25
2019	13	12	25
2020	34	82	116
2021	40	111	151
එකතුව	98	219	317

ඒ අනුව 2023 ජූනි 30 දිනට අධිකාරිය සතුව පැවති ලියාපදිංචිය සම්පූර්ණ නොකළ මුළු පොරොත්තු ගොනු සංඛ්‍යාව 1,882 ක් විය.

7.7.4 ඉහත 7.7.1 ඡේදයෙහි දැක්වෙන පරිදි ඩොසියරයක් ඇගයීම සඳහා දින 300 ක් ලෙස නිර්ණය කර තිබුණද 2020 වර්ෂයේ දී ඉහත අංක 7.3.16 හි සඳහන් එකම ලිපිනයේ පිහිටි එකම නම්වලින් යුක්ත අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් සමන්විත සමාගම් 02 ක හා ඒ හා සම්බන්ධිත තවත් සමාගමක ඖෂධ ලියාපදිංචි සහතික ලබාගැනීමට ඖෂධ අධිකාරියට ඉදිරිපත් කර තිබුණු ඩොසියර් (Dossiers) 93 කින් ඩොසියර් 41 ක් එක් ඖෂධවේදියෙකු විසින් දින දෙකක් හෝ එයට අඩු කාලයක් තුළ දී ඇගයීම් සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය. මින් ඩොසියර 17 ක ඇගයීම් කටයුතු ඖෂධ නියාමන අධිකාරියේ එවකට සිටි ප්‍රධාන විධායක නිලධාරීගේ පැවරීම මත සිදු කර තිබුණු බව ඩොසියර පැවරීමේ ලේඛණය අනුව විගණනයට තහවුරු විය**.** එම ඩොසියර් නිසි ඇගයීමකට ලක්කර නොතිබුණු බව ස්වාධීන විශේෂඥ පරීක්ෂණ වාර්තාවක් මඟින් තහවුරු කර තිබුණි **(ඇමුණුම 77).**

7.7.5 සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත අනුයුක්ත කර සිටි ඉහත 7.7.4 ඡේදයෙහි සඳහන් ඖෂධවේදියා විසින් 2019 වර්ෂය තුළදී ඉහත සමාගම් හැරුණු විට අනෙකුත් සමාගම්වල එක් ඩොසියරයක් ඇගයීම සඳහා දින 281 ත් දින 427 ත් අතර කාලයක් ගත කර තිබුණු බවද අනාවරණය විය. තවද ඉහත 7.7.1 ඡේදයෙහි සඳහන් ගැසට් පත්‍රයෙහි 8 වගන්තිය අනුව **(ඇමුණුම 78)** ඖෂධයක තාවකාලික ලියාපදිංචිය සඳහා වන කාලසීමාව අවසන් වීමෙන් පසුව ඖෂධයක් සඳහා අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා සම්පූර්ණ ලියාපදිංචිය ප්‍රදානය කළහැකි වුවද ඊට පටහැනිව අවස්ථා 35 කදී අදාළ සමාගම් 03 වෙත

තාවකාලික ලියාපදිංචි සහතික නිකුත් කර මාස 03 ක් යන විට වසර 05 ක් සඳහා වූ සම්පූර්ණ ලියාපදිංචි සහතිකය නිකුත් කිරීමට කටයුතු කර තිබුණි.

7.7.6 ඒ අනුව සම්පූර්ණ ලියාපදිංචිය ලබාදීමේ ඇගයීම් කටයුතු, පරීක්ෂා කිරීම් හා ප්‍රධාන විධායක නිලධාරී විසින් අනුමත කිරීම දින 01 ත් දින 02 ත් තුළදී සිදුකිරීම තුළින් සමාගම්වලට වාසිදායක තත්ත්වයක් ඇති නොවූයේයැයි පැවසීමට සහතිකයක් විගණනයට නොමැත. මෙම ප්‍රශ්නගත ක්‍රියාව පිළිබඳව විගණනය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත අනාවරණය කර වර්ෂ 02 කට අධික කාලයක් ගතවී තිබුණ ද කිසිදු විමර්ශනයක් සිදුකර නොතිබුණු අතර එවැනි ක්‍රියාවන් නැවත සිදු නොවන ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

7.7.7 ඉහත 7.7.2 ඡේදයෙහි දැක්වෙන ඖෂධ ලියාපදිංචි කිරීමේ සහ ලියාපදිංචිය අලුත් කිරීමේ ක්‍රියාවලීන් තුළ පැවති පසුබෑම සඳහා පිළියම් වශයෙන් අධිකාරිය විසින් පැවති ලියාපදිංචිය දීර්ඝ කිරීමේ (Extension of Certificates) සහ තොග නිෂ්කාශන අනුමැතීන් (Approval for Consignment Clearance) ලබා දීමේ ක්‍රමවේදයන් අනුගමනය කර තිබුණි. එහෙත්, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත සහ 2019 ඔක්තෝබර් 14 දිනැති අංක 2145/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ඖෂධ ලියාපදිංචි කිරීමේ සහ බලපත්‍ර ලබා දීමේ නියෝගය මඟින් ලියාපදිංචිය දීර්ඝ කිරීම සහ තොග නිෂ්කාශන අනුමැතීන් ලබා දීම සඳහා අධිකාරිය වෙත නීතිමය ප්‍රතිපාදන සැලසී නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. ඒ අනුව මෙවැනි ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම තුළින් ඖෂධ ලියාපදිංචිය සහ බලපත්‍ර අලුත් කිරීම පිළිබඳව සලසා ඇති නියාමන විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත පරිදි ඖෂධවල ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය පිළිබඳව කලින් කළ සිදු කරනු ලැබිය යුතු සමාලෝචනයන් ඉටු නොවන බව ද වැඩි දුරටත් නිරීක්ෂණය විය.

7.7.7.1 2019 ජුනි 30 දිනෙන් පසු කල් ඉකුත් වීමට නියමිත සියළුම ඖෂධ ලියාපදිංචි සහතිකවල වලංගු කාලය 2021 ජූනි 30 දක්වාත් **(ඇමුණුම 79)** පසුව 2021 දෙසැම්බර් 31 දින දක්වාත් දීර්ඝ කිරීමට අධිකාරිය කටයුතු කර තිබුණි **(ඇමුණුම 80).** ඉන් අනතුරුව සම්පූර්ණ ගොනුව ඇගයීමෙන් තොරව 2022 වර්ෂය තුළ ඖෂධ 618 ක සහ 2023 මුල් අර්ධ වර්ෂය තුළ ඖෂධ 249 ක පැවති ලියාපදිංචිය වසර 5 කින් දීර්ඝ කිරීමටත් **(ඇමුණුම 81),** විගණිත කාලපරිච්ඡේදය තුළ තාවකාලික ලියාපදිංචි සහතික 124 ක වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීමටත් අධිකාරිය කටයුතු කර තිබුණි **(ඇමුණුම 82).** ඒ අනුව ඇතැම් ඖෂධ සඳහා පැවති ලියාපදිංචිය අවස්ථා කිහිපයක දී සැලකිය යුතු වසර ගණනකින් දීර්ඝ කර තිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය. තවද 2022 ජනවාරි සිට 2023 ජුනි දක්වා කාලපරිච්ඡේදය තුළ වලංගු කාලය දීර්ඝ කරන ලද තාවකාලික ලියාපදිංචි සහතික 124 න් 70 ක ලියාපදිංචි වලංගු කාලය අවස්ථා දෙකක දී වසර 2 ත් 4 ත් අතර කාලයකින් දීර්ඝ කර තිබුණු බව වැඩි දුරටත් නිරීක්ෂණය විය **(ඇමුණුම 83)**

7.7.7.2 ඉහත 7.7.1 ඡේදයෙහි දැක්වෙන පනතේ 64 වගන්තිය මඟින් පනවනු ලබන ලියාපදිංචිය අලුත් කිරීම සඳහා අධිකාරිය වෙත ඉල්ලීමක් ඉදිරිපත් වූ විට ඒ පිළිබඳව මතය දැන ගැනීම සඳහා ඖෂධ ඇගයීම් කමිටුව වෙත යොමු කිරීම, අවශ්‍ය අවස්ථාවල දී සාම්පල, ලේඛන හෝ වෙනත් සාක්ෂි ලබා ගැනීම, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙතින් ඇගයීම් වාර්තා ලබා ගැනීම සහ අදාළ කරුණු සැලකිල්ලට ගෙන ලියාපදිංචිය අලුත් කිරීම සිදු කිරීම කළ යුතු වුවද ඉහත 7.7.7.1 ඡේදයෙහි පරිදි ලියාපදිංචි සහතිකවල වලංගු කාලය දීර්ඝ කිරීම තුළින් නියාමන විධිවිධාන කඩවන බව හා එමඟින් ඖෂධවල ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය පිළිබඳ සාධාරණ තහවුරුවක් නොලැබෙන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

7.7.7.3 ඇතැම් ඖෂධවල ලියාපදිංචිය සැකසෙමින් පැවතීම, පැවති ලියාපදිංචිය කල් ඉකුත් වී තිබීම සහ ලියාපදිංචි සහතිකයේ ඉතිරි වලංගු කාලය කෙටි වීම වැනි හේතු මත 2022 අප්‍රේල් 30 දින දක්වා පමණක් ආනයනය කරනු ලබන එකිනෙක ඖෂධ තොගය රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා තොග නිෂ්කාශන අනුමැතීන් ලබා දීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය 2022 ජනවාරි 21 දින අනුමැතිය ලබා දී තිබුණි **(ඇමුණුම 84).** පසුව අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරී විසින් පනතේ 14(උ) උපවගන්තිය මඟින් **(ඇමුණුම 85)** ඖෂධ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමේ දී අවශ්‍යවන අමුද්‍රව්‍ය ආදිය රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සඳහා සලසා ඇති බලතල වැරදි ලෙස අර්ථකථනය කරමින් ඖෂධ තොග නිෂ්කාශන අනුමැතීන් ලබා දීම සඳහා 2022 මැයි 20 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් **(ඇමුණුම 86)** ඉදිරිපත් කර තිබුණු අතර ඒ සඳහා දින නියමයකින් තොරව මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව ප්‍රධාන විධායක නිලධාරී විසින් 2022 ජනවාරි සිට 2023 ඔක්තෝබර් 31 දින දක්වා තොග නිෂ්කාශන අනුමැතීන් 3,202 ක් **(ඇමුණුම 87)** ලබා දී තිබුණු අතර එවැනි අවස්ථා කිහිපයක් **ඇමුණුම 88 හි** දැක්වේ.

7.7.7.4 වලංගු ලියාපදිංචි සහතිකයක් මඟින් අදාළ ඖෂධය ආනයනය සඳහා වර්ෂ එකත් පහත් අතර කාලයක වලංගුතාවයක් ලබා දෙන අතර, ඉහතින් සඳහන් අධිකාරියේ අකාර්යක්ෂමතාවය මත ලියාපදිංචිය අලුත් නොකිරීම හේතුවෙන් ඖෂධ ආනයනකරුවන් වෙත එම අවසරය අහිමි වන බැවින් එකම ඖෂධය වෙනුවෙන් තොග නිෂ්කාශන අනුමැතීන් ගණනාවක් ලබා දීමට සිදු වූ අවස්ථා පැවති ලියාපදිංචි සහතිකය පිටුපස තබා ඇති තොග නිෂ්කාශණ අනුමැති මුද්‍රා අනුව විගණනයට නිරීක්ෂණය විය. ඒ සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

වගුව අංක - 11 : එකම ඖෂධය වෙනුවෙන් තොග නිෂ්කාශන අනුමැතීන් ගණනාවක් ලබා දීම

ඖෂධයේ නම	ආනයනකරුගේ නම	පැවති ලියාපදිංචි සහතිකයේ අංකය	තොග නිෂ්කාශන අනුමැතීන් දී තිබුණු අවස්ථා ගණන
Globetasol Propionate Ointment USP 1.05%	Ceyoka (Pvt) Ltd	M-008786-PR	6
Travoprost Ophthalmic Solution USP 0.004%	Heamas Pharmaceuticals (Pvt) Ltd	M-006590-PR	6
Azithromycin Capsules USP 250mg	Heamas Pharmaceuticals (Pvt) Ltd	M-005121-PR	4
Miconazole Nitrate Cream IP 2%	Pharma Associates (Pvt) Ltd.	M-008019-PR	8
Finasteride Tablets 5mg	Emerchemie NB (Ceylon) Ltd.	M-002418-FR	6
Montelukast Tablets 10mg	Morison Son & Jones	FR-067003	10

7.7.7.5 2022 ජනවාරි සිට 2023 ඔක්තෝබර් මස දක්වා වූ කාලපරිච්ඡේදය තුළ තොග නිෂ්කාශන අනුමැතීන් යටතේ ආනයනය කරන ලද ඖෂධවල ගුණත්වය පිළිබඳව ගැටලු ඇති වීම මත ඖෂධ භාවිතයෙන් ඉවත් කිරීම්, භාවිතය තාවකාලිකව අත්හිටුවීම් සහ භාවිතය අඛණ්ඩව පවත්වාගෙන නොයෑම් සිදු කළ අවස්ථා අධිකාරිය විසින් විගණනයට ලබා දුන් තොරතුරු අනුව නිරීක්ෂණය විය. මේ පිළිබඳ විස්තර පහත දැක්වෙන අතර සවිස්තරාත්මක තොරතුරු **ඇමුණුම 89** හි දැක්වේ.

වර්ෂය	ඖෂධ භාවිතයෙන් ඉවත් කිරීම්	භාවිතය තාවකාලිකව අත්හිටුවීම්	භාවිතය අඛණ්ඩව පවත්වාගෙන නොයෑම්	ගැටලු ඇති වූ මුළු අවස්ථා ගණන
2022	14	6	1	21
2023.10.31 දින දක්වා	14	7	1	22
එකතුව	28	13	2	43

7.7.7.6 පනතේ 43(2)(අ) සහ (ආ) උපවගන්ති ප්‍රකාරව **(ඇමුණුම 90)** ලියාපදිංචියට ඉදිරිපත් කරනු ලබන ඖෂධවල තාක්ෂණික ඇගයීම සිදු කර ඖෂධවලට අදාළ ප්‍රතිලාභ, අවධානම්, තත්ත්වය, ප්‍රත්‍යක්ෂභාවය, ආරක්ෂාකාරීබව, අවශ්‍යතාවය, මිල සහ ආර්ථික විශ්ලේෂණය පිළිබඳව ඇතුළත් වාර්තාවක් ඖෂධ ඇගයීම් කමිටුව විසින් අධිකාරියට ඉදිරිපත් කළ යුතු වේ. තවද පනතේ 59(4)(අ) උපවගන්ති ප්‍රකාරව **(ඇමුණුම 91)** සාධාරණ මිලකට පුරවැසියන්ගේ සෞඛ්‍ය ආරක්ෂණ අවශ්‍යතාවලට අදාළ ප්‍රත්‍යක්ෂ, ආරක්ෂා සහිත සහ නිවැරදි තත්ත්වයේ ඖෂධ ලබා දෙන බවට සහතික වීම සඳහා ඇති අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ඖෂධ ඇගයීමේ වගකීමත්, පනතේ 64(3) උපවගන්තිය ප්‍රකාරව ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉදිරිපත් වන ඉල්ලීම් සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමේ කර්තව්‍යත් ඖෂධ ඇගයීම් කමිටුව සතු වේ. ඒ අනුව ඖෂධ ලියාපදිංචි කිරීමේ සහ ලියාපදිංචිය අලුත් කිරීමේ ක්‍රියාවලියේ පවතින ප්‍රමාදය මත ඖෂධ ආනයනය සඳහා ලබා දෙන සියළුම තොග නිෂ්කාශන අනුමැතීන් සඳහා ඖෂධ ඇගයීම් කමිටුවේ අනුමැතිය හෝ අපරාණුමැතිය ලබා ගැනීම, කමිටුවේ මතය විමසීම හෝ කමිටුවට වාර්තා කිරීම සිදු කළ යුතු වුවත්, අධිකාරිය විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. ඒ අනුව ඖෂධ ලියාපදිංචිය සම්බන්ධයෙන් අධිකාරී පනත මඟින් ඖෂධ ඇගයීම් කමිටුව වෙත පවරා ඇති බලතල නොසලකා තොග නිෂ්කාශන අනුමැතීන් ලබා දීමට කටයුතු කර ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

7.7.7.7 අධිකාරිය මඟින් ලබාදෙනු ලබන තොග නිෂ්කාශන අනුමැතීන් පිළිබඳ විධිමත් සහ සවිස්තරාත්මක දත්ත සමුදායක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර එම හේතුවෙන් අදාළ තොග වරායෙන් නිදහස් කර ගැනීම සඳහා රේගු දත්ත සඳහා වන ස්වයංක්‍රීය පද්ධතිය (ASYCUDA) හරහා අවසරය ලබා දීමේ දී එය සැබෑ ලෙසම අධිකාරිය විසින් ලබාදුන් අනුමැතියක්ද යන්න හරස් පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැලසී නොතිබුණි. ඒ අනුව ආනයනකරුවන් විසින් ASYCUDA පද්ධතියට උඩුගත කර ඇති, පැවති ලියාපදිංචි සහතිකය සහ ඒ පිටුපස තබා ඇති අනුමැති මුද්‍රාව ASYCUDA පද්ධතියට ප්‍රවේශය හිමි අධිකාරියේ නිලධාරියාගේ පෞද්ගලික නිරීක්ෂණය හා විනිශ්චය මත නිවැරදි බවට උපකල්පනය කරමින් නිෂ්කාශන අවසරය ලබා දී තිබුණි.

7.7.7.8 තවද, ASYCUDA පද්ධතිය හරහා නිෂ්කාශන අවසරය ලබා දුන් ඖෂධ තොග පිළිබඳව වාර්තාවක් හෝ දත්ත සමුදායක් පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබුණු අතර අධිකාරිය විසින් තොග නිෂ්කාශන අනුමැතීන් ලබා දීම සම්බන්ධයෙන් විධිමත් හා විනිවිදභාවයකින් යුතු ක්‍රමවේදයක් සහ සඵලදායී අභ්‍යන්තර පාලන පටිපාටියක් අනුගමනය කර නොතිබුණි. ඒ අනුව මෙරටට ඖෂධ ආනයනය කිරීමේදී මෙවැනි අක්‍රමවත් ක්‍රමවේද අනුගමනය කිරීම තුළින් අවිධිමත් සහ විෂමාචාර ක්‍රියා ඇතිවීමේ අවධානමක් පවතින බව සහ එමඟින් සමස්ථ සෞඛ්‍ය පද්ධතිය ම දැඩි අවධානමට ලක්විය හැකි බව නිරීක්ෂණය විය.

7.7.7.9 තවද, ඖෂධ නියාමන අංශයේ නිලධාරීන් දිගින් දිගටම ලියාපදිංචිය දීර්ඝ කිරීමේ සහ තොග නිෂ්කාශන අනුමැතීන් ලබා දීමේ කටයුතු වල නිරත වීම හේතුවෙන් අධිකාරියේ ප්‍රධාන කර්තව්‍යක් වන ඖෂධ ඇගයීමේ සහ ලියාපදිංචි කිරීමේ කටයුතු තව දුරටත් පසුබෑමට ලක්වන බවත්, අධිකාරිය ස්ථාපනය කිරීමේ අරමුණු අතුරින් පනතේ 3(ඇ) වගන්තිය මඟින් අපේක්ෂිත ඖෂධ ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම සහ ආනයනය කිරීමට අදාළ සියලු කටයුතු විනිවිදභාවයකින් යුතුව, තිරසාර ලෙස සහ සාධාරණ ආකාරයට සිදු කරන බවට තහවුරු කිරීමේ අරමුණ ඉටු නොවන බවත් නිරීක්ෂණය විය.

7.7.8 පනතේ 14 (ඒ) උප වගන්තිය ප්‍රකාරව **(ඇමුණුම 92),** බලපත්‍ර යටතේ ආනයනය කරන ලද ඖෂධවල ප්‍රමාණය පිළිබඳ දත්ත රැස් කළ යුතු වුවත් අධිකාරිය විසින් එසේ කටයුතු කර නොතිබුණු අතර එම හේතුවෙන් පනතේ 3(එ) වගන්තිය මඟින් දැක්වෙන පරිදි රට තුළ ඖෂධ පැවතීම නියාමනය කිරීම වැනි අරමුණු ඉටු කර ගැනීම සඳහා ඉවහල් වන ආනයනික ඖෂධ පිළිබඳව දත්ත සමුදායක් අධිකාරිය සතුව නොපැවතුණි.

7.7.9 පනතේ 59(4)(ආ) උපවගන්තිය ප්‍රකාරව යම් ඖෂධයක් ලියාපදිංචිය සඳහා ඉල්ලීමක් ලැබීමේ දී එහි තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා එම ඖෂධයේ සාම්පලයක් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අධිකාරිය විසින් ලියාපදිංචියට ඉදිරිපත් වන සියළුම ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීමක් සිදු නොකරන අතර 2019 ඔක්තෝබර් 15 දිනැති ලියාපදිංචි නියැදි පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කිරීම පිළිබඳ මාර්ගෝපදේශය ප්‍රකාරව **(ඇමුණුම 93)** Meropenam For injection, Erythromycin, Thyroxin යන ඖෂධ සහ අවස්ථානුගත කරුණු මත ඇතැම් ඖෂධ පමණක් තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු වැඩි දුරටත් නිරීක්ෂණය විය.

7.7.9.1 2022 සිට 2023 සැප්තැම්බර් 30 දින දක්වා ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වූ ඖෂධ 1,730 කින් කින් 1,646 ක් එනම් සියයට 95 සාම්පල් පරීක්ෂාව සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණු බව අධිකාරිය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව නිරීක්ෂණය විය.

7.7.9.2 2022 ජනවාරි සිට 2023 සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය විසින් ලියාපදිංචි අවස්ථාවේ දී ඉදිරිපත් කරන ලද ඖෂධ සාම්පල 76 ක් විශ්ලේෂණය කර තිබුණු අතර, ඉන් සාම්පල් 16 ක් හෙවත් සියයට 21 ක් තත්ත්වයෙන් අසමත් වී තිබුණු බව රසායනාගාරය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දෙන තොරතුරු අනුව විගණනයට නිරීක්ෂණය විය. ඒ අනුව ලියාපදිංචිය සඳහා අධිකාරිය වෙත ඉදිරිපත් වන ඖෂධ පහකින් එකක ගුණත්වය පිළිබඳ අවධානමක් පැවතිය හැකි බවට සාධාරණ පූර්ව නිගමනයකට

එළඹිය හැකි අතර ඉහත සඳහන් තත්ත්වයෙන් අසමත් ඖෂධ සාම්පල් 16 අතුරින් 12 ක්ම ආනයනික ඖෂධ වූ බැවින් දේශීයව නිෂ්පාදනය කරනු ලබන ඖෂධවලට සාපේක්ෂව ආනයනික ඖෂධවල ගුණත්වය සම්බන්ධයෙන් වැඩි අවධානමක් පැවතිය හැකි බව ද නිරීක්ෂණය විය **(ඇමුණුම 94).** එබැවින් ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය තහවුරු කරන ලද ඖෂධ මහජනතාවට ලබා දීමේ අරමුණ සපුරාලීමේ දී ලියාපදිංචි කරනු ලබන ඖෂධ වල තත්ත්වය පරීක්ෂා කර තහවුරු කිරීම ඉතාමත් වැදගත් සාධකයක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.

7.7.9.3 සාම්පල් පරීක්ෂාවකින් තොරව ඖෂධ ලියාපදිංචි කිරීම හේතුවෙන් ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය පිළිබඳව තහවුරුවක් නොමැති ඖෂධ රට තුළට ආනයනය කිරීමේ අවධානමක් පවතින බව සහ ගුණත්වය පිළිබඳව ගැටලු ඇති බව අනාවරණය කර ගන්නා අවස්ථාව වන විටත් එම ඖෂධවලින් සැලකිය යුතු ප්‍රමාණයක් රෝගීන් සඳහා භාවිතා කර ඇති බවත් විගණනයේ දී නිරීක්ෂණය විය. මෙසේ ගැටලු ඇති වීම මත ඖෂධ භාවිතයෙන් ඉවත් කිරීම්, භාවිතය තාවකාලිකව අත්හිටුවීම්, භාවිතය අඛණ්ඩව පවත්වාගෙන නොයෑම් සහ ආනයනකරු විසින් ස්වේච්ඡාවෙන් ඉවත් කර ගැනීම් සිදු කළ අවස්ථා වසර ගණනක සිට විගණනයට නිරීක්ෂණය වූ අතර මේ පිළිබඳව සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

වර්ෂය	ඖෂධ භාවිතයෙන් ඉවත් කිරීම්	භාවිතය තාවකාලිකව අත්හිටුවීම්	භාවිතය අඛණ්ඩව පවත්වාගෙන නොයෑම්	ආනයනකරු විසින් ස්වේච්ඡාවෙන් ඉවත් කර ගැනීම්	ගැටලු ඇති වූ මුළු අවස්ථා ගණන
2015	19	12	1	-	32
2016	15	13	2	-	30
2017	37	20	5	1	63
2018	31	24	2	-	57
2019	38	27	-	-	65
2020	24	28	-	3	55
2021	38	15	2	1	56
2022	23	17	4	-	44
2023.10.31 දින දක්වා	23	17	1	5	46
එකතුව	248	173	17	10	448

7.7.10 මෙරට ඖෂධ සම්බන්ධ සියලු කාරණා සඳහා මධ්‍යම නියාමක ලෙස කටයුතු කරනු ලබන ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ඖෂධ ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම යන අවස්ථාවල දී ඉටු කළ යුතු ප්‍රධාන නියාමන අවශ්‍යතා ඉටු කර නොතිබුණු අතර එම හේතුවෙන් අධිකාරිය ස්ථාපනය කිරීමේ අරමුණු අතුරින්, පනතේ 3(උ) වගන්තිය මඟින් දැක්වෙන පරිදි ඖෂධ පිළිබඳව මහජනතාව, සෞඛ්‍ය සත්කාර වෘත්තිකයන් සහ ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන සියලු දෙනා දැනුවත් කිරීම යන අරමුණ ප්‍රමාණවත් පරිදි සාක්ෂාත් කර නොමැති බව සහ අදාළ පාර්ශ්වයන් දැනුවත් වීම තුළින් සමස්ථ සෞඛ්‍ය පද්ධතියට අත්වන ප්‍රතිලාභ අහිමි වන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

7.7.10.1 පනතේ 60(2) උපවගන්තිය ප්‍රකාරව **(ඇමුණුම 95)** අධිකාරිය විසින් ඖෂධ ලියාපදිංචි කරනු ලබන අවස්ථාවල දී ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින් එම ලියාපදිංචිය පිළිබඳව මහජනතාව වෙත දැනුම් දෙනු ලැබිය හැකි වුවත්, අධිකාරිය විසින් මෙම නියාමන අවශ්‍යතාවය විධිමත් පරිදි ඉටු කර නොතිබුණි. 2019 ඔක්තෝබර් 09 දිනැති අංක 2144/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ඒ දක්වා අධිකාරිය යටතේ ලියාපදිංචිය කර තිබුණු ඖෂධ 7,378 ක් ගැසට් කර තිබුණු නමුත් **(ඇමුණුම 96)** ඉන් අනතුරුව මෑත කාලීනව පසුගිය වසර 4ක කාලපරිච්ඡේදය තුළ ලියාපදිංචි කළ ඖෂධ පිළිබඳ විස්තර ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි.

7.7.10.2 පනතේ 61 වගන්තිය ප්‍රකාරව **(ඇමුණුම 97)** අධිකාරිය විසින් ඖෂධ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවල දී එම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ නියමයක් ගැසට් පත්‍රයේ පළකිරීම මඟින් මහජනතාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු වුවත්, අධිකාරිය ස්ථාපිත කර ගතවන වසර 8 තුළ මෙම නියාමන අවශ්‍යතාවය ඉටුවන පරිදි කටයුතු කර නොතිබුණි.

7.7.11 ඖෂධ ඇගයීම් කමිටුවේ සංයුතිය, එහි රැස්වීම් පැවැත්වීම සහ රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ සහභාගීත්වය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

7.7.11.1 ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 44(1)(ආ)(ii) උපවගන්තිය ප්‍රකාරව **(ඇමුණුම 98)** කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපති විසින් නම් කරනු ලබන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ කොළඹ විශ්වවිද්‍යාලයේ ඖෂධ වෛද්‍ය වේදය පිළිබඳ මහාචාර්යවරයෙකු ඖෂධ ඇගයීම් කමිටුව නියෝජනය කළ යුතු වුවත්, 2023 අගෝස්තු මස සිට එම නියාමන අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි.

7.7.11.2 2022 ජනවාරි මස සිට 2023 අගෝස්තු මස දක්වා පවත්වන ලද ඖෂධ ඇගයීම් කමිටු 20 ක් සඳහා පත් කර තිබුණු කමිටු සාමාජිකයින්ගේ සහභාගීත්වය ඇතැම් අවස්ථාවල දී අවම

මට්ටමක පැවති අතර ඉන් කමිටු 9 ක් සඳහා ම සාමාජිකයින්ගේ සහභාගීත්වය සියයට 60 කට වඩා අඩු ප්‍රතිශතයක පැවතුණි. මේ පිළිබඳ විස්තර **ඇමුණුම 99** හි දැක්වේ.

7.7.11.3 පනතේ 44 වගන්තිය මඟින් **(ඇමුණුම 100)** නිශ්චිතව දක්වා ඇති පදිරි ඖෂධ ඇගයීම් කමිටුව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විවිධ අංශ නියෝජනය කරන ප්‍රවීණ සහ විද්වත් සාමාජිකයින්ගෙන් යුක්ත විය යුතු අතර, ඉහත පරිදි කමිටු සංයුතිය අසම්පූර්ණව පැවතීම සහ සාමාජිකයින්ගේ සහභාගීත්වය අවම මට්ටමක පැවතීම, එම කමිටුව විසින් ගනු ලබන තීරණවල සපලදායිත්වය කෙරෙහි සාධනීය නොවන අයුරින් බලපෑ හැකි බව විගණනයේ දී බැහැර කළ නොහැකි විය.

7.8 ඖෂධවල මිල නියාමන ක්‍රියාවලිය

රජයේ අවශ්‍යතාවය සඳහා ඖෂධ ප්‍රසම්පාදනය කර ගැනීමේ දී සහ මහජනතාව විසින් පරිභෝජනය සඳහා ඖෂධ මිලදී ගැනීමේ දී සලකා බලනු ලබන ඉතාමත් සංවේදී සහ තීරණාත්මක සාධකයක් වන ඖෂධවල මිල නියාමනය කිරීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය මඟින් **(ඇමුණුම 101)** නියාමන අධිකාරිය වෙත අදාළ බලතල පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

7.8.1 අධිකාරිය විසින් 2016 වර්ෂයේ දී ප්‍රථම වරට ඖෂධ වර්ග 48 ක් සහ අනතුරුව තවත් ඖෂධ 12 ක් ද ඇතුළුව උපලේඛනගත ඖෂධ වර්ග 60ක් සඳහා උපරිම සිල්ලර මිල ගැසට් මඟින් නියම කර තිබුණු අතර 2019 වර්ෂයේ සිට අවස්ථාවෝචිතව සංශෝධනය කරමින් පැවතුණි **(ඇමුණුම 102).** එහෙත් මෙම ඖෂධ 60ට අමතරව මෑත කාලීන වසර 4 ක කාලය තුළ මෙරට බහුලව භාවිතාවන සහ රෝගීන් හට වැඩිපුරම වියදම් දැරීමට සිදු වන වෙනත් ඖෂධ වර්ග ද හඳුනාගෙන, වෙළඳනාම අනුව වෙනස් නොවන උපරිම සිල්ලර මිලක් නියම කිරීමට කටයුතු කර නොතිබුණි.

7.8.2 2018 අගෝස්තු 31 දිනැති අංක 2086/37 දරන ඖෂධ ටෙන්ඩර මිල නියම කිරීමේ නියෝගය මඟින් **(ඇමුණුම 103)** ඖෂධ 10 ක් සඳහා උපරිම ප්‍රසම්පාදන මිලක් නියම කර ගැසට් කර තිබුණු අතර 2019 දී ඉන් එක් ඖෂධයක් සඳහා වෙනත් ඖෂධයක් ආදේශ කිරීම මඟින් සංශෝධනය කර තිබුණි **(ඇමුණුම 104).** එහෙත් ඉන් අනතුරුව ඖෂධවල උපරිම ප්‍රසම්පාදන මිල සම්බන්ධයෙන් අධිකාරිය විසින් කිසිදු සමාලෝචනයක් සිදු කර නොතිබුණු අතර වර්තමානයේ රජයේ ඖෂධ අවශ්‍යතාවයන් ද සැලකිල්ලට ගනිමින් නව අයිතම ඇතුළත් වන පරිදි ප්‍රසම්පාදන මිල නියම කිරීමේ නියෝගය ප්‍රතිශෝධනය කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි අධිකාරියේ අවධානය යොමු කර නොතිබුණි.

7.8.3 ඇති වී තිබෙන ආර්ථික අර්බුදය තුළ මෑත කාලීනව සිදු වූ විනිමය අනුපාත ඉහළ යාම හේතුවෙන් 2022 වර්ෂය තුළ දී උපලේඛනගත ඖෂධවල උපරිම සිල්ලර මිල අවස්ථා දෙකක දී ඉහළ දමා තිබුණි **(ඇමුණුම 105).** එම සෑම අවස්ථාවකදීම අනෙකුත් ඖෂධවල මිල ද නිශ්චිත ප්‍රතිශතයකින් ඉහළ දැමීමට අවසර ලබා දෙමින් අධිකාරිය විසින් ශ්‍රී ලංකා ඖෂධ කර්මාන්ත මණ්ඩලය (Sri Lanka Chamber of Pharmaceutical Industry) වෙත දැනුම් දීමක් සිදු කර තිබුණි **(ඇමුණුම 106).** එහෙත් 2023 ජුනි 15 දින සිදු කරන ලද ආසන්නතම මිල සංශෝධනය මඟින් **(ඇමුණුම 107)** උපලේඛනගත ඖෂධ 60 හි උපරිම සිල්ලර මිල සියයට 16 කින් **(ඇමුණුම 108)** පහත හෙළීමට කටයුතු කර තිබුණු නමුත් අනෙකුත් ඖෂධවල මිල පහත හෙළන ලෙස ශ්‍රී ලංකා ඖෂධ කර්මාන්ත මණ්ඩලය වෙත දැනුම් දීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. මෙමඟින් අධිකාරියේ මිල නියාමනයෙහි විනිවිදභාවය පිළිබඳ ගැටලුවක් මතු කරනු ලබන අතර ම අධිකාරිය විසින් පනතේ 3(අ) වගන්තිය මඟින් අපේක්ෂිත පරිදි මහජනතාවට සාධාරණ මිලකට ඖෂධ ලබා දීමේ අරමුණින් බැහැරව කටයුතු කර තිබුණි. තවද, මෙය මහජනතාව වෙත හිමි කර දිය හැකිව තිබුණු මිල වාසිය ඖෂධ සමාගම් වෙත රඳවා තබා ගැනීමට අවස්ථාව ලබා දීමක් බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

7.8.4 පනතේ 14(ට) සහ 118(2)(අ) උපවගන්ති ප්‍රකාරව **(ඇමුණුම 109)** ඖෂධයක මිල නියම කිරීමේ කර්තව්‍ය අධිකාරිය සතු වුවත්, එම කර්තව්‍ය නිසි පරිදි ඉටු නොකිරීම හේතුවෙන් උපරිම සිල්ලර මිලක් නියම නොවූ ඖෂධ 765 ක් වෙළඳපොළ තුළ පවතින බව විගණනයේ දී නිරීක්ෂණය විය. මිල නියාමනය සම්බන්ධයෙන් අධිකාරිය වෙත පැවරී ඇති බලතල සාධනීය අයුරින් භාවිතා නොකිරීම හේතුවෙන් මෙම ඖෂධ සඳහා අදාළ සමාගම් විසින් ඉල්ලා සිටිනු ලබන මිලත් අධිකාරිය විසින් ලබා දිය හැකි උපරිම සිල්ලර මිලත් සම්බන්ධයෙන් මේ වන විටත් සාකච්ඡා මට්ටමේ පැවතුණි. එබැවින් මෙම ඖෂධ මේ වන විට වෙළඳපොළ තුළ ඉහළ මිලකට අලෙවි වීමේ අවධානමක් පවතින අතර මෙම තත්ත්වය සාධාරණ මිලකට මහජනතාව වෙත ඖෂධ ලබා දෙන බවට තහවුරු කිරීමේ අරමුණ ඉටුකර ගැනීමේදී බාධාවන ආකාරයේ සාධකයක් බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

වගුව අංක - 12 : උපරිම සිල්ලර මිල නියම නොකරන ලද ඖෂධ සංඛ්‍යාව

විස්තරය	ඖෂධ සංඛ්‍යාව
ලියාපදිංචි අවස්ථාවේ දී උපරිම සිල්ලර මිල නියම නොකළ	319
වාර්ෂික ආනයන බලපත්‍රකරණයේ දී උපරිම සිල්ලර මිල නියම නොකළ	446
	765

7.8.5 පනතේ 118(2)(අ) උපවගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් මිල නියම කිරීමේ කමිටුවේ නිර්දේශ විමසා ඖෂධවල මිල නියම කිරීම සිදුකළ යුතු වේ. මේ සඳහා 2021 වර්ෂයේදී පත්කරන ලද මිල නියම කිරීමේ කමිටුවේ ධුර කාලය 2023 මැයි 14 දිනෙන් අවසන් වී තිබුණු බැවින් 2023 මැයි 19 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ප්‍රකාරව **(ඇමුණුම 110)** 2023 ජුනි 14 දින සිට බලපැවැත්වෙන පරිදි නව මිල නියම කිරීමේ කමිටුවක් පත් කර තිබුණි **(ඇමුණුම 111).** එහෙත් මෙම මිල නියම කිරීමේ කමිටුවේ නිර්දේශ විමසීමකින් තොරව 2023 ජුනි 16 දින අධිකාරිය විසින් ඖෂධ 159 ක් සඳහා උපරිම සිල්ලර මිල නියම කිරීමට කටයුතු කර තිබුණි **(ඇමුණුම 112).** ඒ අනුව වලංගු මිල කමිටුවක් පැවතිය දී එහි නිර්දේශ ලබා ගැනීමෙන් තොරව ඖෂධවල උපරිම සිල්ලර මිල නියම කිරීම මඟින් අධිකාරිය විසින් මිල නියම කිරීමේ කමිටුව සතු බලතල නොසලකා කටයුතු කර ඇති බවත්, මෙමඟින් අධිකාරියේ ඖෂධ මිල කිරීමේ ක්‍රමවේදයේ විනිවිදභාවය පිළිබඳ අවධානමක් පැවතිය හැකි බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

7.8.6 උපලේඛනගත ඖෂධ වර්ග 60 හැරුණුකොට ඉතිරි ඖෂධවල හඳුන්වාදෙන උපරිම සිල්ලර මිල, ඖෂධයේ ලියාපදිංචි සහතිකයේ සටහන් කරනු ලබන අතර, අවස්ථානුකූලව වාර්ෂික ආනයන බලපත්‍රකරණයේ දී සංශෝධනය කරනු ලබයි. එහෙත් මෙම උපරිම සිල්ලර මිල ගණන් මහජනතාව වෙත සන්නිවේදනය කිරීමේ ක්‍රමවේදයක් අධිකාරිය විසින් අනුගමනය කර නොතිබුණි. උපරිම සිල්ලර මිල යනු සෑම විටම පාරිභෝගිකයාට අදාළ සාධකයක් වන බැවින් ඒ පිළිබඳව දැනුවත් විය යුතු ප්‍රධානතම පාර්ශවය මහජනතාව වන අතර මෙම මිල සන්නිවේදනය සඵලදායී ලෙස ඉටු නොවීමෙන් අධිකාරිය විසින් විශේෂ පරිශ්‍රමයක් දරා සිදු කරනු ලබන උපරිම මිලකරණයෙහි සැබෑ ප්‍රතිලාභය මහජනතාව වෙත නොලැබී යා හැකි බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ. අධිකාරියේ නිල වෙබ් අඩවිය මෙම කාර්යය සඳහා ඵලදායී ලෙස යොදා ගත හැකි වුවත්, ඒ තුළ ඖෂධයක නිෂ්පාදක, දේශීය නියෝජිත, වෙළඳ නාමය වැනි වෙනත් සෑම තොරතුරක්ම ඇතුළත් කර තිබුණ ද උපරිම සිල්ලර මිල ඇතුළත් කිරීමට කටයුතු නොකිරීම මඟින් අධිකාරිය මෙම මිල සන්නිවේදනය කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

7.8.7 අධිකාරිය විසින් ඖෂධවල උපරිම සිල්ලර මිල නියම කිරීම සඳහා යෝග්‍ය මිල සූත්‍රයක් හඳුන්වා දිය යුතු බවට ශ්‍රී ලංකා ඖෂධ කර්මාන්ත මණ්ඩලය විසින් 2021 ඔක්තෝබර් 5 දින අධිකරණය හමුවේ මෝසමක් ගොනුකර තිබුණි**.** 2023 දෙසැම්බර් 14 දින වන විට වසර දෙකකට අධික කාලයක් ගත වී තිබුණ ද එදින දක්වාම තාර්කික සහ සුදුසු මිල සූත්‍රයක් සකස් කර අනුමත කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණු අතර මේ හේතුවෙන් 2023 දෙසැම්බර් 14 දින අධිකරණය විසින් මිල නියම කිරීමේ කටයුතුවලින් තාවකාලිකව වැළකී සිටින ලෙස නියාමන අධිකාරියට අතුරු නියෝගයක් ද නිකුත් කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් ඖෂධ සඳහා

නියම කරනු ලබන උපරිම සිල්ලර මිලෙහි සාධාරණත්වය සහ නිරවද්‍යතාවය අභියෝගයට ලක්වීමේ අවධානමකට මුහුණ පා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

7.8.8 2019 ඔක්තෝබර් 21 දිනැති අංක 2146/3 දරන මිල නියම කිරීමේ නියෝගයෙහි **(ඇමුණුම 113)** 4 ඡේදය ප්‍රකාරව නිල බලයෙන් පත්වන පාරිභෝගික කටයුතු අධිකාරියේ නියෝජිතයෙකු මිල කමිටුවට පත් කළ යුතු වුවත්, 2023 ජුනි 14 දින පත් කරන ලද නව මිල කමිටුවට එම පත් කිරීම සිදු කර නොතිබුණු අතර, 2023 වර්ෂය තුළ පවත්වන ලද මිල කමිටු රැස්වීම් 10 ක් සඳහා එම නියෝජිතයාගේ දායකත්වය ලැබී නොතිබුණි. ඒ හේතුවෙන් ඖෂධ 470 ක මිල සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණවලට එම නියෝජනය ලැබී නොතිබුණු අතර ශ්‍රී ලංකාව තුළ වෙළඳාම හා මිල නියාමනය මඟින් පාරිභෝගිකයාට වඩා හොඳ ආරක්ෂාවක් සැපයීමේ පරමාර්ථය සහිතව ක්‍රියාත්මක වනු ලබන පාරිභෝගික කටයුතු අධිකාරියෙහි නියෝජනය රහිතව ඖෂධ මිල පිළිබඳ තීරණ ගැනීම, ඖෂධ පාරිභෝගිකයන් සම්බන්ධයෙන් සාධනීය කරුණක් නොවන නමුත් අධිකාරිය විසින් මෙම නියෝජනයේ අවශ්‍යතාවය ප්‍රමුඛ කොට සලකා කටයුතු කර නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

වගුව අංක - 13 : පාරිභෝගික කටයුතු අධිකාරියේ නියෝජිතයාගේ සහභාගීත්වයෙන් තොරව මිල තීරණය කරන ලද ඖෂධ සංඛ්‍යාව

රැස්වීම් දිනය	ලියාපදිංචි අවස්ථාවේ දී මිල නියම කළ ඖෂධ	වාර්ෂික ආනයන බලපත්‍රකරණයේ දී මිල නියම කළ ඖෂධ	එකතුව
2023.08.09	121	11	132
2023.08.21	56	127	183
2023.09.21	70	85	155
එකතුව	247	223	470

7.8.9 ඉහත නියෝගයෙහි 9 (ඇ) ඡේදය ප්‍රකාරව මිල නියම කිරීමේ කමිටුව විසින් ශ්‍රී ලංකාව තුළ යම් ඖෂධ නිෂ්පාදනයක් හෝ ඖෂධ නිෂ්පාදන කාණ්ඩයක් භාවිතා කිරීම පිළිබඳ දත්ත රැස් කිරීම සිදුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. එබැවින් උපරිම සිල්ලර මිලක් නියම කළ හැකි උපලේඛනගත ඖෂධ අතරට ඇතුළත් කළ යුතු නව ඖෂධ වර්ග හඳුනාගත හැකි තාර්කික පදනමක් සපයන විධිමත් දත්ත පද්ධතියක් අධිකාරිය සතුව නොතිබුණි.

7.8.10 ඉහත නියෝගයෙහි 10 ඡේදය ප්‍රකාරව යම් ඖෂධ නිෂ්පාදනයක ලියාපදිංචි සහතිකය දරන්නා හෝ දේශීය නිෂ්පාදකයා විසින් යම් ලියාපදිංචි කරන ලද ඖෂධ නිෂ්පාදන, ආනයනය කරන

ලද හෝ වෙළඳපොලට සපයන ලද ප්‍රමාණය පිළිබඳ වාර්තා සෑම මාස හයකට වරක් අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එහෙත් මෙම නියාමන අවශ්‍යතාවය විගණිත දිනය වූ 2023 නොවැම්බර් 30 දින දක්වා ඉටු වී නොතිබුණු අතර අධිකාරිය විසින් මෙම වාර්තා ලබා ගැනීමට, අදාළ තොරතුරු ඇසුරින් විධිමත් දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමට සහ පසුවිපරම් කිරීමට සුදුසු යාන්ත්‍රණයක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි.

7.9 ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 39(1) උපවගන්තිය ප්‍රකාරව **(ඇමුණුම 114)** ඖෂධ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කිරීමේ දී, රටට ගෙන ඒමේ දී, භාවිතා කරන්නන් විසින් පැමිණිලි වශයෙන් ඉදිරිපත් කිරීමේ දී, පශ්චාත් අලෙවි සමීක්ෂණ පැවැත්වීමේ දී සහ වෙනත් අවස්ථානුගත කරුණු මත අධිකාරිය වෙත ඉදිරිපත් වන ඖෂධවල තත්ත්වය පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ ප්‍රධාන කර්තව්‍යය වේ. ඖෂධයක ගුණාත්මකභාවය පිළිබඳ ගැටලු ඇතිවන අවස්ථාවලදී එම ඖෂධයේ භාවිතය පිළිබඳව තීරණ ගැනීමට අධිකාරිය විසින් මෙම පර්යේෂණ වාර්තා උපයෝගී කරගනු ලබන අතර එම තීරණ මෙරට සෞඛ්‍ය පද්ධතිය තුළ තීරණාත්මක සාධකයක් වේ. ඒ අනුව ඖෂධ නියාමනය සඳහා අධිකාරියට සහාය දක්වන එහි ප්‍රධාන අංශයක් වන ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ කටයුතු සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

7.9.1 මෙම පර්යේෂණාගාරයේ ප්‍රමිතිය සම්බන්ධයෙන් අනුකූලතා තක්සේරු සහතිකය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතිනත මණ්ඩලය (Sri Lanka Accreditation Board) වෙත 2020 වර්ෂයේ දී අයදුම්පතක් ඉදිරිපත් කර තිබුණු අතර ප්‍රතිනත මණ්ඩලය විසින් 2021 නොවැම්බර් 26 දින පූර්ව අනුකූලතා තක්සේරුවක් සිදුකර තිබුණි. එහිදී ISO 17025:2017 දරන ජාත්‍යන්තර ප්‍රමිතිකරණ නිර්ණායක **(ඇමුණුම 115)** යටතේ හඳුනාගන්නා ලද ප්‍රධාන ඌනතා සම්පූර්ණ කර ගැනීම සඳහා අධිකාරියට මාස 02 කාලයක් ලබා දී තිබුණු නමුත් අධිකාරිය විසින් අදාළ නිර්ණායක සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි. ප්‍රතිනත මණ්ඩලය විසින් පූර්ව අනුකූලතා තක්සේරුවක් සඳහා අතිරේක අවස්ථාවක් අධිකාරියට ලබා දීම සඳහා 2022 ඔක්තෝබර් 17 දින කැමැත්ත ප්‍රකාශ කර තිබුණ ද, පර්යේෂණාගාරයේ පවතින කාර්යමණ්ඩල හිඟය හේතුවෙන් අදාළ තක්සේරුව කල් දමන ලෙස 2023 ජූනි 30 දින අධිකාරිය විසින් ඉල්ලීමක් සිදු කර තිබුණි. එහෙත් ප්‍රතිනත කාර්ය පටිපාටි අනුව තවදුරටත් කල් ලබා දීමට නොහැකි බැවින් ප්‍රතිනත අවශ්‍යතා සම්පූර්ණ කර නැවත අයදුම් කරන ලෙස සඳහන් කරමින් 2023 සැප්තැම්බර් 26 දින ප්‍රතිනත මණ්ඩලය විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබුණි.

7.9.1.1 ඒ අනුව, ඉල්ලුම්කර වසර 04කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද, අනුකූලතා තක්සේරු සහතිකය ලබා ගැනීමට හැකිවන පරිදි පර්යේෂණාගාරයේ ප්‍රමිතිය ඉහළ නැංවීමට අධිකාරිය

විසින් කටයුතු කර නොතිබුණු අතර පර්යේෂණ රසායනාගාරයක පැවතිය යුතු ජාත්‍යන්තර ප්‍රමිතිකරණ මට්ටමට ළඟා වීමට පර්යේෂණාගාරය අපොහොසත් වී තිබුණි. එබැවින් ප්‍රතීතනය මඟින් සැලසෙන සාවද්‍ය පරීක්ෂණ ප්‍රතිඵල ලැබීමේ අවධානම අඩුවීම, පිරිවැය අවම වීම සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක් වීම වැනි ප්‍රතිලාභ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයට අහිමි විය හැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය.

7.9.1.2 2021 වර්ෂයේ දී පැවති පූර්ව අනුකූලතා තක්සේරුවේ දී ප්‍රතීතන මණ්ඩලය විසින් හඳුනාගන්නා ලද ඇතැම් අඩුපාඩු විගණිත දිනය වන විටත් සම්පූර්ණ කර නොතිබුණු අතර, ඒ අනුව පර්යේෂණාගාරය විසින් සිය පර්යේෂණ කටයුතු දිගින් දිගටම නියමිත ප්‍රමිතිකරණයෙන් බැහැරව පවත්වාගෙන යනු ලබන බව නිරීක්ෂණය විය. උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

(i) ප්‍රතීතන විෂය පථය නවතම බ්‍රිතාන්‍ය ඖෂධවේද ප්‍රමිත (British Pharmacopoeia-BP) සමඟ යාවත්කාලීන කර නොතිබීම.

(ii) කාර්ය මණ්ඩලයේ නිපුණතාවයන් තහවුරු නොවීම හා අදාළ සියලු පරාමිතීන් ආවරණ වන පරිදි ප්‍රවීණතා පරීක්ෂණ (Proficiency Testing-PT) හා අන්තර් රසායනාගාර සංසන්දනයන් (Inter Laboratory Comparison–ILC) සඳහා සහභාගී වී නොතිබීම.

(iii) අත්‍යවශ්‍ය ප්‍රධාන උපකරණ අක්‍රීය තත්වයේ හා නඩත්තු මට්ටමේ පැවතීම.

(iv) මධ්‍යම වායු සමීකරණ පද්ධතිය අක්‍රියව පැවතීම හේතුවෙන් පර්යේෂණාගාරය තුළ සුදුසු පාරිසරික තත්වයක් නොපැවතීම.

7.9.2 ජාතික ඖෂධ නියාමන අධිකාරිය සහ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය සඳහා මහල් 23 කින් යුත් නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා සිදු කර තිබුණු යෝජනාව රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත අනුමත කර නොතිබුණු අතර පසුව කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් නාරාහේන්පිට ප්‍රදේශයේ පිහිටි ඉඩමක් මේ සඳහා ලබා ගැනීමට සාකච්ඡා කර තිබුණි. එහෙත් අනවසර පදිංචි කරුවන් ඉවත් කර ගැනීම සම්බන්ධ ගැටලු හේතුවෙන් එම යොජනාව ද ව්‍යර්ථ වී තිබුණි. එබැවින් පවත්නා පර්යේෂණාගාරය අවශ්‍ය පරිදි වැඩි දියුණු කර පවත්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණද ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් විගණිත දිනය වන විටත් කාර්යක්ෂම පර්යේෂණ සේවාවක් පවත්වාගෙන යාමට බාධා වන ආකාරයේ පහත ඌනතා සහ අඩුපාඩු පැවතුණි.

7.9.2.1 ඖෂධ විශ්ලේෂණය සඳහා භාවිතා කරනු ලබන සංකීර්ණ උපකරණ බොහොමයක් ඉතා පැරණි ඒවා වූ අතර ඇතැම් උපකරණ අක්‍රීයව සහ අලුත්වැඩියා කළ නොහැකි මට්ටමේ පැවතුණි. ඊට අමතරව පර්යේෂණාගාරයේ ප්‍රධාන අංශවල විශ්ලේෂණ කටයුතු සුමටව පවත්වාගෙන යාම

සඳහා අත්‍යාවශ්‍ය වන උපකරණ අයිතම 18 ක් හිඟව පැවතුණි. මේ පිළිබඳව විස්තර වගුව අංක 14 හි දැක්වේ.

වගුව අංක - 14 : පර්යේෂණාගාරය සඳහා අත්‍යාවශ්‍ය වන උපකරණ අයිතම

අංශය	හිඟ අයිතම සංඛ්‍යාව	හිඟ අයිතම සඳහා උදාහරණ කිහිපයක්
ජීව විද්‍යා අංශය	4	Dry Block heater, Vacuum Pump, Hot Plate with Magnetic Stirrer, PH meter with printer, UV-Visible Spectrophotometer, Atomic Absorption Spectrophotometer, Digital Polari meter, Water bath single raw, Centrifuge, Top Pan Balance, Heating Mantle, Stop watch
රසායන විද්‍යා අංශය	8	
ක්ෂුද්‍රජීව අංශය	6	
	18	

7.9.2.2 භාවිතා කළ හැකි මටටමේ පවතින උපකරණ අයිතම 29 ක අලුත්වැඩියා කටයුතු අවසන් කර නොතිබුණු අතර ඇතැම් අයිතම වසරකට වැඩි කාලයක් භාවිතයෙන් බැහැර කර තිබුණි **(ඇමුණුම 116).** භාවිතා කරමින් පවතින යන්ත්‍රෝපකරණ 16 ක වාර්ෂික ක්‍රමාංකණ කටයුතු නියමිත දිනට සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි **(ඇමුණුම 117)**.

7.9.3 ඖෂධ නියාමනය කෙරෙහි ඉවහල් වන වැදගත් පරීක්ෂණ වාර්තා නිකුත් කරනු ලබන ජාතික මට්ටමේ පර්යේෂණාගාරයක ප්‍රමිතියට අනුකූල නොවන ආකාරයේ සහ පරීක්ෂණ ප්‍රතිඵල කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැකි ආකාරයේ වාතාවරණයක් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය තුළ නිර්මාණය වී ඇති බව රසායනාගාර පරිශ්‍රයන් සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. එවැනි කරුණු කිහිපයක් පහත දැක්වේ.

(i) මධ්‍යම වායු සමීකරණ පද්ධතිය අක්‍රියව පැවතුණු අතර ඇතැම් අංශවල සවි කර ඇති වායු සමීකරණ යන්ත්‍ර ද අක්‍රියව පැවතීම හේතුවෙන් රසායනාගාර තුළ උෂ්ණත්වය පාලනය කිරීමේ හැකියාවක් නොතිබුණු අතර එමගින් සංකීර්ණ විශ්ලේෂණ යන්ත්‍රවල පැවැත්මට බාධා ඇති වීම.

(ii) හදිසි විදුලි විසන්ධි වීම් සිදු වීම සහ ඇතැම් අංශ සඳහා විදුලි සැපයුම ඇණ හිටීම හේතුවෙන් පරීක්ෂණ කටයුතුවලට බාධා ඇති වීම හා යන්ත්‍ර අඩපණ වීම.

(iii) රසායන ද්‍රව්‍ය ගබඩාවල උෂ්ණත්වය ඉහළ යෑම හේතුවෙන් ඝන වශයෙන් පැවතිය යුතු රසායන ද්‍රව්‍ය දිය වී විනාශ වීම හා රසායනික ප්‍රබලත්වය හීන වීම.

(iv) ඇතැම් විදුලි බල්බ අක්‍රිව පැවතීම හේතුවෙන් ප්‍රමාණවත් ආලෝක තත්ත්වයක් නොමැති වීම, පිරිසිදු වාතාශ්‍රයක් සහ ප්‍රමාණවත් වායු සංසරණයක් නොමැති වීම

හේතුවෙන් පරීක්ෂණ සඳහා සහ කාර්යමණ්ඩලය සඳහා හිතකර පරිසරයක් නොමැති වීම.

(v) රසායනාගාර තුළට වැසි ජලය කාන්දු වීම තුළින් එහි සිවිලිම, බිත්ති හා ඇතැම් සවිකිරීම් ගරා වැටී තිබීම සහ ජල ආසවන (water distiller), ජල නළ හා අපවහන නළවලින් ජලය කාන්දු වීම හේතුවෙන් අපිරිසිදු පරිසරයක් නිර්මාණය වී තිබීම.

ඒ අනුව, අධිකාරිය සතුව ප්‍රමාණවත් මූල්‍ය ශක්‍යතාවයක් පැවතිය ද, වසර ගණනක් පුරා පවතින මෙම අඩුපාඩු සපුරා ගැනීමට සාර්ථක උත්සහයක් ගෙන නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

7.9.4 සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය, 2015 වර්ෂයේ දී ඖෂධ නියාමන අධිකාරිය පනත මඟින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතට පත් කිරීමට පූර්වාසන්නයේ දී 70 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වී තිබුණු අතර ඉන් 42 දෙනෙකු පරීක්ෂණ කටයුතු සඳහා සෘජුව සම්බන්ධවන සහ ඒ ආශ්‍රිත තීරණ ගනු ලබන කාර්ය මණ්ඩලයට ඇතුළත් නිලධාරීන් වූහ. පර්යේෂණාගාරයෙහි වර්තමාන කාර්යමණ්ඩලය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

7.9.4.1 අධිකාරිය යටතට පත් වන අවස්ථාවේ දී ඇතැම් නිලධාරීන් පර්යේෂණාගාරයෙන් ඉවත් වීම සහ පසුකාලීනව නිලධාරීන් විශ්‍රාම යාම තුළින් ඇතිවන පුරප්පාඩු කාලීනව සමාලෝචනය කර බඳවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් පර්යේෂණාගාරයේ කාර්ය මණ්ඩලය සීඝ්‍රයෙන් අඩු වී තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 22 දෙනෙකු දක්වා අඩු වී තිබුණි. එය පර්යේෂණාගාරය අධිකාරිය වෙත පවරන අවස්ථාවේ දී සේවයේ නියුක්තව සිටි කාර්ය මණ්ඩලය සමඟ සැසඳීමේ දී සියයට 52 ක් පමණක් විය.

7.9.4.2 2023 අගෝස්තු 22 ජාතික ඖෂධ නියාමන අධිකාරිය සඳහා අනුමත කරන ලද නව කාර්ය මණ්ඩලය තුළ **(ඇමුණුම 118)** පර්යේෂණාගාරය සඳහා සෘජුවම අනුයුක්ත කළ හැකි නිලධාරීන් 54 දෙනෙකු ඇතුළත්ව තිබුණි. එහෙත් අදාළ බඳවා ගැනීම් දිගින් දිගටම ප්‍රමාද කිරීම හේතුවෙන් විගණිත දිනය වූ 2023 නොවැම්බර් 30 දින වන විට පර්යේෂණාගාරයේ කාර්ය මණ්ඩලය 11 දෙනෙකු දක්වා අඩු වී තිබුණි. එය අනුමත කාර්ය මණ්ඩලය සමඟ සැසඳීමේ දී සියයට 20 ක් පමණක් විය. මේ පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගුව අංක - 15 : පර්යේෂණාගාරය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

තනතුර	2015.06.30 දිනට කාර්ය මණ්ඩලය	2022.12.31 දිනට කාර්ය මණ්ඩලය	2023.08.22 දින අනුමත කාර්ය මණ්ඩලය	2023.11.30 දිනට කාර්ය මණ්ඩලය
අධ්‍යක්ෂ	1	1	1	1
නියෝජ්‍ය අධ්‍යක්ෂ	1	1	-	-
අංශ ප්‍රධානී	5	-	-	-
ඖෂධ විශ්ලේෂක	8	6	20	5
සහකාර ඖෂධ විශ්ලේෂක	-	-	25	-
ඖෂධවේදී	27	14	-	5
රසායනාගාර සහකාර	-	-	08	-
එකතුව	**42**	**22**	**54**	**11**

7.9.4.3 යෝග්‍ය පුහුණු අවස්ථා සැලසීම මඟින් පර්යේෂණාගාර නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සහ තාක්ෂණික දැනුම හුවමාරු කිරීම කෙරෙහි අධිකාරිය ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

7.9.5 ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2019 වර්ෂය තුළදී සිදු කරන ලද මිණුම් ලකුණු වැඩසටහනට (Benchmarking) අනුව, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු ප්‍රධාන නිර්දේශ 15 ක් යෝජනා කර තිබුණි. මෙම නිර්දේශ සියල්ල ම පර්යේෂණාගාරයේ කටයුතු වඩාත් ක්‍රමවත්, සඵලදායී හා විනිවිදභාවයකින් යුතුව සිදු කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීමක් සපයයි. එහෙත් එම නිර්දේශ ඉදිරිපත් කර වසර 04 ක් ගත වී තිබුණ ද, අධිකාරිය විසින් ඒවා ක්‍රියාත්මක කිරීම මඟින් පර්යේෂණාගාරයේ කටයුතු වඩාත් සාධණීය මාවතකට යොමු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. ඒ අනුව විගණිත දිනය වූ 2023 නොවැම්බර් 30 දින වන විටත් එම නිර්දේශ අතුරින් 3 ක් අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර නිර්දේශ 10 ක් සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කර නොතිබුණි **(ඇමුණුම 119)**. ඒ සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

(i) පරීක්ෂණවල ගුණාත්මකභාවය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කළ හැකි සියලුම පාරිසරික තත්වයන් පර්යේෂණාගාරය විසින් පාලනය කළ යුතු වීම සහ ඒ සඳහා ක්‍රියාපටිපාටියක් තිබිය යුතු වීම.

(ii) රසායනාගාර ගබඩා පද්ධතිය වැඩිදියුණු කළ යුතු වීම.

(iii) නිශ්චිත නියැදි ගබඩා තත්ත්වයන් පවත්වා ගැනීම සඳහා නියැදි කළමනාකරණ ක්‍රියා පටිපාටිය සංශෝධනය කිරීම, පරීක්ෂණ පරාමිති සහ නියැදි රඳවා තබා ගැනීමේ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කළ යුතුය.

(iv) රසායනාගාර වාර්තා කිරීම් සඳහා වන මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සංශෝධනය කළ යුතු වීම.

(v) ප්‍රාථමික සහ ද්විතියික විමර්ශන ප්‍රමිතීන් සඳහා වන ප්‍රවණතා විශ්ලේෂණ ක්‍රියා පටිපාටි ඇතුළත් කිරීමෙන් මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සංශෝධනය කළ යුතු වීම.

(vi) රසායනික ද්‍රව්‍ය ආරක්ෂිතව හැසිරවීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ අන්තරායකර ද්‍රව්‍යය බැහැර කිරීම නියාමනය කිරීම සඳහා මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සංශෝධනය කළ යුතු වීම.

(vii) රසායනාගාර කාර්ය මණ්ඩලය සඳහා ප්‍රතිශක්තිකරණ වැඩසටහන් ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

(viii) පාලනය කරන ලද තත්ත්වයන් යටතේ පර්යේෂණාගාරය සතුව වෙනම කිරුම් කාමර තිබිය යුතු වීම.

(ix) බාහිර රසායනාගාර සහ කොන්ත්‍රාත් ක්‍රියා පටිපාටිය සඳහා පිරිවිතරයන් හෝ නිර්ණායක පිළිබඳ පැහැදිලි තොරතුරු සැපයීමට මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සංශෝධනය කළ යුතු වීම.

7.9.6 පර්යේෂණාගාරය විසින් නියමිත කාල සීමා ඇතුළත ඖෂධ තත්ත්ව පරීක්ෂණ වාර්තා නිකුත් කිරීමට අපොහොසත් වී තිබුණු අතර පරීක්ෂණ කටයුතු අවසන් නොකළ පොරොත්තු නියැදි සැලකිය යුතු ප්‍රමාණයක් අඛණ්ඩව පැවතී තිබුණි. තවද, ඖෂධවල තත්ත්වය සම්බන්ධයෙන් සිදු කළ යුතු ඇතැම් අත්‍යවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට ප්‍රමාණවත් පහසුකම් පර්යේෂණාගාරය සතුව නොපැවති අතර පර්යේෂණ කටයුතු වල සාධනීය ප්‍රවණතාවයක් විගණනයේ දී නිරීක්ෂණය නොවීය. විස්තර පහත දැක්වේ.

7.9.6.1 කාලපරිච්ඡේද කිහිපයක් තුළ දී පර්යේෂණ සඳහා ලද නියැදි සංඛ්‍යාව, පරීක්ෂණ සිදු කළ සහ පොරොත්තු නියැදි සංඛ්‍යාව පිළිබඳව තොරතුරු සමාලෝචනයේ දී, එම කාලපරිච්ඡේද තුළ පරීක්ෂා කිරීමට පැවති නියැදි සම්බන්ධයෙන් ඖෂධ තත්ත්ව පරීක්ෂණ වාර්තා නිකුත් කිරීමේ ප්‍රගතිය සියයට 69 සිට සියයට 32 දක්වා පසුබෑමකට ලක් වී තිබුණි. මේ පිළිබඳ සාරාංශයක් වගුව අංක 16 හි දැක්වෙන අතර ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීමෙන් මෙම තත්ත්වය ඖෂධ නියාමනයට අදාළ තීරණවල ප්‍රමාදය කෙරෙහි ඍජුවම බලපෑ හැකි බව විගණනයේ දී නිරීක්ෂණය කෙරේ .

වගුව අංක - 16 : නියැදි පරීක්ෂා කිරීමේ ප්‍රගතිය

	කාලපරිච්ඡේදය ආරම්භයේ පැවති නියැදි සංඛ්‍යාව	ලද නියැදි සංඛ්‍යාව	පරීක්ෂා කිරීමට පැවති නියැදි සංඛ්‍යාව	පරීක්ෂා කළ නියැදි සංඛ්‍යාව	නියැදි පරීක්ෂා කිරීමේ ප්‍රතිශතය (සියයට)
2022වර්ෂය	212	309	521	362	69
2023මුල් අර්ධ වර්ෂය	159	199	358	165	46
2023ජූලි සිට ඔක්තෝබර් දක්වා	193	231	424	134	32

7.9.6.2 2021 අප්‍රේල් 01 දිනැති ඖෂධ නිෂ්පාදනවල තත්ත්වය පාලනය පිළිබඳ මෙහෙයුම් ක්‍රියාපටිපාටියෙහි 5.1 ඡේදය ප්‍රකාරව **(ඇමුණුම 120)** ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත නියැදිය ඉදිරිපත් වූ දින සිට දින 90ක් ඇතුළත අදාළ පරීක්ෂණ වාර්තාව නිකුත් කළ යුතු වුවත් 2022 ජනවාරි සිට 2023 ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදය තුළ නිකුත් කළ ඖෂධ පරීක්ෂණ වාර්තා 586 ක් අතුරින් වාර්තා 220 ක් හෙවත් සියයට 38 ක් නියමිත කාලසීමාව තුළ නිකුත් කිරීමට පර්යේෂණාගාරය විසින් අපොහොසත් වී තිබුණි. තවද, මින් වාර්තා 47 ක් නිකුත් කිරීම සඳහා වසරකට අධික කාලයක් ගත කර තිබුණු බව ද නිරීක්ෂණය විය.

වගුව අංක - 17 : දින 90 තුළ නිකුත් කිරීමට අපොහොසත් වූ පරීක්ෂණ වාර්තා පිළිබඳ විස්තර

වර්ෂය	නිකුත් කළ මුළු පරීක්ෂණ වාර්තා ගණන	දින 90 තුළ නිකුත් කිරීමට අපොහොසත් වූ	
		පරීක්ෂණ වාර්තා ගණන	ප්‍රතිශතය
2022	311	123	40%
2023.10.31 දින දක්වා	275	97	35%
එකතුව	**586**	**220**	**38**

7.9.6.3 පනතේ 127 (3) උපවගන්තිය **(ඇමුණුම 121)** සහ ඖෂධ නිෂ්පාදනවල තත්ත්වය පාලනය පිළිබඳ මෙහෙයුම් ක්‍රියාපටිපාටිය ප්‍රකාරව අධිකරණය විසින් පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කරනු ලබන ඖෂධ නියැදි පරීක්ෂා කර දින 28ක් ඇතුළත අදාළ වාර්තාව අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2022 ජනවාරි සිට 2023 ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදය තුළ නිකුත් කරන ලද එවැනි පරීක්ෂණ වාර්තා 102 ම නියමිත කාල සීමාව තුළ ඉදිරිපත් කිරීමට

අපොහොසත් වී තිබුණි. තවද, මින් වාර්තා 26 ක් නිකුත් කිරීම සඳහා වසරකට අධික කාලයක් ගත කර තිබුණු බව ද නිරීක්ෂණය විය. එබැවින් පනතේ 39(1)(ආ) උපවගන්තිය ප්‍රකාරව පර්යේෂණාගාරය වෙත පැවරෙන අවස්ථානුගත කරුණු අනුව අනුමත අතිරේක රසපරීක්ෂකවරයෙකු ලෙස ක්‍රියාත්මක වීමේ කර්තව්‍යය සඵලදායී ලෙස ඉටුකර නොමැති බව සහ ඖෂධ සම්බන්ධ ඇතැම් අධිකරණමය ක්‍රියාමාර්ග ප්‍රමාද වීම කෙරෙහි මෙම තත්ත්වය බලපානු ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. මේ පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

වගුව අංක - 18 : දින 28 තුළ නිකුත් කිරීමට අපොහොසත් වූ පරීක්ෂණ වාර්තා පිළිබඳ විස්තර

වර්ෂය	නිකුත් කළ මුළු පරීක්ෂණ වාර්තා ගණන	දින 28 තුළ නිකුත් කිරීමට අපොහොසත් වූ	
		පරීක්ෂණ වාර්තා ගණන	ප්‍රතිශතය
2022	46	46	100%
2023.10.31 දින දක්වා	56	56	100%
එකතුව	**102**	**102**	**100%**

7.9.6.4 විගණිත දිනය වූ 2023 නොවැම්බර් 30 දින වන විට පර්යේෂණාගාරය සතුව නවීන යන්ත්‍රෝපකරණ, දියුණු තාක්ෂණික ශිල්ප ක්‍රම සහ සුදුසුකම්ලත් තාක්ෂණික කාර්යමණ්ඩලයක් නොමැති වීමද හේතුවෙන් ඖෂධවල ජීව විද්‍යාත්මක සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණ පැවැත්වීම අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

7.9.6.5 ඉහත පරිදි නියමිත කාල සීමා තුළ අදාළ නියැදි පරීක්ෂා කර වාර්තා නිකුත් කිරීමට අපොහොසත් වීම, පරීක්ෂණ අවසන් නොකළ පොරොත්තු නියැදි විශාල ප්‍රමාණයක් පැවතීම සහ ඇතැම් අත්‍යාවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම වැනි ඌනතා හේතුවෙන් ඖෂධ පිළිබඳ තීරණ ගැනීම, නියාමනය අරමුණු ඉටු කර ගැනීම මෙන්ම නීතිමය අවශ්‍යතා ඉටුකිරීම යන කරුණුවලදී ද පර්යේෂණාගාරය වෙතින් ප්‍රමාණවත් පිටුබලයක් නොලැබෙන බව නිරීක්ෂණය විය.

7.9.7 ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 39(1)(ඇ) ප්‍රකාරව ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා දේශීය හෝ විදේශීය පර්යේෂණාගාරවල සේවාව අවශ්‍ය බවට අධිකාරිය විසින් සලකන අවස්ථාවල දී එම පර්යේෂණාගාර සමඟ සම්බන්ධීකරණය කිරීමේ කර්තව්‍ය ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත පැවරී ඇත. පරීක්ෂණාගාරය සතුව අවශ්‍ය පහසුකම් නොමැති වීම හේතුවෙන් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වන සියලුම ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා පර්යේෂණාගාරය වෙත සාම්පල ඉදිරිපත් නොකරන

තත්ත්වයක් මේ වන විට නිර්මාණය වී ඇති අතර විශ්ලේෂණ කටයුතු අවසන් නොකළ පොරොත්තු නියැදි විශාල ප්‍රමාණයක් ද විගණිත දිනය වූ 2023 නොවැම්බර් 30 දින වන විට පර්යේෂණාගාරය තුළ පැවතුණි. තත්ත්වය එසේ වුවද, ශ්‍රී ලංකාව තුළ ඖෂධ අංශයේ සංවර්ධනය සඳහා ප්‍රතිඥනයලත් තෙවන පාර්ශවීය පරීක්ෂණාගාරයක් වන කාර්මික තාක්ෂණ ආයතනයේ ඖෂධ රසායනාගාරය හෝ අධිකාරිය විසින් පරීක්ෂණ පහසුකම් සැලසිය හැකි බවට හඳුනාගෙන ඇති වෙනත් දෙස් විදෙස් රසායනාගාරයන්හි සේවාව ඖෂධවල තත්ත්ව පරීක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් අයුරින් යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.

7.9.8 පනතේ 39(1)(ඇ) ප්‍රකාරව ඖෂධවල තත්ත්වය සහතික කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණ ව්‍යාපෘති පවත්වාගෙන යා යුතු වුවත් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය විසින් ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

7.10 ඖෂධ ගබඩා සහ ඖෂධ ප්‍රවාහනය නියාමනය

රජයේ ඖෂධ ගබඩා තුළ නියමිත උෂ්ණත්වය පවත්වා නොගැනීම, ශීතදාමය අඛණ්ඩව පවත්වා නොගැනීම, ගබඩා කිරීමේ දෝෂ හේතුවෙන් ඖෂධ විනාශ වීම, අනාරක්ෂිත ස්ථානවල ඖෂධ ගබඩා කිරීම හා කල් ඉකුත් වූ ඖෂධ සම්බන්ධයෙන් නිසි පරිදි කටයුතු නොකිරීම වැනි දුර්වලතා සම්බන්ධයෙන් විගණනය විසින් වසර කීපයක සිට පෙන්වා දී තිබුණු අතර මේ සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි කාර්යභාරය විමසීමේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

7.10.1 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 14(ඉ) උපවගන්තිය ප්‍රකාරව **(ඇමුණුම 122)** ඖෂධ ගබඩා කිරීම, බෙදාහැරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ කර්තව්‍ය ජාතික ඖෂධ නියාමන අධිකාරිය සතු වුවත්, වෛද්‍ය සැපයීම් අංශය, ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශ හා රජයේ රෝහල් තුළ පවත්වාගෙන යන ඖෂධ ගබඩා සහ ඖෂධ ප්‍රවාහන රථ නියාමනය කිරීමේ සහ බලපත්‍රීකරණය කිරීමේ ක්‍රමවේදයක් අධිකාරිය විසින් අනුගමනය කර නොතිබුණි.

7.10.2 2021 අගෝස්තු 27 දිනැති යහපත් බෙදාහැරීමේ පරිචයන් පිළිබඳ මාර්ගෝපදේශය (Guideline on Good Distribution Practices - GDP) මඟින් **(ඇමුණුම 123)** ගබඩා පරිශ්‍රවල තත්ත්වය, ඖෂධ ලබා ගැනීම හා ගබඩා කිරීමේ ක්‍රම, නියමිත ගබඩා තත්ත්වයන්, ආරක්ෂක විධිවිධාන, උෂ්ණත්වය පාලනය, පවිත්‍රත්වය, වගකිව යුතු නිලධාරීන්, තොග පාලනය, කල් ඉකුත් වූ තොග සම්බන්ධයෙන් කටයුතු කිරීම, උපකරණ, බෙදාහැරීමේ රථ හා ලේඛන පවත්වාගැනීම වැනි නිර්ණායක ඔස්සේ ඖෂධ ගබඩාකරණය සහ ප්‍රවාහනය සඳහා පුළුල් මාර්ගෝපදේශයක් සපයනු ලබයි. එමෙන්ම පනතේ 49(3) උපවගන්තිය ප්‍රකාරව **(ඇමුණුම 124)** කිසිදු

තැනැත්තෙකු විසින් යහපත් බෙදාහැරීමේ පරිචයන්ට අනුකූල නොවන ලෙස කිසිදු ඖෂධයක් බෙදාහැරීම නොකළ යුතුය. එහෙත් වෛද්‍ය සැපයීම් අංශය ඇතුළු රජයේ ඖෂධ ගබඩා සහ ප්‍රවාහන රථ යහපත් බෙදාහැරීමේ පරිචයන්ට අනුකූලව පවත්වාගෙන යන්නේදැයි පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් අධිකාරිය විසින් ස්ථාපිත කර නොතිබුණි.

7.10.3 ඒ අනුව, මෙම ඖෂධ ගබඩා සහ ප්‍රවාහන රථ අධීක්ෂණය කිරීම, බලපත්‍රීකරණය කිරීම සහ නියාමනයට ලක් කිරීම මඟින් නිදහස් සෞඛ්‍ය පද්ධතිය තුළට මුදාහරින ඖෂධවල ගුණාත්මය, ප්‍රත්‍යක්ෂභාවය හා ආරක්ෂාව අඛණ්ඩව තහවුරු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අධිකාරියෙහි අවධානය යොමු වී නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

7.11 ජාතික ඖෂධ නියාමන අධිකාරිය ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 109 වගන්තිය ප්‍රකාරව ජීවිතයක් බේරාගැනීම, බෝවන රෝගයක් හෝ වසංගත රෝගයක් පැතිරීම වැළැක්වීම, ජාතික හදිසි අවශ්‍යතාවයක් හා ජාතික ආරක්ෂාව වැනි හේතු මත යම් ඖෂධක් නිශ්චිත ප්‍රමාණවලින් ආනයනය කිරීමට සහ සැපයීමට අධිකාරිය විසින් අවසර ලබා දිය හැකි වේ. එසේ වුවත් අධිකාරිය විසින් එම විධිවිධානයන්ට අනුගත නොවී ඖෂධ ආනයනය සඳහා ලියාපදිංචියෙන් නිදහස් කිරීම් ලිපි (Waiver of Registration) නිකුත් කර තිබුණු බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

7.11.1 පනතේ සඳහන් හේතු යටතට නොගැනෙන පෙර ලියාපදිංචිය කල් ඉකුත් වී තිබීම, ලියාපදිංචි සැපයුම්කරුවන් නොසිටීම, ලියාපදිංචි ක්‍රියාවලියේ ප්‍රමාදය වැනි හේතු මත ද රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, වෛද්‍ය සැපයීම් අංශය සහ පෞද්ගලික ආයතන වෙනුවෙන් වසර ගණනාවක සිට ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. එසේ වාර්ෂිකව නිකුත් කරන ලද ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගුව අංක - 19 : වාර්ෂිකව නිකුත් කරන ලද ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි සංඛ්‍යාව

නිකුත් කළ ආයතනය	2018	2019	2020	2021	2022	2023 ජූනි දක්වා	එකතුව
පරිත්‍යාග හා වෙනත් රාජ්‍ය ආයතන	03	36	43	24	326	145	577
වෛද්‍ය සැපයීම් අංශය	02	09	-	13	57	03	84
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	136	157	139	52	252	88	824

පෞද්ගලික අංශය	-	15	18	37	21	25	116
එකතුව	**141**	**217**	**200**	**126**	**656**	**261**	**1,601**

7.11.2 2019 ඔක්තෝබර් 15 දිනැති ඖෂධ ලියාපදිංචි කිරීමේ මාර්ගෝපදේශය ප්‍රකාරව **(ඇමුණුම 125)** යම් ඖෂධයක් ලියාපදිංචි කිරීමේ දී එම ඖෂධයේ නිෂ්පාදක හා දේශීය නියෝජිත පිළිබඳ තොරතුරු, පරිපාලන හා නිර්දේශ කිරීමේ තොරතුරු, ඖෂධයට අදාළ ලිපිගොනුවේ සමස්ථ සාරාංශ තොරතුරු, ඖෂධයේ ගුණාත්මකභාවය සහතික කෙරෙන ලේඛන, සායනික නොවන අධ්‍යන වාර්තා සහ සායනික අධ්‍යන වාර්තා ඇතුළත්ව පුළුල් ලේඛන පරීක්ෂාවක් සිදු කෙරෙන නමුත් ඊට සාපේක්ෂව ඖෂධ ඇගයීම් කමිටුව යටතේ පිහිටුවන ලද ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුකමිටුවක් මඟින් ඉහත 7.5.4 ඡේදයෙහි දැක්වෙන පරිදි ඉතාම සීමිත ලේඛන ප්‍රමාණයක් පමණක් ඇගයීම මඟින් සහ සාම්පල් පරීක්ෂාවකින් තොරව ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම හේතුවෙන් තත්ත්වය පිළිබඳ තහවුරුවක් නොමැති ඖෂධ රට තුළට ආනයනය කරන බව වර්ෂ ගණනක සිට විගණනයේ දී නිරීක්ෂණය විය.

7.11.3 ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුමැතීන් යටතේ මෙරටට ආනයනය කරන ලද ඖෂධවල ගුණත්වය පිළිබඳව ගැටලු ඇති වීම මත ඖෂධ භාවිතයෙන් ඉවත් කිරීම්, භාවිතය තාවකාලිකව අත්හිටුවීම් සහ ආනයනකරු විසින් ස්වේච්ඡාවෙන් ඉවත් කර ගැනීම් සිදු කළ අවස්ථා 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අවස්ථා 26 කදී විගණනයට නිරීක්ෂණය වූ අතර මේ පිළිබඳව විස්තර පහත දැක්වේ.

වගුව අංක - 20 : ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුමැතීන් යටතේ මෙරටට ආනයනය කරන ලද ඖෂධවල ගුණත්වය පිළිබඳව ගැටලු වූ අවස්ථා

වර්ෂය	ඖෂධ භාවිතයෙන් ඉවත් කිරීම්	භාවිතය තාවකාලිකව අත්හිටුවීම්	ආනයනකරු විසින් ස්වේච්ඡාවෙන් ඉවත් කර ගැනීම්	ගැටලු ඇති වූ මුළු අවස්ථා ගණන
2019	1	-	-	1
2020	-	1	-	1
2021	8	1	-	9
2022	5	-	-	5
2023.10.31 දින දක්වා	3	6	1	10
එකතුව	**17**	**8**	**1**	**26**

ඒ අනුව තත්ත්වය පිළිබඳ තහවුරුවක් නොමැති ඖෂධ මෙරටට ආනයනය කරන බවත්, එලෙස ආනයනය කරන ඖෂධ රෝහල්වලට බෙදා හැරීමට පෙර තත්ත්වය පිළිබඳ පරීක්ෂාවක් සිදු නොකරන බවත්, එවැනි ඖෂධ භාවිතයෙන් රෝගීන්ට සිදුවන හානිය මැනිය නොහැකි බවත් එමඟින් මෙරට සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි යහපැවැත්ම කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරන බවත් නිරීක්ෂණය විය. මේ පිළිබඳව උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

(i) 2020 වර්ෂයේ දී නිකුත් කරන ලද ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපියක් යටතේ ආනයනය කරන ලද හෘද, අක්මා, වකුගඩු රෝග හා අධිරුධිර පීඩන වැනි රෝගී තත්ත්වයන්වල දී භාවිතා කරනු ලබන Furosemide syrup බෝතල් 6,000 ක තොගයක් තත්ත්වයෙන් අසමත් බව වාර්තාවන අවස්ථාව වන විටත් එම ඖෂධ තොගයෙන් සියයට 98 ක ප්‍රමාණයක් රිජ්වේ ආර්යා ළමා රෝහල ඇතුළු රජයේ රෝහල්වල රෝගීන් සඳහා භාවිතා කර තිබීම.

(ii) 2022 වර්ෂය තුළ නිකුත් කරන ලද ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපියක් යටතේ වෛද්‍ය සැපයීම් අංශය විසින් මිල දී ගන්නා ලද Bupivacaine ඖෂධය භාවිතා කිරීමෙන් පසු පේරාදෙණිය ශික්ෂණ රෝහලේ දී කාන්තාවන් දෙදෙනෙකු මියගොස් තිබුණු අතර එම ඖෂධය භාවිතයෙන් රෝගීන් හට බරපතල අහිතකර ප්‍රතික්‍රියා (Adverse Drug Reaction –ADR) සිදු වී ඇති බැවින් 2023 ජූලි 20 දින පැවති ආරක්ෂාව හා අවධානම් ඇගයීමේ අනුකමිටුව (Safety and Risk Evaluation Subcommittee – SAFRESC) විසින් එම ඖෂධය සම්පූර්ණයෙන් ම භාවිතයෙන් ඉවත් කිරීම සඳහා නිර්දේශ කර තිබීම.

7.11.4 ඖෂධ සම්බන්ධයෙන් මධ්‍යම නියාමක ලෙස කටයුතු කරනු ලබන එකම රාජ්‍ය ආයතනය වශයෙන්, ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 58(1) සහ 109(1) උපවගන්ති මඟින් සලසා ඇති විධිවිධාන මත දැඩිව පිහිටමින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි අධිකාරිය වෙත යොමු වීම හැකිතාක් අවම වන ආකාරයට කටයුතු කිරීමේ වගකීම අධිකාරිය සතු වුවත්, එම වගකීම ප්‍රශස්ථ අයුරින් ඉටු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

7.11.4.1 අධිකාරිය විසින් එකම අයදුම්කරු වෙත අවස්ථා කිහිපයක දී මෙන්ම එකම ඖෂධය සඳහා ද අවස්ථා කිහිපයක දී නැවත නැවතත් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කර තිබුණි. මේ තුළින් දේශීය නියෝජිතයන්, ඖෂධ ලියාපදිංචිය කෙරෙහි පවතින උනන්දුව හීනවන අතරම දිගින් දිගටම ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි මත පදනම්ව මෙරටට ඖෂධ ආනයනය කිරීමට පෙළඹීමක් සිදුවන අතර එය සෞඛ්‍ය පද්ධතිය කෙරෙහි සාධණීය නැඹුරුවක් නොවන බව ද නිරීක්ෂණය විය.

7.11.4.2 ඒ අනුව, 2022 ජනවාරි සිට 2023 ජූනි දක්වා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කර තිබුණු ඖෂධ ආනයනකරුවන් 30 දෙනෙකු ඇතුළත් නියැදියක් පරීක්ෂා කිරීමේ දී විගණිත කාලපරිච්ඡේදය තුළ එම ඖෂධ ආනයනකරුවන් 30 දෙනා වෙත මුළු ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 305 * ක් නිකුත් කර තිබුණු අතර එම එක් එක් ආයතන වෙත ලිපි 02 ත් 54 ත් අතර ප්‍රමාණයක් නිකුත් කර තිබුණු අවස්ථා පැවතුණි. විස්තර වගු අංක 20 හි දැක්වේ.

වගුව අංක - 21 : නිකුත් කරන ලද ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි පිළිබඳ විස්තර

	ආනයනකරුගේ නම	නිකුත් කර තිබුණු ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි ගණන
1.	Yaden International	54
2.	Pharma Associate	28
3.	Slim Pharmaceuticals Ltd *	26*
4.	Pharmatec (Pvt) Ltd	23
5.	ABC Parma Services Pvt Ltd	20
6.	Mansel (Ceylon) Pvt Ltd	14
7.	Sunshine Healthcare	14
8.	Tabrane Pharmaceuticals	13
9.	A Baur & Co. Ltd	12
10.	Siba Healthcare (Pvt) Ltd	11
11.	Breath Free Lanka (Pvt) Ltd	10
12.	Ravilux Co.Ltd	10
13.	Cloud Healthcare (Pvt) Ltd	7
14.	Kamazu (Pvt) Ltd	6
15.	George Steuart Health Ltd	5
16.	Markss HLC (Pvt) Ltd	5
17.	Softcare International	5
18.	Emar Pharma (Pvt) Ltd	4
19.	Junaht International (Pvt) Ltd	4
20.	Niix Holdings (Pvt) Ltd	4
21.	Novachem Lanka (Pvt) Ltd	4
22.	TMI Solutions (Pvt) Ltd	4
23.	Care Ring Pharma (Pvt) Ltd	3
24.	Imperial Life Sciences (Pvt) Ltd	3

* සිදු වී ඇති යතුරු ලියන දෝෂය නිවැරදි කර නිවැරදි ආනයනකරුගේ නම සහ නිවැරදි දත්තයන් ඇතුළත් කර ඇත.

25.	Lanka Therapeutics Pvt Ltd	3
26.	PTC Medical Pvt Ltd	3
27.	SSK Pharma (Pvt) Ltd	3
28.	Unicura International Pvt Ltd-Dehiwala	3
29.	Ceyoka (Pvt) Ltd	2
30.	P.T.C Medical Colombo 13	2
	එකතුව	**305***

7.11.4.3 තවද, එකම ආනයනකරු වෙත එකම ඖෂධය ආනයනය කිරීම සඳහා අවස්ථා කිහිපයක දී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කර තිබුණු අතර, ඉහත නියැදියට අදාළව ආනයනකරුවන් 17 දෙනෙකු වෙත ඖෂධ 29 ක් සඳහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 02 ත් 04 ත් අතර ප්‍රමාණයක් නිකුත් කර තිබුණු අවස්ථා පැවතුණි. මේ පිළිබඳව සාරාංශගත තොරතුරු පහත දැක්වේ.

වගුව අංක - 22 : එකම ආනයනකරු වෙත ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම පිළිබඳ විස්තර

	ආනයනකරුගේ නම	ඖෂධයේ නම	ලිපි ගණන
1.	A Baur & Co. Ltd	Capecitabine Tablets 500mg	3
		Clobazam Tablets IP 10mg	4
2.	ABC Parma Services Pvt Ltd	Desferrioxamine Mesilate for Injection BP 500mg	2
3.	Breath Free Lanka (Pvt) Ltd	Warfarin Sodium Tablets IP 5mg (WARF-5)	2
4.	Emar Pharma (Pvt) Ltd	Dried Aluminium HYdroxide Gel 240mg + Magnesium Hydroxide 100mg + Light Magnesium Carbonate 60mg + Activated Dimethicone 25mg Tablets (DIOVOL)	2
5.	Kamazu (Pvt) Ltd	Amoxicillin Capsules BP 250 mg	2
		Erythromycin Stearate Tablets BP 500mg	2

6.	Lanka Therapeutics Pvt Ltd	Ruxolitinib Tablets 5mg	2
7.	Mansel (Ceylon) Pvt Ltd	Fusidic Acid 2% w/w and Hydrocortisone Acetate 1% w/w Cream (DISUF-H-Cream)	2
8.	Niix Holdings (Pvt) Ltd	Atracurium Besilate 10mg/ ml Solution for Injection/ Infusion (25mg in 2.5 ml)	2
9.	Pharma Associate	Pazopanib Tablets 200mg	2
10.	Pharmatec (Pvt) Ltd	Metoprolol Tartrate Injection 1mg/ml, 5ml	2
11.	Ravilux Co.Ltd	Etoposide Capsules 100mg	2
12.	Siba Healthcare (Pvt) Ltd	Captopril Tablets BP 25mg	2
		Gabapentin Capsules USP 100mg (RAVASTAL-100)	4
		Olanzapine Tablets USP 5mg	2
13.	Slim Pharmaceuticals Ltd *	Cefotaxime for Injection USP 1g	2
14.	Sunshine Healthcare	Linezolid IV Injection 200mg/100ml (Lizolid IV)	2
		Pantoprazole for IV Injection 40mg	3
15.	Tabrane Pharmaceuticals	Cyclosparin Capsules USP 50mg	2
		Olaparib Capsules 50mg	2
		Sofosbuvir INN 400mg & Ledpasvir INN 90 mg Tablets (HopSo-LP)	2
16.	TMI Solutions (Pvt) Ltd	Enoxaparin Injection 40mg in 0.4ml	2
17.	Yaden International	Chlorambucil Tablets 2mg	2
		Ergometrine Injection BP 500mcg/ml	3
		Fludrocortisone Acetate Tablets USP 100mcg	2

* සිදුවී ඇති යතුරු ලියන දෝෂය නිවැරදි කර නිවැරදි ආනයනකරුගේ නම ඇතුළත් කර ඇත.

Morphine Tablets 10mg	2
Sodium Fusidate for Infusion BP 50mg	2
Tetracosactide Injection BP 250mcg/1ml	2
එකතුව	**65**

7.11.5 පනතේ 58(1) උපවගන්තිය ප්‍රකාරව අධිකාරිය යටතේ ලියාපදිංචි ඖෂධ පමණක් මෙරටට ආනයනය කළ යුතු අතර ඒ අනුව අධිකාරිය විසින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් නොකිරීම හෝ හැකිතාක් අවම කිරීම සිදු කළ යුතු වුවත්, විවිධ වෙළඳ නාම යටතේ ලියාපදිංචි ඖෂධ කිහිපයක් පවතින ඖෂධ සඳහා ද ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කර තිබුණු අවස්ථා පැවතුණි. ඒ අනුව තෝරා ගත් ඖෂධ 07 ක නියැදියක් සඳහා පහත පරිදි ලියාපදිංචි ඖෂධ 02 ත් 57 ත් අතර ප්‍රමාණයක් පවතින අවස්ථාවල දී පවා වෙනත් ආනයනකරුවන් වෙත ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට කටයුතු කර තිබුණි.

වගුව අංක - 23 : විවිධ වෙළඳ නාම යටතේ ලියාපදිංචි ඖෂධ කිහිපයක් පවතින ඖෂධ සඳහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම

	ඖෂධයේ නම	පවතින ලියාපදිංචි ඖෂධ සංඛ්‍යාව	ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කර තිබුණු ආයතනයේ නම
1.	Aciclovir 200mg bp tablets	19	Savorite pharmaceuticals pvt ltd
2.	Acitretin capsules bp 10mg	3	Centurion healthcare pvt ltd, india
3.	Amikacin sulphate injection bp 500mg/2ml	5	Nandani medical laboratories (pvt) ltd, india
4.	Amoxicillin capsules b.p 250mg	57	Micro labs ltd, india
5.	Atropine eye drops 1% w/v	3	DCI pharmaceuticals (pvt) ltd, india
6.	Azathioprine 50mg bp tablets	8	Siba holdings Yaden international pvt ltd
7.	Betamethasone 0.1%	2	Pharmatec pvt ltd

7.11.6 පනතේ 109(3) උපවගන්තිය ප්‍රකාරව ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි යටතේ ආනයනය කරන ලද ඖෂධ කළමනාකරණය සහ වගවීම සඳහා ආනයනකරු බැඳී සිටිය යුතු වුවත්, පනතේ 3(අ) අනුව ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී හා නිවැරදි තත්ත්වයෙන් යුතු ඖෂධ මහජනතාවට ලබාදෙන බවට තහවුරු කිරීමේ මූලික වගකීම අධිකාරිය සතුබව නිරීක්ෂණය විය. නමුත් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමේදී අධිකාරිය විසින් ඖෂධයේ ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය පිළිබඳ වගකීම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙනුවෙන් ඊට අදාළ ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු වෙත හෝ වෛද්‍ය සැපයීම් අංශය වෙනුවෙන් නිකුත් කිරීමේදී එහි අධ්‍යක්ෂ වෙතත් පවරා අධිකාරිය තම මූලික නියාමන වගකීමෙන් බැහැර වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු ද වැඩි දුරටත් නිරීක්ෂණය විය.

7.11.6.1 ඉහත පරිදි වෛද්‍ය සැපයීම් අංශයට හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු වෙත වගකීම් පවරා තිබුණද ඔවුන් විසින් එම වගකීම භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි **(ඇමුණුම 126)**. කෙසේ නමුත් අභිලාෂ කැඳවීම යටතේ සිදුකර තිබුණු ප්‍රසම්පාදනයන්හිදී සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව තම තීරණය ලබාදීමේදී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික ලබාගැනීමට යටත් කර නොතිබුණි.

7.11.6.2 ඒ අනුව, ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි යටතේ මෙරටට ආනයනය කරනු ලබන ඖෂධවල ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය පිළිබඳ වගකීම, අදාළ කිසිදු පාර්ශ්වයක් විසින් භාර නොගන්නා වාතාවරණයක් නිර්මාණය වී ඇති අතර එමඟින් පනතේ 3(අ) වගන්තිය ප්‍රකාරව අධිකාරිය ස්ථාපනය කිරීමේ මූලිකම අරමුණක් වන ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්ත්වයෙන් යුතු ඖෂධ මහජනතාවට ලබා දෙන බවට තහවුරු කිරීමේ අරමුණ අධිකාරිය විසින් සඵලදායී ලෙස සාක්ෂාත් කර ගෙන නොතිබුණි.

7.11.6.3 අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපිවල මුල් පිටපත් සෘජුවම ආනයන හා අපනයන පාලක ජනරාල් වෙත යොමු කරනු වෙනුවට අදාළ ඖෂධ ආනයනකරුවන් වෙතම ලබා දීමට කටයුතු කර තිබුණි. තවද, වෛද්‍ය සැපයීම් අංශය වෙනුවෙන් නිකුත් කරනු ලබන ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපිවල පිටපත වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ වෙත විධිමත් පරිදි යොමු කර නොතිබුණු අතර 2022 පෙබරවාරි 02 දින සිට නිකුත් කරන ලද ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 105 ක පිටපත් 2023 ඔක්තෝබර් 16 දින එකවර භාර දී තිබුණි.

7.11.6.4 එම ඇතැම් පිටපත්වල නිකුත් කරනු ලබන දිනය යොදා නොතිබීම, නිෂ්පාදකයාගේ නම සඳහන් කර නොතිබීම, ලියාපදිංචියෙන් නිදහස් කරනු ලබන ඖෂධයේ නම නිශ්චිතව සඳහන් කර නොතිබීම, ප්‍රධාන විධායක නිලධාරී විසින් නම සහිත සහ රහිත වශයෙන් නිල මුද්‍රා දෙකක් භාවිතා කර තිබීම වැනි බරපතල අඩුපාඩු නිරීක්ෂණය විය.

7.11.6.5 ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම සම්බන්ධයෙන් දැඩි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළ යුතුව තිබුණ ද, අධිකාරිය විසින් චේතාන්විතව හෝ නොසැලකිල්ලෙන් කරනු ලබන ඉහත සඳහන් අඩුපාඩු හේතුවෙන් වංචාකාරී කටයුතුවලට යොමුවීමට අවස්ථාව සලසා දී තිබුණු අතර පනතේ 3(ඇ) ප්‍රකාරව ඖෂධ ආනයනයට අදාළ සියලු කටයුතු විනිවිදභාවයකින් යුතුව, තිරසාර ලෙස සහ සාධාරණ ආකාරයට සිදු කරන බවට තහවුරු කිරීමේ අරමුණට අනනුකූලව කටයුතු කරමින් පවතින බව නිරීක්ෂණය විය.

7.11.7 ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් අධිකාරිය විසින් 2019 ඔක්තෝබර් 15 දිනැති ව මාර්ගෝපදේශයක් **(ඇමුණුම 127)** පිළියෙළ කර තිබුණු අතර ඊට අනුකූලව ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුමැතිය ඊට අදාළ තාක්ෂණික අනුකමිටුව මඟින් ලබා ගත යුතුය. ඉන්දියානු ණය යෝජනා ක්‍රමය සහ වෙනත් විදේශ ණය ආධාර ව්‍යාපෘති හරහා ඖෂධ මිල දී ගැනීම් සිදු කිරීම සඳහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට වේගවත් යාන්ත්‍රණයක් සකස් කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් අවසරය ලබා දී තිබුණි. ඒ අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි විසින් ඉහත සඳහන් කරන ලද අනුකමිටුව වෙත යොමු කිරීමෙන් තොරව තමා විසින් ම ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට හැකිවන පරිදි Special Pathway නමැති වේගවත් යාන්ත්‍රණයක් නිර්දේශ කර අනුමැතිය සඳහා 2022 සැප්තැම්බර් 16 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබුණි **(ඇමුණුම 128)**.

7.11.7.1 එම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් වේගවත් යාන්ත්‍රණයේ කොන්දේසි, ක්‍රියාත්මක කළ යුතු පාර්ශ්ව, අයකළ යුතු ගාස්තු, අත්‍යාවශ්‍ය ලේඛන (අයදුම්පත හා ගැණුම් ඇණවුම /ඉන්ඩෙන්ටුව /ඉන්වොයිසිය) සහ පහත දැක්වෙන පටිපාටි අනුමැතිය සඳහා යොමු කර තිබුණු අතර ඖෂධයේ ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය තහවුරු කරන ලේඛන හෝ කාර්යයන් කිසිවක් එම පටිපාටි මඟින් ආවරණය කර නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය වූ අතර ගුණත්වය තහවුරු කළ හැකි වෙනත් ක්‍රමවේදයක් යෝජනා කර තිබුණු බවක් විගණනයට තහවුරු නොවීය.

- ලියාපදිංචියෙන් නිදහස් කිරීම් ඉල්ලුම් කිරීමේ අයදුම්පත අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යාලයෙන් ලබා ගැනීම.
- ලද අයදුම්පත් අදාළ ඖෂධවේදීන් වෙත භාර දීම.
- ඖෂධවේදීන් විසින් ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතිය ලබා ගැනීම.
- කළමනාකරණ සහකාර විසින් ගෙවීම් සටහන අයදුම්කරු වෙත නිකුත් කිරීම.

- ගෙවීම් ලද පසු කළමනාකරණ සහකාර විසින් ලියාපදිංචියෙන් නිදහස් කිරීම් ලිපිය කෙටුම්පත් කිරීම.
- කළමනාකරණ සහකාර විසින් අදාළ දත්ත පද්ධතිය සහ ලේඛනය පවත්වා ගැනීම.
- ඖෂධවේදීන් විසින් ලියාපදිංචියෙන් නිදහස් කිරීම් ලිපිය පරීක්ෂා කිරීම.
- අවසන් කෙටුම්පත් ලිපිය ප්‍රධාන විධායක නිලධාරීගේ අත්සනට භාර දීම.
- අදාළ වගකිවයුතු පාර්ශ්ව වෙත ලිපියේ පිටපත් යැවීම.

7.11.7.2 ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව තුළ මෙම වේගවත් යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමෙන් ඇතිවිය හැකියැයි හඳුනාගත් අවදානම්, අවදානමේ සම්භාවිතාව, එහි බලපෑම හා අවදානම කළමනාකරණය කිරීමේ උපාය මාර්ග ආදිය දක්වමින් අවදානම් විශ්ලේෂණයක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව මෙවැනි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම මඟින් මෙරට සෞඛ්‍ය පද්ධතිය කෙරෙහි ඇති විය හැකි අහිතකර බලපෑම් පිළිබඳව අවධානය යොමු කර තිබුණු බවක් හෝ විගණනයට තහවුරු නොවීය.

7.11.7.3 අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ද මෙවැනි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම මඟින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවීමේ මූලිකම අරමුණක් වන ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්ත්වයෙන් යුතු ඖෂධ මහජනතාවට ලබා දෙන බවට තහවුරු කිරීමේ අරමුණ අභියෝගයට ලක්වීමට ඇති අවදානම පිළිබඳව නිසි අවධානයක් යොමු කිරීමෙන් තොරව ඉහත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ ඇතුළත් කරුණු මත යෝජිත වේගවත් යාන්ත්‍රණය අනුමත කර තිබුණි.

7.11.7.4 පැවති ආර්ථික අර්බුධකාරී තත්ත්වය තුළ විදේශ ණය යෝජනා ක්‍රම භාවිතා කරමින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි මත ඖෂධ ප්‍රසම්පාදනය කිරීමේ දී ඖෂධවල ගුණාත්වය ද තහවුරු කෙරෙන ආකාරයට වේගවත් යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා ඖෂධ ඇගයීම් කමිටුවේ හෝ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුකමිටුවේ උපදෙස් ලබා ගෙන නොතිබුණු අතර මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට පෙර එම කමිටුවලින් අදහස් විමසීමක් හෝ සිදුකර තිබුණු බව විගණනයට තහවුරු නොවීය.

7.11.7.5 ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම පිළිබඳ මාර්ගෝපදේශය ප්‍රකාරව ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුකමිටුව සති දෙකකට වරක් රැස්කළ යුතු වුව ද, අධිකාරිය විසින් පෙර සිටම ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. ඒ අනුව විගණිත කාලපරිච්ඡේදය වූ 2022 ජනවාරි සිට 2023 ජූනි දක්වා අනුකමිටු රැස්වීම් 36 ක් පැවැත්විය යුතු වුවත්, රැස්වීම් 15 ක් පමණක් පවත්වා තිබුණි. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම වේගවත් යාන්ත්‍රණය අනුමත

කරන ලද 2022 සැප්තැම්බර් මාසය තුළ අදාළ කමිටුව රැස් කිරීමට කටයුතු කර නොතිබුණු බව ද විගණනයේ දී නිරීක්ෂණය විය.

7.11.7.6 ලියාපදිංචියෙන් නිදහස් කිරීම් සඳහා අනුමැතිය ප්‍රදානය කිරීමේ දී අනුකමිටුව විසින් ඖෂධවල මිල සාධාරණත්වය, ඖෂධය පිළිබඳව අදාළ විද්‍යාලයේ මතය, ඖෂධයේ අත්‍යාවශ්‍යතාවය, දැනට පවතින ඒ හා සමාන ලියාපදිංචි ඖෂධ සංඛ්‍යාව, ඖෂධයේ ලියාපදිංචි තත්ත්වය, සැපයුම්කරුගේ සහ නිෂ්පාදකගේ ලියාපදිංචි තත්ත්වය, ගුණත්වය පිළිබඳව පෙර ගැටළු පැවතීම (තත්ත්වයෙන් අසමත් වීම්) වැනි සාධක පිළිබඳව අවධානය යොමු කළ ද, මෙම ක්‍රමවේදය යටතේ එම කරුණු පිළිබඳව අවධානය යොමු කිරීමෙන් තොරව ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කර තිබුණි. විගණිත කාලපරිච්ඡේදය තුළ වෛද්‍ය සැපයීම් අංශය හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඉහත පරිදි නිකුත් කළ ලියාපදිංචියෙන් නිදහස් කිරීම් අනුමැතීන් සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත වගු අංක 24 හි දැක්වේ.

වගුව අංක - 24 : Special Pathway ක්‍රමය ඔස්සේ නිකුත් කළ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි පිළිබඳ විස්තර

විස්තරය	2022	2023 ජූනි දක්වා	එකතුව
නිකුත් කර තිබුණු මුළු ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි සංඛ්‍යාව	656	261	917
Special Pathway ක්‍රමය යටතේ වෛද්‍ය සැපයීම් අංශය වෙත	57	03	60
Special Pathway ක්‍රමය යටතේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත	176	51	227
Special Pathway ක්‍රමය යටතේ නිකුත් කළ මුළු සංඛ්‍යාව	**233**	**54**	**287**
Special Pathway ක්‍රමය යටතේ නිකුත් කළ මුළු ලිපි සංඛ්‍යාව නිකුත් කර තිබුණු මුළු ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	36%	21%	31%

7.11.7.7 2023 ජනවාරි 24 හා 27 යන දෙදින තුළ පැවැත් වූ හදිසි ඖෂධ ඇගයීම් කමිටුවට සහභාගී වූ කමිටු සාමාජිකයින් විසින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුකමිටුව අභිබවා ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතිය මත ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම පිළිබඳව විමසා තිබුණු අතර රට තුළ ඖෂධ හිඟය වැළැක්වීම සඳහා වන හදිසි රැස්වීම්වලට සහභාගී වීමට අනුකමිටු සාමාජිකයින් කැමැත්තෙන් සිටින බවත්, ගුණත්වය ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය වැනි නිර්ණායක ඇගයීමට ලක් කර ලියාපදිංචි කරන ලද සැපයුම්කරුවන්ගෙන් ඖෂධ මිල දී

ගැනීමේ වැදගත්කමත්, ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි යටතේ ගෙන්වනු ලබන ඖෂධවල ගුණාත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය සම්බන්ධයෙන් අධිකාරිය වගකීම භාර නොගන්නා බවට වූ ප්‍රකාශය ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි තුළ ඇතුළත් නොකළ යුතු බවටත්, අදහස් දක්වා තිබුණි. තවද, අදාළ ඖෂධය ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වී නොමැති වූවත්, ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය ඉල්ලා සිටින නිෂ්පාදකයා හෝ දේශීය නියෝජිතයා අධිකාරියේ ලියාපදිංචි වී සිටිය යුතු වීමේ මූලධර්මය සලකා බැලීමේ අවශ්‍යතාවය ඖෂධ ඇගයීම් කමිටුවේ ලේකම් විසින් අවධාරණය කර තිබුණි.

7.11.7.8 තවද, Special Pathway ක්‍රමය හරහා 2022 වර්ෂය තුළ වෛද්‍ය සැපයීම් අංශය හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත නිකුත් කරන ලද ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුමැතීන් 233 අපරාණුමැතිය සඳහා 2023 ජනවාරි 24 හා 27 දෙදින රැස් වූ ඖෂධ ඇගයීම් කමිටුවට ඉදිරිපත් කර තිබුණි. එහිදී අත්‍යාවශ්‍ය ඖෂධයක් නොවීම, ඖෂධයේ මාත්‍රාව නොගැලපීම, වැඩි මිලක් ඉදිරිපත් කර තිබීම, ලියාපදිංචි ඖෂධ කිහිපයක් පැවතීම හේතුවෙන් එවැනි සැපයුම්කරුවෙකුගෙන් මිල දී ගැනීමට හැකි වීම, එම ඖෂධය දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම සහ නිෂ්පාදක හෝ දේශීය නියෝජිත ලියාපදිංචි වී නොසිටීම වැනි හේතු මත වෛද්‍ය සැපයීම් අංශය වෙත සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත පිළිවෙළින් ඖෂධ වර්ග 31 ක් සහ 58 ක් සඳහා නිකුත් කරන ලද ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 89 ක් සඳහා කමිටුවේ අපරාණුමැතිය ලැබී නොතිබුණි **(ඇමුණුම 129)**. මීට අමතරව නිෂ්පාදක ලියාපදිංචි වී තිබිය යුතු වීම සහ ඉදිරිපත් කර ඇති මිල උපරිම සිල්ලර මිලට වඩා අඩු විය යුතු වීම වැනි කොන්දේසි මත වෛද්‍ය සැපයීම් අංශය වෙත සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත පිළිවෙළින් ඖෂධ වර්ග 13 ක් සහ 12 ක් සඳහා නිකුත් කරන ලද ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 25 ක් සඳහා කමිටුවේ කොන්දේසි සහිත අපරාණුමැතිය ලැබී තිබුණි **(ඇමුණුම 130).** මේ පිළිබඳ වැඩි විස්තර පහත පරිදි වේ.

7.11.7.9 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 58(1) උපවගන්තිය ප්‍රකාරව කිසිදු තැනැත්තෙකු විසින් යම් ඖෂධයක් අධිකාරියේ ලියාපදිංචි නොකර සහ අධිකාරියෙන් බලපත්‍රයක් ලබා නොගෙන ආනයනය කිරීම නොකළ යුතු බැවින්, ලියාපදිංචියෙන් නිදහස් කිරීම සඳහා අනුමැතිය ප්‍රදානය කිරීමේ දී ලියාපදිංචි ඖෂධ පවතින්නේ ද යන්න ඖෂධ ඇගයීම් කමිටුව විසින් මූලිකවම සලකා බලනු ලබයි. එහෙත් Special Pathway ක්‍රමය හරහා ලබා දුන් ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීම් 166 ක් සඳහා ලියාපදිංචි ඖෂධ 01 ත් 21 ත් අතර ගණනක් පැවති අතර එම හේතුව පදනම්ව ලියාපදිංචියෙන් නිදහස් කිරීම් 26 ක් සඳහා ඖෂධ ඇගයීම් කමිටුවේ අපරාණුමැතිය හිමි වී නොතිබුණි **(ඇමුණුම 131).**

7.11.7.10 ආසාධිත රෝගීන් සඳහා බහුලව භාවිතා වන Meropenem Injection USP 500mg යන ප්‍රතිජීවක ඖෂධයෙන් ඒකක 400,000 ක් මෙරටට ආනයනය කිරීම සඳහා Special Pathway ක්‍රමය හරහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුමැතිය ලබා දී තිබුණු අතර මීට පෙර තත්ත්වයෙන් අසමත් වීම් වාර්තා වී තිබීම හේතුවෙන් ඒ සඳහා ඖෂධ ඇගයීම් කමිටුවේ අපරාණුමැතිය හිමි වී නොතිබුණි. මීට අමතරව ඉහත පරිදි අනුමැතිය ලබා දී තිබුණු තවත් ඖෂධ 15 කට අදාළ නිෂ්පාදකයන්ගේ ඖෂධ තත්ත්වයෙන් අසමත් වීම් පිළිබඳ වාර්තා වී ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය. **(ඇමුණුම 132)**

7.11.7.11 කර්ණ ආසාධන, රක්තපාත තත්ත්වයන් සහ ආහාර ජීර්ණ පද්ධතියේ ගැටළු ආදි රෝග සඳහා භාවිතා කරනු ලබන Ofloxacin vialEye/Ear Drops 5ml, Cinnarizine Tablets BP 25mg, Rifaximin Tablets 550mg, සහ Mosapride Citrate Tablets 5mg, වැනි Special Pathway ක්‍රමය හරහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුමැතිය ලබා දී තිබුණු ඖෂධ 29 ක් අත්‍යාවශ්‍ය ඖෂධ ලැයිස්තුවේ ඇතුළත් නොවීම හේතුවෙන් ඖෂධ ඇගයීම් කමිටුවේ අපරාණුමැතිය හිමි වී නොතිබුණි **(ඇමුණුම 133).**

7.11.7.12 ඒ අනුව ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුකමිටුව අභිබවා Special Pathway ක්‍රමය හරහා ප්‍රධාන විධායක නිලධාරී විසින් ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීම සඳහා අනුමැතිය ලබා දීම තුළින් ගුණත්වය, ආරක්ෂාව, ප්‍රත්‍යක්ෂභාවය සහ මිල සාධාරණත්වය පිළිබඳව තහවුරුවක් නොමැති ඖෂධ රට තුළට ආනයනය කිරීමේ සහ රෝගීන් සඳහා භාවිතා කිරීමේ අවදානමක් පවතින බව විගණනයේ දී නිරීක්ෂණය විය.

7.11.8 පනතේ 109(4) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි යටතේ ආනයනය කරන ලද ඖෂධ පිළිබඳව ආනයනකරු විසින් අධිකාරිය වෙත නියමිත ආකාරයට පටිපාටිගතව වාර්තා ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවත්, එම නියාමන අවශ්‍යතාවය ඉටු වී නොමැති අතර අධිකාරිය විසින් මෙම වාර්තා ලබා ගැනීම සහ ඒ ඇසුරින් දත්ත සමුදායක් පවත්වා ගෙන යාම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. එබැවින් අධිකාරිය විසින් නිකුත් කරන ලද ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි යටතේ ඖෂධ ආනයනය කළ/නොකළ බවට සහ ආනයනය කරන ලද ඖෂධවල අනුකූලතාවය පිළිබඳව පසුවිපරම් කිරීමක් සිදු කර නොතිබුණි.

7.12 2022 හා 2023 වර්ෂ වෙනුවෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ඉදිරිපත් කළ ප්‍රධාන ඇණවුම් සම්බන්ධ නිරීක්ෂණ

7.12.1 2022 වර්ෂයේ ඇති වූ ඖෂධ හිඟය හේතුවෙන් හදිසි මිල දී ගැනීම් සිදුකරන බවට අමාත්‍යාංශ පාර්ශවය විසින් අමාත්‍ය මණ්ඩලයට කරුණු ඉදිරිපත් කළද, සම්මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව යමින් අභිලාෂ කැඳවීමේ හා අනායාචිත ක්‍රමයට මිලදී

ගැනීමට ඉදිරිපත් කළ ඇණවුම්වලට අදාළ ඖෂධයන්හි 2022 හා 2023 වර්ෂ වෙනුවෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඉදිරිපත් කළ ප්‍රධාන ඇණවුම්වල ප්‍රගතිය හා 2022, 2023 වර්ෂ වෙනුවෙන් ඖෂධ අයිතම 78 ක් සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ඉදිරිපත් කළ අනෙකුත් ප්‍රධාන ඇණවුම් පිළිබඳ සිදුකළ නියැදි පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

7.12.1.1 වෛද්‍ය සැපයුම් අංශය විසින් තීරණය කර තිබුණු පරිදි කිසියම් වර්ෂයක් සඳහා අවශ්‍ය ඖෂධ ඇණවුම් කර ආයතනයට ලැබීම සඳහා මාස 11 ක පොරොත්තු කාලයක රැඳී සිටීමට සිදුවන බැවින් ඇණවුම අවම වශයෙන් පූර්ව වර්ෂයේ ජනවාරි මාසය තුළ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඉදිරිපත් කළ යුතුය. නමුත් ඖෂධ 04කට අදාළව 2022 වර්ෂයේ සාමාන්‍ය වාර්ෂික ඇණවුම ද, ඖෂධ 04කට අදාළව 2023 වර්ෂයේ සාමාන්‍ය වාර්ෂික ඇණවුම ද, ඖෂධ 07 කට අදාළව 2024 වර්ෂයේ සාමාන්‍ය වාර්ෂික ඇණවුම ද වෛද්‍ය සැපයුම් අංශය විසින් පිළියෙල කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය. **(ඇමුණුම 134)**

7.12.1.2 ඖෂධ 05 කට අදාළව 2022 වර්ෂයේ සාමාන්‍ය වාර්ෂික ඇණවුම වෛද්‍ය සැපයුම් අංශය විසින් පිළියෙල කර රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඉදිරිපත් කිරීමට ආසන්න වශයෙන් මාසයකින් ප්‍රමාද කර තිබුණු බවත්, වෛද්‍ය සැපයුම් අංශය විසින් ඖෂධ 12කට අදාළව 2023 වර්ෂයේ සාමාන්‍ය වාර්ෂික ඇණවුම පිළියෙල කර රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඉදිරිපත් කිරීම මාස 07 සිට මාස 11 දක්වා පරාසයක විහිදෙන පරිදි ප්‍රමාද කර තිබුණු බවත් නිරීක්ෂණය විය. **(ඇමුණුම 135)**

7.12.1.3 2023 ජූනි මස දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ ඖෂධ ඇස්තමේන්තු කිරීම, ඇණවුම් කිරීම, නිකුත් කිරීම සහ බෙදාහැරීම සඳහා MSMIS පරිගණක පද්ධතිය භාවිතා කර තිබුණු නමුත් වෛද්‍ය සැපයුම් අංශය විසින් MSMIS පරිගණක පද්ධතිය හරහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත යොමු කරන ලද ඖෂධ 6 කට අදාළව ඇණවුම් 6 ක් සිරිත් පරිදි ලිඛිතව සංස්ථාව වෙත සන්නිවේදනය වන තෙක් බලා සිටීම නිසා ඇණවුම් ඉදිරිපත් කර මාස 1 සිට මාස 10 දක්වා කාලය විහිදෙන පරිදි ප්‍රමාද කර ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි. **(ඇමුණුම 136)**

7.12.1.4 2022 වර්ෂය සඳහා වූ සාමාන්‍ය වාර්ෂික ඇණවුම පිළියෙල කර ක්‍රියාත්මක නොකිරීම, සාමාන්‍ය ඇණවුමට අදාළව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම මාස 10 කින් ප්‍රමාද කිරීම, සැපයුම්කරු තෝරා ගැනීමෙන් අනතුරුව ඉන්ඩෙන්ටුව නිකුත් කිරීම සඳහා මාස තුනකට ආසන්න කාලයක් ප්‍රමාද කිරීම, ප්‍රසම්පාදන කටයුතු සඳහා මාස 21 ක කාලයක් ගතවීම නිසා ලංසුකරු විසින් සැපයුම භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම, වෛද්‍ය සැපයීම් අංශය හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව අතර පැවති දුර්වල සන්නිවේදන සම්බන්ධතාවය නිසා ඉදිරිපත් වූ එකම ලංසුකරු සම්බන්ධයෙන් වෛද්‍ය සැපයීම් අංශයේ මතය ලබා ගැනීම සඳහා මාස 11 කාලයක්

ගත කර තිබීම, ඇණවුම් අවලංගු කිරීම හා ඇණවුම් තාවකාලිකව අත්හිටවීම, NMRA සහතිකය ලබා ගෙන සිටි එකම සැපයුම්කරුගේ එම සහතිකය කල් ඉකුත් වී තිබීම, වෛද්‍ය සැපයීම් අංශයේ පිරිවිතර සපුරාලන සැපයුම්කරුවකු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි වී නොසිටීම, 2022 සහ 2023 යන වර්ෂවල මෙම ඖෂධයේ ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් අනවශ්‍ය ලෙස දීර්ඝ කාලයක් ගත කර ඇණවුම් අවලංගු කිරීම යනාදී හේතු සහ වෙනත් හේතු මත ඖෂධ 18 ක ප්‍රමාණයක් මාස 04 සිට මාස 35 ½ දක්වා කාල පරාසයක විහිදෙන පරිදි හිඟව පැවතුණි. **(ඇමුණුම 137)**

7.12.1.5 ඖෂධ අයිතම 06 ක් සඳහා 2019 සිට 2023 දක්වා ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා සත්‍ය සැපයීම් ප්‍රමාණය අතර විචලනයන් පැවති අතර මෙම ඇස්තමේන්තු ගත දත්තයන් ඖෂධ අවශ්‍යතාවය අනුව නිවරදිව පුරෝකථනය කිරීමට වෛද්‍ය සැපයීම් අංශය කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. **(ඇමුණුම 138)**

7.12.2 **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුගතව කටයුතු කර නොතිබීම.**

7.12.2.1 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ කාර්ය සාධනය අසාර්ථක වන විට එයින් ප්‍රසම්පාදන අස්පීත්වය ආරක්ෂා කිරීම සඳහා, කාර්යය සාධන සුරක්ෂණයක් ඉදිරිපත් කරන ලෙසත් , ලංසු ඇරයුම් ලේඛනයේ දෙවන කොටසේ 6 වන වගන්තිය අනුව කාර්යය සාධන සුරක්ෂණයක් ලබා ගත යුතු වුවත්, සෞඛ්‍ය අමාත්‍යාංශය ලේකම්ගේ අංක SH/PSRP/01/SPC/2021 දරන 2023 ජනවාරි 10 දිනැති ලිපියේ නිර්දේශය මත කාර්යය සාධන සුරක්ෂණයක් ලබා ගැනීම වෙනුවට සැපයුම්කරුට ගෙවිය යුතු වටිනාකමෙන් සියයට 10 ක මුදලක් සැපයුම සම්පූර්ණ කර දින 30 ක් දක්වා රඳවා තබාගන්නා ලෙස දන්වා තිබීම හේතුවෙන් රු.මිලියන 1,800 ක් හා එ.ජ.ඩො.මිලියන 4.43 ක් වටිනා ටෙන්ඩර් සඳහා රු.මිලියන 180 හා එ.ජ.ඩො.මිලියන 0.44 ක් වටිනා කාර්යය සාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. **(ඇමුණුම 139)**

7.12.2.2 ගැණුම් ඇණවුමේ ඇති සැපයුම් කොන්දේසි අනුව ඖෂධ සැපයීම ප්‍රමාද වීම මත දඩ ගාස්තුවක් සැපයුම්කරුගෙන් අයකර ගත යුතු වුවත්, සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක SH/Misc/03/2022 දරන 2022 නොවැම්බර් 23 දිනැති ලිපිය ප්‍රකාරව සැපයුම ප්‍රමාද වීම මත පනවා තිබූ දඩ ගාස්තුව නිදහස් කර තිබුණි. එලෙස සහන ලබා දීම හේතුවෙන් සැපයුම්කරු විසින් ඖෂධ සැපයීම ප්‍රමාද කිරීම සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකි වී තිබුණි. තොග හිඟතාවය මත අධික මිල ගණන්වලට හදිසි මිලදී ගැනීම් සඳහා පිවිසුනද නියමිත කාලය තුළ නොසැපයීමෙන් රජයට රු.මිලියන 155.595 ක් හා එ.ජ.ඩො.මිලියන 0.064ක දඩ මුදලක් අහිමි වී තිබුණි. **(ඇමුණුම 140)**

7.12.2.3 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ආ) ප්‍රකාරව සැපයුම්කරු සියයට 10 ක කාර්යසාධන බැඳුම්කරයක් ලබා දිය යුතු අතර ලංසු ආරාධනයේ ලංසු සම්බන්ධ කොන්දේසි අංක 5 ට අනුව සැපයුම දැනුම් දී දින 03 ක් ඇතුළත තොග භාරදීමේ දින සිට මාස 03 ක් වලංගු වන පරිදි කාර්යසාධන බැඳුම්කරයක් සැපයිය යුතු වුව ද ඇණවුම් 2ක් සඳහා ලබා දී තිබුණු රු.මිලියන 31.66 ක් වටිනා කාර්යසාධන බැඳුමකර වලංගු වී නොතිබුණි. **(ඇමුණුම 141)**

7.12.2.4 වෛද්‍ය සැපයීම් අංශය විසින් ඇණවුම් සිදු කිරීමේදී එකම ඖෂධය සඳහා එකවර ඇණවුම් ඉදිරිපත් නොකර ඇණවුම් කිහිපයක් නිකුත් කිරීම හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු සංකීර්ණ වී තිබුණු අතර වැඩි ඒකක ප්‍රමාණයක් එකවර ප්‍රසම්පාදනය කිරීම තුළින් ඒකක මිල අඩු කර ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. **(ඇමුණුම 142)**

7.12.2.5 වෛද්‍ය සැපයීම් අංශයේ ඇණවුම් අංක V කේතය යටතේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා මිලදී ගැනීම සඳහා වෛද්‍ය සැපයුම් අංශය විසින් MSMIS පද්ධතිය තුළින් ඇණවුම් නිකුත් කර තිබුණ ද, එම ඇණවුම් සංස්ථාව වෙත නොලද බව 2023 ඔක්තෝම්බර් 30 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආනයන හා ප්‍රසම්පාදන) - ඖෂධ විසින් ලිඛිතව විගණනයට තහවුරු කර තිබුණි. ඒ අනුව ක්‍රියාත්මක නොවන ඇණවුම් ස්වස්ථා පද්ධතිය තුළින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

7.12.2.6 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1(ඊ) මාර්ගෝපදේශය ප්‍රකරව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාව සහ නිර්දේශ සමාලෝචනය කිරීම ප්‍රසම්පාදන කමිටුවේ වගකීමක් හා කාර්යභාරයක් වන අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 8.1.1 මාර්ගෝපදේශය ප්‍රකරව, ප්‍රසම්පාදන කමිටුව විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාව පරීක්ෂාකාරී ලෙස බැලීමෙන් පසු සහ තාක්ෂණික ඇගයීම් කමිටුවෙන් අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා ගැනීමෙන් පසු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 8.1.1(අ) මාගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතුය. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රසම්පාදනයට අදාළ ලංසු ඇගයීම් සිදු කර තිබුණද, විධිමත් ලෙස පිළියෙල කළ නිර්දේශ ඇතුළත් වාර්තා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණු නමුත් ඒ පිලිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව වෙතින් විමසීමට ප්‍රසම්පාදන කමිටුව විසින් කටයුතු කර නොතිබුණි. 2022 සහ 2023 සැප්තැම්බර් 30 දක්වා තාක්ෂණික ඇගයීම් සිදු කිරීම වෙනුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටු දීමනාව ලෙස රු.මිලියන1.83 ක් ගෙවා තිබුණි.

7.12.2.7 2022, 2023 වර්ෂ වෙනුවෙන් ඖෂධ අයිතම 73 ක් සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ඉදිරිපත් කළ ප්‍රධාන ඇණවුම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේ දී ඖෂධ ඇස්තමේන්තු සකස් කිරීමේ සිට ඖෂධ ඇණවුම් කර වෛද්‍ය සැපයීම් අංශය වෙත ලබාදීමත්, එම ඖෂධ බෙදා හැරීමත් සම්බන්ධයෙන් වූ ක්‍රියාවලිය පිළිබඳව නිරීක්ෂණය කරන ලද ප්‍රමාණාත්මක හා වැදගත් කරුණු වෙළුම I හි ඇතුළත් කර ඇත. මෙම වාර්තාවේ කෙටුම්පත 2023 දෙසැම්බර් 29 දින ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කර පිළිතුරු ලබාදීමට මාස 01 ½ ක කාලයක්ද විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට මාස 02 කට වඩා වැඩි කාලයක් ලබා දී ඇතත් අමාත්‍යාංශ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් එම කරුණු සම්බන්ධයෙන් විගණනයට අසම්පූර්ණ ලෙස පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

7.13 2022 හා 2023 වර්ෂයන්හිදී මිලදී ගන්නා ලද ඖෂධවල තත්ත්වය පිළිබඳ පරීක්ෂාව

7.13.1 2019, 2020, 2021 හා 2022 වර්ෂවලදී තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයුම් සම්බන්ධයෙන් නිකුත් කර තිබුණු චක්‍රලේඛ අනුව ප්‍රතිජීවක ඖෂධ, ආසාත්මිකතා, ඇදුම, පිළිකා, හෘද රෝග, අක්ෂි ආසාදන හා වකුගඩු රෝග සඳහා භාවිතා කරන ඖෂධ ඇතුළුව ඇතැම් ඖෂධවල වීදුරු කැබලි පැවතීම, දෘශ්‍ය අංශු පැවතීම, මැරුණු කැරපොත්තෙකු සිටීම, පෙති කැඩීයාම, වර්ණය වෙනස්වීම, බ්‍රිතාන්‍ය ඖෂධවේද පිරිවිතරයන්ට අනුකූල නොවීම, අහිතකර ප්‍රතික්‍රියා හේතුවෙන් මරණ සිදුවීම, ක්ෂුද්‍රජීවී ආසාධන (Microbial Contamination) යනාදී කරුණු හඳුනාගෙන තිබුණු අතර ඒ හේතුවෙන් භාවිතයෙන් ඉවත් කර හෝ භාවිතය අත්හිටුවා තිබුණි.

(i) මේ අතරින් 2022 වර්ෂයේදී රජයේ රෝහල් සඳහා නිකුත් කළ වෛද්‍ය සැපයීම්වලින් රු.මිලියන 349.03 ක් වටිනා ඖෂධ, ශල්‍ය හා රසායනාගාර ද්‍රව්‍ය තත්ත්වයෙන් අසමත් වීම මත භාවිතයෙන් ඉවත් කර තිබුණු අතර (withdraw) තවත් රු.මිලියන 31.75 ක් වටිනා ඖෂධ තත්ත්වයෙන් අසමත් වීම මත තාවකාලිකව භාවිතය අත්හිටුවා (withhold) තිබුණි. ඒ අතර දෘශ්‍ය අංශු පැවතීම, ටැබ්ලටයේ මතුපිට ඉදිකටු හැඩැති ස්ඵටික පැවතීම, පෙති කැඩීයාම, වර්ණය වෙනස්වීම, බ්‍රිතාන්‍ය ඖෂධවේද පිරිවිතරයන්ට අනුකූල නොවීම (does not confirm to BP specification), රෝගී මරණ වාර්තා වීම ආදී කරුණු හඳුනාගෙන තිබුණු අතර ඒ හේතුවෙන් භාවිතයෙන් ඉවත් කර හෝ භාවිතය අත්හිටුවා තිබුණි. එලෙස තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත් කළ වෛද්‍ය සැපයීම් අතර දියවැඩියා, පිළිකා, ආසාදන, වකුගඩු රෝග සඳහා භාවිතා කරන හා වේදනා නාශක ලෙස භාවිතා කරන ඖෂධ තිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ii) මෙම තත්ත්වය විගණනය විසින් වර්ෂ ගණනාවක් තිස්සේ අනාවරණය කළද මෙතෙක් මෙම තත්ත්වය අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2023 වර්ෂයට අදාළව රු.මිලියන 2,482.12 ක් වටිනා ඖෂධ, ශල්‍ය හා රසායනාගාර ද්‍රව්‍ය තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත් කර තිබුණු අතර තවත් රු.මිලියන 10.72 ක් වටිනා වෛද්‍ය සැපයීම් තත්ත්වයෙන් අසමත් වීම මත තාවකාලිකව භාවිතය අත්හිටුවා තිබුණි. ඒ අතර අක්ෂි රෝග, පිළිකා රෝග, නිර්වින්දනය හා ප්‍රතිශක්තිකරණය සඳහා භාවිතා කරන ඖෂධ ඇතුළුව වෛද්‍ය සැපයීම් තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත් කිරීමත්, ඖෂධ භාවිතයෙන් පසු රෝගීන්ට අහිතකර ප්‍රතික්‍රියා ඇතිවීම, රෝගීන් මරණයට පත්වීම, ඇස් අන්ධභාවයට පත්වීම ආදී ගැටළු මතුවී තිබුණු බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ගුණාත්මයෙන් තොර ඖෂධ රෝගීන්ට ලබාදීම වැළැක්වීමේ අපේක්ෂාව ඉටුවී නොතිබුණි.

(iii) ඖෂධ වර්ග 02 කට අදාළ කාණ්ඩ 04 ක අයිතම සම්බන්ධයෙන් දෝෂ පෙන්වන අයිතම පමණක් අඛණ්ඩව පවත්වා ගෙන නොයාමට (Discontinue) 2022 වර්ෂයේදී චක්‍රලේඛ 04 ක් නිකුත් කර තිබුණු අතර එමඟින් රු.මිලියන 2.05 ක් වටිනා දෝෂ සහිත ඖෂධ තොග පමණක් ඉවත් කර තිබුණි. වෛද්‍ය සැපයීම් අයිතම තත්ත්වයෙන් අසමත් වන අවස්ථාව වන විට රෝහල් තුළ පැවති ඉතිරි තොග ප්‍රමාණ පිළිබඳ තොරතුරු වෛද්‍ය සැපයීම් අංශය විසින් පසුවිපරම් කිරීමක් සිදු නොකරන බැවින් දෝෂ පෙන්වන තොග රෝහල් විසින් නිවැරදිව ගණනය කර වෛද්‍ය සැපයීම් අංශයට එවා ඇත්ද යන්න විගණනයේදී ගැටළු සහගත විය.

7.13.2 වෛද්‍ය සැපයීම් අංශය විසින් රෝහල් වෙත ඖෂධ නිකුත් කිරීමට පෙර ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ක්‍රියාත්මක ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (National Medicines Quality Assurance Laboratory -NMQAL) මඟින් තත්ත්වය පරීක්ෂා කිරීමේ හැකියාවක් නොතිබීම හේතුවෙන් ඖෂධ තත්ත්වයෙන් අසමත් බවට වාර්තාවන අවස්ථාව වන විට එම ඖෂධවලින් බොහෝ ප්‍රමාණයක් රෝගීන් විසින් භාවිතා කර අවසන් බව වර්ෂ ගණනාවක සිටම නිරීක්ෂණය විය. නමුත් 2023 වර්ෂයේදීත් ප්‍රමාණාත්මක අයුරින් එම තත්ත්වයන් මහහැර ගැනීම සඳහා ඖෂධ රෝහල්වලට නිකුත් කිරීමට පෙර තත්ත්වය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීම වෙනුවට GMP සහතිකය හිමි සැපයුම්කරුවන්ගෙන් ඖෂධ ලබා ගන්නා බවට විගණනයට කරුණු දැක්වූවද, ප්‍රසම්පාදන අවස්ථාවේදී ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය නොමැති සැපයුම්කරුවන්ට ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපියක් (Wavier of

Registration - WOR) නිකුත් කර සැපයුම්කරුගේ සුදුසුකම් හා ඖෂධයේ තත්ත්වය පිළිබඳ පරීක්ෂා කිරීමකින් තොරව ඖෂධ සැපයීමට පහසුකම ලබා දෙන බැවින් ඖෂධවල තත්ත්වය පිළිබඳ එහිදීද අවධානමක් ඇතිවන බව නිරීක්ෂණය විය.

(ii) 2023 වර්ෂය වන විට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ රසායනාගාර පහසුකම භාවිතා කරමින් ඖෂධ සුළු ප්‍රමාණයක පරීක්ෂණ කටයුතු සිදුකළද පවතින නීතිමය තත්ත්වය තුළ එම පරීක්ෂණ ප්‍රතිඵල මඟින් තත්ත්වයෙන් අසමත් බව හෙළිදරව් වුවහොත් නැවතත් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත එම සාම්පල යවා පරීක්ෂා කළ යුතු විය.

(iii) ශ්‍රී ලංකාව තුළ ඖෂධ අංශයේ සංවර්ධනය සඳහා ස්වාධීන ප්‍රතිතනයලත් තෙවන පාර්ශවීය පරීක්ෂණාගාරයක් ලෙස රු.මිලියන 99 ක වියදමින් කාර්මික තාක්ෂණ ආයතනය (ITI) තුළ ඉදිකර 2019 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබුණු ඖෂධ රසායනාගාරය මේ සඳහා භාවිතා කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ජාතික ඖෂධ නියාමන අධිකාරිය 2023 වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

7.13.3 වෛද්‍ය සැපයීම් අංශය විසින් සපයා ගෙන තිබුණු වෛද්‍ය සැපයීම් තත්ත්වයෙන් අසමත් වූ පසු අදාළ සැපයුම්කරුවන්ගෙන් නිසි පරිදි මුදල් අයකර නොතිබුණු අතර එපරිදි අයකර ගත යුතු මුදල ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට එම සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු හරපත් වටිනාකම් පැවතිය හොත් පමණක් අයවිය යුතු අගය අඩුකර ගැනීමටත්, ඇතැම් සැපයුම්කරුවන්ගෙන් වාරික වශයෙන් ඔවුන්ට ඉදිරියට ගෙවීමට ඇති බිල්පත්වලින් අයකර ගැනීමටත් කටයුතු කර තිබුණි. ඒ අනුව, තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයීම් වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් රු.මිලියන 1,046.77 ක් ද, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙන් අයවිය යුතු රු.මිලියන 160.59 ක්ද දේශීය සැපයුම්කරුවන්ගෙන් රු.මිලියන 84.87 ක් හා දේශීය නිෂ්පාදකයින්ගෙන් රු.මිලියන 370.76 ක් ලෙස රු.මිලියන 1663 ක් 2023 දෙසැම්බර් 31 දින තෙක් වෛද්‍ය සැපයීම් අංශය විසින් අයකර ගෙන නොතිබුණි. තවද රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතු රු.මිලියන 1,406.48 ක් මෙතෙක් අයකර ගෙන නොතිබුණු අතර ඉන් රු.මිලියන 685.68 ක් සම්බන්ධයෙන් නීති ක්‍රියාමාර්ග ගන්නා අතර තවත් රු.මිලියන 165.80 ක් සෞඛ්‍ය ලේකම්ගේ උපදෙස් මත ක්‍රියාකිරීම අත්හිටුවා තිබුණි.

7.13.4 රෝහල්වලට ඖෂධ නිකුත් කිරීමෙන් පසු තත්ත්වයෙන් අසමත්වීම් වාර්තාවීම පිළිබඳවත්, තත්ත්වයෙන් අසමත් ඖෂධ පිළිබඳ චක්‍රලේඛ නිකුත් කරන අවස්ථා වන විට ඒවා සියයට 100 ක්ම රෝගීන්ට නිකුත් කර හෝ භාවිතයට ගෙන අවසන්ව තිබීම පිළිබඳවත්, භාවිතය අත්හිටුවීමට (withhold) නියෝග කළ අයිතම වැඩිදුර පරීක්ෂණ සිදුකර භාවිතයෙන් ඉවත්

කිරීමට (withdraw) හෝ නැවත භාවිතයට ගැනීමට (Revoke) නියෝග නිකුත් කිරීමට පෙර එම අයිතම නිරායාසයෙන්ම කල් ඉකුත්වීමට ලක්වීම පිළිබඳවත්, පරීක්ෂණ කටයුතු පමාවීම හේතුවෙන් කල් ඉකුත්වන අයිතම සඳහා සැපයුම්කරුවන්ගෙන් අදාළ අලාභය අයකර ගැනීමේ හැකියාව අහිමිවී යාම පිළිබඳවත් දිගින් දිගටම විගණන වාර්තාවලින් හෙළිදරව් කළ නමුත් එම තත්ත්වයන් මහහැර ගැනීම සඳහා රෝහල්වලට වෛද්‍ය සැපයීම් නිකුත් කිරීමට පෙර තත්ත්වය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

7.14 නිර්වින්දනය සඳහා භාවිතා කරන Bupivacaine 0.5% + Glucose 8% inj.4 ml Amp. ඖෂධය තත්ත්වයෙන් අසමත් වීම පිළිබඳ පරීක්ෂාව (SR- 01502003)

7.14.1 තොග හිඟ වීම මත ශල්‍යකර්ම වලදී නිර්වින්දනය සඳහා භාවිතා කරන Bupivacaine 0.5% + Glucose 8% inj.4 ml Amp. ඖෂධයෙන් එන්නත් 68,750 ක තොගයක් වෛද්‍ය සැපයීම් අංශයේ 2022/MSD/V/R/P/00076 (ICL/EOI/P1/134/2022) දරන ඇණවුම මඟින් Slim Pharmacueticals (pvt) ltd. සමාගමෙන් රු.40,738,819 ක වටිනාකමකට හදිසි මිලදී ගැනීම් යටතේ මිලදී ගෙන තිබුණි. ඉහත 6.6.5 ඡේදයේ සඳහන් අභිලාෂ කැඳවීම යටතේ (EOI) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවකු නොවන සමාගමකට ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයක් ලබා ගැනීමට යටත්ව මෙම ඇණවුම ප්‍රදානය කර තිබුණු අතර 2023 පෙබරවාරි 13 දින වෛද්‍ය සැපයීම් අංශය වෙත එම තොග ලැබී තිබුණි.

7.14.2 කාණ්ඩ අංක 03 කින් සමන්විත මෙම ඖෂධ එන්නත් වෛද්‍ය සැපයීම් අංශයට ලද දිනයේ සිට ජාතික රෝහල්, ශික්ෂණ රෝහල්, මූලික රෝහල් හා වෙනත් සෞඛ්‍ය ආයතන වෙත නිකුත් කර තිබුණු අතර මෙම ඖෂධය භාවිතා කළ පසු එක් ගර්භණී කාන්තාවක් මරණයට පත්වූ බවත්, තවත් කාන්තාවකට ජීවිත තර්ජන ඇති වූ බවටත් දන්වමින් (Neurological Adverse reaction) අතර 2023 අප්‍රේල් 04 දින පේරාදෙණිය ශික්ෂණ රෝහලේ විශේෂඥ වෛද්‍යවරයකු විසින් රෝහල් අධ්‍යක්ෂ වෙත සහ අප්‍රේල් 06 දින එම අධ්‍යක්ෂ විසින් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (NMQAL) වෙත පැමිණිලි කර තිබුණි . අදාළ පැමිණිලි පරීක්ෂා කිරීමේදී, ඖෂධය භාවිතය නිසා ඇතිවූ බරපතල අහිතකර ප්‍රතික්‍රියා සැලකිල්ලට ගනිමින් වහාම ක්‍රියාත්මක වන පරිදි ඖෂධයේ භාවිතය වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ විසින් අත්හිටුවා තිබුණි.

7.14.3 ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ආරක්ෂාව හා අවදානම් ඇගයීම් උපකමිටුවේ (Safety & Risk Evaluation Subcommittee- SAFRSC) 2023 අප්‍රේල් 10 දිනැති රැස්වීම් වාර්තාව අනුව මෙම එන්නත් 68,750 ක තොගය තත්ත්වයෙන් අසමත් බව හඳුනා ගන්නා විට ඒකක 34,705 ක් හෙවත් මුළු තොගයෙන් සියයට 50 ක්ම රෝගීන් වෙත නිකුත් කර තිබුණි. ඉන් අනතුරුව 2023 ජූලි 27 දින වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ විසින් මෙම නිෂ්පාදනයම සම්පූර්ණයෙන්ම

භාවිතයෙන් ඉවත් කර තිබුණි. තවද වෛද්‍ය සැපයීම් අංශය විසින් රෝහල් වෙත මෙම ඖෂධ නිකුත් කිරීමට පෙර ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය මඟින් ඖෂධවල තත්ත්වය පිළිබඳව පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

7.14.4 ඉහත 7.14.1 ඡේදයෙහි සඳහන් සමාගමෙන් රු.85,496 ක් අයකරමින් ඉහත 7.11.7 ඡේදයෙහි සඳහන් පරිදි ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ඖෂධය පිළිබඳව ඇගයීමකින් තොරව වේගවත් යාන්ත්‍රණය ඔස්සේ විශේෂ ක්‍රමවේදය යටතේ 2022 දෙසැම්බර් 30 දින ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයක් (WOR) නිකුත් කර තිබුණි. ඒ අනුව ඖෂධ නියාමන අධිකාරිය විසින් සැපයුම්කරුගෙන් ඉහත පරිදි මුදලක්ද අයකර ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කර ඉහත 7.11.6.1 ඡේදයෙහි දැක්වෙන පරිදි තම වගකීමද වෙනත් පාර්ශවයකට පවරා තිබීමෙන් අධිකාරිය ප්‍රධාන අරමුණින් බැහැරව කටයුතු කර තිබුණි.

7.14.5 මෙම ඖෂධය තත්ත්වයෙන් අසමත් වීම සම්බන්ධයෙන් හා ඖෂධය භාවිතයෙන් අදාළ රෝගීන්ට සිදුවූ හානිය සම්බන්ධයෙන් වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ වගකීම භාරගන්නේද යන්නත් ඉහත 7.5.7 ඡේදයෙහි සඳහන් කර ඇති පරිදි විගණනය විසින් කරුණු විමසන ලදි. එහිදී අදාළ ඖෂධවල තත්ත්වය සම්බන්ධයෙන් වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂකවරයාට වගකීම දැරීමට නොහැකි බවත්, ඔහුගේ එකඟතාවයකින් තොරව එම කොන්දේසිය ඇතුළත් කර ඇති බවත් දක්වා තිබුණි.

තවද අභිලාෂ කැඳවා සැපයුම්කරුවන් ඇගයීමේ දී විශේෂඥ උපදෙස් ලබා නොගෙන ඇගයීම් කටයුතු සිදු කිරීමත් ලියාපදිංචියෙන් තොර සැපයුම්කරුවන්ට මෙම ඖෂධ සැපයීමට අවස්ථාව සලසා දීමට ඉහත 7.3.6 ඡේදයෙහි සඳහන් ඇගයීම් කමිටුව කටයුතු කර තිබුණි.

ඒ අනුව වෛද්‍ය සැපයීම් අංශය විසින් නිකුත් කරන ලද ඉහත 7.14.2 ඡේදයෙහි සඳහන් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව ගුණත්වයෙන් අසමත් යැයි හඳුනා ගන්නා ලද මෙම ඖෂධය සම්බන්ධයෙන් වගකීම ගැනීමට/වගකීම නිසි පරිදි ඉටුකිරීමට හෝ මෙම ආයතන අසමත් වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය.

7.15 අක්ෂි රෝග සඳහා භාවිතා කරන Prednisolone Acetate Eye Drop 1%,5ml dropper Bot. ඖෂධය පිළිබඳ පරීක්ෂාව (SR- 00901001)

7.15.1 අක්ෂි රෝගීන් සඳහා සිදුකරන කැටරැක් ශල්‍යාකර්මයෙන් (Cataract Surgery) පසු භාවිතා කරනු ලබන Prednisolone Acetate Eye Drop ඖෂධයේ 500,000 ක බෝතල් තොගයක් වෛද්‍ය සැපයීම් අංශයේ 2021/SPC/N/R/P/00043 දරන ඇණවුම මඟින් ඇණවුම් කර තිබුණු අතර ඉන් රු.3,631,093 ක් වටිනා බෝතල් 50,000 ක තොගයක් 2023 මාර්තු 03 දින වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබී තිබුණි. කාණ්ඩ අංක 02 කින් සමන්විත මෙම ඖෂධ ඒකක 50,000 ක

තොගය 2023 මාර්තු 09 දින සිට ශ්‍රී ලංකා ජාතික අක්ෂි රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහනුවර ජාතික රෝහල ඇතුළු රෝහල් හා සෞඛ්‍ය ආයතන 58 ක් වෙත නිකුත් කර තිබුණි.

7.15.2 මෙම ඖෂධය සම්බන්ධයෙන් 2023 අප්‍රේල් 18 දින ජාතික අක්ෂි රෝහලේ හා නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂවරු විසින් මෙම ඖෂධය භාවිතා කළ පසු අදාළ රෝගීන්ට අක්ෂි ආසාත්මිකතා (patient got Endophthalmitis) ඇතිවූ බවට ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (NMQAL) වෙත පැමිණිලි ඉදිරිපත් කර තිබුණි. එම පැමිණිලි පරීක්ෂාවෙන් පසු රෝගීන්ට සිදු වූ බරපතල අහිතකර ප්‍රතික්‍රියා හේතුවෙන් හා "Sample does not conform to specifications for the sterility test" යනුවෙන් සඳහන් කරමින් මෙම ඖෂධය තත්ත්වයෙන් අසමත් බවට වාර්තා කිරීමත් සමඟ ඖෂධ තොගය බෙදාහැරීම අරඹා දින 46 කට පසු එනම් 2023 අප්‍රේල් 25 දින වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂක විසින් එය භාවිතයෙන් ඉවත් කර තිබුණි. කෙසේ නමුත් මෙම ඖෂධය භාවිතයෙන් ඉවත් කරන විටත් ඒකක 21,510 ක් හෙවත් ලැබී ඇති මුළු තොගයෙන් සියයට 43 ක්ම රෝගීන් සඳහා භාවිතා කළ බව වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් 2024 අප්‍රේල් 29 දින අංක MSD/FIN/MSB/75/2023 දරන ලිපිය මඟින් විගණනයට දන්වා තිබුණි. එසේම මෙම ඖෂධය භාවිතා කිරීම හේතුවෙන් ජාතික අක්ෂි රෝහලේ රෝගීන් දෙදෙනෙකු පූර්ණ අන්ධභාවයට පත්වී තිබුණු බවත් නුවරඑළිය දිස්ත්‍රික් මහා රෝහලේ රෝගීන් 16 දෙනෙකු ආසාත්මිකතාවයට පත් වී ඇති බවත් දක්වා තිබුණි.

7.15.3 වෛද්‍ය සැපයීම් අංශය හෝ / හා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය විසින් රෝහල් වෙත මෙම ඖෂධ නිකුත් කිරීමට පෙර ඖෂධවල තත්ත්වය පිළිබඳව පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

7.16 සම්මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරවීමත්, හදිසි මිලදී ගැනීම් ක්‍රියාවලියේ අවධිමත්භාවයත් හේතුවෙන් Human Immunoglobulin IV 5-6g (SR-00603205) හා Rituximab inj. 500mg in 50ml vial(SR-01205702) යන ව්‍යාජ ඖෂධ මිල දී ගැනීම

ඉහත සඳහන් Human Immunoglobulin IV 5-6g (SR-00603205) හා Rituximab inj. 500mg in 50ml vial (SR-01205702) ඖෂධ දෙක පිළිබඳව වැඩිදුර පරීක්ෂාවක් සිදු කරන ලද අතර ඒ පිළිබඳව හඳුනා ගත් කරුණු පහත 7.16.1 සිට 7.16.12 දක්වා ඇත.

7.16.1 **Human Immunoglobulin IV 5-6g ඖෂධය (SR-00603205)**

7.16.1.1 2022 වර්ෂයේ දී රටතුළ ඇති වී තිබුණු තොග ඌනතාවයට පිළියමක් වශයෙන් ඉහත අංක 6.6.5 හි සඳහන් ආකාරයට සිදුකරන ලද හදිසි මිලදී ගැනීම් යටතේ මෙම ඖෂධය මිලදී ගැනීමට

අභිලාෂ කැඳවීමේ පදනම හරහා සැපයුම්කරුවන්ගෙන් ලංසු ලබාගෙන තිබුණි. ඒ අනුව තෝරාගත් ලංසුකරු වූ Isolez Biotech Pharma AG Ltd සමාගමට එක් එන්නතක් එ.ජ.ඩොලර් 130 බැගින් එන්නත් 22,500 ක් එ.ජ.ඩොලර් 2,925,000 ක වටිනාකමකට සැපයීමට සෞඛ්‍ය ලේකම් විසින් 2023 ජනවාරි 04 දින අදාළ සමාගමට ප්‍රසම්පාදනය ප්‍රදානය කර තිබුණි. ඉන් අනතුරුව 2023 ජනවාරි 13 දින අංක 2022/MSD/V/R/P/00038 (ICL/EOI/P1/174/2022) දරන ඉහත සඳහන් වටිනාකමින් යුත් ගැණුම් ඇණවුම සැපයුම්කරු වෙත නිකුත් කර තිබුණි.

7.16.1.2 සැපයුම්කරු විසින් 2023 මැයි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ දී එන්නත් කුප්පි 22,500 න් රු.මිලියන 168.86 ක් වටිනා කුප්පි 3,985 ක් වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු අතර එම අංශය විසින් රු.මිලියන 36.38 ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබුණු සියළුම එන්නත් කුප්පි 2023 මැයි 30 දින සිට ජාතික රෝහල්, ශික්ෂණ රෝහල්, පළාත් රෝහල් හා ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශ වෙත නිකුත් කර තිබුණි. එම ඖෂධය රෝගීන් විසින් භාවිතා කිරීමෙන් පසු කොළඹ, මහනුවර ජාතික රෝහල් සහ මාතලේ හා මාතර දිස්ත්‍රික් මහ රෝහල්වල රෝගීන්ට බරපතල අහිතකර ප්‍රතික්‍රියා (Serious of Adverse reaction) ඇතිවී තිබුණු බව ජාතික ඖෂධ නියාමන අධිකාරියට 2023 සැප්තැම්බර් මාසයේදී වාර්තා වී තිබුණි.

7.16.1.3 එහිදී මෙම ඖෂධය භාවිතයෙන් රෝගීන්ට බරපතල අහිතකර ප්‍රතික්‍රියා ඇතිවීම (serious adverse reaction) හා මෙම ඖෂධය වෙනුවෙන් අධිකාරියේ ලියාපදිංචි සහතිකයක් හෝ ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතිකයක් (WOR) නිකුත් කර නොමැති බවට එම අධිකාරිය විසින් අනාවරණය කර ගෙන තිබුණි. ඉන් පසුව ආරක්ෂිත ක්‍රමවේදයක් ලෙස මෙම සැපයුම්කරු විසින් සපයන ලද මුළු තොගයම වහාම ක්‍රියාත්මක වන පරිදි තත්ත්වයෙන් අසමත් බවට දන්වමින් 2023 ඔක්තෝබර් 03 දින වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂක විසින් භාවිතය අත්හිටුවා තිබුණි. 2023 ඔක්තෝබර් 09 දිනැති අංක MSD/QP/2023/56 දරන චක්‍රලේඛය මඟින් මෙම ඖෂධය ව්‍යාජ ඖෂධයක් හා බරපතල අහිතකර ප්‍රතික්‍රියා ඇති වීම හේතුවෙන් මෙම ඖෂධයෙහි මුළු තොගයම වහාම ක්‍රියාත්මක වන පරිදි භාවිතයෙන් ඉවත් කර තිබුණි. ඉන්පසු 2023 ඔක්තෝබර් 18 දිනැති අංක MSD/Q/Special/2023/4 දරන චක්‍රලේඛය මඟින් මෙම සැපයුම්කරු විසින් සපයන ලද සියළුම නිෂ්පාදන භාවිතයෙන් ඉවත්කර තිබුණි.

7.16.1.4 ඉහත 7.16.1.1 ඡේදයෙහි දැක්වෙන පරිදි 2022 සැප්තැම්බර් වන විට මෙම ඖෂධය සඳහා හදිසි මිලදී ගැනීම් යටතේ අභිලාෂ කැඳවන අවස්ථාව වන විට මෙම ඖෂධය සඳහා 2022 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ සාමාන්‍ය වාර්ෂික ඇණවුමේ ප්‍රසම්පාදන කටයුතු මාස 19 ක් දක්වා ප්‍රමාද කර තිබුණු අතර 2021 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ හදිසි මිලදී ගැනීමේ ඇණවුම ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.එසේම මෙම අභිලාෂ කැඳවන විට 2021 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ සාමාන්‍ය වාර්ෂික ඇණවුමට අදාළව ලැබීමට නියමිත වූ මාස 06 කට ප්‍රමාණවත්

එන්නත් 47,202 ක් ලබාගැනීම නොසලකා මාස 03 ක අවශ්‍යතාවයක් වූ ඉහත 7.16.1.1 හි සඳහන් 22,500 ක් මිලදී ගැනීමට අභිලාෂ කැඳවා තිබුණි.

7.16.1.5 මෙම ඖෂධය ද ඉහත 6.6.3 ඡේදයෙහි සඳහන් පරිදි හදිසි මිලදී ගැනීම් යටතේ අභිලාෂ කැඳවීම් මත සිදු කළ බැවින් හදිසි මිලදී ගැනීම් ක්‍රියාවලිය පිළිබඳ ඉහත නිරීක්ෂණ අංක 7.3 පරිදි මෙම ඖෂධය මිලදී ගැනීමේදී ද, සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ මාසික වාර්තාවක් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතියට ඉදිරිපත් නොකිරීමත්, අභ්‍යන්තර විගණක විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසානයේ සාධාරණ හා ඵලදායී ක්‍රියාවලියක් සහතික කර නොතිබීමත් නිරීක්ෂණය විය. තවද ලැබිය යුතු තොග පිළිබඳව නොසලකා ඇණවුම් ප්‍රමාණය දැනුම් දීමට තීරණය කිරීමෙන් වෙනත් ප්‍රමුඛ කටයුත්තක් වෙනුවෙන් ප්‍රශස්ථ අයුරින් යෙදවීමට තිබුණු අවස්ථාවක් මහනොහැරුණු බව විගණනයට තහවුරු නොවීය. එමෙන්ම අභිලාෂ කැඳවීමේ ක්‍රමවේදයක් හරහා ඖෂධ මිලදී ගැනීමත්, සෞඛ්‍ය අංශ හදිසි මිලදී ගැනීම් කමිටුව විසින් තාක්ෂණික විශේෂඥයන්ගේ උපදෙස් ලබාගැනීමට කටයුතු කළ යුතු වුව ද, එපරිදි කටයුතු නොකිරීමත්, ලියාපදිංචියෙන් නිදහස් කිරීම් යටතේ ප්‍රසම්පාදනයන් සඳහා ඉදිරිපත් වීම අවම වන පරිද්දෙන් උචිත සීමාකාරී කොන්දේසි ලංසු ලේඛනවලට ඇතුළත් කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

7.16.1.6 මෙම සැපයුම්කරු විසින් අදාළ ලංසු ලියවිලිවල මිල ලේඛනය තුළ මෙම ඖෂධය ඉන්දියානු ඖෂධයක් බවත් (Indian origin), නිෂ්පාදක ඉන්දියාවේ Livealth Bio Pharma Pvt Ltd බවත්, වැඩකරන දින 01 ත් 05ත් අතර මුළු තොගයම ආනයනය කර සැපයිය හැකි බවත් සටහන් කර තිබුණු අතර එම ලේඛනයේම අමුද්‍රව්‍ය ඉන්දියාවේ Livealth Bio Pharma Pvt Ltd බවටත්, නිෂ්පාදන සූත්‍රය (Product formulated), කොන්ත්‍රාත් නිෂ්පාදනය හා අලෙවි කිරීම (Contact Manufacturing & Market) Isolez Biotech Pharma AG Ltd බවටත් සටහන් කර තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් ඇගයීම් කමිටුවේ අවධානය යොමු වී නොතිබුණි.

7.16.1.7 මේ සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් පසුව සිදුකළ පරීක්ෂාවේ දී මෙය ව්‍යාජ ඖෂධයක් (Falsified Medicine) බවත්, එම ඖෂධ ඇසුරුමේ සඳහන් සමාගම විසින් මෙම ඖෂධය නිෂ්පාදනය හෝ සැපයුම් නොකළ බවත් 2023 ඔක්තෝබර් 04 දින Livealth Bio Pharma නමැති ඉන්දියානු නිෂ්පාදන සමාගම විද්‍යුත් තැපෑල මඟින් කරන ලද තහවුරු කිරීම අනුව අනාවරණය කර ගෙන තිබුණි. ඒ අනුව මෙම ඖෂධයේ දේශීය නියෝජිත ලෙස කටයුතු කරන බව ව්‍යාජ ලෙස දක්වා Isolez Biotech Pharma AG Ltd සමාගම විසින් වංචා සහගත ලෙස අදාළ ඖෂධ ඇසුරුම්වල හා අනෙකුත් ලේඛනවල ඖෂධයේ නිෂ්පාදක ලෙස ඉන්දියාවේ Livealth Bio Pharma නමැති සමාගමේ නම යොදා ඇති බවත්, එමඟින් මෙම ඖෂධය ආනයනය කරන ලද ඖෂධයක් බව සනාථ කිරීමට උත්සාහ කර තිබුණි. එසේම මෙම ඉන්දියානු සමාගමේ නම ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයට ද ඇතුළත් කර තිබුණි.

7.16.1.8 සැපයුම්කරු විසින් ලංසු ලේඛන සමඟ අදාළ ඖෂධ තොගයේ නිෂ්පාදක ලෙස සඳහන් Livealth සමාගමේ තත්ත්ව පාලන දෙපාර්තමේන්තුවේ යැයි සඳහන් ඖෂධය පිළිබඳ විශ්ලේෂණ සහතිකයක් (Certificate of Analysis –COA) ඉදිරිපත් කර තිබුණද ඉන්දියාවේ නිෂ්පාදක විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත සිදු කරන ලද ලිඛිත තහවුරුව අනුව එම විශ්ලේෂණ සහතිකය ද ව්‍යාජ සහතිකයක් බව තහවුරු කර තිබුණි.

7.16.1.9 මෙම ඖෂධය පිළිබඳව වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් සෞඛ්‍ය ලේකම් වෙත 2023 නොවැම්බර් 14 දින ඉදිරිපත් කළ රසායනාගාර වාර්තාවක් මඟින් ඖෂධයේ අඩංගු IgG (Immunoglobulin) මට්ටම අනාවරණ මට්ටම වූ 5,000mg/dL ට වඩා අඩු මට්ටමක පැවති බවත්, ඒ හේතුවෙන් අදාළ රෝගීන් ආසාදනය වීමේ අවධානමක් පවතින බවටත් දැනුම් දී තිබුණි. එසේම ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය විසින් 2023 නොවැම්බර් 23 දින නිකුත් කළ තත්ත්වය පිළිබඳ සහතික 03කට අනුව කොළඹ ජාතික රෝහලෙන් ලබා ගත් සාම්පල් තුනක Sterility පරීක්ෂාවේ දී අදාළ පිරිවිතරයන්ට අනුකූල නොවූ බවත්, Bacterial endotoxins පරීක්ෂාවේ දී සාම්පල තුනෙන් එකක් අදාළ පිරිවිතරයන්ට අනුකූල නොවූ බවත් විගණනයේ දී අනාවරණය විය.

7.16.1.10 මෙවැනි ඖෂධයක් සැපයුම්කරු විසින් 2023 ජනවාරි 01 දින සිට ආනයනය කර නොමැති බවට ශ්‍රී ලංකා රේගුව 2023 ඔක්තෝබර් 17 දින ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි වෙතද , 2023 නොවැම්බර් 08 දින ආනයන හා අපනයන පාලක ජනරාල් ඉදිරිපත් කරන ලද 2022 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතික මත ආනයන කරන ලද ඖෂධ ලැයිස්තුවට අනුව මෙම සැපයුම්කරුගේ ඖෂධය එම ලැයිස්තුවේ නොමැති බැවින් සැපයුම්කරු විසින් ලංසු ලියවිලි තුළ ඖෂධය ආනයනය කර සපයන බවට ව්‍යාජ ලෙස දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

7.16.1.11 ඉහත 7.3.7 ඡේදයෙහි පරිදි අභිලාෂ කැඳවීමේ ඇගයීම් කමිටුව විසින් මිල හා තොග ලබාදීමේ කාලසටහන් පිළිබඳව පමණක් අවධානය යොමු කළ බවත්, WOR ලබා ගැනීමට අවශ්‍ය අනෙකුත් ලේඛන ඉදිරිපත් නොකිරීම වැනි කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු නොකිරීම වැනි හේතූන් මත ඇගයීම් කමිටුව ස්වාධීනව හා උපරිම අවධානයෙන් යුතුව ක්‍රියාකර නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව ඉහත 7.16.1.6 ඡේදයෙහි පරිදි ලංසු ලේඛනවල සඳහන් පරස්පර විරෝධී කරුණු සම්බන්ධයෙන් ඇගයීම් කමිටුව විසින් වැඩිදුර පරීක්ෂා කර නොමැති බවද විගණනයේ දී නිරීක්ෂණය විය. එසේම සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව ද ඖෂධවල ගුණත්වය තහවුරු කරගැනීමට අවධානය යොමු කර නොතිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුව හා ප්‍රසම්පාදන අස්ථිත්වය ඇගයීම් ක්‍රියාවලියේ දී උපරිම අවධානයෙන් යුක්තව ක්‍රියාකර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

7.16.1.12 මෙම සැපයුම්කාර සමාගම වර්ෂ ගණනාවක සිට වෛද්‍ය සැපයීම් අංශයට රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත අයිතම සපයා තිබුණ ද කිසිදු අවස්ථාවක ඖෂධ අයිතම සපයා තිබුණු බව විගණයට තහවුරු නොවූ බැවින් හා ජාතික ඖෂධ අධිකාරියේ ලියාපදිංචිය ද මෙම සැපයුම්කරුට නොමැති බැවින් ස්නායු රෝගීන් සඳහා භාවිතා කරන මෙවැනි ඖෂධ ආනයනය කිරීමේ හැකියාව පිළිබඳව සහ මෙම සැපයුම්කරු අදාළ ඉන්දියානු නිෂ්පාදකගේ බලයලත් දේශීය නියෝජිතයෙකු ද යන්න සොයා බැලීමකින් තොරව ඇගයීම් කමිටුව විසින් මෙම නිර්දේශ කිරීම සිදුකර තිබුණි.

7.16.1.13 ඉහත පරිදි EOI ඇගයීම් කමිටුව විසින් WOR සහතිකය සමඟ අදාළ සමාගමට ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණ ද, සෞඛ්‍ය ලේකම් විසින් ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ ලිපිගොනු අංක PSRP/08/EOI/ACC/2022 මඟින් මෙම ප්‍රසම්පාදනය ප්‍රදානය කරමින් 2023 ජනවාරි 04 දින යවන ලද ලිපියේ කොන්දේසි අංක 07 යටතේ ‘‘ලියාපදිංචි නොවූ සැපයුම්කරුවකුට අයිතමයක් ප්‍රදානය වුවහොත් ඖෂධ අධිකාරිය විසින් නිකුත් කරන ලද WOR සහතිකය ඖෂධ තොගය ලබා දීමේ දී ඉදිරිපත් කළ යුතු බවට දන්වා තිබුණි. තවද එසේ නොමැති නම් ලබා දෙන ලද අයිතම සඳහා ගෙවීම් සිදු නොකරන බවටත්, ’’ දැනුම් දී තිබුණි. මේ අතර වෛද්‍ය සැපයීම් අංශය විසින්ද WOR සහතිකය ලබාගැනීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව 2023 ජනවාරි 13 දින එ.ජ.ඩොලර් 2,925,000 ක් වටිනා මෙම ගැණුම් ඇණවුම සැපයුම්කරුට නිකුත් කර තිබුණි.

7.16.1.14 සැපයුම්කරු විසින් මෙම ඖෂධ තොගය වෛද්‍ය සැපයීම් අංශයට භාරදෙන අවස්ථාවේදී ලබාදී තිබුණු WOR සහතිකයේ ඖෂධ අධිකාරියේ අංකය NMRA/FA/WOR/MED/ICL/1/MSD096/ 23 ලෙස සඳහන්ව තිබුණි. නමුත් මෙම අංකය මෙම කාලපරිච්ඡේදය තුළ ඖෂධ අධිකාරිය විසින් නිකුත් කර තිබුණු අනෙකුත් WOR සහතික අංක සමඟ සැසඳීමේ දී වෙනස් බව නිරීක්ෂණය විය. එසේම ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2023 ජනවාරි 20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ අංක 88.5.1 අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ඉන්දියානු ණය යෝජනා ක්‍රමය හරහා ගෙන්වන හා ඉදිරියේදී නිකුත් කරන WOR සහතිකවල වලංගු කාලය සති 12 සිට මාස 06 දක්වා දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් 2023 පෙබරවාරි සිට නිකුත් කර තිබුණු WOR සහතිකවල එම කොන්දේසිය සංශෝධනය කර තිබුණි. නමුත් සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද 2023 පෙබරවාරි 17 දිනැති ප්‍රශ්නගත WOR සහතිකයෙහි මෙම කොන්දේසිය සංශෝධනය කර නොතිබුණි.

7.16.1.15 ඉහත 7.11.6.4 ඡේදයෙහි දැක්වෙන පරිදි ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික නිකුත් කරන ලබන අවස්ථාවේදීම වෛද්‍ය සැපයීම් අංශයේ පිටපත, එම අවස්ථාවේ දීම හෝ අවම වශයෙන් භාණ්ඩ ලැබෙන අවස්ථාව වන විට වෛද්‍ය සැපයීම් අංශය වෙත යැවීමට ඖෂධ නියාමන අධිකාරිය විසින් කටයුතු කලේ නම් හෝ ඒ පිළිබඳව විමසා වෛද්‍ය සැපයුම් අංශය අදාළ සහතික

පිටපත් ගෙන්වා ගැනීමට කටයුතු කලේ නම් මෙම ඖෂධය සඳහා නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් වී නොමැති බවට භාණ්ඩ ලැබෙන අවස්ථාව වන විට හෝ හඳුනාගැනීමට හැකියාව ලැබෙන බැවින් එම අවස්ථාවේදීම මෙම සැපයුම්කරු සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට හැකියාව තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. එසේ වුවානම් මෙම ඖෂධය භාවිතා කිරීමෙන් පසු රෝගීන්ට සිදු අවධානම් තත්ත්වයන් මඟ හරවා ගැනීමට හැකියාව තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.

7.16.1.16 ඒ අනුව වෛද්‍ය සැපයීම් අංශය රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා සපයා ගන්නා ඇණවුම් වලදී සංස්ථාවේ වාප්පු අංශය (Wharf Section) හරහා නිශ්කාශන කටයුතු සිදුකර වෛද්‍ය සැපයීම් අංශයට තොග ලබා දුන්නද මෙම හදිසි මිලදී ගැනීම් වලදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හෝ වෛද්‍ය සැපයීම් අංශය මෙම නිශ්කාශන කටයුතු සඳහා සහභාගි නොවීම හේතුවෙන් සත්‍ය වශයෙන්ම සැපයුම්කරු ඖෂධ ආනයනය කර ගෙන්වා ඇති බව තහවුරු කර ගැනීමට අදාළ නෞභාරපත්‍රය, රේගු සටහන්කරය හෝ ඇසුරුම් ලැයිස්තු පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නොපැවතුණි. ඒ අනුව පැවති මෙම අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවය හේතුවෙන් මෙම ඖෂධය ව්‍යාජ ඖෂධයක් ලෙස ඖෂධ සැපයීම් ජාලයට ඇතුළත් වීමට අවස්ථාව සැලසී තිබුණි.

7.16.1.17 2022 සැප්තැම්බර් 16 දින පැවති ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අංක 84.6.1 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව අනුව මීට පෙරද තොග නිෂ්කාශනයන්හීදී (Consignment Clarence) ලියාපදිංචි සහතික හා ආනයන බලපත්‍රවල ව්‍යාජ මුද්‍රා සහ අත්සන් යොදා තිබීම පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කළ බවත්, ලේඛනවල ආරක්ෂාව පිළිබඳ සලකා QR කේත යෙදීමේ හැකියාව පිළිබඳවත්, විශ්වාස කටයුතු (fool proof) යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කර ඇති බවත් නිරීක්ෂණය විය. ඒ සම්බන්ධ කඩිනම් ක්‍රියාමාර්ග ගත්තේ නම් වංචනික ලෙස WOR සහතිකයක් ඉදිරිපත් වීම වැළැක්විය හැකිව තිබුණු බවද විගණනයේ දී නිරීක්ෂණය විය.

7.16.1.18 මෙම ඖෂධය සඳහා WOR සහතිකයක් ලබා ගැනීමට අදාළව සැපයුම්කරු විසින් 2023 ජනවාරි 16 හා පෙබරවාරි 28 යන දින දෙකෙහිදී පිළිවෙලින් වෛද්‍ය සැපයීම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත හා සැපයුම් ගණකාධිකාරී අමතමින් ඉල්ලීම් 02 ක් ඉදිරිපත් කර තිබුණු අතර මෙම WOR සහතික නිකුත් කිරීම වෛද්‍ය සැපයීම් අංශයේ කාර්යභාරයක් නොවූ බැවින් එම අංශය මෙම ඉල්ලීම ඉටුකර නොමැත. එසේ වුවත්, සැපයුම්කරු විසින් 2023 මැයි 27 දින පළමු ඖෂධ තොගය වෛද්‍ය සැපයීම් අංශය වෙත භාරදීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් 2023 පෙබරවාරි 17 දිනැතිව නිකුත් කරන ලද WOR සහතිකයක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාජ WOR සහතිකය කවුරුන් විසින් සකස් කළේ ද යන්න විමර්ශනය කළ යුතු බවට විගණනයේ දී නිරීක්ෂණය විය.

7.16.1.19 මෙම ව්‍යාජ ඖෂධය වෛද්‍ය සැපයීම් අංශයට ලබාදෙන අවස්ථාව වන විට පුද්ගලයින් දෙදෙනෙකු සැපයුම්කාර සමාගම අධ්‍යක්ෂවරු ලෙස කටයුතු කර ඇති බවත්, එක් අධ්‍යක්ෂවරයකු වන හේවගේ සුදත් ජානක ප්‍රනාන්දු නමැත්තා විසින් 2023 පෙබරවාරි 27 දින එනම් ව්‍යාජ WOR සහතිකයේ දිනය වන 2023 පෙබරවාරි 17 දිනෙන් පසුව සෞඛ්‍ය ලේකම්ගේ නිර්දේශය සහිතව ජාතික රුධිර පාරවිලයන සේවයේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ ලිපියක් මඟින් Isolez Biotech Pharma AG Ltd සමාගම විසින් ‘‘විදේශීය සහයෝගය මත මානව ප්ලස්මාවේ භෞතික විද්‍යාත්මක ක්‍රියාකාරකම්වල සොයා නොගත් භූමිකාවන් පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය සහ භාග ක්‍රියාවලිය මඟින් සංචිත ප්ලස්මා මඟින් නව ප්ලස්මා ප්‍රෝටීන හුදකලා කිරීම’’ සම්බන්ධව සිදුකරන පර්යේෂණ හා සංවර්ධනයක් සඳහා යැයි සඳහන් කරමින් (Research & development of undiscovered roles of Physiological functions of Human Plasma & isolate new plasma proteins by pooled plasma by fraction process conducted by Isolez Biotech Pharma with overseas collaboration) මානව රුධිර ප්ලස්මා (Human Blood Plasma) ලීටර් 1,000 ක් මිලදී ගැනීමට ඉල්ලීමක් සිදුකර තිබුණි.මෙම තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා 2023 පෙබරවාරි 28 දින ජාතික රුධිර පාරවිලයන සේවයේ අධ්‍යක්ෂ විසින් සාමාජිකයින් 5 දෙනෙකුගෙන් යුත් කමිටුවත් පත්කර තිබුණි. ඉන් අනතුරුව නැවතත් 2023 මාර්තු 16 හා සෞඛ්‍ය ලේකම්ගේ නිර්දේශය සහිතව අප්‍රේල් 26 යන දිනවල නැවතත් රුධිර පාරවිලයනය සේවයේ අධ්‍යක්ෂකගෙන් ඒ සම්බන්ධව ඉල්ලීම් සිදුකර තිබුණි.

7.16.1.20 ඉහත 7.16.1.18 ඡේදයෙහි දැක්වෙන පරිදි මේ සම්බන්ධයෙන් පත්කර තිබුණු කමිටුව 2023 මැයි 03 දින ඉදිරිපත් කර තිබුණු වාර්තාව මඟින් 2015 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව අතිරික්ත මානව ප්ලස්මා තෝරාගත් ලංසුකරුවකු මඟින් අපනයනය කරන බවත්, ප්ලස්මා විශාල තොගයක් මෙම අවශ්‍යතාවයට නිකුත් කළ නොහැකි බවටත්, යෝජනාවේ සඳහන් ජාතික වැදගත්කම පිළිබඳ සලකා ප්ලස්මා ලීටරයක් සඳහා එ.ජ.ඩොලර් 44.60 බැගින් අයකරමින් සතියකට ප්ලාස්මා පැකට් ලීටර් 40 බැගින් මාස 09 ක් තුළ ලබාදීමට නිර්දේශ කර තිබුණි.

7.16.1.21 විධිමත් අනුමැතිය ලත් පර්යේෂණයක්ද යන්න හෝ පර්යේෂණ සිදුකළ යුතු ආචාරධර්මවලට අනුකූල වන ලෙස (Ethical Review) කටයුතු කර ඇති බවට තහවුරු කරගැනීමකින් තොරව ආසාධිත නොවන බවට රසායනාගාර පරීක්ෂණ මඟින් තහවුරු නොකළ ප්ලාස්මා බාහිර පාර්ශවයකට ලබාදීමට කටයුතු කිරීමටත්, රුධිර පාරවිලයනය ආයතනය විසින් පත්කළ කමිටුව විසින්ද පර්යේෂණ සිදුකළ යුතු ආචාරධර්මවලට අනුකූලව මෙම පර්යේෂණ කටයුතු සිදුකරන බවට තහවුරු කරගැනීමකින් තොරව රුධිර ප්ලාස්මා නිකුත් කිරීමට නිර්දේශ කිරීමටත් කටයුතු කර තිබුණි. තවදුරටත් මෙම කමිටුව මඟින් පර්යේෂණයට අදාළ භූමිභාගය පරීක්ෂා කිරීමට යෝජනා කර තිබුණද එවැනි පරීක්ෂාවක්ද සිදු කිරීමකින් තොරව රුධිර ප්ලාස්මා නිකුත් කර තිබුණි.

7.16.1.22 අන්තර්ජාලයෙන් ලබාගත් තොරතුරු අනුව මෙම ඖෂධය නිෂ්පාදනය කිරීම සඳහා රුධිර ප්ලාස්මා භාවිතා කරන බැවින් සහ සැපයුම්කරුට ඉහත ඇණවුම ලබාදුන් දින සිට එම ඇණවුමේ මුල් ඖෂධ තොගය වෛද්‍ය සැපයීම් අංශය වෙත ලබාදුන් 2023 මැයි 26 දිනය දක්වා කාලපරිච්ඡේදය තුළදී සැපයුම්කරු විසින් ඉහත පරිදි රුධිර ප්ලස්මා ලීටර් 21.73 හා රුධිර පැකට් 06 ක් ලබාගෙන ඇති බැවින් හා එදිනෙන් පසු ප්ලස්මා ලීටර් 149.15 ක් ලබාගෙන ඇති බැවින් ඒවා ඇතුළත් කර ඉහත ඖෂධය සැපයුම්කරුගේ කර්මාන්තශාලාවේ නිපදවූයේද යන්න විගණනයට ගැටළු සහගත විය. ඒ අනුව සැපයුම්කරු විසින් මෙම ඖෂධය ඔහුගේ නිෂ්පාදන පරිශ්‍රයේ සිදු කළේ නම් ඔහු ජාතික ඖෂධ අධිකාරී පනතේ 113(1) උපවගන්තිය කඩ කරමින් නීති විරෝධී කටයුත්තක යෙදී ඇති බවට විගණනයේදී නිරීක්ෂණය විය. එසේම මෙම ඖෂධයේ අන්තර්ගත ද්‍රව්‍ය පිළිබඳව විද්‍යාත්මක පරීක්ෂණයක් මඟින් තහවුරු කර ගත යුතු බව නිරීක්ෂණය විය.

7.16.1.23 එසේ ප්ලස්මා හා රුධිරය භාවිතා කර ඇත්නම් එය ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ III වන කොටසේ 49 (1) හා (2) ප්‍රකාරව සනීපාරක්ෂක නොවන තත්ත්වයන් යටතේ නිෂ්පාදිත කිසිදු ඖෂධයක්, ආගන්තුක ද්‍රව්‍ය පූර්ණ හෝ අර්ධ වශයෙන් අන්තර්ගත කිසිදු ඖෂධයක්, බාල කරන ලද ඖෂධයක් ආනයනය කිරීම හෝ විකිණීම නොකළ යුතු අතර කිසිදු තැනැත්තකු විසින් යහපත් නිෂ්පාදන පරිවයන්ට (GMP) අනුකූල නොවන ලෙස කිසිදු ඖෂධයක් නිෂ්පාදනය කිරීම නොකළ යුතුය යන වගන්තියෙන් බැහැරව කටයුතු කර ඇති බව නිරීක්ෂණය කෙරේ.

7.16.1.24 ඒ අනුව 2023 නොවැම්බර් 20 දින වන විට අදාළ සැපයුම්කරු වෙත රුධිර ප්ලාස්මා ලීටර 170.88 ක් රු.2,460,174 ක් අයකරමින් නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර, සැපයුම්කරු විසින් පළමු ඉල්ලීම සිදුකළ දිනට පසුදිනක එනම් 2023 මාර්තු 10 දින රුධිර ප්ලස්මාවලට අමතරව රු.12,000 කට රුධිර පැකට් 06 ක් විධිමත් අනුමැතියකින් තොරව රෝගී ප්‍රතිකාර සිදුනොකරන ඉහත සැපයුම්කාර සමාගම වෙත ලබාදී තිබුණි.

7.16.1.25 සැපයුම්කාර සමාගමේ ලිපි ශීර්ෂවල මෙම සමාගම "විෂබීජ වලින් තොර ඖෂධ හා පර්යේෂණ රසායනික ද්‍රව්‍ය සංවර්ධක, නිෂ්පාදක හා සැපයුම්කරුවකු (Developer, Manufacturer & Supplier of Sterile Pharmaceuticals & Research Chemicals)" ලෙස දක්වා තිබුණි. තවද, සාංගමික ව්‍යවස්ථාවලියට අනුව මෙම සමාගම ඖෂධ නිෂ්පාදනය කිරීමට අදාළ ව්‍යාපාරවල යෙදෙන බව ද දක්වා තිබුණි. එසේම 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ දී මෙම සමාගම විසින් කිරි නිෂ්පාදනයට අදාළ Vacuum Mixer for Milk Manufacturing 200L, Milk Packing Machine, Milk Storage Unit, Milk Storage Tank, Milk Sterilization Tank 200 L, Milk Making Machinery, Centrifuge for food juice industry (Machine for food juice) වැනි අයිතම ආනයනය කර තිබුණු බව ශ්‍රී ලංකා රේගුව වෙතින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය 2023 ඔක්තෝබර් 17 ලබා ගත් තොරතුරු අනුව තහවුරු විය. ජාතික ඖෂධ නියාමන අධිකාරිය

විසින් 2023 අප්‍රේල් 28 දින සිදු කරන ලද GMP පරීක්ෂාවේ දී සමාගම් පරිශ්‍රයේ පිහිටි උපකරණ ඖෂධ නිෂ්පාදනය සඳහා සුදුසු නොවන බවට දක්වා තිබුණු බව විගණනයේදී වැඩිදුරටත් නිරීක්ෂණය විය.

7.16.1.26 ශ්‍රී ලංකා රේගුවට ඉදිරිපත් කර ඇති ව්‍යාපාර ලියාපදිංචි සහතික අනුව හේවගේ සුදත් ජානක ප්‍රනාන්දු නමැත්තාගේ නේවාසික ලිපිනයම සඳහන් Ospelts Life science Production GMBH නමැති සමාගමක්ද පිහිටුවා ඇති අතර එම සමාගම හරහාද ආනයනය කළ අයිතම අතර කිරි නිෂ්පාදනයට අදාළ උපකරණ ආනයනය කර තිබුණු බවත්, මෙම සමාගම් එකිනෙකට සම්බන්ධිත සමාගම් බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

7.16.1.27 2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අවස්ථා 5 ක දී සැපයුම්කරුගේ වැඩබිම පිළිබඳව GMP පරීක්ෂාවන් ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් සිදුකර තිබුණු අතර විවිධ හේතූන් මත එම සමාගම ඖෂධ නිපදවීමට ඉල්ලා තිබුණු අනුමැතිය ලබා දී නොතිබුණි. එසේම 2023 පෙබරවාරි 20 හා 22 යන දිනයන් හිදී අධිකාරිය මෙම වැඩබිම සම්බන්ධයෙන් GMP පරීක්ෂාවක් සිදුකර තිබුණු අතර එහිදීද මෙම වැඩබිම යහපත් නිෂ්පාදන පරිවයන්ට අනුගතව නිෂ්පාදනයන් කරන බවට පිළිගත නොහැකි බවටත්, එන්නත් නිෂ්පාදනයට (Sterile injections) අවසර ලබාදිය නොහැකි බවටත් සැපයුම්කරු වෙත 2023 අප්‍රේල් 28 දින දන්වා තිබුණි. එසේ තිබියදී සැපයුම්කාර සමාගම විසින් ඔවුන්ගේ ලිපිශීර්ෂ හා ලේඛනවල WHO/ FDA/ CANADIAN GMP සහිතව මිනිස් භාවිතය සඳහා සාමාන්‍ය එන්නත් කළ හැකි නිමි ඖෂධ සංයෝග නිෂ්පාදනය කිරීම (manufacturing of generics injectable finished pharmaceuticals formulations for human use – WHO/ FDA/ CANADIAN GMP) හා ප්‍රතිජීවක, ප්‍රතිදේහ, ජෛව රසයනික එන්සයිම, හෝර්මෝන, අකාබනික ද්‍රව්‍ය, ප්‍රතික්‍රියකාරක හා ජෛව තාක්ෂණ (Antibiotics, Antibodies, Bio chemicals anzymes, Hormones, Biotechs) ආදී නිෂ්පාදනයන් සිදු කරන බවටත්, යහපත් නිෂ්පාදන පරිවයන් සහිත විෂබීජ රහිත ඖෂධ නිෂ්පාදන කර්මාන්තශාලාවක් (GMP Sterile Pharmaceutical Production Plant) බවටත්, පිළිකා රෝගීන් සඳහා භාවිතා කරන Carfilzomib, Ponatinib, Trastuzumab හා Rituximab යනාදී පිළිකා ඖෂධ නිෂ්පාදනය කරන බවටත් වංචනික ලෙස කරුණු දක්වා තිබුණි.

7.16.1.28 තත්ත්වය එසේ තිබියදී ජාතික අවශ්‍යතාවයක් සේ සලකා සුදුසු කොන්දේසි යටතේ මූලික අදියරයේදී Salbutamol, Lidocaine, Tramadol යන ඖෂධ අත්හදා බැලීම් සිදු කිරීමට GMP බලපත්‍රයක් නිකුත් කිරීමටත්, නිෂ්පාදනය කිරීමට අනුමැතිය Isolez Biotech Pharma AG Limited වෙත ලබාදීමටත් නිර්දේශ කරමින් හිටපු සෞඛ්‍ය ලේකම් විසින් 2023 ජුනි 05 දිනැති අංක SH/Misc/03/Medi.Equip දරන ලිපියක් මඟින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරී වෙත දැනුම්දී තිබුණි.

7.16.2 Rituximab inj.500mg ඖෂධය

7.16.2.1 වෛද්‍ය සැපයීම් අංශය විසින් 2022 වර්ෂයේදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ඉදිරිපත් කරන ලද Rituximab inj. 500mg ඖෂධයේ ඒකක 11,600 ක ප්‍රධාන ඇණවුම ඒකකයක් එ.ජ.ඩො.59.95 බැගින් ලබා ගැනීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සැපයුම්කරුට ඇණවුම ඉදිරිපත් කර තිබුණි. මෙම ඇණවුමට අදාළ ඒකක 3,500 ක පළමු තොගය 2022 ඔක්තෝබර් 14 දින වෛද්‍ය සැපයීම් අංශයට ලැබී තිබුණු අතර එම තොගය මාස 04 ක් සඳහා ප්‍රමාණවත් වී තිබුණි. මෙම ඇණවුමේ දෙවන තොගය වූ ඒකක 5,076 ක් පළමු තොගය ලැබී මාස 02 කට පසු එනම් 2022 දෙසැම්බර් 15 දිනද , තෙවන තොගය ද පළමු තොගය ලැබී මාස තුනකට ආසන්න කාලයකදී එනම් 2023 ජනවාරි 09 දින ලැබී තිබුණි. එම තොගය ලැබීමත් සමඟ එම ඖෂධය 2023 මුල් මාස 10 ක කාලයක් සඳහා ප්‍රමාණවත් වී තිබුණි. ඒ අනුව ඉහත 6.6.3 ඡේදයෙහි දැක්වෙන පරිදි ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම් විසින් ලබා දී තිබුණු ලැබිය යුතු තොග පිළිබඳ නොසලකා හැරීමේ උපදෙස් මත කටයුතු කිරීම හේතුවෙන් හා එම තොගය ලැබීම පිළිබඳව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් ප්‍රයත්නයක් ද දැරීමකින් තොරව 2022 නොවැම්බර් 10 දින මෙම ඖෂධයේ එක් එන්නතක් එ.ජ.ඩො.152 ක් වැනි ඉහළ මිලක් යටතේ එන්නත් කුප්පි 2,250 ක් ඉහත 7.16.1 හි සඳහන් Human Immunoglobulin IV 5-6g ඖෂධය සපයන ලද Isolez Biotech Pharma AG Ltd සමාගමෙන් හදිසි මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. මෙම තොගය හදිසි මිලදී ගැනීම් යටතේ දින 07 ක් තුළ ලැබිය යුතුව තිබුණු නමුත් මාස 05 ක් ඉක්මවා යන තෙක් සපයා නොතිබුණි. ඒ අනුව මෙම ඖෂධය සාමාන්‍ය ඇණවුම් මිලට වඩා සියයට 254 ක ඉහළ මිලකට හදිසි මිලදී ගැනීම් යටතේ සම්පාදනය කර ගැනීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙම අනාර්ථික ගනුදෙනුව මඟින් රජයට දැරීමට සිදුවී ඇති පාඩුව ආසන්න වශයෙන් රු.65,350,342 ක් (එ.ජ.ඩො.92.05*2200* 322.7) බවත්, ඒ අනුව ගුණත්වය, ආරක්ෂාව හා ප්‍රත්‍යක්ෂභාවය තහවුරු නොකරන ලද ඖෂධයක් මෙරටට ගෙන්වීම සඳහා පිටුබලයක් සපයා ඇති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

7.16.2.2 සැපයුම්කරු විසින් Rituximab එන්නත් තොගය සැපයීමේදී ද වංචනික ලෙස WOR සහතිකයක් සහ ඉන්දියාවේ නිෂ්පාදකගේ නම ඇතුළත් කරමින් ලේඛන ඉදිරිපත් කර තිබුණු බවත්, ඉහත අංක 7.16.1.6 යටතේ සඳහන් පරිදිම හදිසි මිලදී ගැනීම සඳහා අභිලාෂ කැඳවීමේදී මෙම ඖෂධය ද ඉන්දියානු ඖෂධයක් බවත් (Indian origin), නිෂ්පාදක ඉන්දියාවේ Livealth Bio pharma බවත්, වැඩකරන දින 01 ත් 05ත් අතර සියයට සියයම ආනයනය කර සැපයිය හැකි බවට දක්වා තිබුණු නමුත් ලංසු ලේඛනයේ පහළ කොටසේ අමුද්‍රව්‍ය ඉන්දියාවේ Livealth Bio Pharma Pvt Ltd බවටත්, නිෂ්පාදන සූත්‍රය (Product formulated) හා කොන්ත්‍රාත් නිෂ්පාදනය හා අලෙවි කිරීම (Contact Manufacturing & Market) Isolez Biotech Pharma AG Ltd බවට දක්වා තිබීම පිළිබඳව EOI ඇගයීම් කමිටුව විසින් අවධානයට යොමු කර නොතිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය. ඇගයීම් කමිටුවට කිසිදු තාක්ෂණික ප්‍රවීණයකු හෝ විශේෂඥ වෛද්‍යවරයකු

පත්කර නොතිබුණු බවත්, මෙම අභිලාෂ කැඳවීමේ ක්‍රියාවලිය භාරව කටයුතු කළ අතිරේක ලේකම්ගේ උපදෙස් අනුව මිල හා තොග ලබාදීමේ කාලසටහන් පිළිබඳව පමණක් නිරීක්ෂණය කර ඇති බවත් විගණනයේදී වැඩිදුරටත් නිරීක්ෂණය විය.

7.16.2.3 Human Immunoglobulin ඖෂධය මිලදී ගැනීමට අදාළව ඉහත සඳහන් නිරීක්ෂණ අංක 7.16.1.5 සිට 7.16.1.8 දක්වා සහ 7.16.1.10 සිට 7.16.1.15 දක්වා ඡේදවල සඳහන් කරුණු මෙම ඖෂධය යටතේද නිරීක්ෂණය කෙරේ.

7.16.3 මේ ආකාරයටම Irinotecan hydrochloride trihydrate නමැති ඖෂධයට අදාළ ලංසු ලියවිලි තුළද පෙර සඳහන් කරන ලද අංක 7.16.1.6 පරිදි ඉන්දියානු නිෂ්පාදකගේ නිෂ්පාදනයක් බවටත්, එම නිෂ්පාදකගේ නම සඳහන් ඖෂධ විශ්ලේෂණ සහතික ව්‍යාජ ලෙස ඉදිරිපත් කර ඇති බවත් විගණනයේදී නිරීක්ෂණය විය. මෙම අවිධිමත් ක්‍රමවේද හරහා යමින් Irinotecan hydrochloride trihydrate පිළිකා නාශක ඖෂධය සඳහා ඇණවුමක් ලබා දුන්නද සැපයුම්කරු විසින් ඊට අදාළ තොග ලබාදී නොතිබුණු අතර පිළිකා, අක්ෂි රෝග සහ හිමෝෆීලියා රෝගීන් සඳහා භාවිතා කරන තවත් ඖෂධ 03ක් ලියාපදිංචියෙන් නිදහස් කිරීම යටතේ මිලදී ගැනීමට EOI ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබුණු බව නිරීක්ෂණය විය. මෙම අයිතම 03ට අදාළව හදිසි මිලදී ගැනීම් යටතේ අභිලාෂ කැඳවීමේදීද සැපයුම්කාර සමාගම විසින් ඉහත සඳහන් පරිදිම මෙම ඖෂධද ඉන්දියානු ඖෂධයක් බවත් (Indian origin), නිෂ්පාදක ඉන්දියාවේ Livealth Bio pharmaceuticals බවත්, වැඩකරන දින 01 ත් 05ත් අතර සියයට සියයම ආනයනය කර සැපයිය හැකි බවට දක්වා තිබුණු නමුත් ලංසු ලේඛනයේ පහළින් අමුද්‍රව්‍ය ඉන්දියාවේ Livealth Bio Pharma Pvt Ltd බවටත්, නිෂ්පාදන සූත්‍රය (Product formulated) හා කොන්ත්‍රාත් නිෂ්පාදනය හා අලෙවි කිරීම (Contact Manufacturing & Market) Isolez Biotech Pharma AG Ltd බවට දක්වා තිබුණු බවත් ඒ පිළිබඳව EOI ඇගයීම් කමිටුව විසින් අවධානයට ලක්කර නොතිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

7.16.4 මෙම අයිතම 03 ට මෙතෙක් ඇණවුම් නිකුත් නොකළද ඉන් Docetaxel හා Fluorescein sodium යන අයිතම 02 ට අදාළව සමාගම විසින් ඉදිරිපත් කර තිබුණු ලංසු ලියවිලි සමඟ ඉන්දියාවේ නිෂ්පාදකගේ යැයි නම සඳහන් ඖෂධයේ විශ්ලේෂණ සහතිකද (COA) ඉදිරිපත් කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. විගණනය විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරියට සිදුකළ දැනුම් දීමකට අනුව සිදුකළ පරීක්ෂාවේදී, කිසිදු අවස්ථාවක ඔවුන් විසින් ලංකාවට ඖෂධ සපයා නොමැති බවත්, Isolez Biotech Pharma හෝ එහි ප්‍රවර්ධකයකු නොදන්නා බවත්, එවැනි අයකු සමඟ කිසිදු ගනුදෙනුවක් නොමැති බවටත් ඉන්දියාවේ නිෂ්පාදන සමාගම විසින් තහවුරු කර තිබුණු අතර වංචනික ලෙස තම සමාගමේ නම භාවිතා කර ඇති සියළුම නිෂ්පාදනයන්හි ලියාපදිංචිය අවලංගු කරන ලෙසට දැනුම් දී ඇති බවත් නිරීක්ෂණය විය.

7.16.5 ඒ අනුව සැපයුම්කරු විසින් අවස්ථා දෙකකදී වෛද්‍ය සැපයීම් අංශය වෙත ඉදිරිපත් කළ WOR සහතික 02 සැපයුම්කරු විසින් ව්‍යාජව සකස් කරගත් එකක්ද නැතහොත් ඖෂධ අධිකාරිය විසින් වංචනික ලෙස සැපයූවක්ද යන්න පිළිබඳවත්, ලංසු ලියවිලි තුළ ආනයනය කර සපයන බවට දක්වමින් දේශීයව නිෂ්පාදනය කිරීම හා විකිණීම පිළිබඳවත්, ව්‍යාජ ලෙස ඉන්දියාවේ නිෂ්පාදකගේ නම භාවිතා කිරීමත්, ලංසු ලියවිලි සමඟ ඉන්දියාවේ නිෂ්පාදකගේ නමින් ව්‍යාජ විශ්ලේෂණ සහතික 05 ක් ඉදිරිපත් කිරීම පිළිබඳවත් සැපයුම්කරු සම්බන්ධයෙන් අපරාධමය කාරණා නිරීක්ෂණය වන බැවින් මේ සම්බන්ධව අධිකරණ ක්‍රියාවලියක් තුළින් ඉදිරි කටයුතු කිරීම වඩාත් යෝග්‍ය බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

7.16.6 ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 124 හා 125 වගන්ති ප්‍රකාරව පනතේ කාර්යයන් සඳහා බලයලත් නිලධාරියකු ලෙස පළාත්/ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයකු, සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු, ප්‍රාදේශීය ඖෂධවේදියකු හෝ ආහාර සහ ඖෂධ පරීක්ෂකවරයකු පත් කළ හැකි අතර, යම් භාණ්ඩයක් නිෂ්පාදනය කරන ඕනෑම ස්ථානයකට ඇතුළු වී එය පරීක්ෂා කිරීමට බලතල එම නිලධාරීන් වෙත ලබා දී තිබුණි. එහෙත් ඉහත සැපයුම්කරුගේ නිෂ්පාදන ආයතනය GMP තත්ත්ව පරීක්ෂාව අසමත් වූ පසුව එහි අනීතික ලෙස ඖෂධ නිෂ්පාදනය කිරීමේ අවධානමක් හඳුනාගෙන ඒ පිළිබඳව පසුවිපරම් කිරීමේ යාන්ත්‍රණයක් දියත් කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. අධිකාරියේ හදිසි වැටලීම් අංශයේ ඖෂධ පරීක්ෂකවරුන්ට මෙවැනි නිෂ්පාදනාගාර අඛණ්ඩව පරීක්ෂා කිරීමට, පසු විපරම් කිරීමට දැනුවත් නොකිරීමත්, බලයලත් නිලධාරීන් පළාත් හෝ ප්‍රාදේශීය බලයලත් නිලධාරීන්ගේ සහයෝගයෙන් එවැනි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොකිරීමත් හේතුවෙන් මෙවැනි විෂමචාරී සමාගම්වලට ව්‍යාජ ඖෂධ නිෂ්පාදනය කිරීමට හැකිවන ආකාරයේ හිඳැස් සැලසී ඇති බව නිරීක්ෂණය විය.

7.16.7 2023 නොවැම්බර් 13 දින වන විට රෝහල් වෙත නිකුත් කර තිබුණු Human Immunoglobulin ඖෂධ කුප්පි 3,985 ක තොගයෙන් විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව කුප්පි 1,732 ක් රෝහල්වල ඉතිරිව පවතින බවත්, 2,253 ක ප්‍රමාණයක් (සියයට 57 ක්) රෝගීන් වෙත නිකුත් කර ඇති බවත් නිරීක්ෂණය විය. ඉන් රෝහල් 28කින් ලද තොරතුරු අනුව මෙම ඖෂධය රෝගීන් 87 දෙනෙකු වෙත ලබාදී තිබුණු අතර රෝගීන් 09 දෙනෙකුට අසංරක්ෂිත තත්ත්වයන් (Anaphylaxis Reaction) හා බරපතල අහිතකර ප්‍රතික්‍රියා (Adverse Drug Reaction - ADR) ඇතිවී ඇති බවත් නිරීක්ෂණය විය. එසේම Rituximab ඖෂධයේ එන්නත් කුප්පි 104 ක් රෝගීන්ට නිකුත් කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් රෝහල් කිහිපයකින් පමණක් මෙතෙක් තොරතුරු ඉදිරිපත් කර තිබුණු බවත් එම තොරතුරු අනුව රෝගීන්ට බරපතල අහිතකර ප්‍රතික්‍රියා වාර්තා වී නොමැති බවත් නිරීක්ෂණය විය.

7.16.8 රුධිර ප්ලස්මා භාවිතයෙන් නිෂ්පාදනය කරන ඖෂධයක් වන Human Immunoglobulin ඖෂධය සම්මත තත්ත්ව පාලනයන් යටතේ නිෂ්පාදනය නොවුනහොත් HIV/AIDS, හෙපටයිටිස් B හා

හෙපටයිටිස් C ආදී ආසාධිත තත්ත්වයන්ට රෝගීන්ට මුහුණ පෑමට සිදුවන බවට විශේෂඥ වෛද්‍යවරු විසින් මත පළ කරන බැවින් අදාළ රෝගීන් සියළු දෙනා විශේෂ සායනයකට යොමුකර පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියක් හරහා එම රෝගීන්ගේ සායනික තත්ත්වය අඛණ්ඩව පසුවිපරම් කිරීමට කටයුතු කර නොතිබුණි.

7.16.9 2015 වර්ෂයේ සිට වෛද්‍ය සැපයීම් අංශය වෙත වෛද්‍ය සැපයීම් සැපයූ පැරණි සැපයුම්කරුවකු වන මෙම සමාගම 2017 ඔක්තෝබර් 02 දින සිට සමාගමක් බවට පරිවර්තනය කර ඇතත් වෛද්‍ය සැපයීම් අංශයේ ඖෂධ කළමනාකරණය සඳහා භාවිතා කළ PRONTO පරිගණක පද්ධතිය තුළ එම තොරතුරු සංශෝධනය කර නොමැති බවත්, මේ දක්වාම Isolez Biotech Pharma AG නමින් PRONTO පද්ධතිය තුළ ඇතුළත් කර ඇති බවත් නිරීක්ෂණය විය. මෙම හදිසි මිලදී ගැනීම් ඇණවුම්වලදී සැපයුම්කාර සමාගම විසින් ලංසු ලියවිලි තුළ පැහැදිලිව Isolez Biotech Pharma AG Ltd සමාගමට ගෙවීම් කිරීමට දැනුම් දී තිබුණ ද, නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම හේතුවෙන් මෙම සමාගමට අදාළ සියලු ගෙවීම් Isolez Biotech Pharma AG යන නාමය සහිත ගිණුමකට සිදුකර තිබුණි. මුදල් රෙගුලාසි 257 හා 260 ප්‍රකාරව වවුචර සහතික කිරීමේ අධිකාරියලත් නිලධාරියකු විසින් ගෙවීම් සඳහා භාර ගන්නා වවුචර නිසි පරිදි සහතික කර ඇති බවට සෑහීමකට පත්විය යුතු අතර අදාළ නොවන තැනැත්තන් වෙත මුදල් ගෙවීමක් සිදු නොවීම සඳහා සියලු ආරක්ෂක විධිවිධාන යොදා ගත වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර අභ්‍යන්තර පාලන ක්‍රියාවලියද ඉතා දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

7.16.10 සැපයුම්කාර සමාගමට ගෙවීම් කිරීමේ දී සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් අවස්ථා 03කදී සැපයුම්කරුට ප්‍රමුඛතාවය ලබා දී ගෙවීම් කිරීමට උපදෙස් ලබා දී ඇති බවත්, සැපයුම්කරු විසින් රුධිර ප්ලස්මා ලබා ගැනීමේදීත්, GMP ප්‍රතික්ෂේප වූ අවස්ථාවේදීත්, ගෙවීම් සඳහා ඉල්ලීම් සිදු කිරීමේදීත් සැපයුම්කරුට වාසිදායක වන පරිදි නිර්දේශ ලබා දෙමින් කටයුතු කිරීම හේතුවෙන් සෞඛ්‍ය ලේකම් විසින් අසාමාන්‍ය මැදිහත් වීමක් සිදුකර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

7.16.11 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ VII වන කොටසේ 38(1) (ආ) සහ (ඇ) උපවගන්ති ප්‍රකාරව විගණනය කරනු ලබන අස්ථිත්වයක මූල්‍ය සැලසුම්කරණය, මූල්‍ය කළමණාකරනය සඵලදායී ලෙස සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සහතික විය යුතු අතර මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවටද සහතික විය යුතු වේ. එසේම එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වුවද ඉන් බැහැරව කටයුතු කිරීම හේතුවෙන් ඉහත ගැටළු පැන නැගී ඇති බවද විගණනයේදී නිරීක්ෂණය විය.

7.16.12 ඖෂධ රෝහල්වලට බෙදාහැරීමට පෙර ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන ලෙසට වර්ෂ 06කට වැඩි කාලයක සිට විගණනය විසින් කළමනාකරණය වෙත දැනුම් දුන්නද මෙතෙක් ඒ සඳහා ප්‍රමාණවත් පියවර නොගැනීම හේතුවෙන් තත්ත්වයෙන් අසමත් ඖෂධ රෝගීන්ට නිකුත් කිරීම අවම කිරීමට මේ දක්වාම නොහැකි වී තිබුණි.

7.17 PharmAce නමැති සමාගම විසින් 2022 වර්ෂයේ දී Trastuzumab 440mg යන ඖෂධය සහ ඊට පෙර Ipratropium Pressurized Inhalation, Cefotaxime injection USP 1g, Ceftriaxone Sodium for Injection BP 500mg හා Furosemide Injection BP 20 mg/2 ml යන ඖෂධ වංචනික ආකාරයට වෛද්‍ය සැපයීම් අංශයට සැපයීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු

7.17.1 **Trastuzumab 440mg** එන්නත් ඒකක 500 ක් මිලදී ගැනීම සඳහා 2022 ජූලි 15 දින අමාත්‍යාංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් විවෘත මිල ගණන් කැඳවා තිබුණු අතර 2022 අගෝස්තු 16 රැස්වූ අමාත්‍යාංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් මේ සඳහා අවම මිල ඉදිරිපත් කර තිබුණු ආයතනයට එන්නත් 500 ක් මිලදී ගැනීම සඳහා රු 26,225,000 කට ඇණවුම ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

7.17.1.1 තෝරාගෙන තිබුණු ලංසුකරු විසින් ලංසුව සමඟ ඉදිරිපත් කර තිබුණු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය එම ආයතනය වෙනුවෙන් නිකුත් කරන ලද සහතිකයක් නොවූ අතර එම ලියාපදිංචි සහතිකය වෙනත් සමාගමක් වෙත ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත් කළ ලියාපදිංචි සහතිකයක් විය. මෙම සහතිකයද මාස 29 කට පමණ පෙර සිට එනම් 2020 පෙබරවාරි මස 17 දින කල් ඉකුත් වී තිබුණු සහතිකයක් විය. තාක්ෂණික ඇගයීම් කමිටුව 2022 ජූලි 29 දින ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ වලංගු ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් කිරීමට යටත්ව පමණක් මෙම ආයතනයට ඇණවුම පිරිනැමීමට නිර්දේශ කර තිබුණද ඒ පිළිබඳ නොසලකා එලෙස වලංගු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකයක් ලබාගැනීමකින් තොරව මෙම ප්‍රසම්පාදනය අදාළ ලංසුකරු වෙත පිරිනැමීමට 2022 අගෝස්තු 16 දින අමාත්‍යාංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි.

7.17.1.2 ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති ඇමතූ 2021 අප්‍රේල් 24 දිනැති ලිපිය මඟින් මෙම සමාගමේන් සහ එහි පරිපාලිතයන්ගෙන් සිදු කරනු ලබන සියළු මිලදී ගැනීම් නැවත දැනුම්දෙන තුරු තාවකාලිකව නතර කරන ලෙස දැනුම් දී තිබිණි. එසේ වුවද මෙම ප්‍රසම්පාදනයට අදාළව මෙම ඖෂධයේ රුසියානු නිෂ්පාදන ආයතනය විසින් 2022 ජූලි මස 20 දින සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත තම ආයතනයේ ශ්‍රී ලාංකීය නිළ නියෝජිතයා ලෙස පෞද්ගලික ආයතනයක් පත්කර ඇති බවත් තම ආයතනය වෙනුවෙන් අලෙවිය සහ ටෙන්ඩර් සඳහා සහභාගි

වීමට තවත් දේශීය ආයතනයක් වෙත අධිකාරිය පවරනු ලබන බවත් දන්වා තිබුණි. නිෂ්පාදකයා විසින් තම ශ්‍රී ලාංකීය නියෝජිතයා වශයෙන් පත් කර තිබුණු ආයතනය මීට පෙර ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ලියාපදිංචි වීම් තාවකාලිකව තහනම් කර තිබුණු සමාගමක නව ලියාපදිංචි නාමය විය. එහෙත් මෙම ප්‍රසම්පාදනයේදී යථෝක්ත කරුණු පිළිබඳව සැලකිල්ලක් නොදක්වා ප්‍රසම්පාදන කමිටු තීරණ ලබා දී තිබුණි.

7.17.1.3 ලංසු කොන්දේසි අනුව නිෂ්පාදනයේ ජීව කාලය වසර 02 ක් විය යුතු වුවද, මෙම ලංසුකරු ඉදිරිපත් කරන ලද තොගයේ ජීව කාලය මාස 07 වූ අතර මේ අනුව ඇණවුම ප්‍රදානය කරන දින සිට ඖෂධය භාවිතයට ඉතිරිව තිබුනේ මාස 7 ක් පමණක් විය. ඒ අනුව මතභේදයට තුඩු දී තිබුණු දේශීය නියෝජිත ආයතනය විසින් මීට පෙර මෙරටට ගෙන්වා ඉතිරිව තිබුණු තොගයක් මෙලෙස වෛද්‍ය සැපයීම් අංශයට ඉදිරිපත් කර නොමැති බවට තහවුරු කර ගැනීමට ප්‍රසම්පාදන අස්ථිත්වය කටයුතු කර නොතිබුණි.

7.17.1.4 මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන කමිටු තීරණය 2022 අගෝස්තු 16 වන දින ලබා දී තිබුණු අතර මේ අනුව රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව විසින් 2022 අගෝස්තු 25 දින ගැණුම් ඇණවුම නිකුත් කර තිබුණි. නමුත් මෙම ගැණුම් ඇණවුම නිකුත් කිරීමටත් පෙර එනම් 2022 අගෝස්තු 17 දින වන විට වෛද්‍ය සැපයුම් අංශය වෙත අදාළ ඖෂධ තොගය භාර දී තිබුණි.

7.17.1.5 මීට පෙරද වෛද්‍ය සැපයීම් අංශය වෙනුවෙන් මෙම ඖෂධය මිලදී ගැනීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් 2016 වර්ෂයේදී ලියාපදිංචි සහතිකය ලබාදීම සඳහා ඖෂධ ඇගයීම් කමිටුවේ නිර්දේශය ලැබීමට පෙර ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරී විසින් ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීමත්, ඊට අදාළ නඩු කටයුත්තක් සඳහා අධිකාරිය විසින් මෙම ඖෂධයට අනුමැතිය ලැබී ඇති බවට අධිකරණයට අසත්‍ය තොරතුරු සැපයීමත් සම්බන්ධයෙන් නඩුවට ඉදිරිපත් කිරීමට සකස් කරන ලද ලිපිගොනු සියල්ල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දීමට හා ඒ පිළිබඳ ප්‍රගතිය කාරක සභාවට වාර්තා කිරීමට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් (COPE) විසින් සෞඛ්‍ය ලේකම්ට 2017 ජූලි 07 දින නියෝග කර තිබුණද වර්ෂ 05 ක් ගතවී ඇතත් ඒ පිළිබඳව පසුවිපරම් කර නොතිබුණි.

7.17.2 වෛද්‍ය සැපයීම් අංශය විසින් 2016 අප්‍රේල් 01 දින ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු පිරිවැය රු.58,988,800 ක්වූ ගැණුම් ඇණවුමට අනුව **Ipratropium Pressurized Inhalation BP 20 Mcg/Puff** ඖෂධයෙන් ඒකක 130,000 ක් රු. 91,702,000 කට මිලදී ගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

7.17.2.1 මෙම ප්‍රසම්පාදනයට අදාළව අවස්ථා තුනකදී ලංසු කැඳවීම් සිදුකර තිබුණු අතර පළමු අවස්ථාවේදී සැපයුම්කරු වෙත ඉන්ඩෙන්ටුව නිකුත් කර ණයවර ලිපි විවෘත කර තිබියදී වෛද්‍ය සැපයුම් අංශයේ අධ්‍යක්ෂකගේ දැනුම් දීමකට අනුව ගැණුම් අධියාචනාවට අනුව 2017 ජනවාරි 03 දින සපයන ලෙස දක්වා තිබුණු පළමු තොගය මාස 09 ක් හා 2017 මැයි 02 දින සැපයිය යුතු බව දක්වා තිබුණු දෙවන තොගය මාස 13 ක් ප්‍රමාදව සැපයීම කරන ලෙස දැනුම් දී තිබුණි. නමුත් අදාළ සැපයුම ප්‍රමාදකළ නොහැකි බව සැපයුම්කරු 2017 ජනවාරි 20 දින දන්වා තිබුණි. සැපයුම්කරු ඖෂධ සැපයීමට එකඟ වූ දිනට පසුව නිෂ්පාදන ක්‍රියාවලියේ ඇතිවූ කාර්මික දෝෂයක් හේතුවෙන් ඖෂධ සැපයිය නොහැකි බව 2017 අප්‍රේල් 03 දින දැනුම් දී තිබුණි. වෛද්‍ය සැපයීම් අංශය විසින් ඉදිරිපත් කරන ලද ඖෂධ සැපයීමේ කොන්දේසි වලට අනුව මෙම ප්‍රසම්පාදනය හදිසි කටයුත්තක් ලෙස සීමිත ලංසු කැඳවා හැකි ඉක්මනින් ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු බව දන්වා තිබුණද පසුව මෙම ඖෂධය මාස 09 ක් ප්‍රමාද කර ලබාදෙන ලෙස දන්වා සිටීම තුළ මෙම සැපයුම සත්‍ය ලෙසම හදිසි අවශ්‍යතාවයක් නොවන බව නිරීක්ෂණය විය.

7.17.2.2 මෙම ප්‍රසම්පාදනයට අදාළව තුන්වන ලංසු කැඳවූ අවස්ථාවේදි ලංසු ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය කල් ඉකුත් වී තිබුණද ලියාපදිංචි සහතිකය නැවත ලබාගැනීමේ හා 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ ලියාපදිංචි සහතිකය ලබාගැනීමේ කොන්දේසි වලට යටත්ව ප්‍රසම්පාදන කමිටුව විසින් 2017 සැප්තැම්බර් 29 දින ඒකකයක් රු.705.40 ක් බැගින් ඒකක 130,000 ක් සඳහා රු. 91,702,000 කට ඇණවුම ප්‍රදානය කර තිබුණද ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කර තිබුණු ඉන්වොයිසිවලට අනුව සැපයුම්කරු විසින් ඖෂධ ඒකකයක් රු.14.13 බැගින් ඒකක 130,000 ක් රු. 1,836,900 කට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි නොවුනු සමාගමකින් මෙරටට ආනයනය කර සියයට 4892 ක වැඩි මිලකට වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයා තිබුණි. සැපයුම්කරු විසින් නිෂ්පාදිත ඖෂධ ආනයනය කර තිබුණේ ලංසු ලේඛනවල සඳහන් නොවන නිෂ්පාදන සමාගමක් මගිනි. එමෙන්ම ලියාපදිංචි නොවුණු සමාගමක ඖෂධ රේගුවෙන් නිදහස් කිරීමේදි නියමිත නීති රීති හා පටිපාටිවලට අනුව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

7.17.2.3 සැපයුම්කරු වෙත 2017 ඔක්තෝම්බර් 20 ගැණුම් ඇණවුම නිකුත් කර තිබුණද වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සැපයීමට පෙර එම ඖෂධවල ඇසුරුම, ලේබලය හා රාජ්‍ය ලාංඡනය සඳහා වෛද්‍ය සැපයුම් අංශයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් ඒම තොරතුරු වෛද්‍ය සැපයීම් අංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම ඇණවුමට අදාළ පළමු තොගය (ඒකක 65000) ආනයනය කළ දින සිට වෛද්‍ය සැපයීම් අංශය වෙත සැපයීම සඳහා මසකට වඩා වැඩි කාලයක් ගත කර තිබුණි.

7.17.2.4 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 106(1) වගන්තියට පටහැනිව සැපයුම්කරු විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ආනයනය කරන ලද මෙම ඖෂධය ලංසු ලේඛනවල සඳහන් නිෂ්පාදකයාගෙන් තොරව වෙනත් නිෂ්පාදකයෙකු මඟින් මෙරටට ආනයනය කර පසුව ඖෂධ ඇසුරුම්වල, ලංසු ලේඛනවල සඳහන් නිෂ්පාදකයාගේ විස්තර නීති විරෝධීව මුද්‍රණය කර තිබුණි.

7.17.2.5 සැපයුම්කරු විසින් ආනයනය කරන ලද ඖෂධය ලියාපදිංචි කිරීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද ලිපිගොණුවේ ඇතුළත් ඖෂධයේ ආදර්ශ ඇසුරුම් සහ වෛද්‍ය සැපයුම් අංශය වෙත ලබා දී තිබුණු ඖෂධයේ ඇසුරුම් තුළ පැවති රෝගී උපදෙස් පත්‍රිකාවේ ඇතුළත් තොරතුරු හා සපයන ලද ඖෂධවල ලේබලයේ ඇතුළත් තොරතුරු අතර හා සැපයුම්කරු විසින් ලංසු ලියවිලි සමඟ රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව වෙත නිෂ්පාදිත සමාගමේ ලිපි ශීර්ෂ යටතේ ඉදිරිපත් කර තිබුණු දේශීය නියෝජිතයා පිළිබඳ ප්‍රකාශ, අනුකූලතා ලිපි හා අදාළ ඖෂධයේ විශ්ලේෂණ සහතික අතර මෙන්ම ඉදිරිපත් කරන ලද එකී ලිපි ශීර්ෂවල ද නොසැසඳීම් නිරීක්ෂණය විය.

7.17.2.6 සැපයුම්කරු විසින් ආනයනය කර වෛද්‍ය සැපයීම් අංශය වෙත ඖෂධය සැපයීමට පෙර එම ඖෂධයේ නියැදි (Sample) වෛද්‍ය සැපයීම් අංශය විසින් අනුමත කළ බව සැපයුම්කරුගේ ඉන්වොයිසියේ සඳහන් කර තිබුණද, ඇසුරුමේ වෙනස්කම් එම අවස්ථාවේදී හඳුනාගෙන නොතිබුණු බැවින් සත්‍ය වශයෙන්ම මෙම ඖෂධයේ නියැදි වෛද්‍ය සැපයීම් අංශය විසින් නිසි පරීක්ෂාවට ලක් කර නොමැති බව නිරීක්ෂණය විය.

7.17.2.7 මෙම ප්‍රසම්පාදනය හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා ලංසු ඉදිරිපත් කිරීමට දින 09 ක් වැනි කෙටිකාලයක් ලබාදී තිබුණද, ගිවිසුම් ප්‍රකාරව සැපයුම්කරු විසින් තොග සැපයීම සඳහා එකඟ වූ දිනයන්ට වඩා මාස 5 සිට මාස 8 ක් දක්වා වූ කාල ප්‍රමාදයන් සහිතව තොග සපයා තිබුණි. නමුත් මෙම ප්‍රමාදයන් සඳහා ගිවිසුමේ 10 වන වගන්තිය ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, හදිසි අවශ්‍යතාවයක් ලෙස හුවා දක්වා මෙම සැපයුම්කරුට වාසි සහගත වන ලෙස කටයුතු කර තිබුණේද යන සැකය විගණනයේදී බැහැර කළ නොහැක.

7.17.3 වෛද්‍ය සැපයීම් අංශය විසින් 2016 පෙබරවාරි 16 දින නිකුත් කරන ලද ඇස්තමේන්තු පිරිවැය රු.43,070,000 ක් වූ **Cefotaxime injection USP** 1g කුප්පි 1,000,000 ක් මිලදි ගැනීමට අදාළ ඇණවුමට අනුව රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව විසින් 2016 මාර්තු 15 දින ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවා තිබුණි. 2016 ජූලි 25 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයට අනුව වලංගු ලියාපදිංචි සහතිකයක් සහිත අවම ලංසුකරු වෙත එක් කුප්පියක් එ.ජ. ඩොලර් 0.252 බැගින් එන්නත් කුප්පි 1,000,000 ක් සඳහා එ.ජ. ඩොලර් 252,000 කට ඇණවුම ප්‍රදානය කිරීමට 2016 සැප්තැම්බර් 06 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර

තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

7.17.3.1 වෛද්‍ය සැපයීම් අංශයේ 2017 මාර්තු 14 දිනැති ලිපිය ප්‍රකාරව ඖෂධයේ ඉල්ලුම සියයට 59 කින් අඩුවීම හේතුවෙන් ඇණවුම අවලංගු කර තිබුණි. නමුත් වසරකට පමණ පසු එනම් 2018 අප්‍රේල් 19 දින මෙම ඖෂධයේ අතැති තොගය ශූන්‍ය වී ඇති බැවින් ඖෂධ තොග අවශ්‍ය බව නැවත දැන්වීම මත 2016 දී තෝරාගත් ලංසුකරු වෙත ලංසුවේ වලංගු කාලය ඉක්ම වී වර්ෂ 1 ½ කින් පසුව එනම් 2018 මැයි 23 දින ලංසු පිරිනැමීමේ ලිපිය නිකුත් කර තිබුණ ද ඒ වන විට ඔහුගේ ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය කල් ඉකුත් වී තිබුණි. නැවත ලියාපදිංචි කිරීමේ සහතිකය ලබා ගැනීම සඳහා අවශ්‍ය සාම්පල් සහ අතිරේක තොරතුරු අදාළ ආයතන වෙත භාර දී තිබුණ ද කල් ඉකුත් වූ ලියාපදිංචි සහතිකයේ පිටුපස එන්නත් ඒකක 1,000,000 ක් සඳහා සහතිකය වලංගු බව 2019 අගෝස්තු 01 දින සඳහන් කර තිබුණු බැවින් ඒකක 729,600 ක් නිදහස් කර ගැනීමට ආනයන පාලන දෙපාර්තමේන්තුවට අවසර ලබා දී තිබුණි. එන්නත් ඒකක 770,400 ක් නිදහස් කර ගැනීමට අධිකාරිය විසින් 2020 ජනවාරි 07 හා 2020 මාර්තු 17 දින විරෝධතා නොදැක්වීමේ ලිපි නිකුත් කර තිබුණ ද අදාළ ලියාපදිංචි සහතිකය නිකුත් කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

7.17.3.2 වෛද්‍ය සැපයුම් අංශය විසින් ඖෂධයේ ඉල්ලුම නිවැරදිව පුරෝකථනය කිරීමට හා ලැබීමට නියමිත ඇණවුම් පිළිබඳ අවධානය යොමු නොකර මුළු ප්‍රසම්පාදනයට අදාළව ඖෂධ සැපයිය යුතු කාලයන් අවස්ථා 05 කදී වරින් වර සංශෝධනය කර තිබුණු අතර 2019 ජනවාරි 29 දින ඇණවුම් ප්‍රමාණය සියයට 50 කින් වැඩිකර තිබුණි. ඇණවුමට අදාළ එන්නත් කුප්පි පළමු තොගයට අදාළ එන්නත් කුප්පි 364,800 ක් 2019 පෙබරවාරි 14 දින ද, දෙවන තොගය ඒකක 364,800 ක් 2019 ඔක්තොම්බර් 07 දින ද, තුන්වන තොගය ඒකක 270,400 ක් 2020 ජනවාරි 07 හා ඒකක 500,000 ක් 2020 අප්‍රේල් 22 ලැබී තිබුණි. මෙසේ ඖෂධ තොග ලැබීමට නියමිතව තිබියදී ප්‍රධාන ඇණවුම ප්‍රමාද වීම මත තවත් එන්නත් කුප්පි 250,000 ක් දින 04 ක් ඇතුළත වෛද්‍ය සැපයීම් අංශය වෙත අවශ්‍ය බව දන්වමින් දේශීය වශයෙන් මිල දී ගැනීම සඳහා 2019 මැයි 30 දිනැති ඇණවුම රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව වෙත 2019 ජූනි 03 දින ඉදිරිපත් කර තිබුණ ද වෛද්‍ය සැපයුම් අංශය විසින් වරින් වර සැපයුම් කාලසටහන සම්බන්ධයෙන් සිදුකරන ලද අසාමාන්‍ය සංශෝධනයන් හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු නියමිත කාලසීමාවන් තුළ දී ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

7.17.3.3 වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය මත එන්නත් කුප්පි 250,000 ක් දේශීයව මිලදී ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ඒකකයක් සඳහා රු. 70.70 ක අවම මිල ඉදිරිපත් කරන ලද ලංසුකරුගේ සැපයීම් කාලය දීර්ඝ බව සඳහන් කරමින් මෙම ඇණවුම අවලංගු කර නැවත ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. ඒ අනුව එක් දිනකටත් අඩු කාලයක් ලංසු

ඉදිරිපත් කිරීම සඳහා ලබාදී සිදුකර තිබුණු මිල කැඳවීමකට අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය සහිත ලංසුකරු ඉදිරිපත් කරන ලද රු. 540 ක ඒකක මිල අනුව ප්‍රසම්පාදන වටිනාකම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සීමාව ඉක්මවන බැවින් ලංසුකරු සමග මිල සාකච්ජා කර (එන්නත් 65,000 නොමිලේ සැපයීම මත) එන්නතක ඵලදායී මිල රු.399.60 ක් ලෙස රු.99,900,000 ක මුළු වටිනාකමකට මිලදී ගැනීමට එකඟ වී තිබුණි. එන්නත් කුප්පියක ඇස්තමේන්තු ගත මිල රු. 45.71 ක් ද පළමුව තෝරාගත් සැපයුම්කරුගේ ඒකකයක මිල රු. 70.70 ක් ද වූයෙන් තෝරාගත් සැපයුම්කරුගේ මිලෙහි පිළිවෙලින් සියයට 774 ක හා සියයට 465 ක වැඩිවීමක් පැවතුණි. දෙවන අවස්ථාවේ තෝරාගත් ලංසුකරු පළමු අවස්ථාවේදී රු.255 ක ඒකක මිලක් ඉදිරිපත් කර තිබුණු අතර මාස 2 කට වඩා අඩු කාලයකදී දෙවන වර ලංසු කැඳවීමේදී රු. 540 ක ඒකක මිලක් ඉදිරිපත් කර තිබීම කෙරෙහි ප්‍රසම්පාදන කමිටුව අවධානය යොමු නොකර ඇණවුම ප්‍රදානය කර තිබුණි. පළමු ලංසු කැඳවීමේදී තෝරාගත් රු.70.70 ක අවම ඒකක මිලක් ඉදිරිපත් කරන ලද ලංසුකරු දින 45 ක් ඇතුළත සම්පූර්ණ තොගය සැපයීමට එකඟ වී තිබුණ ද එය ප්‍රතික්ෂේප කර නැවත වරක් ලංසු කැඳවා තිබුණ ද තෝරාගත් සැපයුම්කරු සති 03 ක් ඇතුළත ඖෂධ සැපයීමට අපොහොසත් වී තිබුණි. 2019 දෙසැම්බර් 27 දිනැති මෙකී ඖෂධ ආනයනය සම්බන්ධයෙන් විස්තර ඇතුළත් රේගු සටහනට අනුව සැපයුම්කරුගේ ලංසු ලේඛනවල සඳහන් නිෂ්පාදකයාගෙන් නොවන වෙනත් නිෂ්පාදන සමාගමක ලිපිනයක් සඳහන් වී තිබුණි. ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් 2020 පෙබරවාරි 27 දින මෙම නිෂ්පාදන සමාගමෙන් සිදු කරන ලද කරුණු විමසුමට අනුව, මෙම එන්නත් තොගය තම සමාගම මඟින් ශ්‍රී ලංකාවට අපනයනය නොකළ බව තහවුරු කර තිබුණි.

7.17.3.4 2019 දෙසැම්බර් 27 දින සැපයුම්කරු විසින් නීතිවිරෝධිව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි වී නොමැති සමාගමකින් මෙරටට ගුවනින් රැගෙන එන ලද එන්නත් 20,000 ක් වෛද්‍ය සැපයීම් අංශයට සැපයීමට සැලසුම් කර තිබුණි. එමෙන් ම මෙම ඖෂධවල ඇසුරුමේ හා ප්‍රධාන බහාලුමේ නිෂ්පාදකයාගේ නම හා ලිපිනය සඳහන් කළ යුතු වුවත් එම තොරතුරු නොමැතිව වෛද්‍ය සැපයීම් අංශය විසින් නියැදි අනුමත කර තිබුණි. එන්නත් තොග නොමැති තත්ත්වය මත අඩුපාඩු සහිත මෙම ඖෂධ භාර ගන්නා ලෙසටත් ලේබල් කිරීමට උපදෙස් ලබා දෙන ලෙසටත් වෛද්‍ය සැපයුම් අංශය අධ්‍යක්ෂක විසින් 2020 ජනවාරි 02 දින ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි. එමෙන් ම මෙම ඖෂධයට අදාළ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය නිකුත් කරන ලද ලිපිගොනුවට අනුව එම ලියාපදිංචි ඖෂධයේ ඇසුරුම් සහ වෛද්‍ය සැපයීම් අංශයට ලබා දීමට නියමිතව තිබුණු හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ආහාර හා ඖෂධ පරීක්ෂක විසින් අත්අඩංගුවට ගෙන තිබුණු ඖෂධ ඇසුරුම් අතර පැහැදිලි වෙනස්කම් නිරීක්ෂණය විය.

7.17.4 පිරිවැය රු.1,488,240 ක් වූ **Ceftriaxone Sodium for Injection BP 500mg** ඒකක 79,500 ක් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් නොමැති සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගෙන තිබුණු අතර සැපයුම්කරු විසින් ඉදිරිපත්කර තිබුණු ප්‍රසම්පාදන ලියවිලි වලට අනුව සහ ආනයනයේදී රේගු දෙපාර්තමේන්තු වෙත ඉදිරිපත් කර තිබුණු ලියවිලිවලට අනුව එන්නතෙහි නිෂ්පාදක වශයෙන් සඳහන් කර තිබුණු සමාගමෙන් තොරව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි වී නොතිබුණු සමාගමකින් මෙම ඖෂධය ආනයනය කර තිබුණි.එමෙන්ම නැව් ගත කිරීමට පෙර ඖෂධයේ නියැදි ඉන්දියාවේ පිහිටි Bee Pharma පරීක්ෂණාගාරයෙන් පරීක්ෂා කළ බවට තොරතුරු සහ ඖෂධ ලියාපදිංචියට අදාළව ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නඩත්තු කරන ලද ඩොසියරය සහිත ලිපිගොනුව විගණනයට ඉදිරිපත් නොකෙරුණි. සැපයුම්කරු විසින් වෛද්‍ය සැපයීම් අංශයට සපයන ලද තොගය සම්බන්ධයෙන් ජාතික ඖෂධ ආරක්ෂණ පරීක්ෂණාගාරය විසින් සිදු කරන ලද තත්ත්ව පරීක්ෂණයේ දී USP ලේබල් අවශ්‍යතාවය සහ දැනට පවත්නා ලේබල්වල දක්නට ලැබුණු ලක්ෂණ අතර පැවති වෙනස්කම් හේතුවෙන් අදාළ කාණ්ඩවල තොග භාවිතයෙන් ඉවත් කරන ලෙස දැනුම් දී තිබුණි. අවශ්‍ය පිරිවිතර නොගැලපීම නිසා භාවිතයෙන් ඉවත් කළ තොග වෙනුවෙන් වැය වූ පිරිවැය ආපසු ගෙවන ලෙස සංස්ථාව විසින් සැපයුම්කරු වෙත දැනුම් දී තිබුණ ද ඒ බව පිළිනොගත් සැපයුම්කරුව අසාදු ලේඛන ගත කිරීමට කටයුතු නොකර සැපයුම්කරුගේ අත්හිටුවා තිබුණු ගෙවීම් වලින් ගුණත්වයෙන් තොර ඖෂධ සැපයීම හේතුවෙන් දරන ලද රු.1,860,300 ක මුදල අඩුකර රු.273,598,324 ක් 2022 අගෝස්තු,නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදි මෙම සැපයුම්කරුට ගෙවා තිබුණි.

7.17.5 වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය සඳහා 2016, 2017 හා 2018 වර්ෂ සඳහා පිරිවැය රු.35,761,504 ක් වූ **Furosemide Injection BP 20 mg/2 ml** එන්නත් මාත්‍රා ඒකක 5,845,000 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

7.17.5.1 වෛද්‍ය සැපයුම් අංශය වෙත 2017 මාර්තු 07 දින සපයා තිබුණු එන්නත් මාත්‍රා 99,000 ක තොගය භාරගැනීමේදි නිරීක්ෂණය වූ අඩුපාඩු හේතුවෙන් මෙම තොගය පිළිගත නොහැකි බවත් ඒ සඳහා නිෂ්පාදන ස්ථායිතා වාර්තාව (Product Stability Report) සපයන ලෙස සැපයුම්කරු වෙත කරන ලද දැනුම් දීම මත සැපයුම්කරු විසින් Accelerate Stability Report සපයා තිබුණු අතර එහි සඳහන් ආකාරයට අදාළ ඖෂධ අවශ්‍ය ප්‍රමිත සහ පිරිවිතර වලට අනුකූල බවට නිෂ්පාදක සමාගමෙන් දැනුම් දී තිබුණි. එහෙත් එසේ දැනුම් දුන් ලිපියේ ලිපි ශීර්ෂය නිෂ්පාදන සමාගම භාවිතා කරනු ලබන ලිපි ශීර්ෂයට වෙනස් බවත්, මෙය සාවද්‍ය ලෙස සකස් කරන ලද ලිපි ශීර්ෂයක් බවත්, විගණනයේදී නිරීක්ෂණය වූ අතර ඇනවුම් කරන ලද මුළු ඒකක ප්‍රමාණයට අදාළව නිෂ්පාදන සමාගම විසින් වරින් වර නිකුත් කරන ලද එන්නත් විශ්ලේෂණ සහතිකවල

තත්ත්ව පාලන කළමනාකරුගේ අත්සන් හා ආකෘතිය ද එකිනෙකට වෙනස් වුවද එම වෙනස්කම් පිළිබඳ ප්‍රසම්පාදන අස්ථිත්වය කිසිදු සැලකිල්ලක් දක්වා නොතිබුණි.

7.17.5.2 ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව ඉහත සැපයුමට අදාළව සැපයුම්කරු විසින් ලංසු ලේඛනවල සඳහන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි ඖෂධ නිෂ්පාදකයාගෙන් නොවන වෙනත් ආනයන සමාගම් දෙකකින් එන්නත් මාත්‍රා 3,898,900 ක් ආනයනය කර තිබුණු අතර එම සමාගම් දෙකම ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සමාගම් නොවන බව නිරීක්ෂණය විය.

7.17.5.3 සැපයුම්කරු විසින් සපයා තිබුණු මෙම එන්නත සම්බන්ධයෙන් රජයේ රෝහල් 2 ක් හා වෛද්‍ය සැපයුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි වලට අදාළව පරීක්ෂණ සිදු කරන ලද ජාතික ඖෂධ තත්ත්ව සහතික ආරක්ෂණ රසායනාගාරයේ (NMQAL) පරීක්ෂණ වාර්ථාවට අනුව පරීක්ෂා කරන ලද එන්නත් Sterility පරීක්ෂණයේ දී බ්‍රිතාන්‍ය ඖෂධීය පිරිවිතර වලට අනුකූල නොවන බවට හා පරීක්ෂාව සඳහා ලබාදී තිබුණු එන්නත් සාම්පල්වල හා ලියාපදිංචිය සඳහා ජාතික ඖෂධ තත්ත්ව සහතික ආරක්ෂණ රසායනාගාර (NMQAL) වෙත ඉදිරිපත් කරන ලද ලිපිගොනු තුළ අන්තර්ගත වූ නිෂ්පාදිතයේ ආදර්ශ ඇසුරුම්වල එකිනෙකට වෙනස් විෂමතාවයක් නිරීක්ෂණය වූ බව සඳහන් විය. මෙම පරීක්ෂණයේ ප්‍රතිඵල මත මෙම එන්නත වහා භාවිතයෙන් ඉවත්කරන ලෙස රජයේ සියළු රෝහල් සහ ආයතන වෙතද, පෞද්ගලික වෙළඳසැල් තුළින් ඉවත් කරන ලෙස අදාළ සමාගම වෙතද දැනුම් දී තිබුණි. එම දැනුවත් කිරීම සිදුකරන අවස්ථාව වන විට 2018 හා 2019 වර්ෂවලට අදාළ තොගවල කල් ඉකුත්වී තිබුණි.

7.17.5.4 මෙම ඉන්ඩෙන්ටු වලට අදාළ තොගවල නිෂ්පාදක වශයෙන් ප්‍රසම්පාදන ලියවිලි හා රේගු නිශ්කාෂණ ලියවිලිවල සඳහන් වූ නිෂ්පාදිත සමාගම අදාළ කාලසීමාව තුළ මෙම සැපයුම්කරු වෙත කිසිදු අයිතමයක් නොසැපයූ බවත්, මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව තමන්ගේ කිසිදු දැනුවත් භාවයක් නොමැති බවත්, ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙනුවෙන් සිදුකරන ලද වෝහාරික විගණනයකදී ලිඛිතව තහවුරු කළ ද අදාළ ප්‍රසම්පාදන ලිපිගොනුව තුළවූ ලිපි සහ විශ්ලේෂණ සහතික නිෂ්පාදිත සමාගමේ ලිපි ශීර්ෂ මඟින් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද එම ලිපි ශීර්ෂ 2015 ජූනි 10 දින නිෂ්පාදිත සමාගම විසින් සැපයුම්කරු තම ශ්‍රී ලාංකික නියෝජිතයා ලෙස පත් කළ බව දක්වමින් ලංසු ලේඛන සමග ඉදිරිපත් කරමින් විලවුන් උපකරණ සහ ඖෂධ (Cosmetic Devices and Drug) අධිකාරිය වෙත එවා තිබුණු ලිපි ශීර්ෂයන්ට වඩා හාත්පසින්ම වෙනස් ලිපි ශීර්ෂ විය.

7.17.5.5 කොළඹ ජාතික රෝහලෙන් ලබාගත් ඇසුරුම් වලට අදාළව සිදු කරන ලද භෞතික පරීක්ෂාවට අනුව මෙම එන්නත ලියාපදිංචිය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත ඉදිරිපත් කර

තිබුණු ආදර්ශ ඇසුරුම් හා වෛද්‍ය සැපයීම් අංශය විසින් කොළඹ ජාතික රෝහලට නිකුත් කරන ලද මෙම ඖෂධයේ තොගවලින් ඉතිරි වී තිබුණු ඇසුරුම්වල විවිධ වෙනස්කම් නිරීක්ෂණය විය.

7.17.5.6 ඉහත කරුණු හේතුවෙන් සැපයුම්කාර සමාගම අසාදු ලේඛන ගත කිරීමට නීති අංශය වෙත යොමු කර තිබුණද ගුණත්වයෙන් අසමත් ඖෂධ සඳහා සංස්ථාවට අයවිය යුතු මුදල අයකර තිබීම හේතුවෙන් මෙම සැපයුම්කරු අසාදු ලේඛනගත කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනැගුන බවට කරුණු දක්වමින් අසාදු ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය නවතා දමා තිබුණි.

7.17.5.7 ඉහත අංක 7.17.1 සිට 7.17.5 දක්වා ඡේදවල සඳහන් අවධිමත් ක්‍රියා හේතුවෙන් රාජ්‍ය ඖෂධ නිතීගත සංස්ථාව විසින් වෛද්‍ය සැපයීම් අංශයට සහ රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ ඔසුසල් සඳහා ලබා දී තිබුණු වෛද්‍ය සැපයීම් වෙනුවෙන් දේශීය නියෝජිත ආයතනයට ගෙවිය යුතු බිල්පත් සඳහා ගෙවීම් සිදු කිරීම වසර දෙකකට වඩා වැඩි කාලයක සිට අත්හිටුවා තිබුණු නමුත් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමෙන් හෝ විධිමත් අනුමැතියකින් තොරව ගෙවීමට කටයුතු කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

7.17.5.8 ගෙවීම් අත්හිටුවා තිබුණු රු.248,354,974 ක් ජාතික ඖෂධ නිතිගත සංස්ථාවේ සභාපතිවරයාගේ නිර්දේශය මත නියමිත ප්‍රසම්පාදන කමිටුවල අනුමැතියක් හෝ වෙනත් විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව 2022 අගෝස්තු හා නොවැම්බර් මාසවලදී සැපයුම්කරු වෙත ගෙවා තිබුණි.

7.17.6 මීට අමතරව මෙම දේශීය නියෝජිත ආයතනයෙන් ඉන්ඩෙන්ටු අංක LP/MSD/CPU-DHS/RQ/341/2018 යටතේ රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව විසින් මිලදී ගෙන වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයනු ලැබූ Bevacizumab එන්නත් 1,729 ක් වෙනුවෙන් සැපයුම්කරු ඉදිරිපත් කර තිබුණු ලංසු මිල (Quoted Price) සහ ප්‍රදානය කළ මිල (Awarded Price) අතර වෙනස සඳහා වූ ගෙවීම් අත්හිටුවා තිබුණු රු.25,243,400 ක් ද අදාළ ටෙන්ඩර් මණ්ඩල අනුමැතියකින් තොරව හා ගෙවීම සඳහා ප්‍රමාණවත් හේතූන් ඉදිරිපත් කිරීමකින් තොර ලබාදී තිබුණු සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත 2022 දෙසැම්බර් 08 දින ජාතික ඖෂධ නිතිගත සංස්ථාව විසින් අදාළ සමාගම වෙත ගෙවා තිබුණි.

7.17.6.1 2020 අප්‍රේල් 20 දිනැති අංක 758 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව සැපයුම්කරුවන් වෙත ගෙවීම් විධිමත් කිරීම සඳහා පිහිටුවා තිබුණු කමිටුව මඟින් (Streamline Committee) නිර්දේශ කරනු ලබන සැපයුම්කරුවන්ට නිර්දේශිත සීමාවන් තුළ පමණක් ගෙවීම් සිදු කළ යුතු වුවද ජාතික ඖෂධ නිතිගත සංස්ථාව විසින් අවසන් වරට 2022 ජුනි 08 වන දින පවත්වා තිබුණු එම කමිටුවේ 65 වන කමිටු තීරණයට පරිබාහිරව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ හා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ සභාපතිගේ නිර්දේශ මත මෙම සමාගමට රු.248,354,974 ක් ගෙවීම් සිදු කර තිබුණි. සැපයුම්කරුවන්ට ගෙවීම් සිදු කිරීම සඳහා නිශ්චිත ප්‍රතිපත්තියක් සහ විනිවිදභාවයෙන් යුතු

විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමේ අරමුණින් පිහිටුවනු ලැබූ යථෝක්ත කමිටුව සහ එකී ක්‍රියාකාරිත්වය 2022 ඔක්තෝම්බර් 03 දිනැති අංක 782 වෙනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම මඟින් අහෝසි කර තිබුණු අතර එම කමිටුව අහෝසි කිරීම සඳහා බලපෑ කිසිදු සාධාරණ හේතුවක් විගණනයට නිරීක්ෂණය නොවුණි.

7.17.6.2 මෙම සමාගම තම ව්‍යාපාරික නාමය පසුව වෙනස් කර ගෙන තිබුණු අතර තම ඖෂධ බිල්පත් නිරවුල් කර ගැනීම සඳහා එම නව ව්‍යාපාරික නාමය යටතේ ඉල්ලුම් කර තිබුණි. එසේ වුවද අදාළ වෛද්‍ය සැපයීම් සඳහා සැපයුම්කරු සංස්ථාව සමග ගිවිසුම් ගත වී තිබුණේ මුල් සමාගම නමින් බැවින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් එම නමින් යුත් ගිණුම් හරහා ණයවර ලිපි නිදහස් කර තිබුණි. එසේම සමාගමේ නම වෙනස් කිරීම ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් පිළිගෙන නොතිබුණි. මේ අනුව ගෙවීම් සඳහා ඉල්ලීම සිදුකළ සමාගම හා ගෙවීම් කළ සමාගම එකිනෙකට වෙනස් විය.

7.17.6.3 මෙම සැපයුම්කරු විසින් රජයේ නීති රීති හා රෙගුලාසි උල්ලංඝණය කරමින් ඖෂධ ලියාපදිංචියේ දී සිදු කර තිබුණු වංචා සහගත හැසිරීම් සම්බන්ධයෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව දැනුවත් කරමින් ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2021 අප්‍රේල් 24 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සංස්ථාවේ සභාපති වෙත එවා තිබුණු අංක SM/PSRP/01/SPC/2021 දරන ලිපිය ප්‍රකාරව මෙම මුල් සමාගම සහ එහි පරිපාලිතයන්ගෙන් සිදු කරනු ලබන සියළු මිලදී ගැනීම් නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව නතර කරන ලෙසට දැනුම් දී තිබුණද සෞඛ්‍ය අමාත්‍යාංශය හදිසි ප්‍රසම්පාදන කමිටුවේ 2022 අගෝස්තු 16 දිනැති තීරණය ප්‍රකාරව මෙම මුල් සමාගමේ නව සමාගම් නාමය යටතේ සිය නියෝජිතයකු ලෙස නම් කර තිබුණු සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද ලංසුවක් පිළිගෙන එම සමාගමට රු.52,450,000 ක්වූ Trustuzumab 400mg එන්නත් ඒකක 1000 ක් සැපයීමේ ප්‍රසම්පාදනය පිරිනමා තිබුණු අතර 2022 අගෝස්තු 29 දින හා 2022 සැප්තැම්බර් 12 දින වෛද්‍ය සැපයුම් අංශයට එම ඖෂධ භාර දී තිබුණි.

7.17.6.4 2015 ජනවාරි 15 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ රාජ්‍ය ආයතනවල සිදු වී ඇතැයි සැලකෙන දූෂණ හා වංචා පිළිබඳ සොයා බැලීමේ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවට අනුව '' හර්ටිකැඩ්'' වෙළෙඳ නාමය යටතේ ''ට්‍රස්ටසුමබ්'' පිළිකා ඖෂධය පුද්ගලික සමාගමක් හරහා මෙරටට ආනයනය කිරීමේදී සිදුකර ඇති වංචා, දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධ වගකිව යුතු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් සම්බන්ධව නිර්දේශයන් සිදුකර තිබුණු නමුත් එම වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව එම නිර්දේශයන් කිසිවක් ක්‍රියාත්මක කිරීමට අදාළ බලධාරීන් කටයුතු කර නොතිබුණි.

7.18 රෝගී ජීවිත දෙකක් අහිමි වීම සම්බන්ධයෙන් මතභේදයට තුඩු දුන් Ceftriaxone for inj.1g vial ඖෂධය පිළිබඳ පරීක්ෂාව (SR- 00101704)

ප්‍රතිජීවක ඖෂධයක් වන මෙම ඖෂධයේ 2021/SPCN/R/P/00030 දරන ඇණවුම යටතේ රු.75,959,792 ක් වටිනා එන්නත් 2,100,000 ක් මිලදී ගෙන තිබුණු අතර 2023 මාර්තු මාසයේදී ලද 700,000 ක තොගය බෙදාහැරීමෙන් පසුව පේරදෙණිය හා කෑගල්ල ශික්ෂණ රෝහල්වල මරණ 02 ක් වාර්තා වී තිබුණි. එසේම කොළඹ, මහනුවර ජාතික රෝහල, ගම්පහ, කඹුරුපිටිය, මීගමුව හා කරවනැල්ල ආදී රෝහල්වල රෝගීන්ට ඖෂධය භාවිතයෙන් පසු ආසාත්මිකතා ඇතිවූ බවට වාර්තා වී තිබුණි. මේ සම්බන්ධව එම රෝහල් මඟින් ලබාගන්නා ලද සාම්පල් පරීක්ෂා කිරීමෙන් පසු ඖෂධයේ තත්ත්වය පිළිබඳ ගැටළුවත් නොමැති බවට රසායනාගාර පරීක්ෂණ මඟින් අනාවරණය කළද, මතභේදයට තුඩුදුන් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ මරණයට පත් රෝගී තරුණියට භාවිතා කළ කාණ්ඩයේ සාම්පල් රසායනාගාරයට යැවීමට පේරාදෙණිය රෝහල විසින් කටයුතු කර නොතිබුණි. විගණනයේ දැනුම් දීමෙන් පසු අදාළ සාම්පල් රසායනාගාරය වෙත යවා තිබුණද විගණිත දින දක්වාම ඊට අදාළ වාර්තා නිකුත් වී නොතිබුණි.

8. නිර්දේශ

8.1 ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්ත්වයෙන් යුතු ඖෂධ මහජනතාවට ලබාදෙන බවට වූ මූලික අරමුණ සාක්ෂාත් කර ගැනීමට ස්ථාපිත කර ඇති ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් එවකට ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික (WOR) නිකුත් කිරීමේ දී තාක්ෂණික කමිටුවක නිර්දේශය හරහා සිදුකර තිබුණි. නමුත් එම අවම ක්‍රමවේදයට ද බැහැරව යමින් විශේෂ ක්‍රමවේදයක් (Special Pathway) යටතේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික නිකුත්කිරීමට කටයුතු කිරීම නිසා ඖෂධවල ගුණාත්වය පිළිබඳ පරීක්ෂා කෙරෙන බවට තහවුරු කෙරෙන **අවම ක්‍රමවේදයකින් හෝ තොරව මෙරටට ඖෂධ ගෙන්වා රෝගී ජනතාව අවදානමට ලක්කර තිබුණු බැවින් ඉහත විශේෂ ක්‍රමවේදය නිර්දේශ කර තිබුණු අධිකාරියේ එවකට සිටි ප්‍රධාන විධායක නිලධාරියා ද එය අනුමත කර තිබුණු පාලක මණ්ඩලය ද සම්බන්ධයෙන් විමර්ශනය කර නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බවට නිර්දේශ කෙරේ.** (යොමුව : 7.11.7)

8.2 අධිකාරිය පනත ප්‍රකාරව හදිසි අවස්ථාවන්හිදී ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අවශ්‍යතාවයක් ඇතිවුවහොත් පවත්නා නීතිරීතීන්ට අනුගතව හා ඖෂධවල ගුණාත්වය තහවුරු කර ගනිමින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික නිකුත් කිරීමටත්, **පිළිගත් විධිමත් ක්‍රමවේදයන්ට පටහැනිව ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික නිකුත් කිරීමේ දී ඇති විය හැකි අක්‍රමිකතා වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීමත් නිර්දේශ කෙරේ.** (යොමුව : 7.11.1 සිට 7.11.6 දක්වා)

8.3 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ පවතින අඩුපාඩු හා ඌනතා මගහරවා ගෙන ප්‍රතිතනයලත් ජාත්‍යන්තර ප්‍රමිතිකරණ මට්ටමේ පර්යේෂණාගාරයක් බවට වැඩිදියුණු කිරීම සහ ඖෂධ ලියාපදිංචිය, ආනයනය කිරීම, ගබඩා කර තැබීම යන විවිධ අවස්ථාවලදී **සාම්පල් පරීක්ෂා කිරීම මගින් රෝගීන් සඳහා භාවිතා කරන ඖෂධවල ගුණත්වය තහවුරු කිරීමට ප්‍රමුඛත්වය ලබා දී කටයුතු කළ යුතු බවට නිර්දේශ කෙරේ.** (යොමුව : 7.9.1 සිට 7.9.8 දක්වා)

8.4 Human Immunoglobulin හා Rituximab ඇතුළු ඖෂධ 05 ක ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී හා ඖෂධ තොග සැපයීමේ දී සැපයුම්කරු විසින් සිදුකළ වංචා සහගත ක්‍රියා සහ රෝගී ජීවිත බරපතල අවදානමට ලක් කිරීම පිළිබඳව **විධිමත් විමර්ශනයකින් අනතුරුව සැපයුම්කරුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් ඉදිරි කටයුතු සිදු කළ යුතු බවට නිර්දේශ කෙරේ.** (යොමුව : 7.16)

8.5 Human Immunoglobulin ඇතුළු ඖෂධ අභිලාෂ කැඳවීමේ සහ අනායාචිත පදනම යටතේ ප්‍රසම්පාදනයන් සිදු කිරීමේ දී, අමාත්‍ය මණ්ඩල තීරණ අභිබවා කටයුතු කිරීම, තාක්ෂණික ඇගයීම් නිසි පරිදි සිදු නොකිරීම, සැපයුම්කරුවන්ට වාසිසහගත වන ලෙස නිර්දේශ ලබා දීම, ව්‍යාජ ඖෂධ 02 ක් වෙනුවෙන් ගෙවීම් කිරීමේ දී ප්‍රමුඛතාවය දී කටයුතු කිරීම සම්බන්ධයෙන් **ඉදිරි විමර්ශන කටයුතු සිදු කර ඊට වගකිව යුතු තැනැත්තන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ.** (යොමුව : 7.3, 7.4, 7.16)

8.6 තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයුම් සිදු කළ සමාගම් / ආයතන අසාධු ලේඛනගත කිරීමේ දී එම ආයතන වෙනත් නම් වලින් පෙනී සිටීමින් නැවත ඖෂධ සැපයීම වැළැක්වීම සඳහා එම ආයතනවල භිමිකාරිත්වය ඇති පුද්ගලයින්, ජාතික හැඳුනුම්පත හෝ ගුවන් ගමන් බලපත්‍රය වැනි අනන්‍යතාවය තහවුරු කරන ලේඛනයන් මඟින්ම **අසාධු ලේඛනගත කිරීම සඳහා කඩිනම් පියවර ගැනීමට මුදල් අමාත්‍යාංශ ලේකම්, සමාගම් රෙජිස්ට්‍රාර් හා ප්‍රසම්පාදන කොමිෂන් සභාව කටයුතු කළ යුතු බව නිර්දේශ කෙරේ.** (යොමුව : 7.16, 7.18, වෙළුම I)

8.7 ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ඖෂධ සඳහා ලියාපදිංචිය පිරිනැමීමේ දී රජයේ ඖෂධ අවශ්‍යතාවයන් පිළිබඳව ද අවධානය යොමු කරමින් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව ඉටු නොකිරීමත්, පොරොත්තු ගොනු වැඩි ප්‍රමාණයක් රඳවා ගැනීමත් හේතුවෙන් ඇතිව තිබුණු ගැටලු වළක්වා ගැනීම සඳහා **ලියාපදිංචි කටයුතු කඩිනමින් හා විධිමත්ව සිදු කිරීමට අවශ්‍ය ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීමටත්, එම ක්‍රමවේදයන් නිසි පරිදි ක්‍රියාත්මක වේදැයි පසුවිපරම් කිරීම සඳහා වූ ක්‍රමවේදයක් සකස් කිරීමටත් නිර්දේශ කෙරේ.** (යොමුව : 7.6.1, 7.6.2, 7.6.3, 7.7.1 සිට 7.7.11 දක්වා)

8.8 රජයේ ඖෂධ ගබඩා සහ ඖෂධ ප්‍රවාහනය නියාමනය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් ඇති කිරීම මඟින් ඖෂධ ආනයනය / නිෂ්පාදනය කරන අවස්ථාවේ සිට රෝගීන් සඳහා භාවිතා කරන අවස්ථාව දක්වා **ඖෂධවල ගුණාත්වය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා ක්‍රමවේද සකස් කර ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ.** (යොමුව : 7.10.1, 7.10.2, 7.10.3)

8.9 ඖෂධවල මිල නියම කිරීමේ හා නියාමනය කිරීමේ ක්‍රමවේදයේ පවතින අඩුපාඩු නිවැරදි කිරීම මඟින් **මහජනතාවට සාධාරණ මිලකට ඖෂධ ලබාදෙන බවට තහවුරු කිරීම නිර්දේශ කෙරේ.** (යොමුව : 7.8.1 සිට 7.8.10 දක්වා)

8.10 ඖෂධ ආනයනය කිරීමේ දී ඊට අදාළ වන ලියාපදිංචිය සහ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික ඇතුළු ඖෂධ නිෂ්කාශනයට අදාළ සියළු ලිපිලේඛන මාර්ගගත ක්‍රමයක් ඔස්සේ හරස් පරීක්ෂාවකට ලක් කෙරෙන පරිදි ඊට සම්බන්ධිත ආයතන වන වෛද්‍ය සැපයීම් අංශය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා රේගුව සහ ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුව, **ජාතික ඖෂධ නියාමන අධිකාරිය සමඟ සම්බන්ධ කෙරෙන මාර්ගගත පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමට නිර්දේශ කෙරේ.** (යොමුව : 7.7.7.7, 7.7.7.8, 7.11.6.3)

8.11 වෛද්‍ය සැපයීම් ලබා ගැනීම සඳහා ගත වන කාලය (Lead Time) අඩුකර ගත හැකිවන පරිද්දෙන් විද්‍යාත්මක ක්‍රමවේදයක් හරහා යළි ඇණවුම් තොග මට්ටම් පාදක කර ගෙන නිවැරදි තොග කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම සහ රජයේ රෝහල් සඳහා ඖෂධ අවශ්‍යතාවය නිවැරදිව පුරෝකථනය කිරීම, යළි ඇණවුම් ප්‍රමාණය නිවැරදිව තීරණය කිරීම සහ වාර්ෂික ඇණවුම් ප්‍රමාදයකින් තොරව නියමිත වේලාවට යොමුකිරීමට හැකි වන අයුරින් **නිවැරදි තොරතුරු සැපයෙන විශ්වාසදායී යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට නිර්දේශ කෙරේ.** (යොමුව : වෙළුම I)

8.12 සැපයුම්කරුවන් වෙත යොමුකර තිබෙන ඇණවුම් නියමිත දිනයන්හි දී ලැබෙන බවටත්, එසේ නොවන විට ප්‍රමාද ගාස්තු නිවැරදිව අයකරන බවටත්, තොග ලැබිය යුතු දිනයන් හා ප්‍රමාණයන් සංශෝධනය කරන්නේ නම් එය නිවැරදි ඇගයීමක් මත සිදුකෙරෙන බවටත් තහවුරු කෙරෙන යාන්ත්‍රණයක් සකස්කළ යුතු බවටත් නිර්දේශ කෙරේ. (යොමුව : වෙළුම I)

8.13 සැපයුම්කරුවන් වෙත නිකුත්කර තිබෙන ඇණවුම් පිළිබඳ නිරන්තර පසුවිපරම් කිරීම සහ ලැබීමේ සම්භාවිතාවය අඩු සහ සම්භාවිතාවයක් නොමැති ඇණවුම් සම්බන්ධයෙන් අවශ්‍ය කෙරෙන ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ. (යොමුව : වෙළුම I)

8.14 හිඟ ඖෂධ හඳුනාගැනීමේ දී සහ තීරණ ගැනීම සඳහා වාර්තා කිරීමේදී, කිසියම් දිනකට තොරතුරු පද්ධති මඟින් පෙන්නුම් කෙරෙන ඉතිරි තොග පමණක් නොව සැපයුම්කරුවන් වෙතින් ලැබීමට

නියමිත ඇණවුම් ප්‍රමාණයන්, ඒවා ලැබීමේ සම්භාවිතාවන්, ඖෂධයේ මාසික භාවිතය සහ අවස්ථාවෝචිතව අනෙකුත් සාධක ද සැලකිල්ලට ගෙන හිඟ ඖෂධ මොනවාද යන්න තීරණය කළ යුතු අතර හිඟ ඖෂධ සම්බන්ධයෙන් හදිසි මිලදී ගැනීම්වලට යොමුවීමට පෙර සැපයුම්කරුවන් වෙතින් ලැබීමට නියමිත ඇණවුම් ප්‍රමාණයන් ලබා ගැනීමට උපරිම ආකාරයෙන් කටයුතු යෙදීම, වැඩ අවසන් නොවූ සාමාන්‍ය වාර්ෂික ඇණවුම් කඩිනමින් සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ කෙරේ. (යොමුව : වෙළුම I)

8.15 ඉහත පරිදි ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුත් තවදුරටත් හදිසි මිලදී ගැනීම්වලට යොමුවීමට අවශ්‍ය වන්නේ නම් එසේ හදිසි මිල දී ගැනිම සඳහා යොමු වීම සඳහා නිලධාරින්ගේ නොසැලිකිල්ල හෝ අකාර්යක්ෂමතාවය හේතුවී ඇත්නම් එම නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු බවටත් **හදිසි මිල දී ගැනීම නිසා රජයට දැරීමට සිදුවන අලාභය ඊට වගකිවයුතු නිලධාරින්ගෙන් අයකළ යුතු බවට නිර්දේශ කෙරේ.** (යොමුව : වෙළුම I)

8.16 සෞඛ්‍ය අමාත්‍යාංශය, වෛද්‍ය සැපයීම් අංශය සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වැනි එකිනෙකට සම්බන්ධිත කාර්යයන් සිදුකරනු ලබන ආයතන අතර පැවතිය යුතු මනා සම්බන්ධතාවය ගිලිහි යාම හේතුවෙන් විවිධ ගැටලු පැන නැගී තිබුණු බැවින් මෙම ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කෙරේ. (යොමුව : වෙළුම I)

8.17 වෙළුම I හි විස්තරාත්මකව දැක්වෙන පරිදි නියැදි විගණන පරීක්ෂාවේදී ඖෂධ 11 කට අදාළව සමස්ථ තොරතුරු පරිශීලනය කිරීමකින් තොරව හදිසි මිලදී ගැනීම් සඳහා යොමුවීම හේතුවෙන් රජයට රු. 709,149,099 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබුණු බැවින් විධිමත් විමර්ශනයක් සිදුකර ඊට වගකිව යුත්තන් හඳුනාගෙන දරන ලද අතිරේක පිරිවැය ආපසු අයකර ගැනීමට නිර්දේශ කෙරේ. (යොමුව : වෙළුම I)

8.18 වෙළුම I හි විස්තරාත්මකව දැක්වෙන පරිදි නියැදි විගණන පරීක්ෂාවේදී ඖෂධ 04කට අදාළව ප්‍රසම්පාදන කටයුතු අවසන්වෙමින් පැවති ඇණවුම් අවලංගු කර දේශීය ඖෂධ නිෂ්පාදකයන් වෙත යොමුවීම හේතුවෙන් රජයට රු. 167,717,935 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබුණු බව නිරීක්ෂණය වන බැවින් වැඩිදුරටත් විමර්ශනය කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත්, ඊට වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව අවශ්‍ය කටයුතු කිරීමටත් නිර්දේශ කෙරේ. (යොමුව : වෙළුම I)

8.19 ජාතික ඖෂධ නියාමන අධිකාරිය, වෛද්‍ය සැපයීම් අංශය හා අනෙකුත් සම්බන්ධිත ආයතනවල පවත්නා අභ්‍යන්තර පාලන පටිපාටීන් සමාලෝචනයට සහ ඇගයීමට ලක්කර පවත්නා අඩුපාඩු සහ ඌනතා හඳුනා ගැනීමටත්, ඒවා නිවැරදි කරමින් ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතීන් ස්ථාපිත කිරීමටත් නිර්දේශ කෙරේ. (යොමුව : 7.6 සිට 7.11 දක්වා)

8.20 මා විසින් 2018 මාර්තු 14 දින නිකුත් කළ වෛද්‍ය සැපයීම් ක්‍රියාවලිය පිළිබඳව විශේෂ විගණන වාර්තාවේ සඳහන් අංක 8.1 සිට 8.47 දක්වා වූ නිර්දේශයන් කඩිනමින් ක්‍රියාත්මක කිරීම හා එම නිර්දේශයන් ලබා දී වර්ෂ 06 කට වැඩි කාලයක් ගත වුවද, එකී නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගත් තැනැත්තන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ **(ඇමුණුම 143).**

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති
2024 මැයි 10 දින

118

2022 හා 2023 වර්ෂවල
ඖෂධ අවශ්‍යතාවය, ප්‍රසම්පාදනය, සැපයුම, බෙදාහැරීම හා නියාමනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

<u>වෙළුම I</u>

(ඖෂධ ඇස්තමේන්තු සකස් කිරීමේ සිට ඖෂධ ඇණවුම් කර වෛද්‍ය සැපයීම් අංශය වෙත ලබාදීමත්, එම ඖෂධ බෙදාහැරීමත් සම්බන්ධයෙන් වූ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් එක් එක් ඖෂධයට අදළ නිරීක්ෂණ)

01. Meropenem Injection 1g (SR 00102102)

බැක්ටීරියා මඟින් ඇතිවන ආසාදනවලට ප්‍රතිකාර කිරීම සඳහා භාවිතා කරනු ලබන මෙම ඖෂධයෙන් 2022 සහ 2023 වර්ෂවල රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ලද ඇණවුම්වලට අදාළව එන්නත් කුප්පි 1,500,000 ක් සැපයුම් කර ඒ සඳහා රු.1,105,494,000 ක ගෙවීම් ඉල්ලීම් (හරපත්) වෛද්‍ය සැපයුම් අංශය වෙත නිකුත් කර තිබුණි. ඒ සැපයුමට අදාළ ප්‍රසම්පාදනය සම්බන්ධව පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) වෛද්‍ය සැපයීම් අංශයේ අංක 2022/SPC/E/C/P/00432 දරන හදිසි ඇණවුම යටතේ එන්නත් කුප්පි 150,000 ක් මිලට ගැනීමට අදාළව එන්නත් කුප්පියක් රු.1,395 ක් ලෙස මිල ඉදිරිපත් කළ අවම දෙවන ලංසුකරුගේ ලංසුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් නොකිරීම මත හා අතැති තොග නොතිබීම මත ප්‍රතික්ෂේප කර තිබුණි. තෙවන අවම මිල ඉදිරිපත් කළ Yaden International (Pvt) Ltd සති 04 ක කාලරාමුව තුළ තොග ලබා දෙන බැවින් එම ලංසුකරුට එන්නත් කුප්පියක් රු.1,400 කට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු සහතිකයක් ඉදිරිපත් කිරීමට යටත්ව ඇණවුම ප්‍රදානය කර තිබුණි. නමුත් එම සැපයුම්කරු විසින් ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතිකය මත ඖෂධ සැපයිය යුතු දිනයේ සිට දින 56 ක් හා දින 238 ක් ප්‍රමාද වී තොග සපයා තිබුණි.

(ආ) හදිසි මිලදී ගැනීමක් ලෙස අංක 2022/SPC/E/C/P/00724 දරන ඇණවුම සඳහා එන්නත් කුප්පි 450,000 ක් රු.1895.50 කට මිලට ගැනීමට අදාළව සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් 2022 නොවැම්බර් 21 දින වන විට කිසිදු තොගයක් නොතිබුණු බව සඳහන් කර තිබුණි. නමුත් අංක 2022/SPC/N/C/P/00044 හා 2022/SPC/E/C/P/00432 ඇණවුම්වලට අදාළව පිළිවෙලින් එන්නත් කුප්පි 438,590 ක් 2022 නොවැම්බර් 08 දිනදී සහ එන්නත් කුප්පි 50,000 ක් 2022 නොවැම්බර් 17 දින වෛද්‍ය සැපයීම් අංශයට භාර දී තිබුණි. ඒ අනුව 2022 නොවැම්බර් 21 දින වනවිටත් 2022 නොවැම්බර් මාසය තුල ලැබී තිබූ එන්නත් කුප්පි ඒකක 488,590 කට ආසන්න ප්‍රමාණයක් වෛද්‍ය සැපයීම් අංශයේ හෝ රෝහල් පද්ධතිය තුල පැවතුණු බව නිරීක්ෂණය වන බැවින් එන්නත් කුප්පි 450,000 ක් මිලදී ගැනීම සඳහා හදිසි මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය නොවීය. ඒ අනුව ප්‍රමාණවත් ඖෂධ ප්‍රමාණයක් පවතිද්දීත් හදිසි මිලදී ගැනීමක් සිදු කර තිබීම හේතුවෙන් සාමාන්‍ය ඇණවුම යටතේ එන්නත් කුප්පියක් රු.1,075.60 කට මිලකට මිලදීගෙන තිබීම මත හදිසි මිලදී ගැනීම යටතේ එන්නත් කුප්පියක් රු.1,895.50 කට මිලදී ගෙන තිබීම හේතුවෙන් ආසන්න වශයෙන් රු.368,955,000 ක පාඩුවක් රජයට සිදුවී ඇති බවත් විගණනයේදී නිරීක්ෂණය විය. තවද මෙම සැපයුම්කරුව තෝරා ගැනීමට ප්‍රධාන හේතුවක් වූ ඖෂධ නියාමන අධිකාරිය විසින් ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතිකය ලැබී සති දෙකක් තුළ ඖෂධ සැපයීමට එකඟ වුවත් Slim Pharmaceuticals (Pvt) Ltd ආයතනය විසින් ඖෂධ සැපයිය යුතු දිනයේ සිට දින 6 ක් සහ දින 41 ක ප්‍රමාද කාලයකින් ඖෂධ සපයා තිබුණි.

(ඇ) වෛද්‍ය සැපයීම් අංශය විසින් අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන තොග ඇණවුම් නොකිරීම හේතුවෙන් සාමාන්‍ය ඇණවුම යටතේ එන්නත් කුප්පියක් රු.1,075.60 කටත් ඉන්දිය ණය යෝජනා ක්‍රමය යටතේ රු.901.20 කට හා හදිසි මිලදී ගැනීම් යටතේ එන්නත් කුප්පියක් රු.1,400 කට හා රු.1,895.50 කට මිලදීගෙන තිබුණි. එසේම විවිධ

රෝහල් විසින් 2022 වර්ෂයේ මෙම එන්නත් කුප්පියක් රු.4,950 සිට රු.9,450 ක් දක්වා විහිදෙන පරිදි ඉහළ මිල ගණන්වලට එන්නත් කුප්පි 14,450 ක් රු.81,619,637 ක් වැය කර මිල දී ගෙන තිබුණි.

02. Liposomal Amphotericin B Injection 50mg (SR 00107403)

දිලීර ආසාදනවලට ප්‍රතිකාර කිරීම සඳහා භාවිතා කරනු ලබන ඖෂධයකි. 2022 හා 2023 වර්ෂවලට අදාළව ප්‍රසම්පාදනය රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, වෛද්‍ය සැපයීම් අංශය හා විදේශ ණය ආධාර මඟින් සිදු කර තිබුණි. මෙම ඖෂධයේ ඒකක 42,800 ක් 2022 හා 2023 වර්ෂවලදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙතින් ඇණවුම් කර තිබුණි. 2022 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ඒකක 1,345 ක් ලැබී තිබුණි. 2022 හා 2023 වර්ෂවලට අදාල ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) හදිසි මිලදී ගැනීමක් ලෙස 2022 වර්ෂයේ ඇණවුම් අංක 2022/SPC/E/C/P/00476 යටතේ එන්නත් කුප්පි 2,050 ක් මිලදී ගැනීමට Ceyoka (Pvt) Ltd ආයතනය වෙත ඇණවුම ප්‍රදානය කළ ද ඉන් එන්නත් කුප්පි 1,549 ක තොගය සැපයිය යුතු දින සිට මාසයක් ප්‍රමාද වී සපයා තිබුණි.

(ආ) හදිසි මිලදී ගැනීමක් ලෙස 2022 වර්ෂයේ ඇණවුම් අංක 2022/SPC/E/C/P/00741 යටතේ එන්නත් කුප්පි 6,250 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය ලබා ගෙන සති 02 ක් තුළ තොග භාර දීමට එකඟ වන ලද පස්වන අවම ලංසුකරු වන Slim Pharmaceuticals (pvt) Ltd වෙත එන්නත් කුප්පියක් රු.37,250 බැගින් ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. එසේ වුවද එම සැපයුම්කරු වෛද්‍ය සැපයීම් අංශයට තොග භාර දීමට ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය ලබා ගෙන මසකට වඩා කාලයක් ගත කර තිබුණි.

(ඇ) ඒකකයක මිල රු.11,505.68 ක් ලෙස දෙවන අවම ලංසුව ඉදිරිපත් කර තිබූ සුදුසුකම්ලත් ලංසුකරු ඖෂධය සැපයීමට දින 30 ක කාලයක් ඉල්ලීම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. එසේ වුවද දෙවන අවම ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබූ මුදලට වැඩි රු.25,744.32 ක ලංසුවක් ඉදිරිපත් කර තිබූ පස්වන අවම ලංසුකරු විසින්ද ඖෂධය වෛද්‍ය සැපයීම් අංශයට සැපයීම සඳහා දෙවන අවම ලංසුව ඉදිරිපත් කරන ලද ලංසුකරු විසින් එකඟවූ කාලයම ගත කර තිබුණි.

(ඈ) ඒ අනුව දෙවන අවම ලංසුකරුට ලංසුව පිරිනැමීමකින් තොරව පස්වන අවම ලංසුකරු වන Slim Pharmaceuticals (Pvt) Ltd වෙත මෙම ප්‍රසම්පාදනය පිරිනමා තිබීම හේතුවෙන් රු.160,902,000 ක මුදලක් වැඩිපුර ගෙවීම මඟින් රජයට පාඩුවක් සිදු වී තිබුණි. එසේම ලංසු කැඳවීමේ කොන්දේසිවලට අනුව සැපයුම්කරු විසින් සාම්පල් ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුවද සමාගම කටයුතු කර නොතිබුණි.

03. Dried, Factor VIII fraction 200-350 IU (SR 00206101)

හිමොෆිලියා A ඇති රෝගීන්ගේ රුධිර වහනය සඳහා ප්‍රතිකාර කිරීමට භාවිතා කරනු ලබන මෙම ඖෂධය වෙනුවෙන් 2021 වාර්ෂික අවශ්‍යතා ඇණවුම මඟින් එන්නත් කුප්පි 85,000 ක් හා

2023 වර්ෂයේ හදිසි මිලදි ගැනීම් යටතේ එන්නත් කුප්පි 13,500 ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් මිල දී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාළව පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) වෛද්‍ය සැපයීම් අංශයේ 2021 වර්ෂයේ 2020 ජනවාර් 01 දිනැති ඇණවුම අංක 2021/SPC/N/C/P/00015 දරන වාර්ෂික අවශ්‍යතා ඇණවුම මඟින් එන්නත් කුප්පි 85,000 ක් මිලදී ගැනීමට අදාළව Baxalta GmbH වෙත ඒකකයක් එ.ජ.ඩො. 61 (රු.11,407) කට මිලට ගැනීමට ප්‍රසම්පාදනය ප්‍රදානය කළද ණයවර ලිපි විවෘත කිරීමට නොහැකි වීමෙන් ලෝක බැංකු ආධාර මඟින් එම ගෙවීම් සිදුකර තිබුණි. එම ගෙවීම පිළිබඳව 2022 අප්‍රේල් 21 දින ලෝක බැංකුව සංස්ථාව වෙත දැනුම් දුන්නද මාස 1 ½ ක ප්‍රමාද කාලයකින් පසු එනම් 2022 ජූනි 16 දින වෛද්‍ය සැපයීම් අංශයට පළමු තොගය වූ ඒකක 24,969 ක් සපයා තිබුණි.

(ආ) ඉහත ඇණවුමට අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී මාස 03 ක් ප්‍රමාද කර ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණි.

(ඇ) ඉහත ඇණවුමේ දෙවන තොගයට අදාළව එන්නත් කුප්පි 60,031 කින් එන්නත් කුප්පි 4,500 ක් මාස 5 ක් එනම් 2023 ජූලි 04 දින හා එන්නත් කුප්පි 25,500 ක් මාස 8 ක් ප්‍රමාදව එනම් 2023 ඔක්තෝබර් 06 සපයා තිබුණි. ඉතිරි එන්නත් කුප්පි 30,031 ක ප්‍රමාණය 2024 මාර්තු 07 වන දින වන විටත් වෛද්‍ය සැපයීම් අංශයට සපයා නොතිබුණි.

(ඈ) ඉහත දක්වා ඇති ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු හේතුවෙන් සාමාන්‍ය ඇණවුම යටතේ සපයා ගැනීමට බලාපොරොත්තු එන්නත් කුප්පි ප්‍රමාණය නියමිත සැපයුම් කාල රාමුව අනුව සපයා ගැනීමට නොහැකි වී තිබුණි. මෙම හේතුවෙන් හදිසි මිලදී ගැනීමකට යොමු වීමට සිදුවී තිබුණු අතර 2023 මාර්තු 07 දිනැති අංක 2023/SPC/E/C/P/00166 දරන හදිසි ඇණවුම යටතේ එන්නත් කුප්පි 13,500 ක් ඒකකයක් රු.24,832.50 කට ABC Pharma Services (Pvt) Ltd සමාගමෙන් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව ඉහත දක්වා ඇති ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද කිරීම හේතුවෙන් සාමාන්‍ය ඇණවුම යටතේ මිලදී ගත හැකිව තිබූ මිලට වඩා හදිසි මිලදී ගැනීම සඳහා ඉන්ඩෙන්ටු නිකුත් කල 2023 මැයි 24 දිනට එ.ජ.ඩොලරයක වටිනාකම රු.311.23 වූ අතර ඒ අනුව 2021 වර්ෂයේ ඇණවුම අනුව මෙම ඖෂධ ඒකකයක් එදිනට (එ.ජ.ඩො.61 x රු.311.23) රු.18,985.03 ක් විය. ඒ අනුව එන්නත් කුප්පියක් සඳහා රු.5,847.47 ක් වැඩියෙන් ගෙවීම හේතුවෙන් රු.78,940,845 ක මුදලක් වැඩිපුර ගෙවීමක් සිදු වී තිබුණි.

04. Phenytoin Sodium Injection 250mg / 5ml (SR 00303704)

මෙම එන්නතේ 2022 හා 2023 වර්ෂයේ ඖෂධ අවශ්‍යතාවය වෙනුවෙන් 2022 වර්ෂය සඳහා ඇණවුම් 08 ක් හා 2023 වර්ෂය සඳහා එක් ඇණවුමක් වශයෙන් වෛද්‍ය සැපයීම් අංශය මඟින් ඖෂධ නීතිගත සංස්ථාව, ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව හා වෛද්‍ය සැපයීම් අංශය වෙත නිකුත් කරන ලද ඇණවුම් වලින් 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කළ ඇණවුම් 07 ක් අවලංගු කර තිබුණි. මේ අනුව වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩාවල 2021 දෙසැම්බර් 02 සිට 2023 ජූනි 15 දක්වා අවස්ථා 5 කදී මෙම එන්නත හිඟ වී තිබුණි.මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මෙම ඖෂධය මිලදී ගැනීම වෙනුවෙන් වූ ඖෂධ ඒකක 34,000 ක 2022/SPC/N/R/P/00003 හා 2021 පෙබරවාරි 23 දිනැති සාමාන්‍ය ඇණවුම වසර 01 මාස 11 කට පසු අවලංගු කර 2022 නොවැම්බර් 30 දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ බද්ධ ව්‍යාපාරයක් වන Yaden Laboratories (Pvt.) Ltd මඟින් එන්නත් 24,000ක් මිලදී ගැනීමට තීරණය කර තිබුණි.

(ආ) නිසි පරිදි සාමාන්‍ය ඇණවුම ක්‍රියාත්මක නොවීම නිසා හදිසි අවශ්‍යතාවය මත 2022/SPC/X/R/P/00589 දරන ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ මෙම ඖෂධයෙන් ඒකක 25,000 ක් 2022 නොවැම්බර් 30 දිනට සපයා ගැනීම සඳහා ගැනුම් ඇණවුම 2022 සැප්තැම්බර් 09 දින ඖෂධ නීතිගත සංස්ථාව වෙත නිකුත් කර තිබුණු අතර අවම ලංසුකරු වෙත එන්නත් ඒකකයක් එ.ජ.ඩො. 4.25 (ශ්‍රී ලංකා මුදලින් ඒකකයක් රු.1,549.32) ampoule වටිනාකමට ටෙන්ඩරය ප්‍රදානය කිරීමට 2022 ඔක්තෝබර් 06 ප්‍රසම්පාදන අනුමැතිය ලැබී තිබුණි. සැපයුම්කරුගේ NMRA හි නැවත ලියාපදිංචි සහතිකය සැපයීමට ප්‍රමාද වීම හා ඉන්දියානු ණය පහසුකම ලබා ගැනීමට ප්‍රමාද වීම මත තොගය ලැබිය යුතු දිනය වූ 2022 දෙසැම්බර් 31 දිනෙන් මාස 03 ක් ප්‍රමාද වී 2023 මාර්තු 27 දින ගබඩාවට මෙම එන්නත් තොගය ලැබී තිබුණි.

(ඇ) 2022/SPC/N/R/P/00003 දරන සාමාන්‍ය ගැනුම් ඇණවුම වෙනුවට 2023/SPM/N/R/P/00044 දරන ගැනුම් ඇණවුම 2022 නොවැම්බර් 02 දින වෛද්‍ය සැපයීම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට එන්නත් ඒකක 24,000 ක් 2023 ජනවාරි 01 හා 2023 මාර්තු 01 දිනයන්හිදී ඒකක 12,000 ක් බැගින් මිලදී ගැනීමට ඉදිරිපත් කර තිබුණි. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් එම දිනයන්හිදී මෙම ඖෂධ සැපයීමට අපොහොසත් වී තිබුණු අතර ඊට මාස 07 කට පසුව එනම් 2023 ජූලි 07 දින ඒකක 24,000 ක් ඒකකයක් රු.4,600 කට Yaden Laboratory ආයතනය මඟින් මිලදී ගෙන සැපයුම් කර තිබුණි.

(ඈ) 2022 සැප්තැම්බර් 23 දින ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ කරන ලද ඇණවුමට අදාළව ඇගයීම් කරන ලද ඉහත ඖෂධයේ එක් ampoule එකක් එ.ජ.ඩො. 4.25 සමාන රු.1,542.32 වටිනාකමකට විදේශීය සැපයුම්කරුවකු වන Ciron Drugs Pharmaceutical යන ආයතනය වෙත ප්‍රදානය කොට ආනයනය කිරීමට කටයුතු කර තිබුණද, එදිනට මාස 1 ½ කට පසු එනම් 2022 නොවැම්බර් 02 දින රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හරහා Yaden Laboratory ආයතනය මඟින් මෙම ඖෂධයේ එක් ampoule එකක් රු. 4,600 වැනි මිලකට මිලදී ගැනීම වෙනුවෙන් ඇණවුම් කර තිබුණි. ඒ අනුව කුඩා කාල පරාසයක් තුළ විදේශ විනිමය හුවමාරු අනුපාතය විශාල වශයෙන් වෙනස් වී නොමැති අවස්ථාවක (2022.09.23 US$ 1 = Rs. 359.18, 2022.11.02 - US$ 1 = Rs. 360.71) ඉහත අයුරින් ආනයනය කරන ඒකකයක මිල හා දේශීය වශයෙන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) හරහා මිලදී ගනු ලබන ඒකකයක මිල අතර රු.3,058 ක (4600 – 1542) වෙනසක් වී තිබුණි. ඒ අනුව ආනයනික මිලට සාපේක්ෂව ඉහළ මිලකට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) හරහා Yaden Laboratory ආයතනය වෙතින් මිලදී ගෙන තිබුණු අතර එය ආනයන මිලට සාපේක්ෂව සියයට 198 ක ප්‍රතිශතයක් වී තිබුණි. ඒ අනුව මනා ප්‍රසම්පාදන වැඩපිළිවෙලක්

නොමැති වීම හේතුවෙන් රු.73,392,000 ක් මෙම මිලදී ගැනීම වෙනුවෙන් වෛද්‍ය සැපයීම් අංශයට අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

05. Thiamine Hydrochloride Injection 100mg/2ml Ampoule (SR 00402702)

මෙම එන්නත මිලදී ගැනීම සඳහා 2021 සිට 2023 වර්ෂය දක්වා ඇණවුම් 06ක් ක්‍රියාත්මක වූ අතර ඉන් ඇණවුම් 2 ක් හිටපු සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අවලංගු කර තිබුණි. මෙම අවලංගු කිරීම් නිසා 2021 ඔක්තෝබර් 06 සිට 2022 සැප්තැම්බර් 20 දක්වා වසරකට ආසන්න කාලයක් ඖෂධ ගබඩාවේ මෙම එන්නත ශූන්‍ය වී තිබුණි. මේ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණයන් කෙරේ.

(අ) මෙම එන්නතේ 2022 වර්ෂයේ අවශ්‍යතාවය වෙනුවෙන් 2021 පෙබරවාරි 27 දිනැති අංක 2022/SPC/N/R/P/00042 දරන සාමාන්‍ය ඇණවුම රාජ්‍ය ඖෂධ නිතීගත සංස්ථාවට ඉදිරිපත් කළද, එය අස්ථානගත වීම මත වසරකට පසුව 2022 මාර්තු 01 දින නැවත ඇණවුමක් ඉදිරිපත් කර තිබුණු අතර අස්ථානගත වූ ඇණවුම සම්බන්ධයෙන් පසු විපරම් සිදු නොකිරීම මත 2022 වර්ෂයේ ඖෂධ හිඟතාවයක් ඇතිවී තිබුණි.

(ආ) නැවත මෙම ඇණවුම එම ඇණවුම් අංකයෙන්ම 2022 මාර්තු 01 දින සංස්ථාවට ඉදිරිපත් කිරීමෙන් පසු එන්නත් ඒකක 220,000 ක් මිලදී ගැනීම සඳහා අවම ලංසු ඉදිරිපත් කරන ලද m/s Ciron Drugs and Pharmaceauticals (Pvt) Ltd ආයතනය වෙත ඒකකයක් එ. ජ. ඩො 0.149 කට (රු.41.72කට සමාන) මුළු වටිනාකම එ.ජ.ඩො 32,780 කට කොන්ත්‍රාත්තුව 2022 ජූලි 05 දින ප්‍රදානය කර තිබුණි.

(ඇ) එසේ වුවද, එවකට පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මඟින් මිලදී ගැනීම මත 2022 නොවැම්බර් 30 දිනැති සෞඛ්‍ය ලේකම්ගේ ලිපිය මඟින් මෙම සාමාන්‍ය ඇණවුම අවලංගු කර මෙම සාමාන්‍ය ඇණවුම ප්‍රදානය කිරීමෙන් මාස 7කට පසුව 2023 පෙබරවාරි 15 දින ඒකකයක් රු.175ක මිලකට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ බද්ධ ව්‍යාපාරයක් වූ Yaden Laboratories මඟින් මිලදී ගෙන තිබුණි.

(ඈ) 2022 වර්ෂයට අදාළ අංක 2022/SPC/N/R/P/00042 දරන ඇණවුම මඟින් රු.41.72ට එන්නත් මිලදී ගැනීමට හැකියාව තිබියදී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට අයත් බද්ධ ව්‍යාපාරයක් වූ Yaden Laboratories ආයතනය වෙතින් ලබාගැනීමට කළ තීරණය 2023 වර්ෂයේ අවශ්‍යතාවය වන සාමාන්‍ය ඇණවුම වූ අංක 2023/SPM/N/R/P/00041 දක්වා දීර්ඝ වී තිබුණි. මේ අනුව එන්නත් තොගය 2023 ජනවාරි 02 ඉල්ලුම් කළද ඉන් මාස එකහමාරකට පසුව එන්නත් 149,240ක් ඒකකයක් රු.175 බැගින් හා 2023 සැප්තැම්බර් 24 දින ඉතිරි එන්නත් ඒකක 50,760 මාස 09කට පසු රු.250 බැගින් වෛද්‍ය සැපයීම් අංශයට සැපයීම් කර තිබුණි. මේ අනුව 2022 වර්ෂය සඳහා අවශ්‍ය වූ එන්නත් 2023 වර්ෂය තුළදී වෛද්‍ය සැපයීම් අංශ ගබඩාවට ලැබී තිබුණි.

(ඉ) සාමාන්‍ය ඇණවුම නිසි පරිදි ක්‍රියාත්මක නොවීම මත 2022 ජුනි 28 දිනැති අංක 2022/SPC/E/R/P/00479 දරන හදිසි මිලදී ගැනුම් ඇණවුම යටතේද එන්නත් ඒකක 1ක් රු.177 බැගින් එන්නත් ඒකක 33,000ක් 2022 සැප්තැම්බර් 19 ප්‍රසම්පාදනය කර මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. මෙම ප්‍රසම්පාදනයේදී අවම ලංසු ඉදිරිපත් කළ

ලංසුකරුට එන්නත සැපයීම සඳහා සති 06ක් ගත වීම යන සාධකය පදනම්ව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය නොමැති තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රතික්ෂේප කරන ලද Yaden International ආයතනය වෙත 2022 අගෝස්තු 30 දිනැති හදිසි ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව දින 05ක් ඇතුළත ඖෂධ Ampoules 33,000 ක් ඒකකයක් රු 177ක මුළු වටිනාකමට පිරිනැමීමට තීරණය කර තිබුණු අතර එම එන්නත් 2022 සැප්තැම්බර් 16 දින ගබඩාවට ලැබී තිබුණි.

(ඊ) හදිසි ප්‍රසම්පාදන යටතේ Yaden International විසින් දින 05කින් සැපයීමට පොරොන්දු වූ මෙම හදිසි ප්‍රසම්පාදනය සඳහා දින 9ක් වැඩිපුර ගතකර එන්නත් සපයා තිබුණ අතර ජාතික ඖෂධ තත්ත්ව සහතික රසායනාගාරය (NMQAL) හා වෛද්‍ය සැපයීම් අංශය පිළිවෙලින් 2023 අප්‍රේල් 06 හා 2023 අප්‍රේල් 25 දිනැති ලිපි මඟින් මුළු එන්නත් කාණ්ඩයම භාවිතයෙන් ඉවත් කර ගන්නා ලෙස ඉල්ලා සිටියද 2023 අප්‍රේල් 06 වන විට ගුණත්වයෙන් තොර මෙම එන්නත් සම්පූර්ණ තොගය රෝහල්වලට නිකුත් කර තිබුණි.

(උ) එසේම අංක 2022/SPC/N/R/P/00042 දරන ගැනුම් ඇණවුමට අනුව එන්නත් ඒකකයක් එ.ජ.ඩො. 0.149 කට (රු. 41.72) සැපයීමට සැපයුම්කරු එකඟ වී තිබියදී එය අවලංගු කර අංක 2022/SPC/E/R/P/00479 දරන ගැනුම් ඇණවුමට අනුව එ.ජ.ඩො. 0.49 කට සමාන රු.177 කට වෙනත් සැපයුම්කරුවෙකු වෙත හදිසි ඇණවුම ලබාදීම හා අංක 2022/SPC/N/R/P/00042 දරන ඇණවුම අවලංගු කර රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ බද්ධ ව්‍යාපාරයක් වූ Yaden Laboratories හරහා මිලදී ගැනීම වෙනුවෙන් වූ 2022 නොවැම්බර් 01 දිනැති අංක 2023/SPM/N/R/P/00041 දරන ගැනුම් ඇණවුම ඉහත ආයතන 02 වෙත ලබාදීම තුලින් වෛද්‍ය සැපයීම් අංශයට රු.34,527,550 ක හඳුනා ගත හැකි අලාභයක් දැරීමට සිදු වී තිබුණි.

(ඌ) 2022/MSD/V/R/P/00085 දරන ඇණවුම යටතේ හදිසි මිලදී ගැනීම් මත ඒකක 100,000ක් මිලදී ගැනීමට ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ඉතිරි මුදල් භාවිතා කරමින් හදිසි ප්‍රසම්පාදනය සිදුකිරීම සඳහා අභිලාෂ ප්‍රකාශ කිරීමේ ආරාධනය මඟින් අඩුම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුට ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය (WOR) මත ඒකකයක් එ.ජ.ඩො. 0.045 හා මුළු වටිනාකමට එ.ජ.ඩො. 4500 වටිනාකමට ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණද 2022 නොවැම්බර් 30 හිටපු සෞඛ්‍ය ලේකම් විසින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ බද්ධ ව්‍යාපාරයක් මඟින් ඖෂධ සපයන බව දන්වා එම ඇණවුම අවලංගු කර තිබුණි.

(එ) 2021 ඔක්තෝබර් 06 සිට 2022 සැප්තැම්බර් 16 දක්වා එන්නත් හිඟ වීම තුළ ඒවා දේශීය වෙලඳපොලෙන් මිලදී ගත්තේද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඒ) තවද 2022/SPC/X/R/P/00274 ඇණවුම යටතේ හදිසි අවශ්‍යතාවය මත ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ එන්නත් 400,000 ක් මිලදී ගැනීම සඳහා 2022 අප්‍රේල් 30 අවශ්‍යතාවය මත 2022 මාර්තු 24 දින ඇණවුම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ඉදිරිපත් කළ ද ඊට අදාළ ඖෂධ තොගය 2023 පෙබරවාරි 17 හා 25 යන දිනයන්හිදී එනම් ඇණවුම් දිනෙන් මාස 11 කට පසුව වෛද්‍ය සැපයීම් අංශයට ලැබී තිබුණි. මේ අනුව වෛද්‍ය සැපයීම් අංශයේ 2022 වර්ෂයේ අවශ්‍යතාවය සපයා ගැනීමට නොහැකි වී තිබුණි.

06. Fentanyl Citrate Injection 100mcg in 2ml ampoule ඖෂධය (SR 00000301)

ශල්‍යකර්ම සඳහා වේදනා නාශක අන්තරායකර (Narcotic) ඖෂධයක් ලෙස භාවිතා කරන මෙම ඖෂධය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2022 සාමාන්‍ය වාර්ෂික ඇණවුම පිළියෙල කර නොතිබුණු අතර ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ ඖෂධ ඒකක 720,000 ක් සඳහා 2022/SPC/X/R/P/00287 දරන ඇණවුම වෛද්‍ය සැපයීම් අංශය විසින් ක්‍රියාත්මක කර තිබුණි. එම ඇණවුමේ පළමු තොගය වූ ඒකක 360,000 ප්‍රමාණය සැපයුම්කරු විසින් 2022 නොවැම්බර් 28 වන දින වෛද්‍ය සැපයීම් අංශයට සපයා තිබුණු අතර එම තොගය මාස 6 ක කාලක් සඳහා ප්‍රමාණවත් වී තිබුණි.

(ආ) 2021 වර්ෂයට අදාළ අතිරේක ඇණවුමක් ලෙස ඒකකයක් රු.52.70 ක මිලකට ඒකක 187,500 ක ඇණවුමක් Yichang Humanwell Pharmaceuticals Co Ltd යන විදේශීය සමාගම වෙත 2022 නොවැම්බර් 16 දින යොමුකර තිබුණ ද එම ඇණවුමට අදාළ තොග ලබා ගැනීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉහත ‘‘අ‘‘ සහ ‘‘ආ‘‘ යන නිරීක්ෂණ අනුව මෙම ඖෂධය 2022 දෙසැම්බර් සිට 2023 මැයි දක්වා හිඟව නොතිබුණු බව සහ හදිසි මිලදී ගැනීමකට යොමු වීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බව නිරීක්ෂණය විය. නමුත් සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් ඒකක 180,000 ක් මිලදී ගැනීමේ 2022/SPC/E/R/P/00735 දරන ඇණවුම ක්‍රියාත්මක කර 2022 දෙසැම්බර් 09 දින ඉන්ඩෙන්ටුව ඒකකයක් රු.162.50 ක මිලකට ඉහත සමාගමට යොමුකර තිබුණි. එම ඖෂධ තොගය 2023 අප්‍රේල් 04 දින වෛද්‍ය සැපයීම් අංශයට ඖෂධ සැපයීමට නියමිත දිනය වූ 2023 ජනවාරි 13 දින ඉක්මවා දින 80 ක් ප්‍රමාද කර සපයා තිබුණි. ඒ අනුව රජයට සිදුකර තිබුණු පාඩුව ආසන්න වශයෙන් රු.19,767,000 ක් විය.

(ඈ) 2023 වර්ෂය සඳහා මාස 7 ක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණු 2023/SPC/N/R/P/00037 දරන ඇණවුම මඟින් ඒකක 300,000 ක අවශ්‍යතාවයක් ඉල්ලා තිබුණු අතර එම ඇණවුම රු.42.12 ක අවම මිල ඉදිරිපත් කරන ලද 2021 වර්ෂයේ අතිරේඛ ඇණවුම සහ 2022 වර්ෂයේ හදිසි ඇණවුම ලබා දුන් Yichang Humanwell Pharmaceuticals Co Ltd යන ඖෂධ නිෂ්පාදන සමාගම වෙත ලබා දීමට 2023 පෙබරවාරි 09 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. එසේ තිබියදී 2023 පෙබරවාරි 22 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අංක SH/Misc/03/2022 දරන ලිපිය මඟින් මෙම ඇණවුමට දෙවන වැඩිම මිල වූ රු.184 ඉදිරිපත් කරන ලද ලංසුකරුවකු වන Yaden Laboratories (pvt) Ltd ආයතනය මෙම ඖෂධය ඇතුළුව තවත් ඖෂධ 9 ක් දේශීය වශයෙන් නිෂ්පාදනය කර සැපයිය හැකි තත්ත්වයේ පසුවන බැවින් සහ එම නිෂ්පාදිතයන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි වී ඇති බැවින් ඉහත ඖෂධය ඇතුළු තවත් ඖෂධ 09කට අදාළ වර්තමාන ඇණවුම් අවලංගු කරන ලෙසත් අනාගතයේදී එම ඖෂධ සඳහා මිල කැඳවීම් කිරීමෙන් වැළකී සිටින ලෙසත් දන්වා තිබුණි. ඒ අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් මෙම ඇණවුම් අවලංගු කර තිබුණි. නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉහත ලිපිය නිකුත් කරන අවස්ථාව වන විට මෙම දේශීය ඖෂධ නිෂ්පාදන පුද්ගලික ආයතනය වන

Yaden Laboratories (Pvt) Ltd ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචී නොසිටි අතර Good Manufacturing Practices Inspection (GMP) වාර්තාව පමණක් ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් ලබා ගෙන තිබුණි. මෙම GMP වාර්තාව ලබා ගැනීම මෙම ඖෂධය සඳහා NMRA සහතිකය ලබා ගැනීමක් ලෙස ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නොසලක බැවින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙම දේශීය ඖෂධ නිෂ්පාදන පුද්ගලික ආයතනය මෙම ඖෂධය ඇතුළුව තවත් ඖෂධ 9 ක් දේශීය වශයෙන් නිෂ්පාදනය කර සැපයිය හැකි තත්ත්වයේ පසුවන බව සහ එම නිෂ්පාදිතයන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචී වී ඇති බව තම ලිපියේ සඳහන් කිරීම සාවද්‍ය කරුණු දැක්වීමක් බව විගණනයේදි නිරීක්ෂණය විය.

(ඉ) මෙලෙස 2023 වර්ෂයේ ඇණවුම රු.42.12 ක ඒකක මිලකට ලබා ගත හැකිව තිබියදි, දේශීය සැපයුම්කරුවන්ගෙන් ඖෂධ හා වෛද්‍ය සැපයීම් මිලදී ගැනීම සඳහා වන මිල ගණන් තීරණය කරන මිල කමිටුව විසින් දේශීය ඖෂධ නිෂ්පාදන පුද්ගලික ආයතනයට මෙම ඖෂධයේ ඒකකයක් සඳහා සියයට 418ක මිල වැඩි වීමක් සහිතව රු.218.83 ක මිලක් ලබා දී තිබුණි. කෙසේ නමුත් මෙම මිල තීරණයට අදාළවන පිරිවැය ලේඛන සහ එහි ඇතුළත් පිරිවැය විචල්‍යන් තහවුරු කෙරෙන රෙගු ලියවිලි සහ මුල් ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.

(ඊ) ඒ අනුව 2023 පෙබරවාරි දින වන විටත් ඖෂධ සැපයීම සඳහා සුදානම් තත්ත්වයේ නොසිටි Yaden Laboratories (pvt) Ltd ආයතනයට මෙම ඖෂධය දේශීයව නිෂ්පාදනය කර සැපයිය හැකි බව දන්වමින් ඒ වන විටත් ඒකකයක් රු.42.12 ක අවම මිලකට පිරිනැමීමට තීරණය කර තිබුණු 2023/SPC/N/R/P/00037 දරන ඇණවුම අවලංගු කිරීම නිසා රජයට දැරිමට සිදුකර තිබුණු අතිරේක පිරිවැය රු.53,013,000 ක් විය.

07. Vancomycin Injection 500mg (SR 00103501)

මෙම ඖෂධයෙන් 2021 සිට 2024 වර්ෂයේ ලද ඇණවුම්වලට අදාළව එන්නත් කුප්පි 398,000 ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සැපයුම් කර තිබුණු අතර ඒ සඳහා රු.45,849,123 ක්වූ ගෙවීම් ඉල්ලීම් (හරපත) වෛද්‍ය සැපයීම් අංශය වෙත නිකුත් කර තිබුණි. මෙම සැපයුම් සම්බන්ධව පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) වෛද්‍ය සැපයුම් අංශයේ 2022 නොවැම්බර් 03 වන දිනැති අංක 2022/SPC/E/C/P/00731 දරන හදිසි ඇණවුම මඟින් දෙවන අවම මිල ලෙස එන්නත් කුප්පියක් රු.575 ක් ලෙස ඉදිරිපත් කල Slim Pharmaceuticals වෙත එන්නත් කුප්පි 48,000 ක් මිලදී ගැනීමට 2022 නොවැම්බර් 21 දින අමාත්‍යාංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව වෛද්‍ය සැපයුම් අංශයේ තොග ශූන්‍ය බව සඳහන් කර, ඇණවුම ප්‍රදානය කර තිබුණ ද 2022 නොවැම්බර් 16 දින පරිත්‍යාග ලෙස ඒකක 20,000 ක්ද, 2021 වර්ෂයේ සාමාන්‍ය ඇණවුම යටතේ ඒකක 70,000 ක් 2022 නොවැම්බර් 23 දින ලැබී තිබුණි. තවද 2022 දෙසැම්බර් 15 දිනට මෙම ඖෂධයේ මාසික අවශ්‍යතාවය ඒකක 18,977 ක් බව ස්වස්ථ පද්ධතියේ දත්ත අනුව නිරීක්ෂණය විය.කෙසේ නමුදු මෙම හදිසි ඇණවුමට අදාලව 2023 ජනවාරි 03 වන දින ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණි. තවද එම ඉන්ඩෙන්ටුවට අදාලව ඒකක 47,000 ක් දින 30 ක් හා ඒකක 1,000 ක් මාස 02 දින 05 ක ප්‍රමාදයක් සහිතව සපයා තිබුණි.

(ආ) තවද, 2021 වර්ෂයේ සාමාන්‍ය ඇණවුම යටතේ එ.ජ.ඩො. 0.53 (ඖෂධ තොගය නිෂ්කාශණය කරන ලද 2022 නොවැම්බර් 23 දිනට එ.ජ.ඩොලරයක් රු.371.76 ක් වූ අතර ඒ අනුව එන්නත් කුප්පියක් රු.197.03 ක් විය) කට මිලදී ගත් එන්නත හදිසි මිලදී ගැනීම් යටතේ රු.575 කට මිලදී ගැනීමට සිදුවීම තුළින් එන්නත් කුප්පි 48,000 ක් සඳහා රු.18,142,560 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.

(ඇ) වෛද්‍ය සැපයීම් අංශය විසින් අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන තොග ඇණවුම් නොකිරීම හේතුවෙන් සාමාන්‍ය ඇණවුම යටතේ රු.197.03 කට හා හදිසි මිලදී ගැනීම් යටතේ රු.575 කට මිලදී ගත් එන්නත විවිධ රෝහල් විසින් එන්නතක් රු.1,100 සිට රු.1,644 ක ඉහළ මිල පරාසයක විහිදෙන පරිදි එන්නත් කුප්පි 400 ක් රු.467,200 ක් වැය කර මිලදී ගෙන තිබුණි.

08. Decarbazine injection 200 mg Vial (SR - 01203301)

අන්තර්ජාලයේ දැක්වෙන තොරතුරු අනුව Decarbazine නැමැති මෙම ඖෂධය අයත් වන්නේ ඇල්කයිමේන් කාරක ලෙස හඳුන්වන ඖෂධ කාණ්ඩයටය. එය වසා පද්ධතියේ පිළිකා සහ මාරාන්තික මෙලනෝමා (සමේ පිළිකා වර්ගයක්) සඳහා ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගන්නා අතර, වෛද්‍යවරයෙකු විසින් තීරණය කරනු ලබන වෙනත් ආකාරයේ පිළිකාවලට ප්‍රතිකාර කිරීමටද භාවිතා කළ හැක.

(අ) ඒකක 1,500 ක් මිල දී ගැනීම සඳහා අංක 2022/SPC/V/R/P/00690 දරන ඇණවුම නිකුත් කර තිබුණු අතර එම ඇණවුම තිබියදී ඒ වෙනුවට අංක 2022/MSD/V/R/P/00074 දරන ඇණවුම නිකුත් කර තිබුණි. මෙම ඇණවුමට අදාළ ලිපිගොනුවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර විගණිත දින වන විටත් යථෝක්ත ඇණවුම දෙක ස්වස්ථ පද්ධතිය තුළ නිකුත් කළ ඇණවුම් ලෙස පෙන්නුම් කෙරෙන බව නිරීක්ෂණය විය.

(ආ) ඒකක 3,500 ක 2022 සාමාන්‍ය ඇණවුම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සීමාව තුළ ජාත්‍යන්තර තරඟකාරී ක්‍රමයට ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. ඇණවුම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබා දීම සඳහා දින 17 ක්ද ලංසු කැඳවීම සඳහා මාස 04 කට අධික කාලයක්ද ගත කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තෝරා ගැනීමට අදාළ නිර්දේශයන් විධිමත්ව හා නිශ්චිතව සඳහන් කර නොතිබුණි. එසේම ඇගයීම් වාර්තාවට අනුව අදාළ සාමාජිකයන් ගේ නම්, සඳහන් නොකර අත්සන් කර තිබුණි. ප්‍රසම්පාදන කමිටුව රැස්ව ඒකකයක මිල රු.1,480 යටතේ වලංගු ලියාපදිංචි සහතිකයක් ලබා ගැනීමට යටත්ව Esses Pharmacy (Pvt) Ltd ආයතනයට ඇණවුම පිරිනැමීමට තීරණය කර තිබුණි. මෙම තීරණය ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව රැස්වීමේ සිට දින 82 ක් ගත කර තිබුණි. සැපයුම්කරු විසින් විනිමය හුවමාරු අනුපාත වෙනස් වීම මත මෙම ඇණවුම සැපයිය නොහැකි බව දන්වා තිබුණි. අදාළ සැපයුම්කරුගෙන් ඇණවුම නිසි පරිදි භාර නොදීම සම්බන්ධව මාස 05 ක කාලයක් ගත වන තෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව ලිපි ගොනුව පරීක්ෂා කිරීමේ දී නිරීක්ෂණය විය. එසේම රු. 518,000 ක්වූ කාර්යසාධන සුරක්ෂණය ද අවලංගු වී ඇති බැවින් සැපයුම්කරුගෙන් අදාළ ඇණවුම නියමිත පරිදි නොලැබීම වෙනුවෙන් හානි

ප්‍රතිපූරණයක් කර ගැනීමට නොහැකි වී ඇති බවත්, මේ සම්බන්ධව ප්‍රසම්පාදන කමිටුවට සිය වගකීමෙන් බැහැර විය නොහැකි බවත් විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රසම්පාදන කමිටුව විසින් ඉහත කී ඇණවුම අවලංගු කිරීමටත් නැවත ලංසු කැඳවීමටත් තීරණය කර තිබුණි. ඒ අනුව ලියාපදිංචි හා පෙර සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා තිබුණි. මුල් ඇණවුම අවලංගු කිරීමට දින 37 ක කාලයක් ද, ඇණවුම අවලංගු කිරීමෙන් පසු නැවත ලංසු කැඳවීමට දින 55ක කාලයක් ගත කර තිබුණි. ඒකකයක් රු.1,480 කට සැපයීමට මුල් අවස්ථාවේ එකඟවූ, පසුව ඖෂධ සැපයීය නොහැකි බව දක්වමින් ඇණවුම අත්හිටවූ සැපයුම්කරු වූ The Esses Pharmacy (Pvt) Ltd ආයතනය ඒකකයක් රු.2,200ක මුදලකට නැවත ලංසු ඉදිරිපත් කර තිබුණි. මෙම ආයතනයේ කාර්යසාධන බැඳුම්කරය පවරාගෙන අසාධු ලේඛනගත කළ යුතු වුවද, එලෙස කටයුතු කර නොතිබුණි. දෙවන වර ලංසු කැඳවීමේදී ඒකකයක් එ.ජ.ඩො 2.65 කට ඖෂධ ලබා දීමට එකඟ වූ නව සැපයුම්කරු වන United Bio Tech ආයතනයට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය අලුත් කිරීමකට යටත්ව තෝරා ගැනීම පමණක් සිදු කර තිබුණු අතර, මෙම ඇණවුම සම්බන්ධ ඉදිරි කටයුතු විගණන දින දක්වා සිදු වී නොතිබුණි. කෙසේ වුවත්, ස්වස්ථ පද්ධතිය අනුව මෙම ඇණවුම පළමු ලංසු කැඳවීමෙන් අවලංගු කරන ලද The Esses Pharmacy (Pvt) Ltd ආයතනයේ නමින් ලැබිය යුතු ඖෂධයක් ලෙස දක්වා තිබුණි.

(ඈ) 2022 සාමාන්‍ය ඇණවුම ක්‍රියාත්මක නොවුණ පසුබිමක හදිසි ඇණවුමක් ලෙස අංක 2022/SPC/E/R/P/00744 දරන ඇණවුමට අනුව එන්නත් ඒකක 1,500ක් සැපයිය යුතුව තිබුණි. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සීමාව තුළ ලියාපදිංචි හා පෙර සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. ඇගයීම් වාර්තාවට අනුව විධිමත් හා නිශ්චිත නිර්දේශයක් ඉදිරිපත් කර නොතිබුණ අතර අදාළ සාමාජිකයන් ගේ නම්, සඳහන් නොකර අත්සන් කර තිබුණි. 2022 දෙසැම්බර් 30 වන දින ප්‍රසම්පාදන කමිටුව මෙම ලංසු අතරින් ඒකක මිල එ.ජ.ඩො.5.00 ක් ඉදිරිපත් කරන ලද, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා අයදුම් කර ඇති United Bio Tech ආයතනය වෙත අදාළ ලියාපදිංචිය දීර්ඝ කිරීම් සහතිකය හෝ WOR සසහතිකය ලබා ගැනීමට යටත්ව මෙම ඇණවුම ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණි. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ කළමනාකරුවෙකු විසින් වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ අමතා මෙම ඖෂධ තොගය ප්‍රතික්ෂේප කර තිබුණු බවත්, ස්ථායීතා දත්ත වාර්තාවක් හා උෂ්ණත්ව ගැටළුවක් හේතුවෙන් තොග භාර ගැනීම සඳහා සහතිකයක් ඉදිරිපත් කිරීමට අවශ්‍යව තිබුණ බවත් එම කාරණය සැපයුම්කරු වෙත යොමු කළ විට සහතිකයක් සහිතව දත්ත පැහැදිලි කිරීමේ ලිපියක් ඉදිරිපත් කර ඇති බවත් එම ලියවිලි සලකා බැලීමෙන් මෙම ඇණවුම පිළිගැනීමට කටයුතු යොදන ලෙසත් දක්වා තිබුණි. කෙසේ වුවත්, මෙම ඖෂධ තොගය 2023 මැයි 08 දින ලැබී තිබුණි. මෙම කළමනාකරුට මෙවැනි තාක්ෂණික කරුණක් සම්බන්ධයෙන් නිර්දේශයක් ලබාදීමට විධිමත් බලය පැවරීමක් තිබේද යන්න ගැටළුකාරී වූ අතර මෙම කරුණ සම්බන්ධයෙන් රසායනාගාර වාර්තාවක් ලබාගත යුතුව තිබුණු බව නිරීක්ෂණය විය. මිනිස් වසා පද්ධතියේ පිළිකා සහ මාරාන්තික මෙලනෝමා (සමේ පිළිකා වර්ගයක්) සඳහා ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගන්නා මෙවැනි ඖෂධයක ගබඩා උෂ්ණත්වය පිළිබඳව වඩාත් සැලකිලිමත් විය යුතු බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) 2023 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුම 2022 ජනවාරි මාසයේදි ලබාදිය යුතු වුවත්, 2022 ජුනි 01 දිනට අදාළව සකස් කරන ලද ඇණවුම් පාලන පත්‍රිකාව අනුව ඒකක 6000 ක් ඇණවුම් කළ යුතු වුවද, 2023/SPC/N/C/P/00081 දරන ඇණවුම යටතේ ඒකක 3,000 ක් මාස 11 ක පමණ ප්‍රමාදයක් සහිතව ඉදිරිපත් කර තිබුණි. ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. ඇගයීම් වාර්තාවට අනුව විධිමත් හා නිශ්චිත නිර්දේශයක් ඉදිරිපත් කර ද නොතිබුණ අතර අදාළ සාමාජිකයන් ගේ නම්, සඳහන් නොකර අත්සන් කර තිබුණි. ප්‍රසම්පාදන කමිටුව විසින් ඇණවුම් අතරින් අවම මිල ගණන් වූ රු.1,478.99 ක් ඉදිරිපත් කරන ලද United Bio Tech ආයතනයට ලියාපදිංචිය අලුත් කර ගැනීමට යටත්ව මෙම ඇණවුම ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණි. ඇණවුම නිකුත් කර ලංසු ඇගයීම සඳහා දින 120 කට ආසන්න කාලයක් ගත වී තිබුණු අතර ප්‍රසම්පාදන ඇගයීම් කටයුතු වලින් පසු ඇණවුම ප්‍රදානය කිරීම සඳහා දින 40 කට ආසන්න කාලයක් ගතකර තිබුණි. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය අලුත් කර ගැනීමට යටත්ව මෙම ඇණවුම ප්‍රදානය කර තිබුණද, අළුත් කරන ලද එම සහතිකය ලිපිගොනුව තුළ ඇතුළත් කර නොතිබුණද, 2023 ඔක්තෝබර් 11 දින මෙම ඖෂධ ලබා දී තිබුණි.

(ඊ) 2023 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුමෙන් ඒකක 3000 ක් පමණක් නිකුත් කිරීමට තීරණය කර තිබීම හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශය විසින් අංක 2023/SPC/E/R/P/00143 දරන ඒකක 1,500 **ක** ඇණවුම නැවත නිකුත් කර තිබුණි. ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම ඇණවුම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය ලද ඒකකයක් රු.12,800 ක සංශෝධිත මිල ඉදිරිපත් කළ Yaden International (Pvt) Ltd වන සැපයුම්කරු නිර්දේශ කර තිබුණි. 2023 ජූනි 30 දින සැපයිය යුතු වූ මෙම ඖෂධ තොගය 2023 නොවැම්බර් මස විගණිත දින වන විටත් සපයා නොතිබුණි. තවද ස්වස්ථ පද්ධතිය අනුව මෙම ඇණවුම ලැබිය යුතු ඇණවුමක් ලෙස දක්වා නොතිබුණි. කෙසේ වුවත්, මෙම ඇණවුමට පෙර ආසන්නව (දින 23 ක් ඇතුළත) සිදු කළ 2023/SPC/N/C/P/00081යටතේ ඒකක මිල රු.1,478 ක් බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර, මේ පිළිබඳව වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමුකර නොතිබුණි. දින 23 ක් ඇතුළත සියයට 780 ක මිල වැඩිවීමක් යටතේ සැපයුම්කරු තෝරා ගැනීම හා ඉන්ඩෙන්ටුව නිකුත් කිරීම සිදු කර තිබුණි. ඒ අනුව මෙම මිල ගණන් යටතේ ඇණවුම ක්‍රියාත්මක වූයේ නම් රු.16,983,000 ක මූල්‍යමය අලාභයක් රජයට දැරීමට සිදුවිය හැකි වී තිබුණි.

(උ) උක්ත ඇණවුමට අමතරව අංක 2023/SPC/T/R/P/00146 දරන ඒකක 1,000 ක ඇණවුම වෛද්‍ය සැපයීම් අංශයෙන් 2023 පෙබරවාරි 02 දින නිකුත් කර තිබුණි. ප්‍රසම්පාදනය වෙනුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණු අතර ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන අංශයේ අතිරේක ලේකම් විසින් පත්කරන ලද මිල කමිටුවක් විසින් මෙම මිලට ගැනීම සඳහා වූ නිර්දේශය ලබාදි තිබුණි. මිල කමිටුවක් පත් කිරීම සඳහා අතිරේක ලේකම්ට ලැබුණු අධිකාරි බලය විගණනයේදි තහවුරු නොවීය. මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා දින 02 ක් පමණක් ලබා දී තිබුණු අතර ඉතිරි කටයුතු නිමකර ඉන්ඩෙන්ටුව නිකුත් කිරීම සඳහා දින 61 ක් ගතකර තිබුණි. මේ අනුව මෙම හදිසිය මඟින් ලංසු ඉදිරිපත් කිරීමට ලබාදෙන කාලය සීමා කිරීම පමණක් සිදුවී තිබුණි. සැපයුම්කරු වූ Yaden International (Pvt) Ltd වෙත ඉදිරිපත් කරන ලද රු.13,000 ක ඒකක මිල රු.7,000 ක් දක්වා අඩුකර ඉන්ඩෙන්ටුව නිකුත්

කර තිබුණි. උක්ත සඳහන් කළ ආසන්න ප්‍රසම්පාදනය අනුව ඒකක මිල රු.1,478 ක් වූ අතර, රු. 7,000 යන මිල සැසඳීමේදි සියයට 374 ක පමණ වැඩි වීමක් විය. මෙම තොගය 2023 ජූලි 11 දින ලැබී තිබුණු අතර, මෙසේ වැඩි මිලකට ඖෂධ මිලදී ගැනීම හේතුවෙන් රු.5,522,000 ක මූල්‍යමය අලාභයක් රජයට දැරීමට සිදු වී තිබුණි. මෙම ප්‍රසම්පාදන තීරණය සඳහා අමාත්‍යමණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත් බව හෝ ප්‍රසම්පාදනය නියමිත පරිදි සිදුකළ බවට ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහතිකයක් ලබාගත් බවට හෝ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඌ) අංක 2023/SPC/X/R/P/00191 දරන ඒකක 4,500 ක ඇණවුම ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් ලබාගන්නා ලද වලංගු ලියාපදිංචි සහතිකයක් ලැබීමට යටත්ව ඇණවුම George Steuart Health (Pvt) Ltd ආයතනයට ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණ අතර සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් ද මෙම ආයතනය නිර්දේශ කර තිබුණි.ඒ අනුව මෙම ආයතනය විසින් රු.1,945.39 ක් ලෙස ඉදිරිපත් කරන ලද ඒකකයක මිල රු.1,945 දක්වා ශත 39 කින් අඩු කිරීමට එකඟ වී තිබුණු අතර. කාර්යසාධන බැඳුම්කරයක් ලබා දී නොතිබුණි. මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා දින 02 ක් පමණක් ලබා දී තිබුණු අතර ඉතිරි කටයුතු නිමකර ඉන්ඩෙන්ටුව නිකුත් කිරීම සඳහා දින 90 ක් ගතකර තිබුණි. මේ අනුව මෙම හදිසිය ලංසු ඉදිරිපත් කිරීමට සැපැයුම්කරුවන් වෙත ලබාදෙන කාලය සීමා කිරීමට පමණක් සීමා වී තිබුණි. මෙම ප්‍රසම්පාදන තීරණය සඳහා අමාත්‍යමණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත් බව හෝ ප්‍රසම්පාදනය නියමිත පරිදි සිදුකළ බවට ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහතිකයක් ලබාගත් බවට හෝ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ඖෂධයේ ආයුකාලය මාස 24 ක් බව සඳහන් කර තිබුණද, ඉන්ඩෙන්ටුවේ එය මාස 12 ක් ලෙස දක්වා තිබීම විගණනයේදී ගැටළු සහගත විය.

(එ) උක්ත සඳහන් කරුණු අනුව 2023 වර්ෂය සඳහා මෙම ඖෂධය වෙනුවෙන් අවශ්‍ය තොග ඒකක 6,000 ක් ලෙස පුරෝකථනය කර තිබුණද, ඉන් ඒකක 3,000 ක සාමාන්‍ය ඇණවුමක් නිකුත් කර තිබුණි. අඩුවෙන් ඖෂධ ඇණවුම් කිරීම හේතුවෙන් මෙලෙස හදිසි ප්‍රසම්පාදන අවස්ථා 02 කට යොමු වී වැඩි මිලට ඖෂධ මිලදී ගැනීමට යොමු වීම හේතුවෙන් අතිරේක ඒකක 5500 ක් මිලට ගැනීම සඳහා රු.15,872,500 ක මූල්‍යමය අලාභයක් රජය විසින් දරා තිබුණි.

(ඒ) 2024 වර්ෂය සඳහා සාමාන්‍ය ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා ඇණවුම් පාලන පත්‍රිකාවක් 2023 නොවැම්බර් 29 දින වනවිටත් සකස්කර නොතිබුණි. ඒ අනුව 2024 වර්ෂය සඳහා ඇණවුම නිකුත් කරන්නේද යන්න පිළිබඳ තීරණයකට එළඹ නොතිබුණි. මෙම තත්ත්වය තුළ 2024 වර්ෂයේදිද හදිසි මිලදි ගැනීම් සඳහා යොමු විමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

(ඔ) 2023 නොවැම්බර් 21 දිනට මෙම ඖෂධයේ ඒකක 25,020 ක් ලැබීමට ඇති බව ස්වස්ථ පද්ධතිය තුළ පෙන්නුම් කෙරුණි. නමුත් මෙම ඒකක ගණන සැකසුනු ආකාරය එම පද්ධතිය තුළ හඳුනා ගැනීමට නොහැකි විය.

09. Fluconazole Capsule 50mg ඖෂධය (SR 00107101)

දිලීර ආසාදන සඳහා ප්‍රතිජීවක හා අත්‍යවශ්‍ය මෙම ඖෂධය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) නිවැරදි පුරෝකථනයකින් තොරව 2021 සාමාන්‍ය ඇණවුමේ ඒකක ප්‍රමාණයන් අඩුකිරීමත්, වෛද්‍ය සැපයීම් අංශය සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව යන ආයතනවල අකාර්යක්ෂමතාවය මත ප්‍රසම්පාදන කටයුතුවල සිදුව තිබුණු ප්‍රමාදයන් හේතුවෙන් 2022 සාමාන්‍ය ඇණවුම සැපයුම්කරු විසින් ප්‍රතික්ෂේප කිරීමත් නිසා හටගෙන තිබුණු ඖෂධ හිඟය සඳහා ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචියෙන් නිදහස් කිරීම් (WOR) සහතිකයක මත 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන පනතේ 109 වන වගන්තියට පටහැනිව මෙම ඖෂධය 2022 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු අතර ඖෂධ ඒකකයක් වෙනුවෙන් එ. ජ. ඩො. 0.028 ක් එනම් 2021 සහ 2022 වර්ෂවල සාමාන්‍ය ඇණවුම් සඳහා ලැබී තිබුණු මිලට වඩා එ. ජ. ඩො 0.00452 කින් වැඩියෙන් ගෙවා තිබුණි. ඒ අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ඒකක 979,200 ක් වෙනුවෙන් එ. ජ. ඩො. 4,425.9 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.

(ආ) මෙම ඖෂධයට අදාළව 2022 වර්ෂයේදී තවත් ඇණවුමක් සඳහා ගැනුම් ඇණවුම 2022 නොවැම්බර් 03 දින සැපයුම්කරුවකු වෙත ලබා දී තිබුණු අතර ඒ සඳහා ඉදිරිපත් කර තිබුණු එ.ජ.ඩො. 0.0214 ක ඒකක මිල 2022 වර්ෂයේ වූ අනෙකුත් ඇණවුම් සඳහා ඉදිරිපත් වූ මිල ගණන්වලට වඩා අඩු මිලක් විය. නමුත් දේශීය ඖෂධ නිෂ්පාදකයන් වෙත යොමුවීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් 2023 ජනවාරි 12 දින නිකුත් කර තිබුණු අංක SH/MISC/03/Medi.Equip දරන ලිපිය පදනම් කර ගෙන එම ඇණවුම අවලංගු කර තිබුණි.

(ඇ) අංක අමප/18/1883/814/056 දරන 2018 ඔක්තෝබර් 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඖෂධ දේශීය ඖෂධ නිෂ්පාදකයකුගෙන් මිලදී ගන්නේනම් ඖෂධ ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමට (Buy Back Guarantee) එළඹිය යුතු වුවත් එලෙස ඖෂධ ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමකට එළඹීමකින් තොරව 2023 වර්ෂයේදී මෙම ඖෂධය Newgen Lanka Health Care pvt Ltd යන දේශීය ඖෂධ නිෂ්පාදන සමාගමෙන් මිලදී ගෙන තිබුණි. මේ නිසා 2023 වර්ෂයේදී මාස 3 සිට මාස 6 දක්වා ප්‍රමාදයකින් යුතුව ඖෂධ සැපයීම හරහා රජයට සිදුවන අලාභ අයකර ගැනීමේ ක්‍රමවේදයක් නොතිබුණි.

(ඈ) මෙම ඖෂධයේ ඒකකයක් සඳහා මිල කමිටුව විසින් 2023 වර්ෂයේදී රු.22.64 ක මිලක් ලබා දී තිබුණද එම මිල තුළ අන්තර්ගත පිරිවැය විවිධාන් මොනවාද යන්න සහ එම පිරිවැය විවිධාන් රේගු ලියවිලි සහ මුල් ලේඛන මඟින් තහවුරු කර ගෙන නොතිබුණි. මෙලෙස මිල කමිටුව ලබා දී තිබුණු ඒකක මිල 2022 වර්ෂයේ විදේශීය සැපයුම්කරුවන් ඉදිරිපත් කර තිබුණු මිලට වඩා සියයට 170 කට ආසන්න වැඩි වීමක් බව නිරීක්ෂණය විය. ඒ අනුව වෛද්‍ය සැපයීම් අංශය විසින් ඒකක 475,500 ක් වෙනුවෙන් රු.6,785,385 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.

10. Trastuzumab Injection 440mg (SR 01205102)

පියයුරු හා ආමාශය ආශ්‍රිත පිළිකා සඳහා භාවිතා කරනු ලබන ඉහත ඖෂධය මිලදී ගැනීම සඳහා 2022 වර්ෂයේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ඉදිරිපත් කරන ලද ඇණවුම්වලට අදාළව එන්නත් කුප්පි 10,240 ක් සැපයුම් කර ඒ සඳහා රු.655,983,655 ක ගෙවීම් ඉල්ලීම් (හරපත්) වෛද්‍ය සැපයීම් අංශය වෙත නිකුත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) වෛද්‍ය සැපයීම් අංශය විසින් 2021 ජූනි 17 දිනැතිව නිකුත් කල අංක 2022/SPC/N/C/P/00034 දරන ඇණවුම මඟින් එකක් රු.56,000 බැගින් ඉහත ඖෂධයේ එන්නත් කුප්පි 8,400 ක් මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයේ දෙවන තොගය වන එන්නත් කුප්පි 3,040 ක් ගෙන්වීම සඳහා අනුමැතිය ලබා දීම පළමු තොග ඇණවුම අනුමත කල දින සිට මාස 04 දින 19 ක් ප්‍රමාද කර තිබුණි. එම ප්‍රසම්පාදනය යටතේ වන තෙවන තොගය (එන්නත් කුප්පි 4,000) සැපයීම නියමිත දිනය වන 2023 අගෝස්තු 31 දිනට වඩා මාස 2 ක ප්‍රමාදයක් සහිතව 2023 නොවැම්බර් 06 දින සිදු කර තිබුණි. ඉහත ඇණවුමට අදාල වන 2022 මාර්තු 09 දින විවෘත කරන ලද රු.101,080,000 ක් වූ ණයවර ලිපිය වහාම අවලංගු කළ යුතු වුවත් ණයවර ලිපියේ කල් ඉකුත් වූ දින සිට මාස 14 ක පමණ කාල ප්‍රමාදයක් සහිතව ඒ සඳහා වන දැන්වීම බැංකුවට නිකුත් කර තිබුණි.

(ආ) වෛද්‍ය සැපයීම් අංශයේ අංක 2022/SPC/E/C/P/00497 දරන එන්නත් කුප්පි 1,000 ක් මිලට ගැනීමේ ඇණවුමට අදාල ප්‍රසම්පාදනය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචිය සහිත සැපයුම්කරුවෙකු වෙත නිර්දේශය ලබා දී තිබුණි. නමුත් ඒ පිළිබඳ සැලකිලිමත් නොවී ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් නොමැති Advitec International ආයතනය වෙත ඉහත ඇණවුම එකක් රු.52,450 බැගින් වූ මිලකට සැපයීම සඳහා ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි.

එසේ වුවද Advitec International (Pvt) Ltd ආයතන විසින් සැපයුමට අදාල ඉන්ඩෙන්ටුව නිකුත් කිරීමටත් ප්‍රථමව එන්නත් කුප්පි 500 ක් වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයා තිබූ අතර එය මතභේදාත්මක තත්ත්වයක් බව නිරීක්ෂණය විය.

(ඇ) මෙම එන්නත් කුප්පි 500 මෙන්ම ඉහත (ආ) යටතේ දක්වා ඇති ඇණවුමට අදාල ඉතිරි එන්නත් කුප්පි 500 සැපයීමේදී "අවම මාස 24 ක ජීව කාලයක් සහිතව සැපයිය යුතුය" යන සැපයුම් කොන්දේසිය වෛද්‍ය සැපයුම් අංශයෙන් පනවා තිබුණි. නමුත් ඇණවුමට අදාල එන්නත් කුප්පි 1,000 හිම ජීව කාලය මාස 05,06 ත් අතර අඩු කාලයක් බව නිරීක්ෂණය වූ බැවින් මෙම ඇණවුම සැපයීමේදීම සැපයුම්කරුවන් විසින් සැපයුම් කොන්දේසි උල්ලංඝණය කර තිබුණි.

(ඈ) ඉහත (ආ) යටතේ දක්වා ඇති ඇණවුම එන්නත් කුප්පි 2,000 ක ඇණවුමක් ලෙස සංශෝධනය කිරීම වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂකගේ 10/2022 දරන දින රහිත ලිපිය මඟින් සිදු කර ඇති බව නිරීක්ෂණය විය.එම ඇණවුමට අනුව ඉහත Advitec International ආයතනය වෙත තවත් අමතර එන්නත් කුප්පි 1,000 ක් සැපයීමට අවශ්‍ය ඉඩකඩ සලසා තිබුණි. ඒ අනුව ඉහත ආයතනය විසින් දෙවන ඇණවුමට අදාලව

එන්නත් කුප්පි 840 ක ප්‍රමාණයක් සපයා තිබූ අතර එන්නත් කුප්පි වල ජීව කාලයද මාස 02 ත් 03 ත් අතර අඩු අගයක පැවතිණි. දෙවන ඇණවුමට අදාල ඉතිරි එන්නත් කුප්පි 160, 2024 මාර්තු 07 දින වන විටත් සපයා නොතිබුණු අතර සැපයුම සඳහා වූ කාර්යසාධන සුරක්ෂණයද කල් ඉකුත් වී තිබුණි.

(ඉ) වෛද්‍ය සැපයීම් අංශයේ අංක 2022/SPC/E/C/P/00742 දරන ඇණවුමට අනුව එන්නත් කුප්පි 3,000 ක් මිලට ගැනීමේ ප්‍රසම්පාදනයට ඉදිරිපත් කර තිබූ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය රහිත ආයතනයක ලංසුව වන ඒකක මිල රු.60,950 ක් වන අවම මිල නොසලකා හැර දෙවන අවම මිල වන රු.63,450 ක ලංසුව සඳහා ප්‍රසම්පාදනය ප්‍රදානය කර තිබුණි. එම ප්‍රසම්පාදනය Advitec International (Pvt) Ltd අයතනය වෙත ලබා දීම ආයතනය විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය ලබා ගැනීමට යටත්ව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණි.

නමුත් ආයතනයේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික අයදුම 2023 පෙබරවාරි 23 දින ඖෂධ නියාමන අධිකාරිය මඟින් ප්‍රතික්ෂේප කර තිබුණි. (WOR Committee response “Not recommended by oncologists till the product is register”)

එම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් 2022/SPC/E/C/P/00742 දරන ඇණවුම වෙනුවෙන් අමතර රු.22,350,000 ක පිරිවැයක් දැරීම තාවකාලිකව වැලකී තිබුණි.

11. Glyceryl Trinitrate Inj.50mg/10ml ඖෂධය (SR 00203002)

රෝගීන්ට රුධිර ගමනාගමනය පහසු කිරීම වෙනුවෙන් සහ හදිසි ප්‍රතිකාර සඳහා ලබා දෙන (Emergency) එන්නතක් වන මෙම ඖෂධය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා මෙම ඖෂධය සඳහා වූ ඉල්ලුම කොපමණ ප්‍රමාණයකින් පහත වැටී තිබුණේද යන්න සහ ඉදිරි කාලපරිච්ඡේදය සඳහා කොපමණ ප්‍රමාණයක් අවශ්‍යවේදැයි යන්න පුරෝකථනය කිරීමකින් තොරව 2021 වර්ෂයේ සාමාන්‍ය ඇණවුමේ ඉතිරි ඒකක 50,000 තාවකාලිකව අත්හිටුවා තිබුණු අතර ඒකකයක් එ.ජ.ඩෝ.4.9කට මිලදී ගැනීමට හැකිව තිබුණු 2022 වර්ෂයේ සාමාන්‍ය ඇණවුම ද අවලංගු කර තිබුණි.

(ආ) තාවකාලිකව අත්හිටුවා තිබුණු 2021 වර්ෂයේ සාමාන්‍ය ඇණවුමේ ඉතිරි ඒකක 50,000 නැවත ලබා ගන්නා ලෙස රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත දැනුම් දීමෙන් අනතුරුව එම තීරණය සැපයුම්කරුවෙත දැනුම් දීමට මාස 05කට ආසන්න කාලයක් ප්‍රමාද කර තිබුණි.

(ඇ) මෙම ප්‍රමාදය නිසා 2022 අගෝස්තු මාසයේ සිට 2022 නොවැම්බර් 25 දක්වා මාස 04 කට ආසන්න කාලයක් හෘද රෝගීන් හට ලබාදෙන හදිසි (Emergency) එන්නතක් වන මෙම ඖෂධය හිඟව පැවතුණි. එසේම, ඉහත (අ) හා (ආ) යටතේ දක්වා ඇති ආයතනික අඩුපාඩු හේතුවෙන් 2022 වර්ෂයේ මෙම ඖෂධය සඳහා හදිසි මිලදී ගැනීමට යාමට සිදු වී තිබුණි.

(ඇ) මෙලෙස හිඟව පැවති කාලය තුළ ඒකක 11,250 ක් සඳහා 2022/MSD/V/R/P/00102 දරන ඇණවුම සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් WOR සහතිකය මත ඖෂධ සැපයුම්කරුවකු වෙත 2022 නොවැම්බර් 23 දින එ.ජ.ඩො. 6.23 ක් වූ සාපේක්ෂව ඉහළ ඒකක මිලකට ඇණවුමක් ලබා දී තිබුණු අතර එම ඖෂධ තොග 2023 අප්‍රේල් 07 වන දින නියමිත කාලයට වඩා මාස 04ක් ප්‍රමාද වී ලැබී තිබුණි. නමුත් මෙම ඇණවුම සැපයුම්කරු වෙත ලබා දී දින දෙකකට පසු නැවත සක්‍රීය කරන ලද 2021 වර්ෂයේ සාමාන්‍ය ඇණවුමෙන් ඒකක 29,950 ක ප්‍රමාණය වෛද්‍ය සැපයීම් අංශයට ලැබී තිබුණි. ඒ අනුව ප්‍රායෝගිකව හදිසි අවශ්‍යතාවයක් නොවූ මෙම මිලදී ගැනීම හරහා වෛද්‍ය සැපයීම් අංශය විසින් ඒකක 11,250 ක් වෙනුවෙන් රු. 4,946,032 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.

(ඉ) 2022 වර්ෂයේදී මෙම ඖෂධය සඳහා ඒකක 30,000ක් වෙනුවෙන් 2022/SPC/X/R/P/000264 දරන තවත් ඇණවුමක් ඉදිරිපත් කර තිබුණු අතර තෝරා ගෙන තිබුණු ලංසුකරු විසින් සිය ලංසුව මඟින් ඉදිරිපත් කර තිබුණු Centurion Healthcare Private Limited යන ඉන්දීය ඖෂධ සැපයුම්කරු, ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු NMRA සහතිකය මඟින් ආවරණය වී නොතිබුණි. එසේම NMRA සහතිකයේ සඳහන් වන Mercury Laboratories Limited යන ඉන්දීය ඖෂධ නිෂ්පාදන සමාගම ලංසුවේ සඳහන් වන Centurion Healthcare Private Limited යන ඉන්දීය සැපයුම්කරු හට සිය සමාගමේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා බලය පැවරූ බවට ද ලිඛිතව තහවුරු නොවීය. ඒ අනුව තහවුරු කර නොගත් ඉන්දීය සැපයුම්කරුවකු වෙතින් මෙම ඇණවුමට අදාළ ඒකක 30,000 ක ඖෂධ ප්‍රමාණයක් 2022 දෙසැම්බර් සහ 2023 ජනවාරි යන මාසවලදී ලබා ගෙන තිබුණි.

12. Clarithromycin for Infusion 500 mg vial ඖෂධය (SR 00103002)

බැක්ටීරියා ආසාදනයකදී ප්‍රතිජීවක ඖෂධයක් ලෙස භාවිතා කරන මෙම ඖෂධය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2018 සහ 2019 යන වර්ෂවලට අදාළව ක්‍රියාත්මක කර තිබුණු සාමාන්‍ය වාර්ෂික ඇණවුම් සඳහා පිළිවෙලින් රු. 151.16 ක සහ රු. 190.44 ක මිලක් ඉදිරිපත් වී තිබුණු අතර එම ඇණවුම්වල ඉතිරි ඒකක 159,700 ක ප්‍රමාණයෙන් 111,070 ක ප්‍රමාණයක් නියමිත කාලයට වඩා ප්‍රමාද වී වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබී තිබුණු අතර ඉතිරි ඒකක 48,630 ක් ලැබී නොතිබුණි. එලෙස ඖෂධ නොලැබීම සහ ලැබීම ප්‍රමාද කිරීම නිසා 2019 සහ 2020 වර්ෂවලදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ප්‍රාදේශීය මිලදී ගැනීම් යටතේ ඒකකයක් රු.1,085.22 ක් බැගින් ඒකක 9400 ක් සහ ඒකකයක් රු.924.04 ක් බැගින් ඒකක 5400 ක් ලෙස ඉහල මිලකට මිල දී ගෙන තිබුණි. ඒ අනුව මෙම මිලදී ගැනීම හරහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ඒකක 14,800 ක් වෙනුවෙන් ආසන්න වශයෙන් රු.12,953,708 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.

(ආ) 2022 සාමාන්‍ය වාර්ෂික ඇණවුම පිළියෙල කර නොතිබුණු අතර 2020 වර්ෂයේ සාමාන්‍ය වාර්ෂික ඇණවුමට අදාළව 2020 දෙසැම්බර් සහ 2021 ජනවාරි මාස තුළ ලැබී 2022 වර්ෂයේ ආරම්භක දිනට ඉතිරිව පැවති ආසන්න වශයෙන් ඒකක 43,655 ක පමණ තොගයෙන් 2022 සැප්තැම්බර් 30 දිනට පිරිවැය රු. 5,134,449 ක් පමණ වන

ඒකක 15,120 ක තොගයක් කල්ඉකුත් වී තිබුණි. එම තොගය කල්ඉකුත් වූ පසුව ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ඒකක 25,000 ක් මිල දී ගැනීමේ ඇණවුම WOR සහතිකය මත 2022 ඔක්තෝබර් 18 දින සැපයුම්කරුවකුට ලබා දී තිබුණද 2023 නොවැම්බර් 30 දක්වා ඖෂධ තොග ලැබී නොතිබුණි. එබැවින් මෙම ඖෂධය 2022 සැප්තැම්බර් මස සිට 2023 නොවැම්බර් 30 දක්වා ආසන්න වශයෙන් මාස 14ක කාලයක් හිඟව පැවතුණි.

(ඇ) මෙලෙස හිඟව පැවතුණු මාස 14ක කාලය තුළ මාරවිල මූලික රෝහල විසින් ප්‍රාදේශීය මිලදී ගැනීම් යටතේ අවස්ථා 2 කදී ඒකක 50 ක් රු.5,500 බැගින් වූ එනම් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් පසුගිය වර්ෂ තුනක කාලය තුළ ඇණවුම් මිල දී ගෙන තිබුණු මිලට වඩා සියයට 413 කින් වැඩි මිලකට මිල දී ගෙන තිබුණි.

(ඈ) 2023 සාමාන්‍ය වාර්ෂික ඇණවුම මාස 10 ක් ප්‍රමාද කර වෛද්‍ය සැපයීම් අංශය විසින් ඉදිරිපත් කර තිබුණු අතර ඒ සඳහා සැපයුම්කරුවකු තෝරා ගැනීම වෙනුවෙන් මාස 07 කට වඩා අධික කාලයක් ප්‍රසම්පාදන කටයුතු සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් වැය කර තිබුණි. නමුත් 2023 නොවැම්බර් 30 දින දක්වා ඉන්ඩෙන්ටුව නිකුත් කර නොතිබුණි.

(ඉ) ඇණවුමක් පවතින බවට MSMIS පද්ධතිය මඟින් හෝ ස්වස්ථ පද්ධතිය මඟින් තහවුරු නොවූ ඒකක 60,000 ක තොගයක් සහ ලැබීම පිළිබඳ ශක්‍යතාවයක් නොතිබුණු 2021 සාමාන්‍ය වාර්ෂික ඇණවුමෙහි ලැබිය යුතු ඒකක 70,000 ක තොගයක් 2024 වර්ෂයේ පුරෝකථන අවශ්‍යතාවයෙන් අඩු කිරීමෙන් පසුව ඇණවුමක් අවශ්‍ය නොවන බව සඳහන් කරමින් 2024 සාමාන්‍ය වාර්ෂික ඇණවුම ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) මෙලෙස 2023 සාමාන්‍ය වාර්ෂික ඇණවුම ක්‍රියාත්මක නොකිරීම සහ 2024 සාමාන්‍ය වාර්ෂික ඇණවුම ඉදිරිපත් නොකිරීම හරහා ඉදිරි කාලපරිච්ඡේදයේදී ද මෙම ඖෂධය හිඟව පැවතීමේ අවදානම සහ හදිසි ප්‍රසම්පාදනයන් සඳහා යොමු වීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැකි විය.

13. Dopamine Hydrochloride Injection BP 200mg/5ml (SR -00204001)

හෘදයාබාධ, කම්පනය, වකුගඩු අකර්මන්‍ය වීම හා නිදන්ගත හෘද ක්ෂයවීම් හේතුවෙන් ඇතිවන රක්තපාත අසමතුලිතතා නිවැරදි කිරීම සඳහා මෙම ඖෂධය භාවිතා කරනු ලැබේ. 2023 වර්ෂයේදී සාමාන්‍ය ඇණවුම යටතේ ඖෂධයේ ඒකක 63,000 ක් සහ හදිසි මිලදී ගැනීම් යටතේ ඒකක 37,500 ක් හා විදේශ ව්‍යාපෘති යෝජනා ක්‍රමය හරහා ඒකක 30,000 ක් ලෙස මිල දී ගැනීමේ ප්‍රසම්පාදනයන් සිදු කර තිබූ අතර ඊට අදාළව පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) වෛද්‍ය සැපයීම් අංශය විසින් සාමාන්‍ය ඇණවුම මාස 11 ක පොරොත්තු කාලයක් සහිතව ලබා දිය යුතු වුවත් ඇණවුම් අංක 2023/SPC/N/R/P/00121 යටතේ 2023 ජනවාරි 15 ඒකක 33,000 ක් හා 2023 අප්‍රේල් 16 ඒකක 30,000 ක් ලෙස සැපයිය යුතු ඇණවුම 2022 නොවැම්බර් 24 දින සංස්ථාවට යොමු කිරීමෙන් පොරොත්තු කාලය මාස 1 ½ කට සීමා වී තිබුණි.

(ආ) සාමාන්‍ය ඇණවුම ඉදිරිපත් කිරීමේදී සිදු වූ මෙම ප්‍රමාදය හේතුවෙන් හදිසි මිලදී ගැනීමකට යොමු වීමට සිදු වී තිබුණි. ඒ අනුව 2023 මාර්තු 9 දිනැති අංක

2023/SPC/E/R/P/00187 යටතේ හදිසි මිලදී ගැනීමක් ලෙස වෛද්‍ය සැපයීම් අංශය යොමු කරන ලද ඇණවුම මඟින් ඒකකයක් රු.354.60 ක් බැගින් ඒකක 37,479 ක් මිලදී ගැනීමට ඇණවුම ප්‍රදානය කළද- Ceyoka (Pvt) Ltd විසින් දින 21 ක ප්‍රමාදයක් සහිතව වෛද්‍ය සැපයීම් අංශයට ඖෂධ සපයා තිබුණි. එසේම සාමාන්‍ය ඇණවුම යටතේ රු.284.91 කට මිලදී ගත හැකිව තිබුණු මෙම එන්නත හදිසි මිලදි ගැනීම යටතේ රු.354.60 ක් බැගින් මිලදී ගැනීම හේතුවෙන් රු.2,611,911ක් අතිරේකව වැය කර තිබුණි.

(ඇ) වෛද්‍ය සැපයීම් අංශයේ ඇණවුම් අංක 2023/ADB/X/R/P/00021 යටතේ විදේශ ණය ආධාර යටතේ ඒකක 30,000 ක් ඒකකයක් එ.ජ.ඩො. 3.0535 (රු.953.72) කට Yaden International (Pvt) Ltd වෙතින් මිලදී ගෙන තිබුණි. සාමාන්‍ය ඇණවුම යටතේ මෙම ඖෂධය රු.284.91 කට මිලදී ගත හැකි වුවත්, විදේශ ව්‍යාපෘති මඟින් මිලදී ගැනීමේදී සාමාන්‍ය ඇණවුමේ මිල මෙන් සියයට 234 ක මිල වැඩිවීමක් බව නිරීක්ෂණය විය. ඒ අනුව රු.20,064,300 ක් අතිරේකව වැය කර තිබුණි. එසේම මෙම සැපයුම ගිවිසුම් දින සිට දින 60 ක් තුළ සැපයිය යුතු වුවත් මසක් ප්‍රමාද කර වෛද්‍ය සැපයීම් අංශයට සපයා තිබුණි.

14. Tenecteplase Inj 40mg (SR 00206901)

හෘදයාබාධයක් ඇති වීමේදී හදිසි ප්‍රතිකාර සඳහා භාවිතා කරනු ලබන ඖෂධයකි. 2023 වර්ෂයේ ලද ඇණවුම්වලට අදාළව එන්නත් කුප්පි 6,000 ක් සැපයුම්කර තිබුණු අතර ඒ සඳහා රු.915,854,940 ක් වූ ගෙවීම් ඉල්ලීම් (හරපත්) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් නිකුත් කර තිබුණි. මෙම ඖෂධය ප්‍රසම්පාදනයට අදාළව පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පොරොත්තු ඇණවුම් වලට අදාළ තොග ප්‍රමාණය යෝජිත කාලය සඳහා ප්‍රමාණවත් වේ යන පදනම මත 2022 වර්ෂයේ වාර්ෂික ඇණවුම අවලංගු කර තිබුණි. එමෙන්ම 2022 වර්ෂයේ ඉන්දීය ණය පහසුකම යටතේ ලද ඇණවුම මාස 15 ක් ගත වුව ද අමාත්‍ය මණ්ඩල පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු තීරණය ලබා ගැනීමට සංස්ථාව ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) වෛද්‍ය සැපයීම් අංශයේ 2022 නොවැම්බර් 15 දිනැති ඇණවුම් අංක 2023/SPC/N/R/P/00071 යටතේ එන්නත් කුප්පි 6,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාලව ඒකකයක් රු.83,035.01 ක් ලෙස අවම මිල ඉදිරිපත් කල සැපයුම්කරු ලංසු ලියවිලි ප්‍රකාරව ඖෂධය ගබඩා කල යුතු උෂ්ණත්වය $2C^{o}$ – $8C^{o}$ වුවත් ප්‍රසම්පාදනය සඳහා ප්‍රසිද්ධ කල ලංසු ලියවිලි ප්‍රකාරව ගබඩා කල යුතු උෂ්ණත්වය $28C^{o}$ – $32C^{o}$ ක් විය. කෙසේ වුවද–තාක්ෂණික ඇගයීම් කමිටුව ඒ පිළිබඳව අවධානය යොමු නොකර එම සැපයුම්කරු නිර්දේශ කර තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල පත් කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව ලංසුව ප්‍රදානය කර තිබුණ ද, ලංසුකරුවෙකු විසින් සිදුකල අභියාචනයක් මුල් කර ගනිමින් අභියාචනා කමිටුව විසින් මෙම ලංසුව අවලංගු කර තිබුණි. ඒ බව සංස්ථාවට දැනුම් දීමට දින 57 ක කාලයක් ගත කර තිබුණි.

(ඇ) ඉහත ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති අඩුපාඩු හේතුවෙන් හදිසි ප්‍රසම්පාදනයට යොමු වීමට සිදු වීම හේතුවෙන් සාමාන්‍ය ප්‍රසම්පාදනයට යොමු වීම මඟින් ලබා ගත හැකිව තිබූ වාසිදායක තත්ත්වය නොලැබී ගොස් තිබුණු අතර 2023 මාර්තු 01 දිනැති හදිසි

ඇණවුම මඟින් එන්නත් කුප්පියක් රු.150,150 ක් බැඟින් එන්නත් කුප්පි 1,500 හා 2023 මැයි 09 දිනැති හදිසි ඇණවුම මඟින් එන්නත් කුප්පියක් රු.145,645.50 ක් බැඟින් එන්නත් කුප්පි 6,000 ක් මිලදී ගැනීම සඳහා එකතුව රු.880,629,750 ක් වැය කර තිබුණි.

15. Anti Rabies Inactivated (TC) Vaccine (SR 00600204)

ජලභීතිකා රෝගය සඳහා භාවිතා වන එන්නතකි. මෙම ඖෂධයෙන් මාත්‍රා 1,967,500 ක් 2022 සැප්තැම්බර් 28 දින පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණි.

එසේ තිබියදී ඇණවුම් අංක 2022/SPC/E/R/P/00406 යටතේ එන්නත් මාත්‍රා 500,000 ක් මිලට ගැනීමේ ප්‍රසම්පාදනය අනුව ඒකකයක් රු.310 බැගින් එන්නත් මාත්‍රා 250,000 ක් හදිසි ප්‍රසම්පාදනයක් ලෙස ලබා ගැනීමට 2022 ඔක්තෝබර් 14 දින ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණි.

මෙම ඇණවුමට අනුව එන්නත් මාත්‍රා 500,000 න් පළමු තොගය වශයෙන් මාත්‍රා 250,000 ක් රු.372.70 කට මිලට ගෙන තිබූ අතර දෙවන අවස්ථාවේදී එම සැපයුම්කරුගෙන්ම එන්නත් මාත්‍රා 250,000 ක් රු.310 බැගින් මිලට ගෙන තිබුණි. ඒ අනුව මුල් අවස්ථාවේදී එක් මාත්‍රාවක් සඳහා රු.62.70 ක් බැගින් මාත්‍රා 250,000 ක් සඳහා රු.15,675,000 ක් අතිරේකව වැය කර තිබුණි.

16. Ceftriaxone Injection 500 mg (SR 00101703)

ශරීරයේ විවිධ කොටස්වල බැක්ටීරියා ආසාදන වලට ප්‍රතිකාර කිරීමට භාවිතා කරන ලබන මෙම ඖෂධයට 2022 හා 2023 වර්ෂයේ ලද ඇණවුම්වලට අදාළව ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව එන්නත් කුප්පි 27,500 ක් සැපයුම් කර තිබුණු අතර ඒ සඳහා වටිනාකම රු.25,662,547 ක් වූ ගෙවීම් ඉල්ලීම් (හරපත්) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් නිකුත් කර තිබුණි**.** මෙම ඖෂධය ප්‍රසම්පාදනයට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) හදිසි ඇණවුමක් ලෙස සංස්ථාවට ඉදිරිපත් වූ 2022 ඔක්තෝබර් 18 දිනැති අංක 2022/SPC/E/R/P/00703 දරන ඒකක 27,500 ක ඇණවුම සඳහා ප්‍රසම්පාදන කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව (HSEPC) විසින් සිදුකළ යුතු වුවද මෙම ප්‍රසම්පාදනය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදුකර තිබුණි.

(ආ) ඇණවුම් අංක 2023/SPC/N/R/P/00016 යටතේ එන්නත් කුප්පි 440,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාළව 2023 පෙබරවාරි 08 දින නිකුත් කරන ලද ඉන්ඩෙන්ටුව අනුව පළමු තොගය ලෙස ඒකක 150,000 ක් 2023 මැයි 31 දින සැපයිය යුතුව තිබුණු අතර සැපයුම්කරු 2023 මැයි 17 දින දන්වා තිබුණේ මෙම ඇණවුමට නිෂ්පාදන කටයුතු සිදුකරමින් පවතින බවයි. නමුත් වෛද්‍ය සැපයීම් අංශයේ අංක MSD/QA/DRMM-2023 හා 2023 අප්‍රේල් 04 දිනැති චක්‍රලේඛය අනුව මෙම ඖෂධය ඖෂධ ප්‍රමුඛතා ලැයිස්තුවේ ඇතුළත් නොවූයෙන් ඇණවුම තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කර තිබුණි. ඒ හේතුවෙන් සැපයුම්කරුගේ විශ්වාසය කඩවී අනාගතයේදී ඉදිරිපත් කරන ප්‍රසම්පාදන සඳහා ලංසුකරුවන් ඉදිරිපත් වීම වැලකී සිටියහොත් සැපයුම්කරුවන් ලංසු ඉදිරිපත් නොකිරීම මත තරගකාරී මිල ගණන් කැදවීමට නොහැකි වනු ඇත.

17. Calcium Polystyrene Sulphonate 15g-17g powder sachet ඖෂධය (SR 00406202)

වකුගඩු රෝගීන්ට ලබා දෙන අත්‍යාවශ්‍ය මෙම ඖෂධය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) 2022 සාමාන්‍ය වාර්ෂික ඇණවුම සකස් කර ඉදිරිපත් කිරීම සහ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම ප්‍රමාදවීම නිසා 2022 වර්ෂය ආරම්භයේ ලැබිය යුතු ඖෂධ ප්‍රමාණය මාස 14කට අධික කාලයක් ප්‍රමාද වී 2023 වර්ෂයේදී ලැබී තිබුණි.

(ආ) මෙම ප්‍රමාදය නිසා 2022 ජනවාරි 01 සිට 2022 ජූලි 27 දක්වාද, 2023 ජනවාරි 01 සිට 2023 මාර්තු 08 දක්වා ආසන්න වශයෙන් මාස 09ක කාලයක් මෙම ඖෂධය හිඟව පැවතුණි.

(ඇ) මෙලෙස හිඟව පැවති කාලපරිච්ඡේදය තුළ දේශීය මිලදී ගැනීම් යටතේ රෝහල් දෙකක් විසින් රු.348 බැගින් ඒකක 45 ක් සහ රු.412 බැගින් ඒකක 28 ක් 2022 සාමාන්‍ය වාර්ෂික ඇණවුම සඳහා ඉදිරිපත් වූ රු.307.70 මිලට වඩා වැඩි මිලකට මිලදී ගෙන තිබුණි.

(ඈ) මෙලෙස හිඟව පැවතීම නිසා 2022 වර්ෂයේදී සත්‍ය පරිභෝජනය එහි ඇස්තමේන්තුගත අවශ්‍යතාවයෙන් සියයට 25 ක අවමයක පැවතුණි. 2022 වර්ෂයේදී මෙම ඖෂධය වකුගඩු රෝගීන් සඳහා ප්‍රමාණවත් පරිදි ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) මෙම ඖෂධයට අදාළව 2022 වර්ෂයේ වූ ඇණවුම් 02ක් අවලංගු කර තිබුණද ඒවා ස්වස්ථ පද්ධතිය තුළ වලංගු ඇණවුම් ලෙස පැවති බවත්, 2022 වර්ෂයේ එක් ඇණවුමකට අදාළව ලැබී තිබුණු ඖෂධ තොගය ස්වස්ථ පද්ධතියේ සටහන් කර නොතිබුණු බවත්, 2022 වර්ෂයේ තවත් එක් ඇණවුමකට අදාළව ලැබී තිබුණු ඖෂධ තොගය දින වෙනස් කර සටහන් කර තිබුණු බවත් නිරීක්ෂණය වුයෙන් ඖෂධයට අදළව ස්වස්ථ පද්ධතිය මඟින් පෙන්නුම් කෙරෙන තොරතුරු නිවැරදි නොවන බව කහවුරු විය.

18. Sodium Valproate Syrup 200mg/5ml, 100ml ඖෂධය (SR 00304004)

අපස්මාර රෝගය වැළඳුනු කුඩා දරුවන් වෙනුවෙන් ලබා දෙන අත්‍යාවශ්‍ය මෙම ඖෂධය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2021 වර්ෂයේ සිට 2023 දක්වා මෙම ඖෂධය සැපයීම සඳහා සැපයුම්කරුවන් දෙදෙනෙකු පමණක් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය ලබා ගෙන තිබුණු අතර ඉන් එක් සැපයුම්කරුවකුගේ ලියාපදිංචි සහතිකය 2022 වර්ෂය තුළ කල් ඉකුත් වී තිබීමෙන් මෙම ඖෂධය සඳහා තරඟකාරී මිලක් ඉදිරිපත් වීම සීමා වී තිබුණි.

(ආ) වෛද්‍ය සැපයීම් අංශයේ සහ ඖෂධ නිතීගත සංස්ථාවේ දුර්වල සම්බන්ධීකරණය හේතුවෙන් 2022 වර්ෂයේ සාමාන්‍ය ඇණවුමේ ප්‍රසම්පාදන කටයුතු සඳහා මාස 25 කට

ආසන්න කාලයක් ගත කර තිබීම නිසා මෙම ඖෂධය 2021 අගෝස්තු මාසයේ සිට 2022 මාර්තු 09 දක්වා ආසන්න වශයෙන් මාස 07ක කාලයක් වෛද්‍ය සැපයීම් අංශයේ හිඟව පැවතුණි.

(ඇ) මෙලෙස ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ඖෂධය සඳහා ප්‍රමාණවත් පරිදි සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමට අපොහොසත් වීම සහ ඖෂධ හිඟය නිසා 2022 වර්ෂයේ 2022/SPC/X/R/P/00294 දරන ඇණවුම සඳහා NMRA සහතිකය දරන එකම සැපයුම්කරුගෙන් සාපේක්ෂව ඉහල මිලක් ඉදිරිපත් කර තිබීමෙන් අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත WOR සහතිකය මත ඇණවුමේ ඉන්ඩෙන්ටුව 2023 මාර්තු 10 දින ප්‍රදානය කර තිබුණි.

19. Calcium 500mg+ Vitamin D3 250IU Tab ඖෂධය (SR අංක 00405401)

කැල්සියම් සහ විටමින් ඌනතාවයෙන් පෙලෙන රෝගීන් සඳහා භාවිතා කරන මෙම ඖෂධය සඳහා ලංසු ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවන්ගෙන් NMRA සහතිකය ලබා ගෙන සිටි එකම සැපයුම්කරුගේ එම සහතිකය 2021 නොවැම්බර් 12 දින කල් ඉකුත් වී තිබුණි. එම ලියාපදිංචිය නැවත අලුත්කිරීමට හෝ මෙම ඖෂධය සඳහා නව සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම හෝ සැපයුම්කරුවන් නොමැතිනම් වෙළඳපලෙහි පවතින විකල්ප ඖෂධ අනුව සුදුසු පරිදි වෛද්‍ය සැපයීම් අංශයේ පිරිවිතර සංශෝධනය කර ගැනීම හෝ යන කරුණු ඉටුකර ගැනීමකින් තොරව 2021, 2022 සහ 2023 යන වර්ෂවල මෙම ඖෂධයේ ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් අනවශ්‍ය ලෙස දීර්ඝ කාලයක් ගත කර එම සාමාන්‍ය වාර්ෂික ඇණවුම් අවලංගු කර තිබුණි. මේ හේතුවෙන් මෙම ඖෂධය 2020 දෙසැම්බර් 16 දින සිට විගණිත දිනය වූ 2023 නොවැම්බර් 30 දින දක්වා වෛද්‍ය සැපයීම් අංශය තුළ හිඟව පැවතුණි.

20. Digoxin injection BP 500 mcg/2ml ඖෂධය (SR 00200102)

හෘද රෝගීන් සඳහා භාවිතා කරන මෙම ඖෂධය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා සාමාන්‍ය වාර්ෂික ඇණවුම් වෛද්‍ය සැපයීම් අංශය විසින් පිළියෙල කර ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීම, වාර්ෂික ඇණවුම් ප්‍රමාණය නිවැරදිව පුරෝකථනය නොකිරීම, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඉදිරිපත් වන ඇණවුම් සඳහා ක්‍රියාත්මක වීම ප්‍රමාද කිරීම සහ ප්‍රසම්පාදන කටයුතු සඳහා දීර්ඝ කාලයක් ගත කර තිබීම නිසා 2022 ජනවාරි මස සිට 2023 අගොස්තු මස දක්වා වූ මාස 20 ක කාලපරිච්ඡේදය තුළ මාස 15 ක කාලයක් සඳහා මෙම ඖෂධය වෛද්‍ය සැපයීම් අංශය තුළ නොතිබුණි. එබැවින් 2021 සිට 2023 වර්ෂයේ අගෝස්තු මාසය අවසානය තෙක් මෙම ඖෂධයේ ඇස්තමේන්තුගත අවශ්‍යතාවයට සාපේක්ෂව නිකුත් කළ ඖෂධ ඒකක ප්‍රමාණය සියයට 12 සිට සියයට 38 දක්වා වූ අවම අගයකව පැවතුණි.

(ආ) 2022 සහ 2023 යන වර්ෂවල අවස්ථා 4 කදි ඒකකයක් රු.1,296 සිට රු. 9,575 ක මිලක් දක්වා වූ පරාසයක විහිදෙන පරිදි වෛද්‍ය සැපයීම් අංශය සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ඖෂධය මිලදී ගෙන තිබුණු පසුබිමක ඖෂධය හිඟව පැවති කාලපරිච්ඡේදය තුළ රෝහල් 3 විසින් අවස්ථා 9 කදි ඒකකයක් රු.180 බැගින් ඒකක 95 ක් ප්‍රාදේශිය මිල දී ගැනීම් යටතේ මිලදි ගෙන තිබීම විගණනයේදි ගැටළු සහගත විය.

(ඇ) 2022 හා 2023 වර්ෂවල අවස්ථා 04 කදී සැපයුම්කරුවන් ඉදිරිපත් කළ මිල ගණන් අතර දැඩි විචලතාවයක් පැවතුණු අතර එය ඉදිරිපත් කර තිබුණු අවම මිලට සාපේක්ෂව ඉහල මිලෙහි වෙනස සියයට 706 ක් විය. එහිදි NMRA සහතිකය ලබා ගෙන සිටින සැපයුම්කරුවන් විසින් ඉහල මිලක් ද NMRA සහතිකය නොමැති සැපයුම්කරුවන් විසින් ඉතා අඩු මිලක් ද ඉදිරිපත් කර තිබුණි. මෙලෙස සැපයුම්කරුවන්ගේ මිල අතර පවතින දැඩි විචලතාවයන් ඇතිවිම කෙරෙහි බලපාන හේතු සාධක හඳුනාගෙන ඒවා අවම කිරීම සඳහා ගත යුතුවන ක්‍රියාමාර්ග හඳුනාගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය, වෛද්‍ය සැපයීම් අංශය සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව අපොහොසත් වී තිබීමෙන් මෙම ඖෂධය සඳහා රජයට අධික පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

21. Protein hydrolysate Injection 100ml (SR No -00402201)

දැඩිසත්කාර ඒකකයේ සිටින රෝගීන් සඳහා පෝෂණ අතිරේකයක් වශයෙන් භාවිතා කරන මෙම ඖෂධය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2022 සහ 2023 යන වර්ෂවල ක්‍රියාත්මක කර තිබුණු සියළුම ඇණවුම් සඳහා එක් සැපයුම්කරුවකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. මෙලෙස එක් සැපයුම්කරුවකු පමණක් මෙම ඖෂධයේ ඇණවුම් සඳහා ඉදිරිපත් වීමට හේතු විමර්ශණය කර ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ නිලධාරීන් හිතාමතා හෝ නොසැලකිල්ල සහ අකාර්යක්ෂමතාවය නිසා නැවත නැවත මිලගණන් කැඳවමින් ප්‍රසම්පාදන කටයුතු සඳහා දීර්ඝ කාලයක් ගත කර සාමාන්‍ය වාර්ෂික ඇණවුම් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) එම සැම අවස්ථාවකදීම ලංසු ඉදිරිපත් කර තිබුණු එකම ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු ඒකක මිල 2021 වර්ෂයේ සාමාන්‍ය ඇණවුම සඳහා ඉදිරිපත් කර තිබුණු රු.895ක ඒකක මිලට වඩා ආසන්න වශයෙන් සියයට 85 කින් මිල වැඩිවීමක් සහිත මිලක් විය.

(ඇ) මෙම සැපයුම්කරු විසින් 2022 සාමාන්‍ය වාර්ෂික ඇණවුම ඒකකයක් රු.1,516 බැගින් සැපයීමට 2023 මැයි 15 දින එකඟ වී තිබුණු අතර සැපයීමට එකඟවූ ඖෂධ කාණ්ඩය (Batch No.) අංක 16RM6293 විය. නමුත් මෙම ඖෂධය ප්‍රමුඛතා ලැයිස්තුවෙන් ඉවත්කිරීම හේතුවෙන් 2023 ජූලි 05 දින ඉහත සාමාන්‍ය වාර්ෂික ඇණවුම අවලංගු කර තිබුණි. කෙසේ නමුත් 2023 ජූලි 07 දින නැවත වරක් මෙම ඖෂධය ප්‍රමුඛතා ලැයිස්තුවට ඇතුළත් කර ඉහත ඖෂධ කාණ්ඩයම ඒකකයක් රු.1,662.39 බැගින් වූ මිලකට එනම් ඒකකයක් සඳහා රු.146.39 ක වැඩිපුර මිලකට ඒකක 3000 ක් මිලදී ගැනීමට සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි.

22. Aciclovir Tab. 200mg (SR-00107901)

2022 වර්ෂයේ රෝහල් සඳහා සැපයිය යුතු වන ඇස්තමේන්තුගත මෙම ඖෂධ අවශ්‍යතාවයෙන් සියයට 69ක් වෛද්‍ය සැපයීම් අංශය විසින් සපයා නොතිබුණි. එම හේතුවෙන් 2022 නොවැම්බර් 08 දින සිට ගබඩාවේ ඖෂධ ශූන්‍ය වී තිබුණි. එම ඖෂධ හිඟතාවය මාස 07කට

ආසන්න කාලයක් පැවති බවට පරිගණකගත තොග ලෙජර් වාර්තා පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර, මේ සඳහා පහත කරුණු හේතු වී තිබුණි.

(අ) 2022 වර්ෂයේ ඖෂධ පෙති 840,000ක් සපයා ගැනීම වෙනුවෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත 2021 පෙබරවාරි 25 දින ලබාදුන් 2022/SPC/N/R/P/00045 දරන සාමාන්‍ය ඇණවුම ඉන් මාස 08කට පසුව වෛද්‍ය සැපයීම් අංශයේ නිර්දේශය පරිදි ප්‍රසම්පාදන කමිටුව විසින් 2021 ඔක්තෝබර් 26 දින අත්හිටුවා තිබීම.

(ආ) වෛද්‍ය සැපයීම් අංශයේ ඖෂධ ශූන්‍ය වීමට ආසන්නව තිබියදී වෛද්‍ය සැපයීම් අංශය ඖෂධ ඒකක 525,000ක් සපයා ගැනීමට ඇණවුම් අංක 2022/MSD/V/R/P/00077 යටතේ 2022 නොවැම්බර් 04 දින හදිසි ප්‍රසම්පාදනයක් සිදු කර තිබුණු අතර සැපයුම්කරු විසින් අපේක්ෂිත දිනට ඖෂධ සැපයීමට අපොහොසත් වී තිබුණි. ඇණවුම ලබාදුන් දිනට මාස 07කට පසු එනම් 2023 ජූනි 03 වන දින වෛද්‍ය සැපයීම් අංශය විසින් ඇණවුම වහාම අත්හිටුවා තිබීම.

(ඇ) 2022 වර්ෂයේදී ඖෂධ සපයා ගැනීම වෙනුවෙන් ඉන්දියානු ණය පහසුකම යටතේ සිදුකළ 2022/SPC/X/R/P/00267 දරන ප්‍රසම්පාදනය හරහා ලැබිය යුතු ඖෂධ පෙති 1,000,000 ක තොගය 2022 ඔක්තෝබර් 31 දිනට ලැබිය යුතු වුවද, වර්ෂයකට ආසන්න කාලයක් ප්‍රමාද වී 2023 ජූලි 18 දින ලැබී තිබීම.

23. Gliclazide tab. BP 40mg (SR 00700301)

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් 2022/SPM/A/R/P/00069 දරන ගැනුම් ඇණවුම යටතේ සපයන ලද මෙම ඖෂධයේ කාණ්ඩ අංක 3කට (Batch) අයත් පෙති 5,947,500 ක් ගුණත්වයෙන් අසමත් බවට ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරය (NMQAL) 2023 ජූලි 17 දින දැනුම් දෙන විට එම ඖෂධ සියල්ලම වෛද්‍ය සැපයුම් අංශ ගබඩාවෙන් රෝහල් වෙත නිකුත් කර තිබුණි. තවද, එම ඖෂධයේ ගුණත්වය පිළිබඳ ඉන්දියාවේ නවදිල්ලියේ පිහිටි රසායනාගාරයක් වෙතින් කරන ලද පරීක්ෂාවේදී එම ඖෂධය අදාළ පරාමිතීන් (Parameter) වලින් සමත් බව අදාළ වාර්තා වලින් සනාථ කර තිබුණි. ඒ අනුව මෙම ඖෂධයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම් පිළිබඳව මතභේදාත්මක තත්ත්වයක් පවතී.

24. Flucloxicillin BP 500 mg (SR 00100801)

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් නිෂ්පාදනය කර වෛද්‍ය සැපයීම් අංශයට සපයන ලද Flucloxicillin BP 500 mg ඖෂධ ඒකක 11,731,600 ක් නිසි ප්‍රමිතියට අනුකූල නොවන බව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින්ම පිළිගෙන එය භාවිතයෙන් ඉවත් කරන ලෙස වෛද්‍ය සැපයීම් අංශයෙන් ඉල්ලීමක් කර තිබුණි. ඒ අනුව මෙම ඖෂධ කාණ්ඩ 2023 මැයි 31 දින වෛද්‍ය සැපයීම් අංශය භාවිතයෙන් ඉවත් කරන විට එම ඖෂධ ඒකක සියල්ලම වෛද්‍ය සැපයීම් අංශ ගබඩාවෙන් රෝහල් වෙත නිකුත් කර තිබුණි.

25. Cefuroxime Tablet 500mg (SR 00101403)

ශරීරයේ විවිධ කොටස්වල සිදුවන බැක්ටීරියා ආසාදන සඳහා ලබා දෙන ඖෂධයකි. 2023 ඔක්තෝබර් 03 දිනට මෙම ඖෂධයෙන් ඒකක 79,966,716 ක තොගයක් පවතින බව ස්වස්ථ

පද්ධතියේ දත්ත අනුව නිරීක්ෂණය විය. එම තොගය 2023 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුගත අවශ්‍යතාවය මෙන් 5 ගුණයක් බවත් ඉදිරි වසර 09 කුත් මාස 05 ක පමණ කාලයකට ප්‍රමාණවත් වන බවත් නිරීක්ෂණය විය.

ඒ අනුව වෛද්‍ය සැපයීම් අංශය මඟින් ඖෂධ ඇණවුම් ඉදිරිපත් කිරීමේදී නිවැරදිව ඇස්තමේන්තු සැකසීම සහ ඇණවුම් කර දීර්ඝ කාලයක් ගතවූ සහ ඇණවුම් අනුව සැපයුම් නොකළ ඖෂධ පිළිබඳව ප්‍රමාණවත් පරීක්ෂාවකින් තොරව ඇණවුම් සිදු කරන බවත් ඒ අනුව ඖෂධ තොග අනවශ්‍ය ලෙස රැස් කර කල් ඉකුත් වීමට ලක්වන බවත් නිරීක්ෂණය විය.

26. Sodium Valproate Tab. 100mg (SR-00304001)

2022 වර්ෂයේ මැයි 24 සිට 2023 ජනවාරි 11 දින දක්වා වෛද්‍ය සැපයුම් ගබඩාවේ මෙම ඖෂධය ශූන්‍ය වී තිබුණු අතර, 2022 වර්ෂයේ සැපයිය යුතු වන ඇස්තමේන්තුගත ඖෂධ අවශ්‍යතාවයෙන් සියයට 83ක් වෛද්‍ය සැපයීම් අංශය විසින් සපයා නොතිබුණි. වෛද්‍ය සැපයීම් අංශයේ මෙම ඖෂධ හිඟය ඇතිවීමට පහත කරුණු බලපා තිබුණි.

(අ) 2022 වර්ෂය තුළ ඖෂධ ඒකක 22,000,000 ක් සපයා ගැනීම වෙනුවෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට 2021 පෙබරවාරි 27 දින ලබාදුන් 2022/SPC/N/R/P/00003 දරන සාමාන්‍ය ඇණවුම, ඇණවුම ලබාදුන් දිනට මාස 06කට පසුව වෛද්‍ය සැපයීම් අංශයේ නිර්දේශය පරිදි ප්‍රසම්පාදන කමිටුව විසින් 2021 සැප්තැම්බර් 09 දින අත්හිටුවා තිබුණි.

(ආ) 2022 වර්ෂයේ ලැබිය යුතු ලෙස සිදු කළ සාමාන්‍ය ඇණවුමේ (2021/SPC/N/R/P/00001) සැපයීමට ඉතිරිව තිබුණු ඖෂධ ඒකක 7,625,000 සැපයිය යුතු කාල රාමුව සංශෝධනය කර, 2022 වර්ෂයේ ජූනි, අගෝස්තු, ඔක්තෝබර්, නොවැම්බර් මාසයන්හි ලැබෙන සේ ඖෂධ සැපයිය යුතු කාලරාමුව නැවත සකසා තිබුණි. නියමිත කාලය තුළ සැපයුම්කරු ඖෂධ සපයා නොතිබුණ අතර, පූර්ව ප්‍රසම්පාදිත ඖෂධ කාණ්ඩයක (S-01032) ගුණත්වය අසමත්වීම හේතුවෙන් ප්‍රශ්නගත තත්වයක් ඇති වී තිබුණි. නියමිත කාලය තුළ සම්පූර්ණ නොවුණු මෙම ඇණවුම 2023 වර්ෂයේ වෛද්‍ය සැපයීම් අංශය විසින් අවලංගු කර තිබුණි.

(ඇ) වෛද්‍ය සැපයුම් ගබඩාවේ ඖෂධ 2022 මැයි අවසාන වන විට ශූන්‍ය වීම හේතුවෙන් මාසික අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා ඖෂධ ඒකක 1,000,000ක් ඒකක පිරිවැය රු7.00 ක් වන සේ මිලදී ගැනීම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත අංක 2022/SPC/E/R/P/00488 දරන හදිසි ඇණවුම ලබාදී තිබුණි. මෙම ඇණවුමට අදාළ ඖෂධ සැපයිය යුතු දිනට වඩා මාස 4 ක් ප්‍රමාද වී 2023 වර්ෂයේ ලැබී තිබුණ අතර මසක පරිභෝජන අවශ්‍යතාවය වෙනුවෙන් රු.7,000,000ක ඉහළ පිරිවැයක් දරා සිදු කළ හදිසි ප්‍රසම්පාදනය අනාර්ථික වී තිබුණි.

(ඈ) ඉහත හදිසි ප්‍රසම්පාදනය ප්‍රමාද වීම නිසා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙතින් ඖෂධ පෙති 3,000,000ක්, ඒකක පිරිවැය රු.5.78ක් බැගින් මිලදී ගැනීම සඳහා අංක 2022/SPM/N/R/P/00079 දරන ඇණවුම වෛද්‍ය සැපයීම් අංශය විසින් 2022 සැප්තැම්බර් 21 දින ලබා දී තිබුණි. එම ඇණවුමෙහි ඖෂධ සැපයිය යුතු දිනට දින

10කට පෙර ඇණවුම ලබා දී තිබුණ අතර ඒ අනුව ඖෂධය නිෂ්පාදනය කර සැපයීම සඳහා ප්‍රමාණවත් හා සාධාරණ කාලයක් නිෂ්පාදන සංස්ථාව වෙත ලබා දී නොතිබුණි. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2023 ජනවාරි ඉහත ඖෂධ තොග සැපයීම ආරම්භ කර ඖෂධ පෙති 622,100ක් සැපයූ පසු ඉහළ පිරිවැයක් දරා සිදු කළ හදිසි ප්‍රසම්පාදනය යටතේ වෛද්‍ය සැපයීම් අංශය වෙත ඖෂධ ලැබී තිබුණි.

(ඉ) 2022 වර්ෂය වෙනුවෙන් සිදුකළ ප්‍රසම්පාදනයන් හරහා ඖෂධ ඒකකයක් හෝ ලැබී නොතිබුණ අතර, හදිසි ප්‍රසම්පාදන හරහා ඖෂධ ආනයනය කොට සැපයීම ප්‍රමාද වීමෙන් පසුව රාජ්‍ය දේශීය නිෂ්පාදකයාගෙන් ඖෂධ සපයා ගැනීම සඳහා වෛද්‍ය සැපයීම් අංශය යොමු වී තිබුණි.

27. Miconazole oromucosal gel 40 g Tube/Container (SR No. 01001801)

(අ) මෙම ඖෂධයේ 2021 වර්ෂයේ සාමාන්‍ය ඇණවුම ලෙස ඇස්තමේන්තුගත වටිනාකම රු.4,814,370 ක්වූ 2020 පෙබරවාරි 15 දිනැති මෙම ඇණවුම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත 2020 පෙබරවාරි 21 දින ලැබී තිබුණි. මෙම ඇණවුම අනුව 2021 ජනවාරි 04 දිනට ඒකක 20,000 ක් හා 2021 ජුනි 01 දිනට ඒකක 13,000 ක් සැපයිය යුතුව තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා සංස්ථාව විසින් 2020 මැයි 03 දින ජාත්‍යන්තර තරහකාරී ක්‍රමයට (Global Tender) ලංසු කැඳවා තිබුණු අතර 2020 ජුනි 16 ලංසු කැඳවීම අවසන් කර තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසුකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් වී තිබුණු අතර 2020 නොවැම්බර් 06 දින තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම සිදුකර තිබුණි. 2020 අප්‍රේල් 23 දිනැති වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂගේ ලිපිය පරිදි 2020 මැයි 21 දින වෛද්‍ය සැපයීම් අංශය විසින් මෙම ඇණවුමේ ඒකක ප්‍රමාණය 43,750 දක්වා වැඩිකර තිබුණි. ඒ අනුව ඒකක 23,750 ක් 2021 ජනවාරි 04 දිනටත් ඒකක 20,000 ක් 2021 ජුනි 01 දිනටත් සැපයිය යුතුව තිබුණි. 2020 දෙසැම්බර් 16 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු තෝරාගෙන තිබුණු අතර ඒකකයක් එ.ජ.ඩො. 0.795 ක් බැගින් ඒකක 22,000 ක් මුළු වටිනාකම එ.ජ.ඩො. 17,490 කට මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2021 ජනවාරි 01 දිනැති සැපයුම්කරු වෙත ඇණවුම ප්‍රදානය කිරීමට අදාළ එකඟතාවය 2021 ජනවාරි 05 දින පිළිගෙන තිබුණු අතර එහිදී නැව්ගත කිරීමට පෙර නියැදිය පරීක්ෂා කිරීම අත්හැරීමට සැපයුම්කාර ආයතනය විසින් ඉල්ලා තිබුණු නමුත් ඊට අනුමැතිය ලබාදී නොතිබුණි. වෛද්‍ය සැපයීම් අංශය විසින් 2021 ජනවාරි 28 දිනැති හා 2021 මාර්තු 02 දිනැති ඊමේල් ලිපි මඟින් මෙම ඇණවුමෙහි කාලසටහන සංශෝධනය කර තිබුණි. ඒ අනුව 2021 මැයි 13 දිනැති DHS/NV/300/2021 දරන ඉන්ඩෙන්ටුව අනුව 2021 ජුලි 31 දින වනවිට ඒකක 22,000 ක් සැපයිය යුතුව තිබුණි. නමුත් 2021 ජුනි 23 දිනැතිව වෛද්‍ය සැපයුම් අංශයේ අධ්‍යක්ෂ විසින් යොමුකරන ලද ලිපියෙන් එම ඇණවුමේ කාලය නැවත සංශෝධනය කර තිබුණු නමුත් සැපයුම්කරු ඊට එකඟ වී නොතිබුණු අතර ඖෂධ තොගය 2022 මාර්තු 31 දින වෛද්‍ය සැපයීම් අංශය වෙත සැපයුම්කර තිබුණද ඊට අදාළ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරයේ වාර්තාව ලැබී තිබුණේ 2023 මාර්තු 22 දිනදීය. එම වාර්තාවට අනුව බ්‍රිතාන්‍ය ඖෂධ පිරිවිතර සමග නොගැලපීම හේතුවෙන් ඖෂධය වහාම භාවිතයෙන් ඉවත්

කරගන්නා ලෙස වෛද්‍ය සැපයීම් අංශයට හා මහරගම පිළිකා රෝහල වෙත දන්වා තිබුණි.

(ii) 2023 මාර්තු 22 දින ඉහත දැනුම්දීම කරන අවස්ථාව වනවිටත් වෛද්‍ය සැපයීම් අංශයෙන්2022 දෙසැම්බර් 18 දින දක්වා අදාළ ඖෂධ තොගයෙන් ඇසුරුම් 17,561 ක් රජයේ රෝහල් හා ආයතන වෙත බෙදාහැර තිබුණි. ඒ අනුව තත්ත්වයෙන් අසමත් වීම මත මෙම ඖෂධයේ ඇසුරුම් 8,198 ක් භාවිතයෙන් ඉවත් කර තිබුණද නිකුත් කරන ලද ඉතිරි ඇසුරුම් 13,802 ක් රෝගීන්ගේ භාවිතය සඳහා නිකුත් කර තිබුණි. ඖෂධයේ තත්ත්ව පරීක්ෂණ අප්‍රමාදව සිදු නොවීමෙන් හා පරීක්ෂණ වාර්තා ලබාගැනීමෙන් අනතුරුව ඖෂධ බෙදාහැරීමට කටයුතු නොකිරීමෙන් රෝගීන්ගේ ජීවිත අවදානමකට ලක්කර තිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(iii) ඉහත තත්ත්වයෙන් අසමත් තොගය සම්බන්ධයෙන් ගිවිසුම් කොන්දේසි 3.3 ප්‍රකාරව මුළු ගොඩබෑමේ පිරිවැය සමඟ සියයට 25 ක පරිපාලන ගාස්තු සැපයුම්කරුගෙන් අයකර ගැනීමට විගණිත දිනය වන 2023 නොවැම්බර් 08 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(iv) ඉහත ඇණවුමෙන් ගෙන්වූ ඒකක 22,000 ක ප්‍රමාණයේ තත්ත්වය අසමත්වීම මත ඉවත්කර ගැනීමට සිදුවී තිබියදී 2023 ඔක්තෝබර් 13 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් එම ඇණවුමෙහි මෙතෙක් සැපයුම් නොකළ ඉතිරි ඒකක 21,750 ක් එම සැපයුම්කරුගෙන්ම නැවිගත කිරීමට පෙර නියැදි පරීක්ෂාවක් ස්වාධීන රසායනාගාරයක් මඟින් සිදුකිරීමේ පදනම මත ඇණවුම් කිරීමට අනුමැතිය ලබාදී තිබුණි.

(ආ) 2022 හා 2023 වර්ෂවල සාමාන්‍ය ඇණවුම් නියමිත දිනට නොලැබීම හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශය විසින් නිකුත් කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු.1,304,100 ක්වූ 2023 පෙබරවාරි 28 දිනැති හදිසි ඇණවුම ප්‍රකාරව ඉහත ඖෂධයෙන් ඇසුරුම් 7,500 ක් 2023 මාර්තු 10 දිනට සැපයිය යුතුව තිබුණි. මේ සඳහා මිල ගණන් කැඳවූ බවට තොරතුරු අදාළ ලිපිගොනුව තුළ නිරීක්ෂණය නොවූ අතර ලංසු ආරාධනා පත්‍රයට අනුව එහි දිනය 2023 මාර්තු 15 ත් ලංසු අවසාන වන දිනය 2023 මාර්තු 17 දිනත් ලෙස සඳහන්ව තිබුණු අතර ලංසුව සඳහා දින 03 ක් පමණක් ලබාදී තිබුණු බව නිරීක්ෂණය විය. මේ සඳහා එක් ලංසුකරුවකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර 2023 මාර්තු 28 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම ලංසුකරු වෙත ප්‍රසම්පාදනය පිරිනැමීමටත් ඉදිරිපත් වී තිබුණු මිල අඩුකර ගැනීමකට සාකච්ඡා කරන ලෙසත් දන්වා තිබුණි. ඇසුරුමක මිල රු.1,600 සිට 1,250 දක්වා අඩුකිරීමට ලංසුකරු එකඟතාවය පළ කර තිබීම හේතුවෙන් 2023 අප්‍රේල් 12 දිනැති ප්‍රසම්පාදන කමිටුව ප්‍රසම්පාදනය එකම ලංසුකරු වෙත ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණි. එහෙත් එම මිල ඇස්තමේන්තුගත ඒකකයක පිරිවැයට සාපේක්ෂව සියයට 619 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. 2023 වර්ෂයේ සිදුකරන ලද සාමාන්‍ය ඇණවුමේදී මෙම ඇසුරුමක් මිලදී ගැනීමට තීරණය කළ මිල රු.247.50 ක් වූයෙන් හදිසි ඇණවුමක් මඟින් ඖෂධ මිලදී ගැනීමට තීරණය කිරීමෙන් සාමාන්‍ය ඇණවුමේ

ඒකකයක මිලමෙන් සියයට 405 ක මිල වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර ඒ හේතුවෙන් දැරීමට සිදුවන අතිරේක පිරිවැය රු.7,518,750 ක් විය.

(i) 2023 මැයි 12 දිනැති අංක LP/DHS/EP/3736/2023 දරන ඉන්ඩෙන්ටුව අනුව මෙම තොගය 2023 ජුනි 08 දිනට සැපයිය යුතුව තිබුණද ඒ වනවිටත් සැපයුම්කරු ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය ලබාගෙන නොතිබුණි.

(ii) 2024 මාර්තු 12 දින වනවිටත් පරිගණක පද්ධතිය පරීක්ෂාවේදී මෙම ඇණවුමට අදාළ තොග ලැබී නොතිබුණි. එසේම 2021 වර්ෂයේ ඇණවුමට අදාළව 2022 අප්‍රේල් 01 දින ලැබුණු ඇසුරුම් 22,000 ක තොගයක් 2023 මාර්තු 22 දින භාවිතයෙන් ඉවත් කර ගන්නා ලෙස දැන්වීම හේතුවෙන් එදින සිට විගණිත දිනය වන 2024 මාර්තු 12 දින වනවිටත් ස්වස්ථ පද්ධතිය අනුව මෙම ඖෂධය වෛද්‍ය සැපයීම් අංශයේ සහ ජාතික මට්ටමේ තොග ශූන්‍යව පැවතුණි.

28. Timolol Eye Drops 0.5% 5ml vial (SR No.00901702)

2022 වර්ෂයට අදාළව සාමාන්‍ය ඇණවුම ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2022 මාර්තු 25 දිනැතිව මෙම ඖෂධය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.2,958,400 ක්වූ ඒකක 80,000 ක ඇණවුමක් වෛද්‍ය සැපයීම් අංශය විසින් ලබාදී තිබුණි. ඇණවුම අනුව ඒකක 40,000 ක් 2022 අප්‍රේල් 30 දින හා ඒකක 40,000 ක් 2022 ජුනි 30 දින වනවිට ඉන්දියානු ණය පහසුකම් යටතේ ලබාගැනීමට අපේක්ෂා කර තිබුණි. මේ අනුව සිදුකරන ලද ලංසු කැඳවීමෙන් ආයතන 03 කින් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර අවම මිල ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු වෙත ඖෂධය සඳහා ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය ලබාගැනීමට යටත්ව ඒකකයක් එ.ජ.ඩො. 0.162 බැගින් එ.ජ.ඩො. 12,960 ක් වටිනාකමට ලංසුව ප්‍රදානය කර තිබුණි. මෙම ප්‍රසම්පාදනයට අදාළ සැපයුම් කාලසටහන වෛද්‍ය සැපයීම් අංශය විසින් සංශෝධනය කර තිබුණු අතර 2022 ජුනි 08 දිනැති ඊමේල් ලිපිය මඟින් මේ සම්බන්ධයෙන් සැපයුම්කාර ආයතනය දැනුවත් කර තිබුණි. ඒ අනුව ඒකක 40,000 ක් වහාම හා ඉතිරිය මාස 02 ක් තුළ සැපයිය යුතුව තිබුණද ඊට අනුව සැපයුම් ලබාගැනීමට නොහැකි වී තිබුණි. කඩිනමින් තොග ලබාගැනීමේ අරමුණින් හදිසි ප්‍රසම්පාදනයක් ලෙස මෙම ප්‍රසම්පාදනය සිදුකර තිබුණද සැපයුම්කාර ආයතනය සඳහා ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය නිකුත් කර තිබුණේ 2022 සැප්තැම්බර් 26 දිනදීය. ඒ අනුව 2022 සැප්තැම්බර් 27 දිනැති අංක DHS/ICL/IG/296/22 දරන ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණු අතර 2022 නොවැම්බර් 30 දින හා 2022 දෙසැම්බර් 31 දින වනවිට ඖෂධ ඒකක 40,000 බැගින් සැපයිය යුතුව තිබුණි. කෙසේ වුවද මෙම තොගය එකවර වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබී තිබුණේ එම අංශයේ තොග ඉල්ලුම්කළ දින සිට මාස 06 ක කාල ප්‍රමාදයකින් පසුව 2023 මැයි 30 දිනදීය.

29. Nepafenac Ophthalmic Suspension 0.1% 3ml - 5ml vial (SR No.00903201)

2021 සාමාන්‍ය ඇණවුමට අදාළව ඉහත ඖෂධයෙන් ඒකක 87,500 ක් සපයාගැනීමට අපේක්ෂාකර තිබුණද කොරෝනා වසංගතය හේතුවෙන් ඖෂධයට ඇති ඉල්ලුම අඩුවීම සලකා ඒකක 30,000 ක් පමණක් 2022 අප්‍රේල් 08 දිනට සපයා ගැනීමට හා ඉතිරි ඒකක 57,500 ගෙන්වීම අත්හිටුවීමට තීරණය කර තිබුණි. 2022 වර්ෂයට අදාළව සාමාන්‍ය ඇණවුමක්

ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ඉන්දිය ණය යෝජනා ක්‍රමය යටතේ මිලදී ගැනීමේ අපේක්ෂාවෙන් 2022 මාර්තු 25 දිනැති ඉහත ඇණවුම අනුව රු.45,000,000 ක ඇස්තමේන්තුගත පිරිවැයකට මෙම ඖෂධයෙන් කුප්පි 45,000 ක් ඉල්ලුම්කර තිබුණි. මේ යටතේ කුප්පි 22,500 ක් 2022 අප්‍රේල් 30 දිනට හා කුප්පි 22,500 ක් 2022 ජුනි 30 දිනට ලබාගැනීමට අපේක්ෂාකර තිබුණි. මීට අදාළව පුවත්පත් දැන්වීමක් මඟින් හා ලියාපදිංචි ඉන්දියානු සැපයුම්කරුවන් වෙතින් ලංසු කැඳවා තිබුණු අතර ලංසු කැඳවීමේදී දින 04 ක කාලයක් පමණක් ලබාදී තිබුණි. මේ අනුව එක් ලංසුකරුවෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. 2022 අප්‍රේල් 22 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබාදී තිබුණු අතර ලංසු විවෘත කළ දින සිට ඒ සඳහා දින 21 ක කාලයක් ගත කර තිබුණි. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව 2022 අප්‍රේල් 25 දින රැස්වී තිබුණු අතර එහිදී එකම ලංසුකරු සමඟ සාකච්ඡා කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව සැපයුම්කරු ඒකකයක ලංසු මිල රු.670 සිට රු.636.50 දක්වා අඩුකිරීමට එකඟවී තිබුණු බැවින් ඒකකයක් එ.ජ.ඩො. 2.1287 බැගින් ඒකක 45,000 ක් සඳහා එ.ජ.ඩො. 95,791.50 කට ලංසුව ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණි. අංක DHS/ICL/AMS/186/2022 ඉන්ඩෙන්ටුව 2022 දෙසැම්බර් 31 නිකුත් කර තිබුණු අතර කුප්පි 22,500 ක් 2022 ඔක්තෝබර් 31 දිනටද 22,500 ක් 2022 දෙසැම්බර් 31 දිනටද සැපයිය යුතුව තිබුණි. කෙසේ වුවද මීට අදාළ ඖෂධ කුප්පි මාස 07 ක ප්‍රමාදයකින් පසුව 2023 මැයි 30 දින වෛද්‍ය සැපයීම් අංශයට ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලංසු කැඳවීම සඳහා දින 04 ක කෙටි කාලසීමාවක් ලබාදීමෙන් ලංසුව සඳහා තරඟකාරී මිලගණන් ලබාගැනීමට තිබුණු අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) 2021 හා 2022 වර්ෂයන්ට අදාළව සාමාන්‍ය ඇණවුම් නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම හා ලංසු ඉදිරිපත් කළ එකම ලංසුකරුට ලංසුව ප්‍රදානය කිරීමට තීරණය කිරීම හේතුවෙන් පෙර සැපයුමට සාපේක්ෂව එ.ජ.ඩො. 1.6438 ක් වැඩි වටිනාකමකට ලංසුව ප්‍රදානය කිරීමට සිදුවී තිබීමෙන් පසුගිය සාමාන්‍ය ඇනවුමේ මිලට සාපේක්ෂව සියයට 338 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ඇ) යථෝක්ත ලංසු සඳහා රු.670 ක ලංසුවක් ඉදිරිපත්කර තිබුණද රු.636.50 කට මිල අඩුකිරීමට එකඟවීම හේතුවෙන් එකම ලංසුකරුට ලංසුව ප්‍රදානය කර තිබුණද ඩොලර් වටිනාකමින් ගෙවීම් කිරීමට සිදුවීමෙන් සත්‍ය වශයෙන් ඒකකයකට රු.668.59 ක් දැරීමට සිදුව තිබුණි. ඒ අනුව ලංසු ලබාදීමෙන් ඉතිරිකර ගැනීමට අපේක්ෂාකළ මුදල ඉතිරි කර ගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

30. Epirubicin HCL Ing 10mg vial (SR No. 01201201)

(අ) මෙම ඖෂධයට අදාළව 2022 වර්ෂයේ සාමාන්‍ය ඇණවුම යටතේ ඒකක 250ක් මිලදී ගැනීමට කටයුතු ආරම්භ කර තිබුණු අතර ප්‍රසම්පාදනය වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂකගේ 2021 සැප්තැම්බර් 23 දිනැති ලිපිය පරිදි නතර කර තිබියදී ඉන්දීය ණය පහසුකම යටතේ මිලදී ගැනීම සඳහා 2022 මාර්තු 25 දින වෛද්‍ය සැපයීම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත පද්ධතිය හරහා ඉල්ලීමක් කර තිබුණි. ඒ අනුව 2022 ඔක්තෝබර් 01 දිනට ඖෂධ තොග ලබා ගැනීමට අවශ්‍ය බව සඳහන් කර තිබුණු අතර 2022 මාර්තු 26 දින ප්‍රසම්පාදන දැන්වීම පරිදි 2022 මාර්තු 31 දිනෙන් මිල ගණන් කැඳවීම අවසන් කර තිබුණි. එම දිනට මිල ගණන් විවෘත කිරීමේදී එක් සැපයුම්කරුවකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර ජාතික ඖෂධ නියාමන අධිකාරියේ

සහතිකයද ලබාගෙන නොතිබුණි. ප්‍රසම්පාදන තාක්ෂණික ඇගයීම් කමිටුව වාර්තාව 2022 අප්‍රේල් 26 දින ඉදිරිපත් කර තිබුණු අතර ප්‍රසම්පාදන කමිටුව එදිනම රැස්වී තිබුණි. මෙම ප්‍රසම්පාදනයේදී මිල ගණන් ඉදිරිපත් කිරීමට දින 4 ක් පමණක් ලබාදී තිබුණු අතර එම මිල ගණන් ඇගයීමට මාසයකට ආසන්න කාලයක් ගතකර තිබුණි. එම නිසා තරඟකාරී සැපයුම්කරුවන් ලබාගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. 2022 අප්‍රේල් 26 දින සුළු ප්‍රසම්පාදන කමිටුව සැපයුම්කරු ඉදිරිපත් කළ රු.6,700 ක්වූ ලංසු මිල අඩුකර ගැනීමට තීරණය කර තිබුණු අතර ඒ අනුව ඒකක මිල රු.6,365 ක් දක්වා අඩු කිරීමට තීරණය කර තිබුණි. මෙම ඖෂධයේ ඇස්තමේන්තුගත ඒකක මිල රු.667.09 ක්වූ අතර මෙම සැපයුම් මිල එම මිලෙන් සියයට 854 ක මිල වැඩිවීමක් බව නිරීක්ෂණය විය. තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව පරිදි එම ඖෂධයේ ආසන්නම මිලදී ගැනීම් මිල රු.608 ක් විය. නැවත ප්‍රසම්පාදන කමිටුව 2022 ජුනි 15 දින එනම් මුල් ප්‍රසම්පාදනයේ සිට දින 50 කට පසුව රු.6,365 බැඟින් කුප්පි 250 ක් මිලදී ගැනීමට තීරණය කර තිබුණි. මෙම ඖෂධය ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව මන්දගාමී ස්වරූපයෙන් කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර අදාළ සැපයුම්කරුට ලංසු පිරිනැමීමේ ලිපිය 2022 ජූලි 25 දින එනම් ප්‍රසම්පාදනයෙන් මාසයකට අධික කාලයක් ඉකුත් වීමෙන් පසුව සිදුකර තිබුණු අතර අදාළ සැපයුම්කරු 2022 ජූලි 26 දින එම පිරිනැමීම භාරගෙන තිබුණි. ප්‍රසම්පාදන කමිටුව විසින් ඉන්ඩෙන්ටුව අදාළ නිෂ්පාදකයා වෙත යොමු කිරීම 2022 සැප්තැම්බර් 07 සිදුකර තිබුණු අතර එය ප්‍රසම්පාදනයෙන් පසුව මාස 03 කට ආසන්න කාලයක් ඉකුත් වීමෙන් පසුව බව නිරීක්ෂණය විය. මෙම ඖෂධය සඳහා තෝරාගත් ලංසුකරු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය ලබාගෙන තිබුණද, අධිකාරිය විසින් මෙම ඖෂධයේ ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය (Quality, Safety & Efficacy) සම්බන්ධව වගකීම තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව වෙත පැවරීම තුලින් එම ආයතනය තම වගකීමෙන් බැහැර වී තිබුණි.

(ආ) ඉහත ඖෂධයෙන් 2023 වර්ෂයේ සාමාන්‍ය අවශ්‍යතාවය සඳහා කුප්පි 500 ක් ලබාගැනීම සඳහා 2022 නොවැම්බර් 16 දින පද්ධතිය හරහා ඉල්ලුම් කර තිබුණු අතර 2022 නොවැම්බර් 22 දින ලිඛිතව ඉල්ලුම්කර තිබුණි. වෛද්‍ය සැපයීම් අංශය විසින් මෙම ඉල්ලීම ඉදිරිපත් කිරීමේදී කුප්පි 300 ක් 2023 ජනවාරි 12 දින හා කුප්පි 200 ක් 2023 අප්‍රේල් 12 දින වනවිට ලබා ගැනීමට අවශ්‍ය බව දැනුම් දී තිබුණි. මෙම ඖෂධ ලබා ගැනීම සඳහා 2023 පෙබරවාරි 13 දින මිල කැඳවීමක් සිදුකර තිබුණු අතර ඒ සඳහා දින 11 ක් ලබාදී තිබුණද ප්‍රසම්පාදන තීරණය සඳහා සති 10 ක පමණ කාලයක් ගතකර තිබුණි. 2023 මැයි 09 දින ප්‍රසම්පාදන කමිටුව එන්නත් කුප්පි 500 ක් එක් කුප්පියක් රු.1,687 බැඟින් පිරිවැය රු.843,500 කට මිලදී ගැනීමට තීරණය කර තිබුණි. එය ඇස්තමේන්තු මිල වූ රු.676 සාපේක්ෂව සියයට 150 ක මිල වැඩිවීමක් විය. මෙම ප්‍රසම්පාදන කමිටුව රැස්වූ 2023 මැයි 09 දින වනවිට වෛද්‍ය සැපයීම් අංශයේ හෝ ජාතික වශයෙන් හෝ කිසිදු තොගයක් නොතිබුණු බවත් සඳහන් වන අතර සැපයුම්කරුද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතිකය (WOR) ලබාගත යුතුව තිබුණි. මෙම ප්‍රසම්පාදනය පිරිනැමීම 2023 ජුනි 02 දින සිදුකර තිබුණු අතර ඒ වනවිට ප්‍රසම්පාදන කමිටු තීරණය ලැබී සති 03 ක් පමණ ගත වී තිබුණි. මේ සඳහා 2023 නොවැම්බර් 15 දින වනවිටත් ඉන්ඩෙන්ටුවක් නිකුත් කර නොතිබුණි.

පසුව වෛද්‍ය සැපයීම් අංශය විසින් 2023 පෙබරවාරි 02 දිනැති ඇණවුම පරිදි මෙම ඖෂධයෙන් එන්නත් 175 ක් 2023 පෙබරවාරි 15 දින වනවිට මිලදී ගැනීමට අවශ්‍ය

බව සඳහන් කර තිබුණි. ඒ අනුව මෙම ඖෂධය හදිසි මිලදී ගැනීමක් ලෙස ප්‍රසම්පාදනය කිරීමට 2023 පෙබරවාරි 15 දින මිල කැඳවීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර 2023 පෙබරවාරි 17 දින අවසන් කර තිබුණි. මිල කැඳවීම සඳහා දින 03 ක් පමණක් ලබාදී තිබුණද ප්‍රසම්පාදන තීරණය 2023 මාර්තු 21 දින ලබාදී තිබුණත් ප්‍රසම්පාදනය සඳහා මාසයකට වැඩි කාලයක් ගතකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු තවදුරටත් නිරීක්ෂණය විය.

(i) දෙවන අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයක් මත එක් එන්නතක් රු.3,040 බැගින් කුප්පි 175 ක් රු.532,000 කට මිලදී ගැනීමට අනුමැතිය ලබාදී තිබුණද මෙම ප්‍රසම්පාදන මිල එහි ඇස්තමේන්තුගත මිල වූ රු.676 ට වඩා සියයට 349 ක් මිල වැඩිවීමක් බව නිරීක්ෂණය විය.

(ii) 2023 අප්‍රේල් 21 දිනැති ඉන්ඩෙන්ටුව පරිදි මෙම ඖෂධ 2023 මැයි 28 දින ලැබිය යුතු වුවත් එය 2023 අගෝස්තු 04 දින ලැබී තිබුණු බව නිරීක්ෂණය විය. මෙම හදිසි ප්‍රසම්පාදනයට අදාළව තෝරාගත් ලංසුකරු ලබාදුන් ලංසු ලියවිලි වලට අනුකූලව සති 02ක් තුළ ඖෂධ සැපයීම සිදුකළ හැකි බව දන්වා තිබුණු අතර සැපයුම්කරු තෝරාගැනීමේදී මේ පිළිබඳව සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදන පිරිනමා තිබුණද තොගය සැපයිය යුතු දින සිට මාස 02කට වැඩි කාලයක් ප්‍රමාද වී සැපයීම සිදුකර තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය අසාර්ථක වනවිට එයින් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා, කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කරන ලෙසත් හා ලංසු ඇරයුම් ලේඛනයේ දෙවන කොටසේ 6 වන වගන්ති අනුව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක SH/PSRP/01/SPC/2021 දරන 2023 ජනවාරි 10 දිනැති ලිපියේ නිර්දේශය මත කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීම වෙනුවට සැපයුම්කරුට ගෙවිය යුතු වටිනාකමෙන් සියයට 10 ක මුදලක් සැපයුම සම්පූර්ණකර දින 30 ක් දක්වා රඳවා තබාගන්නා ලෙස දන්වා තිබීම හේතුවෙන් කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) 2023 ජුනි 09 දින අංක NMRA/EA/WOR/MED/SPC/03/025/23 දරන ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතිකය ලැබී තිබුණද මෙම සහතිකය නිකුත් කළ ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් මෙම ඖෂධයේ ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය (Quality, Safety & Efficacy) සම්බන්ධව වගකීම ප්‍රසම්පාදනයට අදාළ තාක්ෂනික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව වෙත පැවරීම තුලින් එම ආයතනය වගකීමෙන් බැහැර වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) ඉහත ඖෂධයෙන් වෛද්‍ය සැපයීම් අංශය මඟින් කුප්පි 250 ක් හදිසි මිලදී ගැනීමක් ලෙස මිලදී ගැනීම සඳහා 2023 ජනවාරි 30 දින ඉල්ලීමක් කර තිබුණි. මේ සඳහා සෞඛ්‍ය හදිසි ප්‍රසම්පාදන කමිටුව 2023 මාර්තු 22 දින පත්කර තිබුණු අතර 2023 මාර්තු 27 දින ලංසු කැඳවා තිබුණු අතර ලංසු ඉදිරිපත් කිරීමට දින 03 ක කාලයක් පමණක්

ලබා දී තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව ඉන් සති 03 කට ආසන්න කාලයක් ඉකුත් වී 2023 අප්‍රේල් 24 දින ලංසු ඇගයීම සිදුකර තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් වූ සැපයුම්කරුවන් 06 දෙනාම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සහතිකය ලබා නොතිබුණු අතර ආයතන 02 ක් විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සහතිකය (NMRA Manufacturing Site Approval) ඉදිරිපත් කර තිබුණු බවත් ඒ අතුරින් අවම මිල ඉදිරිපත් කළ ආයතනය වෙත ලංසු ඇගයීමේ දින සිට දින 20 කට පසුව එනම් 2023 මැයි 12 දින සෞඛ්‍ය අමාත්‍යාංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් ඒකක 250 ක් ඒකකයක් රු.2,948 බැගින් මිලදී ගැනීමට තීරණය ලබාදී තිබුණි. මෙම ප්‍රසම්පාදන මිල එහි ඇස්තමේන්තුගත මිල වූ රු.676 ට සාපේක්ෂව සියයට 336 ක් වැඩි වී තිබුණි. 2023 මැයි 12 දිනැති ප්‍රසම්පාදන කමිටුවේදී මෙම අයිතමයෙන් තොග නොමැති බවත් ඒ හේතුවෙන් ප්‍රමාදයකින් තොරව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු බවටත් සඳහන් කර තිබුණද යථෝක්ත ප්‍රසම්පාදන තීරණය පරිදි 2023 ජුනි 16 දින එනම් ප්‍රසම්පාදනයෙන් මසක් ඉක්මවූ පසුව ඉන්ඩෙන්ටුවක් නිකුත්කර තිබුණි. මෙම ඇණවුමට අදාළව ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතිකය සඳහා 2023 සැප්තැම්බර් 04 දින ඉල්ලීම් කර තිබුණද ලැබී ඇති බවට තොරතුරු ලිපිගොනුවේ නොවීය. නමුත් ඉන්ඩෙන්ටුව පරිදි 2023 ජුලි 30 දින වනවිට ඖෂධ ලැබිය යුතු වුවද විගණිත දිනය වූ 2023 ඔක්තෝබර් 06 දින දක්වාම එන්නත් තොග ලැබී නොතිබුණි. ස්වස්ථ පද්ධතිය අනුව 2024 මාර්තු 11 දින වනවිටත් මෙම තොග ලැබී නොතිබුණි.

(ඇ) 2023 මැයි 25 දින වෛද්‍ය සැපයීම් අංශය විසින් ඖෂධයෙන් ඒකක 1,500 ක් සඳහා ඇණවුමක් ඉදිරිපත් කර තිබුණු අතර ඉන්දියානු ණය පහසුකම් යටතේ මිලදී ගැනීමේ අපේක්ෂාවෙන් 2023 ජුනි 15 දින සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව පත්කර තිබුණි. 2023 ජුනි 16 දින ලංසු භාර ගැනීම අවසන් කර තිබුණු අතර 2023 ජුනි 27 දින තාක්ෂණික ඇගයීම් කමිටු පවත්වා තිබුණි. ප්‍රසම්පාදන කමිටුව 2023 ජුනි 28 දින රැස්වී තිබුණු අතර ඉදිරිපත් වූ සැපයුම්කරුවන් 06 ක් අතුරින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සහතිකය ඇති දෙවන අවම මිල ඉදිරිපත් කළ ආයතනය වෙත ප්‍රසම්පාදනය පිරිනැමීමට හදිසි ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. ඒ අනුව එක් එන්නතක් රු.1,500 බැගින් එන්නත් 1,500 ක් මිලදී ගැනීමට තීරණය කර තිබුණි. එය ඇස්තමේන්තුගත මිල වූ රු.676 ට සාපේක්ෂව සියයට 122 ක වැඩි මිල වැඩිවීමක් බව නිරීක්ෂණය විය. මෙය හදිසි ප්‍රසම්පාදනයක් වුවද මේ සඳහා වූ ඉන්ඩෙන්ටුව ප්‍රසම්පාදන තීරණය ලැබීමෙන් මාස 2 කට පසුව 2023 සැප්තැම්බර් 07 දින නිකුත් කර තිබුණි. ඉන්ඩෙන්ටුව පරිදි මෙම ඖෂධ 2023 දෙසැම්බර් 11 දින ලබාදිය යුතු වුවත් මාස 02 ක ප්‍රමාදයකින් පසුව තොගය ලැබී තිබුණේ 2024 පෙබරවාරි 19 දිනදීය. ඉහත කරුණු අනුව හදිසි අවශ්‍යතාවයක් ලෙස දැක්වුවද මෙම ඖෂධ මිලදීගැනීමේ ක්‍රියාවලියේ මන්දගාමී ස්වරූපයක් නිරීක්ෂණය විය.

31. Natamycin Ophthalmic Suspension 5% in 15 ml Dropper Bottle (SR No.00904901)

(අ) 2022 වර්ෂයට අදාළව සාමාන්‍ය ඇණවුමක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2022 මාර්තු 25 දිනැති ඇණවුම මඟින් මුළු පිරිවැය රු.6,659,120 ක්වූ ඖෂධ කුප්පි 19,000 ක් 2022 අප්‍රේල් 30 දිනට හා 2022 ජුනි 30 දිනට ඒකක 9,500 බැගින් ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ සපයා ගැනීමට අපේක්ෂා කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2022 මාර්තු 26 දින ලංසු කැඳවා තිබුණු අතර 2022 මාර්තු 31 දින විවෘත කර තිබුණි. එක් සැපයුම්කරුවෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර 2022 අප්‍රේල් 26 දින

තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය හා 2022 අප්‍රේල් 27 දිනැති දෙපාර්තමේන්තු සුළු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය පරිදි ඉදිරිපත්ව ඇති ඒකකයක ලංසු මිල ඇස්තමේන්තුගත මිල හා පෙර සැපයුම් මිල අතර විශාල වෙනසක් පවතින බැවින් සැපයුම්කරු සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කර තිබුණි.

(i) මෙම ලංසු කැඳවීම හදිසි ප්‍රසම්පාදනයක් ලෙස ක්‍රියාත්මක කර තිබුණු අතර ලංසු කැඳවීමට දින 04 ක් වැනි කෙටි කාලසීමාවක් ලබා දීම හේතුවෙන් මෙම ප්‍රසම්පාදනය නිසි තරඟකාරීත්වයකට යොමුවී නොතිබුණු බව නිරීක්ෂණය විය. සැපයුම්කරු ලංසුවේ ඉදිරිපත් කළ ඒකකයක මිල රු.970 සිට රු.893 දක්වා අඩුකිරීමට එකඟ වී එම මිලට කුප්පි 19,000 ක් ඒකකයක් එ.ජ.ඩො. 2.99 බැගින් මුළු පිරිවැය එ.ජ.ඩො. 56,810 ක මුදලකට මිලදී ගැනීමට 2022 ජුනි 15 දිනැති ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. මේ හේතුවෙන් පසුගිය ආසන්නතම මිලදී ගැනීමේ මිලට වඩා ඒකකයක් සඳහා සියයට 248 ක් වැඩියෙන් හා ඇස්තමේන්තුගත ඒකකයක මිලට වඩා සියයට 154 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ii) හදිසි මිලදීගැනීමක් ලෙස ලංසු කැඳවා තිබියදී හා ලංසුකරු ලංසු ඉදිරිපත් කිරීමේදී දින 14 ක් ඇතුළත සැපයුම්කළ හැකි බව දන්වා තිබියදී 2022 ඔක්තෝබර් 31 දිනැති ඉන්ඩෙන්ටුව අනුව 2022 නොවැම්බර් හා දෙසැම්බර් 30 දිනයන්හිදී ඒකක 9,500 බැගින් සැපයිය යුතු බව දන්වා තිබීම හේතුවෙන් මෙම ප්‍රසම්පාදනය හදිසි අවශ්‍යතාවක් බව විගණනයට නිරීක්ෂණය නොවීය. කෙසේ වුවද මෙම ඖෂධ තොග යථෝක්ත දිනයන්හිදී සැපයුම්කර නොතිබුණු අතර මාස 04 ක පමණ කාල ප්‍රමාදයකින් පසු 2023 අප්‍රේල් 04 දින එකවර ඖෂධ තොගය සපයා තිබුණි.

(iii) ඉහත ප්‍රසම්පාදනයට අදාළ ලංසුව රුපියල් අගයකින් ඉදිරිපත් කර තිබුණද එ.ජ.ඩොලර් වටිනාකමින් ගෙවීම් කිරීමට සිදුවීමෙන් ඒකකයකට රු.990.82 ක් බැගින් ගෙවීමට සිදුව තිබුණු බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් අපේක්ෂිත ඉතිරිය ලබාගැනීමට නොහැකිවී තිබුණු අතර අඩුකළ ලංසු මිලට වඩා රු.97.82 ක් එනම් මුළු වටිනාකම රු.1,858,580 ක් වැඩිපුර ගෙවීමට සිදුව තිබුණි.

(ආ) 2023 සාමාන්‍ය ඇණවුම යටතේ මෙම ඖෂධයෙන් ඒකක 10,000 ක් මිලදී ගැනීමට අදාළව 2022 නොවැම්බර් 15 දිනැති ඇණවුම අනුව 2023 ජනවාරි 10 දිනට හා 2023 අප්‍රේල් 03 දිනට ඒකක 5,000 බැගින් මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.3,504,800 ක්වූ ඖෂධ ඒකක 10,000 ක් සපයා ගැනීමට අපේක්ෂිතව තිබුණි. මේ සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 21 දින ලංසු කැඳවා 2023 ජනවාරි 05 දින ලංසු කැඳවීම අවසන් කර තිබුණි. ඒ අනුව ලංසුකරුවන් දෙදෙනෙකු මිලගණන් ඉදිරිපත් කර තිබුණු අතර අඩුම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු වෙත ඖෂධ කුප්පියක් රු.750 බැගින් රු.7,500,000 ක්වූ මුළු පිරිවැයකට හා ජීවකාලය මාස 18 ක් සහිත මෙම ඖෂධ වෛද්‍ය සැපයීම් අංශයේ පිළිගැනීම මත මිලදී ගැනීමට 2023 ජනවාරි 23 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි.ලංසුකරුගේ ඒකකයක මිල ඇස්තමේන්තුගත ඒකකයක මිලට වඩා සියයට 113 ක මිල වැඩිවීමක් නිරීක්ෂණය විය. කෙසේ වුවද ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමේ 2023 පෙබරවාරි 20 දිනැති ලිපිය ෆැක්ස් මඟින් යවා තිබුණු අතර ඊට අනුව ඒකක 5,000 ක් වහාම හා ඉතිරි ඒකක 5,000 මාස 02 කට පසු සැපයිය යුතු බව

දක්වා තිබුණි. ඊට අදාළව ආයතනය විසින් එවන ලද 2023 මාර්තු 01 දිනැති ලිපිය අනුව ඒකක 5,000 ක් 2023 මැයි හා පළමු තොගය සඳහා ගෙවීමෙන් අනතුරුව දින 60 ක් තුළ ඉතිරි ඒකක ප්‍රමාණය සැපයුම් කරන බව දන්වා තිබුණි. 2018 සිට මිලදීගත් ඖෂධ සඳහා වූ රු.මිලියන 437.7 ක බිල්පත් පියවීම ප්‍රමාද වීමෙන් යටෝක්ත සැපයුම්කරු විසින් ඖෂධ සැපයීම ප්‍රමාද කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. මේ අවස්ථාව වනවිට වෛද්‍ය සැපයීම් අංශයේ ඖෂධ ශූන්‍ය තත්ත්වයේ පැවති බව නිරීක්ෂණය වූ අතර මෙම තොග හිඟ තත්ත්වය 2022 ඇණවුමකට අදාළව ලබාදී තිබුණු ඒකක 19,000 ක්වූ ඖෂධ තොගය 2023 අප්‍රේල් 04 දින ලැබෙන තුරු පැවති බව නිරීක්ෂණය විය. ස්වස්ථ පරිගණක පද්ධතිය අනුව ඉහත ඇණවුමට අදාළව 2024 මාර්තු 12 දින වනතුරුත් ඉන්ඩෙන්ටුවක් නිකුත් කර නොතිබුණි.

32. Chlorambucil Tabs BP/usp 2mg (SR - 01200201)

(අ) 2022 වර්ෂයේ වාර්ෂික අවශ්‍යතාවය ලෙස ඇස්තමේන්තුගත වටිනාකම රු.10,309,500 ක්වූ මෙම ඖෂධයෙන් පෙති 30,000 ක් ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ මිලදී ගැනීමට 2022 මාර්තු 25 දිනැති ඇණවුමක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඉදිරිපත් කර තිබුණි. මෙම ඇණවුම යටතේ 2022 අප්‍රේල් 01, අගෝස්තු 31 හා නොවැම්බර් 30 දිනට පෙති 10,000 බැගින් සැපයිය යුතුව තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා 2022 මාර්තු 26 දින ලංසු කැඳවා තිබුණි. ප්‍රසම්පාදනය සඳහා ලංසුකරුවන් දෙදෙනෙකු ඉදිරිපත්වී තිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 2022 මාර්තු 31 දින ලංසු ඇගයීම් සිදු කර තිබුණි. 2022 අප්‍රේල් 27 දිනැති දෙපාර්තමේන්තු සුළු ප්‍රසම්පාදන කමිටුව විසින් ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචියක් නොමැති අවම මිල ඉදිරිපත් කරන ලද ලංසුකරු තෝරාගෙන තිබුණු අතර ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ඖෂධ සැපයීමට එකඟතාවය ලබාගන්නා ලෙස දන්වා තිබුණි.

(i) මෙම ඖෂධය සඳහා තෝරාගත් ලංසුකරු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය ලබාගෙන තිබුණද අධිකාරිය විසින් මෙම ඖෂධයේ ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය (Quality, Safety & Efficacy) සම්බන්ධව වගකීම ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත පැවරීම තුලින් එම ආයතනය වගකීමෙන් බැහැර වී තිබුණි.

(ii) ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ඖෂධ සැපයීමට එකඟතාව විමසමින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව 2022 ජුනි 02 දින ඊමේල් පණිවිඩයක් යොමු කර තිබුණු අතර ඒ සඳහා ප්‍රසම්පාදන තීරණයේ සිට දින 36 ක කාලයක් ගත කර තිබුණි. සැපයුම්කරු එම එකඟතාවය හා ඉදිරිපත් කරන ලද මිලෙන් සියයට 5 ක් අඩුකිරීමට එකඟ වී තිබුණෙන් 2022 ජුනි 15 දිනැති ප්‍රසම්පාදන කමිටුව ඖෂධ පෙත්තක් රු.551 ක් හෙවත් එ.ජ. ඩොලර් 1.84 කට මිලදී ගැනීමට අනුමැතිය ලබාදී තිබුණි. මෙම ඇණවුම ප්‍රදානය කිරීමේ ලිපිය 2022 ජුලි 25 දින නිකුත්කර තිබුණු අතර ප්‍රසම්පාදන අනුමැතියේ සිට ඒ සඳහා දින 40 ක කාලයක් ගතවී තිබුණි.

(iii) ඉන්ඩෙන්ටුව අනුව පෙති 30,000 ක් 2022 නොවැම්බර් 30 දින වන විට සැපයිය යුතුව තිබුණද 2023 මැයි 19 දින ඖෂධ තොගය වෛද්‍ය සැපයීම් අංශයට සපයා තිබුණි. එහෙත් 2024 මාර්තු 12 දින වන විටත් තොග ලැබීම්

සම්බන්ධයෙන් ස්වස්ථ පරිගණක පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණි. මෙම ඇණවුමට අදාළ ඖෂධ තොග නිසි දිනට නොලැබීම හේතුවෙන් එම වර්ෂයේ හදිසි මිලදී ගැනීමකට යාමටද සිදුවී තිබුණි.

(ආ) ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ඇණවුම් කළ ඖෂධ නියමිත කාල රාමුව තුළ නොලැබීම හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශය විසින් නිකුත් කරන ලද මෙම ඖෂධ ඒකක 2,500 ක ඇස්තමේන්තුගත වටිනාකම රු.859,125 ක්වූ හදිසි ඇණවුම 2022 ජුනි 28 දින සංස්ථාව වෙත ඉදිරිපත්කර තිබුණි. මේ වනවිට MSMIS පරිගණක පද්ධතිය අනුව වෛද්‍ය සැපයීම් අංශයේ තොග ශූන්‍ය තත්ත්වයක පැවතිණි. ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් වූ සැපයුම්කරුවන් දෙදෙනාටම ලියාපදිංචි සහතිකයක් නොමැති වීම හා සාම්පල් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් නැවත මිලගණන් කැඳවීමට තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) මෙම ඖෂධය පිළිකා රෝගීන්ට ලබාදෙන ඖෂධයක් මෙන්ම දැනට රෝහල් සතුව තොග නොමැතිවීම හේතුවෙන් හා පසුගිය සැපයුම්කරු දින 15 ක් ඇතුළත ඖෂධය සැපයීමට හැකි බව ලංසු ලේඛනයේ දක්වා තිබුණු බැවින් එම සැපයුම්කරු සමඟ සාකච්ඡා කර පෙත්තක් රු.3,100 ක්වූ ලංසු මිල රු.2,000 ක් දක්වා අඩුකර මිලදී ගැනීමට 2022 අගෝස්තු 16 දිනැති සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. මෙම සැපයුම්කරුගේ හදිසි ප්‍රසම්පාදනයේ ඒකකයක පිරිවැය පසුගිය ප්‍රසම්පාදනයේ ඒකකයක පිරිවැයට සාපේක්ෂව සියයට 262 ක හා ඇස්තමේන්තුගත ඒකකයක පිරිවැයට සාපේක්ෂව සියයට 482 ක මිල වැඩිවීමක් බව නිරීක්ෂණය විය.

(ii) හදිසි මිලදී ගැනීමක් වුවත් ප්‍රසම්පාදන තීරණයේ සිට දින 15 ක කාල ප්‍රමාදයකින් පසු 2022 අගෝස්තු 30 දින සැපයුම්කරු වෙත ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණි. ඒ අනුව ඖෂධයේ පෙති 2,500 ක් 2022 ඔක්තෝබර් 05 දින සැපයිය යුතු බව දක්වා තිබුණද මෙම ඖෂධය වෛද්‍ය සැපයීම් අංශයට ලැබී තිබුණේ මාසයක කාල ප්‍රමාදයකින් පසුව 2022 නොවැම්බර් 15 දිනදීය.

(iii) තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සැපයුම්කරුවන් දෙදෙනාම ප්‍රතික්ෂේප කර තිබුණද, ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසුකරු තෝරාගැනීමේදී දින 15 කදී ඖෂධය සැපයීමට හැකි වීම පිළිබඳව පමණක් සැලකිල්ලට ගෙන තිබුණද සැපයුම්කරුට මෙම ඖෂධය වෛද්‍ය සැපයීම් අංශයට සැපයීමට ප්‍රසම්පාදන තීරණයේ දින සිට දින 89 ක කාලයක් ගත වී තිබුණි.

(iv) ලංසුකරුවන් දෙදෙනාගේම නිෂ්පාදකයා එකම ඉන්දියානු සමාගමක් බව නිරීක්ෂණය වූ අතර තෝරා නොගත් අවම මිල ලංසුකරු ඖෂධය සැපයීමට ණයවර ලිපිය විවෘත කළ දිනයේ සිට දින 45 ක කාලයක් තුළ ඖෂධය සැපයිය හැකි බව දන්වා තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණද තෝරාගත් සැපයුම්කරුද දින 15 ක් තුළ සැපයීම සිදුකර නොතිබුණු අතර රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ඉන්ඩෙන්ටුව නිකුත් කිරීමේදී දින 35 ක කාලයක් ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය. මේ අනුව පෙති 2,500 ක් සඳහා රු.5,000,000 ක් වැයකිරීමට සිදුවී තිබුණු අතර අවම මිල ලංසුකරු තෝරා

නොගැනීමෙන් රජයට වැය කිරීමට සිදුව තිබුණු අතිරේක පිරිවැය රු.3,618,025 ක් විය.

(v) වාර්ෂික අවශ්‍යතා ඇණවුම සැලසුම් කළ කාලය තුළ නොලැබීම හේතුකොටගෙන හදිසි ප්‍රසම්පාදනයක් වෙත යොමු වුවද, එම ඇණවුමද වාර්ෂික ඇණවුම ප්‍රදානය කළ සැපයුම්කරු වෙතම ප්‍රදානය කර තිබුණු බව නිරීක්ෂණය වූයෙන් ප්‍රධාන ඇණවුම හිතාමතාම ප්‍රමාද කර හදිසි ප්‍රසම්පාදනයක් වෙත යොමු වීමක් සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(vi) ඖෂධයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට යටත්ව 2022 අගෝස්තු 16 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණය මඟින් ලංසුකරු තෝරාගෙන තිබුණද රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට අයත් රසායනාගාරයේ මෙම ඖෂධය පරීක්ෂා කළ නොහැකි බැවින් ජාතික තත්ත්ව ආරක්ෂණ රසායනාගාරයේ පරීක්ෂා කිරීමට ලිඛිත ඉල්ලීමක් කර තිබුණු අතර සැපයුම්කරු විසින් 2023 මාර්තු 20 දින ඒ සඳහා රු.427,348 ක මුදලක්ද රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ගෙවා තිබුණි. නමුත් මෙම ඖෂධය ජීවී සෛලවලට විෂ සහිත ඖෂධයක් (Cytotoxic) බැවින් පරීක්ෂා කළ නොහැකි බව යථෝක්ත රසායනාගාරය විසින් දන්වා තිබුණි. ඒ අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් මෙම කොන්දේසි ඉවත්කිරීම සඳහා යෝජනාවක් 2023 ජූනි 26 දින ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණි. එම ඖෂධ තොග 2022 නොවැම්බර් වෛද්‍ය සැපයීම් අංශයට ලැබී තිබීමත්, දැනට රෝහල්වල භාවිතා වීමත් හේතුවෙන් නියැදියක් පරීක්ෂා කිරීමේ කොන්දේසිය අවලංගු කිරීමට 2023 ජූනි 28 දින සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. තෝරාගත් ලංසුකරු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය ලබාගෙන තිබුණද අධිකාරිය විසින් මෙම ඖෂධයේ ගුණත්වය, ආරක්ෂාව සහ ප්‍රත්‍යක්ෂභාවය (Quality, Safety & Efficacy) සම්බන්ධව වගකීම ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කළ තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව වෙත පැවරීම තුලින් එම ආයතනයද වගකීමෙන් බැහැර වී තිබුණු බව නිරීක්ෂණය වූයෙන් මෙම ඖෂධය කිසිදු තත්ත්ව පරීක්ෂාවකින් තොරව භාවිතා කර ඇති බව නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් පිළිකා රෝගීන් වෙත ලබාදෙන ඖෂධයක් වූ මෙම ඖෂධය භාවිතයෙන් එම රෝගීන්ට වූ හානිය හෝ බලපෑම විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය.

(ඇ) 2023 වාර්ෂික ඇණවුම 2023 ජනවාරි වනවිටත් ලැබී නොතිබීම හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශය විසින් හදිසි ඇණවුමක් ලෙස ඇස්තමේන්තුගත වටිනාකම රු.2,577,375 ක් වූ ඉහත ඖෂධයෙන් පෙති 7,500 ක් මිලදී ගැනීම සඳහා 2023 ජනවාරි 30 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඇණවුමක් යොමුකර තිබුණි. ඒ අනුව 2023 පෙබරවාරි 01 දින පෙති 7,500 සැපයිය යුතුව තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා 2023 මාර්තු 27 දින මිල ගණන් කැඳවා තිබුණු අතර ඒ සඳහා දින 04 ක් පමණ ලබා දී තිබුණි. මෙම ඇණවුම ඉදිරිපත් කළ දිනයේ සිට දින 55 ක කාලයක් මිල කැඳවීමට ගත කර තිබුණු බව නිරීක්ෂණය විය. ප්‍රසම්පාදනය සඳහා ලංසුකරුවන් 4 දෙනෙකු මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. නමුත් මීට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත්කර තිබුණේ 2023 අප්‍රේල් 20 දිනදීය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂනයන් කෙරේ.

(i) 2023 මැයි 12 දිනැති සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් තුන්වෙනි අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු වලංගු ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකයක් නොමැති හා ඖෂධ නියාමන අධිකාරියේ නිෂ්පාදන වැඩබිම (Manufacturing Site Approval) සඳහා අනුමැතියලත් ලංසුකරු තෝරාගෙන තිබුණු අතර එම දේශීය නියෝජිතයාගේ ඉන්දීය නිෂ්පාදකයාට 2023 වාර්ෂික ඇණවුමේ ලංසුවද ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද විගණිත දිනය වන 2023 සැප්තැම්බර් 26 දින වනවිටත් ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයක් ලැබී තිබුණු බවට තොරතුරු ලිපිගොනුවේ ඇතුළත්ව නොතිබුණි.

(ii) 2023 ජුනි 22 දිනැති ඉන්ඩෙන්ටුව ප්‍රසම්පාදන කමිටු තීරණයෙන් දින 39 කට පසුව නිකුත් කර තිබුණු අතර ඊට අනුකූලව මෙම ඖෂධයේ පෙති 7,500 ක් 2023 ජුලි 24 දින සැපයිය යුතුව තිබුණද විගණිත දිනය වන 2024 මාර්තු 11 දිනටත් ස්වස්ථ පද්ධතිය අනුව මෙම ඖෂධ තොගය වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබී නොතිබුණි.

(ඇ) විදේශ සේවා නියුක්ති කාර්යාංශය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත රජයේ රෝහල්වල පිළිකා රෝගීන් සඳහා පිළිකා අයිතම මිලදී ගැනීමට ලබා දී තිබුණු මුදල් භාවිතාකර පෙති 5,000 ක් රු.1,718,250 ක ඇස්තමේන්තුගත මුදලකට මිලදීගැනීම සඳහා වූ ඇණවුම 2023 පෙබරවාරි 02 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත නිකුත් කර තිබුණි. ඒ අනුව පෙති 5,000 ක ප්‍රමාණය 2023 පෙබරවාරි 15 දිනට සැපයිය යුතුව තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා 2023 පෙබරවාරි 15 දින ලංසු කැඳවා තිබුණු අතර ලංසුකරුවන් 3 දෙනෙකු මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. 2023 පෙබරවාරි 24 දින තාක්ෂණික ඇගයීම් කමිටුව ලංසු ඇගයීම සිදුකර තිබුණු අතර 2023 මාර්තු 09 දිනැති සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරු විසින් ලංසු 2 ක් ඉදිරිපත් කිරීම මත ප්‍රතික්ෂේපකර දෙවැනියට අවම මිල ඉදිරිපත් කළ ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය නොමැති ලංසුකරු ජයග්‍රාහී ලංසුකරු ලෙස තෝරාගෙන තිබුණි. මීට අදාළ ඉන්ඩෙන්ටුව 2023 අප්‍රේල් 21 දින නිකුත්කර තිබුණු අතර ඒ අනුව 2023 මැයි 26 දින පෙති 4,980 ක් සැපයිය යුතුව තිබුණි. නමුත් ස්වස්ථ පද්ධතිය අනුව විගණිත දිනය වූ 2024 මාර්තු 11 දින වනවිටත් මෙම ඖෂධ තොගය ලැබී නොතිබුණි.

33. Epirubicin Hydrochoride Injection 50 mg (SR No. 01201202)

(අ) 2022 සාමාන්‍ය ඇණවුමක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර වෛද්‍ය සැපයීම් අංශය විසින් 2022 මාර්තු 25 දින පද්ධතිය හරහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත මෙම එන්නතෙන් ඒකක 1,000 ක් 2022 දෙසැම්බර් 01 දින වනවිට ලබාගැනීමට ඇණවුම් කර තිබුණි. ඉන්දියන් ණය යෝජනා ක්‍රමය යටතේ මිලදී ගැනීමට 2022 මාර්තු 26 දින ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණු අතර ලංසු කැඳවීම සඳහා දින 04 ක් පමණක් ලබාදී තිබුණි. ලංසු විවෘත කිරීම හා ඇගයීම 2022 මාර්තු 31 දින සිදුකර තිබුණි. මේ සඳහා සැපයුම්කරුවන් තිදෙනෙක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර අදාළ ඖෂධය සඳහා NMRA සහතිකයක් සහිත සැපයුම්කරු වෙත එක් එන්නතක් එ.ජ.ඩො. 18

බැඟින් මුළු වටිනාකම එ.ජ.ඩො. 18,000 ක් හෙවත් රු.6,498,000 කට ලංසුව ප්‍රදානය කිරීමට 2022 අප්‍රේල් 26 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. එහි සඳහන් කලින් ආසන්නතම මිල එන්නතක් සඳහා රු.1,460 ක් විය. ඖෂධ ඒකකයක ලංසු මිල 6,498 ක්වූ අතර ඖෂධ ඒකකයක ඇස්තමේන්තුගත මිල රු.1,325 ක් වූයෙන් මෙම ප්‍රසම්පාදනයේදී ඇස්තමේන්තුගත මිලෙන් සියයට 390 ක් වැඩි මිලකට ප්‍රසම්පාදනය ලබාදී තිබුණු බව නිරීක්ෂණය විය.2022 අගෝස්තු 31 දින ඉන්ඩෙන්ටුවක් නිකුත් කර තිබුණු අතර ඒ අනුව ඖෂධ තොගය 2022 නොවැම්බර් 30 දින සැපයිය යුතුව තිබුණද 2023 මාර්තු 07 දින ඖෂධ තොගය ලැබී තිබුණි. ඉහත ප්‍රසම්පාදනයට අදාළ ලංසුව රුපියල් අගයකින් ඉදිරිපත් කර තිබුණද එ.ජ.ඩොලර් වටිනාකමින් ගෙවීම් කිරීමට සිදුවීමෙන් ඒකකයක ලංසු මිල රු.6,498 ක් වුවද රු.6,637.86 ක් බැගින් ගෙවීමට සිදුව තිබුණි.

(ආ) ඉහත ඖෂධයේ 2023 අවශ්‍යතාවය සඳහා අවශ්‍ය සාමාන්‍ය ඇණවුම පිළිබඳව 2022 නොවැම්බර් 16 දින පද්ධතිය හරහා වෛද්‍ය සැපයීම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත දැනුම් දී තිබුණි. ඊට අදාළ ලිඛිත ඉල්ලීම 2022 නොවැම්බර් 22 දින සිදුකර තිබුණු අතර ඇණවුම අනුව 2023 ජනවාරි 12 හා අප්‍රේල් 12 දින වනවිට එම ඖෂධයෙන් එන්නත් කුප්පි 2,000 බැගින් සපයා ගැනීමට අපේක්ෂා කර තිබුණි. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් 2023 පෙබරවාරි 22 දින දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සීමිත මිල ගණන් කැඳවීමක් කර තිබුණි. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය 2023 ජුනි 15 දින ලබාදී තිබුණු අතර එක් එන්න එ.ජ.ඩො. 7.50 බැගින් එන්නත් කුප්පි 4,000 ක් මුළු පිරිවැය එ.ජ.ඩො. 30,000කට මිලදී ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව එන්නත් කුප්පියක ලංසු මිල රු.2,529.65 ක් වූ අතර ඇස්තමේන්තුගත මිල රු.1,446.76 ක් වූයෙන් මෙම ප්‍රසම්පාදනයේදී ඇස්තමේන්තුගත මිලෙන් සියයට 74ක් වැඩි මිලකට ලංසුව ලබාදී තිබුණි. ස්වස්ථ පරිගණක පද්ධතියට අනුව 2024 මාර්තු 11 දින වනවිටත් මෙම ප්‍රසම්පාදනයට අදාළ ඉන්ඩෙන්ටුව නිකුත් කර නොතිබුණි.

(ඇ) මෙම එන්නත් මිලදී ගැනීම සඳහා 2023 ක්‍රියාත්මක කරන ලද සාමාන්‍ය ප්‍රසම්පාදනය සඳහා ඖෂධ නොලැබීම හේතුවෙන් හදිසි ප්‍රසම්පාදනයක් ලෙස මෙම එන්නතෙන් ඒකක 2,000 ක් මිලදී ගැනීම සම්බන්ධයෙන් වෛද්‍ය සැපයීම් අංශය විසින් 2023 ජනවාරි 30 දින ඉන්ඩෙන්ටුවක් ඉදිරිපත් කර තිබුණි. 2023 මාර්තු 27 දින ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර 2023 මාර්තු 30 දින ලංසු විවෘත කිරීම සිදුකර තිබුණි. සැපයුම්කරුවන් 06 දෙනෙකු මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. එම දිනයෙන් සති 03 ක කාලයක් ඉකුත්වීමෙන් පසුව ඇඟයීම් කමිටුවට ඉදිරිපත් කර තිබුණි. සැපයුම්කරුවන් අතුරින් තෙවන අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුගෙන් එන්නතක් රු.4,420 බැඟින් එන්නත් 2,000 ක් රු.8,840,000 කට මිලදී ගැනීමට තීරණය කර තිබුණි. එන්නත් කුප්පියක ඇස්තමේන්තුගත මිල රු.1,446.76 ක් වූයෙන් මෙම ප්‍රසම්පාදනයේදී ඇස්තමේන්තුගත මිලෙන් සියයට 205ක් වැඩි මිලකට ලංසුව ලබාදී තිබුණි. ඉන්ඩෙන්ටුව අනුව මෙම එන්නත් 2023 ජූලි 26 දින වනවිට ලැබිය යුතුව තිබුණද ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයක් 2023 ජූලි 13 දින ඉල්ලා ඇති අතර විගණිත දිනය තෙක් ලද බවට සාක්ෂියක් නොවීය. 2024 මාර්තු 11 දින වනවිටත් අදාල ඖෂධ තොගය ලැබී නොතිබුණි.

(ඈ) 2023 ඇණවුම් 02 ක් සඳහා ඖෂධ නොලැබී ඇති අවස්ථාවකදී හදිසි මිලදී ගැනීමක් ලෙස එන්නත් කුප්පි 1,350 ක් ලබා ගැනීම සඳහා 2023 පෙබරවාරි 02 දින පද්ධතිය හරහා ඉල්ලීමක් කර තිබුණු අතර 2023 පෙබරවාරි 15 දින ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර 2023 පෙබරවාරි 17 දින ලංසු විවෘත කර තිබුණි. එම දිනයේදීම මිල ඇඟයීම් කමිටුවට නිර්දේශය ලබාදී තිබුණි. සැපයුම්කරුවන් තිදෙනෙක් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර ඒ අතුරින් කිසිඳු සැපයුම්කරුවෙකු NMRA සහතිකය ඉදිරිපත් කර නොතිබුණි. දෙවන අවම මිල ඉදිරිපත් කළ ආයතනය පමණක් Manufacturing Site Approval ඉදිරිපත් කර තිබුණු අතර 2023 මාර්තු 05 දින රැස්වූ හදිසි ප්‍රසම්පාදන කමිටුව මිල සංශෝධනයක් සහ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය පසුව ඉදිරිපත් කිරීම යන කොන්දේසි මත කුප්පි 1,350 ක් රු.5,098 බැගින් රු.6,882,300 ක පිරිවැයකට ලංසුව පිරිනමා තිබුණි. ඉන් සති 06 ක් පමණ ඉකුත් වීමෙන් පසුව 2023 අප්‍රේල් 21 දින ඉන්ටෙන්ඩුව නිකුත් කර තිබුණි. මෙම ඖෂධ ඒකකයක ඇස්තමේන්තුගත මිල රු.1446 ක් වූයෙන් ඇස්තමේන්තුගත මිලෙන් සියයට 252 ක් වැඩි මිලකට ලංසුව ලබාදී තිබුණි.

(i) මෙම හදිසි ප්‍රසම්පාදනයට අදාළව තෝරාගත් ලංසුකරු ලබාදුන් ලංසු ලියවිලිවලට අනුකූලව සති 02ක් තුළ ඖෂධ සැපයීම සිදුකළ හැකි බව දන්වා තිබුණු අතර සැපයුම්කරු තෝරාගැනීමේදී මේ පිළිබඳව සැලකිල්ලට ගෙන තිබුණු බව නිරීක්ෂණය විය ඉන්ටෙන්ඩුව පරිදි කුප්පි 1,350 ක් රු.5,098 බැගින් රු.6,882,300 ක පිරිවැයකට 2023 මැයි 28 දින වනවිට සැපයිය යුතුව තිබුණි. නමුත් ඖෂධ 2023 අගෝස්තු 14 දින ලැබීම හේතුවෙන් තොගය සැපයිය යුතු දින සිට සති 10 ක් පමණ ප්‍රමාද වී සැපයීම සිදුකර තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය අසාර්ථක වනවිට එයින් ප්‍රසම්පාදන අස්පීත්වය ආරක්ෂා කිරීම සඳහා, කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කරන ලෙසත් හා ලංසු ඇරයුම් ලේඛනයේ දෙවන කොටසේ 6 වන වගන්ති අනුව කාර්යයසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක SH/PSRP/01/SPC/2021 දරන 2023 ජනවාරි 10 දිනැති ලිපියේ නිර්දේශය මත කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීම වෙනුවට සැපයුම්කරුට ගෙවිය යුතු වටිනාකමෙන් සියයට 10 ක මුදලක් සැපයුම සම්පූර්ණකර දින 30 ක් දක්වා රඳවා තබාගන්නා ලෙස දන්වා තිබීම හේතුවෙන් කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මෙම ඖෂධයෙන් ඒකක 6,300 ක් මිලදී ගැනීම සඳහා 2023 මැයි 25 දින පද්ධතිය හරහා ඉල්ලුම් කර තිබුණු හදිසි මිලදී ගැනීමක් ලෙස 2023 ජුනි 14 මිල කැඳවීමක් සිදුකර තිබුණු අතර 2023 ජුනි 22 දින තාක්ෂණික ඇඟයීම් කමිටුව නිර්දේශ ලබාදී තිබුණි. තාක්ෂණික ඇඟයීම් කමිටු නිර්දේශය හදිසි ප්‍රසම්පාදන කමිටුව 2023 ජුනි 28 දින ප්‍රසම්පාදන තීරණය පරිදි වලංගු NMRA සහතිකය හිමි එකම ලංසුකරු වෙත කුප්පියක් රු.5,100 බැගින් ලංසුව ලබාදීමට තීරණය කර තිබුණි. ඉන්දියන් ණය යෝජනා ක්‍රමය යටතේ හදිසි මිලදී ගැනීමක් ලෙස ක්‍රියාත්මකකර තිබුණද ප්‍රසම්පාදන තීරණයෙන් සති 09 කට පසුව එනම් 2023 සැප්තැම්බර් 08 දින නිකුත් කරන ලද ඉන්ඩෙන්ටුව අනුව ඖෂධ තොග 2023 දෙසැම්බර් 11 දිනට ලැබිය යුතුව තිබුණද ස්වස්ථ පරිගණක පද්ධතියට අනුව ඊට මාස 02 ක් ප්‍රමාදවී තොග ලැබී තිබුණි.

34. Tropicamide 0.8% with phenyl Phrine hyarochooloride 5% eye drops 5ml dropper bottle (SR No. 00901501)

මෙම ඖෂධයෙන් 2023 වාර්ෂික ඇණවුමේ කොටසක් ජනවාරි වනවිට නොලැබීම හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශය විසින් නිකුත් කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු.2,261,175 ක්වූ ඖෂධ ඒකක 10,500 ක් 2023 පෙබරවාරි 28 දිනැති හදිසි ඇණවුමක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත 2023 මාර්තු 01 දින ලැබී තිබුණි. මෙම ඇණවුම 2023 මාර්තු 10 දින සැපයිය යුතුව තිබුණි. මේ සඳහා 2023 මාර්තු 15 දින ලංසු කැඳවා තිබුණු අතර 2023 මාර්තු 17 දිනෙන් ලංසු කැඳවීම අවසන් කර තිබුණි. නමුත් මීට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව 2023 මාර්තු 27 දින පත්කර තිබුණි. ලංසුකරුවන් තිදෙනෙකු අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරුවන් දෙදෙනාට වලංගු ලියාපදිංචි සහතිකයක් නොමැති වීම නිසා අවම තෙවන මිල ඉදිරිපත් කළ ලංසුකරු ජයග්‍රාහී ලංසුකරු ලෙස සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් 2023 අප්‍රේල් 12 දින තෝරාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මෙම හදිසි ප්‍රසම්පාදනයට අදාළව තෝරාගත් ලංසුකරු ලබාදුන් ලංසු ලියවිලිවලට අනුකූලව සතියක් තුළ ඖෂධ සැපයීම සිදුකළ හැකි බව දන්වා තිබුණු අතර සැපයුම්කරු තෝරාගැනීමේදී මේ පිළිබඳව සැලකිල්ලට ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. යථෝක්ත ප්‍රසම්පාදනයට අදාළව 2023 මැයි 12 දින ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණු අතර 2023 මැයි 18 දින තොගය සැපයිය යුතුව තිබුණි. නමුත් මෙම තොගය වෛද්‍ය සැපයීම් අංශයට ලැබී තිබුණේ 2023 සැප්තැම්බර් 20 දිනදීය. ඒ අනුව තොගය සැපයිය යුතු දින සිට දින 125 ක් ප්‍රමාද වී සැපයීම සිදුකර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය අසාර්ථක වනවිට එයින් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා, කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කරන ලෙසත් හා ලංසු ඇරයුම් ලේඛනයේ දෙවන කොටසේ 6 වන වගන්තිය අනුව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක SH/PSRP/01/SPC/2021 දරන 2023 ජනවාරි 10 දිනැති ලිපියේ නිර්දේශය මත කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීම වෙනුවට සැපයුම්කරුට ගෙවිය යුතු වටිනාකමෙන් සියයට 10 ක මුදලක් සැපයුම සම්පූර්ණකර දින 30 ක් දක්වා රඳවා තබාගන්නා ලෙස දන්වා තිබීම හේතුවෙන් කාර්යය සාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සැපයුම්කරුගේ 2022 සැප්තැම්බර් 21 නිකුත් කළ වලංගු ලියාපදිංචි සහතිකයේ මෙම කුප්පියක් විකිණිය යුතු උපරිම සිල්ලර මිල රු.650 ක් ලෙස දක්වා තිබුණද මෙම සැපයුමේදී කුප්පියක් රු.900 බැගින් සපයා තිබුණි. කුප්පියක ඇස්තමේන්තු මිල 215.35 ක් හා පෙර සැපයුම් මිල රු.299.42 ක්වූ අතර හදිසි මිලදී ගැනීමේදී කුප්පියක මිල රු.900 ක් වී තිබුණු බැවින් ඇස්තමේන්තු මිලට වඩා හදිසි මිලදී ගැනීමේ මිල සියයට 318 ක් හා පෙර සැපයුම මිල වඩා සියයට 200 කින් වැඩි වී තිබුණි.

35. Brinzolamide Eye drops 1% in 5 ml dropper bottle (SR No. 00903001)

2022 වර්ෂයේ වාර්ෂික අවශ්‍යතාවය ලෙස ඇස්තමේන්තුගත වටිනාකම රු.34,260,000 ක්වූ ඇණවුම 2022 මාර්තු 25 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලැබී තිබුණි. මෙම ඇණවුමට අනුව 2022 අප්‍රේල් 30 හා ජුනි 30 දින කුප්පි 40,000 බැගින් සැපයිය යුතුව තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ මිලදී ගැනීම සඳහා 2022 මාර්තු 26 දින ලංසු කැඳවා 2022 මාර්තු 31 දිනෙන් අවසන් කර තිබුණි. ප්‍රසම්පාදනය සඳහා එක් සැපයුම්කරුවෙකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. 2022 අප්‍රේල් 22 දින තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම සිදුකර තිබුණු අතර, කමිටුව විසින් ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකයේ සඳහන් උපරිම සිල්ලර මිලට වඩා ලංසු මිල වැඩි බව සඳහන් කර තිබුණි. මිල ගණන් විවෘත කළ දිනෙන් දින 22 කට පසු ලංසු ඇගයීම සිදුකර තිබුණු අතර 2022 අප්‍රේල් 28 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අවම මිල සහිත ලංසුකරු සමඟ මිල අඩුකිරීමට සහ ඉදිරිපත් කරන ලද මිල එ.ජ.ඩොලර්වලින් ලබා දීමට එකඟතාවය ලබාගන්නා ලෙස දක්වා තිබුණි. ප්‍රසම්පාදන කමිටුවේ තීරණයෙන් දින 21 කට පසු එනම් 2022 මැයි 19 දින අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) විසින් අනුමැතිය ලබා දී තිබුණු අතර එකඟතාවය පිළිබඳ විමසීමක් කරමින් ලංසුකරුට ලිපිය යොමුකර තිබුණේ දින 30 ක කාල ප්‍රමාදයකින් පසු 2022 මැයි 27 දිනදීය. ලංසුකරු විසින් යොමුකරන ලද 2023 ජුනි 07 දිනැති ලිපියෙන් ලංසු මිල නිදහස් කිරීමේ හා අනෙකුත් දේශීය ගාස්තු (Clearing and Local Component Charges) සියයට 5 කින් අඩුකිරීමට හා එ.ජ.ඩොලර්වලින් මිල ඉදිරිපත් කිරීමට එකඟ වී තිබුණි. 2022 ජුනි 13 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් යථෝක්ත ලංසුකරු තෝරාගෙන තිබුණි. එම ඇණවුමට අදාළව 2022 අගෝස්තු 17 දිනැති අංක DHS/ICL/AMS/226/2022 දරන ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණි. ඒ අනුව 2022 ඔක්තෝබර් 31 දින සහ දෙසැම්බර් 31 දින ඒකක 40,000 සැපයිය යුතුව තිබුණි. ඒ අනුව පළමු ඖෂධ තොගය ලෙස ඒකක 40,000 ක ප්‍රමාණය මාස 07 ක කාල ප්‍රමාදයකින් පසු 2023 මැයි 30 වෛද්‍ය සැපයීම් අංශයට සපයා තිබුණි. ඉතිරි ඒකක 40,000 ක තොගය 2022 දෙසැම්බර් 31 දිනට සැපයිය යුතු වුවද සපයා තිබුණේ 2024 ජනවාරි 23 දින විය.

36. Bentomethasone sodium phosphate for eye, ear or nosal drop 0.1% in 5ml vial (SR No. 01000601)

මෙම ඖෂධය මිලදී ගැනීමට අදාළව 2023 වර්ෂයේ වාර්ෂික අවශ්‍යතාවය ලෙස ඇස්තමේන්තුගත වටිනාකම රු.2,431,800 ක්වූ කුප්පි 35,000 ක් 2022 නොවැම්බර් 15 දිනැති ඇණවුම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත 2022 නොවැම්බර් 17 දින ලැබී තිබුණි. මෙම ඇණවුමෙන් 2023 ජනවාරි 10 දින හා අප්‍රේල් 03 දින කුප්පි 17,500 බැගින් සැපයිය යුතුව තිබුණි. 2023 ජනවාරි 19 දින මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවා තිබුණු අතර ලංසුකරුවන් 3 දෙනෙකු ඉදිරිපත් වී තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව 2023 පෙබරවාරි 14 දින ඇගයීම සිදුකර 2023 පෙබරවාරි 23 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ලියාපදිංචි සහතිකයක් සහිත අවම මිල ඉදිරිපත් කරනු ලැබූ ලංසුකරු තෝරාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2023 මාර්තු 09 දිනැති ඇණවුම් ප්‍රදානය කිරීමේ ලිපියට, 2023 මාර්තු 16 දින ලංසුකරු පිළිගෙන තිබුණි. මෙම ඇණවුමට අදාළ අංක LP/DHS/NV/3665/2023 දරන ඉන්ඩෙන්ටුව 2023 මාර්තු 23 දින නිකුත් කර තිබුණි. ඒ අනුව 2023 මැයි 25 දින සහ අගෝස්තු 25 දින කුප්පි 17,500 ක් බැගින් සැපයිය යුතුව තිබුණි. නමුත් පළමු තොගය

ලෙස කුප්පි 16,927 ක් 2023 ජුනි 27 දින හා දෙවන තොගය ලෙස කුප්පි 18,070 ක් 2023 සැප්තැම්බර් 27 දින වෛද්‍ය සැපයීම් අංශයට සපයා තිබුණි. මේ සඳහා ප්‍රමාද ගාස්තු අයකළ බවට වූ ලිඛිත තොරතුරු ලිපිගොනුව තුළ ඇතුළත්ව නොතිබුණි.

(ආ) 2023 ඔක්තෝබර් 06 දින ස්වස්ථ පද්ධතිය පරීක්ෂා කිරීමේදී ඉහත ඇණවුම ලැබිය යුතු ඇණවුමක් හා ලැබුණු ඇණවුම් යන කොටස් 2 යටතේම ඇතුළත් කර ඇති බවත් ඉතිරි ලැබිය යුතු කුප්පි 35,003 ක තොගයක් පෙන්නුම් කළද එවැනි ලැබිය යුතු තොගයක් නොමැති බවක් නිරීක්ෂණය විය

(ඇ) මෙම ඇණවුමෙහි කුප්පියක මිල, ඇස්තමේන්තු මිලට වඩා සියයට 202 කින් වැඩි වී තිබුණු අතර 2022 වර්ෂයේ ඇණවුමෙහි කුප්පියක මිලට වඩා සියයට 287 කින් වැඩි වී තිබුණි.

37. Pralidoxime Chloride Injection 19/20 ml (SR No. 01601001)

මෙම ඖෂධයේ 2023 වර්ෂයේ වාර්ෂික අවශ්‍යතාවය ලෙස ඇස්තමේන්තු වටිනාකම රු.2,791,800 ක්වූ 2022 නොවැම්බර් 15 දිනැති ඇණවුම 2022 නොවැම්බර් 24 දින සංස්ථාවට ලැබී තිබුණි. මෙම ඇණවුමට අනුව 2023 ජනවාරි 10 දින කුප්පි 12,000 ක් සැපයිය යුතුව තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා ලියාපදිංචි හා පසුගිය සැපයුම්කරුවන්ගෙන් 2023 පෙබරවාරි 16 දින මිල කැඳවා තිබුණු අතර 2023 පෙබරවාරි 23 දිනෙන් ලංසු කැඳවීම අවසන් කර තිබුණි. ප්‍රසම්පාදනය සඳහා එක් ලංසුකරුවකු පමණක් ඉදිරිපත් වී තිබුණු අතර 2023 මාර්තු 15 දින තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම සිදුකර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටු තීරණයෙන් දින 54 කට පසු එනම් 2023 මැයි 09 දිනැති දෙපාර්තමේන්තු සුළු ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසුකරුගේ මිල පෙර මිලට හා ඇස්තමේන්තු මිලට වඩා අතිශයින්ම ඉහල අගයක් වීම නිසා ලියාපදිංචි හා පෙර සැපයුම්කරුවන්ගෙන් නැවත ෆැක්ස් හා ඊමේල් මඟින් ලංසු කැඳවන ලෙස දන්වා තිබුණි. ප්‍රසම්පාදන තීරණයෙන් දින 105 කට පසු නැවත ලංසු කැඳවීමේ කටයුතු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ආරම්භ කර තිබුණි. ඒ අනුව 2023 සැප්තැම්බර් 27 දිනැතිව ෆැක්ස් හා ඊමේල් මඟින් ලංසු කැඳවීමේ ලිපි යොමුකර තිබුණු අතර ලංසු කැඳවීම 2023 ඔක්තෝබර් 10 දිනෙන් අවසන් කර තිබුණි. 2023 ඔක්තෝබර් වන තෙක් 2023 වර්ෂයට අදාළ වාර්ෂික අවශ්‍යතාව සම්පූර්ණ කරගැනීමට වෛද්‍ය සැපයීම් අංශයට නොහැකි වී තිබුණි. නිසි කාලරාමුවක් තුළ ඇණවුම් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඇති වී තිබුණු බව නිරීක්ෂණය විය.

38. Morphine Sulphate Injection 15mg/ml Ampoule (SR - 00000807)

ඉහත ඖෂධයේ අවශ්‍යතාවය තීරණය කිරීම, ඇණවුම් කිරීම, මිලදී ගැනීම හා උපයෝජනය සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේදී 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා මුළු ඇස්තමේන්තුව ඒකක 3,339,831 ක් වූ අතර එම කාල පරිච්ඡේදයට අදාළව ඇණවුම් කිරීම ඒකක 3,083,344 ක් විය. නමුත් 2019,2020 සහ 2021 වර්ෂවලට අදාළව ලැබුණු ප්‍රමාණය ඒකක 1,999,988 ක් බව MSMIS දත්ත පද්ධතිය මඟින් අනාවරණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2021 වර්ෂයේ ඇස්තමේන්තු ප්‍රමාණය ඒකක 757,050ක් වූ නමුත් වාර්ෂික ඇණවුම් ප්‍රමාණය ඒකක 880,000ක් විය. ඒ අනුව ඇස්තමේන්තුව ඉක්මවා ඒකක 122,950 ක් ඇණවුම් කර තිබුණි.

(ආ) 2023 වර්ෂයේදි ඇස්තමේන්තු ප්‍රමාණය ඒකක 698,499 ක් වූ අතර වාර්ෂික ඇණවුම් ප්‍රමාණය ඒකක 1,020,000ක් ලෙස සඳහන් කර ඇස්තමේන්තු ප්‍රමාණයට වඩා වාර්ෂික ඇණවුම් ප්‍රමාණය සියයට 46 ක් එනම් ඒකක 321,501 ක් වැඩියෙන් ඇණවුම් කර තිබුණි. නමුත් මෙම ඇණවුම් විගණන දින වන විටත් සපයා නොතිබුණි.

(ඇ) 2023 වර්ෂයට අදාළව ඒකක 460,000ක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා තිබුණු අතර 2023 අප්‍රේල් 11 දිනැති ඉන්ඩෙන්ටුව අනුව හා පිළිවෙලින් ඒකක 250,000 ක් හා ඒකක 210,000 ක් 2023 ජුනි 30 හා ඔක්තෝබර් 31 දින සැපයිය යුතු බව සඳහන් වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) වෛද්‍ය සැපයීම් අංශයෙහි පරිගණක පද්ධතිය විසින් ලබා දෙන ලද දත්ත අනුව 2022 වර්ෂය සඳහා මෙම ඖෂධයෙන් ඒකක 100,000 ක් සඳහා සාමාන්‍ය ඇණවුමක්ද ඒකක 50,000 ක් සඳහා හදිසි ඇණවුමක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබා දී තිබුණද, මෙම ඇණවුම් විගණන දින වන විටත් ලැබී නොතිබුණි.

(ඉ) 2022 වර්ෂයේදී වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රමාණය ඒකක 651,971 ක් වූ අතර අවස්ථා දෙකකදී සිදු කරන ලද ඇණවුම් ප්‍රමාණය ඒකක 150,000 ක් වී තිබුණි .මෙය ඇස්තමේන්තුගත ප්‍රමාණයෙන් සියයට 23ක් වැනි අවම ප්‍රතිශතයකින් ඇණවුම් කිරීම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වල තත්ත්වයක් බවත් නිරීක්ෂණය විය.

(ඊ) 2022 වර්ෂය සඳහා අංක 2022/SPC/N/R/P/00066 දරන සාමාන්‍ය ඇණවුම මඟින් ඒකක 100,000 ක් ඇණවුම් කිරීමට කටයුතු කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් වෛද්‍ය සැපයීම් අංශයෙහි පරිගණක පද්ධතියෙහි මෙම ඇණවුම දැක්වුවත් කොවිඩ් 19 වසංගතය කාලයේ මෙම ඇණවුම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට (ආනයන අංශයට) ලැබී නොමැති බවත් ලිඛිතව විගණනය වෙත දන්වා තිබුණි. අනුව වෛද්‍ය සැපයීම් අංශයෙහි පරිගණක පද්ධතිය මඟින් ලබා ගන්නා ලද තොරතුරු පිළිබඳව විශ්වාසදායී බව තහවුරු කළ නොහැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(උ) වෛද්‍ය සැපයීම් අංශය සතු පරිගණක පද්ධතියේ ඇති තොග පිළිබඳ දත්ත පරීක්ෂාවේ දී 2022 වර්ෂයේ දි මෙම ඖෂධයට අදාළව කිසිදු තොගයක් වෛද්‍ය සැපයුම් ඒකකය සතුව නොතිබුණු අතර අවම තොග මට්ටමක් පවත්වා ගැනීම සම්බන්ධව අවධානය යොමු කර නොතිබුණි. මෙය හදිසි ඇණවුම් සඳහා යොමු වීමට ඉඩ ලබාදීමක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඌ) 2021 වර්ෂයේ මෙම ඖෂධය සාමාන්‍ය මිලදී ගැනීම යටතේ සිදු කර තිබුණු අතර ඇණවුමට අනුව ඒකක 880,000 ක් මිලදී ගැනීම සඳහා තීරණය කර තිබුණි. මෙම ඇණවුම අවස්ථා 4 කදී ලබා ගැනීමට තීරණය කර තිබුණු අතර, මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) 2021 මැයි 01 දින සිදු කරන ලද මිලදී ගැනීම් සඳහා ඒකකයක මිල රු.50.20 ක් වී ඇති අතර එම ඇණවුමට අදාළව 2022.08.17 සිට 2022.12.09 දක්වා සිදු කරන ලද මිලදී ගැනීම් සඳහා ඒකකයක මිල රු.92.44 හා 93.23ක් දක්වා පරාසයකින් වැඩි වී තිබූ අතර, එය සියයට 86 ක පමණ මිල ඉහල යෑමකි.

(ii) මෙම ඉන්ඩෙන්ටුවට අදාළ භාණ්ඩ සැපයීය යුතු දිනයන් හා භාණ්ඩ ලැබීම් දිනයන් සැසඳීමේදි මාස 3 සිට මාස 17 දක්වා කාල ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(iii) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ සඳහන් පරිදි සැපයුම්කරු සමඟ අත්සන් කරනු ලබන ගිවිසුම සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි.

(ඒ) 2022 වර්ෂයේ මෙම ඖෂධයේ ඒකක 50,000 ක් අඛණ්ඩව සැපයීමේ අවශ්‍යතාවය මත හදිසි මිලදී ගැනීම් යටතේ මිලදී ගැනීම් සිදු කර තිබුණි. මෙයට අදාළව අංක 2023/SPC/E/R/P/00442 දරන ඇණවුම නිකුත් කර තිබූ අතර, සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් Yaden International පුද්ගලික ආයතනය වෙතින් ඖෂධ මිලදී ගැනීමට ලංසු ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) හදිසි මිලදී ගැනීම යටතේ ඒකක 50,000 ක් රු.24,500,000 කට මිලදී ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය කළද, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය කල් ඉකුත් වීම හේතුවෙන් වලංගු සහතිකයක් හෝ ලියාපදිංචියෙන් නිදහස් වීමේ සහතිකයක් ඉදිරිපත් කළ යුතු බවක් දන්වා තිබුණද මෙම සහතික ඉදිරිපත් කළ බවට වූ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) M/S Kwality Pharmaceuticals Limited ආයතනය සඳහා ඉන්දියානු රජයෙන් ලබා දී ඇති Certificate of Good Manufacturing Practices සහතිකය 2020.12.27 දිනෙන්ද Certificateof a Pharmaceutical Product සහතිකය 2020.03.11 දිනෙන් අවලංගු වී තිබුණු අතර නීත්‍යානුකූලව වලංගුභාවය රහිත මෙවැනි ආයතනයකින් ඖෂධ මිලදී ගැනීමේදී සංකූලතාවයන් වියහැකි අතර මිලදී ගැනීමට අදාළව වගකිය යුතු පාර්ශවයන්ගේ අවධානය යොමු විය යුතු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(iii) මෙම ඖෂධයට අදාළව මාස 2 ½ කට ප්‍රමාණවත් තොග තිබියදී හදිසි මිලදී ගැනීම් යටතේ ඇණවුම් කිරීමට කටයුතු කර නැවත එය අවලංගු කර තිබුණි. ඒ අනුව නිසි පරිදි අවශ්‍යතාවයන් හඳුනා නොගෙන ක්‍රියා කිරීම කළමනාකරණයේ දුර්වලතාවයක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(iv) වෛද්‍ය සැපයීම් අංශයේ පරිගණක පද්ධතියේ ඇණවුම් ලේඛනය අනුව ඒකක 50,000ක් සඳහා පිරිවැය රු.2,792,500 ක් වුවද තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය ප්‍රකාරව රු.24,500,000 කට මෙම ඇණවුම ලබා දී තිබුණි. ඒ අනුව රු.21,707,500 ක් හෙවත් සියයට 777.3 කින් ඇස්තමේන්තු වටිනාකම ඉක්මවා තිබුණි.

(ඒ) අංක 2023/SPC/N/R/P/00038 දරන ඇණවුමට අදාළව මෙම ඖෂධයේ ඒකක 460,000 ක් සමානාය මිලදී ගැනීම යටතේ මිලදී ගැනීමට කටයුතු කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) පරිගණක පද්ධතිය අනුව ඇණවුම් පිරිවැය රු.25,691,000 ක් වුවද රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ඇණවුම පිරිනමා තිබූ මිල රු.34,832,593 ක් වූයෙන් රු.9,141,593 කින් ඇණවුම් වටිනාකමේ මිල විචලනයක් නිරීක්ෂණය විය. මෙය ඇණවුම් පිරිවැයට වඩා සියයට 35.58 ක වැඩිවීමක් බව නිරීක්ෂණය විය. ඒ අනුව ඇස්තමේන්තු සකස් කිරීම නිසි පරිදි සිදු නොවන බව නිරීක්ෂණය විය.

(ii) ඒකක 300,000 ක් අලුතින්ම සපයන ලෙස දන්වා ඇණවුම ප්‍රදානය කිරීමේ දී සැපයුම්කරු විසින් ඒකක 65,000 ක් ඉක්මණින් සැපයීය හැකි බවත් ඉන් ඒකක 49,000 ක් කල් ඉකුත් වීමේ දිනය 2024 ජුනි මස බවත් නාමමාත්‍ර ඉන්වොයිසියක් මඟින් දක්වා තිබුණි. ඉන්ඩෙන්ටුවේ සාමාන්‍ය කොන්දේසි අංක 05 ප්‍රකාරව තොගය නැව් ගත කරන අවස්ථාවේදී ඉතිරි ජීව කාලය අවම වශයෙන් සියයට 85 ක් තිබිය යුතු බව සඳහන් වුවද මෙම තොග ලැබීමේදී මෙහි ජීව කාලය තවදුරටත් අඩු විය හැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(iii) මෙම සමස්ථ තොගය සැපයීමේ දී අපේක්ෂිත කාල සීමාව ඉක්ම විය හැකි බවත්, කාර්යසාධන බැඳුම්කරයේ කාලය තුළ තොග ලභා වීමට පෙර අවලංගු වන බවත් නිරීක්ෂණය විය.

39. Doxycycline Cap 100 mg (SR – 00102301)

2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ඇස්තමේන්තු ගත ප්‍රමාණය ඒකක 46,609,657 ක් වූ අතර 2021 වර්ෂය හැර ඉතිරි වර්ෂවලදී ඒකක 34,097,600 ක් ඇණවුම් කර තිබුණද වෛද්‍ය සැපයීම් අංශය වෙත 2019 සහ 2020 වර්ෂවලට අදාළව ඒකක 22,978,600 ක් ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික ඇණවුම් ප්‍රමාණය වාර්ෂික ඇස්තමේන්තු ප්‍රමාණය හා සැසඳීමේදී, පිළිවෙලින් 2019,2020,2022 හා 2023 වර්ෂවලදී සියයට 61, 171,53 සහ 77 ක් දක්වා විචලනයන් සිදු වී තිබුණි. මේ අනුව ඇස්තමේන්තු සකස් කිරීම තාර්කිකව සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) 2020 වර්ෂයේ ඇස්තමේන්තු ප්‍රමාණය ඒකක 9,991,070 වූ අතර වාර්ෂික ඇණවුම් ප්‍රමාණය ඒකක 17,097,800 ක් වෛද්‍ය සැපයීම් අංශය විසින් ඇණවුම් පහක් මඟින් ඇණවුම් කර තිබුණි. ඒ අනුව මුළු ඇස්තමේන්තුව ඉක්මවා ඒකක 7,106,730 ක් ඇණවුම් කර තිබුණි. වෛද්‍ය සැපයුම් අංශය වෙත ඒකක 15,353,600 ක් ලැබී තිබුණු අතර ඒකක 6,639,500 ක් නිකුත් කර ඒකක 8,714,100 ක ඉතිරියක් ද පැවතුණි.

(ඇ) 2021 වර්ෂයේ පිළිවෙලින් ඒකක 33,822 ක් සහ ඒකක 29,187 ක් කල් ඉකුත්වීම හා තත්ත්වය අසමත් වීම මත ඉවත් කර තිබුණි.

(ඇ) 2022 සැප්තම්බර් 26 සිට 2023 සැප්තැම්බර් 3 දක්වා මෙම ඖෂධය හිගව පැවති අතර සාමාන්‍ය ඇණවුමක් හෝ ප්‍රාදේශීය මිලදි ගැනීම් හෝ සිදු කර නොමැති අවස්ථාවක සෞඛ්‍ය පද්ධතිය තුළ 2022 වාර්ෂික අවශ්‍යතාවයෙන් ඌනතාවය වූ ඒකක 5,869,550, ක් හා 2023 වර්ෂයේ වාර්ෂික අවශ්‍යතාවය වූ ඒකක 10,338,322 සපුරා ගත්තේ කෙසේද යන්න විගණනයට අනාවරණය නොවීය.

(ඉ) 2021 වර්ෂය සඳහා අංක 2021/SPC/N/R/P/00061 දරන ඇණවුම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන් තෝරා ගෙන මාස 06 ක් ගත වී තිබුණ ද, ඉන්ඩෙන්ටුවක් සැපයුම්කරු වෙත නිකුත් කර නොතිබුණි.

(ඊ) ඇණවුම් අංක 2023/ADB/X/R/P/00013 යටතේ ඒකක 5,000,000 ක ප්‍රමාණයක් ඒකක රු.8,649 බැගින් මිලදී ගැනීමට සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අංක HSEP/AF/PMU/PPC/G.3036/215/2023 හා 2023 අප්‍රේල් 21 දිනැති ඇණවුම නිකුත් කර තිබුණි. නමුත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මිල ගණන් අනුව සැසඳීමේ දී ඉදිරිපත් කර තිබුණු අගය ඉතා ඉහළ බැවින් එය අවම කර ගැනීම සඳහා ලංසුකරු සමග එකඟතාවයකට පැමිණ නොතිබුණි. එසේම ඇණවුම ප්‍රකාරව ගිවිසුම අත්සන් කළ 2023 මැයි 08 දින සිට දින 60 ක් ඇතුළත භාණ්ඩ සැපයිය යුතු වුවද, භාණ්ඩ ලැබී තිබුණේ 2023 සැප්තැම්බර් 08 දිනදී එනම් දින 120 කට පසුය. මිලදී ගැනුම් ඇණවුම ප්‍රකාරව පසුවන සෑම සතියකටම ප්‍රමාද දඩ ලෙස ගිවිසුම්ගත මුදලින් සියයට 0.5 ප්‍රතිශතයක් ලෙස සති 08 ක් සඳහා රු.1,729,800 ක් අයකළ යුතු වුවද, මෙම ව්‍යාපෘතිය විසින් එලෙස අඩු කිරීමෙන් තොරව මුළු මුදල වූ රු.43,245,000 ක් සැපයුම්කරුට ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(උ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රත් ගිවිසුම් පනත ප්‍රකාරව සැපයුම්කරු සමග අත්සන් කරනු ලබන ගිවිසුම සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි.

(ඌ) අංක 2022 / SPC / X /R / P / 00267 දරන ඇණවුම මඟින් ඉන්දීය ණය පහසුකම යටතේ ඒකක 4,000,000 ක ප්‍රමාණයක් ඒකක 2,000,000 බැගින් ලබා ගැනීම සඳහා ඇණවුම 2022 ඔක්තෝබර් 14 දින නිකුත් කර තිබුණි. ඉන්ඩෙන්ටුව අනුව 2022 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල ඒකක මිලියන 2 බැගින් සැපයිය යුතු බව සඳහන් කර තිබුණි. නමුත් එම ඇණවුම 2023 සැප්තැම්බර් 18 විගණිත දින වන විටත් ලැබී නොතිබුණු අතර ඉන්ඩෙන්ටුව නිකුත් කර මාස 11 ක් ගත වී ඇතත් ඖෂධ ලැබී නොමැති බවත් ඉන්ඩෙන්ටුව අවලංගු කිරීම හෝ කාලය දිර්ඝ කිරීම හෝ සිදු කර නොමැති බවත් විගණනයේ දී නිරීක්ෂණය විය.

(එ) වසරක කාලයක් මෙම ඖෂධය වෛද්‍ය සැපයුම් අංශය සතුව නොපැවති අතර මෙම හිගයට ඉහත කරුණු සෘජුවම බලපා ඇතිබව නිරීක්ෂණය කෙරේ.

40. Co-amoxiclav Tab.625 mg (SR No - 00100902)

ඉහත ඖෂධය 2022 සහ 2023 වර්ෂයන් තුළ අවස්ථා 06 කදී පිළිවෙලින් පෙති 13,999,000 ක් හා පෙති 37,100,000 ක් ඇණවුම් කිරීමට කටයුතු කර තිබුණි. මෙයට අදාළව අවශ්‍යතාව , සැපයුම හා නියාමනය පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2022 හා 2023 වර්ෂවලට අදාළ ඇණවුම් සාමාන්‍ය ඇණවුමකින්, පරිත්‍යාග තුනකින් හා වෛද්‍ය සැපයීම් අංශය තුළ ගිවිසුම් ගතව (buy back agreement) සැපයුම්කරුවන්ගෙන් ලබාගත් ඇණවුම් 03 කින් සමන්විත වූ අතර 2021.03.18 දිනැති අංක 2022/SPC/N/R/P/00058 දරන සාමාන්‍ය ඇණවුම අවලංගු කර තිබුණි.

(ආ) වාර්ෂික ඇණවුම් ප්‍රමාණය වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රමාණයන් හා සැසඳීමේ දී 2019, 2020, 2021 හා 2022 වර්ෂවල දී පිළිවෙලින් සියයට 62,95,122 හා 36 ක් වූයෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීම තාර්කිකව සිදු කර නොමැති බවත් විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) 2021 අප්‍රේල් 01 දිනැති අංක 2021/SPC/N/R/P /00038 දරන ඇණවුම මඟින් ඖෂධ පෙති මිලියන 46 ක් සැපයීම සඳහා කාලවකවානු 04 ක් ලබා දී තිබුණද, ඉන්ඩෙන්ටුව නිකුත් කිරීම සඳහා 2020 දෙසැම්බර් 03 දිනැති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතියේ සිට මාස 04 ක කාලයක් ලබා ගෙන තිබුණි. 2021 අප්‍රේල් 01 දිනැති ඉන්ඩෙන්ටුව නිකුත් කිරීමෙන් පසු ඖෂධ සැපයීම සඳහා වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් ගත කර තිබුණි. සැලසුම් කළ පරිදි නියමිත දිනට ඖෂධ ලබා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් රු.121,631,833 වැඩිපුර ගෙවීමට සිදුව තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) ප්‍රති මිලදී ගැනීම් ගිවිසුම යටතේ මිලදී ගත් මෙම ඖෂධයේ කාණ්ඩයකට අයත් ඖෂධ කුරුණෑගල ශික්ෂණ රෝහලින් රෝගියෙකු වෙත ලබා දී තිබුණු අතර එම ඖෂධයේ තත්ත්වය පිළිබඳ (quality) අවිනිශ්චිත තත්වයක් පවතින බවත් භාවිතයට සුදුසු තත්ත්වයේ නොපවතින බවත් නිරීක්ෂණය විය. මෙම තත්ත්වය මත මෙම ඖෂධය සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තාවක් විගණනයට ඉදිරිපත් කරන ලෙස වගකිව යුතු නිලධාරින්ට අවස්ථා දෙකකදි ලිඛිතව දැනුම් දුන්නද මෙම වාර්තාවේ දිනය දක්වා එම පරීක්ෂාව සිදුකර විගණනයට වාර්තා නොකෙරුණි.

(ඉ) 2023 වර්ෂය සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් ප්‍රති මිලදී ගැනීම් හරහා පෙති 14,000,000 ක සාමාන්‍ය ඇණවුම් තිබියදී සහ මෙම ඖෂධයේ ඉල්ලුම අඩු වී ඇති අවස්ථාවක අංක 2023/MSD/A/R/P/00064 දරන අතිරේක ඇණවුම මඟින් මෙම ඖෂධයේ පෙති 23,000,000 ක් නැවත ඇණවුම් කිරීමට කටයුතු කිරීම විගණනයේ දී ගැටලු සහගත විය.

41. Sodium Nitroprusside Inj. 50mg(SR No – 00202001)

2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මුළු ඇස්තමේන්තුව ඒකක 3,668 ක් වූ අතර එම කාල පරිච්ඡේදය සඳහා ඒකක 1,789ක් ඇණවුම් කර ඇති බවත්, 2022 වර්ෂයේ දී ඒකක 200 ක් පමණක් වෛද්‍ය සැපයීම් අංශයට ලැබී ඇති බවත් MSMIS දත්ත පද්ධතිය අනුව අනාවරණය විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) යථෝක්ත ඖෂධයේ 2022 වාර්ෂික අවශ්‍යතාවය ඖෂධ කුප්පි 517 ක් වූ අතර, ඖෂධ කුප්පි 200 ක් ප්‍රදාන වශයෙන් ද, ඖෂධ කුප්පි 500 ක් ඉන්දීය ණය පහසුකම් යටතේ ද ඇණවුම් කිරීමේ දී ඖෂධ කුප්පි 183 ක් වැඩිපුර ඇණවුම් කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 අප්‍රේල් 04 දිනැති අංක 01–14/2023 දරන චක්‍රලේඛයට අනුව අත්‍යාවශ්‍ය ඖෂධයක් වන මෙම ඖෂධය සම්බන්ධයෙන් පරිගණක දත්ත පද්ධතිවල තොරතුරු අනුව 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අවස්ථා 06 දී ඇණවුම් කරන ලද ඖෂධ කුප්පි 1,789 ක් අතරින් අවස්ථා 04 දී ඇණවුම් කරන ලද ඖෂධ කුප්පි 1,089 ක් වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබී නොතිබුණි. ප්‍රසම්පාදනයේ අරමුණු නිසි ලෙස හඳුනා නොගැනීම, ප්‍රසම්පාදනයේ නියුතු අංශවල නිලධාරීන් විසින් ගනු ලබන තීරණවල අවිනිශ්චිතතාවයන් සහ අනවශ්‍ය ප්‍රමාද වීම් නිසා ඇණවුම් නියමිත පරිදි ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) නිසි පරිදි ඇණවුම් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අවස්ථා 32 දී ඖෂධ කුප්පි 209 ක් රු. 258,070 ක් ගෙවා ප්‍රාදේශීය වශයෙන් මිලදී ගෙන තිබුණි.

(ඈ) ඇණවුම් අංක 2022/SPC/X/R/P/00264 මඟින් ඉන්දීය ණය පහසුකම් යටතේ ඖෂධ කුප්පි 500 ක් මිලදී ගැනීම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ලංසු කැඳවා තිබුණු අතර ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ලියාපදිංචිය කිරීමේ සහතිකය (WOR) සහ ස්වාධීන පාර්ශවයකින් රසායනාගාර වාර්තාවක් ලබා දීම වැනි කරුණු මත අඩුම ලංසුව ඉදිරිපත් කරන ලද ලංසුකරු වෙත ඇණවුම ප්‍රදානය කිරීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් 2022 අප්‍රේල් 19 දින තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට අනුව, ඖෂධයේ පැවතිය යුතු Pharmacopoeia Standard සහ ඖෂධය රැස් කර තබාගත යුතු ගබඩා තත්ත්වය (Storage Condition) වැනි මූලිකාංග පිළිබඳව සැලකිලිමත් නොවී යටෝක්ත ලංසුකරු තෝරා ගෙන ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ii) සැපයුම්කරු විසින් ගිවිසගත් පරිදි එනම් 2022 නොවැම්බර් හා දෙසැම්බර් ඖෂධ කුප්පි 250 බැගින් ඖෂධ නොසැපයීම මත 2022 සැප්තැම්බර් 19 දින යටෝක්ත ඖෂධය සඳහා ලබාදුන් WOR සහතිකය 2023 ජූනි 19 දින කල් ඉකුත් වී ඇති බවත් එහි වලංගු කාලය 2023 දෙසැම්බර් 19 දිනය තෙක් දීර්ඝ කිරීමට සිදුව තිබුණු බවත් විගණනයේ දී නිරීක්ෂණය විය.

(iii) ලංසු ප්‍රදානය කිරීම 2022 මැයි 20 දින සිදු කළද, 2022 ජූනි 10 දින සැපයුම්කරු විසින් කාර්යසාධන බැඳුම්කරයේ වටිනාකම අඩු කරන ලෙස කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව, සැපයුම්කරු විසින් මෙම ප්‍රසම්පාදනය සඳහා මාස 03ක කාලයක් ගත කර 2022 අගෝස්තු 16 දින පිළිගෙන ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(iv) ඇණවුම ඉදිරිපත් කිරීමේ දී, ඖෂධ කුප්පි 250 ක් වහාම, ඖෂධ කුප්පි 125 ක් පළමු තොගය ලැබී මාස 02 ක් සහ ඉතිරි ඖෂධ කුප්පි 125 දෙවන තොගය ලැබී මාස 01 කින් සැපයිය යුතු බව දන්වා තිබුණද, 2022 සැප්තැම්බර් 27 දිනැති අංක DHS/ICL/IG//307/22 දරන ඉන්ඩෙන්ටුව අනුව, ඖෂධ කුප්පි 250 ක් 2022 නොවැම්බර් 30 දිනද, ඖෂධ කුප්පි 250 ක් 2022 දෙසැම්බර් 31 දිනද

සැපයිය යුතු බව සඳහන් කිරීම තුළ ඖෂධ සැපයීම පිළිබඳ එකිනෙකට පරස්පර කාල සීමාවන් දැක්වීම හේතුවෙන් අපේක්ෂිත පරිදි තොග මට්ටම පවත්වා ගෙන යාම මතභේදයට හේතු වන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(v) ප්‍රසම්පාදනයේ දී එකඟ වූ කාල සීමාව තුළ දී ඖෂධ සැපයීම වෙනුවට පළමු ඖෂධ කුප්පි 250 සැපයීම සඳහා දින 281 ක් ද, දෙවන ඖෂධ තොග සැපයීම සඳහා දින 250 ක්ද වශයෙන් දීර්ඝ ප්‍රමාදයක් සිදු වී ඇති බැවින්, ඇණවුම ප්‍රදානය කිරීමෙන් අනතුරුව තොග ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් හා විධිමත් වැඩපිළිවෙලක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සතුව තිබිය යුතු බව විගණනයේ දී නිරීක්ෂණය කෙරේ.

(vi) මෙම ඖෂධය අධි රුධිර පීඩනයෙන් පෙලෙන රෝගීන්ට මෙන්ම තීවුර හෘද රෝගවලින් පෙළෙන රෝගීන් සඳහා ද, භාවිතා කරනු ලබන අත්‍යාවශ්‍ය ඖෂධයක් බැවින් ප්‍රසම්පාදනයේ නියුතු අංශවල නිලධාරීන් විසින් ගනු ලබන තීරණවල අවිනිශ්චිතතාවයන් සහ අනවශ්‍ය ප්‍රමාද වීම් නිසා ඖෂධ තොග පිළිබඳ ගැටලු ඇතිවී ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) අංක 2021/SPC/N/R/P/00048 දරන සාමාන්‍ය ඇණවුමට අනුව WOR සහතිකයක් ලබා ගැනීම මත අවම ලංසුව ඉදිරිපත් කරන ලද ආයතනය වෙතින් ඖෂධ කුප්පි 350 ක් ලබා ගැනීම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් 2020 නොවැම්බර් 04 දින තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ලංසු ඉදිරිපත් කරන ලද සියලුම ආයතන ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි නොවූ ආයතන බැවින් ප්‍රසම්පාදනයේ දී අත්‍යාවශ්‍යම සාධකයක් සම්පූර්ණ නොකරන ලද ආයතන පිළිබඳව විශ්වාසනීයත්වයක් තබා ගැනීම පිළිබඳ විගණනයේ දී මතභේදයට හේතු වන කරුණක් බව නිරීක්ෂණය විය.

(ii) සාරානුකූල ලංසුකරු විසින් ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතිකයක් සඳහා අයදුම් කළද, ඖෂධයේ ලංසුව ඉහළ මිලකින් යුක්ත වීම මත ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් WOR සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ අනුව, වෙලඳපොලේ පවතින තරඟකාරී මිල ගණන් පිළිබඳව ප්‍රසම්පාදන කමිටුව නිසි ඇගයීමක් සිදු කලේද, යන්න විගණනයේ දී නිරීක්ෂණය නොවීය.

(ඊ) අංක 2023/BPC/N/R/P/00120 දරන ඇණවුම පදනම් කරගෙන රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා ප්‍රසම්පාදන නිලධාරිගේ (ඖෂධ) 2023 පෙබරවාරි 15 දිනැති කළමනාකරු (පාලන) ඇමතූ ලිපිය අනුව පූර්ව සැපයුම්කරුවන් අට දෙනෙකුගෙන් ලංසු කැඳවා තිබූ අතර, ලංසු දෙකක් පමණක් ලැබී තිබුණි. ඉන් එක් ලංසුකරුවකු පූර්ව සැපයුම්කරුවකු නොවන අතර, අනෙක් ලංසුකරු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සහතිකය නොමැති ලංසුකරුවෙකි. එම ලංසුවේ මිල අඩු කිරීමට යටත්ව ඇණවුම ලබා දීමට තීරණය කර තිබුණද, ලංසුකරු විසින් මිල අඩු කිරීමකට එකඟ වී නොතිබුණු බව 2023 සැප්තැම්බර් 27 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුව නිරීක්ෂණය විය.

42. Pethidine Hydrochloride Injection 75mg (00001102)

2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ඇස්තමේන්තු ඒකක ප්‍රමාණය 1,056,630 ක් වූ අතර 2019 සිට 2022 දක්වා වූ කාලය තුළ ඉන් ඒකක 703,120 ක් ඇණවුම් කර තිබුණි. 2019 සහ 2020 වර්ෂ දෙකේ දී ඒකක 379,999ක් පමණක් ලැබී තිබුණු අතර, මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2020 වර්ෂයේ ඇස්තමේන්තුව ඒකක 231,719 ක් වූ නමුත් ඇණවුම් කිරීම ඒකක 326,120 ක් බැවින් ඇස්තමේන්තුව ඉක්මවා ඒකක 94,401 ක් ඇණවුම් කර ඇති බව නිරීක්ෂණය විය. තවද පිළිවෙලින් 2021 සහ 2022 වර්ෂ වලදී ඇස්තමේන්තු ප්‍රමාණය ඒකක 264,138 හා 210,864 ක් වූ අතර ඇණවුම් ප්‍රමාණය පිළිවෙලින් ඒකක 32,000 ක් හා ඒකක 145,000 ක් වශයෙන් එම වර්ෂවලදී සියයට 87 ක් සහ සියයට 31 ක් අඩුවෙන් ඇණවුම් කිරීම තුළ ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසි ක්‍රමවේදයකින් තොරව සිදු කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) 2021 හා 2022 වර්ෂ වලදී අවස්ථා 03 කදී ඇණවුම් කරන ලද ඖෂධ ඒකක 177,000 ක් විගණිත දින වූ 2023 ඔක්තෝබර් මාසය වන විටත් ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) අංක 2022/SPC/N/R/P/00066 දරන සාමාන්‍ය ඇණවුම මඟින් 2021 මාර්තු 22 ඒකක 32,000 ක් ඇණවුම් කිරීමට කටයුතු කර ඇති බව පරිගණක දත්ත පද්ධතියේ සඳහන් වූ අතර එවැනි ඇණවුමක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ලැබී නොමැති බව 2023 නොවැම්බර් 16 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලිඛිතව විගණනය වෙත දන්වා ඇති බැවින් පරිගණක පද්ධතියේ තොරතුරු පිළිබඳ විශ්වාසදායක බව තහවුරු කළ නොහැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඈ) අංක 2021/SPC/L/R/P/00387 දරන ඇණවුම මඟින් යටෝක්ත ඖෂධයෙන් ඒකක 38,620 ක් ලබා ගැනීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි නිෂ්පාදකයින්ගේ දේශීය නියෝජිතයින්ගෙන් ලංසු කැඳවා තිබුණු අතර මේ සඳහා ආයතන 02 කින් පමණක් මිල ගණන් ලැබී තිබුණු අතර අවම ලංසු කරු වූ Leader Pharma Agency (Pvt) Ltd ආයතනය තෝරාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඉන්දියාවේ Verve Human care laboratories ආයතනයේ දේශීය නියෝජිතයා වන Leader Pharma Agency (Pvt) Ltd ආයතනයට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය ඉන්වොයිස් දිනය වූ 2020 ජූලි 07 වන විට අවලංගු වී මාසයක් ගත වී තිබුණු අතර මෙය දීර්ඝ කර කිරීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ii) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත ප්‍රකාරව සැපයුම්කරු සමඟ අත්සන් කරන ලද ගිවිසුම සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි.

(ඉ) අංක 2021/SPC/N/R/P/00060 දරන ඇණවුම පදනම් කර ගෙන ඖෂධ ඒකක 230,000 ක් සැපයීම සඳහා ලංසු කැඳවීමේ දී අතීත සැපයුම්කරුවෙකු වූ ඉන්දියන් Verve

Human Care Laboratories ආයතනය තෝරා ගෙන තිබුණු අතර ලංසු වටිනාකම එ.ජ.ඩො. 805,000 කි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2021 මාර්තු 04 දිනැති අංක DHS/AR/277/21 දරන ඉන්ඩෙන්ටුව අනුව මෙම ඖෂධයෙන් ඒකක 150,000 ක් 2021 අප්‍රේල් 30 දින ද, ඒකක 80,000 ක් 2021 අගෝස්තු 31 දින ද සැපයීම කළ යුතුව තිබුණි. 2022 ජූනි 20 දින වන විට වෛද්‍ය සැපයීම් අංශයේ සහ රජයේ රෝහල් සතුව ද තොග නොතිබුණි. තොග සැපයිය යුතු දින සිට එදිනට මාස 14 ක් පමණ ගත වී ඇතත් පළමු තොගය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ii) 2021 අප්‍රේල් 28 දින සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද අංක NMRE/EA/LA/040/21 දරන Narcotic License හි පළමු පිටුවේ Pethidine Injection BP 75 mg/1.5ml glass ampoule (VERPAT–75) ලෙසත් දෙවන පිටුවේ එය Codeine Phosphate BP 226,000g (226 Packs of 1000g) ලෙසත් සඳහන් වී තිබුණු බැවින් ලංසුකරුට ඉන්ඩෙන්ටුව ලබා දීම තවදුරටත් පමා වී තිබුණු අතර නැවතත් මසකට පමණ පසු එනම් 2021 මැයි 30 දින Narcotic Licence නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය.

(iii) මෙම ඖෂධයෙන් ඒකක 150,000 ලබා ගැනීම සඳහා වෛද්‍ය සැපයීම් අංශය හා මුදල් අමාත්‍යාංශය විසින් නාමමාත්‍ර ඉන්වොයිසි අනුමත කර තිබුණද තොග ලබා ගැනීම පමාවීම හේතුවෙන් Narcotic Licence නැවත ලබා ගැනීමට සිදුව තිබුණි. 2022 ජූලි 02 දින සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද අංක NMRA/MA/IP/057/22 දරන Narcotic License හි Pethidine Injection BP 75 mg/1.5mg (VERPAT – 75) ලෙස සඳහන් වී තිබුණු නමුත් Pethidine Injection BP 75 mg/1.5ml (VERPAT – 75) ලෙස සඳහන් විය යුතුව තිබුණි. ඒ අනුව නිලධාරීන්ගේ නොසැලකිලිමත් බව හේතුවෙන් Narcotic License අවස්ථා 2 කදී වැරදීම් සහිතව නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය.

(ඊ) 2024 වර්ෂයට අදාළව 2023 පෙබරවාරි 24 දිනැති අංක 2024/SPC/N/R/P/00023 දරන ඇණවුම මඟින් Ampoules 180,000 ක් අවශ්‍ය බවත් මෙයින් ඒකක 100,000 ක් 2024 ජනවාරි 15 වන දිනද ඒකක 80,000 ක් 2024 මැයි 15 දිනද ලබා ගැනීමට අපේක්ෂිත බවත් සඳහන්ව තිබුණි. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ අංක 01 – 14 / 2023 හා 2023 අප්‍රේල් 04 දිනැති චක්‍රලේඛය අනුව ප්‍රමුඛතා ලැයිස්තුවේ මෙම ඖෂධය සඳහන්ව නොමැති බැවින් ඇණවුම ඉදිරිපත් කර විගණිත දිනය වන විට මාස 07 ක් ගත වුවද, නීත්‍යානුකූලව අවලඟු කිරීමට හෝ අත්හිටුවීම පිළිබඳව පැහැදිලි තීරණයක් ගෙන නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

43. Alteplase 20mg Vial (SR No – 00205701)

2019 සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ඇස්තමේන්තු ගත ප්‍රමාණය ඒකක 5,861 ක් වූ අතර එම කාලය තුළ ඒකක 3,865 ක් ඇණවුම් කර තිබුණි. ඉන් ඒකක 2,590 ක් ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2021 වර්ෂයේ ඇස්තමේන්තු ප්‍රමාණය ඒකක 1,204 ක් වූ නමුත් එම ප්‍රමාණය ඉක්මවා ඒකක 1,400 ක් ඇණවුම් කර තිබුණි. 2022 හා 2023 වර්ෂවලදි ඇස්තමේන්තු ප්‍රමාණය පිළිවෙලින් ඒකක 1,164 හා 1,303 ක් වූ අතර ඇණවුම් ප්‍රමාණය පිළිවෙලින් ඒකක 625 ක් හා ඒකක 450 කි. ඇස්තමේන්තු ප්‍රමාණයට සාපේක්ෂව වාර්ෂික ඇණවුම් ප්‍රමාණය එම වර්ෂවලදී සියයට 46ක් සහ සියයට 65 ක් අඩුවෙන් සිදු කිරීම තුළ ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසි ක්‍රමවේදයකින් තොරව සිදුකර ඇති බවත් නිරීක්ෂණය විය.

(ආ) 2022 වර්ෂයේ දී අවස්ථා දෙකකදී ඉදිරිපත් කරන ලද ඒකක 225 සහ ඒකක 450 ක ඇණවුම් විගණිත දින වන විටත් ලැබී නොතිබුණි.

(ඇ) 2023 වර්ෂයේදී අංක 2023/SPC/E/C/P/00163 දරන ඇණවුම යටතේ ද ඒකක 225 ක් රු.24,571,631 ක හදිසි මිලදී ගැනීම් ලෙස ඇණවුම් කර තිබුණද, MSMIS පරිගණක පද්ධතියේ මෙම ඇණවුම ඇතුළත් කර නොතිබුණි.

(ඈ) වෛද්‍ය සැපයීම් සමාලෝචන කමිටුවේ (ඖෂධ) තීරණය පරිදි මාස 03 ක අවශ්‍යතාවයක් සඳහා හදිසි මිලදී ගැනීමක් සිදු කිරීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ (වෛද්‍ය සැපයීම්) 2023 පෙබරවාරි 28 දිනැති අංක DDG/MSD/E/02/2023 දරන ලිපිය මඟින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපති වෙත දන්වා තිබුණි. හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් ඒකක 225 ක ප්‍රමාණයක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමට තීරණය කර තිබුණද, ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් නොවීම හේතුවෙන් නැවත ප්‍රසම්පාදනය කළ යුතු බවට දන්වා තිබුණි. විගණන දින වන විට එනම් ඔක්තෝබර් වනවිට ගත වී ඇති කාලය මාස 08ක් ඉක්මවා තිබුණ ද, නැවත ප්‍රසම්පාදනයක් සිදු කර නොමැති බැවින් හදිසි අවශ්‍යතාව කුමක්ද, යන්න මතභේදයට තුඩු දෙන කරුණක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඉ) සාමාන්‍ය මිලදී ගැනීම යටතේ 2022 වර්ෂය තුළදී Vial 400 ක් සඳහා අංක 2022/SPC/N/C/P/00017 දරන ඇණවුමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසු කැඳවීමට අනුමැතිය දී තිබුණි. මේ සඳහා එක් ලංසුකරුවෙකු ඉදිරිපත් වී තිබුණු අතර එම ලංසුකරු තෝරා ගැනීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම ඖෂධයට අදාළව වෛද්‍ය සැපයීම් අංශයෙන් ලද සැපයුම් කොන්දේසි හා ඉන්ඩෙන්ටු කොන්දේසි අනුව " නිෂ්පාදිත දිනයේ සිට අවම මාස 24 ක ජීව කාලයක් සහිතව සැපයිය යුතු බව " සඳහන් වුවද මෙම ඖෂධයේ අවශ්‍ය ඉතිරි ජීව කාලය මාස 18 ක් වී තිබූ අතර, සියයට 75 කට වඩා අඩුවෙන් සපයා ඇති බවද නිරීක්ෂණය විය.

(ii) ජීව කාලය සියයට 75 කට වඩා අඩු වීම හේතුවෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සැපයුම්කරු වෙත රු. 2,544,574 (ඒ.ජ.ඩො 7,006.17) අතිරේක ගාස්තුවක් අය කිරීම සඳහා අංක D/N – DNS/P/022/2023 දරන හර පතක් නිකුත් කර ඇති නමුත් මෙම මුදල අය කර ගත්තේද, නැද්ද යන්න පිළිබඳ පරීක්ෂා කිරීමට අදාළ ලිඛිත තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(iii) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතට අනුව තෝරාගත් සැපයුම්කරු සමඟ අත්සන් කරනු ලබන ගිවිසුම සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි.

(iv) ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි ලියාපදිංචි කිරීමේ සහතිකයේ වලංගු කාලය අවසන් වී තිබූණු අතර එම ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 නොවැම්බර් 17 දිනැති අංක NMRA/SP/ CEO/02N/2020 දරන ලිපිය මඟින් 2021 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. නමුත් අදාළ ඖෂධ නිෂ්කාශන දිනය වූ 2022 නොවැම්බර් 30 වන විට ලියාපදිංචියේ වලංගුතාවය ඉකුත් වී මාස 17 ක් ඉක්මවා තිබුණද, එය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2023 වර්ෂයේ මෙම ඖෂධය සාමාන්‍ය මිලදී ගැනීම යටතේ සිදු කර තිබුණු අතර අංක 2023/SPC/N/C/P/00124 දරන ඇණවුමට අදාළ ප්‍රසම්පාදන දැන්වීම අනුව ඉදිරිපත් වූ එකම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු වෙතින් ඒකක 450 ක් රු.49,143,262 කට මිලදී ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) මෙම ඖෂධයට අදාළව වෛද්‍ය සැපයීම් අංශයේ පරිගණකගත ඇණවුම් ලැයිස්තුව පරිදි ජනවාරි 15 හා 2023 අප්‍රේල් 16 දිනැති ඇණවුම් මඟින් පිළිවෙලින් ඒකක 250 ක් සහ ඒකක 200 ක් ලබා ගැනීමට සැලසුම් කර තිබුණි. මෙම සැපයුම්කරු අතීත සැපයුම්කරුවෙකු වීම සහ ලංසු ඉදිරිපත් කරන ලද එකම සැපයුම්කරු වූයෙන් තාක්ෂණික ඇගයීම් කමිටු මෙම සැපයුම්කරු තෝරා ගෙන තිබුණි. එසේ වූවද, සැලසුම් කළ දින සිට විගණිත දිනය වන විට මාස 09 ක් ගත වුවද සැපයුම්කරු වෙත ඉන්ඩෙන්ටුව නිකුත් කර ඖෂධ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි කිරීමේ සහතිකය 2022 දෙසැම්බර් 14 දිනෙන් අවලංගු වී තිබුණු බව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ සඳහන් කර තිබුණි. නමුත් ලියාපදිංචි කිරීමේ සහතිකයේ වලංගුතාවය දීර්ඝ කිරීමට අදාළව සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

44. Haloperidol inj' 5 mg/1ml (SR - 00300803)

2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මුළු ඇස්තමේන්තුව එන්නත් 448,349 ක් වූ අතර නිකුත් කළ ප්‍රමාණය එන්නත් 228,873 ක් වී තිබුණි. රෝගීන් විසින් පරිභෝජනය කර ඇති ප්‍රමාණය එන්නත් 228,686 ක් වූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ඇස්තමේන්තුගත කිරීම, නිකුත් කිරීම හා පාරිභෝජනය සමඟ සැසඳීමේ දී ඇස්තමේන්තුගත කිරීම විධිමත් නිර්නායක මත පදනම්ව සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) ඒකක 10,390 ක් 2022 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වී තිබුණු අතර ඒකක 70,000 ක් 2023 ඔක්තෝබර් 31 කල් ඉකුත්වීමට නියමිතව තිබුණි.

(ඇ) අංක 2023/SPC/N/R/P/00069 දරන ඒකක 30,000 ක් සඳහා වූ ඇණවුම 2022.11.24 වෛද්‍ය සැපයීම් අංශය විසින් ඒවා තිබූණි. මේ සඳහා වූ අංක DHS/MM/069/2023 දරන ඉන්ඩෙන්ටුව අනුව 2024 මැයි 30 දින වන විට ඇණවුම සම්පූර්ණ කළ යුතුව තිබුණි. ඒ අනුව වෛද්‍ය සැපයීම් අංශය ඉදිරිපත් කළ ඇණවුමට අදාළ ඖෂධ ලැබීමට ගතවන සාමාන්‍ය කාලය මාස 11 ක් වුවද, එම කාලයද ඉක්මවා මාස 07 ක් ගත කර ඇති බව නිරීක්ෂණය විය.

45. Heparin Injection 25,000 I.U/ 5 ml (SR No – 00204601)

MSMIS පරිගණක පද්ධතිය අනුව 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මුළු ඇස්තමේන්තුව ඒකක 1,876,233 ක් වූ අතර එම කාල පරිච්ඡේදයට අදාළව ඇණවුම් ප්‍රමාණය ඒකක 2,106,660 කි. 2023.10.16 දින වන විට ඒකක 1,373,107ක් ලැබී ඇති බව MSMIS පරිගණක පද්ධතිය මඟින් අනාවරණය විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) යථෝක්ත ඖෂධය සඳහා 2022 වර්ෂයේ වාර්ෂික අවශ්‍යතාවය කුප්පි 396,317 ක් විය. නමුත් අවස්ථා 12 කදී ප්‍රදාන වශයෙන්, හදිසි මිලදී ගැනීම් , ලෝක බැංකු ආධාර හා ඉන්දීය ණය පහසුකම් යටතේ පිළිවෙලින් ඖෂධ කුප්පි 155,350, 100,000, 200,000 හා 275,000 ලෙස එකතුව ඖෂධ කුප්පි 730,350 ක් ඇණවුම් කර තිබුණි. මෙය වාර්ෂික ඇස්තමේන්තු ප්‍රමාණයට වඩා සියයට 84 කට වඩා වැඩියෙන් ඇණවුම් කිරීමක් බවත්, ඇණවුම් සකස් කිරීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුව සිදු කර නොමැති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) මෙම ඖෂධය රෝගී ජීවිත අවදානමෙන් බේරා ගැනීම සඳහා මෙන්ම ඖෂධ ප්‍රමුඛතා ලේඛනය අනුව අත්‍යවශ්ය ඖෂධයක් බව විගණනයේදී නිරීක්ෂණය විය. නමුත් ප්‍රසම්පාදනයේ අරමුණු නිසිලෙස වටහා නොගැනීම, ප්‍රසම්පාදනයේ නියුතු විවිධ අංශවල නිලධාරීන් විසින් ගනු ලබන තීරණවල අවිනිශ්චිතතාවයන් සහ අනවශ්‍ය ප්‍රමාද වීම් තිබීම ඖෂධ හිඟයක් ඇති වීමට හේතුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) Pronto පරිගණක පද්ධතිය මඟින් ලබාගත් තොරතුරු අනුව 2022 වර්ෂය තුළ අවස්ථා 29කදී යථෝක්ත ඖෂධයේ කුප්පි ඒකක 7,131 ක ප්‍රමාණයක් ප්‍රාදේශීය වශයෙන් විවිධ සැපයුම්කරුවන්ගෙන් විවිධ මිලගණන් යටතේ මිලදී ගෙන තිබුණි. මේ සඳහා එකතුව රු.15,179,957 ක මුදලක් වැය කර තිබුණි. මෙම ඖෂධ කුප්පියක මිල රු 1,500 සිට රු 4,000 ක් වැනි විශාල මිල පරාසයක් යටතේ මිලදී ගෙන තිබුණු අතර ඖෂධ කුප්පියක සාමාන්‍ය මිළ රු.717.97 ක් වූ බව විගණනයේදී නිරීක්ෂණය විය. ඖෂධ ප්‍රසම්පාදන කටයුතු නියමිත කාලපරිච්ඡේදය තුළ සිදුනොකිරීම මත විශාල මුදලක් අමතරව දැරීමට සිදු වූ බව විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) 2020 හා 2021 වර්ෂ තුළදී ඇණවුම් කරන ලද ඖෂධ අතුරින් පිළිවෙලින් අංක 2020/SPC/N/R/P/00055 දරන හා අංක 2021/SPC/N/R/P/00066 දරන සාමාන්‍ය ඇණවුම් වලට අදාළව ඖෂධ කුප්පි 42,017ක් සහ 36,444 ක් 2022 වර්ෂයේදී ලැබී තිබුණි. විධිමත් කාල සටහනක් අනුව ඇණවුම් කරන ලද ඖෂධ සැපයීමට නොහැකිවීමෙන් සාමාන්‍ය මිලදී ගැනීමෙන් පරිබාහිර පහත (ඉ) හි සඳහන් පරිදි හදිසි මිලදී ගැනීම්වලට සහ ණය පහසුකම් වැනි වෙනත් ප්‍රභවයන්ට යොමුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) ඇණවුම් අංක 2022/SPC/E/R/P/00738 යටතේ ඖෂධ කුප්පි 75,000 ක් හදිසි අවශ්‍යතාවය මත සැපයීම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත 2022 නොවැම්බර් 04 දින දන්වා තිබුණි. ඒ අනුව ඖෂධ නියාමන අධිකාරියේ සහතිකය සහ සති දෙකක් ඇතුළත ඖෂධ සැපයීමේ එකඟතාවය මත සැපයුම්කරුවකු තෝරා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම මිලදී ගැනීම සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම සහ එම කමිටුව මඟින් ලබා ගන්නා ලද තීරණ පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) යථෝක්ත ඖෂධය සඳහා මිල ගණන් කැඳවීමේ දී එය ඖෂධ කුප්පි (vials) ලෙස සැපයිය යුතු බව ලංසු කැඳවීමේ ලියකියවිලිවල දක්වා තිබුණි. නමුත්, ඇණවුම ප්‍රදානය කර තිබුණු ආයතනය විසින් සපයා තිබුණේ "Ampoule" ලෙස බව ඊට අදාළ ලිපිගොනුව පරීක්ෂාවේ දී අනාවරණය විය. ඒ අනුව, ලංසු කැඳවීමේ ලියකියවිලිවල Heparin Injection vials හෝ Ampoule ලෙස නිර්වචනය කර තිබුනේ නම්, එම ඇණවුම සඳහා තවත් පාර්ශවයන්ට සහභාගී වීමට තිබුණු ඉඩ ප්‍රස්තාව තිබෙන බව විගණනයේ දී බැහැර කළ නොහැකි විය. ඒ අනුව, සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබා දීම පිළිබඳ අවධානය යොමු කර තිබේ ද යන්න විගණනයේ දී මතභේදයට තුඩු දෙන කරුණක් විය.

(iii) ලංසු කැඳවීමේ කොන්දේසි ප්‍රකාරව සැපයුම්කරු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් තිබීම හෝ අඩු මිල ගණන් ඉදිරිපත් කිරීම මත ලියාපදිංචිය අත් හැරීම් සහතිකය ලබා තිබීම අනිවාර්යය විය යුතු බව දක්වා තිබුණි. නමුත් සැපයුම්කරුගේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය 2022 පෙබරවාරි 12 දිනයෙන් අවසන්ව තිබුණි. ඒ අනුව සැපයුම්කරුගේ ලියාපදිංචිය අලුත් කරවා ගැනීමට හෝ WOR සහතිකයක් නිකුත් කර ගැනීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් 2023 ජනවාරි 30 දින ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත දන්වා තිබුණු නමුත් ලියාපදිංචිය අලුත් කිරීමක් හෝ WOR නිකුත් කිරීමක් හෝ සිදුකර නොතිබුණි.

(iv) යථෝක්ත ඇණවුම ඉදිරිපත් කරන ලද 2022නොවැම්බර් 02 දින වන විට වෛද්‍ය සැපයීම් අංශය සතුව මෙම ඖෂධයේ උග්‍ර හිඟයක් පැවැති අතර රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව නිකුත් කළ 2023 පෙබරවාරි 01 දිනැති අංක LP/DHS/EP/HD/3595/2022 දරන ඉන්ඩෙන්ටුව අනුව ඖෂධ සැපයිය යුතු දිනය 2023 ජනවාරි 15 දින ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව එකිනෙකට වෙනස් ලෙස ප්‍රසම්පාදන ලියකියවිලි පිලියෙළ කර තිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(v) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 22/1523/610/018 දරන "ශ්‍රී ලංකාව තුළ අඛණ්ඩ වෛද්‍ය සැපයීමේ සේවාවක් පවත්වාගෙන යාම" යන මැයෙන් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද සංදේශයට අනුව සහ වර්තමානයේ තිබෙන තොග ඌනතාවය මත ඉදිරිපත් කරන ලද ලංසු අතුරෙන්

සැපයුම්කරුවකු තෝරා ගෙන ඇණවුම ලබා දීමට සෞඛ්‍ය පද්ධති හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. නමුත් මෙම සැපයුම්කරු නියමිත කාලසීමාව තුළදී ඖෂධ සැපයීමට අපොහොසත් වී තිබුණි.

(ඊ) ඇණවුම් අංක 2022/SPC/X/R/P/00284 යටතේ හදිසි පදනම මත සහ ඉන්දීය ණය පහසුකම් යටතේ යටෝක්ත ඖෂධ කුප්පි 275,000 ක් මිලදී ගැනීම සඳහා වෛද්‍ය සැපයීම් අංශයේ දත්ත පද්ධතිය මඟින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත දන්වා තිබුණි. එම ඖෂධයෙන් කුප්පියක් එ.ජ.ඩො. 2.65 බැඟින් එ.ජ.ඩො. 728,750 කට කුප්පි 275,000 ක් මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කළ හෝ එම කමිටුව විසින් ගනු ලැබූ තීරණය පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

(ii) මෙම සැපයුම්කරු මීට ප්‍රථම මෙම ඖෂධ සපයා තිබුණු අතර ඖෂධ කුප්පිවල ප්‍රමිතිය පිළිබඳව හෘද රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් විසින් සෑහීමකට පත් නොවන බව අංක MSD/SCU(I)/GMP/38/2015 හා 2015 අගෝස්තු 25 දිනැති ලිපිය මඟින් වෛද්‍ය සැපයීම් අංශයේ සභාපති විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත දන්වා තිබුණි. එසේ තිබියදී, යටෝක්ත ආයතනය වෙත මෙම ඇණවුම ප්‍රදානය කර තිබුණි.

(iii) මෙම සැපයුම්කරු ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් කාලය දීර්ඝ කරනු ලැබූ ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් කර තිබුණ එම සහතිකයද 2022 පෙබරවාරි 10 දිනෙන් අවලංගු වී තිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(iv) මෙම ඖෂධ ආනයනය කිරීම සඳහා දේශීය නියෝජිත ආයතනය වෙත ලබා දී තිබුණු ආනයන බලපත්‍රයෙහි වලංගු කාලය 2020 පෙබරවාරි 10 දින අවසන් වී තිබුණු අතර එහි ලියාපදිංචිය අලුත් කරවා ගැනීමක් පිළිබඳ සාක්ෂි විගණනයට අනාවරණය නොවීය.

(උ) ඇණවුම් අංක 2022/SPC/E/R/P/00478 යටතේ ඖෂධ කුප්පි 25,000 ක් සැපයීම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත දන්වා තිබුණි. ඒ අනුව අඩුම ලංසුව ඉදිරිපත් කළ එමෙන්ම ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් හිමි ආයතනය වෙත ලංසුව ප්‍රදානය කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 2022 ජූලි 28 දින තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම ඇණවුම සඳහා ලංසු කැඳවූ ආයතන විසින් සාම්පල් ඉදිරිපත් නොකිරීම, මිල ගණන් අතර විශාල වෙනසක් පැවැතීම, ඖෂධ සැපයීම සඳහා නියමිත කාලයට වඩා වැඩි කාලයක් ඉල්ලා සිටීම, ඉන්දියානු ණය ආධාර යටතේ ඖෂධ තොග ලැබීමට නියමිතව තිබීම වැනි කරුණු මත සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් 2022 අගෝස්තු 02 දින යටෝක්ත ඇණවුම අවලංගු කර තිබුණු බවට විගණනයේදී අනාවරණය විය. එසේ වුවද ඉන්දියානු ණය ආධාර මත 2022 අප්‍රේල් හා ජූලි ලැබීමට නියමිතව තිබුණු අංක 2022/SPC/X/R/P/00284

දරන ඇණවුම සඳහා වන ඖෂධ කුප්පි සපයා තිබුණේ 2023 ජූනි 01 බවට විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව මාස 10 ක් පමණ දිගු කාලයක් ගතවන ඖෂධ සැපයීම මත තීරණ ගැනීම ප්‍රායෝගික ද යන්න විගණනයේ දී ගැටළු සහගත විය.

(ii) යථෝක්ත ඇණවුම ඉදිරිපත් කරන දින වන විට වෛද්‍ය සැපයීම් අංශය සතුව ඖෂධ කුප්පි 3,875 ක් ද ජාතික මට්ටමේ ඖෂධ කුප්පි 24,203 ක් ප්‍රමාණයක් ද එය මාස 0.7 ක පාරිභෝජනය සඳහා පමණක් ප්‍රමාණවත් බව විගණනයේදී නිරීක්ෂණය විය. ප්‍රමුඛතා ලැයිස්තුවේ සඳහන් මෙවැනි ඖෂධයක් නියමිත පරිදි ලබා ගැනීම සඳහා විධිමත් කාලසටහනක අවශ්‍යතාවය විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඌ) ඇණවුම් අංක 2023/SPC/N/R/P/00098 යටතේ ඖෂධ කුප්පි 150,000 ක් සාමාන්‍ය ඇණවුම යටතේ මිලදී ගැනීම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත 2022 නොවැම්බර් 17 දින ඇණවුම ඉදිරිපත් කර තිබුණු අතර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් සැපයුම්කරුවකු තෝරා ගැනීමට කටයුතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) තාක්ෂණික ඇගයීම් වාර්තාව අනුව යථෝක්ත ඇණවුම ඉදිරිපත් කරන ලද සැපයුම්කරු මීට ප්‍රථම මෙම ඖෂධ සපයා නොමැති බැවින් මෙම ඖෂධය පිළිබඳ ව ස්වාධීන රසායනාගාර වාර්තාවක් ලබා ගැනීම අනිවාර්යය කර තිබුණද, එම වාර්තාව ප්‍රසම්පාදන අස්ථිත්වය වෙත ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ii) ප්‍රසම්පාදන කාල සටහන අනුව ගැණුම් ඇණවුම ඉදිරිපත් කර සති දෙකක කාලයක් ඇතුළත කාර්ය සාධන බැඳුම්කරය ඉදිරිපත් කළ යුතු වුවද විගණිත දිනය වූ 2023 ඔක්තෝබර් 15 දින වන විටත් මෙය ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2023 සැප්තැම්බර් 15 දින නිකුත් කරන ලද අංක DHS/HD/131/2023 දරන ඉන්ඩෙන්ටුව අනුව ඖෂධ තොග සැපයිය යුතු දිනය 2024 දෙසැම්බර් 31 දින වශයෙන් දක්වා තිබුණද, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සැපයුම්කරු වෙත නිකුත් කරන ලද ලිපිය අනුව ඖෂධ කුප්පි 75,000 ක් වහාම සහ ඉතිරි ඖෂධ කුප්පි පළමු තොගය ලබා දී මාස දෙකකින් ලෙස දක්වා තිබුණි. මේ අනුව විවිධ අවස්ථාවලදී ඖෂධ සැපයිය යුතු කාලයන් වෙනස් කිරීම ප්‍රසම්පාදන ක්‍රියාවලිය කෙරෙහි සිදු කරනු ලබන අහිතකර බලපෑම් බව විගණනයේදී බැහැර කළ නොහැකි වී තිබුණි.

(එ) ඇණවුම් අංක 2021/SPC/N/R/P/00066 යටතේ ඖෂධ කුප්පි 350,000 ක් සාමාන්‍ය ක්‍රමය යටතේ මිලදී ගැනීම සඳහා 2020 පෙබරවාරි 26 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඇණවුම ඉදිරිපත් කර තිබුණි. මෙහිදී ඖෂධ කුප්පි ඉන්ඩෙන්ටු තුනක් යටතේ ආයතන දෙකකින් මිලදී ගැනීමට කටයුතු කර තිබූ බව විගණිත ලිපිගොණු අනුව අනාවරණය විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන කාල රාමුවට අනුව ලංසු කැඳවීමට අනුමැතිය ලැබීමෙන් පසුව සති 04 ක් ඇතුළත ලංසු කැඳවිය යුතු වුවත්, අදාළ ප්‍රසම්පාදනය සඳහා පුවත්පත් දැන්වීම් පළ කර ඇත්තේ 2020 මැයි 10 දින බව විගණිත ලිපිගොනුව මඟින් අනාවරණය විය. ඒ අනුව, ඇණවුම ඉදිරිපත් කිරීමට ලිඛිත තහවුරුවක් ලැබී මාස 03 කට ආසන්න කාලයක් ගත කර ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ii) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු විසින් ඖෂධ කුප්පි 300,000 ක් මිලදී ගැනීමටද ඉතිරි ඖෂධ කුප්පි 50.000 අවශ්‍යතාව මත මිලදී ගැනීමට ද තීරණය කර තිබුණි. ඒ අනුව, ඖෂධ කුප්පි 120,000 ක් මිලදී ගැනීම සඳහා නිකුත් කළ ඉන්ඩෙන්ටුව අනුව ඖෂධ කුප්පි සැපයීය යුතු දිනය 2021 ජනවාරි 30 ලෙස දක්වා තිබුණද, දින 40 ක් වැනි කාල පමාවකින් පසුව භාණ්ඩ සපයා තිබුණු බව විගණනයේ දි නිරීක්ෂණය විය.

(iii) තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් පත් කිරීම පිළිබඳව සාක්ෂි ලිපිගොනුවේ ඇතුළත් වී නොතිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය නිර්දේශ කර තිබුණේ, එක් හෘද රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු බව විගණිත ලිපිගොනුව අනුව අනාවරණය විය.

(iv) ඖෂධ කුප්පි 125,000 ක් මිලදී ගැනීම සඳහා අංක DHS/HD/472/2021 දරන ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබූණු අතර, 2022 ඔක්තෝබර් 31 දින ඖෂධ සැපයීය යුතුව තිබුණි. නමුත් යථොක්ත ඇණවුමෙහි ඉතිරි තොගය වන ඖෂධ කුප්පි 193,609 ක් විගණිත දිනය වූ 2023 සැප්තැම්බර් 30 දින වන විටත් සපයා නොතිබුණි.මේ අනුව, ඖෂධ තොග සැපයීය යුතු කාලය නිරන්තරයෙන් සංශෝධනය කිරීම මත අපේක්ෂිත පරිදි තොග මට්ටම පවත්වා ගෙන යා නොහැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඒ) ඇණවුම් අංක 2020/SPC/N/R/P/00055 යටතේ ඖෂධ කුප්පි 250,000 ක් සාමාන්‍ය ඇණවුම යටතේ මිලදී ගැනීම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඇණවුමක් ඉදිරිපත් කර තිබුණි. යථෝක්ත ඇණවුම ඉන්ඩෙන්ටු තුනක් මඟින් ආයතන තුනක් වෙත ලබාදීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබූ අතර, ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ඖෂධ සැපයීම් අංශය විසින් ඖෂධ කුප්පි 250,000 ක් සැපයීම සඳහා 2019 මාර්තු 14 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඇණවුමක් නිකුත් කර තිබුණි. පසුව මෙම ඇණවුම් ප්‍රමාණය සියයට 50කින් වැඩි කර තිබුණි. නමුත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් මිල ගණන් කැඳවීම සිදුකර තිබුණේ 2020 ජුනි 03 දින දීය. ඒ අනුව, පූර්ව ප්‍රසම්පාදන කාර්යයන් සඳහා මාස 14 ක් වැනි දීර්ඝ කාලයක් ගත වී තිබුණි.

(ii) හෘද රෝගීන් සඳහා මීට පෙර මිලදී ගන්නා ලද මෙම ඖෂධය ශල්‍යකර්ම සඳහා භාවිතා කිරීමෙන් පසුව, හෘද රෝගීන්ගේ අසාමන්‍ය හා අධික රුධිර වහනයක් නිරීක්ෂණය වූ බව හෘද රෝග විශේෂඥ වෛද්‍යවරුන් විසින් පැමිණිලි කර තිබුණද, ඒ කෙරෙහි අවධානය යොමු නොකර අංක 2020/SPC/N/R/P/00055 දරන ඇණවුමට අනුව ඖෂධ කුප්පි 196,875 ක ප්‍රමාණයක් නැවත පූර්ව

ප්‍රතික්ෂේප වූ සැපයුම්කරුගෙන් මිල දී ගෙන තිබුණි. ඒ අනුව මෙම ඖෂධය භාවිතය පිළිබඳ විගණනයේ දී මතභේදයට තුඩුදෙන කරුණක් බව නිරීක්ෂණය විය.

(iii) අංක DMS/M/HD/681/2020 දරන ඉන්ඩෙන්ටුව මඟින් තොග වහාම සැපයිය යුතු බව දක්වා තිබුණද, ඖෂධ සැපයීම දින 21ක ප්‍රමාදයක් සහිතව සපයා තිබුණි. මෙම කාලය සඳහා ප්‍රමාද ගාස්තු ද අයකර ගෙන නොතිබුණි.

(iv) යථෝක්ත ඇණවුම් සඳහා ලංසු කැඳවීමේදී එක් සැපයුම්කරුවෙකු විසින් සිය කැමැත්තෙන් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඒ කෙරෙහි වැඩි අවධානයක් යොමු කර නොතිබුණි. නමුත්, NMRA වලංගු ලියාපදිංචි සහතිකය තිබූ බැවින් නිසා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු "B"(MPC "B") විසින් මෙම මිල ගණන් ඇගයීම් කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකය තිබූ පමණින්ම එවැනි තීරණයක් ගැනීම පිළිබඳව විගණනයේ දී මතභේදයට තුඩුදෙන කරුණක් වන අතර අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම ආයතනයෙන් ඖෂධය මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

(v) අංක DMS/M/HD/682/2020 දරන ඉන්ඩෙන්ටුව මඟින් Vials ඒකක 84,375 ක් සැපයීම සඳහා සැපයුම්කරුවකු වෙත 2021 ජනවාරි 17 දින ලංසුව ප්‍රදානය කර තිබුණු අතර Vials ඒකක 42,188 ක් 2021 අප්‍රේල් 15 දින වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණි. එම තොගයෙන් ඉතිරි ඖෂධ කුප්පි 42,187 ක ප්‍රමාණය 2022 අගෝස්තු 31 දින සැපයිය යුතු බව දක්වා තිබුණද, එම තොග වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණේ 2022 දෙසැම්බර් 14 වන දින දීය. ඒ අනුව ප්‍රමාද කාලය මාස තුනක් ඉක්මවා තිබුණි.

(vi) යථෝක්ත ආයතනය විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකය තිබෙන බව දක්වා තිබුණද එහි වලංගු කාලය 2022 පෙබරවාරි 12 වන විට ඉකුත්වී තිබුණි. ඒ අනුව, 2022 ජූනි 29 දින අංක DMS/M/H/717/20 දරන ඉන්ඩෙන්ටුව ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය පිළිබඳ අවධානය යොමු කර නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

46. Zoledronic Acid (SR-00703701)

(අ) අංක 2022/SPC/N/R/P/00039 දරන ඇණවුමට අනුව මිල රු. 359.82 ක් ලෙස දක්වා තිබුණද ඖෂධ නියාමන අධිකාරිය විසින් උපරිම සිල්ලර මිල රු. 6,900 ක් ලෙස ලියාපදිංචි සහතිකයේ සඳහන් කර තිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් බව නිරීක්ෂණය විය.

(ආ) අංක 2023/SPC/T/R/P/00148 දරන ඇණවුමට අනුව ඉතා කඩිනමින් ලබා ගත යුතු මෙම ඖෂධය ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතිකය (WOR) ලබා ගැනීමට යටත්ව අවශ්‍යතාවය කඩිනමින් සිදු කළ යුතු වීම හා තොග නොතිබීම වැනි හේතූන් මත ඖෂධ ඒකකයක් රු.1,302 බැගින් එන්නත් 3,400 සඳහා වටිනාකම රු.4,426,800 ක් වූ

ඇණවුම ප්‍රදානය කරන ලද 2023 අප්‍රේල් 21 දිනට තොග නොතිබීම හෙවත් ශූන්‍ය බව දක්වා තිබුණද ස්වස්ථ පද්ධතිය තුළ තොග ශූන්‍ය වී නොතිබුණි.

(ඇ) ඇණවුම් අංක 144121 හා LP/DHS/EP/PUN/3675/23 දරන ඉන්ඩෙන්ටුව ඉතා හදිසි ඇණවුමක් බැවින් සැපයුම්කරු වෙත ලබා දී දින 14 ක් තුළ ඖෂධය සැපයිය යුතු බව දන්වා තිබුණද ඖෂධ සැපයීම සඳහා දින 53 ක කාලයක් ප්‍රමාද වී තිබුණි.

47. Yellow Fever Vaccine 0.5ml (SR-00600601)

(අ) 2019 වර්ෂයේ සිට 2023 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වෛද්‍ය සැපයීම් අංශය විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ප්‍රමාණය ඒකක 43,778 හා ලැබුණු සත්‍ය ප්‍රමාණය ඒකක 15,150 අනුව විචලනය ඉතා ඉහල අගයක් වූ අතර එය සියයට 15 සිට සියයට 100 අතර පරාසයක විහිදී තිබුණි.ඒ අනුව නිවැරදිව දත්ත මත ඇස්තමේන්තු සකස් නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ඖෂධ ඒකක 10,000 ලබා ගැනීම සඳහා ඇණවුම් 04 ක් ඉදිරිපත් කර තිබුණද එක් ඇණවුමකින් ඒකක 1500 ක් පමණක් ලැබී තිබුණු අතර ඉතිරි මුලු අවශ්‍යතාවය පරිත්‍යාග ඒකක 2050 තුළින් සම්පූර්ණ කරගෙන තිබුණි.

(ඇ) වෛද්‍ය සැපයීම් අංශය විසින් ප්‍රමාණවත් තොග මට්ටම් පවත්වා නොගැනීම හේතුවෙන් 2022 වර්ෂයේ හා 2023 වර්ෂයේ ජාතික ඖෂධ තොග තත්ත්වය වරින් වර ශූන්‍ය තත්වයට පත්වී තිබුණි.

(ඈ) වෛද්‍ය සැපයීම් අංශයේ සැපයීම් හා ලංසු ලේඛනවල සඳහන් කොන්දේසි අනුව අවම මාස 24 ක ජීව කාලයක් සහිතව සැපයිය යුතු බව සඳහන් වී තිබුණද ඉන් බැහැරව මාස 18 ක ජීව කාලයක් ඇති එකම ලංසුකරුට ලංසුව ප්‍රදානය කර තිබුණි. අංක DHS/AMS/460/2022 දරන ඉන්ඩෙන්ටුවට අදාළ ගිවිසුම්වල පිටපත් ලිපිගොනුව තුළ ගොනුගත කර නොතිබුණි.

(ඉ) අංක 2022/SPC/X/C/P/00283 යටතේ වූ ලංසු කැඳවීම අවලංගු කර තිබුණද දත්ත පද්ධතිය තුළ එය ලැබිය යුතු ඇණවුමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් දත්ත පද්ධතිය යාවත්කාලීන වී නොතිබුණි.

(ඊ) අංක 2023/SPC/N/C/P/00088 දරන ඇණවුමට අදාළ ලංසු ඉදිරිපත්වී නොතිබුණු අතර නැවත ලංසු කැඳවීමට තීරණය කිරීම සඳහා මාස 03 දින 14 ක් ගත කර තිබුණි.

(උ) අංක 2023/WHO/A/C/P/00006 යටතේ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ඖෂධ ලැබිය යුතු ඇණවුමක් ලෙස දත්ත පද්ධතියේ දක්වා තිබීම හේතුවෙන් දත්ත පද්ධතිය යාවත්කාලීන වී නොතිබුණි.

48. Omeprazole Sodium InJ. 40mg (SR-00800803)

(අ) 2019 වර්ෂයේ සිට 2023 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වෛද්‍ය සැපයීම් අංශය විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ප්‍රමාණය ඒකක 7,916,993 ක් වූ අතර ලැබුණු

සත්‍ය ප්‍රමාණය ඒකක 4,920,994 ක් විය. ඒ අනුව විචලනය ඉතා ඉහල අගයක් වූ අතර එය සියයට 11 සිට සියයට 83 අතර පරාසයක විහිදී තිබුණි. එබැවින් නිවැරදි දත්ත මත ඇස්තමේන්තු සකස් නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) අංක 2022/SPC/N/R/P/00013 දරන ඇණවුම මඟින් ඖෂධ ඒකක 800,000ක අවශ්‍යතාවයෙන් ඒකක 540,000 ක් ලැබී තිබුණද ප්‍රමාද කාලය මාස 05 ඉක්මවා තිබුණි.

(ඇ) අංක 2022/SPC/Z/R/P/00770 දරන ඉහත ඇණවුමේ ඉතිරි තොගය ස්වස්ථ දත්ත පද්ධතිය අනුව 2023 නොවැම්බර් 23 විගණිත දින වනවිටද ලැබී නොතිබුණි.

(ඈ) මෙම ඇණවුම සඳහා ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ කිරීමට වර්ෂ 02 මාස 09 කට අධික කාලයක් ගතවී තිබුණි.

(ඉ) හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා අංක 2022/SPC/E/R/P/00732 දරන වටිනාකම රු.8,088,000 ක් වූ ඒකක 300,000 ක් සඳහා ලංසු කැඳවීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය නොතිබූ ලංසුකරුවන් විසින් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර, ඉන් එක් ලංසුකරුවෙකු වෙත ලංසුව ප්‍රදානය කර තිබුණි.

(ඊ) අංක 2022/SPC/E/R/P/00732 දරන ඇණවුමට අනුව මිල කැඳවීමේ නියමයන් හා කොන්දේසිවල 08 ඡේදය ප්‍රකාරව ඖෂධයේ ආයු කාලය මාස 24 විය යුතු වුවද තෝරාගත් ලංසුකරුගේ ආයුකාලය මාස 20ක් වී තිබුණි.

(උ) අංක 2022/SPC/E/R/P/00732 දරන ඇණවුමට අනුව ඖෂධ සැපයීමේදී ප්‍රමාද කාලය අවුරුදු 02 මාස 09 දින 12 අතර විය. ප්‍රමාද සැපයීම වෙනුවෙන් වූ සියයට 5 ක දඩ මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඇණවුම සඳහා වූ ප්‍රසම්පාදන කාලය මාස 06 ද ඉක්මවා තිබුණි.

(ඌ) අංක 2023/SPC/N/R/P/00029 දරන වටිනාකම රු.36,751,570 ක් වූ ඖෂධ ඒකක 600,000 ක් 2023 නොවැම්බර් 17 දින සැපයීම සඳහා ලංසු ප්‍රදානය කර තිබුණද 2023 දෙසැම්බර් 14 දිනට දත්ත පද්ධතිය තුළ එය ලැබිය යුතු ඇණවුමක් ලෙස තිබීම හේතුවෙන් නියමිත කාලය තුළ වෛද්‍ය සැපයීම් අංශයට තොග ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය.

49. තයිරොක්සින් පෙති මයික්‍රොග්‍රෑම් 25 (SR – 00701103)

(අ) 2019 වර්ෂයේ සිට 2023 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වෛද්‍ය සැපයීම් අංශය විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ප්‍රමාණය ඒකක 45,138,510 ක් වූ අතර, ලැබුණු සත්‍ය ප්‍රමාණය ඒකක 12,524,580 ක් විය. ඒ අනුව ඇස්තමේන්තු ප්‍රමාණය හා සත්‍ය ඇණවුම් ප්‍රමාණය අතර විචලනය සියයට 39 සිට සියයට 100 අතර පරාසයක විහිදී තිබුණි. ඒ බැවින් නිවැරදිව දත්ත මත ඇස්තමේන්තු සකස් නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) රෝහල් විසින් එවනු ලබන අධි ඇස්තමේන්තු කිසිදු පරීක්ෂාවකින් තොරව වෛද්‍ය සැපයීම් අංශය විසින් සිය ඇස්තමේන්තුවලට ගැනීම නිසා ඇස්තමේන්තු ඒකක ප්‍රමාණය අධි ගණනය වී තිබුණි.

(ඇ) වාර්ෂික අවශ්‍යතාවය නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් අංක 2020/SPC/A/R/P/00278 දරන ඇණවුම අනුව පෙති 13,000,000 ක් සඳහා වූ ඇණවුම ලංසු කරු වෙත ඉදිරිපත් කිරීමේදී ප්‍රමාණවත් තොග තිබීම හේතුවෙන් පෙති 5,000,000 ක් පමණක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

(ඈ) වෛද්‍ය සැපයීම් අංශයේ තොග මට්ටම ශූන්‍ය වීම පිළිබඳව අවධානය යොමු නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු නියමිත කාල රාමුවකට සිදු නොකිරීමත්, ඇණවුම් අවලංගු කිරීමත්, ඇණවුම් අත්හිටුවීමත් හේතුවෙන් ප්‍රමාණවත් තොග මට්ටම් පවත්වා ගැනීමට වෛද්‍ය සැපයීම් අංශයට නොහැකි වී තිබුණි.

(ඉ) ඇණවුම් අංක 2020/SPC/A/R/P/00278 ට අදාළ තොග 2021.01.31 දිනට ලැබිය යුතු වුවද, වෛද්‍ය සැපයීම් අංශය වෙත තොග 2021.06.16 දින හා 2021.06.29 යන දිනයන්හි ලැබීම හේතුවෙන් ප්‍රමාද කාලය මාස 05 ඉක්මවා තිබුණි.

(ඊ) ඉහත ඇණවුමට අනුව වෛද්‍ය සැපයීම් අංශයට L-68005 කාණ්ඩ අංක යටතේ ලැබුණු ඖෂධ ඒකක 4,941,500 ක් තත්වයෙන් අසමත් වීම දැනුම් දීමට වර්ෂයකට අධික කාලයක් ගත වී තිබුණු අතර ඒ සම්පූර්ණ ප්‍රමාණයම රෝහල් 55ක් වෙත නිකුත් කර තිබුණි. රෝහල් 19 ක ඉතිරි ඒකක ප්‍රමාණය 45,300 ක් වූ අතර ඒකක 4,896,200 ම රෝගීන් සඳහා නිකුත් කර තිබුණි.

(උ) වෛද්‍ය සැපයීම් අංශයේ හා රෝහල්වල ඖෂධ තොග නොමැති වීම හේතුවෙන් 2020/MSD/C/R/P/00046 ඇණවුමෙන් තයිරොක්සීන් ඖෂධ ඒකක 3,282,600 ක් මුලු වටිනාකම රු. 13,130,400 කට, ඒකක මිලියනයක් අතැති තොග වලින් සැපයීමටත් ඉතිරිය මාසයකින් සැපයීමටත් ලංසුව පිරිනමා තිබුණද ඖෂධ සැපයීමේ ප්‍රමාද කාලය මාස 02 සිට මාස 05 දක්වා අතර කාලයක් ගත වී තිබුණි.

(ඌ) වෛද්‍ය සැපයීම් අංශයේ හා ජාතික ඖෂධ තොග අවශ්‍යතාවය ශූන්‍ය බව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් නිරීක්ෂණය කිරීමෙන් පසු 2023/SPC/C/N/R/P/000084 ඇණවුම මගින් ඒකක 1,200,000 කඩිනමින් ඖෂධ ලබා ගැනීම සඳහා ලංසුව ප්‍රදානය කර තිබුණද 2023 දෙසැම්බර් වන විටත් තොග ලැබී නොතිබූ බව දත්ත පද්ධතිය තුළ දක්වා තිබුණි.

50. Hydrocortisone Tab. 10 mg (SR-00701502)

(අ) 2019 වර්ෂයේ සිට 2023 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වෛද්‍ය සැපයීම් අංශය විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ප්‍රමාණය ඒකක 8,734,735 වූ අතර, ලැබුණු සත්‍ය ප්‍රමාණය ඒකක 5,940,320 ක් විය. ඒ අනුව විචලනය ඉතා ඉහල අගයක් වූ අතර එය සියයට සෘණ (12) සිට සියයට 47 අතර පරාසයක විහිදී තිබුණි. ඒ අනුව නිවැරදිව දත්ත මත ඇස්තමේන්තු සකස් නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) අංක 2022/SPC/N/R/P/00039 ඇණවුම මගින් ඒකක 850,000 ක් ලබා ගැනීමට රු.6,791,500 කට ලංසු විවෘත කර තිබුණි. ලංසු විවෘත කළ දිනය සිට ප්‍රසම්පාදන කටයුතු සඳහා දින 295 ක කාලයක් ගත කර තිබුණි. ලංසු ඉදිරිපත් කිරීමට අදාළ ලංසු ප්‍රදානය තාවකාලිකව නතර කර නැවත ලංසුකරු වෙත ලංසුව ප්‍රදානය කර තිබුණ අතර ඖෂධ ලබා දීමේ දී ලංසුකරු විසින් මාස 06 ක ප්‍රමාද කාලයක් ගත කර තිබුණි.

(ඇ) අංක DHS/ICL/SA/381/22 දරන ඉන්ඩෙන්ටුව NMRA ලියාපදිංචි සහතිකය නොමැති සැපයුම්කරුවෙකු වෙත නිකුත් කර තිබූ අතර ඖෂධ සැපයීම නියමිත දිනට වඩා මාස 08 ක් ප්‍රමාද වී තිබුණි.

(ඈ) අංක 2022/SPC/V/R/P/00640 දරන ඇණවුම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව අවලංගු කිරීමකින් තොරව වෛද්‍ය සැපයීම් අංශයේ ඇණවුම් අංක 2022/MSD/V/R/P/00076 යටතේ නැවත ක්‍රියාත්මක කර තිබුණි. නමුත් මෙම ඇණවුම් දෙකම ස්වස්ථා පද්ධතිය තුළ ලැබිය යුතු ඇණවුම් ලෙස දක්වා තිබීම හේතුවෙන් පද්ධතිය යාවත්කාලීන වී නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) 2022 වර්ෂයේදී ඇණවුම් කරන ලද පිළිවෙලින් අංක 2022/MSD/V/R/P/00076, 2022/SPC/E/R/P/00569 හා 2023/SPC/N/R/P/00084 ට අදාළ ඇණවුම් ඒකක 1,455,000 ක් 2023 දෙසැම්බර් වනවිටත් ඖෂධ සැපයීම් අංශයට ලැබී නොතිබුණි.

51. Anti-Rabies Human lg 300 I.U (SR-00602501)

(අ) 2019 වර්ෂයේ සිට 2023 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වෛද්‍ය සැපයීම් අංශය විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ප්‍රමාණය ඒකක 27,112 ක් වූ අතර, ලැබුණු සත්‍ය ප්‍රමාණය ඒකක 10,550 ක් විය. ඒ අනුව විචලනය ඉතා ඉහල අගයක් වූ අතර එය සියයට සෘණ (07) සිට සියයට 77 අතර පරාසයක විහිදී තිබුණි. ඒ අනුව නිවැරදි දත්ත මත ඇස්තමේන්තු සකස් නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) DHS/TN/482/2022 දරන ඉන්ඩෙන්ටුව 2023.08.09 දින අවලංගු කිරීමට තීරණය කර තිබුණු අතර ඇණවුම අවලංගු කළ බවට සැපයුම්කරුට දැනුම් දුන් බවට වූ කිසිදු තොරතුරක් අදාළ ලිපිගොනුව තුළ නොවීය. දත්ත පද්ධතිය තුළ මෙම ඇමුණුම ලැබිය යුතු ලෙස දක්වා තිබුණි.

(ඇ) LP/DHS/EP/TN/3532/2022 අංක දරන ඉන්ඩෙන්ටුව යටතේ ඖෂධ එන්නත් කුප්පි 400 ක් හදිසි පදනම යටතේ මිලදී ගෙන තිබූ අතර, එම ඖෂධ තොගය 2022.09.30 දින සැපයිය යුතු වුවත්, 2022.12.22 දින සැපයීම නිසා ඇතිවූ දින 84 ක ප්‍රමාද කාලය සඳහා දඩ මුදල් අය නොකිරීමට තීරණය කර තිබුණි.

52. Salbutamol Respiratory 501 0.5% 15ml vial (SR-00500109)

(අ) 2019 වර්ෂයේ සිට 2023 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වෛද්‍ය සැපයීම් අංශය විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ප්‍රමාණය 2,177,591 හා ලැබුණු සත්‍ය ප්‍රමාණය ඒකක 713,000 අනුව විචලනය ඉතා ඉහල අගයක් වූ අතර එය සියයට 52 සිට සියයට

102 අතර පරාසයක විහිදී තිබුණි. ඒ අනුව නිවැරදිව දත්ත මත ඇස්තමේන්තු සකස් නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) අංක 2022/MSD/V/R/P/000103 දරන ඇණවුමට අනුව ඖෂධ ඒකක 60,000 ක් මිලදී ගැනීමට ICL/EOI/PI/124/2022 දරන ගැණුම් ඇණවුමට අනුව 2023 පෙබරවාරි වන විට ඖෂධ ලැබිය යුතුව තිබුණද 2023 දෙසැම්බර් වන විටත් මෙම ඖෂධ තොගය සැපයුම් අංශය වෙත ලැබී නොතිබුණි.

(ඇ) 2023 වර්ෂයේ වාර්ෂික අවශ්‍යතාවය ලෙස ඖෂධ ඒකක 120,000 ක් අංක 2023/SPC/N/R/P/00098 දරන ඇණවුමට අනුව පිළිවෙලින් 2023 ජනවාරි හා අප්‍රේල් ඒකක 60,000 බැගින් සැපයිය යුතු බව දක්වා තිබුණි.නමුත් මෙම ඖෂධ ලැබුණු බවට වූ තහවුරුවක් විගණනය වෙත ලැබී නොතිබුණි.

53. Mesna Injection 200 mg in 2 ml (SR - 01210101)

(අ) මෙම ඖෂධයෙන් ඒකක 23,000 ක් මිලදී ගැනීමට අදාළ 2022 සාමාන්‍ය ඇණවුම දත්ත පද්ධතිය හරහා 2021 පෙබරවාරි 27 දින නිකුත්කර තිබුණු අතර එය 2021 මාර්තු 18 දින ලැබී තිබුණි. ජාත්‍යන්තර තරඟකාරී ක්‍රමයට ලංසු කැඳවීමට අනුව එක් ආයතනයක් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. එම ලංසු ලියවිලිවලට අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය 2025 ජුනි 21 තෙක් වලංගුව ඇති බවත් සඳහන් කර තිබුණද ඉදිරිපත් කර තිබුණු ලියාපදිංචි සහතිකය 2021 ජූනි 30 තෙක් පමණක් වලංගුව පැවතුණි. තාක්ෂණික ඇගයීම් වාර්තාවේ අදාළ සාමාජිකයන්ගේ නම්, තනතුරු සඳහන් නොකර අත්සන් කර තිබුණි. විධිමත් හා නිවැරදි දත්ත මත පදනම්ව ඖෂධ ඇණවුම් නොකිරීම මත 2021 පෙබරවාරි 27 දින ලද ඇණවුම තාවකාලිකව අත්හිටුවීමට වෛද්‍ය සැපයීම් අංශය මාස 07 ක් ගත කර තිබුණු බවත්, එය නැවත සක්‍රීය කිරීමට තවත් මාස 07 කට වඩා වැඩි කාලයක් ගත කර ඇති බවත්, එදින සිට ඇණවුම සැපයුම්කරු වෙත පිරිනැමීමට තවත් මාස 03 ක් ගත කර ඇති බවත්, ඖෂධ ලැබීම සඳහා තවත් මාස 03 ක් හා 06 ක් ගත වී ඇති බවත් ඒ අනුව මෙම ක්‍රියාවලිය සඳහා මාස 23 ගත වී ඇති බැව් නිරීක්ෂණය විය. එසේම මෙම ඖෂධ තොගය ලද පසු එනම් 2023 ඔක්තෝබර් 18 දින ගිවිසුම අත්සන් කර තිබුණි.

(ආ) ඒකක 15,000 ක් මිලට ගැනීමට අදාළ 2023 වර්ෂයේ සාමාන්‍ය ඇණවුම මාස 10 ක් ප්‍රමාදයකින් පසුව 2022 නොවැම්බර් 16 දින ලබාදී තිබුණි. මෙම ඇණවුමට අනුව 2023 ජනවාරි 12 දින හා 2023 අප්‍රේල් 12 දින එන්නත් ඒකක 7,500 ක් බැගින් සැපයිය යුතුව තිබුණි. ඇණවුම නිකුත් කිරීමෙන් පසු ලංසු කැඳවීම සඳහා මාස 03 ක් ගත කර තිබුණි. ලංසු විවෘත කර ඇගයීම සඳහා මාසයකට ආසන්න කාලයක් ගත කර තිබුණු අතර 2023 අප්‍රේල් 18 දිනැති ලංසු ඇගයීම් වාර්තාවේ අදාළ සාමාජිකයන්ගේ නම් හා තනතුරු සඳහන් නොකර අත්සන් කර තිබුණි. මෙම තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබාදීමෙන් මාස 03 කට පසුව ඉදිරිපත් කරන ලද ලංසු අතරින් අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි ආයතනයක් නොවන බැවින් එම ලියාපදිංචිය සහිත දෙවන අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතනය වෙත ඒකකයක් රු.600 බැගින් මෙම ඇණවුම ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණි.

(ඇ) 2023 අගෝස්තු 14 දින මෙම ඇණවුම යථෝක්ත ආයතනය වෙත පිරිනමා තිබුණු අතර ඒකක 7,500 ක් ඇණවුමේ සිට දින 90 ක් තුළද, ඉතිරි 7,500 ක තොගය පළමු තොගයෙන් මාස 03 කට පසුද සැපයිය යුතු බව දක්වා තිබුණි. සැපයුම්කරු විසින් දක්වා ඇති උෂ්ණත්ව අගය සෙල්සියස් අංශක 25 ට අඩු වුවද, වෛද්‍ය සැපයීම් අංශයට අනුව අවශ්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 30 ක් බැවින් ඒ සඳහා තහවුරුවක් ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි. 2023 අගෝස්තු 20 දිනැති විද්‍යුත් ලිපියට අනුව මෙම අයිතමය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ යථෝක්ත ගබඩා තත්ත්වය යටතේ ලියාපදිංචි වී ඇත්නම් සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් හා ප්‍රසම්පාදන කමිටුව විසින් පිරිනමා ඇත්නම් එය වෛද්‍ය සැපයීම් අංශයට අනුව සාධාරණීය බව දක්වා තිබුණි. ගබඩා තත්ත්වය සෙල්සියස් අංශක 25 ට අඩුවෙන් පැවතිය යුතු බවත්, ආයු කාලය මාස 24 ක් ලෙස පැවතිය යුතු බවත් දක්වා තිබුණි. නැවතත් 2023 ඔක්තෝබර් 12 දින ඉන්ඩෙන්ටුවක් නිකුත් කර තිබුණු අතර ගබඩා තත්ත්වය සෙල්සියස් අංශක 30 ට අඩුවෙන් තිබිය යුතු බවත් ආයු කාලය මාස 21 ක් ලෙස පැවතිය යුතු බවත් දක්වා තිබුණි. 2023 ඔක්තෝබර් 10 දින ඒකක 7,500 ක් ලැබී තිබුණු අතර එම තොගය නියමිත පිරිවිතරයන්ගෙන් බැහැරව භාරගෙන ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) අංක 2023/SPC/X/C/P/00192 දරන ඒකක 25,000 ක් මිලට ගැනීම සඳහා ඇස්තමේන්තුගත වටිනාකම රු.13,020,750 ක් වූ ඇණවුම 2023 මැයි 25 දින නිකුත් කර තිබුණි. මෙම ඇණවුමට අනුව පිළිවෙලින් එන්නත් ඒකක 13,000 ක් හා ඒකක 12,000 ක් බැගින් සැපයිය යුතුව තිබුණි. ආයතන 03 ක් විසින් ලංසු ඉදිරිපත් කර තිබුණි. මෙම ලංසු ලියවිලි තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක්කර තිබුණු අතර උපරිම මිල ඉදිරිපත් කරන ලද එකම ලියාපදිංචි සැපයුම්කරුවෙත මිල කේවල් කිරීමක් සිදුකර ඇණවුම ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණු අතර ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම ප්‍රසම්පාදනය ඒකකයක මිල රු.550 ක් ලෙස ඉහත සැපයුම්කරුට පිරිනැමීමට නිර්දේශ කර තිබුණි. මෙම ප්‍රසම්පාදන තීරණය සඳහා අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත් බවට හෝ මෙම ප්‍රසම්පාදනය නියමිත පරිදි සිදුකළ බවට ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් සහතික කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.ප්‍රසම්පාදන ඇගයීම් කටයුතු වලින් පසු ඇණවුම ප්‍රදානය කිරීම සඳහා දින 68 කට ආසන්න කාලයක් ගත කර තිබුණි. මෙම ඖෂධයට අදාළ, සැපයුම් කොන්දේසි අනුව ඖෂධයේ ආයුකාලය මාස 24 ක් බව සඳහන් කර තිබුණද ඉන්ඩෙන්ටුවේ අවම ආයුකාලය ලෙස මාස 12 ක් (සහතික කිරීමක් සමග-with assurance) ලෙස දක්වා තිබීම විගණනයේදී ගැටළු සහගත විය.

(ඉ) මහරගම අපේක්ෂා රෝහල විසින් 2022 වර්ෂයේ හා 2023 වර්ෂයේ ඔක්තෝබර් දක්වා අවස්ථා 15 කදී මෙම ඖෂධයේ ඒකක 27,600 ක් වෛද්‍ය සැපයීම් අංශය වෙතින් ඉල්ලීම් කර තිබුණු ද ඒකක 23,106 ක් පමණක් ලැබී තිබුණි.

(ඊ) 2024 වර්ෂයට අදාළව වෛද්‍ය සැපයීම් අංශය විසින් පිළියෙල කරන ලද ඇණවුම් පාලන පත්‍රිකාව අනුව 2024 වර්ෂය වෙනුවෙන් ඒකක 13,129 ක අතිරික්ත තොගයක් පැවතීම හේතුවෙන් 2024 සඳහා ඇණවුමක් පිළියෙල කර නොතිබුණි. කෙසේ වෙතත් මෙම ඇණවුම් පාලන පත්‍රිකාව සකස් කිරීම සඳහා යොදාගත් දත්තවල නිවැරදිතාවය පිළිබඳව ගැටළුකාරී තත්ත්වයක් පවතින බැවින් 2024 වර්ෂයේදීද හදිසි මිලදී ගැනීම් සඳහා යොමු වීමට සිදුවීමේ අවධානමක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

54. Epoetin injection 10,000 IU (SR N0. 00404004)

(අ) 2021 වර්ෂය සඳහා වාර්ෂික අවශ්‍යතාවය ඒකක 45,987 ක් වුවද, ඒකක 50,000 ක ලැබිය යුතු ඇණවුම් හා ඒකක 39,558 ක අතැති තොගය ප්‍රමාණවත් වීම මත 2021 වර්ෂය සඳහා මෙම ඖෂධය ඇණවුම් කර නොතිබුණි. කෙසේ වුවත්, ලැබිය යුතු ඇණවුම් ඒකක අතුරින් ඒකක 12,500 ක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව ලැබිය යුතු ඇණවුම් වෙනුවෙන් තොග ලැබීමේ හැකියාව හෝ එම ඇණවුම්වල ප්‍රගතිය නොසලකා අවිනිශ්චිත දත්ත මත පදනම්ව වාර්ෂික ඇණවුම් තක්සේරු කර තිබුණි.

(ආ) මෙම ඖෂධයේ 2022 වාර්ෂික ඇස්තමේන්තුව ඒකක 60,311 ක් වුවත්, වර්ෂය තුළ ඒකක 85,000ක ඇණවුම් නිකුත් කර තිබුණි. මින් ඒකක 36,000ක් සාමාන්‍ය ඇණවුම් යටතේද ඒකක 24,000 ක් ‘‘හදිසි අවශ්‍යතා’’ යටතේද තවත් ඒකක 25,000ක් ඉන්දීය ණය පහසුකම් යටතේද ඇණවුම් කර තිබුණි. 2022 සාමාන්‍ය ඇණවුමෙන් ඒකක 3,600 ක් පමණක් ලැබී තිබුණු බැවින් හදිසි මිලදී ගැනීම් හා වෙනත් ණය පහසුකම් යටතේ මිලදී ගැනීමට වෛද්‍ය සැපයීම් අංශය කටයුතු කර තිබුණි.

(ඇ) 2023 වර්ෂය වෙනුවෙන් වෛද්‍ය සැපයීම් අංශය විසින් ඇණවුම් පාලන පත්‍රිකාවක් සකස් කර නොතිබුණු අතර, රෝහල්වල වාර්ෂික අවශ්‍යතාවය පමණක් ලබාගෙන තිබුණි. කෙසේ වුවත් 2022 නොවැම්බර් 24 දින ඒකක 24,000 ක සාමාන්‍ය ඇණවුමක් නිකුත්කර තිබුණු අතර, ඒ සඳහා පාදක කරගත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) ඒකක 12,000ක් මිලදි ගැනීම සඳහා 2022 සැප්තැම්බර් 24 දින අංක 2022/SPC/V/C/P /00633 දරන ඇණවුම නිකුත් කර තිබුණු අතර 2022 නොවැම්බර් 01 දින ඒ වෙනුවට අංක 2022/MSD/V/C/P/00091 දරන ඇණවුම නිකුත් කර තිබුණි. නමුත් මෙම ඇණවුම් දෙකම ස්වස්ථ පද්ධතිය තුළ නිකුත් කළ ඇණවුම් ලෙස විගණිත අවස්ථාව වන විටත් පැවතුණි.

(ඉ) 2022 වර්ෂය වෙනුවෙන් 2021 වර්ෂයේදී ලබාදෙන ලද ඒකක 36,000 ක සාමාන්‍ය ඇණවුම වෙනුවෙන් ඒකක 19,200 ක් පමණක් ලැබී තිබුණු අතර, ඉතිරි ඒකක 16,800 ක ප්‍රමාණය 2023 විගණිත දින වන විටත් වෛද්‍ය සැපයීම් අංශයට ලැබී නොතිබුණි.

(ඊ) ඇණවුම් ලබා නොදීම හේතුවෙන් හා ප්‍රමාණවත් අතැති තොග නොමැතිවීම හේතුවෙන් පිළිවෙලින් 2022 සැප්තැම්බර් 07, නොවැම්බර් 01 හා නොවැම්බර් 02 දින එකතුව ඒකක 49,000 ක හදිසි මිලදී ගැනීම් වෙනුවෙන් ඇණවුම් නිකුත්කර තිබුණි. මින් ඒකක 22,000 ක් පමණක් 2023 මාර්තු 31 වනවිට වෛද්‍ය සැපයීම් අංශයට ලැබී තිබුණු අතර, ඉන්දීය ණය ආධාර ක්‍රමය යටතේ ඇණවුම් කළ ඒකක 25,000 ක් ඇතුළු ඒකක 27,000 ක හදිසි කැඳවීම් අනුව ඇණවුම් කළ ඖෂධ තොග විගණිත දිනය වූ 2023 ඔක්තෝබර් වන විටත් වෛද්‍ය සැපයීම් අංශයට ලැබී නොතිබුණි.

(උ) ඒ අනුව සාමාන්‍ය ඇණවුමෙහි තොග සැපයිය යුතු දිනයන් අවිධිමත් හා නිශ්චිත නොවූ දත්ත මත පදනම්ව වරින්වර වෙනස්කිරීම, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් WOR නිකුත්කිරීම ප්‍රමාද කිරීම හා වෛද්‍ය සැපයීම් අංශය විසින් පවතින තොග මට්ටම් පිළිබඳ නිවැරදි තොරතුරු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබානොදීම යනාදී

කරුණු මත මෙම හදිසි මිලදී ගැනීම් සඳහා ඇණවුම් නිකුත්කර ඇති බවත් මේ සම්බන්ධයෙන් අදාළ වගකිව යුතු නිළධාරීන් වගකීමට බැඳෙන බවත් විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(උ) අවම වශයෙන් මාස 11 කට පෙරවත් වාර්ෂික සාමාන්‍ය ඇණවුම ලබාදිය යුතු වුවත්, 2023 වර්ෂය සඳහා ඒකක 24,000 ක ඇණවුම් 2022 නොවැම්බර් 24 දින ලබාදී තිබුණි. මෙම ඖෂධ අවම වශයෙන් 2023 අප්‍රේල් වන විටවත් ලබා ගැනීමට අපේක්ෂා කර තිබුණි. ප්‍රසම්පාදන කාල රාමුව අනුව ඇණවුම ලැබී සති 03ක් ඇතුළත ලංසු කැඳවිය යුතු වුවත්, ඇණවුම ලැබී මාස 04 කට පසුව එනම් 2023 මාර්තු 13 දින ලියාපදිංචි හා පසුගිය සැපයුම්කරුවන්ගෙන් මිල කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. කෙසේ වුවත් අදාළ ලංසු කැඳවීම සිදු කර නොතිබුණු අතර , විගණිත දින දක්වා මෙම ඇණවුම අවලංගු කිරීමට ක්‍රියාකර නොතිබුණි.

(එ) ඒකක 36,000 ක 2022 සාමාන්‍ය ඇණවුම 2021 පෙබරවාරි 27 දින ඉදිරිපත් කර තිබුණි. ඇණවුම ලැබී දින 53 කට පසුව ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය යටතේ ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර තිබුණි. මෙම අනුමැතියෙන් දින 24 කට පසුව ලංසු කැඳවීමට අදාළ පුවත්පත් දැන්වීම් පළ කර තිබුණි. මේ අනුව පිළිවෙලින් 2021 සැප්තැම්බර් 21 හා සැප්තැම්බර් 23 යන දිනයන්හි ඉන්ඩෙන්ටු දෙකක් නිකුත් කර තිබුණි. ඇණවුමෙන් සියයට 70 ක් එනම් ඒකක 25,200 ක් සපයන ලංසුකරු වෙත පෙර නිකුත් කළ ඇණවුමෙහි වැරදි ලිපිනයක් සඳහන් කිරීම මත 2021 ඔක්තෝබර් 11 දින නැවත ඇණවුමක් නිකුත් කර තිබුණි. ලංසු ලියවිලිවල නිවැරදි ලිපිනය සඳහන් කර තිබුණද, මෙලෙස වැරදි ලිපිනයකට ගැණුම් ඇණවුම නිකුත් කිරීම සම්බන්ධයෙන් කරුණු විමසීම් ඊට අදාළ නිළධාරීන්ගෙන් සිදු කර නොතිබුණි.

(ඒ) යථෝක්ත ඇණවුමෙන් සියයට 70 ක් සපයන සැපයුම්කරු පමණක් ඒකක 16,800 ක් තවදුරටත් සැපයිය යුතු වුවත්, සැපයුම්කරු විසින් ඉදිරිපත් කළ කාර්යසාධන බැඳුම්කරයෙහි කාලය 2023 පෙබරවාරි 28 දිනෙන් අවසන් වී තිබුණි. වගකිව යුතු නිලධාරින් විසින් රු.2,948,400 ක් වූ මෙම කාර්යසාධන බැඳුම්කරයේ කාලය අවසන් වීමට පෙර දීර්ඝ කරවා ගැනීමට හෝ එය පවරා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඔ) අංක 2022/SPC/N/C/P/00021 දරන සාමාන්‍ය ඇණවුමට අදාළව ඒකක 25,200 ක් සැපයීම සඳහා තෝරාගත් ලංසුකරු ඉන්ඩෙන්ටුවේ සඳහන් දිනට ඖෂධ තොග සපයා නොතිබුණුද රුපියලේ අගය අවප්‍රමාණය වීම මත මිල සංශෝධනයක් ඉල්ලා තිබුණි.ඒ අනුව ඒකකයක් රු.1,170 ක් වෙනුවට අවස්ථා දෙකකදී පිළිවෙලින් ඒකකයක් රු.2,142 ක හා රු.2,154ක මිල වැඩිවීමක් ඉල්ලා තිබුණි. ප්‍රසම්පාදන කමිටුව මෙම සියයට 81 ක මිල විවලනය සඳහා ලංසු ඉදිරිපත් කරන දිනට පැවති එ.ජ. ඩොලරයේ අගය සහ මිල සංශෝධනය ඉල්ලුම් කරන දිනට පැවති එ.ජ. ඩොලරයේ අගය පදනම් කරගෙන තිබුණි. ඒ වනවිටත් සැපයුම්කරු ඖෂධ තොග සපයා නොතිබුණු බැවින් සැපයුම්කරුට දැරිමට සිදුවූ සත්‍ය වියදම ඉන් තහවුරු නොවුන අතර, සැපයුම්කරුට දැරිමට සිදුවූ සත්‍ය වියදම තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ලබාගෙන මිල වැඩිවීම ලබාදිය යුතු වුවත් මෙහිදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. මිල සංශෝධනය අනුමැතියෙන් දින 93 කට පසු ඒකක 8,400 ක් ඒකකයක් රු.2,000 බැගින් සපයා තිබුණි.

(ඕ) අංක 2022/SPC/X/C/P/00575 දරන ඒකක 25,000 ක ඇණවුම හදිසි පදනම මත මිලදි ගැනීමට යොමුකර තිබුණි. අවම මිල ඉදිරිපත් කළ එක් ලංසුකරුවෙකුට තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා මිල ඇගයීම් පදනම් කරගෙන ඒකකයක් එ.ජ.ඩොලර් 5.75 යටතේ ඒකක 25,000 න් වහාම සපයන ලෙස ප්‍රසම්පාදන කමිටුව නිර්දේශය කර තිබුණි. හදිසි පදනම මත ලංසු කැඳවීමට තීරණය කර වහාම සැපයිය යුතු බවට සඳහන් කර ලංසු කැඳවා තිබුණද, 2023 ඔක්තෝබර් 26 දින වනවිටත් ඖෂධ තොග සපයා නොතිබුණු බැවින් ''හදිසි'' පදනම යන්න ලංසුකරුවන්ගෙන් ලංසු කැඳවීමට පමණක් සීමා වී තිබීම විගණනයේදි ගැටලු සහගත විය. ප්‍රමුඛතා ගණයට අයත් නොවන බැවින් මෙම ඇණවුම අවලංගු කිරීමට තීරණය කර තිබුණද රාජ්‍ය ඖෂධ නිතීගත සංස්ථාව විසින් ඉන්දීය ණය පහසුකම් යටතේ අනුමත හා දැනට ක්‍රියාත්මක වන ඇණවුමක් වන බැවින් අවලංගු කළ නොහැකි බව දන්වා තිබුණි.ඇණවුම නිකුත් කර වසරකට වැඩි කාලයක් ගත වී තිබුණද යාවත්කාලීනව ඇණවුම ක්‍රියාත්මක නොකිරීම මත මෙම ඇණවුමට අදාළ තොග නොලැබීමටද, ඇණවුම අවලංගු වීමට ප්‍රවණතාවයක් පවතින බවද විගණනයේදී නිරීක්ෂණය විය.

(ක) අංක 2022/MSD/V/C/P/0633 දරන ඒකක 12,000 ක ගැනුම් ඇණවුම 2022 නොවැම්බර් 04 දින නිකුත් කර තිබුණි. ගැණුම් ඇණවුම අනුව 2022 දෙසැම්බර් 26 දින හා තෝරාගත් ලංසුකරු විසින් ලංසුවේ ප්‍රකාශයට පත් කළ පරිදි දින 50 ක් තුළ තොග සැපයිය යුතු බවට සඳහන් කර තිබුණද තොග සැපයීම දින 94 කට පසුව 2023 මාර්තු 30 දින සිදුකර තිබුණි. ඒකක 2,000 ක් 2023 ඔක්තෝබර් 09 දින වනවිටත් සපයා නොතිබුණි. ලංසු ලේඛනවල කාර්යසාධන බැඳුම්කර ලබා ගැනීම සම්බන්ධව වගන්තියක් සඳහන් කර නොතිබුණු අතර 2022 ඔක්තෝබර් 28 දින සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සැපයීම් අංශය) වෙත යොමුකළ ලිපිය අනුව කාර්යසාධන බැඳුම්කරයේ කාලසීමාව සහ ප්‍රමාණය, බෙදාහැරීම් කාලසටහනට අනුව සහ හදිසි අවස්ථා අවශ්‍යතාවයට අනුව තීරණය කළ යුතු බව දන්වා තිබුණද , ඇපකරය ලබා නොගත යුතු බව එහි සඳහන් කර නොතිබුණි. නමුත් පසුව අමාත්‍යාංශ ලේකම් විසින් තම අධිකාරි සීමාව අභිබවා යමින් කාර්යසාධන බැඳුම්කර ලබා ගැනීමෙන් හා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වීමෙන් නිදහස් කර තිබුණි.

55. Imatinib Mesilate Tab/Cap 100 mg (SR - 01204401)

(අ) 2021 වර්ෂය සඳහා රෝහල්වල වාර්ෂික ඇස්තමේන්තුව ඒකක 835,000 ක් වූ අතර, වර්ෂය තුළ නිකුත් කළ ඒකක ප්‍රමාණය 1,613,875 ක් විය. එම ප්‍රමාණය ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 93 ක වැඩිවීමක් විය. නිකුත්කළ ඇණවුම් අතුරින් ඒකක 1,562,500 ක සාමාන්‍ය ඇණවුමට අදාළ ඖෂධ තොග 2023 නොවැම්බර් 15 දින වනවිටත් වෛද්‍ය සැපයීම් අංශයට ලැබී නොතිබුණි.

(ආ) 2022 වර්ෂය සඳහා රෝහල්වල වාර්ෂික ඇස්තමේන්තුව ඒකක 582,080 ක් වූ අතර, වර්ෂය තුළ නිකුත් කළ ඇණවුම් ඒකක ප්‍රමාණය 1,325,000 ක් විය. එම ප්‍රමාණය ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 128 ක වැඩිවීමක් විය. නිකුත්කළ ඇණවුම් අතුරින් ප්‍රදාන ලෙස ලැබූ ඒකක 30,000 පමණක් වර්ෂය තුළ වෛද්‍ය සැපයීම් අංශයට ලැබී තිබුණි.

(ඇ) ස්වස්ථ පද්ධතිය තුළ අංක 2022/SPC/E/R/P/00610, අංක 2022/SPC/V/R/P/00690, හා අංක 2023/SPC/E/R/P/00143 දරන ඇණවුම් මඟින් පිළිවෙලින් ඒකක 140,000, 137,500 ක් හා ඒකක 137,500 බැඟින් ඇණවුම් පෙන්නුම් කළද මෙම ඖෂධ තොග ලැබිය යුතු තොග ලෙස ස්වස්ථ පද්ධතිය තුළ පෙන්නුම් නොකෙරුණි.

(ඈ) පිළියෙල කරන ලද ඇණවුම් පාලන පත්‍රිකාව මත පදනම්ව 2022 සාමාන්‍ය ඇණවුම නිකුත් නොකිරීමට තීරණය කර තිබුණි. කෙසේ වුවත්, වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලැබූ ඒකක 30,000 ඇතුළුව ඒකක 1,325,000 ක ඉන්දීය ණය ආධාර හා හදිසි මිලදී ගැනීම් වශයෙන් ඇණවුම් නිකුත් කර තිබුණි. 2021 වර්ෂය වෙනුවෙන් 2020 ජනවාරි 08 දින නිකුත් කරන ලද ඒකක 1,562,500ක ඇණවුමට අදාළ ඖෂධ තොග ලැබිය යුතු පදනම මත සලකා 2022 සඳහා සාමාන්‍ය ඇණවුමක් නිකුත් කර නොතිබුණද ලැබීමට පැවති බැව් සඳහන් ඖෂධ තොගය විගණිත දිනය වූ 2023 නොවැම්බර් 15 වන විටත් වෛද්‍ය සැපයීම් අංශයට ලැබී නොතිබුණි.

(ඉ) අංක 2022/SPC/X/R/P/00306 දරන ඒකක 600,000 ක 2022 වර්ෂය සඳහා හදිසි පදනම මත ඇණවුම නිකුත්කර තිබුණි. ලංසුකරුවන් 07 දෙනෙකු ලංසු ඉදිරිපත් කර තිබුණු අතර, මින් සුදුසුකම් සහිත ලංසුකරුවන් දෙදෙනාගෙන් අවම මිල ඉදිරිපත් කරන ලද ලංසුකරුට ප්‍රසම්පාදනය පිරිනැමීමට තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා එම නිර්දේශයෙන් දින 167 කට පසුව 2022 ඔක්තෝබර් 06 දින ලබාදී තිබුණු ප්‍රසම්පාදන කමිටු නිර්දේශය අනුව තීරණය කර තිබුණි. ගැණුම් ඇණවුම නිකුත් කර දින 14 ක් ඇතුළත කාර්යසාධන බැඳුම්කරය ඉදිරිපත් කළ යුතු වුවත් දින 96 කට පසුව එය ඉදිරිපත් කර තිබුණි. ගැණුම් ඇණවුමෙහි සඳහන් ඖෂධ තොග සැපයිය යුතු දිනය පසුවී දින 97 කට පසු 2023 අප්‍රේල් 07 දින ඇණවුම සපයා තිබුණු අතර, ඒ වනවිට ඖෂධ තොගයෙහි ඉතිරි සක්‍රීය ජීව කාලය මාස 18 ත් මාස 19 ත් අතර කාල පරාසයක විය. 2022 මාර්තු 26 දින ඇණවුම හදිසි පදනම මත නිකුත්කර වර්ෂයකට වැඩි කාලයකින් ඖෂධ තොග සැපයීම ප්‍රමාද කර තිබුණු අතර ඒ අනුව හදිසි පදනම යන්න " ලංසු ඉදිරිපත් කිරීමට දින 05 ක පමණ කාලයක් ලබාදීම" යන්නට පමණක් වලංගු වන්නේද යන්න විගණනයේදි ගැටලු සහගත විය.

(ඊ) අංක 2022/MSD/V/R/P/00074 දරන ඒකක 137,500 ක ඇණවුම, ඒකකයක් එ.ජ.ඩොලර් 0.0044 කට ඒකක 137,500 ක් සැපයීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි ලියාපදිංචි සහතිකය සහිත සැපයුම්කරුවෙකු තෝරාගෙන තිබුණි. ගැණුම් ඇණවුම අනුව ඒකක 6,000 ක් හා ඒකක 131,500 ක් සැපයිය යුතු බවත් ,තෝරාගත් ලංසුකරු තම ලංසු ලියවිලිවල ඒකක 6,000 ක් වහාම සහ ඉතිරිය දින 30 ක් තුළ තොග සපයන බවත් සඳහන් කර තිබුණද විගණිත දිනය වූ 2023 ඔක්තෝබර් මාසය වනවිටත් වෛද්‍ය සැපයීම් අංශයට අදාළ ඖෂධ තොග සැපයුම් කර නොතිබුණි.

(උ) 2022 ජුනි 16 දින මුදල් අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය (HSEPP) වෙනුවෙන් හඳුන්වා දී තිබුණු උපදෙස් (Guideline) ප්‍රකාරව අංක 2022/SPC/E/R/P/00730 දරන ඒකක 140,000 ක් මිලට ගැනීම සඳහා වූ ඇණවුම නිකුත් කර තිබුණි. පවතින හදිසි අවශ්‍යතාවය මත ලියාපදිංචිය නිදහස් කිරීමේ බලපත්‍රයක් යටතේ (WOR) ඒකකයක් සඳහා රු 59.66 ක අවම ප්‍රතිචාර දක්වන ලද ලංසුකරුට ප්‍රසම්පාදනය පිරිනැමීමට, සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර තිබුණද ඊට අදාළ අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලිපි ගොණුවේ නොතිබුණි. ඒකක 139,980 ක් සපයන ලෙස දක්වා තිබුණු අතර ලංසු ලියවිලිවල

ඖෂධ තොග ''වහාම'' සැපයිය ලෙසට දක්වා තිබුණු අතර WOR නිකුත් කිරීමෙන් පසු ඖෂධ තොග සපයන බවට තෝරාගත් ලංසුකරුගේ ලංසු ලියවිලිවල දක්වා තිබුණි. තවද, ගැණුම් ඇණවුම නිකුත් කරන ලද අවස්ථාව වනවිටත් වෛද්‍ය සැපයීම් අංශය සතුව ඖෂධ තොග නොතිබුණු අතර තොග '' වහාම'' සපයන ලෙස ඇණවුම නිකුත් නොකිරීමද විගණනයේදි ගැටලු සහගත විය. WOR බලපත්‍රය සඳහා ඉල්ලීම රාජ්‍ය ඖෂධ නිතීගත සංස්ථාව විසින් 2023 ජනවාරි 23 දින ජාතික ඖෂධ නියාමන අධිකාරියට යොමුකර තිබුණු අතර දින 24 කට පසුව 2023 පෙබරවාරි 16 දින මෙම අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව WOR සහතිකය නිකුත් කිරීම ප්‍රමාද වීම මත ගැණුම් ඇණවුමෙහි සඳහන් ආකාරයට 2023 පෙබරවාරි 28 දින ඖෂධ තොග සැපයීමට කටයුතු කර නොතිබුණු අතර, WOR සහතිකය නිකුත් කර දින 16 කට පසුව ඇණවුම වෛද්‍ය සැපයීම් අංශයට ලබා දී තිබුණි.

(ඌ) අංක 2022/SPC/E/R/P/00744 දරන ඒකක 140,000 ක ඇණවුම නිකුත් කර දින 07කට පසු ලියාපදිංචි හා සැපයුම්කරුවන්ගෙන් සීමිත මිල ගණන් යටතේ ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව නිර්දේශය ලබාදී තිබුණි. අවම ප්‍රතිචාර දක්වන ලද ලංසුකරුට ලංසුව පිරිනැමීමට තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලබාදී තිබුණි. ගැණුම් ඇණවුම නිකුත් කරන ලද අවස්ථාව වනවිටත් වෛද්‍ය සැපයීම් අංශය සතුව තොග නොතිබුණු අතර ජාතික තොග තත්ත්වය පද්ධතිය අනුව මාස 0.01 සීමා වී තිබුණි. ඒ අනුව ලංසු ලියවිලි ප්‍රකාරව ඖෂධ තොග '' වහාම'' සපයන ලෙස දැක්වීම වෙනුවට 2023 මාර්තු 31 දින සපයන ලෙස සඳහන් කරමින් ගැණුම් ඇණවුමට නිකුත් කර තිබුණි.

(එ) සකස් කරන ලද ඇණවුම් පාලන පත්‍රිකාවට අනුව මෙම ඖෂධය සඳහා 2023 වර්ෂය වෙනුවෙන් සාමාන්‍ය ඇණවුම නිකුත් නොකිරීමට වෛද්‍ය සැපයීම් අංශය විසින් තීරණය කර තිබුණද. මාස 10 කට පමණ පසුව ඒකක 275,000 ක සාමාන්‍ය ඇණවුමක් හා ඒකක 137,500 ක හදිසි මිලදී ගැනීම් ඇණවුමක් වශයෙන් ඇණවුම් දෙකක් නිකුත් කර තිබුණි. ඒ අනුව නිකුත් කළ ඇණවුම් සඳහා පාදක කරගත් තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේදි ගැටළු සහගත විය.

(ඒ) අවම වශයෙන් මාස 11 කට පෙර සාමාන්‍ය ඇණවුම නිකුත් කළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාළ ඒකක 275,000 ක සාමාන්‍ය ඇණවුම 2022 නොවැම්බර් 16 දින නිකුත් කර තිබුණි. සාමාන්‍ය ඇණවුමක් නියමිත දිනයේදි ලබාදුන්නේ නම් විවෘත මිල කැඳවීමක් යටතේ ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කිරීමට හැකියාව තිබුණද පවතින හදිසි තත්ත්වය තුළ දින 07ක් ඇතුළත සීමිත මිල ගණන් යටතේ ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටු නිර්දේශ කර තිබුණද මෙම අනුමැතියෙන් දින 75 කට පසුව ලංසුකරුවන්ට ප්‍රතිචාර දැක්වීමට සාධාරණ කාලයක් ලබා නොදී ලංසු කැඳවා තිබුණි. 2023 ජූලි 07 දින වනවිට අතැති තොගය මාස 09 කට ප්‍රමාණවත් බැවින් 2024 මැයි 15 දින ඖෂධ තොග සපයන ලෙස දක්වමින් , ලංසු ප්‍රදානය කර දින 131 කට පසු ගැණුම් ඇණවුම 2023 ජූලි 17 දින නිකුත් කර තිබුණි. 2022 ජනවාරි මස පිළියෙල කරන ලද ඇණවුම් පාලන පත්‍රිකාවට අනුව 2023 වර්ෂය සඳහා ඇණවුමක් නිකුත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව තීරණය කර තිබියදි නැවත ඇණවුම් පාලන පත්‍රිකාවක් පිලියෙළ නොකර ඇණවුමක් නිකුත් කිරීම විගණනයේදි ගැටලු සහගත විය. විගණිත දිනය වූ 2023 නොවැම්බර් 06 වන විටත් සැපයුම්කරු කාර්යසාධන බැඳුම්කරය ලබා දී නොතිබුණු අතර සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමක් ඇතිකර ගෙනද නොතිබුණි. තවද,

ගැණුම් ඇණවුමෙහි සඳහන් දිනට ඖෂධ තොග සපයන බවට සහතිකයක් මෙම සැපයුම්කරුගෙන් ලබාගෙන නොතිබුණි.

(ඔ) 2022 ජුනි 16 දිනැති අංක PFD/PMD/Health/ HSEPP/01/2022 දරන මුදල් අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය (HSEPP) වෙනුවෙන් හදුන්වා දී තිබුණු උපදෙස් (Guideline) ප්‍රකාරව අංක 2023/SPC/E/R/P/00143 දරන ඒකක 137,500 ක ඇණවුම නිකුත් කර තිබුණි. 2022 ජනවාරි මාසයේදි 2023 වර්ෂය වෙනුවෙන් ඇණවුමක් නිකුත් කිරීමට අවශ්‍ය නොවන බව තීරණය කර ඇතත් 2023 ජනවාරි මාසයේදිම මෙම හදිසි ඇණවුම නිකුත් කිරීම විගණනයේදි ගැටළු සහගත විය. ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබාදී නොතිබුණද ලංසු කැඳවීම අවසන් කර දින 25 ක පමණ කාලයක් ගතකර 2023 අප්‍රේල් 24 දින තාක්ෂණික ඇඟයීම් කමිටුව තම නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව ඖෂධ මිලදී ගැනීම ‘‘වහාම’’ යන පදනම ලංසුකරුවන්ට ලංසු ඉදිරිපත් කිරීමට පමණක්ද යන්න විගණනයේදී ගැටලු සහගත විය. තාක්ෂණික ඇඟයීම් කමිටු නිර්දේශයට අනුව වෛද්‍ය සැපයීම් අංශය සතුව මෙම ඖෂධයේ අතැති තොගය මාස 12 කට ප්‍රමාණවත් බව සඳහන් කර තිබුණු අතර, එම නිර්දේශ නිකුත්කර දින 18 කට පසුව ඇණවුම අවලංගු කිරීමට ප්‍රසම්පාදන ඇඟයීම් කමිටුව තීරණය කර තිබුණි. ඒ අනුව වෛද්‍ය සැපයීම් අංශය සතුව ප්‍රමාණවත් තොග නොමැති බව සඳහන් කරමින් හදිසි පදනම මත ඇණවුම් නිකුත් කිරීමත් ප්‍රමාණවත් තොග ඇති බව දක්වමින් ඇණවුම අවලංගු කිරීමත් විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය. ඒ අනුව මෙම ඇණවුම වෙනුවෙන් වැයකළ කාලය, ශ්‍රමය හා පිරිවැය නිෂ්කාර්ය වී තිබුණි.

(ඕ) 2024 වර්ෂය සඳහා සාමාන්‍ය ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා ඇණවුම් පාලන පත්‍රිකාවක් 2023 නොවැම්බර් 15 දින වනවිටත් සකස්කර නොතිබුණි. ඒ අනුව 2024 වර්ෂය සඳහා ඇණවුම නිකුත් කරන්නේද යන්න පිළිබඳ තීරණයකට එළඹ නොතිබුණි.

(ක) 2022 සැප්තැම්බර් 02 දින සිට 2023 මාර්තු 13 දින දක්වා කාලය තුළ වෛද්‍ය සැපයීම් අංශය සතුව ඖෂධ තොග නොතිබුණු අතර ඒ අනුව රෝහල් 02 ක් විසින් මෙම කාලපරිච්ඡේදය තුළදී ඒකකයක් රු.500 බැගින් ඒකක 400 ක් හා ඒකකයක් රු.224 බැගින් ඒකක 270 ක් ලෙස රු.260,480 කට ඒකක 724 ක් මිලදී ගෙන තිබුණි.

56. Oxaliplatin injection 50 mg in 10ml vial (SR-01203801)

(අ) ස්වස්ථ පරිගණක දත්ත පද්ධතියට අනුව 2023 ඔක්තෝබර් 12 දිනට මෙම ඖෂධයේ සියළුම ප්‍රමාණයන්ගේ ඖෂධ තොග සම්පූර්ණයෙන්ම අවසන් වී තිබුණි.

(ආ) 2021, 2022 හා 2023 වර්ෂ සඳහා පිළිවෙලින් ඒකක 15,000 ක්, ඒකක 2,550ක් හා ඒකක 2,750 ක් ඇණවුම් කර තිබුණු අතර, මෙම ඇණවුම් සිදුකරන ලද අවස්ථාවන් වන විට ප්‍රමාණාත්මක තොග නොපැවති බව නිරීක්ෂණය විය. 2020 න් පසුව නිකුත් කරන ලද ඇණවුම් අවලංගු කිරීම මීට හේතුවී තිබුණු බව විගණනයේදි නිරීක්ෂණය විය.

(ඇ) 2021 වර්ෂය වෙනුවෙන් වූ මෙම ඖෂධයේ ඒකක 12,000 ක සාමාන්‍ය ඇණවුමක් 2020 ජනවාරි 06 දින ලබා දී තිබුණු අතර, 2020 පෙබරවාරි 02 දින ජාත්‍යන්තර

තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදයට අනුව ලංසු කැඳවා ලංසු විවෘත කිරීම 2020 අප්‍රේල් 24 දින සිදු කර තිබුණි. ලංසු විවෘත කර මාස 7 කට පසුව අවම මිල ඉදිරිපත් කරන ලද සැපයුම්කරු වෙත මෙම ප්‍රසම්පාදනය පිරිනැමීමට තීරණය කර තිබුණි. තෝරාගත් සැපයුම්කරු වෙත එම තීරණය දන්වා තිබුනේ ඉන් මාස 02 කට පසුවය. 2021 මාර්තු 31 දින ඉන්ඩෙන්ටුව නිකුත් කිරීමේ දී ඇණවුම් ලබාදෙන අවස්ථාවේ සඳහන් කළ සැපයුම් දිනයන්ට වඩා අවුරුද්දකට වැඩි කාල පමාවක් සහිතව ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණි.

(ඇ) තෝරාගත් ලංසුකරු ඉදිරිපත් කර තිබුණු ජාතික ඖෂධ නියාමන අධිකාරී (NMRA) සහතිකය Oxaliplatin for injection USP 50mg in 30ml vial නැමැති වෙනත් SR අංකයක් සඳහා ලබාගත් සහතිකයක් වූ අතර එය පිළිගැනීමට ඇති හැකියාව විගණනයේදී ගැටළුකාරී විය. තවද මෙම සහතිකය 2023 ජුනි 14 දිනෙන් අවලංගු වී ඇති බවද නිරීක්ෂණය විය.

(ඉ) වෛද්‍ය සැපයීම් අංශය විසින් 2021 සැප්තැම්බර් 23 දින, රටේ පවතින කොවිඩ් වසංගතය හමුවේ මෙම ඖෂධය සඳහා තිබුණු ඉල්ලුම අඩු වී ඇති බැවින් මෙම ඇණවුම සහ ඊට පෙර ඉදිරිපත් කර තිබුණු ඒකක 12,000 ක ඇණවුම නවතා දමා තිබුණි. නමුත් මෙම ඇණවුමෙන් ඒකක 3,000 ක් නැවත කැඳවන ලෙස වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ විසින් 2022 ජූලි 21 දින දන්වා තිබුණ ද විගණිත දිනය වූ 2023 ඔක්තෝබර් 12 වන විටත් එම ඖෂධ වෛද්‍ය සැපයුම අංශය වෙත ලැබී නොතිබුණි.

(ඊ) මීට ප්‍රථම නිකුත් කරන ලද ඇණවුම් දෙකක් අත්හිටුවා තිබිය දී අංක 2022/SPC/X/R/P/00306 දරන ඇණවුම යටතේ ඒකක 1,800 ක් මිල දී ගැනීම සඳහා ඇණවුම් ඉදිරිපත් කර තිබුණි. අවම මිල ඉදිරිපත්කළ ආයතනයට ලංසුව පිරිනැමීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. නැවතත් මාස තුනකට පසු එනම් ප්‍රසම්පාදන කමිටුව තීරණය අනුව සැපයුම්කරුගෙන් ප්‍රදානය කරන ලද අයිතමය සැපයීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් ලබා ගැනීමට කැඳවීම් කිරීමට තීරණය කර ඇති බව නිරීක්ෂණය වූ අතර එයට හේතු ලෙස අවශ්‍ය කරන කාර්යසාධන ඇපකරය ලබා නොදීම හා ගිවිසුම් අත්සන් නොකිරීම යන කරුණු දක්වා තිබුණි. එම අවස්ථාවේ සැපයුම්කරු විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලිපියක් යොමු කර අමුද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා එ.ජ.ඩොලර් 3.50 ට ඉදිරිපත් කළ මිල එ.ජ.ඩොලර් 6.875 දක්වා ඉහළ දැමීමක් ඉල්ලා තිබුණි. ප්‍රසම්පාදන කමිටුව විසින් සැපයුම්කරු මිල වැඩි කිරීම පදනම් කරගෙන අදාළ ප්‍රසම්පාදනය අවලංගු කර ඇති බව නිරීක්ෂණය විය. මෙම ඖෂධය සඳහා ලංසු ඇඟයීමේදී ඉදිරිපත් කර තිබුණු NMRA සහතිකය වෙනත් SR අංකයකට අදාළ එකක් බැව් නිරීක්ෂණය විය.

(උ) 2020/SPC/E/R/P/00744 දරන ඒකක 750 ක හදිසි මිලදී ගැනීමක් සඳහා වූ ඇණවුම වෛද්‍ය සැපයීම් අංශය විසින් යොමුකර තිබුණි. මෙම ඇණවුම හදිසි ඇණවුමක් ලෙස සඳහන්ව තිබිය දී ලංසු කැඳවීමට දින 15 ක් ගතකර තිබුණි. නමුත් ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 06 ක් පමණක් ලබා දී තිබුණු අතර හදිසි මිලදී ගැනීමක් ලෙස සලකා මිල ගණන් ඉදිරිපත් කිරීමට දින 6 ක් ලබා දී ඇඟයීම් සඳහා මාස 1 ½ ක් වැනි දිගු කාල පරාසයන් ලබාදීම තුළ හදිසි අවශ්‍යතාවය බව දක්වමින් තරඟකාරිත්වය සීමා කර ඇති බවත් අනෙකුත් කටයුතුවල දී කිසිදු හදිසියක් පෙන්නුම් කර නොමැති බවත් නිරීක්ෂණය විය. මෙම ඇණවුමට අදාළව ඉදිරිපත් කර තිබුණු මෙම ඖෂධයේ වෙනත්

මාත්‍රාවකට අදාළ NMRA සහතිකය 2020 අප්‍රේල් 21 දිනෙන් අවසන් වී ඇති අතර එය නැවතත් දීර්ඝ කර වලංගු සහතිකයක් ලෙස ඉන්ඩෙන්ටුව නිකුත් කරන අවස්ථාව වනවිට ලබා දී තිබුණි. එම සහතිකය වෙනත් SR අංකයකට අදාළ ඖෂධයක් වුවත් ලංසු ඇගයීමේදී ඒ සඳහා අවධානය යොමුකර නොතිබුණි. මෙම ඖෂධ තොගය 2023 මාර්තු 10 වන දින වෛද්‍ය සැපයීම් අංශයට ලැබී තිබුණු අතර එය වෙනස් ඇණවුම් අංකයක් හා SR අංකයක් යටතේ තොගයට ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය.

(ඌ) 2023 වර්ෂයට අදාළ ඒකක 1,500 ක අංක 2023/SPC/N/R/P/00081 දරන ඇණවුම 2022 නොවැම්බර් 16 දින යොමුකර තිබුණි. ඇණවුම් පාලන පත්‍රිකාව අනුව පුරෝකථන කාලපරිච්ඡේදයට අදාළව ඒකක 23,501 ක අතිරික්ත ඖෂධ තොගයක් පැවතිය දී සාමාන්‍ය ඇණවුම ලෙස ඒකක 1,500 ක ඇණවුමක් නිකුත් කර තිබුණි. 2023 වර්ෂයේ සාමාන්‍ය ඇණවුම මාස 11 කට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් පොරොත්තු ඇණවුම් මත පදනම්ව ඉහත සාමාන්‍ය ඇණවුම ඉදිරිපත් කර තිබුණේ 2023 වර්ෂය ආරම්භ වීමට මාසයකට පමණ පෙරදීය. ප්‍රමුඛතා ලැයිස්තුවේ ඇතුළත් නොවූ මෙම ඖෂධය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණ ගැනීම වගකිව යුතු නිලධාරීන් නොසැලකිලිමත්ව කටයුතු කිරීමක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(එ) 2023 සාමාන්‍ය ඇණවුමට අදාළව ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පැවතියේ දී ඒකක 750 ක් හා ඒකක 500 ක් මිලට ගැනීම සඳහා අවස්ථා දෙකකදී ඇණවුම නිකුත් කර තිබුණු අතර ප්‍රමුඛතා ලයිස්තුවට ඇතුළත් නොවීම හේතුවෙන් සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම ප්‍රසම්පාදන අවලංගු කිරීමට තීරණය කර තිබුණි.

(ඒ) සියළුම ඇණවුම් විවිධ හේතූන් මත ප්‍රමාද වීම් මත මෙම ඖෂධයේ එක් ඒකකයක් රු.9,000 ක් බැගින් ඒකක 18 ක් රු.162,000 කට බදුල්ල පළාත් මහ රෝහල විසින් මිල දී ගෙන තිබුණු බැව් නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය විය.

57. Ergometrine maleate inj.500mcg/1ml amp (SR - 01300102)

(අ) 2022 වර්ෂය වෙනුවෙන් අංක 2022/SPC/N/R/P/00007 දරන ඇණවුම මඟින් එන්නත් ඒකක 15,000 ක් 2021 පෙබරවාරි 27 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත තොරතුරු කළමනාකරණ පද්ධතිය හරහා ඉදිරිපත් කර තිබුණු අතර එම ඇණවුම දින 18 කට පසුව ලිඛිතව යොමුකර තිබුණි. ජාත්‍යන්තර තරඟකාරී ලංසු ක්‍රමයට සිදු කරන ලද ලංසු කැඳවීමට අනුව ලංසු 02 ක් ඉදිරිපත් කර තිබුණු නමුත් වෛද්‍ය සැපයීම් අංශයේ ඉල්ලීම මත මෙම ඇණවුම තාවකාලිකව අත්හිටුවා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.10 අනුව ලංසු වලංගු කාලය තුළ ලංසුව පිරිනමා අවසන් කළ යුතු වුවත්, වලංගු කාලය දීර්ඝකර ගැනීමකින් තොරව 2022 ඔක්තෝබර් 05 වන දින මෙම ලංසුව පිරිනමා තිබුණි. ඒ වන විට ඖෂධයට අදාළ NMRA ලියාපදිංචි සහතිකයේ වලංගු කාලය ද 2022 මැයි 20 දිනෙන් අවසන් වී තිබුණි. කෙසේ නමුත් 2022 ඔක්තෝබර් 17 දින ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණි. 2023 ඔක්තෝබර් දක්වා මෙම ඇණවුමට අදාළ ඖෂධ සපයා නොතිබුණි.

(ආ) අංක 2022/SPC/X/R/P/00284 දරන එන්නත් ඒකක 35,000 ක ඇණවුමට අදාළව මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතන 2 කින් අවම ලංසුකරුට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. සම්පූර්ණ තොගයම 2023 මාර්තු 31 දිනට ලැබිය යුතු බව දක්වා ඉන්ඩෙන්ටුව

2022 ජූලි 04 වන දින නිකුත් කර තිබුණි. මෙම ඖෂධයේ මුළු එන්නත් ප්‍රමාණය 2023 අප්‍රේල් 12 දින සපයා තිබුණි. මෙම ප්‍රසම්පාදනයට අදාළ වන කාර්යසාධන ඇපකරය දින 41 ක ප්‍රමාදයක් සහිතව ලබා දී තිබුණි. සැපයුම්කරුට මෙම කොන්ත්‍රාත්තුව පිරිනමන අවස්ථාව වන විටත් ඖෂධයේ NMRA ලියාපදිංචි සහතිකය කල් ඉකුත් වී තිබුණු අතර නැවත ලියාපදිංචිය ලබාගැනීම සඳහා සැපයුම්කරු විසින් ඉල්ලුම් කර ඇතත් ඒ අනුව කඩිනමින් එම ලියාපදිංචිය අළුත් කිරීමට හෝ එය ප්‍රතික්ෂේප කිරීමට ජාතික ඖෂධ නියාමන අධිකාරිය කටයුතු නොකර මෙම තොගය නිදහස් කර ගැනීම සඳහා තොග නිෂ්කාශන ලිපියක් (Shipment clearance letter) නිකුත් කර තිබුණි. මෙම ඇණවුමට අදාළ ඇස්තමේන්තු පිරිවැය රු.17,035,200 ක් ලෙස ගණනය කර තිබුණු අතර සත්‍ය පිරිවැය රු.8,845,561 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුගත පිරිවැය හා සත්‍ය පිරිවැය අතර සියයට 92 ක විචලනයක් පැවතුණි. මෙම ඇණවුමට අදාළව බැංකු ඇපකරයේ ප්‍රමාදවීම හේතුවෙන් ශීතකාමර ගාස්තු ලෙස රු.75,600 ක අමතර පිරිවැයක් දරා තිබුණ ද එම මුදල සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2023 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුම 2022 ජනවාරි වන විට නිකුත් කළ යුතු වුවත් ඒකක 17,500 ක 2023 සාමාන්‍ය ඇණවුම් 2022 නොවැම්බර් 17 දින නිකුත් කර තිබුණි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව එකම ලංසුකරු වූ සමාගමක් වෙත ඒකකයක පිරිවැය එ.ජ.ඩො. 2.80 කට මිලට ගැනීම සඳහා ලංසු ප්‍රදානය කර තිබුණි. නමුත් 2021 හා 2022 වර්ෂවල සාමාන්‍ය ඇණවුම් ඒකක ලැබීමට නියමිත බැවින් මෙම ඇණවුම ලබාගත යුතු දිනය 2025 මාර්තු දක්වා කල් දමා ප්‍රසම්පාදන ක්‍රියාවලිය නවතා දමා තිබුණි.

(ඈ) මෙම ඖෂධයේ ප්‍රමාණවත් පරිදි තොග පැවතිය ද අවස්ථා 4 ක දී ඒකක 53 ක් රු.21,925 කට ප්‍රාදේශිය වශයෙන් ද මිල දී ගැනීම් සිදුකර තිබුණි.

(ඉ) ඖෂධයේ ඇස්තමේන්තු නිසි ලෙස සකස් නොකිරීම, ඇණවුම් කළ යුතු ප්‍රමාණයන් නිසිලෙස පුරෝකථනය නොකිරීම, රෝහල් විසින් අනවශ්‍ය ලෙස වැඩිපුර තොග පවත්වා ගැනීම, අතිරික්ත තොග ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොකිරීම ආදී කරුණු හේතුවෙන් මෙම ඖෂධය රෝහල් තුළම කල් ඉකුත් වී තිබුණු බව නිරීක්ෂණය වූ අතර කල් ඉකුත් වූ තොගයේ ගැනුම් පිරිවැය පමණක් රු. 5,238,344 ක් වී තිබුණි.

58. Pazopanib tablet 200 mg (SR-01208101)

(අ) අංක 2021/SPC/O/C/P/00528 දරන 2021 ජූලි 20 දිනැති ඇණවුම යටතේ ඖෂධ ඒකක 18,505 ක් ලබා ගැනීම සඳහා ලියාපදිංචි අතීත සැපයුම්කරුවන්ගෙන් 2021 අගෝස්තු 25 දින ෆැක්ස් මඟින් මිල ගණන් කැඳවා තිබුණු අතර එක් ආයතනයක් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. සැපයුම්කරු වෙත 2021 ඔක්තෝබර් 25 දින ඉන්ඩෙන්ටුව ලබා දී තිබුණු අතර 2022 අප්‍රේල් 18 දින වන විට මෙම ඇණවුම සැපයිය යුතු විය. 2023 නොවැම්බර් 02 විගණන දිනටත් මෙම ඖෂධ තොගය ලබා දී නොතිබුණු අතර ලැබිය යුතු තොගයක් ලෙස ස්වස්ථ පද්ධතියේ දක්වා තිබුණි. මෙම ඇණවුමට අදාළ කාර්යසාධන බැඳුම්කරය 2022 ජූලි 30 දින තෙක් වලංගු වූ අතර ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියද 2022ජූනි 03 තෙක් පමණක් වලංගු වී පැවතුණි.

(ආ) 2021 සැප්තැම්බර් 08 දිනැති ඇණවුම් අංක 2021/SPC/E/C/P/00653 යටතේ ඖෂධ ඒකක (Tabs) 30,000 ක් ලබා ගැනීම සඳහා වූ ඇණවුමක් පිළිබඳ ස්වස්ථ පද්ධතියේ දක්වා තිබුණද, MSMIS පද්ධතියට අනුව හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ දත්ත පද්ධතිය අනුව එවැනි ඇණවුමක් පිළිබඳ තොරතුරු විගණනයේදී ලබා ගත නොහැකි විය.

(ඇ) 2021 සැප්තැම්බර් 16 දිනැති අංක 2021/SPC/E/C/P/00680 දරන ඇණවුමට අනුව ඖෂධ ඒකක 25,000 ක් ලබා ගැනීම සඳහා ලියාපදිංචි අතීත සැපයුම්කරුවන්ගෙන් ෆැක්ස් මඟින් මිල ගණන් කැඳවීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් 2021 ඔක්තෝබර් 25 දින අනුමැතිය ලබා දී තිබුණි. 2022 ජනවාරි 26 දින මෙම ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. සැපයුම්කරු සති 45 ක කාලයක් ඉල්ලීම නිසා 2022 අගෝස්තු 18 දින දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම ඇණවුම අවලංගු කර තිබුණි. වෙනත් ප්‍රතිචාරාත්මක ලංසු නොතිබුණ බැවින් නැවතත් මිල ගණන් කැඳවීමට තීරණය කර තිබුණු අතර ලියාපදිංචි හා අතීත සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා තිබුණි. ඒ අනුව 2022 ඔක්තෝබර් 20 දින WOR සහතිකය ලබා ගැනීමට යටත්ව, නැවිගත කිරීමට පෙර සාම්පල සඳහා ස්වාධීන රසායනාගාර වාර්තාවක් ලබා ගැනීමට යටත්ව ප්‍රසම්පාදනය ප්‍රදානය කර තිබුණි. නමුත් 2023 පෙබරවාරි 16 දිනැති WOR කමිටු තීරණයට අනුව WOR සහතිකය පිරිනමා නොතිබුණි. ඒ අනුව ඇණවුම නිකුත් කර වර්ෂ 02 කට පසුත් එය ප්‍රදානය කිරීමට නොහැකි වීමත් 2023 නොවැම්බර් 03 දින වනවිටත් මෙම ඖෂධ තොගය ලැබිය යුතු තොගයක් ලෙස ස්වස්ථ දත්ත පද්ධතියේ දක්වා තිබීමත් තුළින් ශ්‍රී ලංකාවේ පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත පිළිකා ඖෂධ මිලදී ගැනීමට ප්‍රමුඛත්වය දීම සම්බන්ධයෙන් විශේෂ අවධානයකින් කටයුතු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) මෙම ඖෂධයට අදාළ ඇණවුම් නොලැබීම හේතුවෙන් 2021 ජූලි 20 සිට නොවැම්බර් 29 දක්වා කාල පරිච්ඡේදය තුළ දින 94 ක් වෛද්‍ය සැපයීම් අංශය සතුව තොග නොමැතිව පැවති බව MSMIS පරිගණක පද්ධතියෙන් ලබා ගත් තොරතුරු අනුව නිරීක්ෂණය විය.

(ඉ) අංක 2022/SPC/N/C/P/00081 දරන ඒකක 50,000 ක ඇණවුම 2021සැප්තැම්බර් 17 දින දත්ත පද්ධතිය මඟින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත යොමුකර තිබුණු අතර දින 12ක ප්‍රමාදයකින් පසුව අදාල ඇණවුම සංස්ථාව වෙත ලිඛිතව ලබාදී තිබුණි. 2021 සැප්තැම්බර් 08 දින වන විට අතැතිව තොග ශූන්‍ය වී තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයන් ඇගයීම් වාර්තාව අත්සන් කර තිබුණද, ඔවුන්ගේ නම් හා තනතුරු දක්වා නොතිබුණි. සැපයුම්කරු විසින් තම ලංසුව ඉදිරිපත් කිරීමේදී ඉන්ඩෙන්ටුව හා ණයවර ලිපිය ලද පසු සති 45 කින් ඖෂධය සැපයිය හැකි බව දක්වා තිබුණි. එකී කරුණුද පදනම්ව 2022 පෙබරවාරි 02 දින අදාළ සැපයුම්කරු තෝරාගෙන තිබුණි. සැපයුම්කරු විසින් 2022 පෙබරවාරි 09 දින මෙම ඇණවුම ඉහත කොන්දේසිවලට යටත්ව භාර ගෙන තිබුණද 2022 අගෝස්තු 18 දින රැස්වූ ප්‍රසම්පාදන කමිටුව මෙම ඇණවුම අවලංගු කර නැවත ලංසු කැඳවීමට තීරණය කර තිබුණි. මේ අනුව 2022 පෙබරවාරි 15 දින සැපයුම්කරු විසින් දන්වන ලද කොන්දේසි පිළිබඳව තීරණ ගෙන ඇණවුම අවලංගු කිරීම සඳහා වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණු බව නිරීක්ෂණය වූ අතර සැපයුම්කරුගේ වරදක් නිසා ඇණවුම අවලංගු කළද, ඔහුට විරුද්ධව ගත් ක්‍රියාමාර්ග ලිපිගොනුව අනුව නිරීක්ෂණය නොවීය.

(ඊ) මෙම ඒකක 50,000 ලබා ගැනීමට 2022 සැප්තැම්බර් 08 දින නැවත දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව යටතේ මිල ගණන් කැඳවා තිබුණි. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි බලපත්‍රයක් සහිත සැපයුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද ඒකකයක් සඳහා වූ රු. 1,370 ක ලංසුව පිළිබඳව නොසලකා ලියාපදිංචියෙන් නිදහස් සහතිකයක් (WOR) ලබාගැනීමට යටත්ව හා පූර්ව නැවිගත කිරීමේ සාම්පල සඳහා ස්වාධීන රසායනාගාර වාර්තාවක් ලබා ගැනීමට යටත්ව ඖෂධ ඒකකයක් රු.330 ක් වැනි අසාමාන්‍ය අඩු මිලකට ලබා ගැනීමට 2022 නොවැම්බර් 15 දින රැස්වූ ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර තිබුණි. 2022 නොවැම්බර් 08 දිනට මෙම ඖෂධයේ තොග තත්ත්වය ශුන්‍ය මට්ටමේ පැවතුණි. WOR කමිටු තීරණය අනුව ඖෂධ නිෂ්පාදකයා සහ දේශීය නියෝජිතයා යන දෙදෙනාම ලියාපදිංචි වී නොමැති බැවින් මෙම සහතිකය සඳහා අවසර ලබා දී නොතිබුණි. ස්වස්ථ දත්ත පද්ධතිය අනුව මෙම ඇණවුම් අංකයෙන් ඖෂධ ඒකක 50,000 ක් ලැබීමට නියමිත බව නිරූපනය වන අතර ඉන්ඩෙන්ටුවක් හෝ නිකුත් කර නොමැති ඇණවුමක් සඳහා දත්ත පද්ධතියේ ලැබිය යුතු අයිතම ලෙස මෙවැනි තොග පෙන්වීම තුළින් පිළිකා රෝගීන්ට අඛණ්ඩ ඖෂධ සැපයීමක් ලබා දිය නොහැකි බව විගණනයේදී තව දුරටත් නිරීක්ෂණය විය.

(උ) අංක 2022/SPC/X/C/P/00331 යටතේ මෙම ඖෂධයෙන් ඒකක 54,000 ක් ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ මිලදී ගැනීම සඳහා 2022 මාර්තු 26 දින ලබාදී තිබුණු මෙම ඇණවුමට අදාළ සැපයුම් කොන්දේසි ඇතුළත් ලිඛිත ඇණවුම් ලේඛන විගණනයට ඉදිරිපත් කරන ලද ලිපිගොනුව තුළ ඇතුළත්ව නොතිබුණි. ඒකකයක් සඳහා අවම මිල වූ එ.ජ. ඩොලර් 3.05 ක ඒකක මිලක් ඉදිරිපත් කරන ලද ඉන්දියානු සැපයුම්කරුට ප්‍රසම්පාදනය පිරිනැමීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව 2022 අප්‍රේල් 21 නිර්දේශ කර තිබුණි. එම තීරණය ගෙන දින 12 කට පසුව ඇණවුම අදාළ ආයතනය වෙත පිරිනමා තිබුණි. ඖෂධ නැව් ගත කිරීමට පෙර ස්වාධීන රසායනාගාර වාර්තාවක් සැපයුම්කරුගේ පිරිවැයෙන් ලබාදිය යුතු යුතු බවටත්, WOR සහතිකයක් ඉදිරිපත් කිරීමටත් යටත්ව මෙම ඇණවුම පිරිනමා තිබුණි. ඉන්ඩෙන්ටුව නිකුත් කිරීමට පෙර සැපයුම්කරු විසින් WOR සහතිකය ලබාගත යුතු වුවද, ඉන්ඩෙන්ටුව 2022 ජූලි 04 දින නිකුත් කර තිබුණ අතර WOR සහතිකය නිකුත් කර තිබුණේ 2022 සැප්තැම්බර් 06 දිනදී විය. 2022 අගෝස්තු 10 දින මෙම ඖෂධය මත DHS සලකුණ සටහන් (Embossed) කිරීමට නොහැකි බව දන්වා තිබුණු අතර 2022 අගෝස්තු 17 දින වෛද්‍ය සැපයීම් අංශය විසින් මෙම යෝජනාව සඳහා ද අනුමැතිය ලබා දී තිබුණි. මෙම තොගයේ මුල් ඖෂධ ඒකක 27,000 ක් මාස 04ක පමණ ප්‍රමාදයක් සහිතව ද ඒකක 10,000 ක තෙවන තොගය මාස 1 ½ ක පමණ ප්‍රමාදයක් සහිතව වෛද්‍ය සැපයීම් අංශය වෙත තොග ලැබී තිබුණි. 2022 ජූලි 08 සිට සැප්තැම්බර් 01 දින තෙක් දින 23 ක්ද 2022 සැප්තැම්බර් 01 සිට දෙසැම්බර් 14 දින තෙක් දින 104 ක්ද වශයෙන් මෙම ඖෂධයේ එක් ඒකකයක් හෝ වෛද්‍ය සැපයීම් අංශයේ නොතිබුණි.

(ඌ) අංක 2022/SPC/E/C/P/00748 දරන 2022 නොවැම්බර් 09 දිනැති ඒකක 22,500 ක හදිසි මිලදී ගැනීමේ ඇණවුමට අනුව ප්‍රසම්පාදනය සඳහා ලියාපදිංචි හා පූර්ව සැපයුම්කරුවන්ගෙන් දින 07 ක් තුළ මිල ගණන් කැඳවීමට 2022 නොවැම්බර් 15 දින අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව ආයතන 04 ක් වෙතින් 2022 නොවැම්බර් 25 දින ෆැක්ස් මඟින් මිල ගණන් විමසා තිබුණි. 2022 දෙසැම්බර් 02 දින ලංසු විවෘත කර තිබුණි. ඒ සඳහා ලංසුකරුවන්ගේ නියෝජිතයන් ලෙස ආයතන 08 ක නියෝජිතයින් සහභාගී වී තිබුණි. නමුත් 2022 දෙසැම්බර් 02 දිනැති ලංසු විවෘත කිරීමේ වාර්තා

(Bids Opening Minutes) අනුව මිල ගණන් එවන ලද ආයතන ගණන දෙකක් විය. 2022 දෙසැම්බර් 02 දිනැති ඇගයීම් කමිටු වාර්තාවට අනුව ආයතන දෙකක් ඇගයීමට ලක් කර තිබුණු නමුත් මෙම ප්‍රසම්පාදනය සඳහා ආයතන 3 ක් ලංසු ඉදිරිපත් කර තිබුණු බව 2022 දෙසැම්බර් 28 දිනැති හා 2023 ජනවාරි 04 දිනැති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තවල සඳහන් කර තිබුණි. ඒකකයක් වෙනුවෙන් රු.1,256.63 ක අවම ලංසුව ඉදිරිපත් කරන ලද ආයතනය NMRA හි ලියාපදිංචිය ලබා නැති බැවින් හා අනෙක් සැපයුම්කරු NMRA හි ලියාපදිංචිය ලබා ඇති බැවින් මිල ගණන් කේවල් කර ගැනීමකට යටත්ව මෙම ප්‍රසම්පාදනය පිරිනැමීමට නිර්දේශ කර තිබුණි. මෙම සමාගම විසින් ඒකකයක් සඳහා රු.10 ක මිල අඩු කිරීමක් සහිතව රු.1,467 බැගින් සැපයීමට එකඟතාවය පලකර තිබුණි. නමුත් අදාළ ඖෂධ තොගය ලබා දී තිබුණේ දින 64 ක ප්‍රමාදයක් සහිතවය. ඒ අනුව හදිසි මිලදී ගැනීමක් ලෙස 2022 නොවැම්බර් 09 දින සිදු කිරීමට අපේක්ෂා කළ මෙම ප්‍රසම්පාදනය සඳහා මාස 05 කට අධික කාලයක් වැය වී තිබුණි.

(එ) අංක 2022/SPC/E/C/P/00497 දරන ඒකක 9,000 ක මාසයක අවශ්‍යතාවය සැපිරීම සඳහා ඇණවුමක් 2022 ජුනි 29 දින නිකුත් කර තිබුණි. මෙම ඇණවුමට අනුව 2023 ජූලි 15 දින ඖෂධ සැපයිය යුතුව තිබුණි. මේ අනුව 2023 ජූලි 22 දින වන විට සිදු කරන ලද ලංසු කැඳවීමට අනුව ඉදිරිපත් කරන ලද ලංසු 03 කින් 2022 අගෝස්තු 05 දින රැස්වූ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඒකකයක් සඳහා රු. 1,987.15 ක අවම මිලක් ඉදිරිපත් කරන ලද සැපයුම්කරුගෙන් මිල දී ගැනීම නිර්දේශ කර තිබුණි. නමුත් 2022 අගෝස්තු 30 දින රැස්වූ ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රසම්පාදනය කඩිනම් කිරීමේ පරමාර්ථයෙන් රු.1,609.30 ක් වැනි මිලකට ප්‍රධාන බෙහෙත් ඇණවුම ප්‍රදානය කර ඇති සමාගම වෙතම මෙම ඇණවුම ලබා දීමට තීරණය කර තිබුණි. ලංසු ආරාධනා කරන ලද පුවත්පත් දැන්වීම හෝ ලියාපදිංචි සැපයුම්කරුවන්ට යවන ලද ලිපි පිළිබඳ විස්තර ගොනුවේ ඇතුළත් නොවීය. එසේම 2023 ඔක්තෝබර් 23 විගණන දිනටත් මෙම ඖෂධ තොගය ලැබී නොතිබුණි.

(ඒ) අංක 2023/SPC/X/C/P/00195 දරන ඒකක 60,000 ක ඇණවුම ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ඉතිරි අරමුදල් භාවිතා කරමින් හදිසි ප්‍රසම්පදාන ලෙස ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය යටතේ වෛද්‍ය සැපයුම් ආනයන කිරීමට පුද්ගලික අංශයේ ආනයනික නියෝජිතයකුට අවස්ථාව ලබා දීම හා මාස තුනකට ප්‍රමාණවත් වෛද්‍ය සැපයීම් තොග මිල දී ගැනීමට 2022 ඔක්තෝබර් 04 දින වෛද්‍ය සැපයීම් අංශයට අනුමැතිය ලබා දී තිබුණි. 2023 ජූනි 15 දින හා 2023 සැප්තැම්බර් 15 ඖෂධ ඒකක 30,000 බැගින් සැපයිය යුතුව තිබුණි. සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ලියාපදිංචිය ලත් සැපයුම්කරුවන්ගෙන් 2023 ජූනි 14 දින සිදු කරන ලද ලංසු කැඳවීමට අනුව 2023 ජූනි 16 දින වන විට ලංසු ඉදිරිපත් කළ යුතු විය. මේ අනුව ආයතන 04 ක් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර ලංසු ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දී නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඔ) 2023 ජූනි 27 දින රැස් වූ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඉදිරිපත් කළ ආයතන 4 සඳහාම NMRA සහතිකය නොමැති වුවද, NMRA- Manufactured site approval සහිත ආයතන දෙකක් අතරින් අනෙකුත් කොන්දේසි සමාන වුවද, සැපයීම් කාල සටහන පිළිබඳවද සලකා බලමින් ඒකකයක් සඳහා රු.1,905 ක මිලක් ඉදිරිපත් කරන ලද ආයතනය නිර්දේශ කර තිබුණි. ඒකකයක මිල රු.1,835.17 ක් යටතේ මෙම

සැපයුම ලබා දීමට මෙම ආයතනයම එකඟ වී තිබුණු බැවින් මෙම සැපයුම එම ආයතනය වෙත ලබා දීමට 2023 ජුනි 28 දින රැස්වූ ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර තිබුණු අතර මෙම ප්‍රසම්පාදන තීරණය සඳහා අමාත්‍යමණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. 2023 සැප්තැම්බර් 07 දින ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණු අතර, සැපයුම්කරු ඖෂධ ඒකක 60,000 ක් 2023 නොවැම්බර් 07 දින වන විට සැපයිය යුතු විය. මෙම ඇණවුමට අදාළ කාර්ය සාධන බැඳුම්කරය හා ගිවිසුම විගණනයට ඉදිරිපත් කරන ලද ලිපිගොනුවේ ඇතුළත් නොවීය. WOR සහතිකය ලද දින සිට දින 30 ක් ඇතුළත ඖෂධ සැපයීමට එකඟ වී තිබුණු හා තොරාගත් සැපයුම්කරුගේ මිලට වඩා රු.34,552,200 ක් අඩුවෙන් ඖෂධ තොගය ලබාගැනීමට හැකිව තිබිය දී මෙම සැපයුම්කරු තෝරාගෙන තිබුණි. කෙසේ වෙතත් 2023 නොවැම්බර් 17 දින වන විටත් මෙම සැපයුම්කරු විසින් ඖෂධ තොගය සපයා නොතිබුණි.

(ඕ) අංක 2023/SPC/E/C/P/00145 දරන ඒකක 22,500 ක් හදිසි මිලදී ගැනීම් ඇණවුම 2023 ජනවාරි 27 දින නිකුත් කර තිබුණි. ඒ අනුව මෙම හදිසි ප්‍රසම්පාදනය සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදු කර තිබුණි. ප්‍රසම්පාදන තීරණය සඳහා අමාත්‍ය මණ්ඩයේ ආවරණ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මෙම ඇණවුමට අදාළ කාර්යසාධන සුරක්ෂණය ලිපිගොනුව තුළ ඇතුළත් නොවීය.

(ක) MSMIS පද්ධතියට අනුව නම් කරන ලද රෝගීන් සඳහා ලබා දෙන ඖෂධ පිළිබඳ දත්ත හා ආදේශක ලෙස ලබා දෙන ඖෂධ පිළිබඳ අතීත දත්ත (Historical Data) ඇතුළත් වී තිබුණද, ස්වස්ථ දත්ත පද්ධතිය තුළ එම තොරතුරු ඇතුළත් කිරීමේ පහසුකම් මෙතෙක් නිර්මාණය කර නොතිබුණ බවත් ඒ හේතුවෙන් මෙම රෝගීන්ට ලබාදෙන ලද අතීත ඖෂධ පිළිබඳ තොරතුරු අවශ්‍ය අවස්ථාවල ඖෂධවේදීන්ට ලබා ගැනීමේ හැකියාවක් නොමැති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ග) ඇණවුම් කරන ලද ඖෂධ ප්‍රමාණයන් MSMIS පද්ධතිය හා ස්වස්ථ දත්ත පද්ධතිය තුළ ලැබිය යුතු ඖෂධ ප්‍රමාණයන් ලෙස පෙන්නුම් කළද මෙම ඖෂධ තොග තවදුරටත් ලැබීමේ හැකියාව, මේ දක්වා නොලැබීමට හේතුව, අදාළ ඇණවුමට අදාළ ප්‍රගතිය හා ඉදිරියේ දී ඖෂධ ලැබීමේ හැකියාව පිළිබඳව සොයා බලා සත්‍ය ලෙස තොග නොලැබේ නම් එම ඇණවුම් සුදුසු පරිදි අවලංගු කර දත්ත පද්ධතියෙන් ඉවත් කිරීමට කටයුතු නොකිරීමේ හේතුවෙන් ඖෂධ ඇණවුම් කිරීමේදී සිදුකරනු ලබන පුරෝකථනයන් නිවැරදි නොවන තත්ත්වයට පත්ව තිබුණි. නිවැරදි නොවූ දත්ත පදනම් කරගෙන පුරෝකථනයන් සිදුකර ඇණවුම් ප්‍රමාණයන් හා සැපයුම් කාලසටහන් සකස් කිරීම තුළින්, අදාළ ලැබීමට ඇති ඇණවුම් ලෙස පුරෝකථනය කළ ඖෂධ තොග සත්‍ය ලෙස අපේක්ෂිත ලෙස නොලැබීමේ හේතුවෙන් ඖෂධ හිඟයන් ඇති වීමත් එම ඖෂධ හිඟයට පිළියමක් ලෙස ප්‍රාදේශීය මිල දී ගැනීම් සිදුකිරීමට හා හදිසි මිල දී ගැනීම් යටතේ අධික මිල ගණන් වලට ඖෂධ මිල දී ගැනීමට සිදු වීමත් විගණනයේ දී නිරීක්ෂණය විය.

(ච) 2020, 2021 හා 2022 වර්ෂවල වෛද්‍ය සැපයීම් අංශය විසින් ප්‍රමාණවත් තොග තත්ත්වයන් පවත්වා නොගැනීම හේතුවෙන් හා මෙම ඖෂධයේ සැපයුම් කාලසටහන් අනුව සැපයුම් කිරීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව අපොහොසත් වීමෙන් රෝහල් පද්ධතිය තුළ අවස්ථා 06 කදී දින 319 ක කාලයක් මෙම ඖෂධය නොමැතිවී තිබුණි.

එසේම මෙම ඖෂධයෙන් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් මහරගම අපේක්ෂා රෝහල සඳහා ලබා දෙන අතර එම රෝහලෙන් 2022 හා 2023 දී අවස්ථා 04 කදී ඉල්ලුම් කරන ඒකක 36,000 කින් ඒකක 24,700 ක් පමණක් සපයා තිබුණි.

59. Capecitabine Tab 500 mg (SR - 01201601)

(අ) 2020 වර්ෂය සඳහා ඇණවුම් කරන ලද ඒකක 200 ක් හා 2021 වර්ෂයේදී ඇණවුම් කරන ලද ඒකක වලින් සියයට 64 ක් 2023 සැප්තැම්බර් 30 වන විටත් ලැබී නොතිබුණි.

(ආ) 2022 ට අදාළ ඒකක 230,000 ක සාමාන්‍ය ඇණවුම නිකුත් කර ලංසු ඇගයීම සඳහා මාස 04 ක කාලයක් ගතකර තිබුණි. තාක්ෂණික ඇගයීමෙන් පසුව ප්‍රසම්පාදන කමිටුව රැස්වීම සඳහා මාස 02 කට වඩා කාලයක් ගතකර තිබුණු අතර, ඇණවුම ප්‍රදානය කිරීම සඳහා දින 55 කට ආසන්න කාලයක් ගතකර තිබුණි. ඉන්ඩෙන්ටුවට අනුව 2023 ඔක්තෝබර් 31 වන විට ඒකක 230,000 ක් ලැබිය යුතු වුවද, දත්ත පද්ධතිය අනුව 2023 නොවැම්බර් 28 දින වන විටත් මෙම තොගය ලැබී නොතිබුණි.

(ඇ) අංක 2022/SPC/E/R/P/00457 දරන ඒකක 83,000 ක හදිසි ඇණවුමක් සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීමට තීරණය කර තිබුණි. අවම ඒකක මිල රු.310 ක් ඉදිරිපත් කරන ලද ආයතනය වෙත ඒකක මිල රු.290 ක් ලෙස සැපයීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති හෙයින් මෙම ඇණවුම WOR සහතිකය ලබා ගැනීමට යටත්ව ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණි. 2022 වර්ෂයට අදාළ ඖෂධ ප්‍රමාණය නියමිත සැලසුමකට අනුව ඇණවුම් කර නියමිත දිනවල දී තොග ලබා ගැනීමට කටයුතු නොකර මේ ආකාරයට හදිසි ඇණවුම් නිකුත් කිරීම හේතුවෙන් 2022 වර්ෂයේ සාමාන්‍ය ඇණවුමට අදාළ ඒකක මිල වූ රු.35.98 ක මිල මෙහි දී රු.290 ක් දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව අමතරව දැරීමට සිදුවන පිරිවැය රු. මිලියන 21.083 කි. මෙය සියයට 706 ක පමණ මිල වැඩිවීමේ විචලනයක් විය.

(ඈ) අංක 2022/SPC/E/R/P/00603 යටතේ මෙම ඖෂධයෙන් ඒකක 160,000 ක ඇණවුම නිකුත් කර තිබුණි. අඩුම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු වෙත ඒකකයක් රු. 68.59 බැගින් NMRA සහතිකය හෝ WOR ලබා ගැනීමට යටත්ව ප්‍රදානය කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුවලදී, තීරණය කර තිබුණු නමුත් මෙම ඇණවුම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකළ බවට හෝ අවලංගු කළ බවට සාක්ෂි ලිපිගොනුව තුළ නොතිබුණි. එසේම සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව ලබාදුන් ඉහත තීරණ සඳහා අමාත්‍යමණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) අංක 2022/SPC/E/R/P/00702 දරන ඒකක 83,000 ක ඇණවුම සඳහා අවම ඒකක මිල ඉදිරිපත් කරන ලද ආයතනයෙන් සියයට 0.5 ක මිල අඩුකිරීමක් සඳහා එකග වී ඇති හෙයින් හා සති 3 ක් තුළ ඖෂධය ලබා දීමට එකග වී ඇති හෙයින් ඇණවුම ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණි. කාර්යසාධන බැඳුම්කරය හා කොන්ත්‍රාත් ගිවිසුම ලිපිගොනුව තුළ ඇතුළත් නොවීය. ඇණවුම ප්‍රදානය කිරීමෙන් පසු මාසයක කාලයක් WOR සහතිකය ඉල්ලීම් කිරීම සඳහා ගතකර තිබුණු අතර එය ලබා දීම සඳහා මාස 06 කට අධික කාලයක් ගතකර තිබුණි. WOR සහතිකය නිකුත් කළ දින සිට මාස 06 ක්

පමණක් වලංගු වන බැවින් දෙසැම්බර් 01 වන විට මෙම ඖෂධ තොගය ලැබිය යුතු වුවද, 2023 නොවැම්බර් 30 දිනටත් ඖෂධ ලැබී නොමැති බැවින් නැවත WOR සහතිකයක් ලබාගැනීමට සිදු වන බව නිරීක්ෂණය විය.

(ඊ) අංක 2022/SPC/E/R/P/00730 දරන ඒකක 250,000 ක ඇණවුම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීමට තීරණය කර තිබුණි. ආයතන 05 කින් ලංසු ඉදිරිපත් කර තිබුණ අතර ප්‍රසම්පාදන කමිටුව රැස්ව මෙම ඇණවුම් අතරින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය සහිත ඒකක මිල රු. 250 ක් ඉදිරිපත් කරන ලද ආයතනය ඖෂධ සැපයීම සඳහා ගන්නා කාලය සඳහා එකඟ විය නොහැකි බැවින් ඖෂධ ඒකක මිල රු.102.27 ක් ලෙස ලංසු ඉදිරිපත් කළ ආයතනය වෙත WOR සහතිකය ගැනීමට යටත්ව ඇණවුම ලබා දීම නිර්දේශ කර තිබුණි. ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව මෙම ආයතනය වෙත 2023 නොවැම්බර් 20 දින වන විටත් WOR සහතිකයක් ලබා දී නොතිබුණි. හදිසි ඇණවුමක් ලෙස ප්‍රදානය කරන ලද මෙම ඇණවුම සඳහා 2023 නොවැම්බර් 30 දින වන විටත් ඖෂධ ලැබී නොතිබුණි.

(උ) ඒකක 83,000 ක හා ඒකක 250,000 ක හදිසි ඇණවුම් නිකුත් කර තිබිය දී නැවත අංක 2022/SPC/E/R/P/00744 දරන ඒකක 250,000 ක හදිසි ඇණවුමක් වෛද්‍ය සැපයීම් අංශය විසින් නිකුත් කර තිබුණි. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සීමාව තුළ ලියාපදිංචි හා පෙර සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. ඇඟයීම් වාර්තාව මඟින් විධිමත් හා නිශ්චිත නිර්දේශයක් ලබා දී නොතිබුණු අතර කමිටු සමාජිකයින් තම නම්, තනතුරු සඳහන් නොකර අදාළ වාර්තාව අත්සන් කර තිබුණි. ප්‍රසම්පාදන කමිටුව රැස් වී මෙම ලංසු අතරින් අවම ඒකක මිල වූ රු.99 ක් ඉදිරිපත් කරන ලද, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය ලත් ආයතනය වෙතින් මිල අඩු කර ගැනීමක් සිදු කර ගැනීමට තීරණය කර තිබුණි. 2023 ජනවාරි 12 දින ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණු අතර 2023 මාර්තු 13 දින ඒකක 249,990 ක් සැපයිය යුතුවිය ඒකක 247,440 ක් එනම් ඒකක 2,550 ක් අඩුවෙන් 2023 අප්‍රේල් 04 දින ලැබී තිබුණි. 2023 මැයි 29 දින සැපයුම්කරු වෙත දින 22ක් ප්‍රමාද වී ලැබීම හේතුවෙන් අය කළ යුතු දඩ මුදල් ලෙස රු.2,449,656 ක් හර පතක් යවා තිබුණි. සැපයුම්කරු විසින් 2023 ජූනි 01 දින නිදහසට කරුණු දක්වමින් ලිපියක් ඉදිරිපත් කර තිබුණු අතර නැවත 2023 අගෝස්තු 04 දින ලිපියක් ඉදිරිපත් කරමින් මෙම ඉතිරි 2,550 ක තොගය සැපයිය නොහැකි බව දක්වා තිබුණි. කෙසේ වෙතත් මෙම ගෙවීම් සනාථ කිරීමට අදාළ තොරතුරු ලිපිගොනුව තුළ ඇතුළත් නොවීය.

(ඌ) 2023 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුම 2022 ජනවාරි මස නිකුත් කළ යුතු වුවත් මාස 10 ක පමණ ප්‍රමාදයක් සහිතව ඒකක 500,000 ක ඇණවුම 2022 නොවැම්බර් 16 දින නිකුත් කර තිබුණි. ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණු අතර ඇගයීම් වාර්තාවට අනුව විධිමත් හා නිශ්චිත නිර්දේශයක් ඉදිරිපත් කර නොතිබුණි. ඇණවුම නිකුත් කර ලංසු ඇගයීම සඳහා මාස 04 ක කාලයක් ගතකර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයෙන් පසුව ප්‍රසම්පාදන කමිටුව රැස්වීම සඳහා මාස 02 කට වඩා කාලයක් ගතකර තිබුණු අතර, ප්‍රසම්පාදන ඇගයීම් කටයුතු වලින් පසු ඇණවුම ප්‍රදානය කිරීම සඳහා දින 55 කට ආසන්න කාලයක් ගතකර තිබුණි. ඉන්ඩෙන්ටුවට අනුව 2023 ඔක්තෝබර් 31 වන විට ඒකක 250,000 ක් ලැබිය යුතු

වුවද, දත්ත පද්ධතිය අනුව 2023 නොවැම්බර් 28 දිනටත් මෙම ඖෂධ තොගය ලැබී නොතිබුණි.

(එ) අංක 2023/SPC/X/R/P/00191 දරන ඒකක 600,000 ක ඇණවුම සඳහා ලංසු විවෘත කර තිබුණු අතර ආයතන 08 ක් විසින් ලංසු ඉදිරිපත් කර තිබුණි. සැපයුම්කරු විසින් රු.95.89 ක් ලෙස ඉදිරිපත් කරන ලද ඒකකයක මිල රු.95.79 දක්වා අඩු කිරීමට එකඟ වී තිබුණි. කාර්යසාධන බැඳුම්කරයක් ලිපිගොනුව අනුව ලබා දී නොතිබුණු අතර ස්වස්ථ පද්ධතිය අනුව මෙම තොගය ලැබිය යුතු තොගයක් ලෙස දක්වා තිබුණි. ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 02 ක කාලයක් පමණක් ලබා දී තිබුණි. මෙම ප්‍රසම්පාදන තීරණය සඳහා අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත යුතු වුවත් එම අනුමැතිය ලබා ගත් බවට වූ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ප්‍රසම්පාදන ඇගයීම් කටයුතු වලින් පසු ඇණවුම ප්‍රදානය කිරීම සඳහා දින 70 කට ආසන්න කාලයක් ගත කර තිබුණි. ඖෂධයේ ජීව කාලය මාස 24 ක් බව සඳහන් කර තිබුණද ඉන්ඩෙන්ටුවේ එය මාස 12 ක් ලෙස දක්වා තිබීම විගණනයේදී ගැටළු සහගත විය.

(ඒ) අංක 2023/SPC/E/R/P/00204 දරන ඒකක 300,000 ක ඇණවුම සඳහා ලංසු කැඳවා 2023සැප්තැම්බර් 14 දින ලංසු විවෘත කර තිබුණු අතර ආයතන 07 ක් විසින් ලංසු ඉදිරිපත් කර තිබුණි. අවම මිල ඉදිරිපත් කරන ලද ලංසුකරු ලියාපදිංචි සැපයුම්කරුවකු නොවන බැවින් හා දෙවන අවම මිල වූ රු.108.31 ඉදිරිපත් කරන ලද ලියාපදිංචිය සහිත පෙර සැපයුම්කාර ආයතනය නිර්දේශ කර තිබුණි. ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සටහනට අනුව මෙම ඖෂධය තවත් මාසයක කාලයක් සඳහා පමණක් ප්‍රමාණවත්ව පවතින බව දක්වා ඇති අතර නිර්දේශ ලෙස අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනයෙන් මිල ගණන් අඩු කර ගැනීමට හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය තහවුරු කර ගැනීම කළ යුතු බව දක්වා තිබුණු අතර ලිපිගොනුව මෙම සටහනින් පසු නිම කර තිබුණි. ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 03 ක කාලයක් පමණක් ලබා දී තිබුණි. ලංසු විවෘත කර දින 40 ක් ගත වී තිබුණද,2023 දෙසැම්බර් 04 විගණිත දින වන විටත් සැපයුම්කරුවකු තෝරා ගැනීමට නොහැකි වී තිබීම හේතුවෙන් ඇණවුම ප්‍රදානය කර නොතිබුණි.

(ඔ) 2023 දෙසැම්බර් 07 දිනට මෙම ඖෂධයේ ඒකක 1,919,416 ක් ලැබීමට ඇති බව ස්වස්ථ පද්ධතියට අනුව පෙන්නුම් කෙරුණි. නමුත් මෙම ඒකක ගණන සැකසුනු ආකාරය පිළිබඳ තොරතුරු මෙම පද්ධතිය තුළ ඇතුළත් කර නොතිබුණි.

(ඕ) 2024 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුම 2023 ජනවාරි මස නිකුත් කළ යුතු වුවත් එම ඇණවුම 2023 නොවැම්බර් අවසානය දක්වා නිකුත් කර නොතිබුණි. මෙම ඖෂධයේ පසුගිය වර්ෂ දෙකට අදාළ සාමාන්‍ය ඇණවුම් නියමිත පරිදි විධිමත් පුරෝකථනයන් මත නිකුත් නොකිරීමත් අවස්ථා කිහිපයක දී හදිසි ඇණවුම් නිකුත් කිරීමත් හේතුවෙන් වඩාත් හොඳ තරඟකාරිත්වයක් තුළින් අඩු මිලකට ඖෂධය මිලට ගැනීමට තිබුණු අවස්ථාව අහිමි කර තිබුණු අතර 2024 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුම නියමිත දිනට නිකුත් නොකිරීම මත 2024 වර්ෂයේ දී ද මෙම ඖෂධය සාමාන්‍ය පිරිවැයකට වඩා අධික පිරිවැයකට හදිසි මිල දී ගැනීම් යටතේ මිල දී ගැනීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

60. Cytarabine Inj 100mg/5ml (SR 01201701)

ලියුකේමියාව සමනය කිරීම සඳහා වෙනත් අනුමත පිළිකා නාශක ඖෂධ සමග ඒකාබද්ධව එන්නත් කරනු ලබන ඖෂධයක් වූ මෙම ඖෂධයෙන් 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වෛද්‍ය සැපයීම් අංශය විසින් එන්නත් ඒකක 29,500 ක් මිලදී ගැනීම සඳහා ඇණවුම් 07 ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත නිකුත් කර තිබුණි. එම ඇණවුම් 07 සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබුණද ඉන් එක් ඇණවුමකින්වත් ඖෂධ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව 2020 වර්ෂයේ සිට 2023 ඔක්තෝබර් 19 දින තෙක් තොග ශූන්‍ය තත්ත්වයක් නිරීක්ෂණය විය. මෙම තොග ශූන්‍ය තත්ත්වයක් ඇතිවීමට ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිදු කර තිබූ පහත සඳහන් කරුණු හේතු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) අංක 2020/SPC/A/R/P/00168 දරන ඇණවුම හා DHS/RP/408/2020 දරන ප්‍රසම්පාදනය යටතේ තෝරා ගත් සැපයුම්කරුවන් වෙත යැවූ ලංසු ඇරයුම් අතුරින් විදේශ සමාගම් 12 ක් වෙත සෘජුවම යවන ලද ෆැක්ස් 11 ක් සහ අංක 2023/SPC/N/R/P/00081 දරන ඇණවුම යටතේ සැපයුම්කරුවන් වෙත යැවූ ලංසු ඇරයුම් අතුරින් විදේශ සමාගම් 11 ක් වෙත සෘජුවම යවන ලද ෆැක්ස් වලට අදාළව කිසිවෙකු ප්‍රතිචාර දක්වා නොතිබුණි.

(ආ) අංක 2021/SPC/N/R/P/00020 දරන ඇණවුම හා අංක DHS/RP/51/2021 දරන ප්‍රසම්පාදනය යටතේ ලංසුකරුවන් විසින් සාම්පල් ඉදිරිපත් කළ යුතු වුවත් තෝරාගත් සැපයුම්කරු විසින් ප්‍රසම්පාදනය විවෘත කරන අවස්ථාව වන විටත් සාම්පල් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) අංක 2021/SPC/N/R/P/00020 යටතේ තෝරා ගත් සැපයුම්කරු විසින් 2021 නොවැම්බර් 16 දිනැතිව ලියාපදිංචිය අලුත් කිරීම සඳහා මුදල් ගෙවා තිබුණු නමුත් එම ලියාපදිංචිය අලුත් කිරීමට අදාළ ලියවිලි දින 220 ක පමණ කාලයක් ගතවන 2023 ඔක්තෝබර් 19 දින වන විටත් අදාළ ලියාපදිංචිය අලුත් කිරීමේ සහතිකය නිකුත් කිරීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියට නොහැකි වී තිබුණි.

(ඈ) ඇණවුම් අංක 2022/SPC/E/R/P/00744 යටතේ එන්නත් කුප්පි 750 ක් මිලදී ගැනීමට අදාළව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදංචිය නිදහස් කිරීමේ සහතිකය මත එන්නත් කුප්පියක් රු.1,700ක් ඉදිරිපත් කළ M/S Tabrane සැපයුම්කරු වෙත ප්‍රදානය කළ ද සැපයුම්කරුගේ අමුද්‍රව්‍ය හිඟකම මත 2023 ජනවාරි 16 ප්‍රසම්පාදනය ඉල්ලා අස්කර කර ගෙන තිබුණි. ඒ අනුව නැවත කැඳවන ලද ලංසුවට අනුව පෙර අත්දැකීම් පදනම් කරගෙන ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදංචිය නිදහස් කිරීමේ සහතිකයක් මත ඉදිරිපත් කළ අවම දෙවන ලංසු මිල වූ එන්නත් කුප්පික් රු. 670 ක් ලෙස ඉදිරිපත් කළ ඉහත සැපයුම්කරු වෙතම ප්‍රදානය කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත තීරණය කර තිබුණි. එම සැපයුම්කරු ඉහත පරිදි ප්‍රසම්පාදනය ඉල්ලා අස් කරගෙන තිබියදී නැවත ලංසු කැඳවීමේදී එම සැපයුම්කරුට ඖෂධ ලබා ගැනීමට හැකියාවක් පවතී ද යන්න සොයා බැලීමකින් තොරව ප්‍රසම්පාදන කමිටුව වගකීම් විරහිතව එම සැපයුම්කරු වෙතම මෙම ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමට 2023 මාර්තු 02 දින අනුමත කර තිබුණි. තවද සැපයුම්කරු අයදුම් කර ඇත්තේ Cytarabine Inj 100mg/ ml බවත් සංස්ථාව ඉල්ලුම් කර ඇත්තේ Cytarabine Inj 100mg/5ml බවත් 2023 ජූනි 01 දින සැපයුම්කරු දැන්වීම මත ඇති වූ ගැටලුකාරී තත්ත්වය මත

අදාළ කාරණය සම්බන්ධව 2023 ජූනි 06 දින වෛද්‍ය සැපයීම් අංශය දැනුවත් කළ දින සිට ඒ හා සම්බන්ධව නිසි තීරණයකට එළඹීමකට 2023 සැප්තැම්බර් 03 දිනට දින 89 ක කාලයක් ගත කර Cytarabine Inj 100mg/ ml මාත්‍රාව මිලදී ගැනීම සඳහා 2023 සැප්තැම්බර් 26 දින ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතිකය ලබා ගැනීමට ඉල්ලුම් කර තිබුණි.

(ඉ) ඇණවුම් අංක 2023/SPC/N/R/P/00081 යටතේ එන්නත් කුප්පි 1,500 ක් මිලදී ගැනීමේ ලංසු ඇරයුමට එන්නත් කුප්පියක් රු.1,310 ලෙස ඉදිරිපත් කළ සැපයුම්කරු වූ අවම දෙවන ලංසුකරු වෙත ලියාපදිංචිය නිදහස් කිරීමේ සහතිකය (WOR) ලබා ගැනීමට යටත්ව 2023 මැයි 23 දින දෙපාර්තමේන්තු සුළු ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබා දී තිබුණි. ප්‍රසම්පාදනය සඳහා සැපයුම්කරු අයදුම් කර ඇත්තේ Cytarabine Inj 100mg/ ml බවත් 2023 ජූනි 20 දින සැපයුම්කරු විසින් දන්වා තිබුණි. 2022 වර්ෂයේ ප්‍රදානය කළ ඇණවුම් දෙකක්ම ප්‍රදානය කළ සැපයුම්කරුට අමුද්‍රව්‍ය නොමැති වීම මත හා සංස්ථාව විසින් ඇණවුම් කරන ලද ඖෂධයේ එම මාත්‍රාව නොමැති වීම හේතු කොට ගෙන ඖෂධ සැපයීමට නොහැකි පසුබිමක දී මෙම ඇණවුමත් එම සැපයුම්කරුට ප්‍රදානය කිරීමට ප්‍රසම්පාදන කමිටුව ගත් තීරණය සම්බන්ධව විගණනයට ගැටලු සහගත විය.

(ඊ) ඇණවුම් අංක 2023/SPC/X/R/P/00191 යටතේ එන්නත් කුප්පි 1,500 ක් මිලට ගැනීමේ ලංසු ඇරයුමට කුප්පියක් රු.1025 ක (මිල එකහතාවට පසු) වටිනාකම ඉදිරිපත් කළ ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය සහිත අවම දෙවන ලංසුකරු වෙත ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත සෞඛ්‍ය අමාත්‍යාංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් 2023 ජූනි 28 දින අනුමැතිය ලබා දී තිබුණි. අවම මිල වූ ඒකකයක් රු.950 ක් ලෙස ඉදිරිපත් කර තිබූණු ලංසුකරුගේ ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය 2022 මැයි 20 දින කල් ඉකුත්ව එය නැවත අලුත් කිරීම සඳහා වූ සහතිකය ඉදිරිපත් කර තිබුණද ඒ පිළිබඳ සැලකිල්ලක් නොදක්වා අවම ලංසු කරුව ප්‍රතික්ෂේප කර තිබුණි.

61. Methylene Blue injection W/V 10 ml Ampoule 500 mg (SR - 01601201)

(අ) මෙම ඖෂධයේ ඒකක750 ක් මිලදී ගැනීම සඳහා 2022 ඔක්තෝබර් 28 දින අංක 2022/SPC/V/R/P/00715දරන ඇණවුම නිකුත් කර තිබුණු අතර එය ක්‍රියාත්මක වී නොතිබුණි. 2022 අගෝස්තු 25 දින අංක 2022/MSD/E/R/P/00041 දරන ඇණවුම නිකුත් කර තිබුණද, මෙම ඇණවුමට අදාළ ලිපිගොනුවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර 2023 නොවැම්බර් 17 විගණන දින වන විටත් යථෝක්ත ඇණවුම් දෙකම ස්වස්ථ පද්ධතිය තුළ නිකුත් කළ ඇණවුම් ලෙස පෙන්නුම් කෙරෙන බව නිරීක්ෂණය විය.

(ආ) ඒකක 4,000 ක 2022 සාමාන්‍ය ඇණවුම 2021 පෙබරවාරි 02 දින නිකුත් කර තිබුණි. 2023 නොවැම්බර් 17 විගණන දිනට ස්වස්ථ පද්ධතියට අනුව මෙම ඇණවුම යටතේ ඒකක 4,000 ක් ලැබිය යුතු තොග ලෙස නිරූපනය කරන බව නිරීක්ෂණය විය. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුගෙන් මිලදි ගැනීමට ලබාදී තිබුණු තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය නොසලකා ප්‍රසම්පාදන කමිටුව තීරණ ගැනීම

හේතුවෙන් 2022 වර්ෂයට ඖෂධ මිලට ගැනීමට සිදුකරන ලද ඇණවුම සඳහා 2023 වර්ෂයේදී නැවත මිල ගණන් කැදවීමට සිදුවී තිබුණි.

(ඇ) අංක 2022/SPC/E/R/P/00500 දරන ඒකක 250 ක ඇණවුම 2022 ජූනි 30 දින නිකුත් කර තිබුණි. සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව 2022 ජූලි 15 දින පුවත්පත් මඟින් සිදු කරන ලද ලංසු කැදවීමට අනුව ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනය 2022 ජූලි 22 විය. 2022 අගෝස්තු 16 දින ප්‍රසම්පාදන කමිටුව රැස්ව තිබුණු අතර අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතනයට ඒකකයක් රු.6,100 ක මිලකට මෙම ඇණවුම ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණි. මාස 02 කට අධික ප්‍රමාදයක් සහිතව 2022 සැප්තැම්බර් 02 දින ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණි. මෙම ප්‍රසම්පාදන කමිටු තීරණය සඳහා අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි ලිපිගොණුවේ ඇතුළත් නොවීය. මෙම කාල සීමාව තුළ ඖෂධ නොමැති වීම හේතුවෙන් මහනුවර ජාතික රෝහල විසින් මෙම ඖෂධය ඒකක 25 ක් රු.56,000 කට මිලදී ගෙන තිබුණි. මෙම ඖෂධයේ ඇස්තමේන්තුගත ඒකක මිල රු. 17,000 ක් පමණ වීමත්, සාමාන්‍ය ඇණවුමේදි පිළිගත් මිල ඒකකයක් රු.6,500 ක් වීමත් හදිසි මිල දී ගැනීම යටතේ මිල දී ගත් ඒකක මිල රු. 6,100 ක් වීමත්, ප්‍රාදේශීය මිලදි ගැනීම් වලදි ඒකකයක් රු.1,600 හා රු. 2,400 ක් වීමත් විගණනයේ දී ගැටළුකාරී විය.

(ඈ) 2022 ජනවාරි වන විට නිකුත් කළ යුතු සාමාන්‍ය ඇණවුමට අදාළ ඇණවුම් පාලන පත්‍රිකාව 2022 ජූනි මස පිළියෙල කර ඖෂධ ඇණවුම් නිකුත් කළ යුතු නැති බවට තීරණය කර නියමිත දිනට වඩා මාස 11 කට පමණ පසුව 2022 නොවැම්බර් 15 දින ඒකක 750 ක 2023 සාමාන්‍ය ඇණවුම නිකුත් කර තිබුණි. ඇණවුම නිතුක් කිරිමෙන් පසු ලංසු කැදවීම සඳහා මාස 03 කට ආසන්න කාලයක් ගත කර තිබුණි. ලංසු විවෘත කර, ඇගයීම 2023 මාර්තු 07 හා 08 දිනවල සිදු කර තිබුණු අතර ඒ සඳහා සති 03 කට ආසන්න කාලයක් ගත කර තිබුණි. ඇගයීම් වාර්තාවට අනුව අදාළ සාමාජිකයන් ගේ නම්, තනතුරු සඳහන් කර නොමැතිව අත්සන් කර තිබුණි. 2023 මාර්තු 23 දින රැස්ව තිබුණු ප්‍රසම්පාදන කමිටුව විසින් ඒකකයක් වෙනුවෙන් රු.4,408.18 ක අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි ආයතනයක් වන බැවින් එම ආයතනයේ නියෝජිතයකු කැඳවා මිල කේවල් කිරීමක් පිළිබඳව සාකච්ඡා කිරීම සුදුසු බවට උපදෙස් ලබා දී තිබුණි. 2023 ජූනි 01 දින නැවත ප්‍රසම්පාදන කමිටුව රැස්ව තිබුණු අතර අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනය මිල අඩු කිරීමක් සඳහා එකඟ වී නොමැති බැවින් ඒකකයක් සඳහා රු. 6,659.32 ක දෙවන අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනයෙන් මිල ගණන් අඩු කිරීම පිළිබඳව විමසීමට තීරණය කර තිබුණු අතර ලිපිගොනුව මෙම තීරණයෙන් පසු නිමකර තිබුණි. මෙම ඇණවුම 2022 නොවැම්බර් 15 දින නිකුත් කර තිබුණද ස්වස්ථ පද්ධතියට අනුව මෙම ඇණවුම් 2022 ජූනි 23 දින නිකුත් කරන ලද ඇණවුමක් ලෙස දක්වා තිබුණි. 2022 වර්ෂයේදි හදිසි මිලදි ගැනීමක් ලෙස මෙම ඖෂධයේ ඒකකයක් රු.6,100 ක මිලකට මිලදී ගෙන තිබියදී, 2023 සාමාන්‍ය ඇණවුම සඳහා ඉදිරිපත් කරන ලද ඒකකයක් සඳහා වූ රු.4,408.18 ක මිල තවදුරටත් අඩු කර ගැනීමට උත්සාහ කළද, සැපයුම්කරු ඒ සඳහා එකඟ නොවීම හේතුවෙන් දෙවන අවම මිල වූ රු.6,659.32 ක් ඉදිරිපත් කරන ලද ලංසුකරු වෙත යොමු වී මිල ගණන් අඩු කිරීමට උක්සාහ කිරීම එම ලංසුකරු වෙත මෙම ලංසුව පිරිනැමීම සඳහා දරන උත්සාහයක් බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ඉ) 2023 නොවැම්බර් 21 දිනට මෙම ඖෂධයට අදාළ ජාතික මට්ටමේ තොගය ඒකක 254 ක් වූ අතර 2024 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුම 2023 ජනවාරි මාසයේදි ලබාදිය යුතු වුවත් 2023 නොවැම්බර් 21 දින වන විටත් එම ඇණවුම නිකුත් කර නොතිබුණි. විගණන දිනට ලැබිය යුතු ලෙස දැක්වෙන ඒකක 25,020 ක ඖෂධ ප්‍රමාණය ලැබීමේ නිශ්චිතතාවයක් නොමැති බව විගණනයේදි නිරීක්ෂණය වන බැවින් මෙම තත්ත්වය තුළ 2024 වර්ෂයේදිද හදිසි මිලදි ගැනීම් සඳහා යොමු වීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

62. Exemestane Tab. 25mg (SR 01207901)

(අ) 2020 සිට 2023 මැයි 31 දින දක්වා මෙම ඖෂධයේ ඇස්තමේන්තුගත ප්‍රමාණයන්, ඇණවුම් කළ ප්‍රමාණයන්, වෛද්‍ය සැපයීම් අංශයට ලැබුණු ප්‍රමාණයන් හා උපයෝජනය කළ ප්‍රමාණයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2019 සිට 2023 දක්වා කාලය තුළ නිකුත්කළ ඇණවුම් 06 කට අදාළව එකතුව ඒකක 248,500 ක් ලැබිය යුතු ඇණවුම් ලෙස දක්වා තිබුණි. කෙසේ වුවත්, 2023 නොවැම්බර් 17 දිනට ස්වස්ථ පද්ධතිය තුළ 2021 සහ 2022 වර්ෂ වලට අදාළව එකතුව ඒකක 65,500 ක ඇණවුම් 02 ක් පමණක් ලැබිය යුතු ලෙස දක්වා තිබුණි.

(ආ) ස්වස්ථ පද්ධතිය තුළ අංක 2022/SPC/V/R/P/00690 දරන ඒකක 15,500 ක ඇණවුමක් නිකුත් කළ ඇණවුමක් ලෙස පෙන්නුම් කළද එම ඇණවුමට අදාළ ඖෂධ ප්‍රමාණය ස්වස්ථ පද්ධතිය තුළ ලැබිය යුතු ඇණවුමක් (Pending Orders) ලෙස දක්වා නොතිබුණි.

(ඇ) 2021 වර්ෂය වෙනුවෙන් නිකුත් කළ සාමාන්‍ය ඇණවුමට අදාළව ඒකක 122,500 ක ඖෂධ තොග ලැබිය යුතු පදනම මත 2022 සාමාන්‍ය ඇණවුම නිකුත් කර නොතිබුණු අතර, 2023 නොවැම්බර් 15 විගණිත දින වනවිටත් එම තොග වෛද්‍ය සැපයීම් අංශයට ලැබී නොතිබුණි. 2022 වර්ෂය සඳහා සාමාන්‍ය ඇණවුමක් නිකුත් නොකළද එකතුව ඒකක 20,500 ක ඇණවුම් 02 ක් හදිසි පදනම මත නිකුත් කර තිබුණි.

(ඈ) මුදල් අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය (HSEPP) වෙනුවෙන් හඳුන්වා දී තිබුණු උපදෙස් (Guideline) ප්‍රකාරව 2022 වර්ෂය සඳහා 2022 ජුනි 28 දින අංක 2022/SPC/E/R/P/00469 දරන ඒකක 5,000 ක ඇණවුමක් නිකුත් කර තිබුණි. ලංසුකරුවන් දෙදෙනෙකු ලංසු ඉදිරිපත් කර තිබුණු අතර, 2022 අගෝස්තු 29 දින සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් විසින් ලංසු ප්‍රදානය කිරීමට තීරණය ලබාදී තිබුණි. කෙසේ වුවත් මෙම තීරණයට අදාළ අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලිපි ගොණුවේ ඇතුළත් වී නොතිබුණි.

(ඉ) අංක 2022/MSD/V/R/P/00110 දරන ඒකක 15,500 ක ඇණවුම 2022 නොවැම්බර් 01 දින නිකුත් කර තිබුණි.. ගැනුම් ඇණවුම 2022 නොවැම්බර් 30 දින නිකුත් කර තිබුණි. ගැණුම් ඇණවුම අනුව 2022 දෙසැම්බර් 30 දින ඖෂධ සැපයිය යුතු බව සඳහන් කර තිබුණද විගණන දිනය වූ 2023 නොවැම්බර් 16 වන විටත් වෛද්‍ය සැපයීම් අංශයට අදාළ ඖෂධ තොගය සැපයුම් කර නොතිබුණි. ලංසු ලේඛනවල කාර්යසාධන බැඳුම්කර ලබා ගැනීම සම්බන්ධව වගන්තියක් සඳහන් කර නොතිබුණු අතර 2022

නොවැම්බර් 02 දින සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් තම අධිකාරි බලය අභිවඩා යමින් කාර්යසාධන බැඳුම්කරය ලබා නොගත යුතු බවට හා ගිවිසුම් ගත වීම අවශ්‍ය නොවන බවට අනුමැතිය ලබාදි තිබුණි. ඒ අනුව මෙම තොගය ලබා නොදීම සම්බන්ධයෙන් කිසිදු ආවරණයක් අමාත්‍යාංශයට හිමි වී නොතිබුණි.

(ඊ) 2021 වර්ෂයේ සාමාන්‍ය ඇණවුමට අදාළ ඖෂධ තොග ලැබිය යුතු පදනම මත 2022 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුම නිකුත් නොකර 2022 වර්ෂයෙදී හදිසි මිලදි ගැනීම් සඳහා ක්‍රියාකර තිබියදි 2021 වර්ෂයට අදාළ ඖෂධ ලැබිය යුතු ලෙස තවදුරටත් උපකල්පනය කර 2023 වර්ෂය වෙනුවෙන්ද සාමාන්‍ය ඇණවුමක් නිකුත් නොකිරීමට තීරණය කර තිබුණු අතර 2023 වර්ෂය වෙනුවෙන් වූ සාමාන්‍ය ඇණවුම නිකුත් කළ යුතු දිනට මාස 11 කට පමණ පසුව ඒකක 30,000 ක් සැපයීම සඳහා 2022 නොවැම්බර් 23 දින සාමන්‍ය ඇණවුමක් නිකුත් කර තිබුණි.

(උ) සාමාන්‍ය ඇණවුමක් නියමිත දිනයේදි ලබාදුන්නේ නම් විවෘත මිල කැඳවීමක් යටතේ ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කිරීමට හැකියාව තිබුණද පවතින හදිසි තත්ත්වය තුළ දින 07ක් ඇතුළත ලියාපදිංචි හා පසුගිය සැපයුම්කරුවන්ගෙන් සීමිත මිල ගණන් යටතේ ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව, ඇණවුම නිකුත්කර දින 30 කට පසුව අනුමැතිය ලබාදී තිබුණි. මෙම අනුමැතියෙන් දින 56 කට පසුව ලියාපදිංචි හා පසුගිය සැපයුම්කරුවන්ට 2023 පෙබරවාරි 16 දින ෆැක්ස් මඟින් ලංසුකරුවන් දැනුවත් කර තිබුණු අතර, ලංසුකරුවන්ට ප්‍රතිචාර දැක්වීමට සාධාරණ කාලයක් ලබාදී නොතිබුණි.

(ඌ) අංක 2023/SPC/X/R/P/00191 දරන ඒකක 50,000 ක ඇණවුම මුදල් අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය (HSEPP) වෙනුවෙන් හදුන්වා දී තිබුණු උපදෙස් (Guideline) ප්‍රකාරව ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ 2023 මැයි 25 දින නිකුත් කර තිබුණි. ඇණවුමෙන් දින 20කට පසුව ලංසු ඉදිරිපත් කිරීමට ආරාධනා කර තිබුණු අතර, දින 02 ක ලංසු කාලයක් පමණක් ලබාදි තිබුණි. ලංසුකරුවන් දෙදෙනෙකුට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් නොතිබුණි. ඒ අනුව ඉතිරි ලංසුකරු විසින් වැඩිම ලංසු වටිනාකම ඉදිරිපත් කර තිබුණද ලංසු විවෘත කරන ලද දිනෙන් දින 11 කට පසුව 2023 ජුනි 27 දින තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා ජුනි 28 දින සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්ගේ නිර්දේශ මත එම ලංසුකරු තෝරා ගෙන තිබුණද ප්‍රසම්පාදන තීරණය සඳහා අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලබා ගත් බවට සාක්ෂි ගොණුවේ ඇතුළත් කර නොතිබුණි.

(එ) ලංසු ප්‍රදානයෙන් දින 71 කට පසුව 2023 සැප්තැම්බර් 07 දින ඒකකයක් රු.1,286.17 ක් බැගින් මිලට ගැනීම සඳහා ගැණුම් ඇණවුම නිකුත්කර තිබුණු අතර , ඒකක 50,000ක් 2023 නොවැම්බර් 30 දින වනවිට සපයන ලෙස දක්වා තිබුණි. කෙසේ වුවත්, 2023 ජුනි 15 හා අගෝස්තු 15 යන දිනයන්හි ඒකක 25,000 බැගින් ඖෂධ සපයන ලෙස පද්ධතිය මඟින් ඇණවුම ලබා දී තිබුණු අතර, ලංසු ලියවිලි අනුව එක් මාසයක් ඇතුළත ඒකක 50,000 ක් සැපයිය යුතු බවත් දක්වා තිබුණි. ඇණවුම නිකුත් කරන ලද අවස්ථාව වනවිටත් වෛද්‍ය සැපයීම් අංශය සතුව ඖෂධ තොග නොතිබුණු අවස්ථාවක ඖෂධ තොග “ වහාම” සපයන ලෙස ඇණවුම නිකුත් නොකිරීමද විගණනයේදි ගැටලු සහගත විය. 2023 නොවැම්බර් 17 විගණිත දින වනවිටත් සැපයුම්කරු කාර්යසාධන බැඳුම්කරය ලබා දී නොතිබුණු අතර සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමක් ඇතිකර ගෙනද නොතිබුණි.

(ඒ) 2024 වර්ෂය සඳහා සාමාන්‍ය ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා ඇණවුම් පාලන පත්‍රිකාවක් 2023 නොවැම්බර් 17 දින වනවිටත් සකස්කර නොතිබුණි. ඒ අනුව 2024 වර්ෂය සඳහා ඇණවුම නිකුත් කරන්නේද යන්න පිළිබඳ තීරණයකට එළඹ නොතිබුණි. මෙම තත්ත්වය තුළ 2024 වර්ෂයේ දී ද හදිසි මිල දී ගැනීම් සඳහා යොමු වීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය කෙරේ.

63. Thalidomide Capsule 100mg (SR - 01206401)

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2019 සිට 2023 දක්වා කාලය තුළ නිකුත්කළ ඇණවුම් 07 කට අදාළව එකතුව ඒකක 447,463 ක් ලැබිය යුතු ඇණවුම් ලෙස දක්වා තිබුණි. කෙසේ වුවත්, 2023 නොවැම්බර් 17 දිනට ස්වස්ථ පද්ධතිය තුළ 2021 සහ 2022 වර්ෂ වලට අදාළව එකතුව ඒකක 156,500 ක ඇණවුම් 02 ක් පමණක් ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. 2023 නොවැම්බර් 21 දිනට ස්වස්ථ පද්ධතිය තුළ දැනට පවතින තොග පිළිබඳ විස්තරයෙහි (Availability) ලැබිය යුතු තොග (Balance Due) ලෙස ඒකක 563,500 ක් පෙන්නුම් කරන අතර, එම තොග ලැබීමට ඇත්තේ කුමණ ඇණවුම් වලට අදාළවද යන්න පිළිබඳව නිශ්චිත තොරතුරු පද්ධතිය තුළ ඇතුළත් වී නොතිබුණි.

(ආ) 2020 වර්ෂය සඳහා නිකුත්කළ ඒකක 134,463 ක ඇණවුම් දෙකකට අදාළ ඖෂධ තොග 2023 නොවැම්බර් 21 දින වනවිටත් වෛද්‍ය සැපයීම් අංශයට ලැබී නොතිබුණු අතර 2022 වර්ෂය තුළ එම වර්ෂයට අදාළව හෝ ඊට පෙර වර්ෂ වලට අදාළව හෝ ඇණවුම් තොග කිසිවක් ලැබී නොතිබුණු බැවින් එම වර්ෂයට අදාළ නිකුත් කිරීම් ප්‍රමාණය ඇණවුම් වලට සාපේක්ෂව සියයට 13 ක් පමණක් වී තිබුණි.

(ඇ) 2023 වර්ෂය සඳහා රෝහල්වල වාර්ෂික ඇස්තමේන්තුව ඒකක 175,250 ක් වූ අතර, 2023 මැයි 31 දිනට නිකුත් කළ ඇණවුම් ඒකක ප්‍රමාණය ඒකක 241,500ක් විය. එදිනට එම ප්‍රමාණය ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 38 ක වැඩිවීමක් විය.

(ඈ) ස්වස්ථ පද්ධතිය තුළ අංක 2022/SPC/V/R/P/00690 දරන ඇණවුමක් නිකුත් කළ ඇණවුමක් ලෙස පෙන්නුම් කළද එම ඇණවුමට අදාළ ඖෂධ ප්‍රමාණය ස්වස්ථ පද්ධතිය තුළ ලැබිය යුතු ඇණවුමක් ලෙස දක්වා නොතිබුණි.

(ඉ) පිළියෙල කරන ලද ඇමුණුම් පාලන පත්‍රිකාව අනුව ඒකක 23,024 ක් ඇණවුම් කළ යුතු වුවත්, මෙම ඖෂධය සඳහා 2022 වර්ෂය වෙනුවෙන් සාමාන්‍ය ඇණවුම නිකුත් නොකිරීමට වෛද්‍ය සැපයීම් අංශය විසින් තීරණය කර තිබුණි. 2018, 2020 හා 2021 වර්ෂ වෙනුවෙන් නිකුත්කළ එකතුව ඒකක 412,500 ක්වූ ඇණවුම් වලට අදාළව ලැබිය යුතු තොග පදනම් කරගෙන තිබුණද, විගණිත දින වනවිටත් ඉන් ඒකක 163,463 ක තොග වෛද්‍ය සැපයීම් අංශයට ලැබී නොතිබුණි.

(ඊ) අංක 2022/SPC/X/R/P/00306 දරන ඒකක 100,000 ඇණවුම හදිසි අවශ්‍යතාවය මත රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත පද්ධතිය හරහා යොමු කර තිබුණි. අවම මිල ඉදිරිපත් කරන ලද ලංසුකරුට ප්‍රසම්පාදන කමිටු නිර්දේශය ලබා දී තිබුණි. ඉන්දියානු ණය පහසුකම යටතේ ඖෂධ තොග සැපයීම සඳහා ණය සම්බන්ධීකරණ ඒකකයේ

අනුමැතිය 2022 දෙසැම්බර් 05 දින ලැබී තිබුණු අතර, අනුමැතිය ලැබීමේ ප්‍රමාදය මත ගැණුම් ඇණවුමෙහි සඳහන් ඖෂධ තොග සැපයිය යුතු දිනය පසුවී දින 122 කට පසු 2023 ජනවාරි 30 දින ඇණවුම සපයා තිබුණි. ඒ වනවිට ඖෂධ තොගයෙහි ඉතිරි සක්‍රීය ජීව කාලය මාස 21 ක් පමණ වී තිබුණි. 2022 මාර්තු 26 දින ඇණවුම හදිසි පදනම මත නිකුත්කර දින 310 ක පමණ කාලයක් ඖෂධ තොග සැපයීම ප්‍රමාද කර තිබුණු අතර හදිසි අවශ්‍යතාවය යන්න ‘‘ලංසු ඉදිරිපත් කිරීමට දින 05 ක පමණ කාලයක් ලබාදීම’’ යන්නට පමණක් සිමාවී තිබුණි.

(උ) අංක 2022/SPC/E/R/P/00744 දරන ඒකක 40,000 ක හදිසි අවශ්‍යතාවය මත ඇණවුම සඳහා ෆැක්ස් මඟින් ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර තිබුණි. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය 2022 මාර්තු 15 දිනෙන් අවසන්වූ, ඒකකයක් රු. 347 ක පස්වෙනියට අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුට මිල එකඟතාවයකට යටත්ව ඇණවුම ලබාදීමට තීරණය කර තිබුණි. ඒකකයක් රු. 297 ක් බැගින් වූ ගැණුම් ඇණවුම ලංසු අනුමැතියෙන් දින 13 කට පසු නිකුත්කර තිබුණි. සැපයුම්කරු විසින් ඇණවුමෙහි සඳහන් දිනට පෙර 2023 ජනවාරි 30 ඖෂධ තොග සපයා තිබුණු අතර, ලංසු කොන්දේසි අනුව මෙම ඖෂධයේ අවම ආයු කාලය මාස 24 ක් ලෙස සඳහන් කර තිබුණද සැපයුම්කරු විසින් මාස 36 ක ආයු කාලයක් සහිත ඖෂධ තොග සපයන බවට ලංසු ලේඛනවල සඳහන් කර තිබුණි. තවද, ලංකාවට ඖෂධ තොග සපයන දිනට ඖෂධයේ ඉතිරි ආයු කාලය අවම මාස 12 ක ආයුකාලයක් සහිතව සපයන බව කොන්ත්‍රාත් ගිවිසුමෙහිත් සඳහන් කර තිබුණද, මාස 06 ක පමණ ආයු කාලයක් පවතින, සැපයුම්කරු සතුව පැවති අතැති තොගයක් මෙලෙස වෛද්‍ය සැපයීම් අංශයට සපයා තිබුණි.

(ඌ) ඒ අනුව ලංසු කොන්දේසි හා ගිවිසුම් කොන්දේසි වලට අනුකූළ නොවන පරිදි ඖෂධ තොග බාරගෙන තිබුණු අතර ලංසු කොන්දේසි ගිවිසුම්ගත විමේදි වෙනස් කිරීමටද ලක්කර තිබුණි. මෙම ඖෂධය සඳහා සැපයුම්කරු සතුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකයක් නොතිබුණු අතර ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයක්ද (WOR) නොතිබුණි. තත්ත්වය එසේ තිබිය දී ලංසු කොන්දේසි වලට පටහැනි වෙමින් මෙම ඖෂධය භාරගෙන තිබුණි. 2023 මැයි 04 දින මෙම ඇණවුමට අදාළ ඒකක ගණන සියයට සියයකින් ඉහල නැංවීමට තීරණය කර තිබුණි. ඒ අනුව ඒකකයක් රු.297 බැගින් ඒකක 40,000 ක් සැපයුම්කරුගෙන් සපයා ගැනීමට සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් 2023 ජුනි 13 දින තීරණය ලබාදී තිබුණු අතර ඊට අදාළ අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලබා ගත් බවට සාක්ෂි ගොණුවේ ඇතුළත් නොවීය. මෙම ඖෂධය සැපයීමට අදාළව පමණක් ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් 2023 ජුනි 24 නිකුත්කළ සහතිකය මත ඖෂධ තොග සපයා තිබුණි.

(එ) මෙම ඖෂධය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරීයේ ලියාපදිංචි එකම සැපයුම්කරුගේ ලියාපදිංචිය 2022 මාර්තු 15 දිනෙන් අවසන් වී තිබුණු අතර තම ලියාපදිංචිය අළුත් කිරීම සඳහා 2023 මැයි 20 දින ඉල්ලීමක් කර තිබුණි. ඖෂධය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොමැති තත්ත්වයක් යටතේ මෙම ඉල්ලීම කඩිනමින් සලකා බැලිය යුතු වුවත් විගණන අවස්ථාව වූ 2023 දෙසැම්බර් 01 වන විට මාස හතක පමණ කාලයක් ගතවී තිබුණද ජාතික ඖෂධ නියාමන අධිකාරීය විසින් ඒ සඳහා තීරණයක් ලබා දී නොතිබුණි.

(ඒ) 2018, 2020 හා 2021 වර්ෂ වෙනුවෙන් නිකුත් කළ ඇණවුම් වලට අදාළව ඒකක 412,500 ක ඖෂධ තොග ලැබිය යුතු පදනම මත 2022 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුම නිකුත් නොකර 2022 වර්ෂයේදී හදිසි මිලදී ගැනීම් සඳහා ක්‍රියාකර තිබියදී මෙම ඇණවුම් අතරින් ඒකක 167,523ක් ලැබිය යුතු ලෙස තවදුරටත් උපකල්පනය කර ඒකක 79,534 ක ඇණවුමක් නිකුත් කළ යුතු වුවද, 2023 වර්ෂය වෙනුවෙන්ද සාමාන්‍ය ඇණවුමක් නිකුත් නොකිරීමට තීරණය කිරීම වගකිව යුතු නිලධාරීන් වගකීම් විරහිතව කටයුතු කිරීමක් බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ඔ) ඒකක 30,000 ක 2023 සාමාන්‍ය ඇණවුම 2022 නොවැම්බර් 16 දින නිකුත් කර තිබුණු අතර ඒ අනුව පිළිවෙලින් 2023 ජනවාරි 12 හා අප්‍රේල් 12 දින ඒකක 45,000 ක් හා ඒකක 40,000 ක් බැගින් සැපයිය යුතු විය. ඇණවුම නිකුත් කර දින 27 කට පසු ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර තිබුණි. ප්‍රසම්පාදන තීරණයෙන් දින 65 කට පසුව 2023 පෙබරවාරි 16 දින ෆැක්ස් මඟින් ලංසු ඉදිරිපත් කිරීමට ආරාධනා කර තිබුණු අතර, වෙබ් පිටුවේ හා පුවත්පත් දැන්වීම් මඟින් ලංසු කැඳවීම් පිළිබඳ විස්තර ලිපිගොණුවේ නොතිබුණි. දින 07 ක ලංසු කාලය තුළ ලංසුකරුවන් 05 දෙනෙකු ලංසු ඉදිරිපත් කර තිබුණු අතර, ලංසුකරුවන් සියලු දෙනාටම ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් නොතිබුණි.

(ඕ) පිළිකා විශේෂඥ වෛද්‍යවරයෙක් ඒකකයක් රු. 90.62 ක දෙවෙනියට අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුවෙකු නිර්දේශ කර තිබුණි. 2023 මාර්තු 24 දින පැවැත්වූ තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව ඒකකයක් රු. 74.50 ක අවම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු හට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ බලපත්‍රයක් ලබා ගැනීමේ පදනම මත, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ඉදිරිපත් කර දින 25 කට පසුව හා 2023 අප්‍රේල් 19 දින ප්‍රසම්පාදන කමිටු නිර්දේශය ලබාදී තිබුණි. ලංසු ප්‍රදානය කිරීමෙන් දින 26 කට පසුව 2023 මැයි 16 දින ලංසු ප්‍රදානය ලංසුකරුට දන්වා තිබුණු අතර, දින 6 කට පසු 2023 මැයි 26 දින සැපයුම්කරු ලංසුව තහවුරු කර තිබුණි. කෙසේ වුවත්, WOR සහතිකය ලබා ගැනීම සඳහා අදාළ ලියවිලි ඉදිරිපත් කරන ලෙස වරින්වර සැපයුම්කරුට විද්‍යුත් තැපෑල හරහා දන්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. මෙම ප්‍රසම්පාදනය විධිමත් පරිදි අවලංගු කර තිබේද, ඊට අදාළ ප්‍රසම්පාදන තීරණයක් තිබේද, කාර්යසාධන බැඳුම්කරයක් ලබාගෙන තිබේද, ගිවිසුම්ගත වීමක් තිබේද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කරන ලද ලිපිගොනුව තුළ ඇතුළත් කර නොතිබුණි.

(ක) අංක 2023/SPC/T/R/P/00146 දරන ඒකක 28,500 ක ඇණවුම මුදල් අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය (HSEPP) වෙනුවෙන් හඳුන්වා දී තිබුණු උපදෙස් ප්‍රකාරව විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ලබාදෙන ලද අරමුදල් භාවිතා කර මිලදී ගැනීම සඳහා නිකුත් කර තිබුණි. ලංසුකරුවන් අතරින් ඒකකයක් රු.79.80 ක අවම මිලකට සැපයීමට ලංසු ඉදරිපත් කළ ලංසුකරුගේ ප්‍රමාණවත් අතැති තොගයක් නොමැති වීම මත තෝරාගෙන නොතිබුණු අතර, ඒ අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයක් ලබා ගැනීමේ පදනම මත ඒකකයක් රු. 150 කට සැපයීමට ලංසු ඉදිරිපත් කළ දෙවනියට අවම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට ඇගයීම් කමිටු නිර්දේශ මත සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් විසින් ලංසු ප්‍රදානය කිරීමට තීරණය ලබාදී තිබුණි. කෙසේ වුවත් මෙම තීරණයට අදාළ අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලිපි ගොණුවේ ඇතුළත්

නොවීය. ගැණුම් ඇණවුම ලංසු අනුමැතියෙන් දින 48 කට පසු 2023 මැයි 08 දින නිකුත්කර තිබුණි. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයක් (WOR) 2023 මැයි 19 දින නිකුත් කර තිබුණු අතර, ගැණුම් ඇණවුමෙහි සඳහන් දිනෙන් දින 114 කට පසුව සැපයුම්කරු විසින් 2023 ඔක්තෝබර් 05 දින ඖෂධ තොග වෛද්‍ය සැපයීම් අංශයට ලබාදී තිබුණි.

(ග) මුදල් අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය වෙනුවෙන් හදුන්වා දී තිබුණු උපදෙස් ප්‍රකාර ඉන්දියානු ණය යෝජනා ක්‍රමය මඟින් ලබාදෙන ලද අරමුදල් භාවිතා කර 2023 මැයි 25 දින අංක 2023/SPC/X/R/P/00191 දරන ඒකක 128,000 ක ඇණවුම නිකුත් කර තිබුණි. ඒකකයක් රු.76, රු.164.05 ,රු. 171.5 හා රු.220 ක් ලෙස ලංසු ඉදිරිපත් කළ ලංසුකරුවන් හතර දෙනාගේ ලංසු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකය, අතැති තොගය හා සැපයුම් කාලය ලංසු කොන්දේසි හා නොගැලපීම මත තෝරා ගැනීමට ලක්කර නොතිබුණි.

(ච) ඒ අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයක් ලබා ගැනීමට යටත්ව ඒකකයක් රු.674 ක වැඩිම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට ලංසු විවෘත කරන ලද දිනෙන් දින 11 කට පසුව 2023 ජුනි 27 දින මිල ඇගයීම් කමිටු නිර්දේශ මත සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් විසින් ඒකකයක් රු. 674 කට සැපයීමට ලංසු ප්‍රදානය කිරීමට තීරණය ලබාදී තිබුණි.කෙසේ වුවත් මෙම තීරණයට අදාළ අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලිපි ගොණුවේ ඇතුළත් නොවීය. සියලුම ලංසුකරුවන්ට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් නොමැති අවස්ථාවක මෙලෙස වැඩිම මිලක් ඉදිරිපත් කළ ලංසුකරුට ලංසු පිරිනැමීම විගණනයේදී ගැටලු සහගත වූ අතර, මෙම ඇණවුමට ආසන්නව 2023 පෙබරවාරි 02 නිකුත්කළ ඇණවුමෙහි ඒකකයක පිරිවැය රු. 150 ක් වී තිබුණි. තවද, අඩුම මිල ඉදිරිපත් කළ ලංසුකරුට සාපේක්ෂව මිල වැඩිවීම සියයට 786 ක් වී තිබුණි. ගැණුම් ඇණවුම ලංසු අනුමැතියෙන් දින 72 කට පසු 2023 සැප්තැම්බර් 08 දින නිකුත්කර තිබුණි. කෙසේ වුවත්, විගණිත දින වනවිටත් වෛද්‍ය සැපයීම් අංශයට ඖෂධ තොග සපයා නොතිබුණි.

(ඡ) 2024 වර්ෂය සඳහා සාමාන්‍ය ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා ඇණවුම් පාලන පත්‍රිකාවක් 2023 නොවැම්බර් 23 දින වනවිටත් සකස්කර නොතිබුණි. ඒ අනුව 2024 වර්ෂය සඳහා ඇණවුම නිකුත් කරන්නේද යන්න පිළිබඳ තීරණයකට එළඹ නොතිබුණි. මෙම තත්ත්වය තුළ 2024 වර්ෂයේදිද හදිසි මිලදි ගැනීම් සඳහා යොමු විමට සිදුවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

64. Allopurinol Tab 100mg (SR - 01401001)

(අ) 2020 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රමාණය ඉක්මවා සියයට 127 ක ඖෂධ ඇණවුම් කර තිබුණු අතර 2021 වර්ෂයේ සිට 2023 වර්ෂයේ විගණිත දින දක්වා ඇස්තමේන්තු ගත ප්‍රමාණයන්ට ප්‍රමාණවත් තොග ඇණවුම් කර නොතිබුණු අතර ඇණවුම් ප්‍රමාණයන්ද නියමිත පරිදි ලැබී නොතිබුණි.

(ආ) 2020 හා 2022 වර්ෂවල ඇස්තමේන්තුව ඉක්මවා රෝහල් වෙතින් ඇණවුම් කර ඇති බව නිරීක්ෂණය විය. නමුත් නිකුත් කළ ප්‍රමාණය ඇස්තමේන්තු අගයන් හා සැසඳීමේදී සියයට 68 සහ සියයට 51 ක අගයක් වී තිබුණි.

(ඇ) එමෙන්ම ඇණවුම් කළ ප්‍රමාණයට ප්‍රමාණවත් ඖෂධ තොග රෝහල් වෙත නිකුත් කර නොමැති බව නිරීක්ෂණය වූ අතර එය ප්‍රතිශතයක් ලෙස ගත්කළ සියයට 16 සිට සියයට 62 ක් දක්වා පරාසයක පැවතුණි. 2023 ජනවාරි සිට මැයි 31 දින දක්වා රෝහල් විසින් අවස්ථා 37ක දී ඉල්ලුම් කරන ලද ඖෂධ ඒකක 277,650 ක ප්‍රමාණයක් සපයා නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) අංක 2022/SPC/V/R/P/00659 දරන ඇණවුම වෙනුවට අංක 2022/MSD/V/R/P/00072 දරන ඇණවුම නිකුත් කර තිබුණද ස්වස්ථ පද්ධතියේ අංක 2022/SPC/V/R/P/00659 දරන ඇණවුම විගණිත දිනය වන විටත් නිකුත් කළ ඇණවුමක් ලෙස පෙන්නුම් කෙරුණි.

(ඉ) 2022 වර්ෂය වෙනුවෙන් වූ ඒකක 4,200,000 ක සාමාන්‍ය ඇණවුම, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත යොමුකර තිබුණි. ප්‍රසම්පාදන තීරණය ලංසු කරුට දැන්වීම සඳහා දින 28ක් ගත කර තිබුණි. මීට අදාළ ඉතිරි තොගය වූ ඒකක 2,200,000 ඖෂධ තොගය 2023 ඔක්තෝබර් දක්වා ලැබී නොතිබුණි.

(ඊ) අංක 2022/SPC/E/R/P/00627 දරන ඇණවුම 2022 සැප්තැම්බර් 16 දින ලබාදී තිබුණි. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) වෙත දක්වා තිබුණු ඖෂධ 89 ට අදාළ ලිපිගොණු ආසියා සංවර්ධන බැංකුව (ADB) යටතේ මිලදී ගැනීමට ඉදිරිපත් කර තිබුණු අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීමට අනුමැතිය ලබාදී තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුවේදී NMRA සහතිකය හෝ WOR ලබා ගැනීමට යටත්ව අවම ලංසුව ඉදිරිපත් කරන ලද සමාගම වෙතින් සපයා ගැනීමට තීරණය කර තිබුණු නමුත් මෙම ඇණවුම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකළ බවට හෝ අවලංගු කළ බවට සාක්ෂි ලිපිගොනුව තුළ නොතිබුණි. එසේම සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව ලබාදුන් ඉහත තීරණ සඳහා අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(උ) අංක 2024/SPC/N/R/P/00044 දරන ඒකක 1,800,000 ක් මිලදී ගැනීමේ සාමාන්‍ය ඇණවුම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත යොමුකර ඇණවුම් පාලන පත්‍රිකාව අනුව 2024 වර්ෂය සඳහා ඇණවුම් කළ යුතු ඒකක ප්‍රමාණය 4,871,610 ක් වුවත්, ඒකක 3,071,610 ක් අඩුවෙන් ඇණවුම් කර තිබුණි.

65. Bicalutamide Tab. 50mg (SR - 01207001)

(අ) 2021 සහ 2022 වර්ෂවල ඇස්තමේන්තුගත ප්‍රමාණයන් ඉක්මවා ඇණවුම් කර ඇති බව නිරීක්ෂණය වූ අතර 2021 වර්ෂයේ එය ඇස්තමේන්තුගත අගයෙන් සියයට 5 ක වැඩිවීමක් වන අතර 2022 වර්ෂයේ එය ඇස්තමේන්තුගත අගයෙන් සියයට 56 ක වැඩිවීමකි.

(ආ) 2023 වර්ෂය සඳහා රෝහල්වල වාර්ෂික ඇස්තමේන්තුව ඒකක 415,300 ක් වූ අතර, 2023 නොවැම්බර් වන විට නිකුත් කළ ඖෂධ ප්‍රමාණය ඒකක 177,526 ක් විය. එදිනට එම ප්‍රමාණය ඇස්තමේන්තුගත ප්‍රමාණයෙන් සියයට 43 ක ප්‍රමාණයක් වන අතර 2023 වර්ෂයේ ඔක්තෝබර් වන විටත් ඖෂධ තොග ලැබී නොතිබුණි.

(ඇ) අංක 2022/SPC/V/R/P/00690 දරන ඇණවුම වෙනුවට අංක 2022/MSD/V/R/P/00074 දරන ඇණවුම නිකුත් කර තිබුණද ස්වස්ථ පද්ධතියේ අංක 2022/SPC/V/R/P/00690 දරන ඇණවුම තවදුරටත් නිකුත් කළ ඇණවුමක් ලෙස සටහන් වී තිබුණි.

(ඈ) 2023 නොවැම්බර් 21 දිනට මෙම ඖෂධයේ ඒකක 930,416 ක් ලැබීමට ඇති බව ස්වස්ථ පද්ධතියේ පෙන්නුම් කෙරුණි. නමුත් මෙම ඒකක ගණන සැකසුනු ආකාරය පිළිබඳ තොරතුරු මෙම පද්ධතිය තුළ ඇතුළත් වී නොතිබුණි.

(ඉ) අංක 2022/MSD/V/R/P/00074 දරන ඒකක 82,500 ක ඇණවුමට අදාළ පිළිවෙලින් ඒකක 2,000 ක් හා ඒකක 80,500 ක් සපයන ලෙස තෝරාගත් ලංසුකරු වෙත ගැණුම් ඇණවුම නිකුත් කර තිබුණද, 2023 ඔක්තෝබර් 31 දින වනවිටත් ඖෂධ තොගය ලැබී නොතිබුණි. ගිවිසුමක් අත්සන් කිරීමකින් හා කාර්යසාධන බැඳුම්කරයක් ලබා ගැනීමකින් තොරව ඉන්ඩෙන්ටු නිකුත් කිරීම සඳහා සෞඛ්‍ය ලේකම් තම අධිකාරි බලය අභිබවා අනුමැතිය ලබාදී තිබුණි.

(ඊ) 2022 වාර්ෂික සාමාන්‍ය ඇණවුම අවම වශයෙන් මාස 11 කට පමණ පෙර ලබාදිය යුතු වුවත්, 2022 නොවැම්බර් 16 දින ඒකක 165,000 ක ඇණවුම නිකුත් කර තිබුණි. සාමාන්‍ය ඇණවුමක් නියමිත දිනයේදී ලබාදුන්නේ නම් විවෘත මිල කැඳවීමක් යටතේ ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කිරීමට හැකියාව තිබුණද පවතින හදිසි තත්ත්වය තුළ දින 07ක් ඇතුළත ලියාපදිංචි හා පසුගිය සැපයුම්කරුවන්ගෙන් සීමිත මිල ගණන් යටතේ ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටු නිර්දේශ කර තිබුණි.

(උ) ලංසු කැඳවීමට අනුමැතිය ලබාදී දින 60 කට පසු ලංසු කැඳවා තිබුණි. ලංසුකරුවන් 05 දෙනෙකු ඉදිරිපත් කළ ලංසු ලියවිලි අතරින් අවම ප්‍රතිචාර දැක්වූ ලංසුකරු වෙත ඒකකයක් රු.27.38 කට(එ.ජ.ඩොලර් 0.0757) ලංසු පිරිනැමීමට තාක්ෂණික ඇඟයීම් කමිටුව තම නිර්දේශ 2023 මාර්තු 22 දින ලබාදී තිබුණු අතර ඒ සඳහා 2023 අප්‍රේල් 19 දිනැති ප්‍රසම්පාදන කමිටුව නිර්දේශය ලබාදී තිබුණි. ලංසු ප්‍රදානය කර දින 83 කට පසුව, 2023 ජූලි 12 දින ගැණුම් ඇණවුම නිකුත් කර තිබුණි. මෙම ඇණවුමට අදාළ ඖෂධ 2023 නොවැම්බර් 29 දින වන විටත් ලබාදී නොතිබුණි.

(ඌ) මුදල් අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය (HSEPP) වෙනුවෙන් හඳුන්වා දී තිබුණු උපදෙස් ප්‍රකාරව මිලදි ගැනීම සඳහා 2023 මැයි 25 දින ඒකක 190,000 ක අංක 2023/SPC/X/R/P/00191 දරන ඇණවුම නිකුත් කර තිබුණි. ඇණවුමෙන් දින 20කට පසුව සීමිත ලංසු කැඳවීම් යටතේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය සහිත ලංසුකරුවන්ගෙන් 2023 ජුනි 14 දින ලංසු ඉදිරිපත් කිරීමට ආරාධනා කර තිබුණු අතර, දින 02 ක ලංසු කාලයකින් පසුව 2023 ජුනි 16 දින පෙරවරු 10 ට ලංසු වසා දමන බව ඉන් දන්වා තිබුණි.

(එ) ලංසුකරුවන් 05 දෙනෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර, ලංසුකරුවන් දෙදෙනෙකුගේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වලංගු ලියාපදිංචි සහතිකයක් නොතිබුණු අතර දෙදෙනෙකු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය ඉල්ලුම් කර තිබුණි. ඒ අනුව අවම ලංසුව ඉදිරිපත් කළ ආයතනයේ මිල ඒකකයකට රු.22.75ක් වූ අතර ඔහුගේ NMRA සහතිකය 2022 දෙසැම්බර් 22 අවලංගු වීම නිසා වලංගු NMRA සහතිකය හිමි ඒකකයකට රු.46.77ක ලංසු වටිනාකම ඉදිරිපත් කර ආයතනය වෙත ලංසු විවෘත කරන ලද දිනෙන් දින 11 කට පසුව 2023 ජුනි 27 දින තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා ජුනි 28 දින සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්ගේ නිර්දේශ මත තෝරා ගෙන තිබුණද ප්‍රසම්පාදන තීරණය සඳහා අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලබා ගත් බවට සාක්ෂි ගොණුවේ ඇතුළත් කර නොතිබුණි.

(ඒ) ලංසු ප්‍රදානයෙන් දින 75 කට පසුව 2023 සැප්තැම්බර් 11 දින ඒකකයක් රු.43.77 ක් බැගින් මිලට ගැනීම සඳහා ගැණුම් ඇණවුම නිකුත්කර තිබුණු අතර , ඒකක 189,990 ක් 2023 නොවැම්බර් 08 දින වනවිට සපයන ලෙස දක්වා තිබුණි. කෙසේ වුවත්, 2023 අගෝස්තු 15 යන දිනට ඒකක 190,000 සපයන ලෙස පද්ධතිය මඟින් ඇණවුම ලබා දී තිබුණු අතර, ලංසු ලියවිලි අනුව එක් මසක් ඇතුළත ඒකක 190,000 ක් සැපයිය යුතු බවත් දක්වා තිබුණි. 2023 නොවැම්බර් 27 විගණිත දින වනවිටත් සැපයුම්කරු කාර්යසාධන බැඳුම්කරය ලබා දී නොතිබුණු අතර සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමක් ඇතිකර ගෙනද නොතිබුණි.

(ඔ) 2024 වර්ෂයට අදාළව ඖෂධ අවශ්‍යතාවය තීරණය කිරීමට අදාළ ඇණවුම් පාලන පත්‍රිකාව 2023 ජනවාරි 23 දින පිළියෙල කර තිබුණද ඇණවුම ඉදිරිපත් කර නොතිබුණි. 2024 වර්ෂයේ සාමාන්‍ය වාර්ෂික අවශ්‍යතාව සැපයීමට වර්ෂය ආරම්භ වීමට ආසන්න වශයෙන් මාස 11 කට පෙර ඇණවුමක් ඉදිරිපත් කළ යුතු වුවත් විගණිත දිනය වූ 2023 නොවැම්බර් 29 දින දක්වා 2024 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුමක් ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය.

66. Vincristine Sulphate Inj.1mg/mL Vial (SR - 01202401)

(අ) අංක 2021/SPC/N/R/P/00095 දරන ඇණවුමට අදාළ ඒකක 13,250 ක් සහ අංක 2022/SPC/N/R/P/00032 දරන ඇණවුමට අදාළ ඒකක 11,000 ක් 2023 නොවැම්බර් විගණිත දිනය වන විටත් සපයා නොතිබුණු අතර නිකුත් කර තිබුණු ඇණවුම් 06 කට අදාළ එන්නත් ඒකක 55,344 ක් සම්පූර්ණයෙන්ම සපයාගෙන නොතිබුණි.

(ආ) ඒකක 22,000 ක 2022 සාමාන්‍ය ඇණවුම 2021 පෙබරවාරි 27 දින නිකුත් කර තිබුණි. 2023 අගෝස්තු 03 දින ලංසු ප්‍රදානය කර තිබුණු අතර ඒකක 11,000 ක් වූ පළමු තොගය 2022 සැප්තැම්බර් 27 දින සපයාගෙන තිබුණි. ලංසු ඇගයීමෙන් පසුව ඊට අදාළව නිශ්චිත නිර්දේශයක් සහිතව ඇගයීම් වාර්තාවක් ද ඉදිරිපත්කර නොතිබුණු අතර සාමාජිකයින්ගේ නම් හා තනතුර රහිතව අත්සන පමණක් යොදා තිබුණි. මෙම ඇණවුමට අදාළව ලබාගෙන තිබුණු කාර්යසාධන සුරක්ෂණයේ වලංගුභාවය 2022 නොවැම්බර් 16 දිනෙන් අවසන් වී තිබුණු අතර ඇණවුමෙන් අඩක් පමණක් සපයාගෙන තිබුණි.

(ඇ) අංක 2022/MSD/V/R/P/00074 දරන ඒකක 5,750 ක ඇණවුම 2022 සැප්තැම්බර් 26 දින නිකුත් කර තිබුණි. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 22/1523/610/018 යටතේ "ශ්‍රී ලංකාව තුළ අඛණ්ඩ වෛද්‍ය සැපයීම් සේවාවක් පවත්වාගෙන යාම" යන මැයෙන් සෞඛ්‍ය ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2022 සැප්තැම්බර් 26 දිනැති සංදේශය අනුව වෛද්‍ය සැපයීම් අංශය විසින් අත්‍යවශ්‍ය ඖෂධ ශ්‍රී ලංකාවට ආනයනය කර සැපයීම සඳහා උනන්දුව ඇති පාර්ශවයන්ගෙන් (Expression of interest EOI) 2022 සැප්තැම්බර් 27 දින Promise.lk වෙබ් අඩවිය මඟින් ලංසු කැඳවා තිබුණි.

(ඈ) ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි WOR ලබා ගැනීමේ පදනම මත මෙම ඖෂධය සපයා ගැනීමට තීරණය කර තිබුණි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුවේ මිල ඇගයීම් කමිටුව මඟින් එය ඇගයීම් කර ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරගන්නා බව සටහන් කර තිබුණ ද මිල ඇගයීම් වාර්තාවක් සහ ප්‍රසම්පාදන කමිටු වාර්තාවක් අදාළ ලිපිගොනුව තුළ ඇතුළත් නොවීය. ගැණුම් ඇණවුම අනුව 2023 ජනවාරි 05 වන විට ඖෂධ සැපයිය යුතු බවට සඳහන් කර තිබුණද විගණන දිනය වූ 2023 නොවැම්බර් 15 වන විටත් වෛද්‍ය සැපයීම් අංශයට අදාළ ඖෂධ තොගය සපයා නොතිබුණි. අමාත්‍යාංශ ලේකම් විසින් 2022 නොවැම්බර් 02 දින තම අධිකාරි සීමාව අභිබවා යමින් කාර්යසාධන බැඳුම්කර ලබා ගැනීමෙන් හා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වීමෙන් නිදහස් කර තිබුණි. මෙම තත්ත්වය තුළ මෙම තොගය ලබා නොදීම සම්බන්ධයෙන් කිසිදු ආවරණයක් අමාත්‍යාංශයට හිමිවී නොතිබුණි.

(ඉ) 2023 සාමාන්‍ය ඇණවුම ලෙස ඒකක 12,000 ක් 2022 නොවැම්බර් 16 දින නිකුත් කර තිබුණි. 2023 මාර්තු 20 දින ලංසු ඇගයීම් සිදුකර තිබුණු නමුත් ඊට අදාළව ඇගයීම් වාර්තාවක් ඉදිරිපත්කර නොතිබුණු අතර දෙවන අවම ලංසුකරු වෙත ඖෂධයට අදාළ නිෂ්පාදන ලියාපදිංචිය අළුත් කිරීමට යටත්ව ඒකකයක් රු. 595 බැගින් ලංසු ප්‍රදානය කිරීමට 2023 මැයි 09 දින පැවති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. 2023 වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු ඇණවුම් පාලන පත්‍රිකාවට අනුව 2023 වර්ෂයට ඇණවුම් කළ යුතු එන්නත් ඒකක 8,000 ක් වුවත් යථෝක්ත ඇණවුම මඟින් මාස 06 ක අවශ්‍යතාවයට සමගාමීව එන්නත් ඒකක 12,000 ක් ඇණවුම් කර තිබුණු අතර එසේ කිරීමට පාදක වූ කරුණු විගණනයේදී අනාවරණය නොවීය. ප්‍රසම්පාදන කාලසටහන අනුව ප්‍රසම්පාදන තීරණය ගෙන දින 14 කින් ලංසු ප්‍රදානය කළ යුතු වුවත්, දින 52 ක ප්‍රමාදයක් සහිතව එය සිදුකර තිබුණි. ලංසු පිරිනමා දින 14 ක් ඇතුළත මුළු පිරිවැයෙන් සියයට 10 ක් වන කොන්දේසි විරහිත කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. විගණන දිනය වූ 2023 නොවැම්බර් වන විටත් මෙම ඇණවුමට අදාළ ඖෂධ ලැබී නොතිබුණි.

(ඊ) අංක 2023/SPC/E/R/P/00143 දරන ඒකක 5,750 ක ඇණවුමක් 2023 ජනවාරි 30 දින නිකුත් කර තිබුණි. 2023 අප්‍රේල් 24 දින පැවති තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කිසිම ලංසුකරුවෙකු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය ලබාගෙන නොතිබුණු බැවින් සහ දෙවන අවම ලංසුකරු ඖෂධ සාම්පල් ආනයන බලපත්‍රය ලබාගෙන තිබීම හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය ඉල්ලා තිබුණු බැවින් දෙවන අවම ලංසුකරු වෙත මිල අඩුකිරීමකට යටත්ව හා WOR ලබා ගැනීමේ පදනම මත ලංසු ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණි. යථෝක්ත සැපයුම්කරු වෙත ඒකකයක් රු. 1,665 බැගින් ඒකක 5,750 ක් සඳහා ලංසු ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණු අතර අදාළ ඉන්ඩෙන්ටුව 2023 ජූනි 15 දින නිකුත් කර තිබුණි.

(උ) යථෝක්ත ප්‍රසම්පාදනයට අදාළව ලංසු පිරිනැමීම 2023 මැයි 12 පැවති සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර තිබුණු අතර එම තීරණය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ආවරණ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි ලිපිගොණුවේ ඇතුළත් නොවුණු අතර මෙම ප්‍රසම්පාදනය නියමිත පරිදි සිදුකළ බව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් තහවුරුකර ද නොතිබුණි. ඇස්තමේන්තුගත මිල හා ලංසු ප්‍රදානය කළ මිල අතර වෙනස සියයට 411 ක් විය.

(ඌ) ලංසු පිරිනමා දින 03 ක් ඇතුළත මුළු පිරිවැයෙන් සියයට 10 ක් වන කොන්දේසි විරහිත කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවත් එසේ කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි. එසේම ලංසු පිරිනැමූ වහාම සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවත් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් එසේ සිදුකර නොතිබුණි. හදිසි අවශ්‍යතාවය යටතේ මෙම ඖෂධය සපයා ගැනීමට තීරණය කර මිල ගණන් ඉදිරිපත් කිරීමට දින 03 ක් වැනි සීමිත කාලයක් ලබාදී තිබුණද අදාළ ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණේ 2023 ජුනි 15 වූ අතර ඒ සඳහා ලංසු විවෘත කළ දින සිට දින 75 ක කාලයක් ගතකර තිබුණි. 2023 නොවැම්බර් විගණන දිනය වන විටත් මෙම ඇණවුමට අදාළ ඖෂධ ලැබී නොතිබුණි.

(එ) අංක 2023/SPC/X/R/P/00191 දරන ඒකක 18,000 ක ඇණවුම 2023 මැයි 25 දින නිකුත් කර තිබුණි. 2023 ජුනි 27 පැවති තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සැපයුම්කරු වෙත ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නැවත ලියාපදිංචියට හෝ WOR ලබා ගැනීමේ පදනම මත ඒකකයක් රු. 362 බැගින් ඒකක 18,000 ක් සඳහා ලංසු ප්‍රදානය කිරීමට 2023 ජුනි 28 දින පැවති සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. අදාළ ප්‍රසම්පාදන තීරණය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ආවරණ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ සිදුකර ඇති බවට සාක්ෂි ලිපිගොනුවේ ඇතුළත් නොවුණු අතර මෙම ප්‍රසම්පාදනය නියමිත පරිදි සිදුකළ බව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් තහවුරුකර ද නොතිබුණි. මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා දින 03 කටත් අඩු කාලයක් ලබාදෙමින් සිදුකරන ලද මිල කැඳවීමට අදාළ ඖෂධ මිලදී ගැනීමට 2023 ජුනි 28 දින තීරණය කර තිබුණද, ඊට අදාළ ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණේ 2023 සැප්තැම්බර් 06 වූ අතර ඒ වෙනුවෙන් මාස 02 කට වැඩි කාලයක් ගත කර තිබුණි. 2023 නොවැම්බර් විගණන දිනය වන විටත් මෙම ඇණවුමට අදාළ ඖෂධ ලැබී නොතිබුණි.

(ඒ) මෙම ඖෂධයේ 2024 වර්ෂය සඳහා වන සාමාන්‍ය ඇණවුම 2023 ජනවාරි නිකුත් කළ යුතු වුවත් 2023 නොවැම්බර් 15 විගණන අවස්ථාව වන විටත් වෛද්‍ය සැපයීම් අංශය විසින් එය නිකුත් කර නොතිබුණි. මෙම තත්ත්වය තුළ 2024 වර්ෂයේදීද මෙම ඖෂධය හදිසි මිලදී ගැනීම් යටතේ මිලදී ගැනීමට සිදුවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ඔ) ස්වස්ථ තොරතුරු පද්ධතියට අනුව මෙම ඖෂධයට අදාළව ලැබිය යුතු තොග ලෙස එක් ස්ථානයක (Balance Due) එන්නත් ඒකක 76,750 ක් ලෙසත්, තවත් ස්ථානයක (Pending Orders) එන්නත් ඒකක 23,750 ක් ලෙසත් දක්වා තිබුණි. එබැවින් එකම තොරතුරු පද්ධතියේ විවිධ ස්ථාන තුළ පරිශීලකයන් වෙත ලබා දෙන තොරතුරු පරස්පර බැවින් පද්ධතිය මඟින් ලබා දෙන තොරතුරුවල විශ්වාසනීයත්වය පිළිබඳව විගණනයේදී ගැටළු සහගත විය.

67. Procarbazine capsule 50mg (SR 01203901)

(අ) ඒකක 3,000 ක 2022 සාමාන්‍ය ඇණවුම 2021 පෙබරවාරි 27 දින නිකුත් කර තිබුණි. අවස්ථා 05 කදී ම ලංසු කැඳවා තිබුණු අතර ඉන් එක් අවස්ථාවක ලංසු ප්‍රදානයකර තිබුණු නමුත් පසුව එය අවලංගු කර තිබුණි. ප්‍රසම්පාදන කටයුතු මුල් අදියරයෙහි පැවති බැවින් 2024 වර්ෂයේදී ද හදිසි ප්‍රසම්පාදනයන් සඳහා යොමුවීමට සිදුවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ආ) අංක 2022/SPC/E/R/P/00744 දරන ඒකක 600 ක හදිසි ඇණවුම 2022 නොවැම්බර් 09 දින නිකුත් කර තිබුණි. ඒකක මිල අධිකවීම හේතුවෙන් අවස්ථා දෙකකදී මෙම ප්‍රසම්පාදනය අවලංගුකර නැවත ලංසු කැඳවීමට 2023 පෙබරවාරි 16 දින පැවති ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණද. විගණිත දිනය වූ 2023 ඔක්තෝබර් 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඇ) ඒකක 1,200 ක 2023 සාමාන්‍ය ඇණවුම 2022 නොවැම්බර් 16 දින නිකුත් කර තිබුණි. ඒකක මිල අධිකවීම හේතුවෙන් අවස්ථා දෙකකදී 2023 සාමාන්‍ය ඇණවුමට අදාළ ප්‍රසම්පාදනය අවලංගු කර තිබුණද විගණිත දිනය වූ 2023 නොවැම්බර් 15 දින වන විටත් නැවත ලංසු කැඳවීමක් ද සිදුකර නොතිබුණි.

(ඈ) විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ලබාදෙන ලද අරමුදල් භාවිතා කර මිලදි ගැනීම සඳහා 2023 පෙබරවාරි 02 දිනැති අංක 2023/SPC/T/R/P/00146 දරන ඒකක 400 ක ඇණවුම නිකුත් කර තිබුණි. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිෂ්පාදනාගාර අනුමැතිය සහිත සැපයුම්කරු වෙත WOR ලබාගැනීමේ පදනම මත ලංසුව පිරිනැමීමට 2023 මාර්තු 09 සහ 21 දිනයන්හි පැවති හදිසි ප්‍රසම්පාදන කමිටුව මඟින් තීරණය කර තිබුණි. එම තීරණය සඳහා අමාත්‍යමණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත් බවට හෝ ප්‍රසම්පාදනය නියමිත පරිදි සිදුකළ බවට ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහතිකයක් ලබාගත් බවට සාක්ෂි ලිපිගොනුවේ ඇතුළත් නොවීය.

(ඉ) මිල ගණන් ඉදිරිපත් කිරීමට දින 03 ක් වැනි සීමිත කාලයක් ලබාදී තිබුණද අදාළ ඉන්ඩෙන්ටුව නිකුත් කිරීම සඳහා දින 33 ක කාලයක් ගතකර තිබුණි. පසුව මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය නතර වී තිබුණද කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන්කර නොතිබීම හා වලංගු කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබීම හේතුවෙන් මේ සම්බන්ධයෙන් සැපයුම්කරුට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට ප්‍රසම්පාදන අස්ථිත්වයට නොහැකි වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) අංක 2023/SPC/X/R/P/00191 දරන ඒකක 2,000 ක ඇණවුම 2023 මැයි 25 දින නිකුත් කර තිබුණි. 2023 ජුනි 28 දින පැවති සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් ඖෂධය සඳහා නිෂ්පාදනාගාර අනුමැතිය හිමි සැපයුම්කරු වෙත ඒකකයක් රු.3,000 බැගින් WOR ලබා ගැනීමට යටත්ව ලංසු ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණි. මෙම ප්‍රසම්පාදන තීරණය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ආවරණ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ සිදුකර ඇති බවට සාක්ෂි ලිපිගොනුවේ ඇතුළත් නොවීය. එසේම මෙම ප්‍රසම්පාදනය නියමිත පරිදි සිදුකළ බව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් තහවුරු කරද නොතිබුණි. මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා දින 03

කටත් අඩු කාලයක් ලබාදුන්නද ඉන්ඩෙන්ටුව නිකුත් කිරීම සඳහා මාස 02 කට වැඩි කාලයක් ගත කර තිබුණි.

(ඵ) මෙම ඖෂධයේ 2024 වර්ෂය සඳහා වන සාමාන්‍ය ඇණවුම 2023 ජනවාරි වන විට නිකුත් කළ යුතු වුවත් විගණන අවස්ථාව වූ 2023 නොවැම්බර් 15 වන විටත් එය නිකුත් කර නොතිබුණි.

68. Paclitaxel Inj. 30mg/5mlVial (SR - 01204901)

(අ) අංක 2022/SPC/E/R/P/00600 දරන ඒකක 25,000 ක් සපයා ගැනීම සඳහා වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) වෙත 2022 සැප්තැම්බර් 16 දින මෙම ඇණවුම ලබාදී තිබුණි. 2022 ඔක්තෝබර් 26 දින පැවති තාක්ෂණික ඇගයීම් කමිටුවේදී මිල අඩු කිරීමකට යටත්ව සහ වහාම ලබාගත හැකි පරිදි ඒකක 25,000 ක් සපයා ගැනීමට තීරණය කර තිබුණු නමුත් මෙම ඇණවුම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකළ බවට හෝ අවලංගු කළ බවට හෝ සාක්ෂි ලිපිගොනුව තුළ නොතිබුණි. එසේම සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටුව ගත් මෙම තීරණ සඳහා අමාත්‍යමණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ඒකක 50,000 ක 2023 සාමාන්‍ය ඇණවුම 2022 නොවැම්බර් 16 දින නිකුත් කර තිබුණි. 2023 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුම මාස දහයක් පමණ ප්‍රමාදවී ලබාදීම හේතුවෙන් විවෘත මිල කැඳවීමක් මඟින් තරඟකාරී ලෙස ඖෂධ මිලට ගැනීමට තිබුණු අවස්ථාව අහිමි වී තිබුණි. මුළු පිරිවැයෙන් සියයට 10 ක් වන කොන්දේසි විරහිත කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවත් එය ලබාගෙන තිබුණේ දින 108 ක ප්‍රමාදයක් සහිතව 2023 ජූලි 17 දින විය. 2023 ජූනි 23 දින නිකුත් කර තිබුණු ඉන්ඩෙන්ටුව අනුව 2023 අගෝස්තු 15 දින තොග ලබාදිය යුතු වුවත් 2023 නොවැම්බර් 10 වන විටත් මෙම ඖෂධ ලැබී නොතිබුණි.

(ඇ) 2023 වාර්ෂික සාමාන්‍ය ඇණවුම නියමිත දිනට ලබා නොදී අංක 2023/SPC/E/R/P/00143 දරන ඒකක 25,000 ක් හදිසි ප්‍රසම්පාදනය යටතේ සපයා ගැනීම සඳහ ඇණවුමක් 2023 ජනවාරි 30 දින ලබාදී තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අවම ලංසුකරු වෙත මිල අඩුකිරීමකට යටත්ව ඒකකයක් රු.2,370 බැගින් ඒකක 25,000 ක් සඳහා රු.59,250,000 ක පිරිවැයක් යටතේ මිලදී ගැනීම සඳහා ලංසු ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණු අතර 2023 මැයි 12 පැවති සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර තිබුණි. එම තීරණය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ආවරණ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි ලිපිගොනුවේ ඇතුළත් වී නොතිබුණි.

(ඈ) හදිසි අවශ්‍යතාවය යටතේ මෙම ඖෂධය සපයා ගැනීමට තීරණය කර මිල ගණන් ඉදිරිපත් කිරීමට දින 03 ක් වැනි සීමිත කාලයක් ලබාදී තිබුණද අදාළ ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණේ ලංසු විවෘත කිරීමකින් දින 80 කට පසුව විය. මෙම ඖෂධය සපයා ගැනීම සඳහා ඉදිරි පියවර ගැනීමට ස්වස්ථ පද්ධතිය තුළ යථෝක්ත ඉන්ඩෙන්ටුව නොපෙන්වීම හේතුවෙන් 2023 අගෝස්තු 24 දින නව ඉන්ඩෙන්ටුවක් නිකුත් කර තිබුණු අතර එහි තොග ලබා ගැනීමේ කාලය ලෙස දක්වා තිබුණේ 2023 අගෝස්තු 31

දින විය. එසේ වුවද ඒවන විටත් මෙම ඖෂධ ලැබී නොතිබුණු අතර කාර්යසාධන සුරක්ෂණයක් ද ලබා ගෙන නොතිබුණි.

(ඉ) විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ලබාදෙන ලද අරමුදල් භාවිතා කර මිලදි ගැනීම සඳහා වෛද්‍ය සැපයීම් අංශය විසින් 2023 පෙබරවාරි 02 දිනැති අංක 2023/SPC/T/R/P/00146 දරන ඇණවුම නිකුත් කර තිබුණි. මෙම ප්‍රසම්පාදනය සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදුකර තිබුණු අතර 2023 පෙබරවාරි 24 දින පැවති මිල කමිටුවෙන් පසු අවම ලංසුකරු වෙත WOR ලබාගැනීමේ පදනම මත ලංසුව පිරිනැමීමට තීරණය කර තිබුණු අතර එම තීරණය සඳහා අමාත්‍යමණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි ලිපිගොනුවේ ඇතුළත් නොවීය. පිරිවිතරවලට අනුකූල නොවීම මත මෙම ඇණවුම අවලංගු කිරීමට තීරණය කර තිබුණි. එබැවින් මෙහිදී ලංසු ඇගයීමේදී පිරිවිතර වලට අනුකූල නොවන ලංසු ප්‍රතික්ෂේප කිරීමට තිබුණු අවස්ථාව මඟ හැර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) ඇණවුම අවලංගු කිරීමට සිදුවී තිබුණේ සැපයුම්කරුගේ දෝෂයක් මත වුවත් කාර්යසාධන සුරක්ෂණය ලබානොගැනීමේ හේතුවෙන් අදාළ ප්‍රසම්පාදනය වෙනුවෙන් වැයකර තිබුණු පිරිවැය සැපයුම්කරුගෙන් අයකරගැනීමට තිබුණු අවස්ථාවද අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. එසේම ලංසු පිරිනැමූ වහාම සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවත් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් එසේ සිදුකර නොතිබුණි. මෙම ඖෂධයේ නිෂ්පාදකයා විසින් දේශීය නියෝජිතයා නිසි පරිදි පත්කර ඇති බව තහවුරු කෙරෙන ලියවිලි ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(උ) අංක 2023/SPC/X/R/P/00191 දරන ඒකක 75,000 ක් ඉන්දීය ණය පහසුකම යටතේ මිලදි ගැනීම සඳහා 2023 මැයි 25 දින ඇණවුමක් නිකුත් කර තිබුණි NMRA ලියාපදිංචිය හිමි එකම ලංසුකරු වෙත ඒකකයක් රු.1,729.41 ක් බැගින් වූ ඒකක 75,000 ක් සඳහා රු.129,705,750 ක් වූ පිරිවැය යටතේ මෙම ඖෂධය සපයා ගැනීම සඳහා ලංසු ප්‍රදානය කිරීමට 2023 ජුනි 28 දින පැවති සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර තිබුණු අතර එම තීරණය සඳහා අමාත්‍යමණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි ලිපිගොනුවේ ඇතුළත් නොවීය.

(ඌ) මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා දින 03 කටත් අඩු කාලයක් ලබාදෙමින් සිදුකරන ලද මිල කැඳවීමට අදාළ ඖෂධ මිලදි ගැනීමේ ඉන්ඩෙන්ටුව නිකුත් කිරීම සඳහා වෛද්‍ය සැපයීම් අංශය මාස 02 කට වැඩි කාලයක් ගත කර තිබුණි. මෙම ඖෂධය ප්‍රසම්පාදනය සඳහා ලංසු පිරිනමා දින 03 ක් ඇතුළත මුළු පිරිවැයෙන් සියයට 10 ක් වන කොන්දේසි විරහිත කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවත් එසේ කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි.

(එ) මෙම ඖෂධයේ ප්‍රමාණවත් පරිදි තොග පවත්වා නොගැනීම හේතුවෙන් කුරුණෑගල ශික්ෂණ රෝහල විසින් ප්‍රාදේශීය වශයෙන් ඒකක 500 ක් ඒකකයක් රු.4,960 ක් වැනි අධික පිරිවැයක් දරා මිලදීගැනීම් සිදුකර තිබුණි.

(ඒ) මෙම ඖෂධයේ 2024 වර්ෂය සඳහා වන සාමාන්‍ය ඇණවුම 2023 ජනවාරි මස වන විට නිකුත් කළ යුතු වුවත් විගණන අවස්ථාව වූ 2023 නොවැම්බර් 15 වන විටත් වෛද්‍ය

සැපයීම් අංශය විසින් එය නිකුත් කර නොතිබුණි. විගණිත දිනය වන විට ඇණවුම් පාලන පත්‍රිකාව පිළියෙල කිරීමට පදනම් කරගෙන තිබුණු ලැබිය යුතු ඇණවුම් 04 ක් ම අවලංගු කර තිබුණි. මේ හේතුවෙන් 2024 වර්ෂයට සාමාන්‍ය ඇණවුමක් පිළියෙල නොකිරීම හේතුවෙන් 2024 වර්ෂයේදී ද හදිසි ප්‍රසම්පාදනයන් සඳහා යොමුවීමට සිදුවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

69. Tamoxifen Tab. 20mg (SR අංක 01206802)

(අ) අංක 2022/SPC/V/R/P/00690 දරන ඇණවුම වෙනුවට අංක 2022/MSD/V/R/P/00074 දරන ඇණවුම නිකුත් කර තිබුණද ස්වස්ථ පද්ධතියේ පළමු ඇණවුම තවදුරටත් නිකුත් කළ ඇණවුමක් ලෙස පෙන්නුම් කෙරුණි.

(ආ) 2023 නොවැම්බර් 21 දිනට මෙම ඖෂධයේ ඒකක 4,953,285 ක් ලැබීමට ඇති බව ස්වස්ථ පද්ධතියේ පෙන්නුම් කෙරුණි. නමුත් මෙම ඒකක ගණන සැකසුනු ආකාරය පිළිබඳ තොරතුරු මෙම පද්ධතිය තුළ ඇතුළත් වී නොතිබුණි.

(ඇ) අංක 2022/MSD/V/R/P/00074 දරන ඒකක 450,000 ක ඇණවුමක් නිකුත් කර තිබූ අතර, 2022 දෙසැම්බර් 05 ඒකක 150,000 ක් ද, 2023 පෙබරවාරි 06 දින ඒකක 300,000 ක්ද සපයන ලෙස තෝරාගත් ලංසුකරු වෙත ගැණුම් ඇණවුම ඉදිරිපත් කර තිබුණ 2023 නොවැම්බර් 21 දින වන විටත් ඖෂධ තොගය ලැබී නොතිබුණි. 2022 නොවැම්බර් 02 දින සෞඛ්‍ය ලේකම් විසින් තම අධිකාරී බලය අභිබවා යමින් කාර්යසාධන බැඳුම්කරය ලබා ගැනීම හා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වීම අවශ්‍ය නොවන බවට අනුමැතියක් ලබාදී තිබුණි.ඒ අනුව මෙම ඉතිරි තොගය ලබා නොදීම සම්බන්ධයෙන් කිසිදු ආවරණයක් අමාත්‍යාංශයට හිමිවී නොතිබුණි. මේ සම්බන්ධයෙන් රජයට යම් අලාභයක් දැරීමට සිදුවුව හොත් මෙම තීරණය අනුමත කළ හා නිර්දේශ කළ පුද්ගළයින් පුද්ගලිකව වගකිව යුතු බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ඈ) අංක 2023/SPC/E/R/P/00143 දරන ඒකක 450,000 ක ඇණවුම 2023 ජනවාරි 30 දින නිකුත් කර තිබුණු අතර 2023 අප්‍රේල් 24 දින පැවති තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය ලබාගෙන තිබුණු අවම ලංසුකරු වෙත ලංසු ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණි. අදාළ ඉන්ඩෙන්ටුව 2023 ජූලි 12 දින නිකුත් කර තිබුණු අතර යථෝක්ත ප්‍රසම්පාදනයට අදාළ ලංසු පිරිනැමීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර තිබුණුද එම තීරණය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ආවරණ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි ලිපිගොණුවේ ඇතුළත් වී නොතිබුණි.

(ඉ) ඒකකයක ඇස්තමේන්තුගත මිල රු. 4.73 ක් වූ අතර අවම ලංසුකරු ඉදිරිපත් කර තිබුණු මිල රු.10.48කි. ඒ අනුව ඇස්තමේන්තුගත මිල හා ලංසු ප්‍රදානය කළ මිල අතර වෙනස සියයට 121 ක් විය. මෙම ඖෂධය ප්‍රසම්පාදනය සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණු අතර සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. හදිසි අවශ්‍යතාවය යටතේ මෙම ඖෂධය සපයා ගැනීමට තීරණය කර මිල ගණන් ඉදිරිපත් කිරීමට දින 03 ක් වැනි සීමිත කාලයක් ලබාදී තිබුණද අදාළ ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණේ ලංසු විවෘත කළ දින සිට දින 103 ක කාලයකට පසුව-විය.

(ඊ) 2023 සාමාන්‍ය ඇණවුම වූ ඒකක 900,000 ක් මාස 10 ක පමණ ප්‍රමාදයක් සහිතව 2022 නොවැම්බර් 16 දින නිකුත් කර තිබුණු අතර ඇණවුම නිකුත් කරන ලද දිනට ඇණවුම් පාලන පත්‍රිකාවක් පිළියෙල කර නොතිබුණි. 2023 අප්‍රේල් 19 දින ලංසු ලියවිලි ඇගයීමට ලක්කර, ආයතන දෙකක් වලංගු NMRA සහතිකය ඉදිරිපත් කර අනෙකුත් නිර්නායක සම්පූර්ණ කර ඇති බව පමණක් සඳහන් කරමින් අදාළ සාමාජිකයන් ගේ නම්, තනතුරු සඳහන් නොකර අත්සන් කර තිබුණි .තාක්ෂණික කමිටු ඇගයීමෙන් මාස දෙකක කාල පමාවක් සහිතව. ප්‍රසම්පාදන කමිටුව විසින් මිල සාකච්ඡාවකට ආරධනා කර තිබුණි. ප්‍රසම්පාදන කමිටු තීරණයට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ තාක්ෂණික අංශයට ලැබී තිබුණේ 2023 සැප්තැම්බර් 25 දින වන අතර එදිනෙන් පසු ලිපිගොණුව යාවත්කාලීන කර නොතිබුණි.

(උ) මුදල් අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය (HSEPP) වෙනුවෙන් හඳුන්වා දී තිබුණු උපදෙස් (Guideline) ප්‍රකාරව විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ලබාදෙන ලද අරමුදල් භාවිතා කර මිලදි ගැනීම සඳහා 2023 පෙබරවාරි 02 දින ඒකක 300,000 ක අංක 2023/SPC/T/R/P/00146 දරන ඇණවුම නිකුත් කර තිබුණි. ලංසු ඉදිරිපත් කිරීමට දින 02 ක් පමණක් ලබාදී තිබුණි. පස්වෙනියට අවම මිල ඉදිරිපත් කරන ලද ලංසුකරුගේ NMRA සහතිකය 2020 වර්ෂයේ අවලංගු වී තිබුණි.

(ඌ) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයක් ලබා ගැනීමේ පදනම මත ලංසු විවෘත කරන ලද දිනෙන් දින 07 කට පසුව හා මිල ඇගයීම් කමිටු නිර්දේශයෙන් දින 47 කට පසුව ලංසු ප්‍රදානය කිරීමට තීරණය ලබාදී තිබුණි. මෙම තීරණයට අදාළ අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලිපි ගොණුවේ ඇතුළත් නොවීය. ඒකකයක් රු.222.19 ක් බැගින් වූ ගැණුම් ඇණවුම ලංසු අනුමැතියෙන් දින 20 කට පසු 2023 මැයි 02 දින නිකුත්කර තිබුණි. මිල ඇගයීම් කමිටු නිර්දේශය ලබාදෙන අවස්ථාව වන විට වෛද්‍ය සැපයීම් අංශයේ තොග මට්ටම මාස 06 කට පමණ ප්‍රමාණවත් වී තිබුණි. මෙහි ඒකකයක ඇස්තමේන්තුගත මිල රු. 4.73 ක් වූ අතර සුදුසුකම්ලත් ලංසුකරු ඉදිරිපත් කර තිබුණු අතර මිල රු.222.19කි. ඒ අනුව ඇස්තමේන්තුගත මිල හා ලංසු ප්‍රදානය කළ මිල අතර වෙනස සියයට 4597.46 ක් විය.

(එ) 2023 මැයි 25 දින අංක 2023/SPC/X/R/P/00191 දරන ඒකක 1,300,000 ක ඇණවුම නිකුත් කර තිබුණු අතර සෞඛ්‍ය අංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් විසින් ලංසු ප්‍රදානය කිරීමට තීරණය ලබාදී තිබුණි.කෙසේ වුවත් මෙම තීරණයට අදාළ අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලිපි ගොණුවේ ඇතුළත් වී නොතිබුණි.

(ඒ) අවම අගය ඉදිරිපත් කළ ලංසුකරුගේ ලංසු අගය රු.11.22ක් වූ අතර මිල සාකච්ඡාවකින් පසුව ඒකකයක අගය රු.11ක් බැගින් වූ ගැණුම් ඇණවුම ලංසු අනුමැතියෙන් දින 77 කට පසු 2023 සැප්තැම්බර් 13 දින නිකුත්කර තිබුණි. ඒ අනුව 2023 නොවැම්බර් 13 දින සපයන ලෙස සඳහන් කරමින් ගැණුම් ඇණවුමට නිකුත් කර තිබුණි. කෙසේ වුවත්, විගණිත දිනය වූ 2023 නොවැම්බර් 24 වනවිටත් වෛද්‍ය සැපයීම් අංශයට ඖෂධ තොග සපයා නොතිබුණි.

(ඔ) 2024 වර්ෂයට අදාළව ඖෂධ අවශ්‍යතාවය තීරණය කිරීමට අදාළ ඇණවුම් පාලන පත්‍රිකාව 2023 ජනවාරි 23 දින පිළියෙල කර තිබුණද පුරෝකථනය කරන ලද ඒකක 2,600,000 ක ප්‍රමාණයට ඇණවුමක් ඉදිරිපත් කර නොතිබුණි. 2024 වර්ෂයේ සාමාන්‍ය වාර්ෂික අවශ්‍යතාව සැපයීමට වර්ෂය ආරම්භ වීමට ආසන්න වශයෙන් මාස 11 කට පෙර ඇණවුමක් ඉදිරිපත් කළ යුතු වුවත් විගණිත දිනය වූ 2023 නොවැම්බර් 30 දින දක්වා 2024 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුමක් ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය තුළ 2024 වර්ෂයේදිද හදිසි මිලදි ගැනීම් සඳහා යොමුවීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය කෙරේ.

70. Anastrozole Tab 1 mg (SR - 01206701)

(අ) ඒකක 1,000,000 ක 2022 සාමාන්‍ය ඇණවුම 2021 පෙබරවාරි 27 නිකුත් කර තිබුණු අතර මෙම ඇණවුම සංස්ථාව වෙත 2021 මාර්තු 17 දින ලැබී තිබුණි. තාක්ෂණික ඇගයීමෙන් පසුව පළමු ප්‍රසම්පාදන කමිටුව රැස්වීම සඳහා මාස 02 කට වඩා කාලයක්ද දෙවන ප්‍රසම්පාදන කමිටුව රැස්වීම සඳහා තවත් මාස 02 ක කාලයක්ද ගත කර තිබුණු අතර ඇණවුම ප්‍රදානය කිරීම සඳහා මාස 02 කට ආසන්න කාලයක් ගතකර තිබුණි. ඇණවුම නිකුත් කිරීමෙන් පසු ඉන්ඩෙන්ටුවට නිකුත් කිරීමට මාස 05 ක් ගතකර තිබුණි. ඉහත ප්‍රමාදයන් හේතුවෙන් විනිමය අනුපාතය සියයට 54 ක් වැනි අගයක් දක්වා ඉහල ගොස් තිබුණි. සමස්තයක් ලෙස ගත් කළ ඇණවුම නිකුත් කළ දින සිට භාණ්ඩ ලැබීම සඳහා වසරකට ආසන්න කාලයක් ගත වී තිබුණි. එසේම මිල විචලනය ගණනය කිරීමේදි සැපයුම්කරුට සත්‍ය ලෙස දැරිමට සිදුවූ පිරිවැය අදාළ ණයවර ලිපි සඳහා ගෙවීම් තොරතුරු හා රේගු ලියවිලි මඟින් තහවුරු කර ගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) අංක 2022/SPC/X/R/P/00306 දරන ඒකක 2,000,000 ක ඇණවුම 2022 මාර්තු 25 දින නිකුත් කර තිබුණි. ඒකකයක් සඳහා අවම මිල වූ එ.ජ. ඩොලර් 0.0234 ක මිලක් ඉදිරිපත් කරන ලද ආයතනයට ලංසුව පිරිනැමීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව 2022 අප්‍රේල් 27 දින තීරණය කර තිබුණි. ප්‍රසම්පාදන තීරණය ලැබීමෙන් මාස 02 කට පසුව ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණු අතර ඖෂධ තොගය ලැබී තිබුණේ 2023 අප්‍රේල් 21 දින විය. මෙම ගනුදෙනුවට අදාළ කොන්දේසි සැපයුම්කරු විසින් කඩ කර ඇති බැවින් අදාළ (එ.ජ.ඩො.46.50ක්) කාර්යසාධන බැඳුම්කරයෙන් අයකර ලබාදෙන මෙන් අදාළ බැංකුවෙන් ඉල්ලා තිබුණි. ඒ අනුව ප්‍රමාද ගාස්තු රජයට අයකරගෙන තිබේද යන්න හා අනෙකුත් ගෙවීම් සිදු කළ ආකාරය පිළිබඳ ලිඛිත සාක්ෂි ලිපිගොනුව තුළ ඇතුළත් වී නොතිබුණි.

(ඇ) අංක 2023/SPC/X/R/P/00191 දරන ඒකක 1,200,000 ක ඇණවුම 2023 මැයි 25 දින නිකුත් කර තිබුණි. සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන කමිටු සීමාව තුළ ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. කාර්යසාධන බැඳුම්කරයක් ලිපිගොනුව අනුව ලබාදී නොතිබුණු අතර 2023 නොවැම්බර් 22 දිනට ස්වස්ථ පද්ධතිය අනුව මෙම තොගය ලැබිය යුතු තොගයක් ලෙස දක්වා තිබුණි.

(ඈ) ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 3 කටත් අඩු කාලයක් පමණක් ලබා දී තිබුණි. මෙම ප්‍රසම්පාදන තීරණය සඳහා අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත යුතු වුවත්

එම අනුමැතිය ලබා ගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ප්‍රසම්පාදන ඇගයීම් කටයුතු වලින් පසු ඇණවුම ප්‍රදානය කිරීම සඳහා දින 70 කට ආසන්න කාලයක් ගත කර තිබුණි. ඖෂධයේ ආයුකාලය මාස 24 ක් බව සඳහන් කර තිබුණද ඉන්ඩෙන්ටුවේ අවම ආයුකාලය මාස 12 ක් ලෙස දක්වා තිබීම විගණනයේදී ගැටළු සහගත විය.

(ඉ) 2023 වර්ෂයට අදාළ ඒකක 1,000,000 ක සාමාන්‍ය ඇණවුම මාස 10 ක පමණ ප්‍රමාදයක් සහිතව 2022 නොවැම්බර් 16 දින නිකුත් කර තිබුණි. 2023 මාර්තු 22 දින ලංසු ලියවිලි ඇගයීමට ලක්කර තිබූණු අතර ඇගයීම් කරුණු සඳහන් කර තිබුණ ඇගයීම් වාර්තාවට අනුව විධිමත් හා නිශ්චිත නිර්දේශයක් ඉදිරිපත් කර නොතිබුණ අතර අදාළ සාමාජිකයන් තම නම් හා තනතුරු සඳහන් නොකර ඇඟයීම් වාර්තාව අත්සන් කර තිබුණි.

(ඊ) 2023 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ඇණවුම් පාලන පත්‍රිකා විගණනය විසින් ඉල්ලා සිටියද 2023 දෙසැම්බර් 08 විගණන දින තෙක් ලබා දී නොතිබුණි. 2022 නොවැම්බර් 16 දිනැති ඇණවුම සඳහා ලංසු කැඳවීමට 2023 පෙබරවාරි 27 තෙක් මාස 03 ක කාලයක් ගත කර තිබුණු අතර තාක්ෂණික ඇගයීම් කටයුතු කිරීමට මාසයක් ගත කර තිබුණි. ප්‍රසම්පාදන කමිටුව රැස්වීමට තවත් මාසයක කාලයක් ගතකර තිබුණු අතර ඇණවුම පිරිනැමීම සඳහා තවත් මාසයක කාලයක් ගත කර තිබුණි. දෙවන ඉන්ඩෙන්ටුවට අනුව මුළු තොගයම 2023 ඔක්තෝබර් 31 දිනට ලැබිය යුතු වුවද, දත්ත පද්ධතිය අනුව 2023 දෙසැම්බර් 04 දින වන විටත් මෙම ඖෂධ තොගය ලැබී නොතිබුණි.

(උ) 2024 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුම 2023 නොවැම්බර් අවසානය දක්වා නිකුත් කර නොතිබුණි. මෙම ඖෂධයේ පසුගිය වර්ෂ දෙකට අදාළ සාමාන්‍ය ඇණවුම් නියමිත පරිදි විධිමත් පුරෝකථයන් මත නිකුත් නොකිරීමෙන් අවස්ථා කිහිපයකදි හදිසි ඇණවුම් නිකුත් කිරීමේත් හේතුවෙන් වඩාත් හොඳ තරඟකාරිත්වයක් තුළින් අඩු මිලකට ඖෂධය මිලට ගැනීමට තිබුණු අවස්ථාව අහිමි කර තිබුණු අතර 2024 වර්ෂයට අදාළ සාමාන්‍ය ඇණවුම නියමිත දිනට නිකුත් නොකිරීම මත 2024 වර්ෂයේදිද මෙම ඖෂධය හදිසි මිලදි ගැනීම් යටතේ මිලදි ගැනීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය කෙරේ.

(ඌ) 2023 නොවැම්බර් 21 දිනට මෙම ඖෂධයේ ඒකක 1,919,418 ක් ලැබීමට ඇති බව ස්වස්ථ පද්ධතියට අනුව පෙන්නුම් කෙරුණි. නමුත් මෙම ඒකක ගණන සැකසුනු ආකාරය පිළිබඳ තොරතුරු මෙම පද්ධතිය තුළ ඇතුළත් නොවීය.

71. Hydroxyurea (Hydroxycarbamide) Capsule 500mg (SR - 01203501)

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2019, 2020 සිට 2023 දක්වා නිකුත් කළ ඇණවුම් 09 කට අදාළව එකතුව ඒකක 2,557,139 ක් වූ ඖෂධ 2023 දෙසැම්බර් 07 විගණිත දිනය වන විටත් ලැබී නොතිබුණි. නමුත් එදිනට ස්වස්ථ පද්ධතිය තුළ ඒකක 792,000 ක් පමණක් ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. එසේම ස්වස්ථ තොරතුරු පද්ධතියට අනුව මෙම ඖෂධයට අදාළව දැනට පවතින තොග පිළිබඳ විස්තරයෙහි ලැබිය යුතු තොග ලෙස ඒකක 2,285,000 ක් පෙන්නුම් කෙරුණි. එබැවින් නිකුත් කළ

ඇණවුම් හා ලැබිය යුතු තොග සම්බන්ධයෙන් එකම තොරතුරු පද්ධතියේ විවිධ ස්ථාන තුළ පරිශීලකයන් වෙත ලබා දෙන තොරතුරු පරස්පර බැවින් පද්ධතිය මඟින් ලබා දෙන තොරතුරුවල විශ්වාසනීයත්වය පිළිබඳව විගණනයේදී ගැටළු සහගත විය.

(ආ) ඇණවුම් අංක 2021/SPC/N/R/P/00020 මඟින් ඒකක 1,500,000 ක් ඇණවුම් කර තිබුණු අතර ඉන් ඒකක 118,600 ක් 2021 පෙබරවාරි 02 දින සහ ඒකක 631,400 ක් 2021 පෙබරවාරි 25 දින වශයෙන් එකතුව ඒකක 750,000 ක් පමණක් ලැබී තිබුණි. ඉන් කාණ්ඩ අංක JD 20051 ට අදාළ මුළු පිරිවැය රු. 15,071,056 ක් වූ ඒකක 144,914 ක් තත්ත්වයෙන් අසමත් වී තිබුණි. මේ අනුව සැපයුම්කරුගෙන් රු.93,750,000 ක් අයකර ගත යුතු වුවත්, එම මුදල 2023 දෙසැම්බර් 14 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) 2021 පෙබරවාරි 27 දින නිකුත් කර තිබුණු අංක 2022/SPC/N/R/P/00047 දරන ඒකක 200,000 ක ඇණවුම අත්හිටුවා අංක 2022/SPC/X/R/P/00306 දරන ඒකක 300,000 ක ඇණවුම 2022 මාර්තු 25 දින නිකුත් කර තිබුණි. ඉන්දීය සම්භවයක් ඇති ඖෂධ තොග සැපයීමට අදහස් කරන ඉන්දියානු සැපයුම්කරුවන්/ නිෂ්පාදකයින් සහ දේශීය නියෝජිතයින් වෙත රාජ්‍ය ඖෂධ නිතීගත සංස්ථා වෙබ් අඩවියේ සහ 2022 මාර්තු 26 දින පුවත්පත් දැන්වීම ඔස්සේ ලංසු ඉදිරිපත් කිරීමට ආරාධනා කර තිබුණු අතර, දින 05 ක ලංසු කාලයක් පමණක් ලබාදී තිබුණි. ලංසු ඇඟයීම් සිදු කර තිබුණද ඊට අදාළ ඇගයීම් වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. මෙම ලංසුකරුවන් තිදෙනාගෙන් එක් අයෙකු ලංසු ලියවිලි අත්සන් කර නොතිබුණි.

(ඈ) හදිසි අවශ්‍යතාවය යටතේ මෙම ඖෂධය සපයා ගැනීමට තීරණය කර මිල ගණන් ඉදිරිපත් කිරීමට දින 05 ක් වැනි සීමිත කාලයක් ලබාදී තිබුණද අදාළ ඉන්ඩෙන්ටුව නිකුත් කිරීම සඳහා දින 197 ක කාලයක් ගතකර තිබුණි. නමුත් 2023 දෙසැම්බර් 07 දිනටත් මෙම ඖෂධ තොගය වෛද්‍ය සැපයීම් අංශයට ලැබී නොතිබුණි.

(ඉ) ඒකක 400,000 ක 2023 සාමාන්‍ය ඇණවුම 2022 නොවැම්බර් 16 දින නිකුත් කර තිබුණි. 2023 අප්‍රේල් 25,26 හා 27 දිනයන්හි ලංසු ඇගයීම් සිදුකර තිබුණු නමුත් ඊට අදාළව ඇගයීම් වාර්තාවක් ඉදිරිපත්කර නොතිබුණි. 2023 වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු ඇණවුම් පාලන පත්‍රිකාවට අනුව 2023 වර්ෂයට ඖෂධ ඇණවුම් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බැව් නිරීක්ෂණය විය. මෙම ඖෂධයට අදාළ ඇණවුම නිකුත් කරන විට ඒකකයක ඇස්තමේන්තුගත මිල රු.104 ක් ලෙස දක්වා තිබුණු අතර තෝරාගත් සැපයුම්කරුගේ මිල රු. 34.60 ක් විය. ඒ අනුව තෝරාගත් මිල හා ඇස්තමේන්තුගත මිල අතර වෙනස සියයට 67 ක් විය. මෙම ඇණවුමට අදාළ ප්‍රසම්පාදන කාලසටහනට අනුව 2023 ජූනි 18 වන විට ඖෂධ මිලදීගැනීමට අදාළ ඉන්ඩෙන්ටුව නිකුත් කළ යුතු වුවත් 2023 නොවැම්බර් 30 වන විටත් එය නිකුත් කර නොතිබුණි.

(ඊ) අංක 2023/SPC/E/R/P/00143 දරන ඒකක 200,000 ක ඇණවුම 2023 ජනවාරි 30 දින නිකුත් කර තිබුණි. 2023 අප්‍රේල් 24 දින පැවති තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අවම ලංසුකරු ජාතික ඖෂධ නියාමන අධිකාරියේහි ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොවන බැවින් දෙවන අවම ලංසුකරු වෙත ලංසු ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණි ප්‍රසම්පාදනයට අදාළව ලංසු පිරිනැමීම 2023 මැයි 12 පැවති සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර තිබුණු අතර එම තීරණය අමාත්‍ය

මණ්ඩලයට ඉදිරිපත් කර ආවරණ අනුමැතිය ලබාගත් බවට සාක්ෂි ලිපිගොණුවේ ඇතුළත් නොවුණු අතර මෙම ප්‍රසම්පාදනය නියමිත පරිදි සිදුකළ බව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් තහවුරුකර ද නොතිබුණි.

(උ) මෙම ඖෂධයට අදාළ ඇණවුම නිකුත් කරන විට ඒකකයක ඇස්තමේන්තුගත මිල රු. 104 ක් ලෙස දක්වා තිබුණු අතර තෝරාගත් සැපයුම්කරුගේ මිල රු. 43.20 ක් විය. ඒ අනුව තෝරාගත් මිල හා ඇස්තමේන්තුගත මිල අතර වෙනස සියයට 58 ක් විය. කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණු අතර සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. හදිසි අවශ්‍යතාවය යටතේ මෙම ඖෂධය සපයා ගැනීමට තීරණය කර මිල ගණන් ඉදිරිපත් කිරීමට දින 03 ක් වැනි සීමිත කාලයක් ලබාදී තිබුණද අදාළ ඉන්ඩෙන්ටුව නිකුත් කිරීමට ලංසු විවෘත කළ දින සිට දින 74 ක කාලයක් ගතකර තිබුණි.

(ඌ) විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ලබාදෙන ලද අරමුදල් භාවිතා කර මිලදි ගැනීම සඳහා 2023 පෙබරවාරි 02 දිනැති අංක 2023/SPC/T/R/P/00146 දරන ඇණවුම නිකුත් කර තිබුණි. 2023 පෙබරවාරි 24 දිනැති පැවති මිල ඇගයීම් කමිටුවෙන් පසු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිෂ්පාදනාගාර අනුමැතිය නිමි තෙවන අවම ලංසුකරු වෙත WOR ලබාගැනීමේ පදනම මත ඒකකයක් රු. 76 බැගින් ඒකක 135,000 ක් සඳහා ලංසුව පිරිනැමීමට තීරණය කර තිබුණු අතර එම තීරණය සඳහා අමාත්‍යමණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගත් බවට හෝ ප්‍රසම්පාදනය නියමිත පරිදි සිදුකළ බවට ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහතිකයක් ලබාගත් බවට සාක්ෂි ලිපිගොනුවේ ඇතුළත් නොවීය. ගිවිසුමට අදාළ කොන්දේසිවල කාර්යසාධන සුරක්ෂණයට අදාළ කොන්දේසිය ඉවත් කර තිබුණි. මිල ගණන් ඉදිරිපත් කිරීමට දින 03 ක් වැනි සීමිත කාලයක් ලබාදී තිබුණද දෙවැනි ඉන්ඩෙන්ටුව නිකුත් කිරීමට ලංසු විවෘත කළ දින සිට දින 220 ක කාලයක් ගතකර තිබුණි.

(එ) අංක 2023/SPC/X/R/P/00191 දරන ඒකක 657,000 ක ඇණවුම 2023 මැයි 25 දින නිකුත් කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අවම ලංසුකරට ලංසු ප්‍රදානය කිරීමට නිර්දේශ කර තිබුණි. යථෝක්ත ප්‍රසම්පාදනයට අදාළ ප්‍රසම්පාදන තීරණය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ආවරණ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ සිදුකර ඇති බවට සාක්ෂි ලිපිගොනුවේ ඇතුළත් නොවුණු අතර මෙම ප්‍රසම්පාදනය නියමිත පරිදි සිදුකළ බව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් තහවුරුකර ද නොතිබුණි.

(ඒ) මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා දින 03 කටත් අඩු කාලයක් ලබාදෙමින් සිදුකරන ලද මිල කැඳවීමට අදාළ ඖෂධ මිලදි ගැනීමට 2023 ජුනි 28 දින තීරණය කර තිබුණුද ඊට අදාළ ඉන්ඩෙන්ටුව නිකුත් කර තිබුණේ 2023 සැප්තැම්බර් 15 වූ අතර ඒ සඳහා මාස 02 කට වැඩි කාලයක් ගත කර තිබුණි.

(ඔ) ප්‍රමාණවත් පරිදි මෙම ඖෂධයේ තොග පැවතිය ද රෝහල් 06 ක් විසින් ප්‍රාදේශිය වශයෙන් ඒකක 3,428 ක් රු.469,970 ක පිරිවැයක් දරා ද මිලදි ගැනීම් සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය. අමාත්‍යාංශ ප්‍රසම්පාදනයකදී 2023 ජුනි 28 දින ඇණවුම් අංක 2023/SPC/X/R/P/00191 මඟින් ඒකක මිල රු.36.80 බැගින් සැපයීමට එකඟ වී තිබුණද ප්‍රාදේශිය වශයෙන් මිලදී ගැනීමේදී එම මිල හා සැසඳීමේද සියයට 63 සිට සියයට 647 දක්වා වැඩි මිල ගණන් යටතේ මිලදිගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ඕ) මෙම ඖෂධයේ 2024 වර්ෂය සඳහා වන සාමාන්‍ය ඇණවුම 2023 ජනවාරි මස වන විට නිකුත් කළ යුතු වුවත් 2023 නොවැම්බර් 15 වන විටත් වෛද්‍ය සැපයීම් අංශය විසින් එය නිකුත් කර නොතිබුණි. මෙම තත්ත්වය තුළ 2024 වර්ෂයේදිද මෙම ඖෂධය හදිසි මිලදි ගැනීම් යටතේ මිලදි ගැනීමට සිදුවිය හැකි බව විගණනයේදි නිරීක්ෂණය කෙරේ.

72. Propofol Inj.50 ml Amp/Vial (SR - 01500302)

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2019, 2020,2022 හා 2023 වර්ෂ වෙනුවෙන් නිකුත්කළ ඇණවුම් 08 කට අදාළව එකතුව ඒකක 249,800ක් ලැබිය යුතු ඇණවුම් ලෙස දක්වා තිබුණි. කෙසේ වුවත්, 2023 නොවැම්බර් 27 දිනට ස්වස්ථ පද්ධතිය තුළ 2022 වර්ෂට අදාළව ඒකක 25,000 ක එක් ඇණවුමක් පමණක් ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. 2023 නොවැම්බර් 21 දිනට ස්වස්ථ පද්ධතිය තුළ දැනට පවතින තොග පිළිබඳ විස්තරයෙහි ලැබිය යුතු තොග ලෙස ඒකක 783,420 ක් පෙන්නුම් කළද එම ප්‍රමාණය සකස් වුණු ආකාරය පිළිබඳ තොරතුරු එම පද්ධතිය තුළ ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2020 හා 2021 වර්ෂ වෙනුවෙන් නිකුත්කළ ඇණවුම් 03 කට අදාළව එකතුව ඒකක 290,737 ක් ලැබිය යුතු පදනම මත 2022 වර්ෂය සඳහා සාමාන්‍ය ඇණවුම නිකුත්කර නොතිබුණද එම වර්ෂ වලට අදාළව එකතුව ඒකක 157,737 ක් 2023 දෙසැම්බර් 01 දින වන විටත් වෛද්‍ය සැපයීම් අංශයට ලැබී නොතිබුණි.

